පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 1

1. ඛුද්දක පාඨ
2. ධම්ම පද,
3. උදාන,
4. ඉතිවුත්තක,
5. සුත්ත නිපාත,
6. විමානවත්ථු,

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., Ph.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න රේරුකාන මහතා

# ඛුද්දක නිකාය

# 1

1. ඛුද්දක පාඨ
2. ධම්ම පද,
3. උදාන,
4. ඉතිවුත්තක,
5. සුත්ත නිපාත,
6. විමානවත්ථු,

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 1**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 ජනවාරි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇතිකරන කථා රාසියක් අන්තර්ගත කර තිබේ. කාව්‍යරසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ විමාන වත්ථුව අවසන්කොට ඇති කාණ්ඩ හයක්ද ඇතුල් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත විමල විජයසූරිය මහතාද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

16 - 2 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන

$x$

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| 1. ඛුද්දක පාඨය | 1 |
| 1. තුන්සරණය | 1 |
| 2. දස සිල්පද | 1 |
| 3. දෙතිස් ආකාරය | 1 |
| 4. (සෝපාක) කුමාර ප්‍රශ්න | 2 |
| 5. මංගල සූත්‍රය | 3 |
| 6. රතනසූත්‍රය | 4 |
| 7. තිරොකුඩ්ඩ සූත්‍රය | 7 |
| 8. නිධිකණ්ඩ සූත්‍රය | 8 |
| 9. කරණීයමෙත්ත සූත්‍රය | 10 |
| 2. ධම්මපදය | 11 |
| 1. යමක වර්ගය | 11 |
| 2. අප්පමාද වර්ගය | 14 |
| 3. චිත්ත වර්ගය | 16 |
| 4. පුෂ්ප වර්ගය | 18 |
| 5. බාල වර්ගය | 20 |
| 6. පණ්ඩිත වර්ගය | 22 |
| 7. අරහන්ත වර්ගය | 24 |
| 8. සහශ්‍ර වර්ගය | 25 |
| 9. පාප වර්ගය | 27 |
| 10. දණ්ඩ වර්ගය | 29 |
| 11. ජරා වර්ගය | 31 |
| 12. ආත්ම වර්ගය | 32 |
| 13. ලෝක වර්ගය | 34 |
| 14. බුද්ධ වර්ගය | 35 |
| 15. සුඛ වර්ගය | 37 |
| 16. පිය වර්ගය | 39 |

17. ක්‍රොධ වර්ගය 40
18. මල වර්ගය 42
19. ධම්මට්ඨ වර්ගය 44
20. මාර්ග වර්ගය 47
21. ප්‍රකීර්ණක වර්ගය 49
22. නිරය වර්ගය 51
23. නාග වර්ගය 53
24. තෘෂ්ණා වර්ගය 55
25. භික්ෂු වර්ගය 58
26. බ්‍රාහ්මණ වර්ගය 61
3. **උදානය** 67
1. බෝධි වර්ගය 67
2. මුචලින්ද වර්ගය 78
3. නන්ද වර්ගය 91
4. මෙඝිය වර්ගය 107
5. සොරණ වර්ගය 118
6. ජාත්‍යන්ධ වර්ගය 132
7. චුල්ල වර්ගය 147
8. පාටලීගාම වර්ගය 156
4. **ඉතිවුත්තකය** 179
**ඒක නිපාතය** 179
1. භෝග වර්ගය 179
2. බහුපකාර වර්ගය 183
3. චිත්ත වර්ගය 189
**දුක නිපාතය** **195**
4. සංවේජනිය වර්ගය 195
5. ජාගරිය වර්ගය 201
**තික නිපාතය** **211**
6. මාරධෙය්‍ය වර්ගය 211
7. පුණ්‍යක්‍රියා වර්ගය 216
8. දිට්ඨ වර්ගය 222
9. විතක්ක වර්ගය 233
10. පසාද වර්ගය 246

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**චතුක්ක නිපාතය** 257
11. බ්‍රාහ්මණ වර්ගය 257
**සුත්ත නිපාතය** 275
1. උරග වර්ගය 275
2. චූළ (සුළු) වර්ගය 305
3. මහා වර්ගය 326
4. අට්ඨක වර්ගය 381
5. පාරායන වර්ගය 410
**6. විමානවත්ථු** 430
ඉත්ථි විමානවත්ථු 430
1. පීඨ වර්ගය 430
2. චිත්තලතා වර්ගය 440
3. පාරිච්ඡත්තක වර්ගය 446
4. මඤ්ජෙට්ඨක වර්ගය 461
5. මහාරථ වර්ගය 472
6. පායාසි වර්ගය 486
7. සුනික්ඛිත්ත වර්ගය 489

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ඛුද්දක නිකාය

## ඛුද්දක පාඨය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### 1. තුන් සරණය.

බුදුන් සරණයෙමි, දහම් සරණයෙමි, සඟුන් සරණයෙමි. දෙවනුවත් බුදුන් සරණයෙමි, දෙවනුවත් දහම් සරණයෙමි, දෙවනුවත් සඟුන් සරණයෙමි. තුන්වෙනුවත් බුදුන් සරණයෙමි, තුන්වෙනුවත් දහම් සරණයෙමි, තුන්වෙනුවත් සඟුන් සරණයෙමි.

### 2. දශසිල් පද.

සතුන් මැරීමෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, නුදුන් දේ ගැනීමෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළක්මවූ සිල්පදය මැනවින් ගනිමි. බොරු කීමෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, මත්වීමට හා පමාවීමට කරුණුවූ රහමෙර පීමෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, නියම කාලය නොවන අවස්ථාවෙහි ආහාර ගැනීමෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, නැටුමෙන් ගැයුමෙන් වැයුමෙන් විසුළු දැක්මෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි. මල්ගඳ විලවුන් දැරීම (ශරීරයෙහි) අඩුතැන් පිරවීම සැරසීම යන මෙයට හේතුවූ කරුණින් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, උස් ආසන මහා ආසනයන්ගෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි, රන් රිදී මසුරන් කහවණු (මුදල්) පිළිගැන්මෙන් වැළැක්මවූ සිල්පදය මැනවින් ගනිමි.

### 3. දෙතිස් ආකාරය.

මේ කයෙහි කෙස් ඇත, ලොම් ඇත, නිය ඇත, දත් ඇත, සම ඇත, මස් ඇත, නහර ඇත, ඇට ඇත, ඇටමිදුලු ඇත,

වකුගඩු ඇත, හදවත ඇත, අක්මාව ඇත, දළඹුව ඇත, බඩදිව ඇත, පපුමස ඇත, අතුනු ඇත, අතුනු බහන් ඇත, නොපැසුනු අහර ඇත, පැසුණු අහර (මළ) ඇත, පිත ඇත, සෙම ඇත, සැරව ඇත, ලේ ඇත, ඩහදිය ඇත, මේදතෙල ඇත, කඳුළු ඇත, වුරුණුතෙල් ඇත, කෙළ ඇත, සොටු ඇත, සඳමිදුලු ඇත, මූත්‍ර ඇත, (හිස්මොළ ඇත.)

## 4. (සොපාක) කුමාර ප්‍රශ්න.

එක නම් කිම?- සියලු සත්වයෝ ආහාරය නිසා සිටින්නෝය.

දෙක නම් කිම?- නාමයද රූපයද යන දෙකය.
තුන නම් කිම?- තුන් වේදනාවෝය.
සතර නම් කිම?- සතර ආර්ය සත්‍යයෝයි.

පස නම් කිම?- තෘෂ්ණා දෘෂ්ටි දෙකින් තදින් අල්වාගත් රූප, වෙදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන පසයි.

සය නම් කිම?- තමා කෙරෙහිවූ චක්‍ෂුප්‍රසාද, ශ්‍රොත ප්‍රසාද, ඝ්‍රාණප්‍රසාද, ජිව්හාප්‍රසාද, කායප්‍රසාද, මනස යන සයයි.

සත නම් කිම?- සති, ධම්මවිචය, විරිය, පීති, පස්සධි, සමාධි, උපෙක්ඛා යන සතර මාර්ගඥානය පිණිස පවත්නා බොජ්ඣංග සතය.

අට නම් කිම?- සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

නවය නම් කිම?- නානත්තකාය නානත්තසඤ්ඤී, නානත්තකාය එකත්තසඤ්ඤී, එකත්තකාය නානත්තසංඤී, එකත්තකාය එකත්තසඤ්ඤී. අසංඤී, ආකාසානඤ්චායතනූපග, විඤ්ඤාණඤ්චායතනූපග, ආකිඤ්චඤ්ඤායතනූපග, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග යන නවවිධ සත්‍වයෝයි.

දහය නම් කිම?- රහත්හුගේ අංග දහයයි, රහත් සම්මා දිට්ඨි, රහත් සම්මාසංකප්ප, රහත් සම්මාවාචා, රහත් සම්මා

කම්මන්ත, රහත් සම්මාආජීව, රහත් සම්මාවායාම, රහත් සම්මාසති, රහත් සම්මාසමාධිය යන අටත් සම්මාඥාණ, සම්මාවිමුක්ති යන දෙකත් වෙත්.

**5. මංගල සූත්‍රය**- 1 මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වසනසේක. එකල වනාහි එක්තරා දෙවියෙක් මැදුම්රැයෙහි මනහර ශරීරප්‍රභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක සිටියේය. පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට "බොහෝ දෙවියෝද මනුෂ්‍යයෝද යහපත පතන්නෝ අභිවෘද්ධිය සලසාලන උතුම් කරුණු සෙවූහ. වහන්ස, අභිවෘද්ධිය සලසාලන උතුම් කරුණු වදාරණ සේක්වායි" ගාථායෙන් කීය.

**2.** "එවිට භාග්‍යවතුන් වහන්සේ බාලයන් ඇසුරු නොකිරීමද, පණ්ඩිතයන් ඇසුරු කිරීමද, පිදියයුත්තන් පිදීමද යන එය උතුම් මඟුල්ය.

**3.** "නිසි රටෙහි විසීමද, පෙර ජාතිවල රැස්කළ පින් ඇතිබවය, තමා ගුණදහම්හි පිහිටුවීමද යන එය උතුම් මඟුල්ය.

**4.** ධර්මශාස්ත්‍ර දෙක්හි බොහෝ උගත් බවද, ශිල්ප දැනීමද, කය වචන සිත මනාව හික්මවීමද, බොරු ආදියෙන් වෙන්වූ වචනයද යන එය උතුම් මඟුල්ය.

**5.** "මවට උපස්ථානයද, පියාට උපස්ථානයද, අඹුදරුවනට උපකාර කිරීමද, නිරවුල් කර්මාන්තද යන එය උතුම් මඟුල්ය.

**6.** "දීමද, දසකුසල් කිරීමද, නෑයනට උපකාර කිරීමද, නිවැරදි කර්මද, යන එය උතුම් මඟුල්ය.

**7.** "පව් කෙරෙන් තුන්දොර වැළැක්මද, මත්පැනින් වැළැක්මද, කුසල්දහම් වැඩීමෙහි නොපමාවද යන එය උතුම් මඟුල්ය.

8. "ගරුබුහුමන් කිරීමට සුදුස්සන්ට ගරුබුහුමන් කිරීමද, යටත්පහත් බවද, ලද දෙයින් සතුටුවීමද, කළගුණ දන්නා බවද, සුදුසු අවස්ථාවෙහි දහම් ඇසීමද යන එය උතුම් මඟුල්ය.

9. "ඉවසීමද, සුවච බවද, ශ්‍රමණයන් දැක්මද, නිසිකාලයෙහි ධර්ම සාකච්ඡාවද යන එය උතුම් මඟුල්ය.

10. "ඉන්ද්‍රිය සංවරය හා වීර්යයද, බ්‍රහ්මචර්යාවද, ආර්ය සත්‍යයන් අවබෝධයද, නිවණ නුවණැසට හමුකිරීමද යන එය උතුම් මඟුල්ය.

11. "අෂ්ටලොක ධර්මයෙන් හැප්පුණු යමෙකුගේ සිත නොසැලේ නම් ඒ නොසැලෙන සිතද, ශොකනැති සිතද, කෙලෙස්ධූලි නැති සිතද, උපද්‍රව නැති සිතද යන එය උතුම් මඟුල්ය.

12. "මෙවැනි අභිවෘද්ධියට කරුණුවූ දේ කිරීමෙන් හැමතන්හි නොපැරදුනෝව හැමතන්හි සැපසේ යත්. ඒ දේ ඒ පුරන්නහුට උතුම් මඟුල්ය."

**6. රතන සූත්‍රය-** 1. "පොළොව උපන් හෝ අහස උපන් හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් දැන් මෙහි රැස්වූවෝද ඒ හැම අමනුෂ්‍යයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා. මාගේ වචනය සකසා අසත්වා.

2. "භූතයිනි, එබැවින් තෙපි හැමදෙන අසවු. මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරවු. ඒ යම් මිනිස් කෙනෙක් දහවලුත් රෑත් තොපට පුදපඬුරු ගෙනෙත්ද එබැවින් ඔවුන් නොපමාව රකිවු.

3. "මේ මිනිස්ලොව හෝ අන් නාග භවනාදී තැනෙක හෝ යම් වස්තුවෙක් ඇද්ද, ස්වර්ගයන්හි හෝ යම් අගනා රත්නයක් ඇද්ද, ඔවුන් අතරෙහි තථාගතයන්ට සමාන රත්නයක් නැත්තේමය. මේ කරුණින් බුදු රජ උත්තම රත්නයයි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.!

4. "ශාක්‍යමුනි තෙම එකඟ සිත් ඇත්තේ ක්ලෙශයන්ගේ ක්ෂයට නිමිතිවූ රාගයෙන් වෙන්වූ ජාති ජරා මරණ නැති උතුම්වූ යම් නුවණක් ලැබුයේද ඒ නිර්වාණ ධර්මයට සමාන කිසි දෙයක්

නැත. මේ කරුණින්ද ධර්මය උතුම් රත්නයයි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.!

**5.** "බුද්ධශ්‍රෙෂ්ඨතෙම අත්‍යන්ත ශුද්ධවූ යම් සමාධියක් වර්ණනා කෙළේද, අනතුරුවම ඵලදෙන සමාධියයි, යමකට බුද්ධාදීහු කියත්ද, ඒ මාර්ග සමාධිය හා සම අන් කිසිම සමාධියක් නැත. මේ කරුණින්ද ආර්ය මාර්ග ධර්මය උතුම් රත්නයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.!

**6.** "සත්පුරුෂයන් විසින් පසස්නාලද යම් ආර්ය පුද්ගලයෝ අටදෙනෙක් වෙත්ද, ඔව්හු යුග සතරෙකි. සුගත් බුදුන්ගේ ශ්‍රාවකවූ ඔව්හු කම්පල අදහා දෙන දේ පිළිගැනීමට සුදුස්සෝය. ඔවුනට දුන්දේ මහත්ඵලය. මේ කරුණින්ද ආර්ය සංඝයා උතුම් රත්නයයි. මේ සත්‍යයෙන් සෙත්වේවා.!

**7.** "ගෞතම බුදුන්ගේ සස්නෙහිවූ යම් ආර්ය ශ්‍රාවක කෙනෙක් ශීලයෙහි මොනොවට යෙදුනේද, ස්ථිර සිතින් යුක්තවූවෝද, සියලු කෙලෙසුන්ගෙන් නික්මුණේද, ඔව්හු නිවණට බැසගෙන නිවීම ඉබේම ලබාගෙන විඳින්නෝ පැමිණියයුතු දහමට පැමිණියාහුය. මේ කාරණයෙන් ද ආර්ය සංඝ රත්නය උතුම් රත්න වේ. මේ සත්‍යබලයෙන් සෙත් වේවා.!

**8.** "පොළොව බැස සිටි නුවර දොර සවිවන කනුව සිවුදිගින් හමන සුළඟින් යම්සේ නොසෙල්විය හැකිද ආර්ය සත්‍යයන් යමෙක් නුවණින් බැසගෙන දක්නේ නම් ඒ සත්පුරුෂයා එවැනිකොට කියමි. මේ කරුණින්ද ආර්ය සංඝයා උතුම් රත්නයි. මෙ සත්‍ය බලයෙන් සෙත් වේවා.!

**9.** "ගැඹුරු නුවණ ඇති බුදුරජුන් විසින් මැනවින් දක්වන ලද ආර්ය සත්‍යයන් යම්කෙනෙක් තමනට ප්‍රකට කෙරෙත්ද, ඔව්හු කිසිසේත් බෙහෙවින් පමාවූවෝද අටවන අත්බවක් නම් නොගනිත්. මේ කරුණින්ද ආර්ය සංඝයා රත්නයකි. මේ සත්‍ය බලයෙන් සෙත්වේවා.!

**10.** "ඔහුගේ පළමුවන නිවන් දැක්ම සමගම සක්කාය දෘෂ්ටියද සැකයද යම්කිසි මිථ්‍යා ශීල ව්‍රත කෙනෙක් ඇත්නම්

එහැමද යන තුන් සංයෝජනයෝ ඔහු විසින් හරණ ලද්දෝ වෙත්. හේ අපාය සතරින් මිදුනේද වේ. ආනන්තර්ය කර්ම පස හා මිසදිටු ගැන්ම යන බර පව් සය කරන්නටද නොහැක්කේය. මේ කරුණින්ද සංඝයා උතුම් රත්නයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත්වේවා.!

11. "ඒ සෝවාන් පුද්ගලතෙම කිසි පමාවෙකින් කයින් හෝ වචනින් හෝ සිතින් හෝ පව්කමක් කරන්නේද, හේ සඟවා ලීමට නොහැක්කේය. නිවන් දුටුවහු වරද සඟවාලීම නොහැක්කක් බව වදාරණ ලදී. මේ කරුණින්ද ආර්ය සංඝයා උතුම් රත්නයයි. මේ සත්‍ය බලයෙන් සෙත්වේවා.

12. "වනෙහි වැඩුණු ගස් රැස ග්‍රීෂ්ම ඍතුවෙහි පළමුවන ග්‍රීෂ්ම මාසයෙහි යම්සේ පිපුණු අග් ඇතියේද එබඳුවූ නිවන් පමුණුවන උතුම් පර්යාප්ති ධර්මයක් පරමහිතය පිණිස වදාළේය. මේ කරුණින්ද බුදුරජ උතුම් රත්නයයි. මේ සත්‍යානුභාවයෙන් සෙත්වේවා.

13. "උතුම්වූ නිවන් දන්නාවූ නිවන් දෙන්නාවූ නිවන් මග ගෙනහැර පාන්නාවූ නිරුත්තර බුදුරජතෙම උතුම් දහමක් දෙසීය. මේ කරුණින්ද බුදුරජ උතුම් රත්නයයි. මේ සත්‍යානුභාවයෙන් සෙත්වේවා.

14. "යම් කෙනෙකුන්ගේ පුරාණ කර්ම ගෙවීගියේද, අළුත් කර්ම පහළවීමෙකුත් නැද්ද, අනාගත භවයෙහි නොඇලුණු සිතැති ක්‍ෂයකළ ප්‍රතිසන්ධි විඥාන බීජ ඇති පැනනැගීමෙහි ඡන්දය නැති ධෛර්යය සම්පන්නවූ ඒ රහත්හු මේ පහනසේ පිරිනිවෙත්. මේ කරුණින්ද සංඝයා උතුම් රත්නයයි. මේ සත්‍යානුභාවයෙන් සෙත්වේවා.

15. "(සක්දෙව් රජ) පොළොව උපන් හෝ අහස උපන් යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්වූහුද, ඒ අපි දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජුන් වඳිමු. සත්නට සෙත්වේවා.

16. "පොළොව උපන් හෝ අහස උපන් යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්වූවාහුද, ඒ අපි දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත ධර්මය වඳිමු. සත්නට සෙත්වේවා.

17. "පොළොව උපන්නාවූද අහස උපන්නාවූද යම් භූත කෙනෙක් මෙහි රැස්වූවාහුද, ඒ අපි දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත සංඝයා වඳිමු. සත්නට සෙත්වේවා."

**7. තිරොකුඩ්ඩ සූත්‍රය-** 1. "ඥාති ප්‍රේතයෝ තමන් ගෙය කරා අවුත් බිත්තියෙන් පිටත්හිද සන්ධිස්ථාන වලද තුන්මංසන්ධි වලද දොර සමීපයෙහිද සිටිත්.

2. "බොහෝ ආහාරපානද කෑම්බීම්ද පිළියෙලව සිටි කල්හි ඒ සත්වයන්ගේ කර්ම හෙතුවෙන් කිසිම නෑදෑයෙක් සිහි නොකරයි.

3. "යම් කෙනෙක් ඒ ප්‍රේත නෑයන්ට අනුකම්පා කරන්නෝ වෙත්ද, ඔව්හු ශුද්ධවූ ප්‍රණීතවූ කැපවූ ආහාර පාන වර්ග සුදුසු කාලයෙහි මෙසේ (මතු දැක්වෙන පරිද්දෙන්) පමුණවත්.

"මේ පින නෑයනට වේවා. නෑයෝ සුවපත් වෙත්වා කියා'යි. ඒ ඥාති ප්‍රේතයෝද එතැන්හි අවුත් එක්රැස්වූවාහු. ඒ බොහෝ ආහාර පාන තමන් උදෙසා දෙනකල ඒ සකසා අනුමෝදන් කොට ගණිත්. යම් කෙනෙකුත් හේතුකොටගෙණ මේ අවස්ථාවෙහි සම්පත් ලබමෝද ඒ අපේ නෑයෝ බොහෝ කල් ජීවත්වෙත්වා. ඔවුන් විසින් අපටද පූජා කරණ ලදී. දායකවූ ඔව්හුද ඒ දානමය පිනෙහි ඵල නොලබන්නෝ නොවෙත්' (යයි කියා ඒ දන්දී පින් දුන් නෑයන්ට ප්‍රශංසා කරත්) ඒ ප්‍රේත ලෝකයෙහි සීසෑමක් නොමැත. එහි ගව පාලනයෙක්ද නැත.

රන් රිදීයෙන් ගනුදෙනුවෙක් නැත. එබඳුවූ අන් වෙළඳාමෙක්ද නැත. මළප්‍රේතවූ ඔව්හු මෙයින් දුන් දැයෙකින් (පිනෙන්) එහි යැපෙත්.

4. "උස්බිම වට වැසිදිය මිටිතෙනට යම්සේ ගලා බසීද, එසේම මෙයින් දුන්දේ ප්‍රේතයනට පැමිණේ.

"මහා නදීහු පිරුණාහු යම්සේ සාගරය පුරාලත්ද එසේම එසේම මෙයින් දුන් පින ප්‍රේතයනට පැමිණේ.

"මට මෙනම් දේ දුන්නේය, මගේ මෙනම් වැඩ කෙළේය. මගේ නෑයෙක, මගේ මිත්‍රයෙක, මගේ යහළුවෙකැයි ඔවුන්

පෙරකළ උපකාර සිහිකරන්නේ ප්‍රේතයනට දක්ෂිණාව දෙන්නේය.

"හැඬීම හෝ ශෝකය හෝ යම් අන් විලාපයක් හෝ ඒ ප්‍රේතයන්ට වැඩ පිණිස නොවේ. ඒ ඥාතිප්‍රේතයෝ එහි ඒ උපන් පරිදිම සිටිත්.

**5.** "දෙන ලද මේ දක්ෂිණාව වනාහි සංඝයා කෙරෙහි මොනවට පිහිටියා ඒ ප්‍රේත ජනයාට දිගුකලක්ම හිත පිණිස එකෙණෙහිම පැමිණේ. හෙවත් එයින් සැප විපාක ලැබේ.

**6.** "ජීවත්ව සිටිනවුන් විසින් කළයුතුවූ ඒ මේ ඥාති ධර්මය දක්වන ලදී. ප්‍රේතයනට මහත් පූජාවෙක්ද කරණ ලදී. භික්‍ෂූනට ශක්තිජනක ආහාරපාන දීම් වශයෙන් බලයද දෙන ලදී. මෙසේ තොප විසින් මහත් පින් රැස් කරණ ලදී."

**8. නිධිකණ්ඩ සූත්‍රය**- 1. "හිත සැප ගෙනදෙන කටයුත්තක් පැමිණි කල්හි මට ප්‍රයෝජන පිණිස වන්නේයයි සිතා පුරුෂතෙම පොළොව ගැඹුරුවූ ජල සමීපයෙහි (එතරම් යට) නිධානයක් පිහිටුවයි. සතුරන් විසින් නපුරුකොට කියන ලද (නඩුවකට මූණපෑ) මට රජුන්ගෙන් මිදීම පිණිසද සොරුන් විසින් පෙලන ලද මට සොරුන්ගෙන් මිදීම පිණිසද ණයවූ මට ඒ ණයෙන් මිදීම පිණිසද දුර්භික්ෂකාලයෙහි හෝ හිරිහැර විපත් ඇතිකල්හි හෝ මෙකී වැඩ නිපදවනු පිණිස ලොව නිධාන නම් දෑ පිහිටවනු ලැබේ.

**2.** "දිය මතුවන තැනට සමීපවූ ගැඹුරු වළෙහි එතරම් මනාකොට පිහිටුවන ලද්දේ වන්නේද, ඒ සියලු නිධානය හැම කල්හිම එසේ ඔහුට නොපැමිණේ, නොලැබේ.

**3.** "ඒ නිධානය තිබූ තැනින් පහවන්නේ හෝ වේ. ඔවුන්ගේ සංඥාව හෝ මුළාවන්නේය. නාගයෝ හෝ එය ඉවත් කරන්නේය. යකෙකු හෝ එය හැරගෙන යන්නෝය.

**4.** "අප්‍රිය උරුමක්කාරයෝ හෝ නොදැක්කදීම එය ගොඩ ගනිත්. යම්කලෙක පින් ගෙවේද එකල්හි මේ නිධන්ගත වස්තුව වැනසේ.

5. "යම් පුරුෂයෙකු හෝ ස්ත්‍රියක විසින් දීමෙන් සිල් රැකීමෙන් හෝ චිත්තසංයමයෙන් හෝ කෙලෙස් සන්සිඳුවීමෙන් හෝ චෛත්‍යයෙහි සංඝයා විෂයයෙහි පුද්ගලයෙකු කෙරෙහි අමුත්තන් කෙරෙහි මව කෙරෙහි පියා කෙරෙහි නැවත දෙටුබෑයා කෙරෙහි හෝ දානමානාදී වශයෙන් හෝ පුණ්‍ය නිධානයෙක් මැනවින් පිහිටුවන ලදද?

6. "අනුන් විසින් දිනාගත නොහැකිවූ එය කළාහු අනුවම යන්නාවූ මේ නිධානය මැනවින් පිහිටවනු ලද්දේවේ. මැරෙන සමයෙහි සියලු භොගයන් හැරදමා යායුතු කල්හි මේ පුණ්‍ය නිධානය වූකලී හෙතෙම අත්නොහැරගෙනම යෙයි.

7. යම් පුණ්‍ය නිධානයෙක් එය කළාහු අනුව යන්නේවේද, එය කළාහට විනා අනුනට සාධාරණ නොවන්නේද, යම් පුණ්‍ය නිධානයෙක් සොරුන් විසින් පැහැරගතහැකි නොවන්නේද නුවණැත්තේ ඒ නිධාන නම්ලත් පින් කරන්නේය.

8. "මේ පින් දෙවිමිනිසුනට සියලු කැමති දේ දෙන නිධානයයි. යමක් ඔහු පතත්ද ඒ සියල්ල මේ පුණ්‍ය නිධාන හේතුවෙන් ලැබේ.

9. "උපනුපන් තැන මනා පැහැති බව මනා කටහඬ ඇති බව මනා සටහන් හා මනා සිරුර ඇති බව අධිපති බව හා පිරිවර යන සියල්ල මේ පුණ්‍ය නිධාන හේතුවෙන් ලැබේ.

10. "ප්‍රදේශ රජ බවද ද්විපාධිපති බවද ප්‍රියවූ සක්විති සැපද දෙවියන් අතරෙහි දෙව්රජ බවද යන සියල්ල මේ පින් හේතුවෙන් ලැබේ.

11. "යම් මානුෂික සම්පතක්වේද, දෙව්ලොව යම් රතියකුත් වේද යම් නිවන් සැපතක් වේද, ඒ සියල්ල මේ පින් හේතුවෙන් ලැබේ.

12. "මිත්‍ර සම්පත්තිය නිසා නිසිපරිදි යොගභාවනාහි යෙදෙන්නහුට ත්‍රිවිද්‍යා ද විමුක්තීන්හි වශී බවද යන සියල්ල මේ පිනින් ලැබේ.

13. "සිවුපිළිසිඹියාද අෂ්ට විමොක්ෂ ද යම් ශ්‍රාවක පාරමී ඥාණයෙක් වේනම් එයද පසේ බුදු බවද සම්‍යක් සම්බුද්ධත්වයද යන සියල්ල මේ පිනින් ලැබේ.

14. "යම් මේ පුණ්‍ය සම්පත්තියක් වේද; එය මෙසේ මහත් ප්‍රයෝජන පිණිස පවතී. එබැවින් ධෛර්‍ය්‍යවත් නුවණැත්තෝ කළ පින් ඇති බව වණත්."

9. **කරණීය මෙත්ත සූත්‍රය**- 1. "ශාන්තපදය (නිවණ) ලෞකික ඥාණයෙන් අනුමානයෙන් හා ඇදහීමෙන් දැන (එය ලබනු පිණිස) යමක් කටයුතු නම් එය තමාගේ අභිවෘද්ධියෙහි දක්ෂ තැනැත්තහු විසින් කළ යුතුය. ඔහු දක්ෂ වියයුතු, ඍජු වියයුතු, වඩාත් ඍජුවියයුතු, සුවච වියයුතු, මෘදුවියයුතු උඩඟු නොවියයුතු.

2. "ලද දෙයින් සතුටු වියයුතු පහසුවෙන් පෝෂණය කටහැක්කකු වියයුතු, බොහෝ වැඩ කටයුතු ඇත්තකු නොවියයුතු, සැහැල්ලු පැවතුම් ඇත්තකු වියයුතු, සන්සුන් ඉඳුරන් ඇත්තකු වියයුතු, ප්‍රඥා සම්පන්න වියයුතු, නොසරුප් කියුම් කෙරුම් සිතුම් නැත්තකු වියයුතු, කුලය කෙරෙහි නොඇලියයුතු.

3. "යමකින් අන් නුවණැත්තෝ දොස් නගන්නේ නම් එබඳු අල්පවූද කිසි දුසිරිතක් නොකළ යුතු. "සියලු සත්හු සුවැත්තෝ වෙත්වායි" කියා හෝ නිරුපද්‍රව වෙත්වායි කියා හෝ මෙත් වැඩිය යුතු.

4. "සැලෙන සත්හුද නොසැලෙන සත්හුද, දික් සත්හුද මහත් සත්හුද මැදුම් පමණ සත්හුද මිටි සත්හුද ඉතා කුඩා සත්හුද, තර සත්හුද යන යම් සත්ව කෙනෙක් වෙත්ද ඒ සියල්ලෝ සුවපත් වෙත්වා.

5. "ඇස් හමුවූද, ඇස් හමුනොවූද දුර වසන්නාවූද ළඟ වසන්නාවූද, පහළවූද, පහළවන්නෝවූද සියලු සත්හු සුවපත් සිතැති වෙත්වා.

6. "කිසිම තැනෙක්හි එකෙක් අනිකෙකු නොරවටාවා. ඒ කිසිවකු හෙළානොදකීවා. කයින් වචනින් ගැටීමකින් හෝ

තරහයෙන් සිත් පෙරලියෙන් හෝ එකෙක් අනිකෙකුහට දුකක් කැමති නොවේවා.

7. "මව යම්සේ තමාගේ එකම දරුවා (සියදිවි පුදාත්) රක්නේද, එසේම සියලු සතුන් කෙරෙහි අප්‍රමාණවූ මෙත් සිත් වැඩිය යුතුයි.

8. "අප්‍රමාණවූ සම්බාධ නැති වෛර චේතනා නැති, සතුරන් නැති මෛත්‍රී සහගත සිත සියලු ලොවෙහි උඩද යටද සරසද යන හැමදෙසෙහිම වැඩිය යුතුයි.

9. "යම්තාක් වේලා පහවූ නිදි ඇතිවන්නේද ඒතාක්ම සිටිමින් හෝ හිඳිමින් හෝ ඇවිදිමින් හෝ ඉඳිමින් මේ මෛත්‍රී ධ්‍යානය ඉටිය යුතු. මේ මේ සස්නෙහි ශ්‍රෙෂ්ඨ විහරණයයි බුද්ධාදී උතුමෝ කීහු.

10. "මෙසේ සිල්වත් තැනැත්තේ මිථ්‍යා දෘෂ්ටියට නොපැමිණ සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තව කාමයන්හි ඇල්ම හැරීමෙන් කිසිකලෙකත් මතු මවුකුසෙක හෝනා බවට නොපැමිණෙන්නේය."

(ඛුද්දක පාඨය නිමි)

---

# ධම්මපදය

## 1. යමක වර්ගය.

1. (අරූප) ධර්මයෝ (කර්ම) සිත පෙරටුකොට ඇත්තාහ සිත උතුම් කොට ඇත්තාහ. සිතින් උපදනා හෙයින් මනෝමයහ. ඉදින් දූෂිතවූ සිතින් යුක්තව (චතුර්විධි වාග් දුශ්චරිතය) බෙනේ නම් හෝ (ත්‍රිවිධ කාය දුශ්චරිතය) කෙරේ නම් හෝ ඒ හේතුවෙන් (විපාක) දුක්ඛය ඒ පුද්ගලයා අනුව යන්නේය. (කුමක් මෙන්ද යත්?) ගැල උසුලන ගොනුන්ගේ පිය අනුව යන ගැල සක මෙනි.

2. (අරූප) ධර්මයෝ කර්ම සිත පෙරටු කොට ඇත්තාහ. සිත උතුම් කොට ඇත්තාහ. සිතින් උපදනා හෙයින් මනෝමයහ.

ඉදින් ප්‍රසන්නවූ සිතින් බෙනේ නම් හෝ කෙරේනම් හෝ ඒ හේතුවෙන් (විපාක) සුඛය ඒ පුද්ගලයා අනුව යන්නේය. (කුමක් මෙන්ද යත්?) ශරීරයෙන් පහනොවන්නාවූ සෙවනැල්ල මෙනි.

3. මට ආක්‍රොශ කෙළේයියද, මට ගැසීයයිද, මා දිනීයයිද, මා (සතු දෙය) පැහැර ගත්තේ යයිද, යම් කෙනෙක් ඒ (ක්‍රොධය) (නැවත නැවත සිත්හි) (ii) බඳිත් ද ඔවුන්ගේ ඒ වෛරය නොසන්සිඳෙයි.

4. (මෙහි 3 (i) ඡේදය යෙදිය යුතුයි.) නොබඳිත් ද ඔවුන්ගේ වෛරය සන්සිඳෙයි.

5. මේ ලෝකයෙහි වෛරයෙන් වෛරයෝ කිසිකලෙක්හිදු නොසන්සිඳෙන්නාහ. අවෛරයෙන්ම වෛරය සන්සිඳෙන්නාහ. මේ (අවෛරයෙන් වෛරය සන්සිඳවීම) පුරාතනවූ ගුණධර්මයකි.

6. මේ (සඟ) මැද (පණ්ඩිත ජනයා කෙරෙන් අන්‍යවූ කළහකාර) යමෙක් අපි නසුම්හයි නොදතිත්ද, ඒ කළහකරුවන් අතුරෙහි යම් (පණ්ඩිත ජන) කෙනෙක් වනාහි (අපි නසම්හයි) දනිද්ද ඒ හේතුවෙන් කළහයෝ සන්සිඳෙන්නාහ.

7. (විසභාග අරමුණු) ශුභ වශයෙන් අනුව බලමින් වාසය කරන්නාවූ, (එහෙයින්ම චක්ෂුරාදී) ෂඩින්ද්‍රියයන් කෙරෙහි සංවරයක් නැත්තාවූ ආහාරයෙහිද පමණ නොදන්නාවූ, කුසීතවූ (හෙවත් ග්‍රන්ථධුර විදර්ශනා ධුරයන්හිද වත් පිළිවෙත් පිරීමෙහිද මැළිවූ) වීර්යය රහිතවූ ඒ (මෙබඳු) පුද්ගලයා (ක්ලේශ) මාරතෙම ඒකාන්තයෙන් මැඩපවත්නේයි. [කුමක් මෙන්ද යත්] (ප්‍රචණ්ඩ) වාතය තෙම දුර්වල වෘක්ෂයක් (උපුටා හෙලන්නාක්) මෙනි.

8. (උද්ධුමාතකාදි) අශුභයක් අනුව බලමින් වසන්නාවූ (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියයන් කෙරෙහි මනා සංවරයෙන් යුක්තවූ ආහාරයෙහිද පමණ දන්නාවූ, ශ්‍රද්ධාවෙන් යුක්තවූ (සතර ඉරියව්වෙහි) වඩන ලද වීර්යය ඇති ඒ (මෙබඳු) පුද්ගලයෝ (ක්ලේශ) මාරතෙම ඒ කාන්තයෙන් මැඩ නොපවත්නේය. [කුමක් මෙන්ද යත්] (දුර්වල) වාතය තෙම (ඝන) ශෛල පර්වතයක් (නොසෙල්වෙන) මෙනි.

**9.** යම් පුද්ගලයෙක් තෙම (රාගාදී කෙලෙස්) කසටවූයේ (ඉන්ද්‍රිය) දමනයෙන් හා (වාක්) සත්‍යයෙන් පහවූයේ, කාෂායවස්ත්‍රය හැඳ පොරෝනේ වේද මෙබඳු ඒ පුද්ගලතෙම කාෂාය වස්ත්‍රය ධාරණයට සුදුසු නොවන්නේයි.

**10.** යම් පුද්ගලයෙක් තෙම වමාරා දැමූ (කෙලෙස්) කසට ඇත්තේ වේද (චතුපාරිශුද්ධි) ශීලයෙහි මනාව පිහිටියේද (ඉන්ද්‍රිය) දමනයෙන් හා (වාක්) සත්‍යයෙන් යුක්තද ඒ පුද්ගලතෙම ඒකාන්තයෙන් කාෂාය වස්ත්‍ර ධාරණයට සුදුසුයි.

**11.** අසාරයෙහි මේ සාරය යන දෘෂ්ටි ඇත්තාවූ, සාරයෙහිද මේ අසාරය යන දෘෂ්ටි (දැකීම්) ඇත්තාවූ, මිථ්‍යා සංකල්පය (වැරදි අදහස්) ම ගෝචරකොට ඇත්තාවූ ඒ (අඥාන) ජනයෝ (ලෞකික ලෝකොත්තර ධර්‍මී) සාරයට නොපැමිණෙන්නාහුය.

**12.** සාරයද සාරවශයෙන් (දැන) අසාරයද අසාර වශයෙන් දැන වසන්නාවූ සම්‍යක් සංකල්පයම ගෝචරකොට (හරි අදහස්) ඇත්තාවූ ඒ ප්‍රාඥයෝ (ලෞකික ලොකොත්තර ධර්ම) සාරයට පැමිණෙන්නාහුය.

**13.** යම්සේ නොසකස්කොට සොයන ලද (හෙවත් කුඩු මහත් සිදුරු පෙනෙනසේ විරළකොට සොයන ලද්දාවූ) ගෙයක් වැසි (ධාරාතොම) විනිවිද යාද එපරිද්දෙන් අභාවිතවූ (නොවැඩූ) සිත කාමරාගය තෙම විනිවිද පවත්නේයි.

**14.** යම්සෙ සකස්කොට සොයන ලද ගෙයක් වැසි (ධාරතෙම) විනිවිද නොයාද එපරිද්දෙන් මනාකොට භාවිතවූ (වැඩූ) සිත කාමරාගය තෙම විනිවිද නොපවත්නේයි.

**15.** පව්කම් කරන (සුළුවූ) පුද්ගලතෙමේ, මෙලොව ශෝක කරන්නේය, පරලොවත් ශොක කරන්නේය, මෙසේ දෙලොවම ශෝක කරන්නේය. හෙතෙම තමාගේ කිලිටිවූ (කායවාක්) කර්මය දැක මෙලොවම ශෝක කරන්නේය.

**16.** කරණලද පින්කම් ඇති පුද්ගලතෙම, මෙලෙව්හි සතුටු වන්නේය. පරලෙව්හිද සතුටු වන්නේය. (මෙසේ) දෙලෙව්හිම සතුටු වන්නේය. හෙතෙම තමාගේ (පුණ්‍යකර්ම) විශුද්ධිය (පිරිසිදු බව) දැක සතුටු වන්නේය. හෙතෙම වෙසෙසින් සතුටු වන්නේය.

**17.** පව් කරණ (සුළු) පුද්ගලතෙම, මෙලෙව්හි තැවෙන්නේය. පරලෙව්හි තැවෙන්නේය. දෙලෙව්හිම (මෙසේ) තැවෙන්නේය. මා විසින් පව්කරණ ලදැයි තැවෙන්නේය. දුගතියට ගියේ අතිශයින් තැවෙන්නේය.

**18.** කරණ ලද පින්කම් ඇති පුද්ගලතෙම, මෙලොවද සතුටු වන්නේය. පරලොවද සතුටු වන්නේය. (මෙලෝ පරලෝ) දෙක්හි සතුටු වන්නේය. මා විසින් පින්කරණ ලදැයි මෙලොවදී සතුටු වන්නේය. සුගතියට ගියේ බොහෝකොට සතුටු වන්නේය.

**19.** ප්‍රමත්ත (පමාවන) පුද්ගලතෙම (ත්‍රිපිටක) බුද්ධ වචනය බොහෝකොට කියන්නේ වීනමුදු (ඉදින්) ඒ නොකරන්නේ වීනම්, අනුන්ගේ ගෙරින් රක්නාවූ ගොපල්ලා මෙන් (සතරමග සතරඵලයයි කියනලද) ශ්‍රාමණ්‍යයට (මහණකමට) හිමි නොවන්නේය.

**20.** ස්වල්පවූද බුද්ධ වචනය කියන්නාවූ පුද්ගලතෙම, (ඉදින්) (නවලෝකෝත්තර) ධර්මයට අනුරූපව පවත්නා සුළු වී නම් රාගයද ද්වේෂයද මෝහයද ප්‍රහාණය කොට (නසා) (පිරිසිඳ දතයුතු ධර්මයන්) මනාකොට දන්නාවූ, මනාව මිදුණු සිත් ඇත්තාවූ, මෙලොව (පවත්නාවූද) පරලොව (වන්නාවූද) [උපාදානයන් (හේතුකොටගෙණ) නිත්‍ය සුඛ ශුභ ආත්ම වශයෙන් නොගන්නා] ඒ (ආර්යය පුද්ගල) තෙම ශ්‍රාමණ්‍ය ගුණයට (මහණ බවට) හිමිවන්නේය.

## 2. අප්පමාද වර්ගය.

**1.** අප්‍රමාදය හෙවත් නොපමා බව අමෘතයයි කියනලද නිර්වාණයාගේ (අධිගමයට) කාරණ වෙයි. ප්‍රමාදය මරණයට කාරණ වෙයි. (කළ්‍යාණ මිත්‍ර ධර්මයෙහි) අප්‍රමත්ත (පමා නොවන) සත්වයෝ නොමියන්නාහ. යම් කෙනෙක් ප්‍රමත්තයෝ (පමාවන්නෝ) ද ඔහු මළවුන් මෙනි.

**2.** මේ කාරණය විශේෂයෙන් දැන, නොපමා බැව්හි පිහිටියාවූ නුවණැත්තෝ (තමන්ගේ) අප්‍රමාද ගුණයෙහි සතුටුවෙති. ආර්යයන්ගේ ගෝචරයෙහි (ගොදුරෙහි) ඇලුනාහුවෙති.

3. (ද්විප්‍රකාර) ධ්‍යානයෙන් (ධ්‍යායීවූ) වඩන හෙවත් සමථ විදර්ශනා භාවනාවෙහි යෙදුනු සතතයෙන් පැවති (කායික චෛතසික) දැඩිවීර්යය ඇති (නිතර දෘඪවීර්යයයෙන් යුක්තවූ ඒ ප්‍රාඥයෝ සතරයෝගයෙන් කෙරෙන් නිර්භයවූ බැඳුම්වලින් බියනැති) නිරුත්තරවූ නිර්වාණය (උතුම් නිවණ) ස්පර්ශ කරන්නාහුය.

4. උට්ඨාන වීර්යයයෙන් යුක්තවූ (නැඟීසිටින), එළඹ සිටි සිහි ඇති, නිර්දෝෂවූ කායකර්මාදිය ඇති (කටයුතු පිරිසිදු) පරීක්ෂාකරණ සුලුවූ (ආශාකරනසුලු සංයතවූ (කාය වාක්කර්ම ඇති) හෙවත් සංවරවූ ධාර්මික ජීවිකාවෙන් ජීවත්වන්නාවූ, අප්‍රමත්ත (නොපමා) පුරුෂයාගේ යසස විශේෂයෙන් වැඩෙයි.

5. කායික චෛතසික වීර්යයෙන් (නැඟීසිටීමෙන්) ද අප්‍රමාදයෙන් ද (චතුපාරි ශුද්ධිශීල සංඛ්‍යාත කායවාග්) සංයමයෙන් (සංවරයෙන්) ද (ඉන්ද්‍රිය) දමනයෙන්ද, නුවණැති පුරුෂතෙම, කෙලෙස් මහවතුර යමක් නොනසාද, ඒ ප්‍රතිෂ්ඨාව (දිවයින) කරන්නේයි.

6. (මෙලොව පරලොව වැඩ) නොදන්නාවූ, (එහෙයින්ම) නුවණ නැති සත්‍වයෝ ප්‍රමාදයෙහි යෙදී වෙසෙති. ප්‍රාඥතෙම අප්‍රමාදය උත්තම ධනයක් මෙන් රකියි.

7. පමා බව නොම පුරුදු කරව්. තෘෂ්ණා සංස්තවයෙහි (කාමසම්බන්ධයෙහි) නොයෙදෙවු. අප්‍රමත්ත (නොපමා) පුද්ගලතෙමේ (සමථ විදර්ශනා) භාවනා කරන්නේ මහත්වූ (නිවන්) සුවයට පැමිණෙන්නේය.

8. ප්‍රාඥතෙම යම් කලෙක්හි අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරු කෙරේද එකල්හි ප්‍රඥා නමැති ප්‍රාසාදයට නැඟී ශෝක රහිතවූ ප්‍රාඥවූ ඒ (ක්ෂීණාශ්‍රව) තෙම ශෝක සහිතවූ මෝඩවූ සත්ව සමූහයා බිම සිටියවුන් පර්වත මුදුනෙක්හි සිටි එකක්හු විසින් මෙන් දක්නේය.

9. (පමාවන) සත්වයන් අතුරෙහි නොපමාවූ, (කෙලෙස් නින්දෙන්) නිදන්නාවූ සත්වයන් අතුරෙහි වඩා නොනිදීම් ඇති, (සුන්දරවූ ප්‍රඥා ඇති මහා ක්ෂීණාශ්‍රව) පුද්ගලතෙම දුර්වල

අශ්වයකු (හැරපියා යන්නාවූ) සීඝ්‍රවූ ජව ඇති අශ්වයකු මෙන් (පමාවන) සත්වයන් සසරවටැම හැරපියා (නිවන් පුරයට) යන්නේයි.

10. ශක්‍රතෙමේ අප්‍රමාදය හේතුකොටගෙණ දෙවියන්ට උතුම් බවට (රජබවට) පැමිණියේ. අප්‍රමාදය පසසත්. ප්‍රමාදය සදාකල්හි ගර්හිතයි. (නින්දාකොට තිබේ.)

11. නොපමාබවෙහි ඇලුනාවූ, ප්‍රමාදයෙහි අගය දක්නාවූ මහණතෙම කුඩාවූද, මහත්වූද, (දශවිධ) සංයෝජනයන් (ලැව්) ගින්නක් මෙන් (අර්හත්මාර්ගඥාන නැමැති ගින්නෙන්) දවමින් (නිවන්පුරයට) යන්නේය.

12. අප්‍රමාදයෙහි ඇලුනාවූ භය දක්නාවූ, මහණතෙම පිරිහීමට අයෝග්‍යය. නිර්වාණයට සමීපයෙහිම වන්නේය.

## 3. චිත්ත වර්ගය

1. සැලෙන්නාවූ, එක් අරමුණක නොසිටින්නා (චපල) වූ නොරැක්ක හැක්කාවූ, (තුන්) දුසිරිතින් නොවැළකිය හැක්කාවූ, සිත ප්‍රාඥවූ පුරුෂතෙම හීදණ්ඩක් (ඇද මැඩ ඉදිකරන්නාවූ) හී වඩුවා මෙන්, සෘජු කරන්නේය.

2. මේ සිත ජල (සංඛ්‍යාත) වාසස්ථානයෙන් නගන ලද්දාවූ ගොඩදමන ලද්දාවූ, මත්ස්‍යයකු මෙන් සැලෙන්නේය. ක්ලේශ වෘත්තය (මරගෙය) පහකටයුතුයි.

3. නිග්‍රහ (දඬුවම්) කරන්ට නොපිළිවන්වූ, ලඝුවූ, යම් කැමති අරමුණක වැටෙනසුළුවූ, චිත්තයාගේ දමනය කිරීම මැනවි, සිත දමනය කරන ලද්දේ සුව එලවන්නේය.

4. දක්නට නොපිළිවන්වූ, ඉතා සියුම්වූ, යම් කැමති අරමුණක් ගන්නාසුළුවූ සිත ප්‍රාඥතෙම රක්නේයි. සිත රක්නා ලද්දේ (ලොවී ලොව්තුරා) සැප එලවන්නේය.

5. දුරට යන්නාවූ, හුදකලාවම පවත්නාවූ, ශරීරයක් නැත්තාවූ, (ශරීරය නැමැති) ගුහාවෙහි පවත්නාවූ, (හෙවත් හෘදය

රූපය නිසා පවත්නාවූ) සිත යම්කෙනෙක් සංවරයෙහි පිහිටුවත්ද, ඔහු මාරබන්ධනයයි කියනලද ත්‍රෛභූමක වෘත්තයෙන් (මර බැම්මෙන්) මිදෙන්නාහුය.

**6.** අනවස්ථිතවූ (නිතර චංචලවන) සිත් ඇති සද්ධර්මය නොදන්නාවූ, ඉපිලෙන සැදැහැ ඇත්තාහට ප්‍රඥාතොම නොපිරෙන්නීය.

**7.** (රාගයෙන් චංචලනොවූ සිත් ඇති, (ද්වේෂයෙන්) නොපහරණ ලද සිත් ඇති, (අර්හත් මාර්ගයෙන්) ප්‍රහීණකළ කුශලා කුශල ඇති ක්ෂීණාශ්‍රවයාහට කෙලෙසුන් කෙරෙන් භයක් නැත.

**8.** මේ ශරීරය මැටි බඳුනක් වැනි කොට දැන, මේ (විදර්ශනා) චිත්තය නුවරක් මෙන් (කෙලෙස් සතුරන් විසින් නොපැරදවිය හැකි කොට) තබා, ප්‍රඥා නැමැති ආයුධයෙන් (ක්ලෙශ) මාරයා පහරණේය. දිනන ලද්ද (හෙවත් උපදවන ලද්දාවූ තරුණ විදර්ශනාව) ද රක්නේය. (සමාපත්තියෙහි) ආලය නොකරන්නේය.

**9.** මේ කය නොබෝ කලකින්ම ඒකාන්තයෙන් පහවූ සිත් ඇත්තේ, ඉවත දමන ලදුයේ දිරාගිය දඬුකඩක් මෙන් පොළොව මත්තෙහි හෝනේය.

**10.** සොරෙක්, සොරකු දැක ඕහට යමක් (අනාහ්‍යව්‍යසනයක්) කෙරේද බද්ධවෛර ඇති එකෙක් එසේම තමාකෙරෙහි (බද්ධ) වෛර ඇති එකක්හු දැක, යම් ඒ අවැඩක් (ඕහට) කෙරේද, (එයට වඩා) වරදවා (දශඅකුශල කර්මපථයෙහි) පිහිටුවනලද සිත ඒ හේතුවෙන් ඔහු අතිශයින් ලාමක කරන්නේයි.

**11.** ඒ කාරණය මවු නොකරන්නීය. පියාද නොකරන්නේය, අනික් නෑයෝද නොකරන්නාහුය. (දශකුශල කර්ම පථයෙහි) මනාකොට පිහිටුවන ලද සිත, ඒ හේතුවෙන් ඒ පුද්ගලයා අතිශයින් උත්තම කරන්නේය.”

# සතරවෙනි පුෂ්ප වර්ගය.

1. (ආත්මභාව සංඛ්‍යාතවූ) මේ පෘථිවිය කවරෙක් දිනන්නේද, සතර අපායද දෙව්ලෝ සහිතවූ මේ මනුෂ්‍ය ලෝකයද කවරෙක් දිනන්නේද? මනාකොට දෙසන ලද්දාවූ (සත්තිස් බොධිපාක්‍ෂික) ධර්මය (මල් කඩා රැස්කරන්නාවූ) මල්කරුවකු මල මෙන් පරීක්‍ෂාකරන්නේ (හෙවත් ප්‍රතිවේධ කරන්නේ) ද?

2. (සප්තවිධ) ශෛක්‍ෂතෙම (හික්මෙන්නේ), (ආත්මභාව යයි කියන ලද) පෘථිවිය දිනන්නේය. සතර අපායද, දෙව්ලොව සහිතවූ මේ මනුෂ්‍ය ලෝකයද දිනන්නේය. ශෛක්‍ෂ (හික්මියයුතු) පුද්ගලතෙම මනාකොට දෙසන ලද්දාවූ (සත්තිස් බෝධි පාක්‍ෂික) ධර්මය මල්කරුවෙකු මල මෙන් පරීක්‍ෂාකරන්නේ (හෙවත් ප්‍රතිවේධ කරන්නේ) යි.

3. මේ කය පෙණපිඬක් වැනියයි දැන, මිරිඟු වැනියයි සලකන්නාවූ මහණතෙම, (ක්ලේශ) මාරයාගේ (පංච) කාම ගුණයන් (හෙවත් ත්‍රෛභූමක දුක්ඛයන්) සිඳ මාරයාහට අවිෂයවූ (නොපෙනෙන) නිර්වාණයට (මාර්ගඵල චිත්තයන්ට අරමුණු කරගැනීම් වශයෙන්) යන්නේයි.

4. මල් කඩා රැස්කරන්නාවූ, (මාලාකාරයක්හු මෙන් මේ ලෝකයෙහි පංචකාම ගුණයෙහි) තදින් ඇලුනු සිත් ඇති මනුෂ්‍යයා, මහවතුරක් නිදන්නවූ ගම්වැසි ජනයා (මුහුදට ගෙණයන්නාක්) මෙන් මරණය හාම හැරගෙණ යන්නේයි.

5. (මල් කඩා රැස්කරන්නාවූ මාලාකාරයක්හු මෙන් මේ ලෝකයෙහි) පංචකාම ගුණයෙහි ඇලුනු සිත් ඇති, මනුෂ්‍යයා (වස්තුකාම ක්ලෙශ) කාමයන්හි තෘප්තියකට නොපැමිණියාහුම මාරතෙම තමා වසඟ කරන්නේය.

6. යම්සේ බමරතෙම මල්ද වර්ණයද ගන්ධයද නොනසමින් (පුෂ්ප) රසය පමණක් ගෙණ (වනයට) නැඟීයේද එපරිද්දෙන්ම භික්‍ෂුතෙම ගොදුරු ගම්හි සිගා ඇවිදින්නේය.

7. අනුන්ගේ ඵරුෂ වචනයෝ (මෙනෙහි නොකට යුත්තාහ.) අනුන්ගේ කරණ ලද්දාවූද නොකරණ ලද්දාවූද (දුශ්චරිත සුචරිත)

දෙය නොබලන්නේය. තමාගේම කරණ ලද (දුශ්චරිත) නොකරණලද (සුචරිත) දෙය බලන්නේය.

8. සිත්කලුවූ, මනාවූ පැහැ ඇති, සුවඳ රහිතවූ, මල් යම්සේ (සුවඳ නොපතුරුවා) ද එපරිද්දෙන්ම මනාකොට දෙසනලද ත්‍රිපිටක බුද්ධ වචනය (ඒ ධර්මය) නොකරන්නාහට සඵල නොවෙයි.

9. සිත්කලුවූ, මනා පැහැ ඇති, සුවඳ සහිතවූ, මල් යම්සේ (සුවඳපතුරුවා) ද එපරිද්දෙන්ම මනාකොට දෙසන ලද ත්‍රිපිටක බුද්ධ වචනය (ඒ ධර්මය) කරන්නාහට සඵල නොවෙයි.

10. පුෂ්පරාශියකින් බොහෝ මල්දම් (දක්‍ෂවූ මාලාකාරයෙක්) යම්සේ කෙරේද එපරිද්දෙන්ම උපන්නාවූ මිනිසා විසින් බොහෝ කුසල් කටයුතුයි.

11. මල් සුවඳ උඩුසුළඟට නොපැමිණෙයි. සඳුනෙහි සුවඳද, තුවරලායෙහි සුවඳද, සීනිද්ද බෝලිද්දයෙහි සුවඳද උඩු සුළඟට නොයයි. (බුද්ධාදී) සත්පුරුෂයන්ගේ (ශීල) සුගන්ධය වනාහි උඩුසුළඟට පැමිණෙයි. (කුමක්හෙයින්ද යත්) සත්පුරුෂතෙම (යම්හෙයකින් ශීල සුගන්ධයෙන්) සියලු දසදිගුන් මැඩ පවතීද එහෙයිනි.

12. තුවරලා හා සඳුන් පිළිබඳවූ මානෙල් හා සමන් පිළිබඳවූ යම් මේ සුවඳක් වේද, මේ සුවඳවලට වඩා සිල්වතුන්ගේ ශීල සුගන්ධය උතුම්ය.

13. තුවරලා සඳුන් පිළිබඳ මේ සුවඳ ටිකක් පමණය. සිල්වතුන්ගේ යම් උතුම් සුවඳෙක් වේද, දෙවියන් අතරද හමයි.

14. පරිපූර්ණවූ (ලෞකික ලොකොත්තර) ශීල ඇති, අප්‍රමාදව වසන සුලුවූ, මනාකොට දැන (සියලු කෙලෙසුන් කෙරෙන්) මිදුනාවූ, ඒ ක්‍ෂීණාශ්‍රවයන්ගේ මග (දිව්‍යපුත්‍ර) මාරතෙම නොදන්නේය.

15. මහ මගෙක්හි උගුලන ලද්දාවූ, ඒ කසලගොඩෙක්හි සුවඳ ඇති, සිත් අලවන්නාවූ, පියුමෙක් යම්සේ උපදීද.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**16.** එසේම කසල ගොඩක් බඳුවූ, (නුවණ ඇස් නැති හෙයින්) අන්ධවූ, පුහුදුන් ඉක්මවා සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවකවූ (මහාක්ෂීණාශ්‍රව) තෙම නුවණින් (පුහුදුන් ලෝකයා) ඉක්ම දිලිසෙන්නේය.

## පස්වෙනි බාල වර්ගය.

**1.** නොනිදන්නාහට රාත්‍රිතොම දිගය. (ශ්‍රන්තායා) විඩා වූවහුට යොදුන දිගය. සද්ධර්මය නොදන්නාවූ බාලයන්ට සංසාරය දිගය.

**2.** (තමා හා එක්ව විසීමට නිසි කළ්‍යාණ මිතුරෙකු) සොයන්නේ (මහණතෙම) (ශීල සමාධි ප්‍රඥාවෙන්) තමහට වැඩිවූ හෝ තමා හා සමානයෙකු හෝ ඉදින් නොලද්දේ වීනම් තනිව විසීම දැඩි කරන්නේය. (කුමක්හෙයින්ද යත්? අඥානයා කෙරෙහි සහායතාතොමෝ නැද්ද එහෙයිනි.

**3.** මාගේ පුත්‍රයෝ ඇත. ධනයද ඇතැයි මෙසේ නුවණ නැතියේ වෙහෙසෙයි. තෙමේද තමාට නැත. පුත්‍රයෝ කොයින්ද? ධනය කොයින්ද?

**4.** යමෙක් තෙමේ අඥානවූයේ තමාගේ බාලභාවය දනීද, ඒ කාරණයෙන් හෙතෙම පණ්ඩිත (හෝ පණ්ඩිත සමාන හෝ) වන්නේය. යම් බාලයෙක් වනාහි පණ්ඩිතමානී වේද? හෙතෙම (ඒකාන්තයෙන්) බාලයයි කියනු ලැබේ.

**5.** අඥානතෙම දිවිපමණිනුදු ඉදින් නුවණැත්තන් කරා එළඹෙන්නේ නමුදු, හෙතෙම ධර්මය නොදන්නේය. කුමක් මෙන්ද යත්? (ලුණු ඇඹුල් ආදී) රස නොදන්නා හැන්ද මෙනි.

**6.** නුවණැත්තේ ඉදින් ඇසිල්ලකුදු බුද්ධාදී මහෝත්තමයන් ඇසුරු, කෙරේද, හෙතෙම ධර්මය දන්නේය. කුමක් මෙන්ද යත්? (ලුණු ඇඹුල්) රස දන්නා විඥානයෙන් යුක්තවූ ජිව්හා ප්‍රසාදය (දිව) මෙනි.

**7.** (මෙලෝ පරලෝ වැඩ නොදන්නාවූ) මෝඩවූ බාලයෝ කටුකවූ විපාක ඇති යම් අකුශල කර්ම කෙරෙමින් තමන් හා සතුරුවූ සේ හැසිරෙති.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. යම් කර්මයක් කොට පසුතැවිලි වේද, යම් කර්මයක් හුගේ (අනිෂ්ට) විපාකය කඳුලෙන් තෙත් මුහුණු ඇතිව හඬමින්, අනුභව කෙරේද? (එබඳුවූ) අකුශල කර්මය කරණලද්දේ නොමැනවි.

9. යම් කර්මයක් කොට නොතැවේද, යම් කර්මයක්හුගේ (ඉෂ්ට) විපාකය පිනාගියේ, සුන්දරවූ සිහි ඇත්තේ, අනුභව කෙරේද?, (එබඳුවූ) කුශලකර්මය කරණ ලද්දේ මැනවි.

10. අකුශල කර්මය (පව) යම්තාක්කල් විපාක නොදේද, ඒතාක්කල් අඥානතෙම (පාපකර්මය) මිහිරිකොට සිතන්නේය. යම් කලෙක පාපය විපාක දේද, එකල්හි අඥානතෙම (කායික චෛතසික) දුක්ඛයට පැමිණෙන්නේය.

11. අඥාන (පුද්ගල) තෙම මසක් පාසා (එක්වරෙක) තණ අගින් ගෙණ භෝජනය අනුභව කරන්නේ නමුදු, හෙතෙම පිරිසිඳ දන්නාලද (චතුරාර්ය සත්‍ය) ධර්මයන් ඇති රහතුන්ගේ සොළොස්වන කලාවට (කොටසට) ද නොපැමිණෙන්නේය.

12. කරණලද පාප (අකුශල) කර්මය එකෙණෙහිම කිරීමෙන් නොදැවෙන්නේය. අළුයෙන් වැසුණු අඟුරක් මෙන් ඒ අඥානයා දවමින් අනුව යන්නේය.

13. බාලයා විසින් දන්නා ලද්ද (ශිල්පය නොහොත් බාලයාගේ ඉසුරුබව) බාලයාට අවැඩ යම්තාක් පිණිසම වන්නේය. බාලයාගේ (ප්‍රඥා නැමති) සිරස පළමින් ඔහුගේ කුශල කොඨාශය නසන්නේය.

14. තමා කෙරෙහි නැති (ගුණයෙන්) බුහුමන් කිරීම කැමති වන්නේය. භික්ෂූන් කෙරෙහි හෙවත් භික්ෂූන් විසින් පිරිවැරීමද කැමති වන්නේය. සාංඝික ආවාසයෙහි අධිපතිකමද කැමති වන්නේය. අන් (උපාසක) කුලයෙහි පූජාවද කැමති වන්නේය.

15. ගිහියෝද, පැවිද්දෝද යන දෙදෙනම මා විසින්ම කරණ ලද්දා කොට සිතත්වායි කියාද, කිසි කුදු-මහත් කටයුත්තෙහි මා අනුවම පැවතුම් ඇතිවෙත්වායි කියාද, මෙසේ බාලයාහට විතර්කයද, තෘෂ්ණාවද, මානයද වැඩෙයි.

16. ලාභ උපදවන ප්‍රතිපත්තිතොම අනිකක්මය. නිවණට පමුණුවන්නාවූ ප්‍රතිපත්තිතොම අනිකක්මය. මෙසේ මෙය විශේෂයෙන් දැන බුදුන්ගේ ශ්‍රාවකවූ මහණතෙම (අධර්මයෙන් උපදවනලද සිව්වැදෑරුම් ප්‍රත්‍යය) සත්කාර නොඉවසන්නේය. විවේකය වඩවන්නේය."

## සයවෙනි පණ්ඩිත වර්ගය.

1. වරද දක්නා සුළුවූ, නිග්‍රහකොට කියන්නාවූ විදර්ශනා ඥානයෙන් යුක්තවූ යම් කළ්‍යාණ මිත්‍රයෙකු නිධානය (තිබූ තැන) කියන්නක්හු වැනි කොට දක්නේවේද එබඳු පණ්ඩිතයා සේවනය කරන්නේය. එබන්දා (පණ්ඩිතයා) සෙවුනාහට වැඩක්ම වන්නේය. අවැඩක් නොවන්නේය.

2. යම් කළ්‍යාණ මිත්‍රයෙක් අවවාද කෙරේද, අනුශාසනා කෙරේද, අකුශල ධර්මයන් වළකාද මෙබඳු ඒ පුද්ගලතෙම (බුද්ධාදී) සත්පුරුෂයන්ට ප්‍රිය වන්නේය. අසත්පුරුෂයන්ට අප්‍රිය වන්නේය.

3. පාපමිත්‍රයන් සේවනය නොකරන්නේය. අධම පුරුෂයන් සේවනය නොකරන්නේය. කළ්‍යාණ මිත්‍රයන් සේවනය කරන්නේය. උත්තම පුරුෂයන් සේවනය කරන්නේය.

4. නවලොව්තුරා දහම්රස වළඳන මහණතෙම සුවසේ වසන්නේය. ප්‍රාඥතෙම විශෙෂයෙන් ප්‍රසන්නවූ සිතින් යුක්තව (බුද්ධාදී) ආර්යයන් විසින් දක්නාලද්දාවූ ධර්මයෙහි හැම කල්හිම ඇලෙන්නේය.

5. දියාළුවෝ (සිත් පිත් නැති) දිය ගෙණ යන්නාහ. හී වඩුවෝ (සිත් පිත් නැති) හීදඬු නමන්නාහ. වඩුවෝ දඬු නමන්නාහ. නුවණැත්තාහු සිත දමනය කරන්නාහ.

6. යම්සේ ඝනවූ ගල් පර්වතයක් (සතර දිගින්) හමන සුළඟින් කම්පා නොවේද, එපරිද්දෙන්ම නුවණැත්තෝ නින්දා ප්‍රශංසා දෙක්හි කම්පා නොවන්නාහුය.

**7.** යම්සේ ගැඹුරුවූ මහමුහුද විශෙෂයෙන් ප්‍රසන්නද නොකැළඹුනේද එපරිද්දෙන්ම නුවණැත්තෝ ධර්මයන් අසා මැනවින් පහදිති.

**8.** උතුම් පුරුෂයෝ සියලු දෙයෙහි නොඇලෙති. සත්පුරුෂයෝ (සිව්පසය ලබාගන්නා පිණිස) සිත්ගන්නා වචන නොකියති. පණ්ඩිතයෝ සුවදුක් විඳිනා කල උස් පහත් ගති නොදක්වති.

**9.** (පණ්ඩිත පුරුෂතෙම) තමා හෙතුකොට ගෙණද, පව් නොකරන්නේය. අනුන් හෙතුකොට ගෙණද පව් නොකරන්නේය. පව් කිරීමෙන් ලැබියයුතු පුතෙකුද, පව් කිරීමෙන් ලැබියයුතු ධනයද, පව් කිරීමෙන් ලැබියයුතු රටකුදු කැමති නොවන්නේය. අධර්මයෙන් තමාට ලැබියයුතු දේ යමෙක් නොකැමති වේද හෙතෙම සිල්වත්ය ප්‍රඥාවත්ය, ධාර්මිකය.

**10.** මනුෂ්‍යයන් අතුරෙන් යම්කෙනෙක් (පාරයයි කියනලද) නිවණට යන්නේද ඒ ජනයෝ ස්වල්පයහ. නැවත ඔවුන් කෙරෙන් අන්‍යවූ (හෙවත් නිවණට නොයන සුළුවූ) මේ ජනයා මෙතෙරටම දුවන්නේය.

**11.** යම්කෙනෙක් වනාහි මනාකොට දෙසන ලද්දාවූ ධර්මයෙහි ධර්මය අනුව පවතිත්ද, ඒ ජනයෝ (ක්ලේශ) මාරයාගේ ආඥා පවත්වන්නාවූ වෙසෙසින්ම එතෙරවිය නොහැකි (ත්‍රෛභූමක වෘත්තය ඉක්මවා නිර්වාණයයි කියන ලද) පාරයට (මෙතරට) පැමිණෙන්නාහ.

**12-13** නුවණැති මහණතෙම (කාය දුශ්චරිතාදී) අකුශල ධර්මය දුරුකොට, ගිහිගෙයින් නික්ම ගේ නැති ප්‍රව්‍රජ්‍යාවට පැමිණ (කාය සුචරිතාදී) කුශල ධර්මය වඩන්නේය. නුවණැත්තෝ කාමයන් හැර, කිසිත් නැතිව, සිත කිලිටිවලින් සෝදා එහි ඇල්ම කැමති වන්නේය.

**14.** යම් ක්ෂීණාශ්‍රව කෙණෙකුන්ගේ සිත බොධ්‍යංග ධර්මයන් විෂයෙහි මනාකොට වඩන ලදද, යම් ක්ෂීණාශ්‍රව කෙනෙක් කිසි උපාදානයක් මමය මාගේයයි නොගෙණ

ග්‍රහණයක් නැත්තාවූ නිර්වාණයෙහි ඇලුනාහුද, දිලිසෙන ඒ ක්ෂීණාශ්‍රවයෝ (ස්කන්ධාදී) ලෝකයෙහි පිරිනිවියා නම් වෙති.”

## සත්වෙනි අරහන්ත වර්ගය.

1. ගොස් නිමවන ලද සංසාර මාර්ග ඇති ශොක නැති (ස්කන්ධාදී) සියලු ධර්මයෙහි නොඇලී (එයින් මිදුණු) සියලු කාය ග්‍රන්ථයන් (ගැට) ප්‍රහීණ කළාවූ ක්ෂීණාශ්‍රවයාහට (චෛතසික) පරිදාහයක් දැවිල්ලෙක් නැත්තේය.

2. ස්මෘති සම්පන්නවූ (සිහිමත්) ක්ෂීණාශ්‍රවයෝ ව්‍යායාම කරන්නාහ. ඔහු ආලයෙහි (ගෙහි) නොඇලෙන්නාහ. ඔහු විලහැර යන්නාවූ හංසයන් මෙන් ආලයක් ආලයක් පාසා හරණාහුයයි (හෙවත් සියලු ආලයන් හරණාහුයි.)

3. යම් (ක්ෂීණාශ්‍රව) කෙනෙකුන්ට (කුශලා කුශල) රැස් කිරීමෙක් (චීවරාදී සිව්පසස රැස්කිරීමෙක් වත්) නැද්ද යම් (ක්ෂීණාශ්‍රව) කෙනෙක් පිරිසිඳ දන්නා ලද භොජන ඇත්තාහුද, යම් (ක්ෂීණාශ්‍රව) කෙනෙකුන්ට සුඤ්ඤතවිමොක්ඛ (කිසිත් නැතැයි මිදීම) නම්වූද අනිමිත්ත විමොක්ඛ (අරමුණ නොගෙන මිදීම) නම්වූද අප්පණිහිත විමොක්ඛ (ආශාවක් නැති මිදීම) නම්වූද නිර්වාණය අරමුණු වේද ඒ ක්ෂීණාශ්‍රවයන්ගේ (උත්පත්ති) ගතිතොම ආකාශයෙහි පක්ෂීන් ගිය මග මෙන් නොදත හැක්කේය.

4. යම් ක්ෂීණාශ්‍රවයෙකුට කාමාදී ආශ්‍රවයෝ ක්ෂයවූවාහුද කබලිංකාරාහාරයෙහි (සිගු අහරෙහි) ද තෘෂ්ණාව දෘෂ්ටි වශයෙන් නොඇලුනේද, යම් ක්ෂීණාශ්‍රවයෙකුට සුඤ්ඤත විමොක්ඛ නම්වූද, අනිමිත්ත විමොක්ඛ නම්වූද අප්පණිහිත විමොක්ඛ නිර්වාණය අරමුණුවේද ඒ ක්ෂීණාශ්‍රවයාගේ පිය ආකාශයේ පක්ෂීන්ගේ පිය මෙන් නොදත හැක්කේයි.

5. යම් ක්ෂීණාශ්‍රවයෙකුගේ ෂඩ්ඉන්ද්‍රියයන් දක්ෂ රියැදුරෙකු විසින් මනාකොට දමනය කරණ ලද අශ්වයන් මෙන් මනාකොට දැමුණේද ප්‍රහීණවූ (නවවිධි) මාන ඇති, ආශ්‍රව නැති, (අෂ්ටලොක

ධර්මයෙන් නොසැලෙන හෙයින්) තාදීවූ (නොසැලෙන) ඔහුට දෙවියෝද කැමති වෙති.

**6.** පොළොව හා සමවූ නුවර දොර හිඳුවන ලද කණුවක් බඳුවූ (අටලෝ දහමින් කම්පා නොවන බැවින්) තාදීවූ (නොසැලෙන) යහපත් ව්‍රත (වත්) ඇති යම් ක්ෂීණාශ්‍රවයෙක් විරුද්ධ නොවේද, පහවූ මඩ ඇති විලක් මෙන් ප්‍රසන්නවේද, ඒ ක්ෂීණාශ්‍රවයාහට සංසාරයෝ (ඉපදීම්) නොවන්නාහ.

**7.** මනාකොට (තදංගාදී පංචවිධ විමුක්තියෙන්) විශෙෂයෙන් මිදුනාවූ, අටලෝ දහමින් කම්පා නොවූ, සන්සුන්වූ, රහතුන්ගේ සිත කය වචනය යන තුන්දොරම ශාන්තය.

**8.** යමෙක් (අනුන්ගේ බස්) නොඅදහාද, (බුදුන්ගේ විනා අන් ශාස්තෘවරයෙක් කෙරෙහි ඇදහිලි නැත්තේද) අත්ත (නොකළ) නම් වූ නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කොට දත්තේද, (සංස්කාර) සන්ධිය සින්දේද, සින්දාවූ ප්‍රතිසන්ධ්‍යාවකාශ (පිළිසිඳීම් ඉඩ) ඇත්තාවූ වමනය කරණ ලද ආශා ඇත්තේද හෙතෙම ඒකාන්තයෙන් උත්තම පුරුෂ නම්වේ.

**9.** ගමක හෝ වනයක හෝ වළතැනෙක හෝ ගොඩ තැනෙක හෝ යම් තැනෙක්හි රහත්හු වාසය කරත්ද ඒ භූමි ප්‍රදෙශය සිත්කලුය.

**10.** අරණ්‍යයෝ සිත් අලවන්නාහ. යම් අරණ්‍යයෙක්හි මහජනතෙම නොඇලේද, (එබඳු අරණෙහි) පහවූ රාග ඇති රහත්හු (ක්ෂීණශ්‍රවයෝ) ඇලෙන්නාහ. ඒ රහත්හු වස්තුකාම ක්ලේශකාමයන් නොසොයන සුල්ලෝය."

## අටවෙනි සහශ්‍ර වර්ගය

**1.** අනර්ථ පදයෙන් යුක්තවූ වචන දහසක් නමුදු උතුම් නොවෙති. යමක් අසා පුද්ගලතෙම සන්සිඳේද එබඳු වූ අර්ථ (සාධක) සිදුකරන එක පදයකුදු උතුම්ය.

**2.** අනර්ථ පදයෙන් යුක්තවූ (නොහොත් අවැඩ කොටසින් යුක්ත වූ) ගාථාවෝ ඉදින් දහසක් නමුදු උතුම් නොවෙති. යම්

එක ගාථා පදයකුදු අසා පුද්ගල තෙමේ සන්සිඳේ නම් එබඳු වූ එක ගාථා පදය උතුම්ය.

**3.** යම් පුද්ගලයෙක් තෙම ඉදින් අවැඩ කොටසින් යුක්තවූ ගාථා සියයක් කීයේ වී නමුදු (ඒ ගාථාවෝ උතුම් නොවෙති). යමෙක් යමක් අසා සන්සිඳේද එබඳු වූ එකම ධර්ම පදය උතුම්ය.

**4.** යම් යෝධයෙක් දශ ලක්‍ෂයක් මිනිසුන් එකම යුද්ධයෙක්හි දිනුයේ වී නමුත් (හෙතෙම ජය ලද්දේ නම් නොවෙයි) එකම ආත්මය හෙවත් තමාම දිනුයේ වේද හෙතෙම ඒකාන්තයෙන් යුද්ධයෙහි දිනුවන්ට උතුම්ය.

**5.** තමා දැමුණු, නිතර සංවරව හැසිරෙන පුරුෂයා, තමා ආත්මය දිනන ලද්දේ ඒකාන්තයෙන් උත්තමයි. යම් යම් අන්‍ය ප්‍රජාතොම දූ කෙළීම් ආදියෙන් දිනන්නීද, (ඒ දිනීම) උතුම් නොවෙයි.

**6.** දෙවියෙක් ගාන්ධර්වයෙක් ඔව්හු හා සමග මාරයාද එබඳු සත්වයාගේ දිනීම පැරදීමක් නොකරන්නේය.

**7.** මාසයක් මාසයක් පාසා දහසක් වියදම් කිරීමෙන් අවුරුදු සියයක් මුළුල්ලෙහි යමෙක් තෙම යාග කරන්නේ වඩන ලද සිත් ඇති එකම ආර්යයක්හු මොහොතකුදු පුදන්නේ වේද ඉදින් අවුරුදු සියයක් මුළුල්ලෙහි දෙන ලද යම් දානයක් ඇද්ද එයට වඩා ඒ පූජාව උතුම්.

**8.** යම් පුරුෂයෙක් වනයෙහි ඉදින් අවුරුදු සියයක් මුළුල්ලෙහි ගිනි පූජාව කරන්නේද වඩනා ලද සිත් ඇති එක ආර්යය පුද්ගලයෙකු මොහොතකුත් පුදන්නේද අවුරුදු සියයක් මුළුල්ලෙහි කරණ ලද යම් ඒ ගිනි පූජාවට වඩා ඒ පූජාවම උතුම්ය.

**9.** මේ ලෝකයෙහි පින් කිරීමෙහි අපෙක්ෂා ඇති පුද්ගල තෙම, යම්කිසි (කුඩා) දාන වස්තුවක් හෝ (අමුතු) මහ දනක් හෝ අවුරුද්දක් මුළුල්ලෙහි දුන්නේ නමුදු ඒ සියලු දානයම ආර්යයන් වැඳීමේ (කුශල චේතනාවෙන්) සතරින් කොටසටත් නොපැමිණෙයි.

10. (නිතර සිල්වතුන්) වඳින සුළුවූ, (ගුණයෙන්) වැඩිහිටියන් පුදන්නාහට ආයුෂ (ශරීර) වර්ණ සැප බල යන මේ සතර ගුණයෝ වැඩෙති.

11. දුශ්ශීලවූ (උපචාර අර්පණා සමාධියෙන්) සමාහිත (සිත් එකඟ) නොවූ යම් පුද්ගලයෙක් ඉදින් අවුරුද සියයක් ජීවත්වේ නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා) සිල්වත්වූ ධ්‍යායීවූ (සිත් වඩන) භික්‍ෂුවගේ එක් දවසක් ජීවත්වීම උතුම්ය.

12. ප්‍රඥා නැත්තාවූ සමාහිත (සිත එකඟ) නොවූ යම් පුද්ගලයෙක් ඉදින් අවුරුදු සියයක් ජීවත්වේ නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා) ප්‍රඥාවන්වූ (සමථ විදර්ශනා) භාවනායෙහි යෙදුණු භික්‍ෂුහුගේ එක්දවසකුදු ජීවත්වීම උතුම්ය.

13. මැලිවූ (කායික චෛතසික) වීර්යය නැත්තාවූ යම් පුද්ගලයෙකු ඉදින් අවුරුදු සියයක් ජීවත්වීමට වඩා දැඩිකොට වීර්යය වඩන භික්‍ෂුවගේ එකදවසකුදු ජීවත්වීම උතුම්ය.

14. (පංචස්කන්ධයන්ගේ) උදයව්‍යය (ඇතිවීම හා නැතිවීම) නොදක්නාවූ යම් පුද්ගලයෙක් ඉදින් අවුරුදු සියයක් ජීවත්වේ නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා) උදයව්‍යය දක්නා භික්‍ෂුහුගේ එකදවසකුදු ජීවත්වීම උතුම්ය.

15. නිර්වාණය නොදන්නාවූ යම් පුද්ගලයෙකු අවුරුදු සියයක් ජීවත්වීමට වඩා අමෘත මහා නිර්වාණය නුවණැසින් දක්නා පුද්ගලයාගේ එක දවසකුදු ජීවත්වීම උතුම්ය.

16. උතුම්වූ (නවලොකොත්තර) ධර්මය (නුවණැසින්) නොදක්නාවූ යම් පුද්ගලයෙකු අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා උතුම් (නවලොකොත්තර) ධර්මය නුවණැසින් දක්නා පුද්ගලයාගේ එක් දවසක් ජීවත්වීම උතුම්ය.”

## 9 පාප වර්ගය

1. සුචරිත ධර්මයන්හි යුහුසුලු වන්නේය. අකුසලයෙන් සිත වළකන්නේය. (දානාදී කුශල කර්මය) සෙමෙන් කරන්නහුගේ සිත අකුශලයෙහි ඇලෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. පුරුෂතෙම ඉදින් අකුශල කර්මයක් කෙළේ නමුදු ඒ (අකුශල කර්මය) නැවත නැවත නොකරන්නේය. ඒ (අකුශල කර්මයෙහි) ආලයක් නොකරන්නේය. පව් රැස්වීම දුක්ය.

3. පුරුෂයා ඉදින් පිනක් කරන්නේ වීනම් එය නැවත නැවතද කරන්නේය. ඒ කුශලයෙහි ආලය කරන්නේය. පින් රැස්වීම සුවය.

4. යම්තාක් කල් අකුශල කර්මය (පව) විපාක නොදේද, ඒතාක් කල් පාපකාරී පුද්ගලතෙමේ පව් කරන්නේද යහපත දක්නේය. යම්කලෙක වනාහි ඔහු විසින් කරණ ලද පාප කර්මය විපාක දේද එකල්හි පව්කම් කළ පුද්ගලතෙම පාපයෙහි විපාක දක්නේය.

5. යම්තාක් කල් කුශල කර්මය විපාක නොදේද, ඒතාක් කල් පාපකාරී පුද්ගල තෙමේද අකුශල විපාකවූ අවැඩ දක්නේය. යම්කලෙක වනාහි ඔහු විසින් කරණ ලද සුචරිතය විපාක දේද, එකල්හි කුශලකාරීවූ සත්පුරුෂතෙම ඉෂ්ටවිපාකයන් දක්නේය.

6. ඒ (සුලුවූ අකුශල කර්මය) (විපාකදීම වශයෙන්) නොඑන්නේයයි අකුශල කර්මය සුලුකොට නොසිතන්නේය. (අකුශල කර්මය ස්වල්පයයි නොසිතන්නේය) (එක එක) දිය බිඳ වැටීමෙන් දිය බඳුන යම්සේ පිරේද, එමෙන්ම මඳ මඳ කොටද පව් රැස් කරන අඥානතෙම අකුශලයෙන් පිරෙයි.

7. ඒ (සුලු කුශලය) (විපාකදීම් වශයෙන්) නොඑන්නේයයි කුශල කර්මය සුලුකොට නොසිතන්නේය. (කුශල කර්මය සුළුයයි නොසිතන්නේය) එක එක දිය බිඳ වැටීමෙන් කළය යම්සේ පිරේද, (එසේම) මඳ මඳ කොටද කුශල් රැස්කරන්නාවූ නුවණැත්තා කුශල කර්මයෙන් පිරෙන්නේය.

8. බොහෝ ධනය ඇති, කැටිව යන බොහෝ වෙළඳුන් නැති වෙළෙඳෙකු භය සහිත මඟ මෙන්ද ජීවත්වනු කැමති එකක්හු විස මෙන්ද අකුශල කර්මයන් දුරින් දුරුකරන්නේය.

9. ඉදින් අත්ලෙහි වනයක් නොවීනම් අත්ලෙන් විෂය ගන්නේය. විෂය තෙමේ වණ නැතියහු අනුව නොයන්නේය. එසේම නොකරන්නාහට අකුශලයෙක් නැත්තේය.

**10.** යම් පුද්ගලයෙක් ද්වෙෂයෙන් දූෂිත නොවූ (තරහ නැති) පව් නැති, පිරිසිදුවූ පුරුෂයෙකුට අපරාධ කෙරේද, ඒ පාපකර්මය තෙම උඩු සුළඟට දමන ලද ධූවිලි මෙන් (මෙලෝ හෝ පරලෝ හෝ විපාක දෙමින්) ඒ අනුවණයා පැසවන්නේය.

**11.** (යම් තැනක සිටියාවූ) එකෙක් පාපකර්මයෙන් මිදේද, එබඳුවූ භූමි ප්‍රදේශයක් නැත්තේය. ආකාශයෙහිදු නැත්තේය. මුහුද මැදද නැත්තේය. පර්වතයන්ගේ විවරයට වැදද පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදේශයක් නැත්තේය.

**12.** යම් තැනෙක්හි සිටි සත්වයා මරණය තෙම නොමඩීද එබඳු භූමි ප්‍රදේශයක් නැත. ආකාශයෙහිද නැත. මුහුද මැදද නැත. පර්වතයන්ගේ විවරයට වැදද නැත.

## දහවෙනි දණ්ඩ වර්ගය

**1.** සියලු සත්වයෝම වධබන්ධනාදියට තැතිගන්නාහ. සියල්ලෝම මරණයට බියවෙති. තමා උපමාකොට හිංසා නොකරන්නේය. අනුන් ලවා හිංසා නොකරවන්නේය.

**2.** සියලු සත්වයෝම වධබන්ධනාදියට බිය වෙති. සියල්ලන්ටම ජීවිතය ප්‍රියය. තමා උපමාකොට හිංසා නොකරන්නේය. අනුන් ලවාද හිංසා නොකරවන්නේය.

**3.** යම් පුද්ගලයෙක් තමාහට සුව කැමතිවූයේ සුව කැමති සත්වයන් දණ්ඩනයෙන් පෙළාද, හෙතෙම පරලොව සුව නොලබන්නේය.

**4.** යමෙක් තමහට සුව කැමතිවූයේ සුව කැමති සත්වයන් දඬුවමින් නොපෙළාද ඒ පුද්ගලතෙම පරලොව සුව ලබන්නේය.

**5.** කිසිවකුට පරුෂ වචනයක් නොකියව. (තා විසින් පරුෂ වචන) කියන ලද්දාවූ අන්‍යයෝ තට පෙරළා කියති. එසේම, එකටෙක කථාව දුක්ය. තට පෙරළා දඬුවම් ලැබෙයි.

**6.** ඉදින් (වටින්) කැඩූ ලොහොතලියක් මෙන් තාගේ සිත නිශ්ශබ්ද කෙළෙහි නම් නිවණට පැමිණියා නම් වෙහි. තට පෙරළා දෙසීම් නොවන්නේය.

7. යම්සේ ගොපලුතෙම දඬුයෙන් හරකුන් තණ බිමට පමුණුවාද, එපරිද්දෙන්ම ජරාවද මරණයද යන (මොහු දෙදෙන) සත්වයන්ගේ ජීවිතය ගෙන යන්නේය.

8. තවද පව්කම් කරන්නාවූ අනුවණ තෙම (එය) දනියි. ඒ නුවණ නැත්තේ ස්වකීය පාපකර්මයන් ගින්නෙන් දනලද්දක්හු මෙන් තැවෙයි.

9. යමෙක් දඬුවම් නොකළ යුතු, ද්වේෂ නොකරණ පුද්ගලයන් විෂයෙහි අපරාධ කෙරේද, හෙතෙම දශවිධ දුක්ඛ කාරණයන් අතුරෙන් එක්තරා දුක්ඛකාරණයකට වහාම පැමිණෙන්නේය.

10. දැඩිවූ (කායික) වේදනාවකට හෝ ධනහානියකට හෝ ශරීර භෙදයකට හෝ නැවත බලවත් රෝගයකට හෝ උන්මාදයට හෝ පැමිණෙන්නේය.

11. රජුන් කෙරෙහි වන්නාවූ උවදුරකට හෝ දරුණුවූ (අභ්‍යාඛ්‍යානයකට) චෝදනාවකට හෝ නෑයන්ගේ විනාශයට හෝ භෝගයන්ගේ විනාශයට හෝ පැමිණෙන්නේය.

12. ඔහුගේ ගෙවල් පාවක (ශුද්ධකරන්නා) නම්වූ ගින්න දවයි. ඒ අඥාන පුද්ගලතෙම මරණින් මතු නරකට පැමිණෙන්නේය.

13. තරණය නොකළ සංකා ඇති මිනිසා නග්නව (නිර්වස්ත්‍රව) කරණ තපස්ද ශුද්ධ නොකෙරෙයි. ජටාවෝ ශුද්ධ නොකෙරෙති. ඇඟ මඩ ගැල්වීමද ශුද්ධ නොකෙරෙයි. අහර නොවළඳා කරණ තපස්ද ශුද්ධ නොකෙරෙයි. ආගන්තුක ධූලි දැරීම ශරීරයෙහි දැලි ඉලීම යන මේද උක්කුටුකයෙන්ම (වකගැසී) හිඳ කරණ තපස්ද යන මොහුද ශුද්ධ නොකෙරෙති.

14. සැරසුනු පුද්ගල තෙමේද ඉදින් ධර්මයෙහි යෙදී පවතීද, ශාන්තද, දැමුනේවීද, (සිව්මග නියමයෙන්) නියතද බඹසර ඇත්තේද, සියලු සතුන් කෙරෙහි දණ්ඩනය (හිංසා) බහා තබා වෙසේද හෙතෙම බ්‍රාහ්මණයයි කියයුතුය. හෙතෙම ශ්‍රමණයයිද කියයුතුයි. භික්ෂුයයිද කියයුතුවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

15. කසය වළහන්නාවූ උතුම් අසෙකු මෙන් යම් මහණෙක්තෙම නින්දාව ප්‍රබොධ නොකෙරේද, (පවෙහි) ලජ්ජාවෙන් (අකුශල විතර්කයන්) දුරු කරණ කිසි පුරුෂයෙක් තෙම ලෝකයෙහි ඇත්තේය.

16. කසයෙන් පහරණලද උතුම් අශ්වයෙකු මෙන් වීර්යයවත් වවු. සසර කලකිරීම් ඇත්තාහු වවු. ශ්‍රද්ධාවෙන්ද ශීලයෙන්ද වීර්‍ය්‍යයෙන්ද සමාධියෙන්ද විදර්ශනා ප්‍රඥාවෙන් (ධර්මානුකූල විසඳීමෙන්) ද සමන්විතව සම්පූර්ණවූ විජ්ජාචරණ ඇතිව බොහෝවූ මේ සංසාර දුක දුරුකරවු.

17. දියාලුවෝ දිය ගෙන යත්මය. ඊ වඩුවෝ ඊ නමත්. වඩුවෝ දඬු නමත්. මනාවත් පිළිවෙත් ඇත්තෝ තමා (සිත) දමනය කරත්.

## 11. ජරා වර්ගය

1. නිතොර ඇවිලගෙණ දිලිසෙන කල්හි සිනාවක්, සතුටක්, කවරේද? අඳුරෙන් (අවිද්‍යාන්ධකාරයෙන්) වළඳනා ලද්දාවූ තෙපි මාර්ගඵල ප්‍රඥායයි කියනලද ප්‍රදීපය කුමට නොසොයවූද?

2. යමක (මේ ශරීරයාගේ) නිත්‍යවූ පැවැත්මෙක් නැද්ද, රෝග සමූහයවූ අඹනලද්දාවූ, ගිලන්වූ, බොහෝදෙනා විසින් (සුභය සුඛයයි) කල්පනාකරණ ලද්දාවූ, මේ ශරීරය බල.

3. මේ රූපය ඉතා දිරාගියේය. රෝගයන්ට (නිවාසස්ථාන හෙයින්) කුඩුවක් බඳුයි. වහා නැසෙන සුලුය. මේ කුණුකය නොබෝ කලකින් බිඳෙන්නේය. (කුමක් හෙයින්ද යත්?) යම් හෙයිකින් ජීවිතය මරණයම අන්තකොට ඇත්තේද එහෙයිනි.

4. සරත් කාලයෙහි ඒ ඒ තත්හි දමනලද්දාවූ-ලබුවැනිවූ, කොබෝවන් පැහැ ඇත්තාවූ, යම් මේ ඇට ඇද්ද, ඒ දැක කවර නම් කාමරතියක් වේද?

5. යම් තැනෙක්හි ජරාවද මරණයද (නවවිධ) මානයද ගුණමකු බවද බහන ලදද, මසින් හා ලෙහෙයෙන් ගල්වන ලද නුවරක් ඇට වලින් කර තිබේ.

6. විශේෂයෙන් විසිතුරු කරණ ලද්දාවූ රජුගේ මගුල් රථයෝද දිරීමට පැමිණෙති. නැවත මේ ශරීරයද දිරීමට එළඹෙයි. බුද්ධාදී සත්පුරුෂයන්ගේ ධර්මය වනාහි දිරීමට නොපැමිණෙන්නේය. බුද්ධාදීහු සත්පුරුෂයන් හා සමග ඒකාන්තයෙන් (මෙසේ) කියති.

7. අල්පශ්‍රැතවූ (අසා බලා නොදත්) මේ පුද්ගලතෙමේ ගොනෙකු මෙන් මුහුකරන්නේය. ඒ මහණහුගේ ශරීර මාංශයෝම වැඩෙත්. ඕහට ප්‍රඥාතොම නොවැඩෙයි.

8. නැවත නැවත උත්පත්තිය (යම් හෙයකින්) දුක්ද (එහෙයින්) මේ ආත්මභාව සංඛ්‍යාත ගෙය කරන්නහු සොයන්නාවූ මම නොයෙක් (කෙළ ලක්‍ෂ ගණන්යයි කියනලද) ඉපදීම් ඇති සංසාරයෙහි (ඒ ශූන්‍ය) නොලබන්නෙම් (චුති ප්‍රතිසන්ධි වශයෙන්) දිව ඇවිද්දෙමි.

9. ගෙය කරණ වඩුවා දක්නා ලද්දෙහිය. නැවත ගෙයක් නොකරන්නෙහිය. තාගේ සියලු පරාළයෝ බිඳින ලදහ. ගෙයි කැණිමඬල විසුරුවන ලදී. (මාගේ) සිත නිවනට වනි. තෘෂ්ණා ක්ෂයයයි කියනලද අර්හත්වයට පැමිණියෙමි.

10. බඹසර නොවැස, යෞවන වයස්හී ධනය නොලැබ මසුන් නැති විලෙක මඩ පිට (හිඳ තැවෙන) මහලු කොස්ලිහිණියන් මෙන් තැවෙන්නාහුය.

11. බඹසර නොවැස, යෞවන වයස්හී ධනය නොලැබ මසුන් නැති විලෙක මඩ පිට (හිඳ තැවෙන) මහලු කොස්ලිහිණියන් මෙන් තැවෙන්නාහුය. දුන්නෙන් හරණලද ශර මෙන් පෙර වින්දාවූ සැපතට ශෝක කරමින් හොවිති.”

## 12. ආත්ම වර්ගය

1. ඉදින් ආත්මය තමහට ප්‍රියයයි දන්නේ නම් ඒ ආත්මය (තුන්වයස්හි) සුරක්ෂිත කොට රක්නේය. ප්‍රාඥතෙම තුන්වයසින් එක්තරා වයසක (අකුසලින් දුරුකොට ආත්මය රකින්නේය.)

2. පළමුකොට තමාම සුදුසු ගුණයෙක්හි පිහිටුවන්නේය. අනතුරුව අනිකක්හට අනුශාසනා කරන්නේය. එබඳු ප්‍රාඥතෙම නොකෙලෙසෙන්නේය.

3. අනිකෙකුහට යම්සේ අනුශාසනා කෙරේද? තමාටද ඉදින් එසේම කරන්නේය. ඒකාන්තයෙන් තෙමේ මනාව දමනය කරන්නේය. තෙමේ නම් දමනයට දුෂ්කරමය.

4. තෙමේම තමහට පිහිටවන්නේය. අන්‍යවූ කවරෙක් නම් පිහිට වන්නේද? මනාකොට දැමුනාවූ තමා විසින් (පරම) දුර්ලභවූ (අර්හත් ඵලයයි කියන ලද) ප්‍රතිෂ්ඨාව (පිහිට) ලබන්නේය.

5. තමා කෙරෙන්ම (ජනිතවූ) උපන්, තමා කෙරෙන්ම හටගත්, තමා විසින්ම කරණ ලද්දාවූ අකුශල කර්මය තෙම පාෂාණමයවූ මැණික (කඩ කඩ කරණ) විදුර මෙන් ඒ අඥානයා මඬනේය.

6. යමෙකුගේ බොහෝවූ දුශ්ශීල භාවය සල්රුකක් වැළඳගෙණ සිටි මාලුවා වැලක මෙන් ඒ දුශ්ශීලයා වැළඳගෙණ සිටියේ වේද ඒ තමාගේ සතුරාට යම්සේ අනර්ථයක් කරනු කැමති වේද, ඒ (දුශ්ශීල) තෙමේද තමහට එසේම (අනර්ථව) කරන්නේය.

7. යම් කර්මකෙනෙක් සාවද්‍ය හෙයින් අසාධූහු (අයහපත්) ද, අපායට පමුණුවන් හෙයින් තමහට අහිතයෝද (එබඳු අකුශලයෝ) සුවසේ කටහැක්කාහ. යම් කර්මයක් (සුගතියට පමුණුවන හෙයින්) තමහට හිතද (නිරවද්‍ය බැවින්) සාධු (යහපත්) ද ඒ කුශල කර්මය අතිශයින් දුෂ්කර (නොකටහැකි) යි.

8. යම් (අඥාන) පුද්ගලයෙක් ලාමකවූ දෘෂ්ටිය නිසා නිකෙලෙස්වූ දැහැමින් ජීවත්වන සුළුවූ (බුද්ධාදී) ආර්යයන්ගේ අනුශාසනාව වළකාද උන ගසේ පීදීම මෙන් ආත්ම වධය පිණිස නිපදනේය.

9. තමා විසින් අකුශල කර්මයක් කරණ ලද්දේ නම් තෙමේම් කෙලෙසෙන්නේය (හෙවත් තැවෙන්නේය.) තමා විසින් අකුශල කර්මයක් නොකරණ ලද්දේ නම් තෙමේම ශුද්ධ

වන්නේය. ශුද්ධියද, අශුද්ධියයද තම තමන්ටමය. අනිකෙක් අනිකෙකු ශුද්ධකරන්නේ නොවේ.

10. බොහෝවූ පරාර්ථයෙන් ආත්මාර්ථයෙහි නොපිරිහෙලන්නේය. ආත්මාර්ථය මේයයි දැන ස්වාර්ථයෙහි (සිය වැඩෙහි) යුක්තවන්නේය.”

## 13 ලෝක වර්ගය

1. හීනවූ (රූපාදී කාමගුණ) ධර්මයන් සේවනය නොකරන්නේය. ප්‍රමාදය හා එක්ව නොවසන්නේය. මිථ්‍යාදෘෂ්ටියද සේවනය නොකරන්නේය. ලොව වඩන්නෙක් නොවන්නේය.

2. ගෙපිළිවෙළින් පිඬු සිඟීමෙහි නොපමා වන්නේය. ඒ සුචරිත ධර්මය සකස්කොට කරන්නේය. ධර්මයෙහි හැසිරෙන මහණතෙම මෙලොව්හිද පරලොව්හිද සුවසේ වසන්නේය.

3. සුචරිත ධර්මය මනාකොට පුරන්නේය. දුශ්චරිත ධර්මය නපුරුකොට නොපුරන්නේය. ධර්මයෙහි හැසිරෙන මහණතෙම මෙලොව්හිද පරලොව්හිද සුවසේ වසන්නේය.

4. දිය බුබුලක් යම්සේ බලාද මිරිඟු යම්සේ බලාද එපරිද්දෙන්ම ලෝකය (නුවණැසින්) බලන මහණහු මරණ රජතෙම නොදක්නේය.

5. යමක (ආත්මභාවයෙක්හි) අඥානයෝ (දෘෂ්ටිවශයෙන්) ගැලෙද්ද, නුවණැත්තවුන්ට ඇලීමෙක් නැද්ද විසිතුරුවූ රාජ රථයක් වැනිවූ මේ ආත්මභාවය එවු, බලවු.

6. යම් පුද්ගලයෙක් පෙර ප්‍රමාදව පසුව නොපමාවේද ඒ පුද්ගලතෙම වළාපටලයකින් මිදුනාවූ පූර්ණචන්ද්‍රයා මෙන් මේ ලෝකය ඥානාලෝකයෙන් බබුලුවන්නේය.

7. යම් පුද්ගලයක්හු විසින් කරණලද අකුශල කර්මය (අර්හත්මාර්ග චිත්තය හා යෙදුනු චේතනායි කියන ලද කුශලයෙන්) මුවාවූයේද ඒ පුද්ගලතෙම වළාපටලකින් මිදුණු (පුන්) සඳ මෙන් මේ ලෝකය බබුලුවන්නේය.

8. මේ ලෞකික මහජන තෙමේ (නුවණැස් නැති හෙයින්) අන්ධවූයේය. (මේ මහා ජනයා අතුරෙහි) ස්වල්පවූ සත්වයෙක් අනිත්‍යාදී වශයෙන් (පඤ්චස්කන්ධය) දක්නේය. දැලින් මිදුණු වටුවෙකු මෙන් ස්වල්පවූ සත්වයෙක්ම ස්වර්ගයට යන්නේය.

9. හංසයෝ සූර්යය මාර්ගයෙහි යෙති. යොගීහු ඍද්ධියෙන් ආකාශයෙහි යෙති, ප්‍රාඥයෝ සේනාව සහිතවූ මාරයා පරදවා ලෝකයෙන් නික්මෙති.

10. එකම (වාක්සත්‍ය) ධර්මය ඉක්මවූ, බොරු (බොහෝකොට) කියන සුලුවූ තරණය නොකළ පරලෝ ඇති සත්වයා විසින් නොකටහැකි අකුශලයෙක් නම් නැත.

11. මසුරෝ ඒකාන්තයෙන් දෙව්ලොවට නොයති, අඥාන ජනයෝ ඒකාන්තයෙන් දානයට ප්‍රසංශා නොකරති. දානය අනුමෝදන් වන්නාවූ ප්‍රඥාවූ ඒ පුරුෂතෙම වනාහි ඒ කුශල කර්මයෙන්ම පරලොවද සැප ඇත්තෙක් වන්නේය.

12. මුළු පොළොව (සක්විති) රජකමටද ස්වර්ගයට යාමටද වඩා මේ සියලු ලෝකයෙහිද අධිපති භාවයටද වඩා සෝවාන් ඵලයම උතුම්."

## 14 බුද්ධ වර්ගය

1. යමකු (බුදු කෙනෙකුන්) වසින් දිනනලද කේලශ සමූහය නපුරුකොට දිනන ලද්දේනම් නොවේද, ඒ බුදුන් විසින් දිනනලද කෙලෙස් ලෝකයෙහි කිසි එකද ක්ලේශයෙක් අනුව නොයේද (ii) කෙළවරක් නැති ගෝචර ඇති රාගාදී එකද කාරණයක් නැති (ii) ඒ බුදුන් කවර මඟකින් තොපගේ වසයට ගෙණයවුද,

2. යම් සම්බුදු කෙනෙකුන් (කිසි භවයකට පමුණුවන්නට) ජාලිනී නම් වූ විසත්තිකා නම්වූ රූපතෘෂ්ණාදී තෘෂ්ණාවක් නැත්තේද (මෙහි මේ වර්ගයේ 1 (ii) ඡේදය යෙදිය යුතුයි.)

3. යම් ප්‍රාඥ කෙනෙක් ධ්‍යානයෙහි නියුක්තද, නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනාහුද ස්මෘතිමත්වූ ඒ සම්බුදුන්ට දෙවියෝද කැමතිවෙති.

4. මිනිසත් බව ලැබීම දුෂ්කරය, සත්වයන්ගේ ජීවිතය දුක්ය, ධර්ම ශ්‍රවණය දුර්ලභය, බුදුවරයන්ගේ ඉපදීම දුර්ලභය.

5. සියලු අකුශල කර්මයාගේ (පව්) නොකිරීමද, සියලු කුශල කර්මයාගේ (පින්) ඉපදවීමද තමාගේ සිත පිරිසිදු කිරීමද, යනමේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනයයි.

6. ඉවසීමවූ ක්‍ෂාන්ති තොමෝ උතුම්වූ තපසෙක, සියලු බුදුවරයෝ නිර්වාණය උතුම්යයි කියති. පරහට හිංසා කරණ සුලුවූයේ පැවිද්දෙක් නොවෙයි, පරහට පීඩා කරන්නේ මහණෙක් නොවෙයි.

7. උපවාදයක් (බිණීමක්) නොකිරීමද, උපඝාතයක් (හිංසාවක්) නොකිරීමද, ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලයෙහි සංවරයද ආහාරයෙහි පමණ දන්නා බවද (ගමට) දුරුවූ සේනාසනයන්හි ඇල්මද (රූපාරූප අෂ්ට) සමාපත්තියෙහි සතතයෙන් යෙදීමද යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනයයි.

8. කහවණු වැස්සෙනුදු (වස්තු, ක්ලේශ) කාමයන්හි තෘප්තියක් නැත. කාමයෝ ආශ්වාද රහිතයහ. (බොහෝ) දුක් ඇත්තාහ, නුවණැති මහණතෙම මෙසේ දැන

9. හෙතෙම දිව්‍යවූ පඤ්චකාමයෙහිදු ඇල්මකට නොපැමිණෙන්නේය. ඒ බුද්ධ ශ්‍රාවකතෙම (තෘෂ්ණාව) ගෙවීමෙහි ඇලුනේ වන්නේය.

10. භයින් තැතිගත් බොහෝ මිනිස්සු පර්වතයන්ද වනයන්ද ආරාමයන්ද චෛත්‍ය වෘක්ෂයන්ද ඒකාන්තයෙන් සරණ යන්නාහ.

11. මේ සියලු සරණයම ක්ෂෙම නොවෙයි. උත්තමද නොවෙයි. මේ (පවර්තාදී) සරණයට පැමිණ සියලු (සංසාර) දුක්ඛයෙන් (සත්වතෙම) නොමිදෙන්නේය.

12. යමෙක් බුදුන්ද ධර්මයද සංඝයාද සරණ ගියේද චතුරාර්යය සත්‍යයන් මනාකොට විදර්ශනා ඥානයෙන් දක්නේවේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. දුක්ඛසත්‍යයද, සමුදය සත්‍යයද, (ඒ දුක්ඛයාගේ හික්මීමට කාරණවූ) නිරෝධ සත්‍යයද, දුක්ඛනිරොධයට පමුණුවන්නාවූ ආර්යය අෂ්ටාංගික සංඛ්‍යාත මාර්ග සත්‍යයද (මනාකොට නුවණැසින් දක්නේවේද)

14. මේ සරණය ක්‍ෂෙමය. මේ සරණය උතුම්ය. මේ සරණයට පැමිණ සියලු සංසාර දුක්ඛයෙන් සත්වතෙම මිදෙන්නේය.

15. උතුම් පුරුෂවූ (සම්‍යක් සම්බුද්ධ) තෙමේ දුර්ලභය. ඒ (සම්‍යක් සම්බුද්ධ) තෙම හැමතන්හිම නූපදනේය. ඒ ප්‍රාඥතෙම යම් කුලයක උපදනේවේද, ඒ කුලය සුවයට පැමිණෙන්නේය.

16. බුදුවරයන්ගේ ඉපැත්ම සුවය. ධර්ම දේශනාවද සුවය සංඝයාගේ සමගිබව සුවය. සමගවුවන් (භික්‍ෂුන්) ගේ තපසද සුවය.

17. පූජාවට සුදුසුවූ, (ත්‍රිවිධ) ප්‍රපඤ්චයන් මනාකොට ඉක්මවූ, ඉක්මවූ ශෝක වැලපීම් දුක්ඛයන් ඇති බුදුවරයන්ද, නැතහොත්, බුදු සවුවන්ද යමෙක් පුදාද?

18. නිවීගිය සිත් ඇති, කොයිනුත් බිය නැති, එබඳුවූ උන්වහන්සේලා පුදන්නහුගේ පින්කම් මෙතෙකැයි ගණින්නට කිසිවෙකු විසිනුදු නොහැකි.”

## 15 සුඛ වර්ගය.

1. වෛරීවූ මනුෂ්‍යයන් අතුරෙහි, අවෛරීවූවෝ (අපි) මනුෂ්‍යයන් වෛරීව පවත්නා කල්හි අවෛරීව වසමෝද, (එසේවූ අපි) ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වෙමු.

2. ආතුරවූ මනුෂ්‍යයන් අතුරෙහි ආතුරනොවූ (අපි) මනුෂ්‍යයන් ආතුරව පවත්නාකල්හි ආතුර නොව වසමෝද (එසේවූ අපි) ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වෙමු.

3. (පඤ්චකාම ගුණ සෙවීමෙහි) උත්සාහවත්වූ මනුෂ්‍යයන් අතුරෙහි නිරුත්සාහවූ (අපි) මනුෂ්‍යයන් උත්සාහවත්ව

පවත්නාකල්හි නිරුත්සාහව වසමෝද (එසේවූ අපි) සුවසේ ජීවත් වෙමු.

**4.** යම්බඳුවූ අපට රාගාදී කිසි පළිබොධයක් නැද්ද (එසේවූ අපි) ඒකාන්තයෙන් සුවසේ ජීවත්වෙමු. ආභස්සර බ්‍රහ්මයන් මෙන් ප්‍රීතියම ආහාරකොට ඇත්තෝවෙමු.

**5.** අනුන් පරදවන්නේ වෛරීන් ඇති කෙරෙයි. අනුන් විසින් පරදවන ලද්දේ දුකසේ වසන්නේය. සන්හුන් රාගාදී ක්ලේශයන් ඇති ක්ෂීණාශ්‍රවතෙම ජය පරාජය දෙකම හැර සුවසේ වසන්නේය.

**6.** රාගය හා සමවූ ගින්නෙක් නැත. ද්වේෂය හා සමවූ අපරාධයක් නැත. පඤ්චස්කන්ධයන් හා සමවූ දුක්ඛ කෙනෙක් නැත. නිර්වාණයට වැඩි සුවයක් නැත.

**7.** රෝගයෝ සා දුක ප්‍රධානකොට ඇත්තාහ. දුක්ඛයෝ පඤ්චස්කන්ධයන් ප්‍රධානකොට ඇත්තාහ. මේ දෙක තත්වූ පරිද්දෙන් දැන (ප්‍රාඥයෝ නිවන් පසක් කරති) නිර්වාණය උතුම්වූ සුවයයි.

**8.** සියලු ලාභයෝ නිරෝගිබව ප්‍රධානකොට ඇත්තාහ. ධනය සතුට ප්‍රධානකොට ඇත්තාහ. නෑයෝ විශ්වාසය ප්‍රධානකොට ඇත්තාහ. නිර්වාණය උතුම් සුවයකි.

**9.** ප්‍රකර්ෂ විවේකයාගේ (තද විවේකයේ) රසයද, ක්ලේශව්‍යුපශමයාගේ පව් සංසිඳවීමේ රසයද බී (නවලෝකෝත්තර) ධර්ම වශයෙන් උපන් ප්‍රීතිරසය බොන්නාවූ ක්ෂීණාශ්‍රවතෙම පීඩා නැත්තේද පව්නැත්තේද වෙයි.

**10.** (බුද්ධාදී) ආර්යයන්ගේ දැක්ම මැනවි. ඔවුන් හා සමග විසීමද හැමකල්හි සුවය. අඥානයන්ගේ නොදැක්ම හේතුකොටගෙණ සතතයෙන්ම සත්වතෙම සුඛිත වන්නේය.

**11.** ඒ එසේ මැයි. බාලයන් හා එක්ව ඇවිදිනා සුලු වූයේ දීර්ඝ කාලයක් ශෝක කරන්නේය. බාලයන් හා එක්ව විසීම සතුරෙකු සමග (වාසයක්) මෙන් සැම කල්හි දුක්ය. ප්‍රාඥතෙමේද ප්‍රියවූ නෑයන්ගේ සමාගමයක් මෙන් සුවවූ සහවාස ඇත්තේය.

12. එහෙයින් ධීරයාද, ප්‍රාඥයාද, බහුශ්‍රැතයාද ප්‍රතිපත්තිධුරය උසුලන්නාද, ව්‍රත සම්පන්නයාද, ආර්යයාද යන සුන්දරවූ ප්‍රඥා ඇති එබඳුවූ ඒ සත්පුරුෂයා චන්‍ද්‍රතෙමේ ආකාශය (සේවනය කරන්නාක්) මෙන් සේවනය කරව්.

## 16 ප්‍රිය වර්ගය.

1. තමා නොයෙදියයුතු තැන යොදන්නාවූද, යෙදිය යුතු තැන නොයොදන්නාවූද පුද්ගලතෙම අර්ථය (යහපත) හැර ප්‍රියයම ගන්නාසුලුවූයේ ආත්මාර්ථකාමියා පතන්නේය.

2. ප්‍රියයන් හා ද අප්‍රියයන් හා ද කිසිකලෙක්හිදු (තෘෂ්ණා ආශ්‍රය වශයෙන්) සමාගමය නොකරන්නේය. (කුමක් නිසාදයත්) ප්‍රියවූ සත්ව (සංස්කාරය)න්ගේ නොදැක්ම දුක්ය. අප්‍රියවූ සත්ව (සංස්කාරය)න්ගේ දැක්ම දුක්ය.

3. එහෙයින් (කිසි සත්වයෙක්වත් සංස්කාරයක්වත්) ප්‍රිය නොකරව්. ඒ එසේ මැයි. ප්‍රියයන්ගේ වියෝගය ලාමකයි. යම් (රහත්) කෙනෙකුන්ට ප්‍රියවූ හෝ අප්‍රියවූ වස්තුවක් නැද්ද, ඔවුන්ට (අභිධ්‍යාදීකාය) ග්‍රන්ථයෝ (ගැටලු) නැත්තාහ.

4. ශෝකය ප්‍රියවූ සංස්කාරයන් නිසාම උපදනේය. භය ප්‍රියවූ සංස්කාරයන් නිසා උපදනේය. ප්‍රිය වස්තුවෙන් මුක්තවූ සිත් ඇත්තාහට ශෝකයෙක් නැත. භය කොයින්ද?

5. ශෝකය ප්‍රේමය නිසාම උපදනේය. භය ප්‍රේමය නිසාම උපදනේය. ප්‍රේමයෙන් මිදුණු සිත් ඇත්තාහට ශෝකයක් නැත. භයක් කොයින්ද?

6. ශෝකය පඤ්චකාම ගුණ රතිය නිසා උපදනේය. භය පඤ්චකාම ගුණ රතිය නිසා උපදනේය. පඤ්චකාම ගුණරතියෙන් මිදුණු සිත් ඇත්තාහට ශෝකයක් නැත. බියක් කොයින්ද?

7. ශෝකය කාමයන් නිසාම උපදනේය. භය කාමයන් නිසාම උපදනේය. කාමයන්ගෙන් මිදුණු සිත් ඇත්තාහට ශෝකයක් නැත. බියක් කොයින්ද?

8. ශෝකය තෘෂ්ණාව නිසාම උපදනේය. භය තෘෂ්ණාව, නිසාම උපදනේය. තෘෂ්ණාවෙන් මිදුණු සිත් ඇත්තාහට ශෝකයක් නැත. භයක් කොයින්ද?

9. (චතුපාරි ශුද්ධි) ශීලයෙන් හා (මාර්ගඵල සම්ප්‍රයුක්තවූ) සම්‍යක් දෘෂ්ටියෙන් ද යුක්තවූ (නවලොකොත්තර) ධර්මයෙහි පිහිටියාවූ (සත්‍යඥානයෙන්) සත්‍යවාදීවූ තමාගේ කාර්යය කරන්නාවූ ඒ ක්ෂීණාශ්‍රවයා (ලෞකික) මහජනතෙම ප්‍රිය කරන්නේය.

10. නිර්වාණයෙහි (කත්තුකම්‍යතා කුසලච්ඡන්ද වශයෙන්) උපන් ඡන්දය ඇතියේ, (යටතුන් මග හා තුන්පල) සිතින් ස්පර්ශ කෙළේත්වේද, රූපදීපඤ්චකාමයෙහිද නොඇලුණු සිත් ඇත්තේවේද (හෙතෙම) උද්ධං සෝතයයි කියනු ලැබේ.

11. බොහෝකල් විදේශයෙහි විසූ පුරුෂයෙකු දුර රටකින් සුවසේ ආවහු (දැක) නෑයෝද මිත්‍රයෝද, යහලුවෝද, ඔහුගේ ඊමට යම්සේ සතුටු වෙද්ද?

12. එපරිද්දෙන්ම කරණලද පින්කම් ඇති (පුරුෂයාද) මෙලොවින් (මිය) පරලොවට ගියහු (ඔහු) කළ කුශලයෝ දුර සිට ආ ප්‍රිය නෑයෙකු (පිළිගන්නා නෑයන්) මෙන් පිළිගන්නාහ.

## 17 ක්‍රොධ වර්ගය

1. ක්‍රොධය දුරු කරන්නේය. මානය විශේෂයෙන්ම පහකරන්නේය. සියලු දශවිධ සංයොජනය (බැඳුම්) ඉක්මවන්නේය. නාම රූප දෙක්හි ඇලුම් නොකරන්නාවූ (රාගාදි) කෙලෙසුන් නැති (හෙයින්) ඒ පුද්ගලයා (කායික චෛතසික) දුක්ඛයෝ අනුව නොපවත්නාහ.

2. යම් පුද්ගලයෙක් තෙම ඒකාන්තයෙන් උපන්නාවූ ක්‍රෝධය භ්‍රමණය වන රථයක් මෙන් වළකාද, ඒ පුද්ගලයා මම රථාචාර්යයයි කියමි. අන්‍යවූ සාරථී ජන තෙම රැහැණ ගන්නා නම් වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. ක්‍රොධ ඇති පුද්ගලයා ක්‍රොධ නොකිරීමෙන් දිනන්නේය. නපුරු ගුණ ඇත්තාහු මනා ගුණයෙන් දිනන්නේය. තද මසුරා දීමෙන් දිනන්නේය. බොරු කියන්නා සත්‍යයෙන් දිනන්නේය.

4. සත්‍ය වචනයක්ම කියන්නේය. අනුන්ට නොකිපෙන්නේය. ඉල්වන ලදුයේ (දෙය ධර්මය) ස්වල්ප කල්හිදු (එයින්) මඳ දෙයකුදු දෙන්නේය. මේ තුන් කාරණයෙන් දෙවියන්ගේ සමීපයට (ප්‍රතිසන්ධි වශයෙන්) යන්නේය.

5. යම් (අශෛක්ෂ) මුනිකෙනෙක් (අනුන්ට) හිංසාවක් නොකෙරෙත්ද, නිතොර කයින් සංවෘතයෝ (සංවරද) ඔහු යම් තැනකට ගොස් (සත්වයෝ) ශෝක නොකෙරෙත්ද, චුති රහිතවූ ඒ ස්ථානයට යෙති.

6. හැම කල්හිම (ක්ලේශ නිද්‍රාවෙන්) නොනිදන්නාවූ දිවාරාත්‍රියෙහි (ත්‍රිවිධ ශික්ෂාවෙන්) හික්මෙන්නාවූ (ක්ලේශ) පරි නිර්වාණයෙහි ඇලුණවුන්ගේ (යෝගාවචරයන්ගේ) ආශ්‍රවයෝ නැසීමට යන්නාහ.

7. අතුලය, (නින්දා ප්‍රශංසා යන) මෙය පුරාතනය, මෙය අදවූ දෙයක්ම නොවෙයි. තුෂ්ණීම්භූතව හුන්නහුටද නින්දා කෙරෙති. බොහෝ කොට කියන්නහුටද නින්දා කෙරෙති. මඳකොට කියන්නහුටද නින්දා කෙරෙති. මේ (සත්ව) ලෝකයෙහි නින්දා නොකරණ ලද්දෙක් නැති.

8. ඒකාන්තයෙන් නින්දා කරණ ලද පුරුෂයෙක් හෝ ඒකාන්තයෙන් ප්‍රශංසා කරණ ලද පුරුෂයෙක් හෝ අතීතයෙහිද නොවීය. අනාගතයෙහිද නොවන්නේය. දැන් වර්තමාන කාලයෙහිද නැත්තේය.

9. ඉදින් ප්‍රාඥයෝ දවස දවස විමසා යමෙකුට ප්‍රශංසා කෙරෙද්ද, සිදුරු නැති දිවි පැවතුම් ඇති, (විදර්ශනා) ඥානයෙන් යුක්තවූ ප්‍රඥාවෙන් හා ශීලයෙන්ද යුක්ත ඔහු.

10. දඹරත්රන් පිඩකට මෙන් ඔහුට නින්දා කරන්ට කවරෙක් සුදුසුද, දෙවියෝද ඒ මහණහුට ප්‍රශංසා කෙරෙති. බ්‍රහ්මයා විසිනුදු ප්‍රශංසා කරණ ලද්දේම වේ.

**11.** ත්‍රිවිධ කාය දුශ්චරිතය රක්නේය. කයින් සංවරයෙහි පිහිටියෙක් වන්නේය. කායදුශ්චරිතය දුරුකොට කායද්වාරයෙන් සුචරිතය පුරන්නේය.

**12.** (චතුර්විධ) වාග් දුශ්චරිතය රකිනේය. වචනයෙන් සංවරයෙහි පිහිටියෙක් වන්නේය. වාග් දුශ්චරිතය දුරුකොට වාග්ද්වාරයෙන් සුචරිතය පුරන්නේය.

**13.** (ත්‍රිවිධ) මනෝ දුශ්චරිතය රක්නේය. සිතින් සංවරයෙහි පිහිටියෙක් වන්නේය. මනෝ දුශ්චරිතය දුරුකොට සිතින් සුචරිත පුරන්නේය.

**14.** යම් ප්‍රාඥ කෙනෙක් කයින් සංවෘතයෝද වචනයෙන් සංවෘතයෝද සිතින් සංවෘතයෝද ඒ ප්‍රාඥයෝ ඒකාන්තයෙන් මනාව සංවර වූයෝය.

## 18 මල වර්ගය

**1.** දැන් (පැසී වියලි) පරණලා පතක් මෙන් වෙහි. යමදූතයෝද තා කරා පැමිණ සිටියහ. මරණ මුඛයෙහිද සිටියෙහි. තට මාර්ගෝපකරණය කුදු නැත.

**2.** ඒ තෝ තමහට පිහිටක් කර, වහාම වීර්යකර, නුවණැති වෙව. (ii) නසනලද (රාගාදී) මල ඇත්තේ (එහෙයින්ම) කෙලෙස් නැත්තේ ශෝභාවත්වූ සුද්ධාවාස භූමියට පැමිණෙන්නෙහිය.

**3.** දැන් ගියාවූ වයස් ඇත්තේද, වෙහිය. යමයා සමීපයට පැමිණියේ වෙහි. තට අතුරෙහි වාසයකුදු නැත. තට මාර්ගෝප-කරණද නැත.

**4.** ඒ තෝ (2 (ii) ඡෙදය යෙදිය යුතුයි) ජාති ජරාවන්ට නොඑලඹෙන්නෙහිය.

**5.** ප්‍රාඥතෙම පිළිවෙළින් ක්‍ෂණ ක්‍ෂණයෙහි මද මද තමාගේ රාගාදී මල (රන්) ස්වර්ණකාරයෙකු රිදියේ දෝෂය මෙන් දුරු කරන්නේය.

**6.** යකඩින්ම නැංගාවූ මලය. එයින්ම නැඟී ඒ යකඩම යම්සේ කාද එසේම සිව්පසය නොසෝදා (ප්‍රත්‍යවෙක්‍ෂාකොට)

පරිභෝග කරණ ප්‍රඥාවෙන් ඉක්මුණු මහණහු, තමන්ගේ ඒ පාපකර්මයෝ (ඔහු) දුගතියට පමුණුවන්නාහ.

7. හදාරණ ලද ශාස්ත්‍රයෝ නොපිරිවීම මලකොට ඇත්තාහ. ගෘහයෝ නොනැංවීම මල කොට ඇත්තාහ. (ශරීර) වර්ණයට කුසීත බව මලයි. (යම් කිසිවක්) රක්නාහට ප්‍රමාදවීම මලයි.

8. ස්ත්‍රියකට දුශ්චරිතය මලයි. දන් දෙන්නාට මසුරු සිත මලයි. අකුශල ධර්මයෝ මෙලොවද පරලොවද මලයෝය.

9. මහණෙනි, ඒ සියලු මලට වඩා අධිකතර මලයක් (තොපට කියමි) අවිද්‍යා (ඇත්ත නොදැනීම) තොමෝ උතුම්වූ මලයෙක. මේ මලය දුරුකොට නිර්මලව.

10. (පාපයෙහි) හිරිඔතප් නැත්තාවූ ගසා කෑමෙහි ශූරවූ කවුඩෙකු වැනිවූ. (අනුන්ගේ) ගුණමකුවූ ගෙන් ගෙට දිවන සුලුවූ, බුහුටිවූ, කිලිටිවූවහු විසින් ජීවත්වීම සුවසේ කට හැක්කේයි.

11. (පාපයෙහි) හිරිඔතප් ඇත්තාවූ නිතොර පිරිසිදු (කායකර්මාදිය) සොයන සුලුවූ, කුසීත නොවූ, ආඩම්බර නොවූ, පිරිසිදු ආජීව ඇති (එම පිරිසිදු ආජීවය සාරකොට) දක්නාවූවහු (ලජ්ජී මහණහු) විසින් ජීවත්වීම දුක්ය.

12. යම් පුද්ගලයෙක් පරපණ නසාද, බොරුකියාද මේ සත්ව ලෝකයෙහි (හිමියන් විසින්) නොදෙන ලද වස්තුව සොරා ගණීද පරස්ත්‍රීන් කරා යේද.

13. යම් පුරුෂයෙක් රහමෙර බීමෙහිද නැවත නැවත යෙදේද, මෙබඳු පුද්ගල තෙම, මෙලොවදීම තමාගේ (ප්‍රතිෂ්ඨා) මූලය කණන්නේය.

14. භවත් පුරුෂය, ලාමකවූ අකුශල ධර්මයෝ නොසන්සුන් කළ හැක්කාහයි මෙසේ දනුව (විෂමවූ) ලෝභයද ද්වේෂයද (යන අකුශල මූලයෝ දෙදෙන) බොහෝ කලක් නරකාදී දුකට නොපමුණුවත්වා.

15. ජනතෙම ශ්‍රද්ධාවට අනුරූප පරිද්දෙන් ප්‍රසාදයට අනුරූප පරිද්දෙන් (අනුන්ට) දෙන්නේය. ඒ කෑම් බීම්හි යමෙක්

(මහණෙක් දොම්නස්වීද ඒ මහණතෙම ඒකාන්තයෙන් දවාලකවත් රාත්‍රියකවත් සමාධියකට නොපැමිණෙන්නේය.

**16.** යම් මහණෙකු විසින් මේ (මංකුභාවයයි කියන ලද) අකුශලය, මනාකොට සිඳින ලදද, අර්හත් මාර්ගඥානයෙන්) මූලඝාතන (මුල් සුන්) කොට සිඳින ලදද, සම්පූර්ණයෙන් උගුලන ලදද ඒ මහණතෙම ඒකාන්තයෙන් දවාලෙකවත් රාත්‍රියෙකවත් සාමාධියකට නොපැමිණෙන්නේය.

**17.** රාගය හා සමාන ගින්නක් නැත. ද්වෙෂය සම අල්ලාගැනීමක් නැත. මොහය හා සමාන දැලක් නැත. තෘෂ්ණාව හා සමාන ගඟක්වත් නැත.

**18.** අනුන්ගේ ස්වල්ප මාත්‍රවූ වරද සුවසේ දැක්ක හැකි. තමාගේ වූකලී (මහත් වරදද) නොදැක්ක හැකි (අනුන්ගේ වරද සොයන) ඒ පුද්ගලතෙම (ස්වල්පවූද) අනුන්ගේ දෝෂයක් (උසස් තැනෙක සිට) රොඩු බොල් මෙන් පොලන්නේය. තමාගේ වූකලි (මහත් වරදද කොළ කැලෑ වලින්) ශරීරය මුවහ කරන්නාවූ කපටි ලිහිණි වැද්දා මෙන් වසන්නේය.

**19.** අනුන්ගේ වරද දක්නා සුලුවූ නිතොර (අනුන්ගේ සිදුරු සොයන බැවින්) අවමන් කරණ සුලුවූ ඒ මහණහුට (කාමාදි) ආශ්‍රවයෝ වැඩෙති. ඒ මහණ තෙම රහත් ඵලයෙන් දුරුයි.

**20.** අකාශයෙහි පියවරක් නැත. බාහිර සස්නෙහි මහණෙක් නම් නැත. ප්‍රජාතොම ප්‍රපඤ්චයෙහි (පමාවෙහි) අලුණාය. බුදුවරයෝ ප්‍රපඤ්ච රහිතයෝයි.

**21.** ශාස්වත (නිත්‍යව පවත්නා) වූ ස්කන්ධ කෙනෙක් නැත. බුදුවරයන්ට එකද ඉඤ්ජිතයෙක් (කම්පාවට) කරුණක් නැති.

## 19 ධම්මට්ඨ වර්ගය

**1.** යම් කාරණයකින් කටයුතුවූ අර්ථය (ඡන්දාගති ආදියෙහි පිහිටා මුසාවාදයෙන්) වහා විනිශ්චයකෙරේද ඒ කාරණයෙන් (විනිශ්චය) ධර්මයෙහි පිහිටියා නම් නොවෙයි. නුවණැත්තාවූ

යමෙක් වනාහි සත්‍යවූ කාරණයද අසත්‍යවූ කාරණයද යන දෙක නිශ්වය කෙරේද.

2. සත්‍යවූ තෙපුලෙන් පිළිවෙළින් (විනිශ්වය) ධර්මයෙන් සමසේ (අපරාධවූ පරිද්දෙන්) අනුන් හික්මවාද (විනිශ්වය) ධර්මය රක්නා ලද්දාවූ නුවණැති පුරුෂ තෙම (විනිශ්වය) ධර්මයෙහි පිහිටියේයයි කියනු ලැබේ.

3. යම් පමණ කාරණයකින් බෙහෝ කොට බෙණේද? ඒකාරණයෙන් පණ්ඩිත නම් නොවෙයි. යමෙක් වනාහි තෙමේ ක්‍ෂෙමීවේද පඤ්චදුශ්වරිතයන් නැත්තේද අවෛරීවේද, යමෙකු කෙරෙන් මහජනයාට භය නැත්තේද (හෙතෙම) පණ්ඩිතයයි කියනු ලැබේ.

4. යම් පමණකින් බොහෝකොට බෙණේද, එපමණකින් (ධර්මධර) ධර්මය දරන්නේ නම් නොවෙයි. යමෙක් වනාහි මඳ දෙයකුදු අසා නාමකායෙන් (චතුස්සත්‍යය) ධර්මය දකීද, යමෙක් ධර්මයෙහි නොපමා වේද, ඒ මහණතෙම ඒකාන්තයෙන් ධර්මධර නම් වෙයි.

5. යම් (වයෝවෘද්ධතා) කාරණයකින් ඔහුගේ හිස පැසුනේ වේද, ඒ කාරණයෙන් ස්ථවිර (වැඩිසිටි) නම් නොවෙයි. ඔහුගේ වයස මුහුකුරා ගියේ වෙයි. හෙතෙම (ස්ථවිර කර ධර්මයන් නැතිහෙයින්) හිස් මහල්ලායයි කියනු ලැබේ.

6. යම් පුද්ගලයෙකු කෙරෙහි චතුරාර්ය සත්‍යයද නවලොකොත්තර ධර්මයද අවිහිංසාවද (හෙවත් මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛාද) කායවාග් හික්මීමද (ඉන්ද්‍රිය) දමනයද යන මේ ගුණ ඇද්ද (අර්හත් මාර්ගඥාන නැමැති මුඛයෙන්) වමනය කරණ ලද (රාගාදී) මල ඇති ධෛර්ය සම්පන්නවූ ඒ (මහණ) තෙම ස්ථවිරයයි කියනු ලැබේ.

7. (මිහිරි) තෙපුල් ඇති පමණකින් හෝ (ශරීර) වර්ණය යහපත් බැවින් හෝ ඊර්ෂ්‍යා කරණ සුළුවූ, මසුරුවූ, කෛරාටිකවූ මිනිස් තෙම සාධු ස්වරූප ඇත්තේ නොවෙයි.

8. යමෙකු විසින් මේ (ඊර්ෂ්‍යාදී දෝෂ සමූහය) මනාකොට සිඳින ලදද කෙලෙස් මුල් හා සමග නසනලදද, නසනලද

(ඊර්ෂ්‍යාදී) දෝෂ ඇති ප්‍රඥාවත්වූ හෙතෙම සාධු ස්වරූප (හොඳ ගති පැවතුම්) ඇත්තේයයි කියනු ලැබේ.

**9.** හිස මුඩු පමණින් ශ්‍රමණයෙක් නොවෙයි. ව්‍රතගුණ නැති බොරු කීමෙන්, ඉච්ඡා (කැමත්ත) හා ලෝභයෙන් යුක්තවූයේ කෙසේ නම් ශ්‍රමණයෙකැයි කියනු ලැබේද?

**10.** යමෙක් වනාහි ස්වල්පවූද මහත්වූද අකුශලයින් සර්වප්‍රකාරයෙන් සංසිඳුවාද අකුශලයන් සංසිඳුවන ලද බැවින් හෙතෙම ශ්‍රමණයයි කියනු ලැබේ.

**11.** යම් පමණෙකින් අනුන් සිඟාද ඒ කාරණෙන් භික්ෂූනම් නොවෙයි විෂමවූ (පාප) ධර්මයන් (නොහොත් දුගඳ හමන කාය කර්මාදිය) සමාදන්ව වසන්නේ එපමණකින් භික්ෂූ නම් නොවේ.

**12.** මේ ශාසනයෙහි යම් මහණෙක් කුශලයද අකුශලයද යන මේ දෙකම (මාර්ග බ්‍රහ්මචර්යයෙන්) දුරුකොට (මාර්ග) බ්‍රහ්මචර්යයෙන් යුක්ත වේද, (ස්කන්ධාදී ලෝකයෙහි සියලු ධර්මයන්) නුවණින් සලකා හැසිරේද, හෙතෙම ඒකාන්තයෙන් භික්ෂුයයි කියනු ලැබේ.

**13.** මූඪගති ඇති අඥාන පුද්ගල තෙම, තුෂ්ණිම්භූත වීමෙන් මුනිනම් නොවෙයි. ප්‍රාඥයා වනාහි තරාදියක් ගෙණ කිරන්නට සිටි එකක්හු මෙන් ගතයුතුවූ උතුම් දෙය ගෙණ වෙසේද.

**14.** අකුශලයන් දුරු කෙරේද, හෙතෙම එයින් මුනි නම් වේ. යමෙක් තෙම උභය ලෝකයන් (නුවණින්) පිරිසිඳ දනීද ඒ කාරණයෙන් හෙතෙම මුනියයි කියනු ලැබේ.

**15.** යම් කාරණයෙකින් ප්‍රාණීන් නසාද එබැවින් ආර්යය නම් නොවෙයි. සියලු සත්වයන්ට හිංසා නොකිරීම හේතුකොටගෙණ ආර්යයයි කියනු ලැබේ.

**16.** ශීලමාත්‍රයකින් හෝ වත් පිළිවෙත් මාත්‍රයකින් හෝ නැවත (ත්‍රිපිටක ධරවීම්) බහු ශ්‍රැත මාත්‍රයකින් හෝ නොහොත් සමාධි ලාභයෙන් හෝ විවේකව විසීමෙන් හෝ

**17.** පුහුදුන් විසින් නොසෙවිය හැකි නෛෂ්ක්‍රම්‍යය. සුඛය (හෙවත් අනාගාමී ඵල සුඛය) ස්පර්ශ කෙරෙමියි කියා හෝ මහණ රහත් ඵලයට නොපැමිණියාවූ තෝ (භවයෙහි) විශ්වාසයට නොපැමිණෙව.

## 20 මාර්ග වර්ගය.

**1.** මාර්ගයන් අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨයි. සත්‍යයින් අතුරෙන් දුක්ඛාය (සත්‍ය) පදයෝ සතර දෙන ශ්‍රෙෂ්ඨයහ. ධර්මයන් අතුරෙන් නිර්වාණයයි කියන ලද නොඇල්ම ශ්‍රෙෂ්ඨයි. දෙපාඇති සත්වයන්ට පසැස් ඇති තථාගතතෙම ශ්‍රෙෂ්ඨයි.

**2.** (මාර්ගඵලයයි කියන ලද) දර්ශනයාගේ විශුද්ධිය පිණිස මේ මගය. අනික් මගෙක් නැති තෙපි මේ මාර්ගයෙහි පිළිපදුව මේ (ආර්ය අෂ්ටාංගික මාර්ගය) මාරයා මුළා කරන්නේය.

**3.** මෙහි (ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි) පිළිපන්නාවූ තෙපි සියලු (වෘත්ත) දුක්ඛය කෙළවර කරව්. (රාගාදි) උල් දුරු කරන්නාවූ මේ (ආර්ය) මාර්ගය (ප්‍රත්‍යක්ෂ ඥානයෙන්ම) දැන මා විසින් කියන ලදී.

**4.** තොප විසින් සම්‍යක් ප්‍රධාන වීර්යය කටයුතුයි. සර්වඥවරයෝ (නිවණට පමුණුවන මග හුදෙක්) කියන්නාහුම වෙති. (කියන ලෙස) පිළිපන්නාවූ යෝගාවචරයෝ මාර බන්ධනයෙන් මිදෙන්නාහුයි.

**5.** සියලු සංස්කාරයෝ අනිත්‍යහයි (යම් කලෙක්හි විදර්ශනා ප්‍රඥාවෙන්) දකීද එකල්හි මේ ස්කන්ධ පරිහරණයයි කියන ලද) දුක්ඛයෙහි කලකිරෙන්නේය. මේ කලකිරීම නිර්වාණයට මාර්ගයයි.

**6.** සියලු සංස්කාරයෝ දුක්ඛයහයිද යම් කල්හි (විදර්ශනා ප්‍රඥාවෙන්) දකීද එකල්හි (මේ ස්කන්ධ පරිහරණයයි කියන ලද) දුක්ඛයෙහි කලකිරෙයි. මේ කලකිරීම නිර්වාණයට මාර්ගයයි.

7. සියලු ධර්මයෝ අනාත්මයහයි යම් කලෙක්හි විදර්ශනා ප්‍රඥාවෙන් දකීද, එකල්හි මේ (ස්කන්ධ පරිහරණයයි කියන ලද) දුක්ඛයෙහි කලකිරෙයි. මේ කලකිරීම නිර්වාණයට මාර්ගයකි.

8. (වීර්ය කරන්ට) සුදුසුකල්හි වීර්ය නොකරන්නේ තරුණ වූයේද, කායබල ඇත්තේද, ඉදින් අලසකමින් යුක්ත නම් අතිශයින්ම සිත් ඇතියේ කුසීතවූයේ කම්මැළිවූයේ ප්‍රඥාවෙන් දැක්ක යුතුවූ ආර්ය මාර්ගය නොලබන්නේය.

9. වචනින් රැකුනේ වේද, මනසින් සුසංවෘතද කයිනුත් අකුසල් නොකරන්නේවේද, මේ කර්ම පථයන් තුන්දෙන යමෙක් පිරිසිදු කෙරේනම් හෙතෙම (බුද්ධාදී) ඍෂීන් විසින් ප්‍රතිවේධ කරණ ලද ආර්ය මාර්ගය සිද්ධ කරන්නේය.

10. (අටතිස් අරමුණෙහි යෝනිසෝමනසිකාරයෙහි) භාවනය (සිත වැඩීම) හේතුකොටගෙණ ඒකාන්තයෙන් (ලොකොත්තර) ප්‍රඥාතොම උපදනීය. භාවනා (මනස්කාර) යෙහි නොයෙදීම හේතුකොටගෙණ ප්‍රඥාවගේ විනාශය වෙයි. වැඩ පිණිසද අවැඩ පිණිසද පවත්නාවූ මේ දෙමග දැන යම්සේ ප්‍රඥාව වැඩේද, එසේ තමා (යෝනිසෝමනසිකාරයෙහි) පිහිටු වන්නේය.

11. මහණෙනි, කෙලෙස් නැමැති වනය කපව්. රුක් නොකපව්. (රාගාදී කෙලෙස්) වනයෙන් (ජාතිභයාදී) භය උපදවන්නේය. (මහත් කෙලෙස් නැමැති) වනයද වාසය (අර්හත් මාර්ග ඥාන නැමැති ශස්ත්‍රයෙන්) කපා කෙලෙස් වනරහිතවව්.

12. ස්ත්‍රීන් කෙරෙහි පුරුෂයාගේ ස්වල්පමාත්‍රවූ ද කෙලෙස් නැමැති වනය යම්තාක් කල් නොසිඳේද, ඒතාක් කල් ඒ පුරුෂ තෙම මව කෙරෙහි ප්‍රේමයෙන් ඇලුණු කිරිබොන වස්සෙකු මෙන් එක්ව බැඳුණු සිත් ඇත්තේම වේ.

13. සරත් කාලයෙහිවූ කුමුදු මලක් අතින් (උදුරා ගන්නාක්) මෙන් තමාගේ (තෘෂ්ණායයි කියන ලද) ස්නේහය අර්හත් මාර්ග ඥාන (නැමැති ශස්ත්‍ර) යෙන් සිඳපියව. අෂ්ටාංගික මාර්ගයම වඩව. නිර්වාණය තථාගතයන් විසින් දෙසන ලදද එහෙයිනි.

14. වැසි සාරමස මෙහිම වෙසෙමි. හිමත් සාරමසද ගිමන් සාරමසද මෙහිම වෙසෙන්නෙමි. මෙසේ අඥාන පුද්ගලතෙම සිතයි. (තමහට වන) ජීවිතාන්තරාය නොදකියි.

15. දරුවන් හා ගවමහීෂාදීන් කරණකොට ගෙණ වෙසෙසින් මත්වූ විශේෂයෙන් ලග්නවූ (ඇලුණු) සිත් ඇති ඒ මනුෂ්‍යයා නිදන්නාවූ ගම්වැසි ජනයා (මුහුදට ගෙණ යන්නාවූ) මහ වතුරක් මෙන් මරණ තෙම හැරගෙණ යන්නේය.

16. මරහු විසින් මඩනා ලද සත්වයාට ආරක්ෂාව පිණිස දරුවෝ නොවන්නාහ. පියෙක්ද නොවන්නේය. සෙසු නෑයෝද (ආරක්ෂාව පිණිස) නොවන්නාහ. නෑයන් කෙරෙහි පිහිට වියයුතු බවෙක් නැති.

17. මේ කාරණ දැන ශීලයෙන් සංවරණයවූ නුවණැත්තේ නිවන් යන මග වහාම පිරිසිදු කර ගන්නේය.

## 21. ප්‍රකිර්ණක වර්ගය.

1. ස්වල්ප මාත්‍රවූ (යන්තම්) සුවය හැරීම හේතුකොටගෙණ, ඉදින් මහත්වූ නිර්වාණ සුවය දක්නේද, එහෙයින් උදාරවූ (නිර්වාණ) සුඛය දක්නා කැමැත්තාවූ ප්‍රාඥතෙම ඒ ස්වල්පවූ සුඛය හරණේය.

2. පරහට දුක් දීමෙන් (යම් පුද්ගලයෙක්) තමහට සුව කැමති වේද, ඒ පුද්ගලතෙම වෛර සංසර්ගයෙන් මිශ්‍රවූයේ වෛරයෙන් නොමිදෙන්නේය.

3. යමක් (මහණුන් විසින්) කටයුතුවූද එය (යමෙකු විසින්) හරන ලදද, නොකළමනා දෙය වනාහි කරනු ලැබේද උස්වූ මාන නල ඇති (ස්මෘති විප්‍රවාහයෙන්) පමාවූ ඒ පුද්ගලයන්ට ආශ්‍රවයෝ වඩනාහුයි.

4. යමකුන් විසින් කායගතාසති භාවනා තොමෝ (කය ගැන සිහිය වැඩීම) සතතයෙන් මනාකොට වඩනා ලදද මහණුන් විසින් කටයුතු (සිල් පිරීම්) ආදියෙහි සතත (නිතොර) ක්‍රියා ඇති ඔහු (පරිෂ්කාර මණ්ඩනාදී) අකෘත්‍යය (අවැඩ) නොසෙව්නාහ.

ඇත්තාවූ සම්පජානකාරීවූ (හොඳ කල්පනා ඇති) ඒ පුද්ගලයන්ගේ ආශ්‍රවයෝ ක්‍ෂයට යන්නාහ.

**5.** මවද පියාද ක්‍ෂත්‍රිය රජුන් දෙදෙනාද නසා අනුචරයන් (අයකැමියා) සහිතවූ රටත් නසා ක්‍ෂීණාශ්‍රවතෙම නිදුක්ව නිවන් පුරයට යන්නේය.

**6.** මවද (තෘෂ්ණාව) පියාද (අස්මිමානය) බ්‍රාහ්මණ රජුන් දෙදෙනාද නසා විචිකිච්ඡා නීවරණය (සැකය) පස් වනුකොට ඇති (නීවරණ) පස නසා ක්‍ෂීණාශ්‍රව තෙම නිදුක්ව නිවන් පුරයට යන්නේය.

**7.** යම් කෙනෙකුන් දවල්ද (ii) රාත්‍රියෙහිද නිතොර බුදුගුණ අරභයා උපදනා ස්මෘතිය (සිහිය) ඇද්ද ඒ බුද්ධ ශ්‍රාවකයෝ හැමකල්හිම යෙහෙන් නිදා පිබුදුනාහ.

**8-10.** (මෙය මෙහි 7 ඡේදයේ "බුදුගුණ" යන්නට "දහම් ගුණය" "සඟ ගුණය" "කය" යන වචන යෙදීමෙන් මේ ඡේද තුන සාදාගත යුතුයි.)

**11.** යම් කෙනෙකුන්ගේ (ii) සිත දවල්ද රාත්‍රියෙහිද නිතොර කරුණා භාවනාවෙහි (වැඩීමෙහි) ඇලුනේද (iii) ඒ බුද්ධ ශ්‍රාවකයෝ හැම කල්හිම යෙහෙන් නිදා පුබුදිනාහ.

**12.** යම් කෙනෙකුන්ගේ (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) (මෛත්‍රී) භාවනාවෙහි ඇලුනේද (මෙහි 11(iii) යෙදිය යුතුයි.)

**13.** මහණ වීම දුෂ්කරයි. ශාසනයෙහි සිත් ඇලවීම දුෂ්කරයි. ආරාම වාසයද දුෂ්කරය. ගෘහ වාසයෝ දුෂ්කරයහ. අසමානවූ අදහස් ඇත්තවුන් හා එක්ව විසීම දුෂ්කරය. සංසාර නැමැති දීර්ඝ මාර්ගයට පැමිණිහු දුක්ඛයා විසින් අනුව යන්නාහු වෙති. එහෙයින් (සසර නැමැති) දුර මඟට නොපැමිණෙන්නේය. සංසාර දුක්ඛයා විසින් අනුව යන ලද්දේත් නොවන්නේය.

**14.** (ලෞකික ලොකොත්තර) ශ්‍රද්ධාවෙන් සමන්විතවූ ශීලයෙන් සමන්විතවූ, යසසින්ද භෝග සම්පත්තීන්ද යුක්තවූ, කුල පුත්‍රතෙම යම් යම් ප්‍රදේශයකට පැමිණියේ වෙයිද ඒ ඒ හැම තන්හිම පුදනු ලබන්නේයි.

**15.** සාධූහු (හොඳ අය) දුර සිටියාහුද හිමාලය පර්වතය මෙන් (බුදු නුවණට) ප්‍රකට වෙති, මේ ලෝකයෙහි අසුධු පුද්ගලයෝ රාත්‍රියෙහි විදි සැර මෙන් නොපෙනෙන්නාහුය.

**16.** හුදෙකලාව ඉඳීම සෙවුනේය. හුදෙකලාව සයනය කිරීම (නිදීම) සෙවුනේය. (ජංඝා බලයෙන් පිඬු සිඟා ජීවත් වන බැවින්) කුසීත නොව, (සතර ඉරියව්වම) හුදෙකලාව හැසිරෙමින් තමා හුදෙකලාව දමනය කරන්නේ (මහණතෙම) අරණ්‍යයෙහිම ඇලෙන්නේය."

## 22. නිරය වර්ගය.

**1.** බොරු කියන පුද්ගලතෙම නරකයට යන්නේය. නැවත යමෙක් පව්කම කොට නොකෙළෙමියි කියාද (හෙද නරකයට යන්නේය.) ලාමකවූ ක්‍රියා ඇති ඒ මිනිස්සු දෙදෙනාම මෙයින් මිය ගොස් පරලොවදී සමවන්නාහුය.

**2.** කාෂාය වස්ත්‍රයෙන් වෙළන ලද ග්‍රීවා ඇති, ලාමක ස්වභාව ඇති සංයම නැති පුද්ගලයෝ බොහෝය. ඒ ලාමක පුද්ගලයෝ පාප කර්මයෙන් නරකයෙහි උපදනාහ.

**3.** සිල් නැත්නාවූ, සංයම රහිතවූ, පුද්ගලතෙම රට වැස්සන් විසින් දුන් අහර ඉදින් වළඳන්නේ වේද, (එයට වඩා) තැවී දිලිසුණු ගිනි සිලක් වැනිවූ ලෝ ගුලියක් වළඳනා ලද්දේ උතුම්ය.

**4.** පරස්ත්‍රීන් සේවනය කරණ සුලුවූ ප්‍රමාදශීලි පුරුෂතෙම අකුසල් ලැබීමය. කැමති පරිද්දෙන් නිදි නොලැබීමය. තුන්වනුවූ නින්දාවය, සතරවනුවූ නරකොත්පත්තියද යන මේ දුක් සතරට පැමිණෙන්නේය.

**5.** අකුසල් ලැබීමද, (නරකයෙහි ඉපදීම යයි කියන ලද) පාපයෙහි ගතියද (මෙසේ ඒ පුරුෂයාට වෙයි.) භය පත්වූ පුරුෂයාගේ භයපත්වූ ස්ත්‍රීය හා සමඟ කාම රතියද, ස්වල්ප වන්නීය. රජද ගරුවූ දඬුවම් පමුණුවන්නේය. එහෙයින් පුරුෂතෙම පරස්ත්‍රී සේවනය නොකරන්නේය.

**6.** යම්සේ කුස තණපතක් වරදවා ගන්නා ලද්දේ හෙවත් නොපිටට අදනා ලද්දේ ගත් අතම කපාද (එපරිද්දෙන්ම) මහණදමද වරදවා ගන්නා ලද්දේ නරකයට අදනේය.

**7.** (පසු බැස බැස) සිථිල කොට කරණ ලද යම්කිසි කුශල කර්මයෙක් ඇද්ද, සකිලිටුවූ යම් ව්‍රතයක් ඇද්ද, සැකයෙන් යුක්තව හැසිරිය යුතුවූ යම් මහණ දමකුත් ඇද්ද, ඒ සියල්ල මහත් ඵල නොවේ.

**8.** ඉදින් යම් කුශල කර්මයක් කරන්නේ නම් එය කරන්නේමය. ඒ කුශල කර්මයද තරකොටම කරන්නේය. කුමක් හෙයින්ද යත්? යම් හෙයකින් චණ්ඩාදී භාවයට පමුණුවන ලද ශ්‍රමණ ධර්මය (-පැවිද්ද) බොහෝකොටම රාගාදී රජස් වගුරු වන්නේද එහෙයිනි.

**9.** අකුශල කර්මය නොකරන ලද්දේම උතුම්. අකුශල කර්මය තෙම පසුව තවන්නේය. යම් කර්මයක් කොට පසුව නොතැවේද එසේවූ කුශල කර්මය කරන ලද්දේ උතුමී.

**10.** ඇතුළතින් පිටතින් රක්නා ලද ප්‍රත්‍යන්තයෙහිවූ නුවරෙක් යම්සේ වේද, එපරිද්දෙන්ම ආත්මය හෙවත් සිත රකිව්. (බුද්ධොත්පාද) ක්ෂණය තෙම ඒකාන්තයෙන් නොයික්මේවා. යම්හෙයකින් බුද්ධොත්පාදක්ෂණය ඉක්මවූවාහු නරකයෙහි උපදින්නාහු ශෝක කෙරෙද්ද එහෙයිනි.

**11.** ලජ්ජා නොකොටයුතු තන්හි යමෙක් ලජ්ජාවෙත්ද, ලජ්ජා කටයුතු තන්හි ලජ්ජා නොවෙත්ද, මෙසේ හිස්වූ දෘෂ්ටිය ගෙණ වසන්නාවූ ඒ සත්වයෝ දුගතියට යෙති.

**12.** භය නොකළමනා තන්හි භය දක්නා සුලුවූ, භය කළමනා තන්හි අභය දක්නා සුලුවූ, මෙසේ හිස්වූ දෘෂ්ටිය ගෙණ වසන්නාවූ ඒ සත්වයෝ දුගතියට යෙති.

**13.** නිරවද්‍යයෙහි මේ සාවාද්‍යය (නිවැරැද්ද වරදැයි) යන බුද්ධි ඇත්තාවූද, සාවාද්‍යයෙහි නිරවද්‍යයයි දක්නා සුලුවූද (මෙසේ) විපරීත දෘෂ්ටිය ගෙණ වසන්නාවූ සත්වයෝ දුගතියට යෙති.

14. වරද වරද හෙයින් දැන, නිරවද්‍ය (නිවැරැද්ද) නිරවද්‍ය හෙයින් දැන මෙසේ සම්‍යග් දෘෂ්ටිය මනාකොට ගන්නාවූ නුවණැති සත්වයෝ සුගතියට යති.”

## 23. නාග වර්ගය

1. යම් හෙයකින් ලෞකික මහ ජනතෙම දුශ්ශීලද එහෙයින් යුද්ධ භූමියෙහි දුන්නෙන් මිදුණු සර (ඉවසන්නාවූ) ඇතකු මෙන් මම එරුෂ වචන ඉවසන්නෙමි.

2. දැමුනු සතකුම බොහෝදෙනා රැස්වන තැනට (සභාවට) පමුණුවති. රජතෙමේද දැමුනු ඇතකු අසකුටම නැගෙන්නේය. යමෙක් තෙම පරොස් තෙපුල් ඉවසාද ඒ දැමුනු පුද්ගලතෙම මිනිසුන් අතුරෙන් උත්තමයි.

3. අශ්වතරයෝද දැමුනාහුම උත්තමයහ. ආජානේය නම් අශ්වයාද සෛන්ධව අශ්වයෝද, මහා නාගයයි කියන ලද ඇත්තුද දැමුනාහුම උත්තමයහ. ඔවුන් හැම දෙනාටම වඩා තමා දැමුනේ උත්තමයි.

4. මේ යානවලින් අගත (-නොගිය) නම්වූ දිශාවට නොයන්නේ වේද, එහෙයින් දැමුණේ, දැමුණාවූ, ඉතා මනාව දැමුණාවූ සිතින් (එහි) යයි.

5. ධනපාල නම්වූ ඇත්තෙම (දෙකන්සිළින් වැහෙන) තීව්‍රවූ මද ඇත්තේ (කිසිවක්හු විසින්) නොවැළැකිය හැකි වූයේ, (ඇත් ගලට ගෙණවුත්) බඳනා ලද්දේ අහර නොකයි. ඇත්තෙම ඇත් වනයම සිහි කරන්නේය.

6. යම් කලෙක පුරුෂතෙම මිද්ධ (නිදිමත) බහුල කොට ඇත්තේ වේද, බොහෝකොට කන්නේද (කුඩු ආදී ඌරු අහරින් පෝෂණය කරන ලද මහා ඌරෙකු මෙන්) නිදන්නේ පෙරළි පෙරළී වැද හෝනේ වේද, ප්‍රඥා රහිතවූයේ නැවත නැවත මව් කුසට පැමිණෙන්නේය.

7. මේ සිත මෙයින් පූර්වයෙහි (රූපාදී අරමුණෙහි ලෝභාදී) යම් ආකාරයකින් පවත්නා කැමැත්තේද යමෙක (රූපාදී යම්

අරමුණෙක්හි) පවත්නා කැමැත්තේ වේද සුවසේ බොහෝ කලක් සැරිසරා ඇවිද්දේ වේද, ඒ සිත අද මම වැගිරෙන මද ඇති ඇතක්හු නිග්‍රහ කරන්නාවූ දක්‍ෂවූ හස්තියාචාර්යයක්හු මෙන් නුවණින් නිග්‍රහ කරන්නෙමි.

**8.** නොපමා බවෙහි ඇලෙව්. තොපගේ සිත රකිව්. (ගැඹුරු) මඩෙහි ගැලුනු ඇතු වැයම් කොට එයින් නැගී ගොඩ පිහිටිය) මෙන් තමා ඒ කෙලෙස් මඩින් ගොඩ නගවු.

**9.** ප්‍රඥාවත්වූ, තමා හා වසන්නට සුදුසුවූ, යහපත් වාස ඇති, ධෘති සම්පන්නවූ, (කල්‍යාණ) මිත්‍රයෙකු ඉදින් (ලබා නම්) ඒ සියලු උපද්‍රවයන් මැඩ ඒ කල්‍යාණ මිත්‍රයා හා සමග සතුටු සිත් ඇතිව සිහි නුවණින් යෙදී වසන්නේය.

**10.** ප්‍රඥාවත්වූ තමා හා සමග වසන්නට සුදුසුවූ යහපත්වූ වාස ඇති ධෘති සම්පන්නවූ (කල්‍යාණ) මිත්‍රයකු ඉදින් නොලබා නම්, දිනන ලද රට හැර (වනයට වැද පැවිදිවූ) මහා ජනක රජු මෙන්ද, වනයෙහි මේ පාරිලෙය්‍යය ඇතු මෙන්ද එකලාව වසන්නේය.

**11.** හුදෙකලා වූවහුගේ විසීම උතුම්ය. අඥානයා කෙරෙහි සහාය බවක් නැත. (එහෙයින්) එකලාව වසන්නේය. පව් නොකරන්නේය. වනයෙහි පාරිලෙය්‍ය ඇතු මෙන්ම එකලාව වසන්නේය.

**12.** ප්‍රයෝජනයක් උපන් කල්හි, සහායයෝ සැපය, (යම්කිසි ප්‍රත්‍යයකින්) එකින් එක උපදනාවූ යම් තුෂ්ටියක් ඇද්ද, ඒ තුෂ්ටිතොම සුවය. මරණාසන්න කාලයෙහි කරණ ලද කුශල කර්මය සුවය. සියලු සංසාර දුක්ඛයාගේ ප්‍රහාණය (ගෙවා ලීම) සුවයි.

**13.** ලෝකයෙහි මවුන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සුවය. නැවත පියන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සුවය. ලෝකයෙහි ශ්‍රමණයන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සුවය. නැවත ක්‍ෂීණාශ්‍රව බ්‍රාහ්මණයන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සුවයි.

14. ශීලය ජරා වයස දක්වා සුවය. ශ්‍රද්ධාතොම නිශ්චලව පිහිටියා සුවය. ප්‍රඥාව ලැබීමද සුවයි. පව් නොකිරීම සුවයි.

## 24 තෘෂ්ණා වර්ගය

1. ප්‍රමාදයෙන් හැසිරෙන මිනිසාට තෘෂ්ණාතොම මාලුවා වැලමෙන් වැඩෙයි. හෙතෙම වනයෙහි ඵල කැමතිව රුකින් රුකකට පනින්නාවූ වඳුරකු මෙන් භවයෙන් භවයට පැමිණෙන්නේය. (පනින්නේය)

2. ලාමකවූ විසත්තිකා නම්වූ තෘෂ්ණාතොම ලෝකයෙහි යම් පුද්ගලයකු මැඩ ගනීද ඒ පුද්ගලයාහට තෙමන ලද හොට තණ වැඩෙන්නාක් මෙන් ශෝකයෝ වඩනාහුයි.

3. ලාමකවූ ඉක්මවිය නොහැකිවූ මේ තෘෂ්ණාව ලෝකයෙහි යම් පුද්ගලයෙක් වනාහි මැඩ පවත්වාද ඒ පුද්ගලයා කෙරෙන් ශෝකයෝ නෙළුම් පතින් ගිලිහෙන්නාවූ දිය බිඳුමෙන් ගිලිහෙන්නාහ.

4. යම් පමණ කෙනෙක් මෙතැන්හි රැස්වූද ඒ තොප හැම දෙනාට වැඩක් වේවා, ඒ කාරණයෙන් හැම දෙනාට මේ අවවාදය කියමි. සුවඳ හොට මුලින් ප්‍රයෝජන ඇතියක්හු බොරු තණ කණින්නාක්මෙන් තෘෂ්ණාවගේ මුලකනින්නේ වේ. බට පඳුරක් බිඳගෙණ යන්නාවූ ගංවතුරක් මෙන් මාරතෙම තොප නැවත නැවත නොබිඳීවා.

5. යම්සේ මුල උපද්‍රවයකට නොපැමිණිකල්හි (එහෙයින්ම) ස්ථිර කල්හි, (අගින්) කපන ලද වෘක්ෂය නැවතද හටගන්නේමවේ, එසේම තෘෂ්ණා සංඛ්‍යාත අනුසය සිඳ නොපියනලද කල්හි මේ දුක්ඛය නැවත නැවත උපදනේමැයි.

6. යමෙකුට ශ්‍රොතස් සතිසකින් යුක්තවූ මනාපයෙහි (රූපාදී අරමුණෙහි) වැගිර පවත්නාවූ තෘෂ්ණාතොම බලවත්වේද, නුවණ නැති ඒ පුද්ගලයා රාගය ඇසුරුකළාවූ විතර්කයෝ බලවත්වූවාහු අපායට පමුණු වන්නාහුයි.

7. (තෘෂ්ණා) ශ්‍රොතස්හු සැමතැනදීම වැගිරෙති. තෘෂ්ණාලතා තොමෝ (සදොරින්) ඉපද සිටිනීය. එසේ උපන්නාවූ ඒ තෘෂ්ණා ලතාව වනාහි දැක (මාර්ග) ප්‍රඥාවෙන් මුල සිඳිව්.

8. (රූපාදී අරමුණෙහි) විසිර පතළාවූද, (තෘෂ්ණා ස්නේහයෙන්) තෙමන ලද්දාවූද සොම්නස්හු සත්වයාහට වෙති. (ඒ තෘෂ්ණාවසික) සත්වයෝ සංත්‍රාස ඇත්තාහු සුව සොයන සුලුවෙති. එබඳුවූ සත්වයෝ ඒකාන්තයෙන් ජාති ජරාවට පැමිණෙන්නෝ නම් වෙති.

9. තෘෂ්ණාව පිරිවරණ ලද්දාවූ සත්වයෝ ලුහුබඳනා ලද සාවකු මෙන් (බියව) ඒ මේ අත දුවත්. සංයෝජනයෙන් හා සංවේගයෙන් බැඳුණුහු සත්වයෝ බොහෝ කලක් නැවත නැවත දුකට පැමිණෙන්නාහ.

10. තෘෂ්ණාව පිරිවරණ ලද්දාවූ සත්වයෝ ලුහු බඳනාලද සාවකු මෙන් ඒ මේ අත දුවත්. එහෙයින් තාමාහට නිර්වාණය (නොඇල්ම) කැමති වන්නාවූ මහණතෙම තෘෂ්ණාව දුරු කරන්නේය.

11. යම් පුද්ගලයෙක් තෘෂ්ණා රහිත වූයේ තපොවනයෙහි ඇලුණේ, තෘෂ්ණා වනයෙන් මිදුණේ නැවත තෘෂ්ණා වනයටම දිවේද ඒ පුද්ගලයා මෙසේ බලව්.

12. යකඩින් කරණ ලද්දාවූද දණ්ඩෙන් කරණ ලද්දාවූද බබුස් තණින් කරණ ලද්දාවූද, යම්බන්ධනයෙක් ඇද්ද, ඒ සියලු බන්ධනයම ප්‍රාඥයෝ දැඩිවූ බන්ධනයකැයි නොකියති. මාණික්‍යයෙහිද කුණ්ඩලාභරණයෙහිද අතිශයින්ම ඇලුණාවූ එසේම දරුවන් කෙරෙහිද අඹුවන් කෙරෙහිද යම් අපෙක්‍ෂාවක් ඇද්ද, ඒ තෘෂ්ණාවද යන,

13. (මේ බුද්ධාදී) ප්‍රාඥයෝ ස්ථිරවූ බන්ධනයකැයි කියති. යට බලාගෙණ යන්නාවූ, සිහිල්වූ, උනාහැරිය නොහැකිවූ මේ (ක්ලේශ) බන්ධනය පවා කපා වස්තු කාම ක්ලේශකාමයන්හි අපෙක්‍ෂා රහිතවූවාහු කම්සුවහැර පැවිදිවෙති.

14. රාගයෙන් රත්වූ, යම් සත්වකෙනෙක් තමා විසින් කරණ ලද දැලෙහි (වැද හොත්තාවූ) මකුළුවා මෙන්ම (තමන්ම උපදවා

ගත්තාවූ තෘෂ්ණා නැමැති) සැඩ පහරෙහි වැටෙද්ද ඔහු තෘෂ්ණා ශ්‍රොතස ඉක්මවන්නට නොපොහොසත් වන්නාහ. ප්‍රාඥයෝ වනාහි මේ (තෘෂ්ණා ශ්‍රොතස) පවා සිඳ ආලය නැතිව සියලු සසරදුක් පහකොට නිවන් පුරට යන්නාහ.

**15.** අතීතවූවන් (ස්කන්ධයන්) කෙරෙහි පැවති තෘෂ්ණාව හරුව. අනාගතවූවන් (ස්කන්ධයන්) කෙරෙහි පවත්නා තෘෂ්ණාව හරුව. වර්තමානවූවන් (ස්කන්ධයන්) කෙරෙහි පැවති තෘෂ්ණාවද හරුව. මෙසේ භවයාගේ පරතෙරටම පැමිණි තෝ සියලු ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෙන් කෙරෙහි මිදුණු සිත් ඇත්තෝ නැවත ජාතියට හා ජරාවට නොපැමිණෙහි.

**16.** විතර්කයන් විසින් මඩනා ලද්දාවූ, තීව්‍රවූ කාමරාග ඇති. ඉෂ්ටාලම්බනයන් ශුභ වශයෙන් වෙලන සුලුවූ, සත්වයාහට බොහෝකොටම තණ්හා තොම වඩනීය. මේ පුද්ගලයා වනාහි තෘෂ්ණාව නැමැති බැම්ම ස්ථිර කරන්නේය.

**17.** යම් මහණෙක්, සිතුවිලි සන්සුන් කිරීමෙහි (ප්‍රථම ධ්‍යානයෙහි) ඇලුනේ වේද, හැමකල්හි සිහි ඇත්තේ අශුභ ධ්‍යානය වඩාද මේ මහණ වනාහි තෘෂ්ණාව පහකරන්නේය. මේ මහණතෙම මාර බන්ධනය සිඳින්නේය.

**18.** (යම් මහණෙක්) (අර්හත් ඵල සංඛ්‍යාත) නිෂ්ඨාවට පැමිණියේ වේද, සන්ත්‍රාස රහිතද, පහවූ තෘෂ්ණා ඇත්තේද, (රාගාදී අංගන) පව් නැත්තේද, භවගාමීවූ (ක්ලේශ) ශල්‍යයන් සිත් දේද (ඔහුට) මේ ශරීරය අන්තිම ආත්ම භාවයයි.

**19.** (යම් මහණෙක්) පහ කරණ ලද තෘෂ්ණා ඇත්තේද, මමය මගේ යයි ගැනීමක් නැත්තේද, නිරුත්තියෙහි හා සෙසු තුන් පදයෙහි දක්ෂද අක්ෂර සමූහයද පූර්වාක්ෂර, පරාක්ෂරයන්ද දන්නේ වේද, අන්තිම ශරීරයෙහි පිහිටියාවූ ඒ මහණතෙම ඒකාන්තයෙන් මහත් ප්‍රඥා ඇත්තේයයිද මහා පුරුෂයයිද කියනු ලැබේ.

**20.** මම සියලු (ත්‍රෛ භූමක ධර්මයන්) මැඩ පැවැත්වීමි. සියලු (චතුර්භූමක ධර්මයන්) මනාකොට දත්තේ වීමි. සියලු ත්‍රෛභූමික ධර්මයෙහි නොඇලිණිමි. සියලු ත්‍රෛභූමික

ධර්මයන් පහකොට සිටියෙමි. තෘෂ්ණාව ගෙවීමෙන් මිදුණෙමි. මමම ප්‍රත්‍යක්ෂ කොට දැන, අනික් කවරක්හු (මේ මාගේ ආචාර්යයයි) කියම්ද?

**21.** ධර්ම දානය තෙම සියලු දානය දිනන්නේය. ධර්ම රසය තෙම සියලු රසය දිනන්නේය. ධර්මයෙහි ඇල්ම සියලු ඇල්ම දිනන්නේය. තණ්හාව නැතිකිරීම සියලු දුක් දිනන්නේය.

**22.** (උපභෝග පරිභෝග) වස්තූහු අඥාන පුද්ගලයා නසන්නාහ. (නිවන් නැමැති) පරතෙර සොයන සුලුවූ ප්‍රාඥයන් නොනසන්නාහ. අඥාන පුද්ගලතෙම වස්තුවෙහි උපන් තෘෂ්ණාව හේතුකොට ගෙණ තමා අනුන් නසන්නාක් මෙන් නසන්නේය.

**23.** ක්ෂෙත්‍රයෝ යම්සේ තණ දොස්කොට ඇත්තාහුද එසේම මේ ප්‍රජාතොමෝ, රාගය දොස් කොට ඇත්තීය. එහෙයින් පහවූ රාග ඇති ක්ෂීණාශ්‍රවයන්ට දෙන ලද දානය මහත් ඵල වන්නේය.

**24.** මේ ප්‍රජාතොමෝ ද්වේෂය දොස් කොට ඇත්තේය. එහෙයින් පහවූ ද්වේෂ ඇති ක්ෂීණාශ්‍රවයන්ට දෙනලද දානය මහත් ඵල වන්නේය.

**25.** මේ ප්‍රජාතොමෝ (චතුරාර්ය සත්‍යයන් දැක්ක නොදී මුවා කොට සිටිනා අඥාන ලක්ෂණවූ) මෝහය දොස් කොට ඇත්තීය. එහෙයින් අර්හත් මාර්ගයෙන් පහකරණ ලද මෝහ ඇති ක්ෂීණාශ්‍රවයන්ට දෙනලද දානය මහත් ඵල වන්නේය.

**26.** මේ ප්‍රජාතොමෝ නොලද දෙය පැතීය. (නොලද දැයෙහි බලවත් ආශාවය යන) ඉච්ඡාව දොස් කොට ඇත්තීය. ඒ කාරණයෙන් අර්හත් මාර්ගයෙන් පහ නොකරණ ලද තෘෂ්ණා ඇති ක්ෂීණාශ්‍රවයන්ට දෙනලද දානය මහත් ඵල වන්නේය.

## 25. භික්ෂු වර්ගය

**1-2** චක්ෂුද්වාරයේ (ඇසෙහි) සංවරය මැනවි. ශ්‍රොත්‍ර ද්වාරයෙන් (කනෙහි) සංවරය මැනවි. ඝාණද්වාරයෙන් (නාසයෙහි) සංවරය මැනවි. ජිව්හාද්වාරයෙන් (දිවෙහි) සංවරය

මැනවි. කායද්වාරයෙන් (කයේ) සංවරය මැනවි. වාග්ද්වාරයෙන් (වචනයේ) සංවරය මැනවි. මනොද්වාරයෙන් (සිතේ) සංවරය මැනවි. චක්ෂුරාදී සදොරම මැනවි. සියල්ල (සදොරම) රක්‍ෂාකළ මහණතෙම සියලු සසර දුකින් මිදෙන්නේය.

3. "යමෙක් අතින් සංයතද, පයින් සංයතද, වචනයෙන් සංයතද, සංයතවූ කය ඇත්තේද, ඇතුළත ඇලුනේද එකඟවූ සිත් ඇත්තේද, හුදෙකලාව වසන්නේද, යථාලාභ සන්තොෂාදියෙන් සතුටුද ඔහු (බුද්ධාදී ප්‍රාඥායෝ) භික්ඛුයයි කියති.

4. "යම් මහණෙක් මුඛයෙන් සංයතද, නුවණින් යෙදී කියනසුලුද, සන්සුන් නිවී සිත් ඇත්තේද, (පාළි) අර්ථයද, පාළියද ප්‍රකාශ කෙරේද? ඒ මහණහුගේ වචනය මධුරවේ.

5. (සමථ විදර්ශනා) ධර්මය වාසස්ථානකොට ඇති (සමථවිදර්ශනා) ධර්මයෙහි ඇලුණු (සමථ විදර්ශනා) ධර්මය නැවත නැවත සිහිකරන්නාවූ මහණතෙම සද්ධර්මයෙන් නොපිරිහෙන්නේය.

6. ස්වකීය ලාභය ඉක්මවා නොසිතන්නේය. අනුන්ගේ ලාභය පතමින් නොඇවිදින්නේය. අනුන්ගේ චීවරාදී ලාභය පතන්නාවූ මහණතෙම සමාධියට නොපැමිණෙන්නේය.

7. මහණතෙම ස්වල්පවූ ( ප්‍රත්‍යය) ලාභය ඇත්තේවී නමුදු ඉදින් ස්වකීය ලාභය ඉක්මවා සිතාද? පිරිසිදුවූ ජීවිකා ඇති, අකුසිතවූ, ඔහු (භික්ෂු) හට දෙවියෝද ප්‍රශංසා කෙරෙති.

8. යමෙකුට නාම රූප දෙක්හි සර්වප්‍රකාරයෙන්ම මමත්වයක් (මගේයයි සිතීමක්) නැද්ද ඒ (නාම රූප දෙක) නැසුනුකල්හි (ඒ නැසීම හේතුකොටගෙණ) ශෝක නොකෙරේද? ඒ (ක්ෂීණාශ්‍රව) තෙම (භින්නවූ ක්ලේශයන් ඇති හෙයින්) භික්ෂුයයි කියනුලැබේ.

9. යම් මහණෙක් මෛත්‍රී විහරණ ඇත්තේද, බුදු සස්නෙහි ප්‍රසන්නද, (හෙතෙම) සියලු සංස්කාරයන් සංසිඳුවන්නාවූ (අත්‍යන්ත) සුඛවූ ශාන්තවූ නිර්වාණය ලබන්නේය.

10. මහණ (මේ සිත් නැමැති) නැව (තුළ මිථ්‍යා විතර්ක නැමැති ජලය) ඉසුව. එසේ ඉසිනලද මේ නැව සැහැල්ලුව (නොහොත් වහාම සංසාර සාගරයෙහි නොඇලී නිවන් පුරයට) යන්නේය. රාගයද ද්වේෂයද නසා ඉක්බිත්තෙන් නිර්වාණයට පැමිණෙන්නෙහි.

11. (සක්කාය දිට්ඨි ආදී සංයෝජන) පස සිඳින්නේය. (රූප රාගාදී සංයෝජන පස දුරු කරන්නේය. (ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්) පස්දෙනා මත්තෙහි වඩන්නේය. ඇලීම් පස්දෙනා ඉක්මවූ මහණතෙම (කාමාසාදී සතර) මහ වතුරෙන් එතෙරවී යයි කියනුලැබේ.

12. මහණ ධ්‍යාන කරව, පමාබවට නොපැමිණෙව, පස්කම්හි තාගේ සිත නොනමව, ප්‍රමාදවූයේ ලෝ ගුළි නොගිලව දැවෙමින් මේ දුකැයි නොහඬව.

13. ප්‍රඥාව නැත්තාහට ධ්‍යානයක් නම් නැත. භාවනා නොකරන්නාහට ප්‍රඥාවක් නම් නැත. යමෙකු කෙරෙහි ධ්‍යානයද ප්‍රඥාවද යන මේ දෙක ඇද්ද ඒ පුද්ගලතෙම ඒකාන්තයෙන් නිර්වාණයට සමීපව සිටියේවේ.

14. ශූන්‍යාගාරයට වන්නාවූ, නිවී සිත් ඇත්තාවූ, (රූපා'රූප ධර්මයන් මනාකොට අනිත්‍යාදී වශයෙන්) විශෙෂයෙන් බලන්නාවූ මහණහට මිනිසුන් පිළිබඳ නොවූ ප්‍රීතියද, රතියද වෙයි.

15. යම් යම් කලෙක්හි පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යයය (ඇතිවීම හා නැතිවීම) සම්මර්ශනය කෙරේද, (එකල්හි) ප්‍රීති ප්‍රමෝද්‍යයක් ලබාද ඒ ප්‍රීති ප්‍රමෝද්‍යය නුවණැත්තවුන්ට අමෘත නම් වේ.

16. මේ බුද්ධශාසනයෙහි නුවණැති මහණහට (ඒ පඤ්චස්කන්ධයන්ගේ සම්මර්ශනයෙහි) මේ චතුපාරිශුද්ධි ශීලය පූර්වස්ථානයෙහිවේ. හේ කවරේදයත්? ඉන්ද්‍රිය සංවරයද (චීවරාදී සිව්පසයෙහි යථාලාභාදී) සන්තෝෂයද, ප්‍රාතිමොක්‍ෂය සංවර ශීලයද, යන මෙයි. පිරිසිදු ආජීව ඇති කුසීතනොවූ, කළ්‍යාණ මිත්‍රයන් සේවනය කර

17. (ධර්මාමිෂයෙන්) පිළිසඳර (කරමින් සංග්‍රහ කරන්නෙක්) වන්නේය. ආචාරයෙහි දක්‍ෂවූවෙක් වන්නේය. ඒ හේතුවෙන් ප්‍රමොදාධිකය බහුලකොට ඇත්තේ සියලු සංසාර දුක්ඛය ක්‍ෂයකරන්නේය.

18. පුරුෂයින් පරව මලානව ගියාවූ ඉද්දමල් තොමෝ යම්සේ නටුයෙන් මුදාද, එපරිද්දෙන්ම මහණෙනි, රාගයද, ද්වේෂයද තොපගේ සන්තානයෙන් මුදාහරිව්.

19. ශාන්තවූ කායද්වාර ඇති, ශාන්තවූ වාග්ද්වාර ඇති ශාන්තවූ මනොද්වාර ඇති, ද්වාරත්‍රයම සන්සුන් හෙයින් තැන්පත්වූ, වමාරා හරණලද පඤ්චකාම ගුණ ඇති මහණතෙම අතිශයින් ශාන්තයයි කියනු ලැබේ.

20. තෝම තට චෝදනාකරව, තෝම තා විමසව, මහණ ඒ තෝ තා විසින්ම රක්නා ලද්දෙහි, ස්මෘතිමත් වූයෙහි සුවසේ වසන්නෙහිය.

21. යම් හෙයකින් තෙමේම තමහට පිහිටවේද යම් හෙයකින් තෙමේම තමහට පිළිසරණද එහෙයින් උත්තමවූ අශ්වයෙකු පෝෂණය කරවා අස් වෙළඳකුමෙන් තමා රක්‍ෂා කරව.

22. (ප්‍රකෘතියෙන්ම බුදුන් කෙරෙහි) සන්තෝෂ බහුලවූ බුදුන්ගේ අනුශාසනයෙහි ප්‍රසන්නවූ, මහණතෙම (සියලු) සංස්කාරයන් සන්සිඳුවන්නාවූ එහෙයින්ම එකාන්ත ශාන්තවූ නිර්වාණයට පැමිණෙන්නේයි.

23. ළදරුවූ යම් මහණෙක් බුදුන්ගේ අනුශාසනයෙහි යෙද්ද ඒ මහණතෙම වළාපටලයකින් මිදුණු චන්ද්‍රයා අවකාශය බබුලුවන්නාක්මෙන් ස්කන්ධාදී ලෝකය ඒකාන්තයෙන් (ඥානාලෝකයෙන්) බබුලුවන්නේය.”

## 26. බ්‍රාහ්මණ වර්ගය.

1. බමුණ වීර්යයකොට (තෘෂ්ණා නැමැති) ජලප්‍රවාහය සිඳුව. වස්තුකාම ක්ලේශ කාමයන් දුරුකරව, බමුණ සංස්කාරයන්ගේ විනාශය දැන අකෘතඥයෙක් (නිවණ දුටුවෙක්) වන්නෙහි.

2. ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙමේ යම් කලෙක්හි ධර්ම දෙකක්හි පරතෙරට පැමිණියේ වේද, එකල්හි (චතුරාර්‍ය සත්‍යයන් මනාකොට දන්නාවූ) ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාගේ සියලු සංයෝගයෝ ක්ෂයට යන්නාහ.

3. යමෙකුට එතෙරද මෙතෙරද නැද්ද, දෙතෙරද නැද්ද, පහවූ (ක්ලේශ) පීඩාඇති කෙලෙසුන් කෙරෙන් මිදුණු ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

4. ධ්‍යානකරන්නාවූ රාගාදී රජස් නැත්තාවූ (වෙනෙහි හුදෙකලා) හුන්නාවූ කරණලද කෘත්‍ය ඇත්තාවූ ප්‍රහීන කරණලද ආශ්‍රව ඇත්තාවූ, උත්තමාර්ථයයි කියනලද අර්හත් ඵලයට පැමිණියාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

5. හිරු දහවල්ම දිලිසෙන්නේය. සඳ රාත්‍රියෙහිම දිලිසෙන්නේය. රජතෙම ස්වර්ණාභරණයෙන් සැරසී සෙනගින් පිරිවරණ ලද්දේම දිලිසෙන්නේය. ක්ෂීණාශ්‍රවතෙම සමාපත්තියට සවෙදින්නේම දිලිසෙන්නේය. නැවත සියලු දිවා රාත්‍රියෙහි බුද්ධතෙම (පස්වැදෑරුම්) තේජසින් දිලිසෙන්නේය.

6. බැහැර කරනලද පව් ඇත්තේදැයි බ්‍රාහ්මණයයි කියනුලැබේ. කාය විෂමාදියෙන් (දුරුව) සංසිඳුණු හෙයින් ශ්‍රමණයයි කියනු ලැබේ. තමාගේ (රාගාදී) මල පහකෙරේද එහෙයින් ප්‍රව්‍රජිතයයි කියනු ලැබේ.

7. ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙම බමුණාට නොගසන්නේය. ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙම ඒ තමාට ගැසූ පුද්ගලයාට කෝප නොකරන්නේය. බමුණාට හිරිහැර කරන්නාට නින්දාවේවා. යමෙක් කෝපකරයිද, (ක්ෂීණාශ්‍රවයන්ට ගැසූ) තැනැත්තහුටත් වඩා, ඔහුට නින්දා වේවා.

8. මේ එකටෙක නොකිරීම ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාහට ස්වල්පමාත්‍රවූ අයහපතෙක් නොවේ. නොහොත් යම් කලෙක්හි (ක්‍රොධකරන්නාගේ සිතට) ප්‍රියවූ ක්‍රෝධ චිත්තයාගේ ඉපදීමෙන් යම් වැළැක්මෙක් ඇද්ද මේ ක්‍රෝධ නිග්‍රහය ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාහට ස්වල්පමාත්‍රවූ නොඋතුම් බවක් නොවේ. යම්

යම් කාරණයකින් ක්‍රොධචිත්තය නවතීද, ඒ ඒ කාරණයෙන් සියලු සංසාර දුක්ඛය සන්සිඳෙන්නේම වේ.

**9.** යමකුට කයින් වන්නාවූද, වචනයෙන් වන්නාවූද, සිතින් වන්නාවූද, අකුශල කර්මයෙක් නැද්ද මේ තුන් තැනින් වසනලද දොර ඇති ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**10.** යමක්හු කෙරෙන් සම්මාසම්බුදුන් දෙසන ලද්දාවූ ධර්මය දන්නේවීනම් ඒ ආචාර්‍ය්‍යහු අග්නි ගෝත්‍රයට පූජාකළ බමුණකු මෙන් නමස්කාර කරන්නේය.

**11.** ජටාවන් කරණකොට ගෙණ බ්‍රාහ්මණ නම් නොවෙයි. ගෝත්‍රය කරණකොටගෙණද බ්‍රාහ්මණ නම් නොවෙයි. ජාතිය කරණකොටගෙනද බ්‍රාහ්මණ නොවෙයි. යමකු කෙරෙහි සත්‍ය ඥානයද නවලෝකෝත්තර ධර්මයද ඇද්ද හෙතෙම සුචි (පවිත්‍ර නැත්තේ) නමුදු වෙයි. හෙතෙම බ්‍රාහ්මණ නම් ද වෙයි.

**12.** ජටාවන්ගෙන් තට ප්‍රයෝජන කිම්ද, තට අඳුන්දිවි සමින් ප්‍රයෝජන කිම්ද, තාගේ ඇතුළත (රාගාදී කෙලෙසුන් විසින්) ගැවසීගත්තේය. පිටතම පිරිමදනෙහිය.

**13.** පසුල්සිවුරු දරන්නාවූ, කෘශවූ ශරීර ඇති ඉපිලෙන නහරවැලින් ගැවසීගත්, ශරීර ඇති, අරණ්‍යයෙහි හුදකලාව භාවනාකරන්නාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**14.** යෝනියෙන් උපන්නාවූ, මව්කුස උපන්නාහට (එපමණකින්) මම බ්‍රාහ්මණයයි නොකියමි. ඉදින් හේ බ්‍රාහ්මණ ජාති ඇත්තේද රාගාදී හේ පළිබෝධ සහිතය. (රාගාදී) පළිබොධ නැති (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගන්නාවූ ඒ ක්ෂීණාශ්‍රවයා, මම බ්‍රාහ්මණයයි කියමි.

**15.** සියලු සංයෝජනයන් සිඳ සිටි යම් ක්ෂීණාශ්‍රවයෙක් ඒකාන්තයෙන් නොබාද, (රාගාදී) භවාංගයන් ඉක්මවූ සියලු (කෙලෙසුන් කෙරෙන්) වෙන්වූ ඒ රහත්හු මම බ්‍රාහ්මණයයි කියමි.

**16.** (ක්‍රොධ නැමැති) රැහැනද (තෘෂ්ණා නැමැති) වරපටද අනුක්‍රම සහිතවූ (දෙසැට මිසදිටුනැමැති) මහ දමද (ඒ ඒ

මාර්ගයන්) සිඳ (සිටියාවූ) (උදුරාහරණ ලද අවිද්‍යා නැමැති) හිඳිබව ඇති (චතුරාර්ය සත්‍යයන්) අවබෝධකළාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**17.** (දශවිධ) ආක්‍රොශයද, වධයද, බන්ධනයද යන මේ සියල්ල යම් පුද්ගලයෙක් නොකිපියේ ඉවසාද ඉවසීම් බලයම බල ඇතිකොට ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**18.** ක්‍රොධ නැත්තාවූ, ව්‍රතයෙන් සමන්විතවූ, සිල්වත්වූ (තෘෂ්ණා ස්නේහයෙන්) තෙත් නොවන්නාවූ, දැමුනාවූ, අන්තිම ශරීර ඇති, ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**19.** නෙළුම්පතෙහි ජලය මෙන්ද ඉදිකටු අග අබ ඇට මෙන්ද, යමෙක් කාමයන්හි නො ඇලේද, ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**20.** යමෙක් මේ ආත්මභාවයෙහිම තමාගේ දුක්ඛයාගේ විනාශය දනීද බහා තබන ලද ස්කන්ධ භාර ඇති, (කෙලෙසුන් කෙරෙන්) මිදුනාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයා යයි කියමි.

**21.** ගැඹුරුවූ ප්‍රඥා ඇති, ප්‍රඥාවත්වූ, මඟ නොමග දෙක්හි දක්ෂවූ රහත්ඵලයයි කියනලද උත්තමාර්ථයට පැමිණියාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**22.** ගිහියන් හා ද පැවිද්දන් හා ද යන දෙපක්ෂයෙහි ඇත්තවුන් හා සංසර්ගයක් නැත්තාවූ, ගෙයි හැසිරීමක් නැත්තාවූ, ඉච්ඡා රහිතවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණ යයි කියමි.

**23.** භය සහිතවූද, භය රහිතවූද, සියලු සත්වයන් විෂයෙහි කාය දණ්ඩය බහා තබා යම් පුද්ගලයෙක් කිසි සතෙක්හු නොමරාද, අනුන්ලවාත් නොමරවාද ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**24.** විරුද්ධවූ මහා ජනයා අතරෙහි අවිරුද්ධවූ ජීවිත දඬුවම් ඇති මහජනයා අතුරෙහි නිවියාවූ (මමය මාගේ යයි) ගන්නවුන් අතුරෙහි (මමය මාගේ යයි) හැඟීමක් නැති ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**25.** යමෙකු විසින් රාගයද, ද්වෙෂයද, (නවවිධ) මානයද ගුණමකුබවද, ඉදිකටු අගින් ගිලිහෙන්නාවූ අබ ඇටයක් මෙන් හැරදැමූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**26.** යම් වචනයක් කරණකොටගෙණ කිසිවෙකු කෝප නොකරවාද (එබඳුවූ) කර්කශ නොවූ, වැඩ හඟවන්නාවූ සැබෑ තෙපුල් කියන්නේද, ඒ පුද්ගලයා මම බ්‍රාහ්මණයයි කියමි.

**27.** මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් දික්වූ හෝ ලුහුඬු වූ ස්වල්පවූ හෝ මහත්වූ හෝ යහපත්වූ හෝ නපුරුවූ හෝ වස්තුවක් සොරසිතින් නොගණීද, ඒ පුද්ගලයා මම බ්‍රාහ්මණයයි කියමි.

**28.** යමෙකුට මෙලොවද, පරලොවද, ආශාවෝ නැද්ද, තෘෂ්ණා රහිතවූ (කෙලෙසුන් කෙරෙන්) මිදුණු ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**29.** යමෙකුට තෘෂ්ණාවෝ නැද්ද, දැන, විචිකිච්ඡාව නැත්තේද, නිර්වාණයට බැස සිටි නිවණට පැමිණි ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**30.** මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් කුශලයද අකුශලයද යන දෙකද (රාගාදී) සංගයද පහකොට සිටියේද, ශෝක නැති, රාගාදී රජස් නැති, පිරිසිදුවූ, ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**31.** පූර්ණ චන්‍ද්‍රයා මෙන් නිර්මලවූ පිරිසිදුවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ නොකැළඹුණු සිත් ඇති (නන්දීභවයයි කියනලද) භවතෘෂ්ණාව ක්ෂය කළාවූ ක්ෂීණාශ්‍රවයා බ්‍රාහ්මණයායයි කියමි.

**32.** යම් මහණෙක් මේ මඩ සහිත මාර්ගයද, දුර්ගයද, සංසාරයද මෝහයද, ඉක්මීමද, තරණය කෙළේද, පරතෙරට ගියේද, ධ්‍යාන කරන්නේද, තෘෂ්ණා රහිතද, සැක නැත්තේද, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගෙණ නිවුනේද, ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**33.** මේ ලෝකයෙහි යමෙක් කාමයන් පහකොට ගෙය හැර මහණවේද කාමයන් හා භවයන් ක්ෂය කළාවූ ඒ ක්ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**34.** මේ ලෝකයෙහි යමෙක් තෘෂ්ණාව දුරුකොට ගෙය හැර මහණවේද, තෘෂ්ණාවද භවයද ක්‍ෂය කළාවූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**35.** යමෙක් මේ මනුෂ්‍ය ලෝකයෙහි බැඳීම (පඤ්චකාමය) ද හැර දිව්‍යවූ බැඳීම (ආයුෂ හා පඤ්චකාමය) ද ඉක්ම සිටියේද සියලු යෝගයන් කෙරෙන් වෙන්වූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**36.** (පඤ්චකාම ගුණයෙහි) ඇල්මද උකටලීයද දුරු කොට සන්සිඳුනු සිත් ඇති උපධි (දුක්) නැත්තාවූ සියලු ලෝකයා මැඩපවත්වන්නාවූ වීර්යයවත්වූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**37.** යමෙක් සත්වයන්ගේ ච්‍යුතියද, උත්පත්තියද සර්වප්‍රකාරයෙන් දනීද, කිසි භවයෙක්හි ලග්න නොවූ සුන්දරවූ නිවණට ගියහෙයින් සුගත නම්වූ (චතුරාර්ය සත්‍යය) අවබෝධ කළා වූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**38.** යම් ක්‍ෂීණාශ්‍රවයෙකුගේ උත්පත්ති ගතිය (නිෂ්ඨාව) දෙවියෝද, ගාන්ධර්වයෝද, මනුෂයෝද නොදනිත්ද ක්‍ෂයවූ ආශ්‍රවයන් ඇති කෙලෙසුන් කෙරෙන් දුරුවූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**39.** යමෙකුට අතීත භවයෙහිද, අනාගත භවයෙහිද, වර්තමාන භවයෙහිද කිසි පළි බෝධයක් නැද්ද පළිබෝධ නැති, රාගාදී ගැනීමක් නැති ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**40.** භය නැති හෙයින් වෘෂභරාජවූ උතුම්වූ වීර්යයවත්වූ නසල ලද කෙලෙස් සතුරන් ඇති තෘෂ්ණා රහිතවූ මාර්ග වතුරෙන් නැවාවූ අවබෝධකළාවූ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

**41.** යම් මහණෙක් පෙර විසූ කඳ පිළිවෙළ දනීද ස්වර්ගය හා අපාය දනීද, නැවත අර්හත් ඵලයට පැමිණියේද විශිෂ්ට ඥානයෙන් දැන නිෂ්ඨාවට (නිමාවට) පැමිණියේද සියලු කෙලෙසුන්ගේ අවසානයයි කියනලද බ්‍රාහ්මචර්යය වැස නිමවූ ඒ ක්‍ෂීණාශ්‍රවයා මම බ්‍රාහ්මණයයි කියමි.

# 3 උදානය

## 1. බොධි වර්ගය

1. **පඨම බොධි සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයට පැමිණ පළමුවෙන්ම නෙරංජරා ගඟ අද්දර බෝගස මුල වාසය කරණ සේක. භාග්‍යවතුන්වහන්සේ ඒ කාලයෙහි සත් දවසක් නිවන් රසය විඳිමින් එකම ආසනයකින් හුන්සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත් දවස ඇවෑමෙන් ඒ සිත එකඟ කිරීමෙන් නැගිට රාත්‍රියෙහි පළමුවැනි යාමයෙහි හේතු ප්‍රත්‍යය ධර්මය අනුපිළිවෙළින් (මෙනෙහි කළ සේක)

3. "මෙසේ මෙය ඇතිකල්හි මෙසේවේ. මෙය ඇතිවීමෙන් මෙය උපදී එනම්:- නොදැනීම, ඇතිබව හේතු කොටගෙන සංස්කාර (කර්ම) වන්නේය. සංස්කාර ඇති බැවින් විඥානය (විපාකසිත) වන්නේය. විඥානය ඇති බැවින් නාමරූප (පංචස්කන්ධය) වන්නේය. නාමරූප ඇති බැවින් ආයතන සය වන්නේය. ආයතන සය ඇති බැවින් විපාක ස්පර්ශ චෛතසිකයවේ. ස්පර්ශය ඇති බැවින් වේදනාව ඇති වන්නේය. වේදනා ඇති බැවින් තෘෂ්ණාව ඇතිවන්නේය. තෘෂ්ණාව ඇති බැවින් දැඩිවගැන්ම ඇති වන්නේය. දැඩිව ගැන්ම ඇති බැවින් භවය (කර්මද ස්කන්ධද) වන්නේය. භවය ඇති බැවින් උත්පත්තිය වන්නේය. උත්පත්තිය ඇති බැවින් ජරාව, මරණය, ශොකය, වැළපීම, කයට දුක්, සිතට දුක් දැඩිවෙහෙස යන මොව්හු පහළවෙත්. මෙසේ මේ සියළු දුක් රැස පහළවීම වේයයි" මෙනෙහි කළ සේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ අවස්ථාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක.

"කෙලෙස් තවන වීර්යය ඇති ධ්‍යාන කරණ යොගියාට යම් වේලාවක සත්තිස්බෝධිපාක්ෂික ධර්මයෝ පහළ

වෙත්ද? එකෙණෙහි හේතු ප්‍රත්‍යයෙන් හටගත් දුක් රාශිය දනීද එහෙයින් ඔහුගේ සියළු සැකයෝ දුරුවෙත්.”

2. **දුතිය බොධි සූත්‍රයඃ-** 1. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත් දවස ඇවෑමෙන් ඒ සිත එකඟ කිරීමෙන් නැඟිට රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි හේතු ප්‍රත්‍යය ධර්මය අග සිට මුලට (මෙනෙහි කළ සේක.)

3. මෙසේ මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධවේ. එනම් “නොදැනීම නැති බව හේතුකොට ගෙන සංස්කාර (කර්ම) නොවන්නේය. සංස්කාර (කර්ම) නැති බව හේතුකොටගෙන විඥාන විපාක සිත් නොවන්නේය. විඥානය නැතිබව හේතුකොට ගෙන නාමරූප (පංචස්කන්ධය) නොවන්නේය. නාමරූප නැතිබව හේතුකොටගෙන ආයතන සය නොවන්නේය. ආයතන සය නැතිබව හේතුකොටගෙන විපාක ස්පර්ශය නොවන්නේය. විපාක ස්පර්ශය නැතිබව හේතුකොටගෙන වේදනාව නොවන්නේය. වේදනාව නැතිබව හේතුකොටගෙන තෘෂ්ණාව නොවන්නේය. තෘෂ්ණාව නැතිබව හේතුකොටගෙන දැඩිව ගැන්ම නොවන්නේය. දැඩිව ගැන්ම නැතිබව හේතුකොටගෙන භව (කර්මද) ස්කන්ධද නොවන්නේය. භවය නැති බව හේතුකොට ගෙන උත්පත්තිය නොවන්නෙය. උත්පත්තිය නැතිබව හේතුකොටගෙන ජරාව, මරණය, ශොකය, වැලපීම, කයට දුක්, සිතට දුක්, දැඩි වෙහෙස යන මොව්හු නොවෙත්. මෙසේ මේ සියළු දුක් රැස් නොවීම වේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

4. “කෙලෙස් තවන වීර්යය ඇති ධ්‍යාන කරණ පව් දුරු කළ යොගීහට බොධිපාක්ෂික ධර්ම පහළ වන කල අවිද්‍යාදී හෙතුන්ගෙන් ගෙවීමට කරුණුවූ නිවන ප්‍රත්‍යක්ෂ කරණ බැවින් ඔහුගේ සියලු සැකයෝ දුරුවෙත්.”

**3. තතිය බොධි සූත්‍රයː-** 1. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

2. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිවන් සුව විඳිමින් සත් දිනක් එකම පළඟින් වැඩසිටියේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත්දින ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගිට රාත්‍රි අන්තිම යාමයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදය මුල සිට අග තෙක්ද මනාකොට සිහිකළ සේක.

3. "මෙසේ මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදයි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නැතිකිරීමෙන් මෙය නැතිවෙයි. යම් ඒ නොදැනීම් හේතුවෙන් සංස්කාර වන්නේය. සංස්කාර හේතුවෙන් විඥානය වන්නේය. විඥාන හේතුවෙන් නාම රූප වන්නේය. නාමරූප හේතුවෙන් ආයතන සය ඇති වන්නේය. ආයතන සය හේතුවෙන් ස්පර්ශ වන්නේය. ස්පර්ශ හේතුවෙන් වේදනා වන්නේය. වේදනා හේතුවෙන් තෘෂ්ණාව වන්නේය. තෘෂ්ණා හේතුවෙන් උපාදාන වන්නේය. උපාදාන හේතුවෙන් භව වන්නේය. භව හේතුවෙන් ජාති වන්නේය. ජාති හේතුවෙන් ජරා, මරණද, ශෝක, වැළපීම්, කායික දුක්, දොම්නස් වන්නේය. මෙසේ ඒ සියලු දුක් රාශියේ ඇතිවීම වෙයි.

4. නොදැනීම ඉතිරි නොකළ නැතිකිරීමෙන් සංස්කාරයන්ගේ නැති කිරීම වන්නේය. සංස්කාරයන්ගේ නැති කිරීමෙන් විඥානය නැති කිරීම වන්නේය. විඥානය නැති කිරීමෙන් නාමරූප නැතිකිරීම වන්නේය. නාමරූප නැතිකිරීමෙන් ආයතන සය නැතිකිරීම වන්නේය. ආයතන සය නැති කිරීමෙන් ස්පර්ශය නැති කිරීම වන්නේය. ස්පර්ශය නැති කිරීමෙන් වේදනාව නැතිකිරීම වන්නේය. වේදනාව නැතිකිරීමෙන් තෘෂ්ණාව නැතිකිරීම වන්නේය. තෘෂ්ණාව නැතිකිරීමෙන් දැඩිව අල්වාගැනීම නැතිකිරීම වන්නේය. දැඩිව අල්වා ගැනීම නැතිකිරීමෙන් භවය නැති කිරීම වන්නේය. භවය නැතිකිරීමෙන් ජාතිය (ඉපදීම) නැතිකිරීම වන්නේය. ජාතිය (ඉපදීම) නැතිකිරීමෙන් ජරා, මරණද, ශෝක, වැළපීම්,

කායික දුක්, දොම්නස් නැතිකිරීම් නැතිවෙත්. මෙසේ මේ සියලු දුක් රාශියේ නැතිවීමවෙයි.

5. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"කෙළෙස් තවන වීර්යය ඇති පවු පිටමංකළ යොගී තෙමේ තමහට බොධිපාක්ෂීය ධර්ම පහළ වන කෙනෙහිම අඳුර දුර ගසා අහස බබුලුවන හිරුමෙන් සියලු මර සෙනඟ බිඳහරිමින් සිටී."

**4. (අජපාල) නිග්‍රොධ සූත්‍රය** :- 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිවන් සුව විඳිමින් සත් දිනක් එකම පළඟින් වැඩ සිටියේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත් දින ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගිටි සේක. ඉක්බිති එක්තරා අනුන්ට නින්දා කරන ගති ඇති බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටියාවූ ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය. "භගවත් ගෞතමයන් වහන්ස කරුණු කීයකින් බ්‍රාහ්මණයෙක් වේද? කෙනෙකු බමුණකු කරණ ධර්මයෝ කවරහුද?" යනුවෙනි.

3. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

'පවු දුරුකළ මානාහංකාරයෙන් අනුන් හෙලා නොදක්නා කෙලෙස් කසට නැති, කෙලෙසුන් කෙරෙන් සිත රැකගත්, සතර මග නුවණින් නිවන් කරා පැමිණි මාර්ග බ්‍රහ්මචර්යය වැසනිමවූ යමෙක් වේද, හේ සැබෑ බ්‍රාහ්මණයා නම් වේ. ලොව කිසි අරමුණකුත් රාගාදී වශයෙන් නොගන්නා හෙතෙම තමා බමුණෙකැයි කියානම් ඒ කරුණු සහිතය."

**5. මහාථෙර සූත්‍රයː-** 1 මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටානන් විසින් කරවන ලද ජේතවනාරාමයයෙහි වැඩවසන සේක.

2. එකල්හි වනාහි ඇවැත්වූ සැරියුත් තෙරුන් වහන්සේද ඇවැත්වූ මහ මුගලන් තෙරුන් වහන්සේද ඇවැත්වූ මහා කාස්සප තෙරුන් වහන්සේද, ඇවැත්වූ මහා කච්චායන තෙරුන් වහන්සේද ඇවැත්වූ මහා කොට්ඨිත තෙරුන් වහන්සේද ඇවැත්වූ මහා කප්පින තෙරුන් වහන්සේද, ඇවැත්වූ මහා චුන්ද තෙරුන් වහන්සේද, ඇවැත්වූ අනුරුද්ධ තෙරුන් වහන්සේද, ඇවැත්වූ රේවත තෙරුන් වහන්සේද, ඇවැත්වූ නන්ද තෙරුන් වහන්සේද, ඇවැත්වූ ආනන්ද තෙරුන් වහන්සේද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියහ.

3. භාග්‍යවතුන් වහන්සේ එන්නාවූ ඒ තෙරුන් වහන්සේලා දුරදීම දැකී සේක්මය. දැක භික්ෂූන් ඇමතු සේක. "මහණෙනි, බ්‍රාහ්මණවූ ඔවුහු එන්නාහ. මහණෙනි, බ්‍රාහ්මණවූ ඔවුහු එන්නාහ" යනුවෙනි. මෙසේ වදාළ කල්හි එක්තරා බ්‍රාහ්මණ ජාතික භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය. "ස්වාමීනි, කරුණු කීයකින් බ්‍රාහ්මණයෙක් වේද, කෙනෙකු බමුණකු කරණ ධර්මයෝ කවරහුද?" යනුවෙනි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක. "යමෙක් තුමූ හැම කල්හි සිහි ඇත්තාහු ලාමක අකුශල ධර්මයන් බැහැර කොට හැසිරෙද්ද, නැති කළ භව බැඳුම් ඇති ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ ඔවුහුම ලෝකයෙහි බ්‍රාහ්මණයෝ වෙති."

**6. මහාකස්සප සූත්‍රයː-** 1. මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි ලෙහෙනුන්ට අභාර දුන් වේළුවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එකල්හි වනාහි ඇවැත්වූ මහකසුප් තෙරුන් වහන්සේ හටගත් ආබාධ ඇත්තේ දුක්වූයේ දැඩි ගිලන් බැව් ඇත්තේ පිප්ඵලී ගුහාවෙහි වාසය කරයි. ඉක්බිති ඇවැත්වූ මහකසුප්

තෙරුන් වහන්සේ පසු කාලයක ඒ ආබාධයෙන් නැගිට්ටේය. ඒ ආබාධයෙන් නැගිටි ඇවැත්වූ මහකසුප් තෙරුන් වහන්සේට මේ අදහස විය. 'මම රජගහ නුවර පිඬු පිණිස හැසිරෙන්නෙම් නම් යෙහෙක,' යනුවෙනි.

3. එකල්හි වනාහි පන්සියයක් දේවතාවෝ ඇවැත්වූ මහකසුප් තෙරුන් වහන්සේට පිණ්ඩපාතය දීම ලැබීමට උද්‍යෝගවත් වූහ. ඉක්බිති ඇවැත්වූ මහකසුප් තෙරුන් වහන්සේ ඒ පන්සියයක් දෙවියන් බැහැර කොට පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන රජගහ නුවර දිළින්දන්ගේ වීථිය, ඉතා දුප්පතුන්ගේ වීථිය, රෙදි වියන්නන්ගේ වීථිය යම් තැනකද එහි පිඬු පිණිස හැසුරුන සේක. රජගහ නුවර දිළින්දන්ගේ වීථිය, ඉතා දුප්පතුන්ගේ වීථිය, රෙදිවියන්නන්ගේ වීථිය යම් තැනකද එහි පිඬු පිණිස හැසිරෙන ඇවැත්වූ මහකසුප් තෙරුන් භාග්‍යවතුන් වහන්සේ දැකි සේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"අන්‍යයන් පොෂණය නොකරන්නාවූ ආර්යය සත්‍යය දත් දැමුන, සාරයෙහි පිහිටි, නැතිකළ කෙලෙස් ඇති, වමාරා දැමූ කෝපය ඇති, ඔහු මම බ්‍රාහ්මණයා යයි කියමි."

**7. අජපාලක (යක්ඛ) සූත්‍රයː-** 1. "මේ සූත්‍රය මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පාටලී නුවර අජ කලාපක චෛත්‍යස්ථානයෙහි අජ කලාපක නම් යක්‍ෂයාගේ භවනයෙහි වැඩ වසනසේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ රෑ අඳුරු කළුවරෙහි එළිමහන් තැනක වැඩ සිටියේ වෙයි. වැසි පොදද එක දෙක වැටෙයි. ඉක්බිති අජ කලාපක යක්‍ෂතෙම භාග්‍යවතුන් වහන්සේට බිය, තැති ගැන්ම, ලොමු ඩැහැගැන්ම, උපදවනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි "අක්කුලය, පක්කුලය, අක්කුල, පක්කුලය"යි තුන් වරක් ශබ්ද නැගීය, "ශ්‍රමණය මේ පිසාචයෙක්යයි" (තමා ගැනම) කීයේය.

3. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක. "යම් කලෙක බ්‍රාහ්මණතෙම ස්වකීය ධර්මයන්හි පරතෙරට ගියේ වේද එකල්හි මේ "පිසාචයාද, පක්කුල හඬද" ඉක්ම පවතියි.' යනුයි.

8. **සංගාමජි සූත්‍රයː-** 1. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඒ කාලයෙහි ආයුෂ්මත් සංගාමජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ දැකීමට සැවැත් නුවරට පැමිණියේය. ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව 'සංගාමජි ආර්යයතෙමේ සැවැත් නුවරට පැමිණියේයයි' ඇසුවාය. ඕතොමෝ දරුවා රැගෙන ජේතවනයට ගියාය. ඒ කාලයෙහි ආයුෂ්මත් සංගාමජිතෙමේ එක්තරා ගසක් යට දවල් කාලයෙහි සිටියේ විය. ඉක්බිති ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව ආයුෂ්මත් සංගාමජි යම් තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ (ii) ආයුෂ්මත් සංගාමජිට, "ශ්‍රමණය, පොඩි දරුවෙකු ඇත්තෙමි. මා පොෂ්‍ය කරවයි" කීවාය. මෙසේ කී කල්හි ආයුෂ්මත් සංගාමජි තෙමේ නිශ්ශබ්ද විය. (iii) දෙවනුවත් ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි) දෙවනුවත් අයුෂ්මත් සංගාමජිතෙමේ නිශ්ශබ්ද විය. තුන්වෙනුවත් ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව (මෙහි 2 (ii) යෙදිය යුතුයි) තුන්වෙනුවත් ආයුෂ්මත් සංගාමජිතෙමේ නිශ්ශබ්ද විය.

3. ඉක්බිති ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව ඒ දරුවා ආයුෂ්මත් සංගාමජි ඉදිරියෙහි "ශ්‍රමණය මේ තෙම තොපගේ පුත්‍රයාය, ඔහු පොෂ්‍ය කරවයි" දමාගියාය. ඉක්බිති ආයුෂ්මත් සංගාමජිතෙමේ ඒ දරුවා නොබැලීය. කථා නොකෙළේය. ඉක්බිති අයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාව නුදුරක් ගොස් බලන්නී ආයුෂ්මත් සංගාමජි ඒ දරුවා නොබලන්නාහු කථා නොකරන්නාහු දැක්කාය. දැක මේ ශ්‍රමණ තෙමේ පුත්‍රයාගේ ප්‍රයෝජන නැත්තෙකැයි' ඈට මේ සිත විය. එතැනින් හැරී ඇවිත් දරුවා ගෙන ගියාය.

**4.** භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සංගාමජිගේ පෙර භාර්යාවගේ මෙබඳු විපර්යාසය මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් දුටු සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

'එන තැනැත්තියට සතුටු නොවෙයි. යන තැනැත්තියට ශොක නොකරයි. ඇලීමෙන් සංගාමජි මිදුනේය. මම ඔහුට බමුණායයි කියමි."

**9. ජටිල සූත්‍රය:-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයාවෙහි ගයාව ඉස්මත්තෙහි වාසය කරණ සේක.

**2.** ඒ කාලයෙහි බොහෝ ජටිලයෝ හිම වැටෙන කාලයෙහි නවන් මැදින් දෙමස අතරෙහිවූ දවස් අටෙහි සීතලවූ හිම වැටෙන රාත්‍රීන්හි ගයා (තොටුපලෙහි (දියෙහි) මෙයින් පිරිසිදු බව වේයයි මතුවීමද කිමිදීමද මතුවීම කිමිදීමද කරත්. වතුරද ඉසිත් ගිනිද පුදත්.

**3.** භාග්‍යවතුන් වහන්සේ හිමවැටෙන කාලයෙහි නවම් මැදින් දෙමස අතරෙහිවූ දවස් අටෙහි සීතලවූ හිම වැටෙන රාත්‍රීන්හි ගයා තොටුපලෙහි (දියෙහි) මෙයින් පිරිසිදු බව වේයයි මතුවීමද කිමිදීමද මතුවීම කිමිදීම කරන්නාවූද, වතුර ඉසින්නාවූද ගිනි පුදන්නාවූද, ඒ බොහෝ ජටිලයන් දුටු සේක්මය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

"මෙහි බොහෝ දෙනා නාති. ජලයෙන් පිරිසිදු වූවෙක් නොවේ. යමෙකු කෙරෙහි සත්‍යයද ධර්මයද ඇත්නම් හෙතෙම හෙතෙම පිරිසුදුය. හෙතෙම බ්‍රාහ්මණද වේ."

**10. බාහිය සූත්‍රය:-** 1. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

**2.** "ඒ කාලයෙහි බාහිය දාරුචීරිය සුප්පාරක තොටෙහි මුහුදු වෙරළහි වාසය කරයි. සත්කාර කරණ ලද්දේ ගරු කරණ ලද්දේ, බුහුමන් කරණ ලද්දේ, පුදන ලද්දේ, ගෞරව කරන

ලද්දේ සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු දවස විය. ඉක්බිති විවේකයට ගියාවූ හෝ රහසිගතවූ බාහිය දාරුචිරියට "ලෝකයෙහි රහත්වූ හෝ රහත් මාර්ගයට බැස්ස යෙම් කෙනෙක් ඇත්ද, ඔවුන් අතරින් මමත් කෙනෙක්මියි" මෙසේ සිතට අදහසක් ඇතිවිය.

**3.** "ඉක්බිති බාහිය දාරුචීරිය හිතවත් යහපත කැමති පැරණි සහලේ නෑ දෙවතාවෙක් බාහිය දාරුචීරියගේ සිත තම සිතින් දාන බාහිය දාරුචීරිය යම් තනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, බාහිය දාරුචීරියට බාහිය ඔබ රහත්වී නැත. රහත් මාර්ගයට පැමිණවත් නැත. යමකින් ඔබ රහත් කෙනෙකු හෝ රහත් මගට පිළිපන් කෙනෙකු වන්නේද ඒ පිළිපැදීමද ඔබට නැතැයි" කීයේය.

**4.** "දෙවතාව, එසේ වීනම් ලෝකයෙහි කවරෙක් රහත්ද රහත් මගට පිළිපන්නේදැයි" ඇසීය. "බාහිය උතුරු ජනපදයන්හි, සැවැත් නම් නුවරක් ඇත්තේය. එහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ රහත්වූයේද රහත් බව පිණිසද බණ කියයි."

**5.** ඉක්බිති බාහිය දාරුචීරිය තෙමේ ඒ දෙවතාවා විසින් යොදවන ලද්දේ එකෙනෙහිම සුප්පාරක ජනපදයෙන් පිටත් වූයේය. සියලු තන්හි එක් රැයක් පමණක් විසීමෙන් යම් තැනක සැවත් නුවර අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි භාග්‍යවතුන් වහන්සේ වාසය කරණ සේක්ද එහි පැමිණියේය.

**6.** ඒ කාලයෙහි බොහෝ භික්ෂූහු එළිමහනෙහි සක්මන් කරත්, ඉක්බිති බාහිය දාරුචීරිය තෙමේ ඒ භික්ෂූන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන් වෙතින් "ස්වාමීනි අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වසන සේක්ද? අපි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමැත්තෝ වෙමුයි" ඇසුවේය. "බාහිය, භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ඇතුල්ගමට වැඩි සේක."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

7. "ඉක්බිති බාහිය දාරුචීරිය තෙමේ වහා ජේතවනයෙන් නික්ම සැවැත් නුවරට ඇතුල්වී සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙන පැහැදීම ඇති කරණ, පැහැදිය යුතු සන්සුන් ඉඳුරන් ඇති තැන්පත් සිත් ඇති, උතුම් ආත්ම දමනයට චිත්ත දමනයට පැමිණි, දැමුණු, රැකුණු, ඉන්ද්‍රිය සංවරයට පැමිණි උත්තමයාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ සිරි පාමුල හිස තබා වැඳ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යමක් මට බොහෝකලක් හිත සැප පිණිස වන්නේද, මට භාග්‍යවතුන් වහන්සේ ඒ ධර්මය දෙසන සේක්වා, සුගතයන් වහන්සේ මට ඒ ධර්මය දෙසනසේක්වායි' කීයේය.

8. "මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ බාහිය දාරුචීරියට බාහිය නොකල්ය. පිඬු පිණිස ඇතුළු ගමට පිවිසියෙමියි" වදාළසේක. දෙවනුවත් බාහිය දාරුචීරිය භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අනතුරක් හෝ මගේ ජීවිතයට අනතුරක් හෝ වේද, මෙය සිතාගත නොහැක්කකි. ස්වාමීනි, යමක් මට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේද, මට භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙසන සේක්වා. සුගතයන් වහන්සේ මට ධර්මය දෙසනසේක්වා."

9. දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ බාහිය දාරුචීරිය තවුසාට "බාහිය, මේ නොකල්ය. පිඬු පිණිස ඇතුළුගමට පිවිසියෙමියි" වදාළසේක. තුන්වෙනුවත් බාහිය දාරුචීරිය තවුසා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අනතුරක් හෝ මගේ ජීවිතයට අනතුරක් හෝ සිතාගත නොහැක්කකි. ස්වාමීනි, යමක් මට බොහෝකලක් හිත සැප පිණිස වන්නේද, මට භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙසන සේක්වා."

10. "බාහිය, තොප විසින් එසේ වීනම් මෙහි මෙසේ හික්මීය යුතුය. බාහිය තොපට යම්කිසි තැනක සිට දක්නා ලද්දෙහි දැකීම් මාත්‍රය වන්නේද, ඇසූ දෙයෙහි ඇසූ මාත්‍රය වන්නේද, පෘථිවි ස්පර්ශයෙහි ස්පර්ශකිරීම් මාත්‍රය වන්නේද, දක්නා ලද්දෙහි

දැනීම් මාත්‍රය වන්නේද, එහෙයින් බාහිය, නුඹ ඉන් නොවේ. යම්හෙයකින් බාහිය, නුඹ ඉන් නොවේද, එහෙයින් බාහිය, ඔබ එහි නොවේ. යම්හෙයකින් බාහිය, ඔබ එහි නොවේද, එහෙයින් බාහිය, ඔබ මෙහි මෙලොව නොමවේ. පරලොව නොවේ. මෙලොව පරලොව දෙක අතරෙහි නොවේ. දුකේ අවසානය මෙයමයි." ඉක්බිති බාහිය දාරුචීරියට භාග්‍යවතුන් වහන්සේගේ මේ ලුහුඬින් කළ ධර්ම දේශනාවෙන් එකෙණෙහිම කිසි ධර්මයක් දැඩිකොට නොගෙන කෙලෙසුන්ගේ සිත මිදුනේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බාහිය දාරුචීරියම මේ ලුහුඬු අවවාදයෙන් අවවාද කොට වැඩිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි ටික වේලාවකින් බාහිය දාරුචීරිය වසු පැටවෙක් ඇති දෙනක් ඇන ජීවිතය තොර කළාය.

11. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩ පාතයෙන් වැළැක්කේ බොහෝ භික්ෂූන් සමග නුවරින් නික්ම කළුරිය කළ බාහිය දාරුචීරිය දුටුසේක. දැක භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, බාහිය දාරුචීරියගේ ශරීරය ගනිව්. ඇඳක තබා බැහැර කොට දවව්. ඔහුට ථූපයක්ද කරව්. මහණෙනි තොපගේ සබ්‍රම්සර කෙනෙකු කළුරිය කළේය."

12. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී බාහිය දාරුචීරියගේ මළකඳ ඇඳක තබා බැහැරකොට දවා ඔහුට ථූපයක්ද කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත් පසෙක සිටි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, බාහිය දාරුචීරියගේ ශරීරය දවන ලදී. ඔහුට ථූපයක්ද කරණ ලදී. ඔහුගේ ගතිය කවරේද? පරලොව කීමෙක්දැ"යි ඇසූහ.

13. "මහණෙනි, බාහිය දාරුචීරිය පණ්ඩිතය. නව ලොකොත්තර ධර්මයට හා විදර්ශනා ඥානයට පැමිණියේය. ධර්මය වෙනුවෙන් මට වෙහෙස නොකළේය. මහණෙනි, බාහිය දාරුචීරිය පිරිනිවියේය." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

"යම් නිවණක පොළොව ජලය ගින්දර වාතය යන සතර නොපිහිටාද, එහි තාරකාද නොබබලත්. හිරුද නොපෙනේ."

බෝධි වර්ගය නිමි.

---

# 2. මුචලින්ද වර්ගය.

11. මුචලින්ද සූත්‍රයː- 1. මෙය මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ-සම්‍යක් සම්බුද්ධවූයේ ප්‍රථම කොට උරුවේලාවෙහි නෙරඤ්ජරා ගංතෙර මිදෙල්ල ගසක් මුල වැඩ වසන සේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සත් දිනක් නිවන් සුව විඳිමින් එක පළඟින් වැඩ සිටියේ වෙයි. එකල්හි වනාහි ශීත වාත අඳුර ඇති සත් දවසක් වසින මහා අකාල වැස්සක් ඇතිවිය. ඉක්බිති මුචලින්ද නම් නා රජතෙම ස්වකීය භවනයෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය සත් වරක් දරණින් වටකොට භාග්‍යවතුන් වහන්සේට සීතලක් නොවේවා. උෂ්ණයක් නොවේවා. භාග්‍යවතුන් වහන්සේට ඩැහැලේ බොන මැස්සන්ගේද මදුරුවන්ගේද වාතය හා අව්වද, දීර්ඝ ජාතීන්ගේද, ස්පර්ශය නොවේවා'යි මත්තෙහි මුදුනෙහි මහත්වූ පෙණයක්ද ඇති කොට සිටියේය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සත් දවස ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගිටිසේක. ඉක්බිති මුචලින්ද නාග රජතෙම වැහිකළු පහව ගොස් වැස්ස නැවති ඇති බව දැන භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙන් දරණ ලිහා ස්වකීය වේසය වෙනස් කොට තරුණ වෙසක් මවා හිස නමා භාග්‍යවතුන් වහන්සේට වඳිමින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිටියේය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වෙලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

"චතුර් මාර්ග ඥාන සන්තොෂයෙන් සතුටුවූ තමාට ප්‍රකට වූ ලොවුතුරා දහම් ඇති නුවණැසින් උපධි විවේකය (නිවණ)

බලන පුද්ගලයාට ඒ උපධි විවේකය සැපවේ. ලොව කිසිවකු කෙරෙහිත් නොකිපෙන බවද, සත්වාවිහිංසාවද සැපයි. කාමාශාවෙන් වෙන්වීමවූ විරාගී බව (අනාගාමී බව) ද ලොව සැපෙකි. මම ශ්‍රෙෂ්ඨවෙමියි යන ආදී වශයෙහිවූ අස්මි මානයාගේ විනාශය (රහත් බව (උසස්ම සැපයවේ.")

12. **විරාජ සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි පිණ්ඩපාතයෙන් වැළකුනාවූ සවස් වේලෙහි උපස්ථාන ශාලාවෙහි එක්වූ, රැස්වූ බොහෝ භික්ෂූන් අතර මේ අතුරු කථාවක් පහළ විය. (ii) "ඇවැත්නි, මගධ රටට අධිපති සේනා ඇති බිම්බිසාර රජුද පසේනදි කොසොල් රජුද යන මේ රජවරුන් දෙදෙනාගෙන් කවරෙක් වනාහි මහත්වූ ධන ඇත්තේද, මහත්වූ භොග ඇත්තේද, මහත්වූ කොටු ගුල් ඇත්තේද, මහත්වූ විජිතයන් ඇත්තේද, මහත්වූ වාහන ඇත්තේද, මහත්වූ බල ඇත්තේද, මහත්වූ ඍද්ධිය ඇත්තේද යනුවෙනි. (iii) එකල්හි ඒ භික්ෂූන්ගේ අතුරු කථාව අවසන් නොවීය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගිටිසේක් උපස්ථාන ශාලාව යම්තැනකද එතැනට වැඩිසේක. වැඩ පනවනලද අස්නෙහි වැඩසිටිසේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි දැන් රැස්ව කවර කථාවකින් යුක්තව සිටියහුද, කවර අතුරුකථාවක් ඉතිරිවීදැයි" විචාළසේක. "ස්වාමීනි මෙහි පිණ්ඩපාතයෙන් වැලකුණ සවස් කාලයෙහි එක්වූ රැස්වූ අප අතර මේ අතුරු කථාවක් පහළවිය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.

"ස්වාමීනි මේ අතුරු කථාව අවසන් නොවීය. එකල්හිම වතුන් වහන්සේ වැඩිසේක යනුයි.

4. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ යුෂ්මතුනට මෙය සුදුසු නොවේ. යුෂ්මත්හු කුමක් හෙයින් මෙබඳු කථා කියන්නහුද? රැස්වූ යුෂ්මතුන්ට වැඩ දෙකකි. දැහැමි කථාව හෝ ආර්‍ය්‍යවූ නිශ්ශබ්ද භාවයයි." ඉක්බිති භාග්‍යවතුන්

වහන්සේ මේ කාරණය දැන ඒ වෙලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක.

"ලෝකයෙහි යම් මානුෂික කාමසුවයක් ඇද්ද දිව්‍යකාම සුවයක් ඇද්ද, මේවා තෘෂ්ණාව දුරුකිරීමේ සැපයෙන් සොළොස්වන කලාව පමණකුත් නොවටියි."

**13. දණ්ඩාභි හනන සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි බොහෝ ළමයි සැවැත්නුවරටත් ජේතවනයටත් අතර ගරඬියෙකුට දණ්ඩෙන් හිංසා කරත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සැවැත්නුවර පිඬු පිණිස පිවිසිසේක. සැවතටත් ජේතවනයටත් අතර බොහෝ ළමයින් දණ්ඩකින් ගැරඬියෙකුට හිංසාකරණු භාග්‍යවතුන් වහන්සේ දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළ සේක.

"යමෙක් තමහට සුව කැමතිව, සැපය කැමති සතුන්ට දණ්ඩෙන් හිංසා නොකෙරේද හෙතෙම පරලොව සුව නොලබන්නේය."

**14. සක්ක රාසහන සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ (ii) සත්කාර කරණ ලද්දේ වෙයි. ගරුකාර කරණ ලද්දේ වෙයි. බහුමාන කරන ලද්දේ වෙයි. පුදන ලද්දේ වෙයි. සලකන ලද්දේ වෙයි. සිවුරු පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන මේ දේවල ලැබීම ඇත්තේ වෙයි. (iii) භික්ෂු සංඝයාද (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

3. ඉක්බිති ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේගේද භික්ෂුසංඝයාගේද සත්කාර නොඉවසන්නාහු ගමෙහිද, වනයෙහිද භික්ෂූන් දැක අසභ්‍ය නපුරු වචනවලින් බණිත්. දොස් කියත්. වෙහෙස කරත්. කෝපවෙත්. ඉක්බිති

බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියහ. එකත්පසෙක සිටියාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළහ. "ස්වාමිනී, දැන් භාග්‍යවතුන් වහන්සේ (ii) සත්කාර කරණලද්දේ, පුදනලද්දේ වෙයි. සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකර ලබන්නේ වෙයි. (iii) භික්ෂු සංඝයාද (මෙහි 3 (ii) යෙදිය යුතුයි) අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ වනාහී සත්කාර නොකරණ ලද්දාහු, ගරුකාර නොකරණ ලද්දාහු, බුහුමන් නොකරණ ලද්දාහු, නොපුදන ලද්දාහු, නොසලකන ලද්දාහු වෙති. සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකර නොලබන්නාහු වෙති. ස්වාමිනී, ඉක්බිති ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ භාග්‍යවතුන් වහන්සේගේද භික්ෂු සංඝයාගේද සත්කාර නොඉවසන්නාහු ගමෙහිද, වනයෙහිද, භික්ෂූන් දැක අසභ්‍යවූ නපුරු වචනවලින් බණිත්, දොස් කියත්, කෝප වෙත්, වෙහෙසත්" යනුයි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"තමා ගැන හෝ අන්‍යයා ගැන හෝ ගමෙහිද, වනයෙහිද සුඛ දුක්ඛ ස්පර්ශය නොසොයන්නේය. කෙලෙස් නිසා ස්පර්ශයෝ ස්පර්ශ කරත්. කෙලෙස් රහිතවූ කල කවරකු විසින් ස්පර්ශයෝ ස්පර්ශ කරණු ලැබෙද්ද"

**15. ඉච්ඡානංගල (උපාසක) සූත්‍රය**:- 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. එසමයෙහි වනාහි ඉච්ඡානංගලක නම් උපාසකයෙක් තෙම කිසියම් කටයුත්තක් සඳහා සැවැත්නුවරට පැමිණියේ වෙයි. ඒ උපාසක තෙම සැවැත්නුවර ඒ කාරණය අවසන් කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත් පසෙක සිටියාවූ ඒ උපාසකයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "උපාසකය, ඔබ මෙහි ඒමට බොහෝ කලක් ගත කළෙහිය. "ස්වාමිනී, භාග්‍යවතුන් වහන්සේ දැකීමට එනු කැමතිව

බොහෝ කලක් ගතවිය. එසේ නමුදු මම බොහෝ වැඩ කටයුතුවල යෙදුන නිසා භාග්‍යවතුන් වහන්සේ දක්නට එන්නට නොලැබීමි.” ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

“ජනතෙම ජනයා කෙරෙහි ඇළුනේය. වෙහෙසෙන්නාවූ කෙලෙස් සහිත සත්වයා බලව, සංස්කාර ධර්මයන් පිළිබඳ මනා දැනීම ඇති ඔහුට ඒකාන්තයෙන් කිසි සැපතක් නැත.”

**16. ගර්භනී සූත්‍රයඃ-** 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**2.** එ ම මෙහි වනාහි එක්තරා පිරිවැජියෙකුගේ භාර්‍ය්‍යාව වූ තරුණ මෙනෙවිය හටගත් ගැබ් ඇත්තී වැදීමට ලංව සිටියාය. ඉක්බිති ඒ පරිබ්‍රාජිකාව ඒ පිරිවැජියාට මෙය කීවාය. “බ්‍රාහ්මණය, යව ඔබ තල ගිතෙල් ආදී තෙල් ගෙනෙව. මාගේ වැදීම පිණිස යමක් උපකාර වන්නේය.” මෙසේ කී කල්හි පිරිවැජියා ඒ පරිබ්‍රාජිකාවට මෙය කීවේය. “පින්වතිය, මම කොහින් තෙල් ගෙණෙන්නෙම්ද?”, දෙවනුවද ඒ පරිබ්‍රාජිකාව පිරිවැජියාට මෙය කීවාය. “ බ්‍රාහ්මණය ඔබ යව තෙල් ගෙනෙව යමක් මාගේ වැදීම පිණිස ප්‍රයෝජනවත් වන්නේය” “පින්වතිය, මම කොහින් තෙල් ගෙන එන්නෙම්ද?” තුන්වෙනි වරද ඒ පරිබ්‍රාජිකාව ඒ පිරිවැජියාට මෙය කීවාය. “බ්‍රාහ්මණය, ඔබ යව යමක් මාගේ වැදීම පිණිස ප්‍රයෝජන වන්නේය.

**3.** ඒ කාලයෙහි පසේනදී කොසොල් රජුගේ ගබඩාවෙහි ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ගිතෙල්, තෙල් ඇතිතාක් බොන්ට දෙයි. ගෙනයන්ට නොදෙයි. ඉක්බිති ඒ පිරිවැජියාට මේ අදහස විය. පසේනදි කොසොල් රජුගේ ගබඩාවෙහි ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට ඇතිතාක් ගිතෙල් හා තලතෙල් බොන්ට දෙයි. ගෙනයන්ට නොදෙයි. මම පසේනදි කොසොල් රජුගේ ගබඩාවට ගොස් තෙල් ඇතිතාක් බී ගෙට අවුත් වමාරා දෙන්නෙම් නම් යෙහෙක මැයගේ වැදීමට යමක් උපකාර වන්නේය,” යනුවෙනි.

4. ඉක්බිති ඒ පිරිවැජි තෙම පසේනදි කොසොල් රජුගේ ගබඩාවට ගොස් ඇති තාක් තෙල් බී ගෙට අවුත් උඩට ගෙන වමාරන්නට නොහැකි වෙයි. අධෝමාර්ගයෙන් හෝ පිට කරන්නට නොහැකි වෙයි. හෙතෙම දුක්වූ දැඩිවූ රළුවූ කටුකවූ වේදනාවෙන් පෙළෙන්නේ පෙරළෙයි, ආපසු පෙරළෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සැවැත් නුවර පිඬු පිණිස පිවිසි සේක. දුක්වූ, දැඩිවූ, රළුවූ වේදනාවෙන් පෙරළෙන්නාවූ ආපසු පෙරෙළෙන්නාවූ ඒ පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේ දුටු සේක්මය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"ජනතෙම ජනයාකෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ වෙයි. වෙහෙසෙන්නාවූ කෙලෙස් සහිත සත්වයා දෙස බලව, යම් කෙනෙක් කෙලෙස් රහිතයෝද ඒකාන්තයෙන් සැප ඇත්තෝමය. වෙදගුනම් රහත් පුද්ගලයෝ කෙලෙස් රහිතයෝ වෙති."

17. **එකපුත්තන සූත්‍රය:-** 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එසමයෙහි එක්තරා උපාසකයෙකුගේ ප්‍රියවූ මන වඩන්නාවූ එකම පුත්‍රයෙක් විය. ඉක්බිති බොහෝ උපාසකවරු තෙත් වූ වස්ත්‍ර ඇතිව තෙත් හිසකේ ඇතිව මධ්‍යාහ්නයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ. එකත් පසෙක සිටියාවූ ඒ උපාසකයින්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "උපාසකයෙනි, තෙපි තෙත් වස්ත්‍ර ඇතිව තෙත් හිසකේ ඇතිව මධ්‍යාහ්නයෙහි මෙහි කුමක් පිණිස පැමිණියහුද?" මෙසේ වදාළ කල්හි ඒ උපාසක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය. "ස්වාමිනී, මාගේ ප්‍රියවූ මනවඩන්නාවූ එකම පුත්‍රයෙක්

විය. ඔහු කාලක්‍රියා කළේය. එහෙයින් අපි තෙත් වස්ත්‍ර ඇතිව තෙත් හිසකේ ඇතිව මධ්‍යාහ්නයෙහි මෙහි පැමිණියෙමු.”

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

“දෙවියෝද බොහෝ මිනිස්සුද ප්‍රිය රූපයන් කෙරෙහි යහපත්යයි සිතාගන්නාහුද පිරිහෙන්නාහු දුක් දෙන්නාහු මරුවාගේ වසඟයට යත්.

යම් කෙනෙක් රෑද දවල්ද අප්‍රමාද වූයේ ප්‍රිය රූපය දුරු කෙරෙද්ද? ඒකාන්තයෙන් ඔවුහුම දුකට මුල සාරාදමත්. මරුවාගේ ආමිසය ඈත් කළාහු වෙති.”

18. **සුප්පවාසා සූත්‍රයː-** 1. මේ සූත්‍රය මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුණ්ඩියා ප්‍රදේශයෙහි කුණ්ඩධාන නම් වනයෙහි වැඩවසන සේක.

2. එසමයෙහි සුප්පවාසා නම් කොලිය ධීතෘව සත්වසක් වූ ගැබ දරන්නී ගැබ සරසට වැටී සත් දිනක් ගතවිය, ඇය දුක්වූ දැඩිවූ කටුකවූ වේදනාවෙන් පෙළුනී තුන් විතර්කයන්ගෙන් ඉවසන්නීය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධය. යම් ඒ සම්‍යක්සම්බුද්ධතෙම මේ දුක නැති කිරීමට ධර්මය දේශනාකරයි, ඒ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඒකාන්තයෙන් මනාව පිළිපන්නේය. යම්බඳු ඒ සංඝතෙම මේ දුක නැතිකිරීම පිණිස පිළිපන්නේය. යම් තැනක මෙබඳු දුකක් නැද්ද ඒ නිර්වාණය මනා සැපයකි. (යනු සිතා)

3. ඉක්බිති ඒ කොලිය ධීතෘව ස්වාමියා ඇමතීය. “ආර්ය පුත්‍රය ඔබ මෙහි එනුමැනවි. භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි යනු මැනව. ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිනු මැනව. සුව දුක් බල පහසුවිහරණ විචාරනු මැනවි. “ස්වාමීනි, සුප්පවාසා කොලියධීතෘව භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳින්නීය. සුව දුක් බල පහසුවිහරණ විචාරන්නීය. මෙසේද කියනු මැනවි. “ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව සත්වසක්වූ ගැබ දරන්නී ගැබ සරස්ව දින සතකි. ඇය දුක්වූ දැඩිවූ රළුවූ

වේදනාවන්ගෙන් පෙළුනී තුන් විතර්කයන්ගෙන් ඉවසන්නීය. ඒකාන්තයෙන් ඒ භාග්‍යවත්තෙම සම්‍යක් සම්බුද්ධය. යම්බඳුවූ ඒ භාග්‍යවත්තෙම මෙබඳුවූ මේ දුක නැති කිරීම පිණිස ධර්මය දේශනා කරයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාව පිළිපන්නේය. යම්බඳු ඒ සංඝතෙම මෙබඳුවූ මේ දුක නැතිකිරීම පිණිස පිළිපන්නේය. යම් තැනක මෙබඳු දුකක් නැත්තේද, ඒ නිර්වාණය මනා සුවයකි, ඉතා හොඳයයි' ඒ කොළියපුත්‍රතෙම සුප්පවාසා කොලිය ධීතෘවට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූම ඒ කොලියපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

4."ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳින්නීය. සුවදුක් බල පහසු විහරණ විචාරන්නීය. මෙසේද කියන්නීය. 'ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව සත්වස්වූ ගැබ් දරන්නී ගැබ සරස්ව දින සතකි. ඇය දුක්වූ දැඩිවූ රළුවූ වේදනාවෙන් පෙළුනී තුන් විතර්කයන්ගෙන් ඉවසන්නී ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධය. යම්බඳු ඒ භාග්‍යවත්තෙම මෙබඳුවූ මේ දුක් නැති කිරීම පිණිස ධර්මදේශනා කරණසේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඒකාන්තයෙන් සුපිළිපන්ය. යම්බඳු ඒ සංඝතෙම මෙබඳු මේ දුක් නැතිකිරීම පිණිස පිළිපන්නේය. යම්තැනක මෙබඳු දුකක් නැත්තේද ඒ නිර්වාණය මනා සුවයකි.'

5. "සුප්පවාස කොලිය ධීතෘව රෝග නැත්තී සැප ඇත්තී වේවා, නිරෝගිවූ පුතෙකු වදාවා"යි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සමගම සුප්පවාසා කොලිය ධීතෘව රෝග නැත්තී සැප ඇත්තී නිරෝගවූ පුතෙකු වැදුවාය. "එසේය ස්වාමීනියි" ඒ කොලිය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට ස්වකීය ගෘහය යම් තැනකද එහි ආපසු ගියේය. සුප්පවාස කොලිය ධීතෘව සැප ඇත්තී රෝග නැත්තී නිරෝගවූ

පුතකු වැදූබව කොලිය පුත්‍රතෙම දැක්කේමය. දැක ඔහුට මේ අදහස වීය. 'තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇතිබව, මහත් ආනුභාව ඇතිබව පින්වත්නි, ආශ්චර්යය පුදුමය. යම් තැනක මේ සුප්පවාසා කොලිය ධීතෘව භාග්‍යවතුන් වහන්සේගේ වචනය සමගම සැප ඇත්තී රෝග නැත්තී නිරෝගවූ පුතෙකු වදන්නේ යයි' සතුටු සිත් ඇත්තේ ප්‍රමුදිතවූයේ සතුටු සොම්නස් ඇත්තේ විය.

**6.** ඉක්බිති සුප්පවාස කොලිය ධීතෘව ස්වාමියා ඇමතුවාය. "ආර්යය පුත්‍රය, ඔබ මෙහි එනු මැනව, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණෙනු මැනව. පැමිණ ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳින්නේයයි' මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිනු මැනව. මෙසේද කියනු මැනව. 'ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව සත්වයක් ගැබ දරුවා සත් දිනක් ගැබ සරස්ව සිටියාය. ඇය දැන් සැප ඇත්තී රෝග නැත්තී නිරෝගවූ පුතෙකු වැදුවාය. ඇය සත් දිනක් බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා බතින් ආරාධනා කරන්නීය.' ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සුප්පවාසා කොලිය ධීතෘවගේ බත්සත භික්ෂු සංඝයා සමග පිළිගන්නාසේක්වා" යනුවෙනි. "ඉතා හොඳයයි" ඒ කොලිය පුත්‍රතෙම සුප්පවාසා කොලිය ධීතෘවට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පසෙක හුන්නාවූම ඒ කොලිය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. 'ස්වාමීනි, සුප්පවාසා කොලිය ධීතෘව සත්වසක් ගැබ දරුවා සත් දිනක් ගැබ සරස්ව සිටියාය. ඇය දැන් සැප ඇත්තී රෝගනැත්තී නිරෝගවූ පුතෙකු වැදුවාය. ඇය සත්දිනක් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට බතින් පවරන්නීය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සුප්පවාසා කොලිය ධීතෘවගේ බත්සත භික්ෂු සංඝයා සමග ඉවසනසේක්වා' යනුයි."

**7.** එකල්හි වනාහී එක්තරා උපාසක කෙනෙකු විසින් බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයා හෙට පිණිස බතින් පවරණ ලද්දේවෙයි. ඒ

උපාසකතෙමේද ඇවැත්වූ මහමුගලන් තෙරුන් වහන්සේගේ උපස්ථායකයෙක් වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඇවැත්වූ මහමුගලන් තෙරුන් වහන්සේ ඇමතූසේක. "මොග්ගල්ලානය, ඔබ මෙහි එන්න, ඒ උපාසකතෙම යම්තැනෙක්හිද එහි යන්න ගොස් ඒ උපාසකයාට මෙසේ කියන්න. "ආයුෂ්මත, සුප්පවාසා කොලිය ධීතෘව සත්වසක් ගැබ දරුවාය. සත් දිනක් ගැබ සරස්වූවා. ඇය දැන් සැප ඇත්තී රෝග නැත්තී නිරෝගවූ පුතෙකු වැදුවාය. සත් දිනක් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයා බතින් පවරන්නීය. සුප්පවාසා කොලිය ධීතෘවගේ බත්සත ඉෂ්ට කෙරේවා. ඔබගේ දානයට පැමිණීම පසුව ඉටුකරන්නේය" යනුවෙනි.

"එසේය, ස්වාමීනියි" ඇවැත්වූ මහා මුගලන් තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචනදී, ඒ උපාසක තෙම යම් තැනකද එහි පැමිණියහ. පැමිණ ඒ උපාසකයාට මෙය කීහ. "ඇවත, සුප්පවාසා කොලිය ධීතෘව සත්වසක් ගැබ දරුවාය. සත් දිනක් ගැබ සරස්ව සිටියා දැන් සැප ඇත්තී රෝගනැත්තී නිරෝගවූ පුතෙකු වැදුවාය. සත්දිනක් බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා බතින් පවරයි. සුප්පවාසා කොලිය ධීතෘවගේ බත්සත ඉටුකෙරේවා, ඔබ පසුව දෙනු මැනවි"යි යනුයි. ස්වාමීනි, ඉදින් මට ආර්යවූ මහා මොග්ගල්ලානයන් වහන්සේ භොගයන්ටද ජීවිතයටද ශ්‍රද්ධාවටද ඇප කෙරේ නම් සුප්පවාසා කොලිය ධීතෘව බත්සත ඉටුකෙරේවා. මම පසුව ඉටුකරන්නෙමි" "ඇවත, භොගයන්ටද ජීවිතයටද යන ධර්ම දෙකට ඇප ඇත්තේය. ශ්‍රද්ධාව වනාහි ඔබගේම ඇපය වන්නේය. ස්වාමීනි, ඉදින් මට ආර්යවූ මහා මොග්ගල්ලානයන් වහන්සේ භොගයටද ජීවිතයටද යන ධර්ම දෙකට ඇප වන්නේ නම් සුප්පවාසා කොලිය ධීතෘව බත්සත ඉටුකෙරේවා. මම පසුව ඉටුකරන්නෙමි." ඉක්බිති ඇවැත්වූ මහමුගලන් තෙරුන් වහන්සේ ඒ උපාසකයාට දන්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "ස්වාමීනි, මා විසින් ඒ උපාසකයාට දන්වනලදී.

සුප්පවාසා කොලිය ධීතෘව බත්සත ඉටුකෙරේවා හෙතෙම පසුව ඉටුකරන්නේය." යනුවෙනි.

8. "ඉක්බිති සුප්පවාසා කොලිය ධීතෘව සත්දිනක් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට ප්‍රණීතවූ කෑයුතු දැයින්ද බුදියයුතු දැයින්ද සියතින් තෘප්තියට පත්කළාය. මනාකොට පවරා දුන්නීය. ඒ දරුවා ලවා භාග්‍යවතුන් වහන්සේ ද සියලු භික්ෂු සංඝයාද වැන්දවිය. ඉක්බිති ඇවැත්වූ සැරියුත් තෙරුන් වහන්සේ ඒ දරුවාට මෙසේ කීහ. "කිමෙක්ද දරුව ඔබට ඉවසිය හැකිද? යැපියහැකිද? කිමෙක්ද කිසි දුකක් නැද්ද?" යනුවෙනි.

"ස්වාමීනි, මට ඉවසීමක් කොයින්ද, යැපීමක් කොයින්ද සත්වසක් ලොහෝ සැළියෙහි විසීමි."

9. ඉක්බිති සුප්පාවාසා කොලිය ධීතෘව මාගේ පුත්‍රයා ධර්ම සේනාපතීන් වහන්සේ සමග කථාකරන්නේයයි සතුටු සිත් ඇත්තී ප්‍රමුදිතවූවා සොම්නස් වූවාය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සතුටු සිත් ඇති ප්‍රමුදිතවූ, සොම්නස්වූ සුප්පවාසා කොලිය ධීතෘව දැක සුප්පවාසා කොලිය ධීතෘවට මෙය වදාළසේක. " සුප්පවාසාව, ඔබ තවත් මෙබඳු පුතකු කැමති වන්නෙහිද?" "ස්වාමීනි, මම මෙබඳු පුත්‍රයන් සත් දෙනෙකුන් කැමතිවන්නෙමි."

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

"යම්කලෙක ඥානයෙන් යුක්තවූ මුනි නම් වූ බ්‍රාහ්මණතෙම තමා විසින් ආර්යසත්‍යය දැනගන්නා ලද්දේද, එහි චන්‍ද්‍රයාගේ ආලෝකය නොබබළයි. එහි අන්ධකාරය නැත. ඉක්බිති රූපාරූපයෝද සැප දුක්ද මිදෙත්."

**19. විසාඛා සූත්‍රයඃ-** 1. මේ සූත්‍රය මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාර මාතෘප්‍රාසාද නම් පූර්වරාමයෙහි වැඩවසනසේක.

2. එකල්හි වනාහි මිගාර මාතෘ නම් විශාඛාව විසින් කිසියම් වැඩක් ඇත්තේ පසේනදී කොසොල් රජු කෙරෙහි ඇලෙනලද්දී වෙයි. පසේනදී කොසොල් රජතෙම සුදුසු පරිදි මෙය තීරණය

නොකරයි. ඉක්බිති මිගාරමාතෘ නම් විශාඛාතොමෝ මධ්‍යාහ්නයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාය. එකත්පසෙක සිටියාවූම මිගාරමාතෘ නම් වූ විශාඛාවට භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රකාශකළසේක.

3. "විශාඛාවෙනි, මේ මධ්‍යාහ්නයෙහි ඔබ කොහි සිට එන්නීද?" කියායි.

"ස්වාමීනි, මෙහි මාගේ කිසියම් කාරණයක් ඇත්තේ පසේනදී කොසොල් රජු කෙරෙහි ඇළුනේ වෙයි. පසේනදී කොසොල් රජතෙම සුදුසු පරිදි එය තීරණය නොකරයි." යනුයි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක.

"අනුන් අයත් සිලල්ල දුක්ය. සියලු සැප යයි ගන්නාලද සම්පත් අනුන් හා සාධාරණය ඇතිකල්හි වෙහෙසත්. කෙලෙස් ඉක්මවීම ඒකාන්තයෙන් දුෂ්කරය."

**20. භද්දිය කාලිගොධා සූත්‍රයః-** 1. මේ සූත්‍රය මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනුපිය නම් අඹවනයෙහි වැඩවසනසේක.

2. එකල්හි වනාහි කාළි ගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ අරණ්‍යට ගියේද රුක්මුලට ගියේද ශූන්‍යාගාරයට ගියේද ඉතා ප්‍රීතියි, ඉතා ප්‍රීතියි' කියා ප්‍රීතිවාක්‍යය පවත්වයි. අරණ්‍යයට ගියාවූද. රුක්මුළට ගියාවූද ශූන්‍යාගාරයට ගියාවූද කාළි ගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේගේ 'ඉතා ප්‍රීතියි, ඉතා ප්‍රීතියි' යන ප්‍රීතිවාක්‍යය පැවැත්වීම බොහෝ භික්ෂූහු ඇසුවාහුමය. අසා ඒ භික්ෂූන්ට මේ අදහස විය. 'ඇවැත්ති, (ii) කාළිගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරතෙම ඇලීමක් නොමැතිව බඹසර හැසිරෙයි. යම් හෙයකින් හෙතෙම ගිහි කාලයෙහි රාජ්‍ය සැපය ඇතිව විසුයේද, හෙතෙම එය සිහිකරමින් වනයට ගියේද, රුක්මුලටගියේද, ශූන්‍යාගාරයට ගියේද නිතර 'ඉතා ප්‍රීතියි, ඉතා ප්‍රීතියි' යන ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කරයි, යනුවෙනි.

3. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියාහ. එකත්පස්ව සිටියාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "ස්වාමීනි, (මෙහි 2(ii) යෙදිය යුතුයි)

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවකට ඇමතූසේක. 'භික්ෂුව මෙහි එව, ඔබ මාගේ වචනයෙන් 'ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවන්නේයයි' භද්දිය භික්ෂුව කැඳවව"- "එසේය ස්වාමීනියි" ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචනදී කාළිගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ඔබ අමතනසේකැයි" කාළිගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "එසේය, ඇවැත්නි"යි කාලිගෝධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දිය තෙම ඒ භික්ෂුවට උත්තරදී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක සිටියාමවූ කාළිගොධාවගේ පුත්‍රවූ ආයුෂ්මත් භද්දියහට භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රකාශ කළසේක.

5. "භද්දිය, ඔබ වනයට ගියේද රුක්මුලට ගියේද ශූන්‍යාගාරයට ගියේද නිතර 'ඉතා ප්‍රීතියි' 'ඉතා ප්‍රීතියි' යනුවෙන් ප්‍රීතිවාක්‍යය පවත්වන්නේ සැබෑද?"- "එසේය ස්වාමීනි" "භද්දිය ඔබ කුමන කාරණයක් සිහිකරමින් වනයට ගියේද, රුක්මුලට ගියේද, ශූන්‍යාගාරයට ගියේද, නිතර "ඉතා ප්‍රීතියි ඉතා ප්‍රීතියි' යනුවෙන් ප්‍රීතිවාක්‍ය පවත්වන්නෙහිද?"

6. "ස්වාමීනි, මා පෙර ගිහිවූයේ රාජ්‍යය කරවන කල්හි ඇතුළු නගරය ඇතුළෙහිද ආරක්ෂාව මනාකොට කරණලද්දේ විය. ඇතුළුනුවර පිටතද ආරක්ෂාව මනාකොට තබනලද්දේ විය. නගරයෙහි ඇතුළතද ආරක්ෂාව මනාකොට තබනලද්දේ විය. නගරයෙහි පිටතද ආරක්ෂාව මනාකොට තබනලද්දේ විය. ස්වාමීනි, ඒ යම් මෙසේ ආරක්ෂා ඇත්තේ සැඟවීම් ඇත්තේ

බියවූයේ, තැතිගත්තේ සංකා ඇත්තේ, භටගත් ලොමුඩැහැගැනීම් ඇත්තේ වීමි. ස්වාමීනි, දැන් වනාහි මම වනයට ගියේද රුක්මුලට ගියේද ශූන්‍යාගාරයට ගියේද තනිවූයේ බිය නැත්තේ තැති නොගත්තේ සැකනැත්තේ ලොමුඩැහැගැනීම් නැත්තේ (මාගේ ආරක්‍ෂාවට) උත්සාහ නැත්තේ පහතට හෙලූ ලෝම ඇත්තේ, අනුන් අයත් පැවතුම් ඇත්තේ (වනයක් හැර වනයකට යන) මුවන්ගේ මෙන් සිතින් වාසයකරමි. ස්වාමීනි, මම මේ කාරණය සිතමින් වනයට ගියේද රුක්මුලට ගියේද ශූන්‍යාගාරයට ගියේද, නිතර 'ඉතා ප්‍රීතියි, ඉතා ප්‍රීතියි' යනුවෙන් ප්‍රීති වාක්‍යය පැවැත්වීමි.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය වදාළසේක.

"යමෙකුගේ අභ්‍යන්තරයෙහි කෝපයෝ නැත්තාහුද, භවයෙන් භවය ඇතිකරණ තෘෂ්ණාව ඉක්මවූයේද, පහකළ බිය ඇති ශෝක නැති සැපත ඇති ඔහු අධිගත මාර්ගය හැර උප්පත්ති දෙවියෝ දැකීමට නොහැකිවෙත්."

**(දෙවැනි මුචලින්ද වර්ගය නිමි.)**

---

## 3. නන්ද වර්ගය.

**21. කම්ම විපාකජ සූත්‍රයඃ-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි)

**2.** එ සමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් අරමිණිය ගොතා, ඇඟ කෙළින් තබා පෙර කර්මයේ විපාකයෙන් ඇතිවූ තියුණු, රළු, කටුක දුක් වේදනාව ඉවසමින් සිහි ඇතිව, මනා දැනීම් ඇත්තේ, නොපෙළෙන්නේ භාග්‍යවතුන් වහන්සේ අසළ හුන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේ අරමිණිය ගොතා ඇඟ කෙළින් තබා, පෙර කර්මයේ විපාකයෙන්වූ තියුණු, රළු, කටුක, දුක් වේදනාව ඉවසන සිහි ඇති, මනා දැනීම් ඇති, නොපෙළෙන, අසල සිටි ඒ භික්‍ෂුව දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක. "සියලු කර්මයන් දුරලන, පෙරකළ කෙලෙස් (දූවිලි) කම්පාකරන, මමත්වය (-මගේ කියා ගැනීම) නැති, සිටියාවූ, කම්පා නොවන භික්ෂුවට ජනයාට කියයුතු වැඩක් නැත."

**22. නන්ද බ්‍රහ්මචරිය සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1. ඡේදය යෙදිය යුතුයි.)

2. එ සමයෙහි වනාහි බුදුන්ගේ කුඩා මවගේ පුත් ආයුෂ්මත් නන්ද තෙමේ රැස්වූ බොහෝ භික්ෂූන්ට මෙසේ කියයි. (ii) "ඇවැත්නි, මම ඇල්මෙන් තොරව මහණ දම් පුරමි. මහණ දම හොඳට දරා ගැනීමට නොහැක්කෙමි. ශික්ෂාව ප්‍රතික්ෂෙප කොට ගිහි වන්නෙමි." (iii) ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවකට ආමන්ත්‍රණය කළසේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තෙක හුන්නේය. එක් පසෙක හුන් ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ සහෝදරවූද කුඩා මවගේ පුත්‍රවූද ආයුෂ්මත් නන්ද රැස්වූ බොහෝ භික්ෂූන්ට මෙසේ ප්‍රකාශකරයි. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

3. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවූසේක. "භික්ෂුව, එන්න ආයුෂ්මත් නන්දය, ශාස්තෘන් වහන්සේ ඔබට කථාකරතියි" යන මගේ වචනයෙන් නන්ද භික්ෂුවට කථා කරන්න.

"ස්වාමීනි, එසේය"යි, ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී ආයුෂ්මත් නන්ද යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් නන්දට "ආයුෂ්මත් නන්ද, ශාස්තෘන් වහන්සේ ඔබට කථාකරතියි" මෙය කීය.

"ඇවැත්නි, හොඳයයි" ආයුෂ්මත් නන්ද ඒ භික්ෂුවට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් ආයුෂ්මත් නන්දට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** "නන්‍ද, ඔබ රැස්වූ බොහෝ භික්ෂූන්ට 'ඇවැත්නි, මම ඇල්මෙන් තොරව මහණකම් කරමි, මහණකම හොඳට දරාගන්නට නොහැක්කෙමි, ශික්ෂාව ප්‍රතික්ෂෙපකොට ගිහි වන්නෙමියි' මෙසේ ප්‍රකාශ කරහි?" "ස්වාමීනි, එසේය."

"නන්‍ද, ඔබ කුමක් නිසා ඇල්මෙන් තොරව මහණදම් කරහිද, මහණකම හොඳට දරාගන්නට නොහැක්කෙහිද, ශික්ෂා ප්‍රතික්ෂෙපකොට ගිහි වන්නෙහිද?"

**5.** "ස්වාමීනි, ජනපද කල්‍යාණී නම් ශාක්‍යපුත්‍රිය, ගෙදරින් පිටවන මට අඩක් පීරූ කෙසින් මා බලා ආර්ය පුත්‍රය, ඉක්මනින් එන්නයයි" මට මෙය කීවාය.

"ස්වාමීනි, ඒ මම ඇය සිහිකරන්නේ ඇල්මෙන් තොරව මහණදම් කරමි. මහණකම හොඳට දරන්නට නොහැක්කෙමි. ශික්ෂාව ප්‍රතික්ෂෙපකොට ගිහි වන්නෙමි."

**6.** ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්‍ද අතින් අල්ලාගෙන, යම්සේ බලවත් පුරුෂයෙක් හැකිළවූ අත දික් කරන්නේද දික්කළ අත හකුළන්නේද මෙසේම ජේතවනයෙන් අතුරුදන්ව, තව්තිසා දෙවියන් අතර පහළ විය. එසමයෙහි වනාහි පරෙවි (රතු) පා ඇති පන්සියයක් පමණ දිව්‍යාප්සරාවෝ දෙවියන්ට අධිපති ශක්‍රයාට උපස්ථානයට පැමිණියාහුවෙත්.

**7.** ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්‍දහට කථාකළසේක. "නන්‍ද, ඔබ මේ පරෙවි (රතු) පා ඇති පන්සියයක් පමණ දිව්‍යාප්සරාවෝ නොදක්නෙහිද?" "ස්වාමීනි, එසේය." "නන්‍ද, ඔබ කුමක් සිතන්නෙහිද? ශාක්‍යප්‍රතී ජනපද කල්‍යාණියද පරෙවි පා ඇති මේ පන්සියයක් දිව්‍යාප්සරාවෝද යන මින් කවරක් වනාහි වඩා රූමත්ද, වඩා දැකුම් කලුද වඩා පහදවයිද?"

**8.** "ස්වාමීනි, යම්සේ කන් නාශා සිඳුණු දැවුණු වැඳිරිය යම්සේද, ස්වාමීනි, එසේම ශාක්‍යප්‍රතී ජනපද කල්‍යාණිය පන්සියයක් දිව්‍යාප්සරාවන් හා සමකිරීමේදී ගණනකට හෝ කලාවකට හෝ කලා අර්ධයකට හෝ නොඑයි. එහෙම නමුත්

මේ පන්සියයක් අප්සරාවෝ වඩාරූමත්ය. වඩා දැකුම්කලුය, වඩා පහදවත් නන්ද, සිත් අලවන්න, නන්ද සිත් අලවන්න. පරෙවි පා ඇති පන්සියයක් අප්සරාවන් ලබා දීමට මම තොපට ඇපවෙමි.' "ස්වාමීනි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මට පරෙවි පා ඇති පන්සියයක් දිව්‍යාංගනාවන් ලබාදීමට ඉදින් මට ඇපවනසේක්ද, ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචය්‍ය්‍යාව රකීමෙහි ඇලෙන්නෙමි."

**9.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්ද තෙරුන් අතින්ගෙන යම්සේ වනාහි බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දික්කරන්නේද, දික්කල අතක් වක්කරන්නේද, එසේම තව්තිසා වැසි දෙවියන් අතරෙහි අතුරුදහන්වූයේ ජේතවනයෙහි පහළ විය. භාග්‍යවතුන් වහන්සේගේ මවගේ සහෝදරියගේ පුත්‍ර ආයුෂ්මත් නන්ද දිව්‍යාංගනාවන් නිසා මහණකම් කරයි. පරෙවිපා ඇති පන්සියයක් දිව්‍යාංගනාවන් ලබාදීමට භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඇපවීයයි භික්ෂූහු ඇසුවාහුය.

**10.** ඉක්බිති ආයුෂ්මත් නන්දගේ යහළු භික්ෂූහු "ආයුෂ්මත් නන්ද මෙහෙකරු කථාවෙන්ද මුදලට ගත්තෙකැයි යන කථාවෙන්ද කථාකරත්. ආයුෂ්මත් නන්ද තෙමේ මෙහෙකරුවෙකි. ආයුෂ්මත් නන්ද තෙමේ මුදලට ගත් කෙනෙකි. දිව්‍යාංගනාවන් නිසා මහණකම් කරයි. භාග්‍යවතුන් වහන්සේ පරෙවි පා ඇති පන්සියයක් දිව්‍යාංගනාවන් ලබාදීමට ඇපවූසේක. ඉක්බිති ආයුෂ්මත් නන්දතෙමේ යහළු භික්ෂූන්ගේ මෙහෙකරු කථාවෙන්ද මිලයට ගත්තෙකැයි යන කථාවෙන්ද පිළිකුල් කරණු ලබන්නේ නින්‍දා කරණු ලබන්නේ ලජ්ජා කරනු ලබන්නේ හුදකලාවූයේ පිරිසෙන් ඈත්වූයේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්‍ය ඇත්තේ නිවන්වෙත යොමුකළ සිත් ඇතිව වාසයකරන්නේ ටික කාලයකින් කුලපුත්‍රයෝ වහාම ගිහිගෙන් නික්ම අනගාරික සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වෙත්ද මහණකම අවසන්කොට ඇති ශ්‍රෙෂ්ඨවූ ඒ නිවණ තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට පැමිණ වාසය කරයි. උත්පත්තිය ක්‍ෂයවිය. මහණකම කරණලදී, කටයුතු කරණලදී. මින්මතුවට

අනිකක් නැතැයි දත්තේය. ආයුෂ්මත් නන්‍ද තෙමේ රහතන් අතරින් කෙනෙක් විය.

11. ඉක්බිති එක්තරා දෙවතාවෙක් මනහර රාත්‍රියෙහි යහපත් පාටඇති සම්පූර්ණ ජෙතවනරාමය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවතාවා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මවුගේ සහෝදරියගේ පුත්‍රවූ ආයුෂ්මත් නන්‍ද කෙලෙස් ක්‍ෂයවීමෙන් කෙලෙස් නැති අර්හත්ඵල විමුක්තියද අර්හත්ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට පැමිණ වාසය කරයියයි" කීයේය. භාග්‍යවතුන් වහන්සේටද නන්‍ද තෙමේ ආශ්‍රවයන් ක්‍ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියටද අර්හත්ඵල ප්‍රඥාවටද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට පැමිණ වාසය කෙරේයයි මෙසේ දැනුමක් ඇතිවිය.

12. ඉක්බිති ආයුෂ්මත් නන්‍ද තෙමේ ඒ රාත්‍රිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් නන්‍ද තෙම භාග්‍යවතුන් වහන්සෙට "ස්වාමීනි, පරෙවි පා ඇති පන්සියයක් දිව්‍යාංගනාවන් ලබාදීමට මට භාග්‍යවතුන් වහන්සේ යම් ඇපයක්වූසේක්ද, ස්වාමීනි මම මේ පොරොන්දුවෙන් භාග්‍යවතුන් වහන්සේ මුදවමියි" කීවේය. "නන්‍ද තෙමේ අකුසල් නැති කිරීමෙන් අකුසල් රහිත අර්හත්ඵල විමුක්තියද අර්හත්ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට පැමිණවාසය කෙරේයයි දැනගතිමි. දෙවියෝද මට "ස්වාමීනි ආයුෂ්මත් නන්‍ද තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ මවුගේ සහෝදරීගේ පුත්‍රයාය. කෙලෙස් පහවීමෙන් කෙලෙස් නැති අර්හත්ඵල විමුක්තියද අර්හත්ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට පැමිණ වාසය කෙරේයයි' සැලකළේය. නන්‍දය, තොපගේ සිත යම් වේලාවක කෙලෙසුන්ගෙන් මිදුනේද, ඉක්බිති මම ඒ ඇපයෙන් නිදහස්වූවෙමි.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

"ආර්යමාර්ග නැමැති ඒදණ්ඩ කරණකොටගෙන යමෙකු විසින් සංසාර නැමැති මඩවගුර තරණය කරණ ලද්දේ, ක්ලෙශකාම නැමැති කටුව මාර්ග ඥාන නමැති පොල්ලෙන් පොඩිකර දමන ලද්දේද, රහත් ඵලයත් නිවණත් ලැබූ ඒ භික්ෂූතෙම සැපදුක් දෙකෙහි නොසෙල්වේ."

23. **යසොජපමුඛ සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි)

2. ඒ කාලයෙහි යසොජ ප්‍රධාන පන්සියයක් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දකින්නට සැවැත්නුවරට පැමිණියාහුවෙත්. (ii) මෙහි ඒ ආගන්තුක භික්ෂූහු ආවාසික භික්ෂූන් සමග සතුටු නොවන්නාහු සෙනසුන් පනවමින් පාත්‍ර සිවුරු හකුලමින් උස්හඬ මහාහඬ ඇත්තෝ වූහ. (ii) ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "ආනන්ද, මසුන් අල්ලන කෙවුලන් මෙන් උස්හඬ මහහඬ ඇත්තාවූ ඔව්හු කවරහුදැ" යි ආයුෂ්මත් ආනන්ද තෙරුන් අතින් විචාළේය.

3. "ස්වාමීනි යසොජ ප්‍රධාන පන්සියයක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත් නුවරට පැමිණියාහුය. (මෙහි 2 (ii) යෙදියයුතුයි.) ආනන්දය, එසේවීනම් මගේ වචනයෙන් 'ආයුෂ්මතුනි භාග්‍යවතුන් වහන්සේ කැඳවත්යයි" ඒ 'භික්ෂූන්ට අඬගසව්" "ස්වාමීනි එසේයයි," ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තරදී ඒ භික්ෂූහු යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන්ට "ආයුෂ්මතුන්ට භාග්‍යවතුන් වහන්සේ කථා කරත්යයි" කීයේය. "ඇවැත්නි එසේදැයි" ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්දට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මසුන් අල්ලන කෙවුලන්මෙන් තෙපි කුමක්හෙයින් උස්හඬ මහහඬ ඇත්තාහුදැයි" ඇසූහ. මෙසේ වදාළකල්හි ආයුෂ්මත්

යසොජ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි මේ පන්සියයක් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත් නුවරට පැමිණියාහුය. (මෙහි 2 (ii) යෙදියයුතුයි.)

**4.** "මහණෙනි, යව් තොප මා සමීපයේ නොවසව්යයි ඔවුන් නෙරපව්" ඒ භික්ෂූහු "එසේය ස්වාමීනියි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට සෙනසුන් හකුළුවා පාත්‍ර සිවුරුගෙන වජ්ජිරට යම් තැනෙක්හිද එහි පයින් වැඩියාහුය. පිළිවෙළින් වජ්ජිරට ඇවිදින්නෝ වග්ගු මුදානදිය යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ වග්ගු මුදානදිය අද්දර කොලකුටිකොට වස්වැසූහ.

**5.** ඉක්බිති ආයුෂ්මත් යසොජතෙමේ වස්වැසුයේ "ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් යහපත කැමැත්තෙන්, හිතවත්ව, අනුකම්පාවෙන් කරුණාවෙන් අප නෙරපන ලද්දාහුය. ඇවැත්නි එසේ හෙයින් අපි දැන් යම්සේ වාසය කරණ අපට භාග්‍යවතුන් වහන්සේ සතුටු වනසේක්ද එසේ වාසය කරමුයි" කීවේය. "ඇවැත්නි එසේයයි" ඒ භික්ෂූහූ ආයුෂ්මත් යසෝජට පිළිතුරු දුන්හ.

**6.** ඉක්බිති ඒ භික්ෂූහු විවෙකයටගියාහු අප්‍රමාදවූවාහු කෙලෙස් තවන්නාහු කාය ජීවිත දෙක්හි අපෙක්ෂා රහිතව වාසය කරන්නෝ ඒවස් කාලයේම සියල්ලෝම ත්‍රිවිද්‍යාවන් ලබාගත්තාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර කැමතිතාක්කල් වැස විශාලානුවර යම් තැනෙක්හිද එහි වැඩිසේක. පිළිවෙළින් වඩිනසේක් විශාලා නුවරට පැමිණිසේක.

**7.** භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර මහා වනයෙහි කූටාගාරශාලාවෙහි වාසය කරති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදා තීරයෙහිවූ භික්ෂූන්ගේ සිත තම සිතින් දැන මෙනෙහිකොට ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූසේක. "ආනන්දය අර දිශාවෙහි මට එළියක් පහළවූවාක්මෙනි. ආනන්දය අරදිශාවෙහි මට දිලිසීමක් පහළවූවාක්මෙනි. යම් දිශාවක වග්ගුමුදා තීරයෙහිවූ භික්ෂූන් වසත්ද, මට යන්නට පිළිකුල්ය, මෙනෙහි කරන්නට පිළිකුල්ය. ආනන්දය, ඔබ

වග්මුදාතීරයෙහිවූ භික්ෂූන් වෙත ආයුෂ්මත්වරුන්ට භාග්‍යවතුන් වහන්සේ කථාකරණසේක. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මතුන් දක්නට කැමතිසේකැයි කියා දූතයකු යවන්න' "ස්වාමීනි එසේයයි" ආයුෂ්මත් ආනන්දතෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී එක්තරා භික්ෂුවක් යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ ඒ භික්ෂුවට ඇවැත්නි එව වග්ගුමුදාතෙරෙහිවූ භික්ෂූන් යම්තැනෙක්හිද එහි යන්න, ගොස් වග්ගුමුදාතීරයෙහිවූ භික්ෂූන්ට, "ආයුෂ්මතුන්ට භාග්‍යවතුන් වහන්සේ කථාකරති, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මතුන් දක්නා කැමත්තාහයි" මෙසේ කියන්නැයි කීවේය. 'ඇවැත්නි එසේයයි," ඒ මහණතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට පිළිතුරුදී යම්සේ (ii) බලවත් පුරුෂයෙක් ඇකුළූ අත හෝ දික්කරන්නේද දික්කළ අත හෝ වක්, කරන්නේද එසේම මහාවනයෙහි කූටාගාර ශාලාවෙන් අතුරුදහන් වූයේ වග්ගුමුදාගංතෙර ඒ භික්ෂූන් ඉදිරිපිට පෙනී සිටියේය.

8. ඉක්බිති ඒ මහණතෙම වග්ගුමුදාතීරයෙහිවූ භික්ෂූන්ට "ආයුෂ්මතුන්ට භාග්‍යවතුන් වහන්සේ කථා කරනසේක. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මතුන් දක්නට කැමතිසේකැයි" කීවේය. "ඇවැත්නි එසේයයි" ඒ භික්ෂූහු ඒ භික්ෂුවට පිළිතුරු දී සෙනසුන් අකුලා තබා පාත්‍ර සිවුරුගෙන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළූ අත දික්කරන්නේද, දික් කළ අත වක් කරන්නේද එසේම වග්ගුමුදා ගංතෙර අතුරුදහන් වී මහාවනයෙහි කූටාගාරශාලාවෙහි භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිට පෙනීසිටියාහුය.

9. ඒ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේ නොසෙල්වෙන එකඟකමින් සිටියහ. ඉක්බිති ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ දැන් කිනම් වාසයකින් වෙසෙත්දැයි" මේ සිතවිය. ඉක්බිති ඒ භික්ෂූන්ට 'භාග්‍යවතුන් වහන්සේ දැන් නොසෙල්වෙන එකඟකමකින් වෙසෙත්යයි' සිත් විය. සියල්ලෝම නොසෙල්වෙන සමාධියෙන් වැඩ හුන්නාහුය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ (ii) මනහර රාත්‍රියෙහි පළමුවෙනි යාමය නික්මුනු කල්හි අස්නෙන් නැගිට සිවුර එකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි ඇඳිලි බැඳ

භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි රාත්‍රිය මනහරය. ප්‍රථම යාමය ඉක්ම ගියේය. ආගන්තුක භික්ෂූහු බොහෝ වේලා වාඩිවී සිටියෝය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් සමග සතුටුවනසේක්වායි" කීයේය.

**10.** මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූසේක. දෙවනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ (ප්‍රථමයාමය යන්නට මධ්‍යමයාමය කියා වෙනස්කර මෙහි 9 (ii) යෙදිය යුතුයි.) දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූසේක. තුන්වෙනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මනහර රාත්‍රියෙහි අන්තිමයාමය අවසන්වූ පසු අරුණනැගිකල්හි රාත්‍රීමුඛය යහපත්වූ කල්හි අස්නෙන් නැගිට සිවුර එකස්කොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, රාත්‍රිය යහපත්ය. අන්තිම යාමය අවසන්විය, අරුණ නැංගේය, රාත්‍රි මුඛය යහපත්ය. ආගන්තුක භික්ෂූහු පැමිණ බොහෝකල්ය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කථාකරණසේක්වා."

**11.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ එකග්‍රකමින් නැගිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ඇමතුසේක. "ආනන්දය, ඉදින් ඔබදන්නේ නම් මෙපමණකුත් තොපට කථා නොකරන්නේය. ආනන්දය මමද මේ භික්ෂූන් පන්සියද යන සියල්ලෝම නොසෙල්වෙන එකග්‍රකමින් හුන්නාහු වෙමුයි" වදාළසේක.

**12.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

"යමෙකු විසින් කාම නැමැති කටුද බැනවැදීමද, වධද, බන්ධනද, දිනන ලද්දේද, ඒ මහණතෙම පර්වතයක් මෙන් සිටියේ කම්පානොවන්නේ සැපදුක් දෙකෙහි නොවෙවුලයි."

**24. සාරිපුත්ත පසංසා සූත්‍රයඃ-** 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1ඡේදය මෙනි.)

2. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි පළක් බැඳ කය කෙළින් තබා යොමු කළ සිහිය ඇතිකොට හුන්නේවෙයි. පළක් බැඳ කෙළින් කය තබා යොමු කළ සිහිය ඇතිකොට නුදුරෙහි හුන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ දුටු සේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

"නොසෙල් වෙන්නාවූ මනාව පිහිටියාවූ ගල් පර්වතය යම්සේද එසේ මෝහය නැතිකර දැමූ භික්ෂුව පර්වතයක් මෙන් කම්පා නොවෙයි."

**25. කොලිත පසංසා සූත්‍රයඃ-** 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එසමයෙහි වනාහි ඇවැත්වූ මහමුගලන් තෙරුන් වහන්සේ පළක් බැඳ කය කෙළින් තබා කය අනුව බලන සිහිය ඇතුළත යොදවා භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි හුන්නේ වෙයි. පළක් බැඳ කය කෙළින් තබා කය අනුව බලන සිහිය ඇතුළත යොදවා නුදුරෙහි හුන් ඇවැත්වූ මහමුගලන් තෙරුන් වහන්සේ භාග්‍යවතුන් දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළසේක.

"කය අනුව බලන සිහිය යෙදූ සවැදෑරුම් ස්පර්ශායතනයන්හි හික්මීම ඇති නිතර එකඟ සිත් ඇති භික්ෂූතෙම තමාගේ නිර්වාණය දන්නේය.

**26. පිළින්දිවච්ඡ (සමුදාචාර) සූත්‍රයඃ-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එකල්හි වනාහි ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙම භික්ෂූන්ට වසල වාදය කියමින් හැසිරෙයි. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ.

එකත්පසෙක සිටියාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "ස්වාමීනි, ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙම භික්ෂූන්ට වසල වාදය කියමින් හැසිරෙයි."

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවකට ඇමතූසේක. "මහණ, මෙහි එනු මැනවි. මාගේ වචනයෙන් 'ඇවැත් පිලින්දිවච්ඡයෙනි, භාග්‍යවතුන් වහන්සේ ඔබ කැඳවන්නේයයි' පිලින්දිවච්ඡ භික්ෂුවට අඬගසනු මැනවි" "එසේය ස්වාමීනියි" ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දී ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙම යම් තැනකද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට මෙය කීවේය. "ඇවැත්නි, ඔබට ශාස්තෘන්වහන්සේ අමතන සේක." - "එසේය ඇවැත්නියි" ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙම ඒ භික්ෂුවට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේය.

4. එකත් පසෙක සිටියාවූ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "වච්ඡය. ඔබ භික්ෂූන්ට වසල වාදයෙන් කථාකරන්නේය යනු සැබෑද?" - "එසේය ස්වාමීනි" ඉක්බිති ආයුෂ්මත් වච්ඡගේ පෙර විසූ ජාති පිළිවෙල සිහිකොට භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, යුෂ්මත්හු වච්ඡ භික්ෂූවට දොස් නැගීම වශයෙන් ශබ්ද නොකරව්. මහණෙනි, වච්ඡ භික්ෂූව ඇතුළත කෝපය ඇතිව භික්ෂූන්ට වසල වාදය නොකියයි. මහණෙනි, වච්ඡ භික්ෂූව ජාති පන්සියයක් කොකඩවම බ්‍රාහ්මණ කුලයෙහි උපන්නේය. ඔහුට ඒ වසල වාදය බොහෝ කලක් පලපුරුදුය. එහෙයින් මේ වච්ඡ භික්ෂූව භික්ෂූන්ට වසල වාදය කියමින් හැසිරෙයි."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

5. "යමකු කෙරෙහි රැවිටිල්ලද මාන්නයද නොපවතීද යමෙක් ක්‍ෂය කළ ලොභ ඇත්තේ මමය මාගේයයි දෘෂ්ටිය නැත්තේ ආශාව නැත්තේ ක්‍රොධය වෙන් කෙළේ නිවුණු

ආත්ම භාවයක් ඇත්තේද හෙතෙම බ්‍රාහ්මණ නම් වේ, ශ්‍රමණ නම් වේ, භික්ෂු නම් වේ.”

**27. මහාකස්සප පසංසා සූත්‍රය:- 1.** (මෙහි 1 වර්ගයේ 6 සූත්‍රය 1 ඡේදය යෙදිය යුතුයි)

**2.** එසමයෙහි වනාහි ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පිප්ඵලි ගුහාවෙහි වාසය කරති. එක්තරා සමාධියකට සමවැද සත් දිනක් එකම පළඟින් වැඩ සිටියේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙම ඒ සත් දින ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගිටියහ. ඒ සමාධියෙන් නැගිට ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට ඉක්බිති මේ අදහස විය. මම රජගහ නුවර පිඬු පිණිස හැසිරෙන්නෙම් නම් යෙහෙක යනුයි. එසමයෙහි වනාහි පන්සියයක් දේවතාවෝ ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පිණ්ඩපාතය පිළියෙල කිරීමට උද්‍යෝගවත් වෙති. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඒ පන්සියයක් දේවතාවන් ප්‍රතික්ෂෙප කොට පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන රජගහ නුවර පිඬු පිණිස හැසුරුණහ.

**3.** එකල්හි වනාහි දෙවියන්ට අධිපති ශක්‍රතෙම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පිණ්ඩපාතය දෙනු කැමැත්තෙන් වෙයි. හෙතෙම රෙදි වියන්නෙකුගේ වෙශයක් ගෙන නූල් කටියි. සුජාතා නම් අසුර කන්‍යාව ඒවා ඔතයි. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙම රජගහ නුවර ගෙපිළිවෙළින් පිණ්ඩපාතයෙහි හැසිරෙන්නේ දෙවියන්ට අධිපති ශක්‍රයාගේ නිවාසය යම් තැනකද, එහි පැමිණියහ. ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එන බව දෙවියන්ට අධිපති ශක්‍රයා දුරදීම දැක්කේය. දැක ගෙයින් නික්ම පෙර මගට ගොස් අතින් පාත්‍රය ගෙන ගෙට පිවිස වළඳෙහි බත් ගෙන පාත්‍රය පුරවා ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පිළිගැන්විය. ඒ පිණ්ඩපාතය නොයෙක් සූප රශව්‍යඤ්ජනයෙන් යුක්තය. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මේ අදහස විය. යමෙකුගේ මෙබඳු ආනුභාවයක් ඇත්තේද, මේ සත්වයා කවරෙක්ද? කියායි.

4. ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මේ අදහස වීය. මේ ඒකාන්තයෙන් දෙවියන්ට අධිපති ශක්‍රයාය. මෙසේ දැන දෙවියන්ට අධිපති ශක්‍රයාට මෙසේ කීහ. "ශක්‍රය, ඔබ මෙය කරණ ලද්දේය. නැවත මෙසේ නොකළ මැනවි." "කාශ්‍යපයන් වහන්ස අපටද පිනෙන් ප්‍රයෝජන ඇත, අපටද පිනෙන් වැඩ ඇත." ඉක්බිති දෙවියන්ට අධිපති ශක්‍රතෙම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණාකොට අහසට පැන නැග අහසෙහි සිට තුන්වරක් ආශ්චර්යය දානයක් උතුම් දානයක් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ වෙත පිහිටුවන ලදී යනුවෙන් ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළේය.

5. භාග්‍යවතුන් වහන්සේ මිනිස් කය ඉක්මවූ දිව කණින් දෙවියන්ට අධිපති ශක්‍රයාගේ අහසට පැනනැග අහසෙහි සිට ආශ්චර්යයවත් දානයක් පුදුම දානයක් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කෙරෙහි පිහිටුවන ලදී. "ආශ්චර්යයවත් දානයක් පුදුම දානයක් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කෙරෙහි පිහිටුවන ලදී. යනතුන් වරක් කරණ ලද ප්‍රීති වාක්‍යය ඇසූසේක්මය.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

> "තමා පොෂණය කරන්නාවූ අන්‍යයකු පොෂණය නොකරන්නාවූ තාදීවූ උපශාන්තවූ හැමකල්හි සිහි ඇති පිණ්ඩපාතික භික්ෂුවට දෙවියෝ කැමතිවෙත්."

28. **පිණ්ඩපාතික පසංසා සූත්‍රයː-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි පිණ්ඩපාතයෙන් වැළකුණු සවස් කාලයෙහි කරේරි නම් රවුම් මඩුවෙහි රැස්වූ බොහෝ භික්ෂූන් අතර මේ අතුරු කථාවක් පහළවිය. (ii) "ඇවැත්නි පිණ්ඩපාතික භික්ෂුව පිණ්ඩපාතයෙහි හැසිරෙන විට කලින් කළ මන වඩන රූපයන් ඇසින් දකින්නට ලැබෙයි. කලින් කළ මනවඩන ශබ්දයන් කණින් අසන්නට ලැබෙයි. කලින් කළ මනවඩන රශයන් දිවින් රශ බලන්නට ලැබෙයි. කලින් කළ මනවඩන

ස්පර්ශයන් කයින් ස්පර්ශ කරන්නට ලැබෙයි. ඇවැත්නි, පිණ්ඩපාතික භික්ෂුව සත්කාර කරණ ලද්දේ ගරුකාර කරණ ලද්දේ බහුමාන කරණ ලද්දේ පුදන ලද්දේ සලකන ලද්දේ පිඬු පිණිස හැසිරෙයි. එබැවින් අපිද පිණ්ඩපාතිකයෝ වෙමු. අපිද කලින් කල මනවඩන රූපයන් ඇසින් දකින්නට හැකිවෙමු. අපිද කලින් කළ මනවඩන ශබ්දයන් කණින් අසන්නට හැකිවෙමු. අපිද කලින් කල මනවඩන සුවඳ නාසයෙන් ආඝ්‍රානය කරන්නට හැකිවෙමු. අපිද කලින් කල මනවඩන රශයන් දිවෙන් රශ බලන්නට හැකිවෙමු. අපිද කලින් කළ මනවඩන ස්පර්ශයන් කයින් ස්පර්ශ කරන්නට හැකිවෙමු. අපිද සත්කාර කරණ ලද්දෝ ගරුකාර කරණ ලද්දෝ බහුමාන කරණ ලද්දෝ පිඬු පිණිස හැසිරෙන්නෙමු" කියායි.

3. ඒ භික්ෂූන් ගේ මේ අතුරුකථාව ඉතිරි වීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගිටිසේක් කරේරි මණ්ඩල මාලය (රවුම් මළුව) යම් තැනකද එතැන්හි වැඩි සේක. වැඩ පනවල ලද ආසනයෙහි වැඩ සිටි සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි කවර කථාවකින් යුක්තව හුන්නහුද යුෂ්මතුන්ගේ කවර නම් අතුරු කථාවක් ඉතිරිවීදැයි" යනුවෙනි. "ස්වාමීනි, මෙහි පිණ්ඩපාතයන් වැළකුණු සවස් කාලයෙහි කරේරි මණ්ඩල මාලයෙහි එක්වූ රැස්වූ අපගේ මේ අතුරු කථාවක් ඇතිවිය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි) ස්වාමීනි, මේ අපගේ අතුරු කථාව ඉතිරිවූයේ විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි සේක."

4. "මහණෙනි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූ යුෂ්මතුන්ට මෙය සුදුසු නොවේ. යුෂ්මත්හු යම් ඒ මෙබඳු කථාකරන්නහුද, මහණෙනි, රැස්වූ යුෂ්මතුන් විසින් වැඩ දෙකක් කටයුතුය. දැහැමි කථාව හෝ ආර්යවූ තුෂ්ණිම්භාවයද යනුයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය වදාළ සේක.

(ii) "තමා පොෂණය කරන්නාවූ අනුන් පොෂණය කිරීමක් නැති තාදීවූ කීර්ති ප්‍රශංසාවෙහි නොඇළුන භික්ෂුව දෙවියෝ කැමතිවෙත්."

**29. සිප්පඟ්ග සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එසමයෙහි වනාහි පිණ්ඩපාතයෙන් වැළකුණාවූ සවස් කාලයෙහි මණ්ඩල මාලයෙහි එක්වූ රැස්වූ බොහෝ භික්ෂූන්ගේ මේ අතුරු කථාවක් ඇතිවිය. (ii) ඇවැත්නි, කවරෙක් වනාහි ශිල්පය දනීද කවරෙක් කවර ශිල්පයක් ඉගෙණගන්නේද, ශිල්පයන්ගේ කවර ශිල්පයක් උතුම්ද?' යනුයි. ඇතැමෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් අශ්ව ශිල්පය උතුම්ය. කෙනෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් රථ ශිල්පය උතුම්ය. අයෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් කඩු ශිල්පය උතුම්ය. ඇතැම් කෙනෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් රේඛා ශාස්ත්‍රය උතුම්ය. තවත් කෙනෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් ගණිත ශාස්ත්‍රය උතුම්ය. කෙනෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් ලිවීමේ ශාස්ත්‍රය උතුම්ය. තවත් අයෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් කාව්‍ය ශිල්පය උතුම්ය. කෙනෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් පරලොව විශ්වාස නොකරණ ඉගැන්වීම් උතුම්ය, ඇතැමෙක් මෙසේ කීහ. ශිල්පයන්ගෙන් කුඹුරු පිළිබඳ ඉගැන්වීමේ ශිල්පය උතුම්ය.

3. ඒ භික්ෂූන්ගේ මේ අතුරු කථාව ඉතිරිවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි විවේකයෙන් නැගිටිසේක් මණ්ඩල මාලය යම් තැනකද එතැන්හි වැඩිසේක. වැඩ පනවනලද අස්නෙහි වැඩසිටියහ. වැඩහිඳම භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව සිටියාහුද? කවර නම් අතුරුකථාවක් කොට ඉතිරිවීද?" යනුයි.

"ස්වාමීනි මෙහි පිණ්ඩපාතයෙන් වැළකුණු සවස්කාලයෙහි මණ්ඩල මාලයෙහි එක්වූ රැස්වූ අපගේ මේ අතුරුකථාවක් ඇතිවිය. (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) ස්වාමීනි මේ අතුරුකථා ඉතිරිවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩිසේක යනුයි."

4. (මෙහි මේ වර්ගයේ 28 සූත්‍රයේ 4 (i) යෙදිය යුතුයි.)

"සැහැල්ලු පැවැත්මක් ඇති, තමහට වැඩකැමති, ශිල්පයන්ගේ ජීවිකාව නොකරණ, ඉන්ද්‍රියයන් හික්මවූ

සියලුකෙලෙස් දුරු කළ, බැඳුන නිවාසයක් නැති, ආත්ම දෘෂ්ටිය නැතිකළ, ආශා රහිත මාරයා (මරණ) නසා තනිව හැසිරෙන හෙතෙමේ භික්‍ෂුනමි.”

**30. ලොකවොලොකන සූත්‍රයඃ- 1.** මේ සූත්‍රය මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙලාවෙහි නෙරඤ්ජරා ගංතෙර සම්‍යක් සම්බුද්ධවූයේ ප්‍රථම කාලයෙහි වැඩවසනසේක.

**2.** එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ සත්දිනක් එකම පළඟින් නිවන්සුව විඳිමින් වැඩසිටිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සත්දිනක් ඇවෑමෙන් ඒ සමාධියෙන් නැගිට බුදු ඇසින් ලොව බැලූසේක. බුදු ඇසින් ලොව බලන සේක් රාගයෙන් හටගත්, ද්වේෂයෙන් හටගත්, මොහයෙන් හටගත් නොයෙක් තැවීම්වලින් තැවෙන නොයෙක් දාහවලින් දැවෙන නොයෙක් සත්වයන් දැකිසේක්මය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

**3.** “තැවීම් ඇති ස්පර්ශයෙන් පීඩිත මේ ලොකය ආත්මවශයෙන් සිතන්නහුට රෝගයක් යයි කියයි. යමෙකු විසින් එයින් අන්පරිද්දෙකින් වේයයි සිතාද භවයට පැමිණි තැනැත්තේ වෙනස් වන්නේය. භවයෙහි ඇළුන ලෝකයා භවය ගැනම සතුටුවෙයි. යමක සතුටු වේද ඒ භයකි. යමකට භයවේද ඒ දුකකි. භවය දුරු කිරීමට වනාහි මේ බඹසර හැසිරෙයි. යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ භවයෙන්ම (ශාස්වත දෘෂ්ටියෙන්) භවයාගේ මිදීම කීවාහුද ඒ සියල්ලෝම භවයෙන් නොමිදුනාහුයයි” කියමි.

“යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ විභවයෙන්ම (උච්ඡෙද දෘෂ්ටියෙන්) භවයාගේ නික්මීම කීවාහුද ඒ සියල්ලෝම භවයෙන් නොනික්මුනෝයයි කියමි.

“කෙලෙස් නිසා මේ දුක පැමිණෙයි. සියලු උපාදානයන්ගේ නැති කිරීමෙන් දුකෙහි ඉපදීමක් නැත. මේ මහා ලොකය බලව, සත්වයෝ අවිද්‍යාවෙන් යුක්තය. සත්වයෝ

අවිද්‍යාවෙහි ඇළුනෝය. නොමිදුනෝය. යම්කිසි භවයකින් සැමතැන කෙලෙස් පැතිරීම වෙයි. "ඒ සියලු භවයෝ අනිත්‍යය පිණිස දුක් පිණිස, වෙනස්වීම පිණිස වෙති.

"මෙසේ මෙය ඇතිපරිද්දෙන් මනා නුවණින් දක්නා තැනැත්තේ භව තෘෂ්ණාව දුරුකරයි. විභවයෙහි සතුටු නොවෙයි. සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්‍ෂයවීමෙන් ඉතිරිනොවූ නොඇලීම ඇති නිරොධ නම් නිර්වාණය ලබයි. "නිවුනාවූ ඒ භික්‍ෂුවට උපාදානයන්ගේ නැවත ඇතිවීමක් නොවෙයි. මාරයා මැඩ කෙලෙස් සටනින් ජයගත් කෙලෙස් දුරුකළ ඒ තැනැත්තේ සියලු භවයන් ඉක්මවූයේය."

---

## 4. මෙඝිය වර්ගය.

31. **මෙඝිය සූත්‍රය**:- 1-14. (මෙහි අංගුත්තර නිකායේ (9) නවක නිපාතයේ 1 වර්ගයේ 3 වෙනි වූ මෙඝිය සූත්‍රයේ ඡේද 1-14 යෙදිය යුතුයි.) (පිට 1467)

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ අවස්ථාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක.

"සිතට අනුව ගිය, සිත මතුකරණ කුඩා විතර්ක කෙනෙක් ඇද්ද, සියුම් විතර්කකෙනෙක් ඇද්ද, සිතෙහි මේ විතර්කයන් නොදැනීමෙන් නැතිගත් සිත් ඇත්තේ පරලොවින් පරලොවටම දුවයි.

"සිහි ඇත්තාවූ කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූ නුවණැත්තේ සිතෙහි මේ විතර්ක දැන විතර්කයන් සංවර කරයි. බුදුරජතෙම මේ ස්වල්පවූ සිතෙහි (කෙලෙස්) මතුවීම ඉතිරි නොකොට දුරුකළසේක."

32. **උද්ධත භික්ඛු සූත්‍රය**:- 1. මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජවරුන්ගේ සල්වනයෙහි වාසය කරණසේක.

**2.** ඒ කාලයෙහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි කැලෑකුටියේ වාසය කරත්. (ii) නොසන්සුන් වූවාහු එසවූ මානනල ඇත්තාහු, චපලවූවාහු, කෲර වචන ඇත්තාහු, විසිරුණු වචන ඇත්තාහු, මුළාසිහි ඇත්තාහු, යහපත් නුවණැත්තාහු, එකඟසිත් නැත්තාහු තැතිගත් සිත් ඇත්තාහු, ප්‍රකෘති ඉන්ද්‍රියයන් ඇත්තාහු වෙත්.

**3.** "නුදුරු කැලෑකුටියේ වසන (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) "ඇත්තාහු" යන්නට "ඇති" කියා වෙනස්කරගත යුතුයි,) ඒ බොහෝ භික්ෂූන් දැක්කේය.

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක.

"නොරක්නාලද, මිසදිටුගත්, නිදිබර ගතියෙන් මැඩුණු කයින් මාරයාගේ වසඟයට යයි. එහෙයින් රක්නාලද සිත් ඇති යහපත් කල්පනා ඇසුරුකරණ සම්‍යක් දෘෂ්ටිය පෙරටුකරණලද නිදිබරගතිය මැඩ පවත්වන මහණතෙම ඉපදීම හා විනාශය දැන සියලු දුගතීන් අත්හරින්නේය."

**33. ගොපාල (මරණ) සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සමූහයක් සමඟ කොසොල් ජනපදයෙහි පයින් වඩිනසේක.

**2.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත්ව එක්තරා ගසක් යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ පනවනලද අස්නෙහි වැඩහුන්සේක. ඉක්බිති එක්තරා ගොපල්ලෙක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. (ii) එකත්පසෙක සිටි ඒ ගොපල්ලාට භාග්‍යවතුන් වහන්සේ (iii) දැහැමි කථාවෙන් කරුණු ගෙනහැර පෙන්වූසේක, සමාදන් කරවූසේක, තෙදගැන්වූසේක, සතුටුකළසේක.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු ගෙනහැර දක්වනලද, සමාදන් කරවන ලද, තෙදගන්වන

ලද සතුටුකරණලද ඒ ගොපලුතෙම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හෙට දවස දානය පිණිස භික්ෂුසංඝයා සමග ඉවසා වදාරණසේක්වා.” භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවයෙන් ඉවසූසේක. ඉක්බිති ඒ ගොපලුතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන අස්නෙන්නැගිට පැදකුණුකොට ගියේය.

**4.** ඉක්බිති ඒ ගොපලුතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් තමාගේ ගෘහයෙහි බොහෝ දිය නුමුසු කිරිබත්ද අළුත් ගිතෙල්ද සකස්කරවා, භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි කල්සරිය, දානය නිමවීයයි” භාග්‍යවතුන් වහන්සේට දැන්වූයේය.

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන භික්ෂුසංඝයා සමග ඒ ගොපල්ලාගේ නිවස යම්තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ පණවනලද ආසනයෙහි වැඩසිටිසේක. ඉක්බිති ඒ ගොපලුතෙම බුදුන් ප්‍රධාන භික්ෂුසංඝයා දිය නුමුසු කිරිබතින්ද, අළුත් ගිතෙලින්ද සියතින් සතප්පවූයේය, පැවරූයේය. ඉක්බිති ඒ ගොපලුතෙම වැළඳූ පාත්‍රයෙන් පසෙකට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේ ලඟ එක්තරා පහත් අස්නක් ගෙන එකත්පසෙක හිඳගත්තේය. භාග්‍යවතුන් වහන්සේ එකත්පසෙක හුන් ඒ ගොපල්ලා දැහැමි කථාවෙන් කරුණු සහිතව පෙන්වා, සමාදන් කරවා, තෙදගන්වා, සතුටුකරවා අස්නෙන් නැගිට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් ඒ ගොපල්ලා එක්තරා පුරුෂයෙක් සීමාව තුළදී දිවි තොරකළේය.

**6.** ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි යම් ගොපල්ලෙකු විසින් අද බුදුන් ප්‍රධාන භික්ෂුසංඝයා දිය නුමුසු කිරිබතින්ද අළුත් ගිතෙලින්ද, සියතින් සතප්පවන ලද්දේද, පවරණ ලද්දේද, ස්වාමීනි, ඒ ගොපලුතෙම එක්තරා පුරුෂයෙකු විසින් සීමාව අතරේදී ජීවිතයෙන් තොරකරණ ලද්දේයයි” කීවාහුය.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක.

"සොරෙක් හෝ සතුරෙක් හෝ යමෙකුට නපුරක් කරන්නේද දශ අකුශල්හි යෙදූ සිත ඒ පුද්ගලයාට සොර සතුරන් විසින් කරණු ලබන අනර්ථයට වැඩිවූ අනර්ථයක් කරන්නේය. ඔහු අතිශයින් ලාමක කරන්නේය."

34. **ජුණ්හරත්ති සූත්‍රයඃ-** 1. මෙහි 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඒ කාලයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහමොග්ගලාන ස්ථවිරයන් වහන්සේද, පරෙවි කඳුරෙහි වාසය කරත්. ඒ කාලයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙමේ ආලොකවත් රාත්‍රියෙහි අළුත මුඩුකළ හිසින් යුක්තව අවකාශ ස්ථානයෙහි එක්තරා සමාධියකට සමවැදහුන්නේ වේ. ඒ අවස්ථාවෙහි යහළු යක්‍ෂයන් දෙදෙනෙක් කිසියම් කරුණක් කරණ කොටගෙන උතුරු දිගින් දකුණු දිගට යන්නාහු ඒ යක්‍ෂයෝ ආලෝකවත් රාත්‍රියෙහි අළුත මුඩුකළ හිසද ඇතිව අවකාශස්ථානයෙහි හුන් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් දැක එක් යක්‍ෂයෙක් දෙවෙනි යක්‍ෂයාට "යහළුව, මේ ශ්‍රමණයාගේ හිසෙහි පහරක් දෙන්නට මට සිතේයයි" කීයේය.

3. මෙසේ කී කල්හි ඒ යක්‍ෂතෙම ඒ යක්‍ෂයාට, "යහළුව එපා ශ්‍රමණයාට හිරිහැර නොකරව, යහළු, ඒ ශ්‍රමණයා උදාර කෙනෙකි. මහත් ඍද්ධි ඇත්තේය, මහත් ආනුභාව ඇත්තේයයි" කීයේය. දෙවනුවත් ඒ යක්‍ෂතෙම ඒ යක්‍ෂයාට, "යහළුව, මේ ශ්‍රමණයාගේ හිසෙහි පහරක් දෙන්නට මට සිතේයයි" කීයේය; දෙවනුවත් ඒ යක්‍ෂතෙම ඒ යක්‍ෂයාට "යහළුව කම් නැත ශ්‍රමණයාට හිරිහැර නොකරව, යහළුව ඒ ශ්‍රමණයා උදාර කෙනෙක, මහත් ඍද්ධි ඇත්තෙකි. මහත් ආනුභාව ඇත්තෙකි." තුන්වෙනුවත් ඒ යක්‍ෂ තෙම ඒ යක්‍ෂයාට "යහළුව, මේ ශ්‍රමණයාගේ හිසෙහි පහරක් දෙන්නට මට සිතේ යයි" කීයේය. තුන්වෙනුවත් ඒ යක්‍ෂ තෙම ඒ යක්‍ෂයාට "යහළුව, කම්නැත, ශ්‍රමණයාට හිරිහැර නොකරව, යහළුව ඒ ශ්‍රමණයා උදාර

කෙනෙකි, මහත් ඍද්ධි ඇත්තෙකි. මහත් ආනුභාව ඇත්තෙකි. "ඉක්බිති ඒ යක්ෂ තෙම ඒ යක්ෂයාගේ වචන නොපිළිගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ හිසෙහි පහරක් දුන්නේය. කොපමණ මහත් පහරක් වූයේද, ඒ පහරින් සත්රියන් ඇති අටරියන් ඇති ඇතෙකු වැටෙන්නේය. මහත් පර්වතකූටයක් පැලෙන්නේය. ඉක්බිති ඒ යක්ෂතෙම දැවෙමි දැවෙමියි කියා එහිම මහා නරකයෙහි වැටුනේය.

**4.** ආයුෂ්මත් මහමුගලන් තෙමේ ඒ යක්ෂයා විසින් ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ගේ හිසෙහි දෙන ලද පහර මිනිස් ඇස ඉක්ම සිටියාවූ දිවැසින් දැක්කේය. දැක ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට, "ඇවැත්නි, තොපට කිමෙක්ද ඉවසිය හැකිද, කිමෙක්ද යැපිය හැකිද, කිමෙක්ද කිසි දුකක් නැද්ද?"

"ඇවැත්නි මොග්ගල්ලාන, මට ඉවසිය හැක, ඇවැත්නි, මොග්ගල්ලාන මට යැපිය හැක, එතකුදු වුවත් මාගේ හිසෙහි මදක් වේදනා ඇත."

**5.** ඇවැත් ශාරිපුත්‍රය පුදුමයි, ඇවැත්නි ශාරිපුත්‍රය අද්භූතයි. යම් බඳුවූ ඔබ මහත් ඍද්ධි ඇත්තේය. ආයුෂ්මත් ශාරිපුත්‍රතෙමේ මහත් ආනුභාව ඇත්තේය. ඇවැත් ශාරිපුත්‍රය එක්තරා යක්ෂයෙක් තොපගේ හිසෙහි පහරක් දුන්නේද, එය මහත් එකක්ය. ඒ නැවතද ඒ පහරින් සත්රියන් අටරියන් හෝ ඇතෙක් හෙලන්නේද, මහත් පර්වතයක් පලන්නේද, පොහොසත්ය. නමුත් ඇවැත් ශාරිපුත්‍ර තෙමේ "ඇවැත්නි, මොග්ගල්ලාන මට ඉවසිය හැක. ඇවැත්නි, මොග්ගල්ලාන මට යැපෙනු හැක. නමුත් මගේ හිස මදක් රිදේයයි" කීයේය.

**6.** "මෙතරම් මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති ආයුෂ්මත් මොග්ගල්ලාන තෙමේ යම් තැනකදී යක්ෂයෙකුදු දක්නේද, ඇවැත්නි, මොග්ගල්ලාන ආශ්චර්යයයි. ඇවැත්නි, මොග්ගල්ලාන පුදුමයි. අපි තවම පාංශු පිශාචයෙකුදු නොදකිමු"යි කීයේය. භාග්‍යවතුන් වහන්සේ ඒ රහත් දෙනමගේ මෙබඳු කථා ස්වරූපය පිරිසිදු මිනිස් ඇස ඉක්ම පැවති දිවකණින් ඇසූ සේක."

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළ සේක.

"යමෙකුගේ පර්වතයක් මෙන් ස්ථිරවූ සිත නොසැලේද ඇලුම් කටයුතු දෙයෙක්හි නොඇලුනේද කිපිය යුතු දෙයෙහි නොකිපේද, යමෙකුගේ මෙසේ වඩන ලද ඒ සිතට දුකක් කොයින් පැමිණේද?"

**35 පාරිලෙය්‍යක සූත්‍රය:-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයේ වැඩවසන සේක.

2. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ (ii) භික්ෂූන් භික්ෂුණීන්, උපාසකයන්, උපාසිකාවන්, රජුන්, මහ ඇමතියන්, තීර්ථකයන්, තීර්ථක ශ්‍රාවකයන් සමග ගැවසුණේ දුක සේ (iii) වසන සේක. පහසුසේ නොවසන සේක.

3. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේට "දැන් මම වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි) වසමි පහසු සේ නොවසමි. ඒකාන්තයෙන් මම ගණයා කෙරෙන් වෙන්ව වසන්නෙම් නම් ඉතා යෙහෙකැයි" මෙය විය.

4. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවේ හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන කොසඹෑ නුවර පිඬු පිණිස පිවිසුණ සේක. කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුණේ තමාම සේනාසනය තැන්පත් කොට තබා පා සිවුරු ගෙන කථානොකර උපස්ථායකයාද භික්ෂු සංඝයාද නොබලා තනිව, දෙවැන්නකු නැතිව පාරිලෙය්‍යක වනය යම් තැනෙකද එහි චාරිකාවේ වැඩිසේක. පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ පාරිලෙය්‍යක වනය යම් තැනෙකද එහි හැසුරුණේය. භාග්‍යවතුන් වහන්සේ ඒ පාරිලෙය්‍යක වනයෙහිද රක්ඛිත වන ලැහැබේ භද්දශාලා (එනම් ගස) මුල වසනසේක.

5. එක්තරා ඇත් රජෙක් (ii) ඇතුන්, ඇතින්නන්, තරුණ ඇතුන්, ඇත් පැටවුන් හා ගැවසුණේ වසයි. අග් හිස් සිඳුණු

තණ කොළද කයි. ඔහුට නමා ගත්- නමා ගත් අතු කැබලිද කත්. කැලැත්වූ පැන්ද බොයි. දියට බස්නා ඇතින්නෝද එගොඩවූ මගේ ඇගේ හැපෙමින් යත්. ගැවසුණේ දුකසේ වසමි. පහසුසේ නොවසමි. ඒකාන්තයෙන් මම තනිව පිරිසෙන් වෙන්ව වසන්නෙම් ඉතා යෙහෙකැයි' (කියාය)

(iii) ඉක්බිති ඒ ඇත් රජ පිරිසෙන් වෙන්ව පාරිලෙය්‍යක වනයේ රක්ඛිත වනලැහැබේ භද්‍රශාල මූලය යම්තැනෙකද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. එහි වනාහි ඒ ඇත් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනක වසනසේක්ද ඒ ප්‍රදේශයේ තණ ඉගිලීමද කරයි. සොඬින් භාග්‍යවතුන් වහන්සේට පියයුතු, පාවිච්චි කළයුතු පැන්ද ගෙනෙයි. ඉක්බිත්තෙන් වනාහි රහසිගතවූ එල සමවතට පැමිණ භාග්‍යවතුන් වහන්සේට සිතේ මෙබඳු කල්පනාවක් උපන්නේය. පෙර මම වනාහි (මෙහි2 (ii) යෙදිය යුතුයි.) විසීමි. පහසුසේ නොවිසීමි. දැන් වනාහි (මෙහි 2 (ii) යෙදිය යුතුයි) නොගැවසුණේ සුවසේ වසමි පහසුයේ වසමි.'

**6.** ඒ ඇත් රජුටද සිතේ මෙබඳු කල්පනාවක් උපන්නේය. 'මම වනාහි පෙර (මෙහි 5 (ii) යෙදිය යුතුයි.) ගැවසුණේ දුකසේ විසීමි. පහසුසේ නොවිසීමි. ඒ මම දැන් ඇතුන් ඇතින්නන්, තරුණ ඇතුන් ඇත් පැටවුන් හා නොගැවසුණේ වසමි. නොසිඳුණු අක් ඇතිම තණකොළද කමි. මා විසින් නමාගත් නමාගත් අතු කැබලිද ඔවුහු නොකත්. නොකැලැත් පැන්ද බොමි. දියට බස්නා ඇතින්නෝද දියෙන් එගොඩවූ මාගේ ඇඟෙහි හැපෙමින් නොයත්. නොගැවසුණේ සුවසේ වසමි. පහසුසේ වසමි.'

**7.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමාගේද දැඩි විවේකය දැක ඒ ඇත්රජුගේ සිතේ කල්පනාව සිතින් දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

> "යම් විටක තනිව වනයේ සිත් අලවාද, නගුලිස වැනි දත් ඇති, ඇත් නාගයාගේ මේ සිත (බුදුන්ගේ) නාග (උතුම්) වූ සිත හා සමවේ."

**36. පිණ්ඩොලභාරද්වාජ සූත්‍රය**:- 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එසමයෙහි වනාහි (ii) අරණ්‍යයෙහිම වසන, පිණ්ඩපාතයෙන්ම යැපෙන පංසුකූලයම හඳිනා, තුන් සිවුරම පොරවන, ඉච්ඡාරහිත, ලදදෙයින් සතුටුවන ඉතාම විවේකවූ, අනුන් හා නොගැවසෙන වීර්යය පටන්ගත්, ධුතවාද ඇති, සමාධියෙහි නිතර යෙදෙන ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජයන් වහන්සේ (iii) භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අරමිණිය ගොතා බැඳ, කය කෙළින් තබා, සිටියේවෙයි. භාග්‍යවතුන් වහන්සේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) සිටිනු දුටුයේවෙයි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක.

"හිංසා නොකිරීමද දොස් නොකීමද, විනය ශික්‍ෂා පදයන්හි, සංවරවීම (හික්මීම) ද ආහාරයෙහි පමණ දැනීමද, විවේක සෙනසුනද, සමාධියෙහි නිතර යෙදීමද (යන) මෙය බුදුවරයන්ගේ අනුශාසනය වේ."

**37. (අසොක) සාරිපුත්ත සූත්‍රය**:- 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එසමයෙහි වනාහි (ii) ඉච්ඡා රහිත, ලද දෙයින් සතුටුවන, දැඩි විවේක ඇති, අනුන් හා නොගැවසෙන, පටන්ගත් වීර්ය ඇති, සමාධියෙහි නිතර යෙදුණු ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ලඟ අරමිණිය ගොතාබැඳ, කය කෙළින් තබා, (iii) හුන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) හුන්නා දුටුයේ වෙයි.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළකළසේක.

"සමාධියෙහි සිටි සිත් ඇති පමාවක් නැති, නිශ්ශබ්ද මාර්ගයේ හික්මෙන, කම්පාවක් නැති, ඇතුළ සන්සුන්, හැමදාම සිහිමත්, මුනිවරයාට ශෝකයෝ නොවෙති."

**38. සුන්දරී සූත්‍රය**:- 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ සිවුරු, පිණ්ඩපාත, සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේ, සත්කාර ඇත්තේ, ගරු කිරීම් ඇත්තේ, බුහුමන් ඇත්තේ, පූජා ඇත්තේ, සංග්‍රහ ඇත්තේය. අන්‍යතීර්ථක පැවිද්දෝ සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර නොලබන්නෝ, සත්කාර නැත්තෝ, ගරු කිරීම් නැත්තෝ, බුහුමන් නැත්තෝ, පූජා නැත්තෝ, සංග්‍රහ නැත්තෝ වෙත්. ඉක්බිත්තෙන් වනාහි ඒ අන්‍යතීර්ථක පැවිද්දෝ භාග්‍යවතුන්වහන්සේට හා භික්ෂුසංඝයාට වන සත්කාර නොඉවසන්නේ සුන්දරී නම් පැවිද්දිය යම් තැනෙක්හිද එහි පැමිණියෝය. පැමිණ, සුන්දරී නම් පැවිද්දියට මෙය කීහ.

"නංගියේ, නෑයන්ට වැඩක් කරන්නට මහන්සිවෙහිද?"

"මහාත්මයෙනි, මම කුමක් කරම්ද? මට කරන්නට පුළුවන් කුමක්ද? මගේ ජීවිතයත් නෑයනට වැඩ පිණිස පරිත්‍යාග කරණ ලදී." - "එහෙමනම් නංගියේ නිතර නිතර ජේතවනයට යන්න." "මහාත්මයෙනි, එසේයයි" සුන්දරී පැවිද්ද අන්‍යතීර්ථක පැවිද්දන්ට පිළිතුරුදී නිතර නිතර ජේතවනාරාමයට ගියාය. ඒ අන්‍යතීර්ථක පැවිද්දෝ ඒ සුන්දරී පැවිද්ද බොහෝ දෙනා හා නිතර ජේතවනයට ඒ යයි යම්විටක දත්තාහුද ඉක්බිති ඇය මරා ජේතවනයේ එම දිය අගළේ වළදමා පසේනදි කොසොල් රජු යම්තැනෙක්හිද, එහි ගියහ. ගොස් පසේනදි කොසොල් රජුට මෙය කීහ.

3. "මහරජ, යම් ඒ සුන්දරි පැවිද්ද අපට නොපෙනේ"(කියාය) "තෙපි කොතැන සැක කරව්ද?" "මහරජ, ජේතවනයෙහිය."

"එසේ නම් ජේතවනය පරීක්ෂා කරව්." ඉක්බිති වනාහි ඒ අන්‍යතීර්ථක පැවිද්දෝ ජේතවනය පරීක්ෂාකොට වැළලූසේම අගළේ වළින් ගොඩ ගෙන ඇඳකට නගා සැවැත්නුවරට ඇතුළුකොට වීදියෙන් වීදියට සතර මංසන්ධියෙන් සතරමංසන්ධියට ගොස් කෑ ගසා කියත්.

4. "මහාත්මවරුනි, ශාක්‍යපුත්‍රයන්ගේ වැඩක් බලන්න. (ii) මේ ශාක්‍යපුත්‍රතෙම මහණහු ලජ්ජානැත්තෝය, දුශ්ශීලය,

පාපධර්ම ඇත්තෝය, බොරු කියත්, බ්‍රහ්මචර්‍ය්‍යා නැත්තෝය. මොවුන් විසින් නම්, ධර්මයේ හැසිරෙන්නෝය, මහණදම් පුරන්නෝය, බඹසර හැසිරෙන්නෝය, ඇත්ත කියන්නෝය, සිල්වත්තුය, පිරිසිදු ගතිගුණ ඇත්තෝය"යි ප්‍රතිඥා කරත්, මුන්ට මහණකමක් නැත. මුන්ට බ්‍රහ්ම දැකීමක් නැත. මුන්ගේ මහණකම නැහුණේය. මුන්ගේ නිවන් දැක්ම නැහුණේය. මුන්ට මහණකමක් කොයින්ද? මුන්ට නිවන් දැකීමක් කොයින්ද මොහු මහණ කමින් පහවූවෝය. මොහු නිවන් දැකීමෙන් පහවූවෝය. කොහොම නම් පුරුෂයෙක් පුරුෂ ක්‍රියාව කොට ස්ත්‍රියක මරවන්නේද?"

**5.** ඉක්බිති වනාහි බොහෝ භික්ෂූහු පෙරවරුවෙහි හැඳ පොරවා, පාත්‍ර සිවුරුගෙන සැවැත් නුවර පිඬු පිණිස හැසුරුණාහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එහි ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"ස්වාමිනි, දැන් සැවැත්නුවර මිනිස්සු භික්ෂූන් දැක අසභ්‍ය පරුෂවචනවලින් බණිත්, නින්දා කරත්, කෝපකරත්, වෙහෙසත්. මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, මේ ශබ්දය බොහෝ කල් නොපවතී. සත්දිනක්ම වෙයි. සත්දිනක් ගියවිට අතුරුදහන් වෙයි. මහණෙනි, එසේ වීනම්, යම් මනුෂ්‍යයෙක් භික්ෂූන් දැක අසභ්‍ය ඵරුෂවචනවලින් බණිත්ද, නින්දාකරත්ද, කොප කරත්ද, වෙහෙසත්ද, තෙපි ඔවුන්ට මේ ගාථාවෙන් ප්‍රති චොදනා කරව්.

(ii) "නොවූ දෙය කියන්නා නිරයට යයි. යමෙක් කොට නො කෙරෙමියි කියාද පහත්කටයුතු ඇති ඒ මිනිස්සු දෙදෙනාම පරලොවදී සමවෙත්.

**7.** ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ළඟින් මේගාථාව ඉගෙන යම් මනුෂ්‍යයෙක් භික්ෂූන් දැක අසභ්‍ය ඵරුෂ වචනවලින් බණිත්ද, නින්දාකරත්ද, කෝපකරද්ද, වෙහෙසද්ද ඔවුහු මේ ගාථාවෙන් චොදනා කරත්. (මෙහි 6 (ii) යෙදිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යුතුයි.) මිනිසුන්ට මේ (අදහස) විය. මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ නොකරන්නෝය. මොවුන් විසින් කරනලද නම් මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ නොදිවුරත්.

8. ඒ ශබ්ද බොහෝකල් නොවීය. ශබ්දය දිනසතක්ම විය. සත්දින ඉකුත්වීමෙන් අතුරුදන් විය. ඉක්බිත්තෙන් වනාහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. "ස්වාමීනි, ආශ්චර්යයයි, ස්වාමීනි, පුදුමයි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තාක් මේ කරුණ ස්ථිර නොවන්නේය. සත්දිනක්ම වන්නේය. සත්දින යාමෙන් අතුරුදහන් වන්නේයයි' මනාව වදාරනලදද, ස්වාමීනි, ඒ ශබ්දය අතුරුදන්විය.

9. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

> "සංයමයක් (හික්මීමක්) නැති ජනයෝ යුද බිමට ගිය ඇතකු සතුරන් විසින් මෙන් වචනයෙන් පෙළත්. කියනලද ඵරුෂ වාක්‍යය අසා දුෂ්ට (කොප) සිත් නැති භික්ෂුතෙමේ ඉවසන්නේය."

**39. උපසෙන පසංසා සූත්‍රයː-** 1 (මෙහි 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඉක්බිති හුදකලාවූ විවේකයට ගිය ආයුෂ්මත් වංගන්ත පුත්‍රවූ උපසෙන තෙරුන්ට 'ඒකාන්තයෙන් මට ලාභයක, ඒකාන්තයෙන් යහපත් ලැබීමකි. මාගේ ශාස්තෲන් වහන්සේ ද භාග්‍යවත්ය, අර්හත්ය සම්‍යක් සම්බුද්ධය. යහපත් කොට වදාරණ ලද ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය යයි කියන ලද ශාසනයෙහි පැවිදිවීමි. මා සමග ආශ්‍රය කරන්නන්ද සිල්වත්ය යහපත්ය. මම සිල් පුරන්නෙක්ද වෙමි. සමාධිගත එකඟ සිත් ඇත්තෙක්ද වෙමි. කෙලෙස් නැසූ රහත් කෙනෙක්ද වෙමි. මහත් ඍද්ධි ඇත්තේ වෙමි. මහත් ආනුභාව ඇත්තේ වෙමි. මාගේ ජීවිතය යහපත්ද? මාගේ මරණය යහපත්දැයි' මෙසේ සිතට විතර්කයක් පහළ විය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වංගන්ත පුත්‍රවූ උපසේන තෙරුන්ගේ සිතේ විතර්කය තම සිතින් දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"යම් ජීවිතයක් කෙළෙසුන්ගෙන් නොතැවෙයිද, ඔව්හු මරණයට ශෝක නොකෙරෙති. ඒකාන්තයෙන් දක්නාලද, සත්‍ය පද ඇති පණ්ඩිත තෙමේ ශෝක කරණ අය මැද ශෝක නොකරයි. භවතෘෂ්ණාව සිඳින ලද සන්සුන් සිත් ඇති මහණහට ඉපදීම් නැමැති සංසාරය ක්‍ෂයවිය. ඔහුට නැවත උත්පත්තියක් නැත."

**40. (උපසන්ත) සාරිපුත්ත සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඒ කාලයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බද්ධපර්යංකයෙන් ශරීරය ඈද නැතිව තබා තමාගේ කෙලෙස් සන්සිඳීම බලමින් සිටියේවේ. භාග්‍යවතුන් වහන්සේ නුදුරු තැන්හි බද්ධපර්යංකයෙන් ශරීරය ඈද නැතිව තබා තමන්ගේ කෙලෙස් සන්සිඳීම බලමින් හුන් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් දුටු සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

"ශාන්තවූ සන්සුන් සිත් ඇති තණ්හාව සිඳින ලද මහණහට ඉපදීම් නැමැති සසර ක්‍ෂය විය. හෙතෙම මාර බැම්මෙන් මිදුනේය."

**(සතරවෙනි මෙඝිය වර්ගය නිමි.)**

---

## 5 සොරණ වර්ගය.

**41. අත්තපිය සූත්‍රයː-** 1. (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. ඒ කාලයෙහි පසේනදි කොසොල් රජ තෙම මල්ලිකාදේවි සමග මහා ප්‍රාසාදය මත්තේ සිටියේවේ. ඉක්බිති පසේනදී

කොසොල් රජතෙම මල්ලිකාදේවිට "මල්ලිකාවෙනි, තොපට තමාට වඩා අතිශයින් ප්‍රිය කෙනෙක් ඇද්දැයි" ඇසීය. "මහරජ, මට මට වඩා ප්‍රිය අන්කිසිවෙක් නැතැයි" කීවාය. මහරජ, ඔබට ඔබට වඩා ප්‍රිය අන්කෙනෙක් ඇත්දැයි" ඇසුවාය.

"මල්ලිකාවෙනි මටත් මට වඩා ප්‍රිය අන් කෙනෙක් නැතැයි" කීයේය.

3. ඉක්බිති පසේනදී කොසොල් රජ තෙම ප්‍රාසාදයෙන් බැස භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි පසේනදී කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේට, ස්වාමීනි මම මල්ලිකා දේවිය සමග මහාප්‍රාසාදය මත්තෙහි සිටියේය. මල්ලිකා දේවියගෙන් 'මල්ලිකාවෙනි තොපට තමාට වඩා අතිශයින් ප්‍රිය කෙනෙක් ඇද්දැයි' ඇසීමි. මෙසේ ඇසූ කල්හි මල්ලිකා දේවී 'මට, මහරජ මට වඩා ප්‍රිය කෙනෙක් නැතැයි' උත්තර දුන්නාය. 'මහරජ, ඔබටවත් ඔබට වඩා ප්‍රිය අන්කෙනෙක් ඇද්දැයි' ඈ ඇසුවාය. ස්වාමීනි, මෙසේ කියනු ලැබූ මම මල්ලිකා දේවීට 'මල්ලිකාවෙනි, මටද මට වඩා ප්‍රිය කෙනෙක් නැතැයි' කීවෙමි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන, ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළ සේක.

"සියලු දිශාවන් සිතින් සොයා තමාට වඩා ප්‍රිය කිසි කෙනෙක් නොලදිමි. මෙසේ අනුන්ටත් තමා ඉතා ප්‍රියය. එහෙයින් තමහට හිත කැමැත්තේ අනුන්ට හිංසා නොකරන්නේය."

42. **අප්පායුක සූත්‍රය**:- 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙමේ සවස් වේලෙහි පලසමවතින් නැගී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි භාග්‍යවතුන්

වහන්සේගේ මවුතොමෝ මෙපමණ අඩු ආයුෂ ඇත්තීවූවාය. භාග්‍යවතුන් වහන්සේ ඉපිද සත්වෙනි දින භාග්‍යවතුන් වහන්සේගේ මවු කළුරිය කළාය. තුසීලොව උපන්නීය. ස්වාමීනි, මෙය ආශ්චර්‍ය්‍යයි. ස්වාමීනි, මෙය පුදුමයි.”

3. “ආනන්දය, මෙය එසේමය. බෝසත් මවුවරු අඩු ආයුෂ ඇත්තෝය. බෝසතුන් ඉපිද සත්වෙනි දවස බෝසත් මවුවරු කළුරිය කරත්. තුසී පුර උපදියයි” වදාළේය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

“ඇතිවූ මේ කෙනෙක් වෙත්ද, ඒ සියල්ලෝ ශරීරය හැරයත්,
ඒ සියලු හානිය දක්‍ෂයා දැන කෙලෙස් තවන වීර්‍ය ඇතිව
බ්‍රහ්මචර්‍යයාවෙහි හැසිරෙන්නේය.”

43. **සුප්පබුද්ධ කුට්ඨී සූත්‍රය**:- 1 (මෙහි 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඒ කාලයෙහි රජගහනුවර සුප්‍රබුද්ධ නම් කුෂ්ට ඇති දිළිඳු මිනිහෙක් විය. ඔහු මිනිස් දුගියෙක් වේ. මිනිස් අසරණයෙක් වේ. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් පිරිවරන ලද්දේ බණ වදාරමින් හුන්නේ විය.

3. සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙමේ රැස්වූ ඒ මහජන සමූහයා දුරින්ම දුටුවේය. දැක ඔහුට ‘නිසැකයෙන් මෙහි කෑයුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ බෙදනු ලබයි. ඒ මහජන සමූහයා යම්තැනෙක්හිද එහි යන්නෙම් නම් යෙහෙක. මෙහිදී කිසි කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ ලබන්නේ නම් යෙහෙකැයි’ සිතීය. ඉක්බිති සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙමේ ඒ මහජන සමූහයා යම් තැනෙක්හිද එහි පැමිණියේය. සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙමේ මහත් පිරිසක් පිරිවරා බණ වදාරමින් වැඩ සිටින භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක ඔහුට මේ අදහසවිය. මෙහි කිසි කෑ යුතු දෙයක්වත් බුදිය යුතු දෙයක් වත් නොබෙදනු ලබයි. මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිරිසට දම් දෙසයි. මමත් බණ අසන්නෙම් නම් යෙහෙකැයි’ සිතක් විය. ‘මමත් බණ අසමියි” එහිම එකත්පසෙක හුන්නේය.

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සියළු පිරිසගේ සිත් තම සිතින් දැන කවරෙක් මෙහි ධර්මය අවබෝධ කරන්නට සමර්ථදැයි සිහි කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ඒ පිරිසෙහි සිටි සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියා දුටුසේක. දැක, උන්වහන්සේට ‘මේ තෙමේ වනාහි මෙහි ධර්මය අවබෝධ කරන්ට සුදුසුයයි’ සිතූ සේක.

**5.** සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියා වෙනුවෙන් දාන කථා, ශීල කථා, ස්වර්ග කථා, කම්සැපයේ දෝෂය, පහත් බව, කිලිටුවීම, ගිහිගෙන් නික්මීමෙහි අනුසස් යන මේ පිළිවෙළ කථාව ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ සුවපත් මෘදු නීවරණ පහවූ, ඔද වැඩි, පැහැදුනු සිත් ඇති සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියා යම් අවස්ථාවක දත් සේක්ද, ඉක්බිති බුදුවරුන්ගේ යම් තමාම උසස් වන ධර්ම දේශනාවක් ඇද්ද, ඒ දුක දුක ඉපදීමට හේතුව, දුක් නැති කිරීම, දුක්නැති කිරීමේ මාර්ගය ප්‍රකාශ කළ සේක. යම්සේ පහවූ කසට ඇති පිරිසිදු වස්ත්‍රයකට වහාම සායම් අල්වාගන්නේද, එසේම ඒ ආසනයේදීම සුප්‍රබුද්ධ නම් කුෂ්ටරෝගියාට කෙලෙස් රජස් පහවූ, කෙලෙස් මල පහවූ ධර්මඥානය පහළ විය. ඇතිවන ස්වභාව ඇති යම් ධර්මයක් වේද, ඒ සියල්ල නැතිවීම ස්වභාවකොට ඇත්තේයයි’ කියායි.

**6.** ඉක්බිති සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියා දක්නා ලද පැමිණෙනලද අවබෝධ කරණලද, බැසගත් චතුස්සත්‍ය ධර්ම ඇත්තේ පහවූ තරණය කළ සැක ඇත්තේ, විසාරදබවට පැමිණියේ බුද්ධශාසනයෙහි අනෙක් අනෙක් හේතුවක් නොදක්නේ බුදුන් යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ බුදුන් වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි සුප්‍රබුද්ධ කුෂ්ටරෝගීතෙම භාග්‍යවතුන් වහන්සේට (ii) “ස්වාමීනි. ඉතා යහපති, ස්වාමීනි, ඉතා යහපති ස්වාමීනි යම්සේ යටිකුරුවූවක් උඩුකුරු කරන්නේද, වැසුනු දෙයක් වැසුම් හරින්නේද, මංමුළාවූවෙකුට පාර කියන්නේද, ඇස් ඇත්තේ රූප දකිත්වායි කළුවරෙහි තෙල් පහනක් දරන්නේද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කළ සේක. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද, සංඝයාද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සරණයමි. (iii) භවත් ගෞතමයන් වහන්සේ අද සිට දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු වසයෙන් මා දන්නා සේක්වායි" කීයේය.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු ගෙනහැර දක්වන ලද, සමාදන් කරවන ලද, උත්සාහ කරවණ ලද, සතුටු කරවන ලද සුප්‍රබුද්ධ කුෂ්ට රෝගියා භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව අස්නෙන් නැගිට බුදුන් වැඳ පැදකුණු කොට ගියේය. ඉක්බිති ළදරු වස්සෙකු ඇති දෙනක් සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියාට ඇන ජීවිතය තොර කෙළේය.

8. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු පෙන්වන ලද, සමාදන් කරවන ලද, උත්සාහ කරවන ලද, සතුටු කරවන ලද යම් ඒ සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියෙක් වූයේද හෙතෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය. (ස්වභාවය) කවරේද පරලොව කෙසේ දැයි" ඇසූහ.

9. 'මහණෙනි, සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගියා පණ්ඩිතය. නවලෝකොත්තර ධර්මයට අනුව මාර්ග ඵල ඉපද වීය. ධර්මය හෙතුවෙන් මා වෙහෙස නොකෙළේය. මහණෙනි, සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙමේ සංයොජන (බැමි) තුනක් නැති කිරීමෙන් අපායේ නොවැටෙන නිවනට නියම, අවබොධය එකම පිහිට කොට ඇති සොවාන්වූවෙකියි" වදාළසේක. මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් , "ස්වාමීනි, යම් කරුණකින් සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙම දිළිඳු මිනිසෙක් දුගී මිනිසෙක් අසරණ මිනිසෙක් වූයේද මීට හේතු කවරේද කාරණා කවරේදැයි" ඇසීය.

10. "මහණෙනි, බොහෝ පෙර සුප්‍රබුද්ධ නම් කුෂ්ට රෝගී තෙමේ මේ රජගහනුවර සිටු පුත්‍රයෙක් විය. හෙතෙම උයනට යන්නේ නුවරට පිඬු පිණිස ඇතුල්වන තගරසිඛී පසේ බුදුන් දුටුවේය. දැක ඇවිදින මේ කුෂ්ට රෝගියා කවරෙක් දැයි

කෙලගසා අගෞරව කොට ගියේය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් බොහෝ වර්ෂ ගණනක් බොහෝ වර්ෂ සිය ගණනක් බොහෝ වර්ෂ දහස් ගණනක් බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නරකයෙහි පැසුනේය. ඒ කර්මයාගේම ඉතිරි විපාකයෙන් මේ රජගහ නුවර දිළිඳු මිනිසෙක් විය. දුගී මිනිසෙක් විය, අසරණ මිනිසෙක් විය. හෙතෙම තථාගතයන් ප්‍රකාශ කරණ ලද ධර්ම විනය දැන ශ්‍රද්ධාව ලැබුවේය. සිල්සමාදන් විය. ඇසීම ලැබීය. ත්‍යාගය ලැබීය, සම්‍යක් දෘෂ්ටිය ලැබීය. ප්‍රඥාව ලබා, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දිව්‍යලොකයෙහි උපන්නේය. තව්තිසා දෙවියන් හා වාසයට ගියේය. හෙතෙම එහි වර්ණයෙන්ද යසසින්ද සෙසු දෙවියන්ට වඩා බබලයි" යයි වදාළසේක.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

"වීර්යය ඇතිකල්හිත් ඇස ඇතත් විෂමව පීවත් වෙත් මනුෂ්‍යලොකයෙහි පණ්ඩිත තෙම පටු දුරු කරන්නේය."

44. **කුමාරක ප්‍රශ්ණ සූත්‍රයː**- 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. ඒ කාලයෙහි බොහෝ ළමයි සැවත් නුවරටද ජේතවනයටද අතරෙහි මසුන් මරත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලාවෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරටද ජේතවනයටද අතරෙහි මසුන් මරණ ළමයින් දැක ඒ ළමයින් වෙත පැමිණිසේක. පැමිණ ඒ ළමයින්ට "ළමයිනි, නුඹලා දුකට බියද, තොපට දුක අප්‍රිය දැයි" ඇසූහ. "ස්වාමීනි, එසේය. ස්වාමීනි, අපි දුකට බිය වෙමු. අපට දුක අප්‍රියයයි" කීවාහුය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක.

"ඉදින් තොපි දුකට බියනම් ඉදින් තොපට දුක අප්‍රිය නම් ඉදිරිපිට හෝ රහසිගතව හෝ පවිටු කර්මයක් නොකරව්.

යම් පාපකර්මයක් මතු කරන්නහුද දැන් කරන්නහුද පැනයතත් තොපට එහි විපාකයට පැමිණ මිස දුකින් මිදීමක් නැත.”

**45. උපොසථකරණ සූත්‍රය:-** මේ සූත්‍රයේ 1-8 ඡේදය අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ පළමුවෙනි පණ්ණාසකයේ 20 සූත්‍රයේ 1-9 ඡේද මෙනි.) (18 වෙනි පොතේ 1357 සිට බලන්න.)

(මෙහි 9-25 ඡේද අංගුත්තර නිකායේ 19 සූත්‍රයේ 2-21 ඡේද “පහරදය” වෙනුවට “මහණෙනි” යෙදීමෙන් සාදාගත හැක. (18 වෙනි පොතේ 1352 පිට බලන්න.)

**26.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (තමන් වහන්සේගේ ශාසනයෙහි මළ සිරුරුවැනි දුශ්ශීල පුද්ගලයා සමග සංවාසය නැතැබව යයි කියන ලද) මේ කාරණය දැන (සංවාසයට නොසුදුසුවූද සංවාසයට සුදුසුවූද විභාගය කිරීම දක්වන්නාවූ මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

‘(ඇවතට පැමිණ වසන්නේද) ඇවැත් වැස්සද, කෙළෙස් වැස්සද, අතිසයින් වස්නේය. සබ්‍රම්සරුන්ට පවසන්නේද දහම් පරිද්දෙන් විනය පරිද්දෙන් පිළියම් කරන්නේද දෙසන්නේද නැගී සිටින්නේද අන් ඇවැතකට නොපැමිණේද ඔහු විසින්) විවෘත කරණ ලද්දේ වන්නේය.” (නැවත ආපත්ති වර්ෂාවද ක්ලෙශ වර්ෂාවද නොවස්නේය. එහෙයින් සඟවනලද (ඇවත) ප්‍රකාශ කරවු. එසේ ඇති කල්හි ඒ ඇවතට දුවත්. පුද්ගලයා (අත්බැව අතිශයින් විඳ කෙළෙස් වැස්සෙන් නොවස්නේය. (නොතෙමෙන්නේය.)”

**46. සොණ කුරරඝරික සූත්‍රය:- 1.** (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1. ඡේදය යෙදියයුතුයි.)

**2.** එකල්හි වනාහි ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිර තෙම අවන්තීරට කුරරඝර නම් නුවරෙහි ප්‍රපාත නම් පර්වතයෙහි වැඩ වෙසෙයි. එසමයෙහි වනාහි කුටිකණ්ණයයි ප්‍රසිද්ධවූ සොණ උපාසකතෙම ආයුෂ්මත් මහා කච්චායන තෙරණුවන්ට උවටැන් කරන්නේවෙයි. ඉක්බිති විවේකයට පැමිණ සිත එකඟකළාවූ

(කෙළක්වටිනා) කන් පළඳනාවක් දරන්නාවූ සොණ උපාසකයාගේ සිතට මෙබඳු කල්පනාවෙක් උපන, (ii) 'යම් යම් අයුරකින් මහාකච්චායන ස්වාමීන් වහන්සේ දහම් දෙසනසේක්ද, මේ ධර්මය ගිහිගෙයි වසන්නාහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණකොට එතැනින් පිරිසිදුකොට ලියූ සකක් හෝ පිරිසිදු සකක් වැනිකොට බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නට පහසු නොවෙයි. මම කෙස් රවුල් බාවා කසට පෙවූ වස්ත්‍ර හැඳපොරොවා ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා මැනව"යි.

3. ඉක්බිති කුටිකණ්ණයයි ප්‍රසිද්ධ සොණ උපාසක තෙමේ (ii) ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරතෙම යම් තැනෙක වෙසේද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ට වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූම කුටිකණ්ණනම්වූ සොණ උපාසකතෙම ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේට මේ පුවත දැන්වීය:- "වහන්ස, මෙහි රහසිගතව සිත එකඟකළාවූ මාගේ සිතට මෙබඳු කල්පනාවෙක් පහළවීය:- 'යම් යම් ආකාරයකින් ස්වාමීවූ මහාකච්චායනයන් වහන්සේ ධර්මදේශනය කෙරෙද්ද, මේ ධර්මය ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණ කොට ඒකාන්තයෙන් පිරිසිදුකොට ලියනලද්දාවූ හෝ ශුද්ධ කරනලද්දාවූ සකක්සේ බඹසර හැසිරෙන්නට පහසු නොවන්නේය.

'මම කෙස් රවුල් බාවා, කසාවක් හැඳ පොරොවා ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවන්නෙම් නම් ඉතා යෙහෙකැයි' ස්වාමීනි, ආර්ය මහාකච්චායනයන් වහන්සේ මා පැවිදි කරනසේක්වා"යි (කීයේය.)

4. මෙසේ කීකල්හි ආයුෂ්මත් මහාකච්චායන තෙර කුටිකණ්ණ නම් සොණ උපාසකයාට මෙය කීයේය:- (ii) "සොණයෙනි; දිවිහිමිකොට එකවේලේ අනුභව කරන බතද හුදකලාව සයනයකිරීමද මෛථුන විරතියද (නොහොත්) ශාසන බ්‍රහ්මචර්යයද දුෂ්කරමය. එබැවින් සොණය, තෝ ඒ ගිහිගෙහිම ගිහිවූයේම (නිත්‍ය ශීල උපොෂිතාදි බුදුරදුන්ගේ අනුශාසනයවූ

කාලයට යෝග්‍යවූ එක බතෙහිද මෙවුන්දම්න් වැළැක්මෙහිද යෙදෙවයි" (කීය.) ඉක්බිති කුටිකණ්ණයයි ප්‍රකටවූ සොණ උපාසකයාගේ පැවිදිවීමට යම් උත්සාහයෙක්වීද, ඒ උත්සාහය සන්සිඳිණ.

**5.** දෙවනුවද රහස්ගතවූ සිත එකඟ කළාවූ කුටිකණ්ණයයි දක්නාලද සෝණ උපාසකයාගේ සිතට මෙබඳු කල්පනාවෙක් පහළවීය:- (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) දෙවනුවත් කුටිකණ්ණයයි හඳුනලද සෝණ (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

**6.** දෙවනුවත් ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරතෙම කුටිකණ්ණයයි දක්නාලද සොණ උපාසකයාට මේ (මතු කියන) කරුණ කීයේය:- (මෙහි 4 (ii) යෙදිය යුතුයි.)

**7.** තුන්වෙනුවද කෙළක් අගනා කන්පළඳනාවක් දරන්නාවූ රහසිගතවූ සිත එකඟ කළාවූ සොණ උපාසකයාගේ සිතට මෙබඳු අදහසෙක් පහළවීය:- (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) තුන්වෙනුවද කෙළක් අගනා කුණ්ඩලාභරණයක් දරන්නාවූ සෝණ උපාසකතෙම ආයුෂ්මත් (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) එකල්හි වනාහි ආයුෂ්මත් කච්චායන තෙර කෙළක් වටින කොඬොල් අබරණ දරන්නාවූ සෝණ උපාසකයා පැවිදි කෙළේය.

**8.** එකල්හි වනාහි අවන්තීජනපදයෙහි (දකුණු පළාත) ස්වල්ප භික්ෂූන් ඇත්තේවෙයි. ඉක්බිති ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරතෙම තුන් අවුරුද්දක් ඇවෑමෙන් දුකින් මහන්සියෙන් ඒ ඒ තැනින් දශවර්ග භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත් සොණ (තෙරණුහු) උපසපන් කරවීය.

**9.** ඉක්බිති වස්විසූ කාය විවේකයට ගියාවූ සිත එකඟ කළාවූ සෝණ ආයුෂ්මත්හුගේ සිතට මෙබඳු කල්පනාවෙක් පහළවීය. (ii) මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මුඛයෙහි නොම දක්නා ලද්දාහුය. එසේවුවද ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු කාය සම්පත්තියෙන් යුක්තසේකැයි මාගේ ඇසීම පමණෙක්මය. ඉදින් උපාධ්‍යායයන් වහන්සේ මට අනුදන්නා සේක්නම් ඒ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ දක්නට මම යන්නෙමි'යි.

**10.** ඉක්බිති සොණ ආයුෂ්මත්තෙමේ සවස් වේලෙහි පලසමවතින් නැගීසිටියේ ආයුෂ්මත් මහාකච්චායනයන් වහන්සේ යම්තැනෙක වෙසෙද්ද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහාකච්චායනයන් වහන්සේට මනාකොට වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූම සොණ ආයුෂ්මත් තෙමේ ආයුෂ්මත් මහාකසයින් වහන්සේට මේ කාරණය සැළකෙළේය - "ස්වාමීනි, මෙහි රහසිගතවූ සිත එකඟ කළාවූ මාගේ සිතට මෙබඳු අදහසෙක් පහළවීය. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.)

**11.** "සාදු, සාදු, සොණයෙනි, අර්හත්වූ මනාව චතුස්සත්‍යය අවබොධ කළාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නට සොණය තෝ යව, සොණයෙනි, ප්‍රසාදය එළවන්නාවූ පැහැදීමට යොග්‍යවූ සන්සුන් ඉඳුරන් ඇති සන්සුන් සිත් ඇති උතුම්වූ සමථයටද දමථයටද පැමිණ සිටියාවූ දැමුනාවූ ගොපනයවූ සංයතවූ ඉඳුරන් ඇති නාග නම්වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නෙහිය. දැක මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා යුවල හිසින් වඳු, ආබාධ නැති නියාවද රෝග නැතිනියාවද සිරුර සැහැල්ලු කාරණයද ශරීර ශක්තියද සැපසේ විසීමද විචාරව, "ස්වාමීනි, මාගේ උපාධ්‍යායවූ මහාකච්චායනයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මස්තකයෙන් වඳිනසේක. ආබාධ නැති රොග නැති සිරුර සැහැල්ලුවීමට කරුණුවූ නොගිලන් නියාවද ශරීර ශක්තියද සැපසේ විසීමද විචරණසේකැ'යි කියවයි (කීය.)

**12.** "එසේය ස්වාමීනි," (කියා) සොණ ආයුෂ්මත් තෙමේ ආයුෂ්මත් මහා කච්චායනයන් වහන්සේගේ වචනය පිළිගෙන සතුටුව පැදකුණු කොට සෙනසුන තැන්පත් කොට තබා පාත්‍රසිවුරු රැගෙන සැවැත් නුවර යම් දිශාවෙකද එහි චාරිකාවට ගියේය. පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙමින් සැවත්නුවර යම් තැනෙකද ජේතවනනම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමය යම් තැනෙකද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එක් පසෙක හුන්නේය. එක් පැත්තක හුන්නාවූම සොණ ආයුෂ්මත් තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ

සැළකෙළේය. - "ස්වාමීනි, මාගේ උපාධ්‍යායවූ ආයුෂ්මත් මහා කච්චායනයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා සඟල වඳිනසේක. නිරාබාධවූ නිරොගවූ ශරීරයාගේ සැහැල්ලුවීමට කරුණුවූ ශරීරශක්තියද පහසුසේ විසීමද විචාරණසේක."

13. "කිම? මහණ, ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම නිරායාසයෙන් මේ (මෙතෙක්) දීර්ඝ මාර්ගයෙහි ආයෙහි දැයි" (අසා වදාළසේක.) "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැක්ක යැපිය හැක්ක, ස්වාමීනි, මම නොවෙහෙසීමෙන් අදන් මග ආයේ වෙමි. අහරයෙන් ක්ලාන්තනොවූයේ වෙමි'යි (කීයේය) ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් කැඳවූසේක. "ආනන්දය, මේ ආගන්තුක මහණහට සෙනසුනක් පනව"යි (වදාළසේක.)

14. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මෙබඳු අදහසෙක් විය. භාග්‍යවතුන් වහන්සේ යම් භික්ෂුවකට වනාහි 'අනඳ මේ ආගන්තුක භික්ෂුවට සෙනසුනක් පනව'යි මට ඇණවනසේක්ද, භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව සමග එක විහාරයෙහි වසන්නට කැමතිවනසේක, භාග්‍යවතුන් වහන්සේ සොණායුෂ්මතුන් සමග එකවෙහෙරෙහි වසන්නට කැමතිවන සේකැ'යි යම් වෙහෙරක භාග්‍යවතුන් වහන්සේ වාසය කරන සේක්ද, ඒ ගඳකිළියෙහි ආයුෂ්මත් සොණ භික්ෂුවට සෙනසුන පැනවීය.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක්ම එළිමහණෙහි වැඩහිඳීමෙන් ඉක්මවා පා සෝදා ගඳකිළියට පිවිසිසේක. සොණ ආයුෂ්මත් තෙමේද රාත්‍රියෙහි බොහෝ වේලාවක්ම එළිමහනෙහි හිඳීමෙන් ඉක්මවා පා සෝදා විහාරයට ඇතුළුවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම් වේලෙහි නැගිට "මහණ, ධර්මය කියන්නට තොපට වැටහේවා"යි ආයුෂ්මත් සොණ භික්ෂුවට ඇණවූසේක. "එසේය ස්වාමීනි"යි සොණ ආයුෂ්මත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන්දී, කාමසූත්‍රාදී සොළොස් සූත්‍රයන් සියල්ලම මිහිරි උස්හඬින් කීයේය.

**16.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ භික්ෂුවගේ සරභණ්‍යවශානයෙහි "සාධු! සාධු!! මහණැ"යි සතුටුවූසේක. මහණ, (තොප විසින්) අෂ්ටක වර්ගයෙහිවූ සොළොස් සුතුරු මොනවට මෙනෙහි කරන ලද්දාහුය, මොනවට සලකන ලද්දාහුය. මිදුනාවූ නොපිරිහුනු පදව්‍යඤ්ජනයන් ඇති අදහස පරිදි අර්ථය සැඟවීමට සමර්ථවූ මනා (නාගරික) වචනයෙන් යුක්තවූයෙහිය, මහණ, කෙතෙක් වස් ඇත්තේ වෙහිදැ'යි විචාළ සේක.

"භාග්‍යවතුන් වහන්ස, මම උපසම්පදාවෙන් එක් වසක් ඇත්තේ වෙමියි"කී.

"මහණ, තෝ කුමට මෙසේ කල්ගත කෙළෙහිද?" "ස්වාමීනි, මා විසින් වස්තුකාම ක්ලෙශකාමයන්හි දෝෂය බොහෝ කලකින් දක්නා ලද්දේය. යළිදු ගෘහවාසය ගැහැටය (පීඩා සහිතය) බොහෝ කිස ඇත්තේය. දුෂ්කරවූ බොහෝ කටයුතු ඇත්තේය."

**17.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ කරුණ දක්වන්නාවූ මේ ප්‍රීති වාක්‍යය පහළකළසේක.

"ලොකයෙහි දොස් දැක උපධිරහිතවූ නිර්වාණ ධර්මය දැන ආර්යතෙම පවෙහි නොඇලෙයි, පිරිසිදු පුද්ගල තෙම පාප ධර්මයෙහි නොඇලෙයි, පවිටු පුද්ගලතෙම නිරවද්‍යවූ කුශල ධර්මයට නොඇලේයයි"

**47. කංඛාරෙවත සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

**2.** එකල්හි වනාහි ආයුෂ්මත් කංඛාරෙවත ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි එරමිණියා ගොතා කය සෘජුකොට තබා තමාගේ සැක ඉක්මවීමේ සුද්ධිය සිහි කරමින් වැඩහුන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ නොදුරෙහි එරමිණියා ගොතා කය සෘජුකොට පිහිටුවා තමාගේ සැක ඉක්මවීමේ සුද්ධිය සිහිකරමින් වැඩහුන් ආයුෂ්මත් කංඛාරෙවත තෙරුන් දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැකය ඉක්මවීමේ සුද්ධිය සිහිකරන මේ කාරණය දැන ඒ වේලාවෙහි ඒ අර්ථය පහළ කරන්නාවූ මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

"මේ ආත්මභාවයෙහි 'මම වීම්දෝ හෝ නොවීම්දෝ හෝ'යි උපදනාවූ හෝ ස්වකීයාත්මභාවයෙහි පවත්නාවූ හෝ අන්‍යයන්ගේ ආත්මභාවයෙහි ලැබියයුතු බැවින් පවත්නාවූ හෝ යම්කිසි සැකයෝ වෙද්ද ධ්‍යාන කරන සුලුවූ කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ මාර්ගබ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නාවූ පුද්ගලයෝ ඒ සියලු සැක පහ කෙරෙත්."

48. ආනන්ද දෙවදත්ත සූත්‍රයː- (මෙහි 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද තෙර එදවස් පැමිණි පොහොයෙහි පෙරවරු එක්වේලාවෙක්හි හැඳ පොරොවා පාත්‍ර සිවුරු ගෙන රජගහනුවරට පිඬු සිඟාගියේය. දෙව්දත්තෙමේ රජගහනුවර පිඬු පිණිස ඇවිදින්නාවූ ආයුෂ්මත් අනඳ තෙරුන් දුටුයේමය. දැක ආයුෂ්මත් අනඳ තෙර යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් අනඳ තෙරුන්ට මේ කරුණ දැන්වීය. "ඇවත, ආනන්ද ස්ථවිරයෙනි, මම දැන් අද පටන් භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන්වම භික්ෂුසංඝයා නෑරම පොහෝ කරන්නෙමි. සංඝකර්මද කරන්නෙමි"යි

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම රජගහනුවර පිඬු සිඟා වැඩ බතින් පසු කාලයෙහි පිඬු සෙවීමෙන් වැළකුනේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක වෙසෙද්ද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මේ පුවත දැනුම්දින. "ස්වාමීනි, මෙහි මම පෙරවරුයෙහි එක් වේලාවෙක හැඳ පොරොවා පාත්‍ර සිවුරු ගෙන රජගහනුවර පිඬු පිණිස පිවිසියෙමි. ස්වාමීනි, රජගහනුවර පිඬු සිඟා හැසිරෙන මා දෙව්දත් තෙම දිටීමය. දැක මම යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ මට මේ කරුණ කීයේය. ඇවත ආනන්ද ස්ථවිරයෙනි, දැන්

අදින් මත්තෙහි මම භාග්‍යවතුන් වහන්සේ හැරම භික්ෂු සංඝයා හැරම පෝය කරන්නෙමි. සංඝ කර්මද කරන්නෙමියි ස්වාමීනි 'අද දෙව්දත් තෙම සංඝ භෙදය කරන්නේය, පෝයද කරන්නේය, සංඝ කර්මද කරන්නේය'යි (කීය.)"

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ සංඝ භෙද කර්මය දැන ඒ වේලාවෙහි ඒ අර්ථය ප්‍රකාශ කරන මේ උදන් පහළ කළසේක.

> "සත්පුරුෂයා විසින් යහපත සුවසේ කළ හැකිය. පව්ටු පුද්ගලයා විසින් යහපත කළ නොහැකිය. පව්ටා විසින් පව සුවසේ කළ හැකිය. ආර්යයන් විසින් පව් කළ නොහැකියයි."

**49. වධායමාන රූප සූත්‍රය:-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහ බික්සඟන සමග කොසොල් රට චාරිකාවෙහි වඩනාසේක. එකල්හි වනාහි බොහෝ මානවකයෝ භාග්‍යවතුන් වහන්සේගේ නුදුරෙහි වෙසෙන්නවුන් මෙන් හැසිරෙන ස්වභාව ඇත්තාහු කවටකම් වචන කියන ස්වභාව ඇත්තාහු කුදු මහත් ශබ්ද කරන්නාහු ඉක්මවත්.

**2.** භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි කෙළිකවටකම් වචන කියන ස්වභාව ඇත්තාවූ බොහෝ තරුණ බමුණන් ඉක්මෙන්නවුන් දුටුසේක්මය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි ඒ කරුණ ප්‍රකාශ කරන මේ උදන් පහළ කළසේක.

"යම්තාක් කට වසා ගැන්ම නොකමැති වෙද්ද, යම්හෙයකින් පමුණුවන ලද්දාහු ඒ කීමට කාරණය නොදනිද්ද, මූඪවූ පණ්ඩිත ප්‍රතිරූපකයෝ මතයම විෂයකොට ඇතිව කියන්නාහුය, නොහොත් සිහිඑළවා නොකියන්නාහුයයි"

**50. චුල්ලපන්ථක සූත්‍රය:-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

**2.** එකල්හි වනාහි ආයුෂ්මත් චුල්ලපන්ථක ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට නුදුරුතන්හි අරමිණියා අවුළුවා කය

ඍජුකොට පිහිටුවා අරමුණට අභිමුඛකොට සිහිය එළවා වැඩහුන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අරමිණියා බැඳ කය කෙළින් සිටුවා අරමුණට අභිමුඛකොට සිහිය එළවා වැඩහුන් ආයුෂ්මත් චුල්ලපන්ථක තෙරණුවන් දුටුසේක්මය.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන ඒ වේලාවෙහි මේ උදන් පහළ කළසේක.

"මහණතෙම මනාව පිහිටුවන ලද කයින් යුක්තව මනාව පිහිටි සිහියෙන් යුක්තව සිටින්නේ හෝ හුන්නේ හෝ යළි හෝනේ හෝ සිත නොාව පිහිටුවන්නේ (වේද) (ඒ මහණතෙම) පූර්වාපරභාගයෙන් පැවති විශෙෂය ලබන්නේය.

"හෙතෙම පුබ්බාපරීය විශෙෂයෙහි අර්හත්ඵලය ලැබ මෘත්‍යුරාජයයි කියන ලද මරණයට (ආදර්ශනයට) යන්නේය. (පිරිනිවන් පාන්නේය.)"

(පස්වන සොණ වර්ගය නොහොත් මහා වර්ගය නිමි)

## 6. ජාත්‍යන්ධ වර්ගය.

**51. ආයුසංඛාරොස්සජන සූත්‍රයඃ-** (මේ සූත්‍රය අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ 7 චාපාල වර්ගයේ 20 වෙනි ආයුසංඛාරොස්සජන සූත්‍රය මෙනි. - (පිට 1437)

**52. ජටිලාදිසත්තක සූත්‍රයඃ-** (මේ සූත්‍රයේ 1-8 ඡෙද සංයුත්ත නිකායේ 2 වර්ගයේ ජටිල සූත්‍රයේ 1-8 ඡෙද මෙන් වෙති.

**9.** එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාකය පහළකළ සේකඃ-

"දූත මෙහෙවර ඔත්තුකාර කර්මාදි හැම (පාපධර්මයෙහි මේ රාජපුරුෂයන් මෙන් පැවිද්දා) වෑයම් නොකරන්නේය, (පැවිදි වෙසින්) අන්‍ය පුරුෂයෙකුගේ සේවක පුරුෂයෙක්

නොවන්නේය. අන් (ප්‍රධානයෙකු) ජීවත් නොවන්නේය, අන්‍ය අකුශලකර්මයක් නිසා දිවි නොපවත් වන්නේය, ධනාදිය පිණිස දහම් නොකියන්නේය. ධර්මය හෙතුකොට වෙළඳාම් නොකරන්නේය, එසේ ධර්මය හෙතුකොට වෙළෙඳාම් නොකරන්නේයි."

**53. පච්චවෙක්ඛණ සූත්‍රය**:- 1 (මේ ඡෙදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදයමෙනි.) 2 එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ ප්‍රහීනවූ ලාමකවූ නොඑක් ලොභ ද්වෙෂ මොහාදී අකුශල ධර්මයන් වැඩීමෙන්, සම්පූර්ණ කරන ලද්දාවූ නොඑක් කුශල ධර්මයන්ද ප්‍රත්‍යවෙක්ෂා කරමින් වැඩහුන්සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රහානයවූ ලාමකවූ නොඑක් අකුශල ධර්මයන්ද වැඩීමෙන් සම්පූර්ණ කරන ලද්දාවූ නොඑක් කුශල ධර්මයන්ද මෙසේ නුවණින් සිහිකොට මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළසේක.

"පෙර සියලුම රාගාදී ක්ලෙශ සමූහය මාගේ සන්තානයෙහි වීය. එකල්හි නොවීද, නොවීයයි, පූර්වයෙහි නොවීය, එකල්හි විය. මාගේ නොමවීද, නොවන්නේය, දැන් ආර්ය මාර්ගය නොඑක්වාරයෙහි නොඋපදී.)"

**54. ප්‍රථම තීර්ථය සූත්‍රය**:- 1. මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි අනෙක ප්‍රකාර දෘෂ්ටි ඇත්තාවූ නොඑක් ක්ෂාන්ති ඇත්තාවූ නොඑක් රුචි ඇත්තාවූ නන්වැදෑරුම් දෘෂ්ටියට කාරණයෙහි ඇලුනාවූ බොහෝවූ නොයෙක් ලබ්ධියෙහි නියුක්තවූ තීර්ථකයෝද ශ්‍රමණයෝද බමුණෝද පරිබ්‍රාජකයෝද සැවතට පිඬු පිණිස වදිත්.

3. ලොකයෙහි ආත්මය (සදාකාලිකය) (අපගේ) මේ (දර්ශනයම සත්‍යය) අන්‍ය දර්ශනය හිස්ය (මිථ්‍යා දර්ශනයයි) මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ විද්‍යමාන වෙත්. ආත්මය සදාකාලික නොවේ. අපගේ (මේ දර්ශනයම සත්‍යය, අන්‍ය දර්ශන මිථ්‍යායයි මෙසේ

කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ විද්‍යමාන වෙත්. ආත්මය කෙළවර ඇත්තේය, මේ අපගේ දර්ශන යම් සත්‍යය (අන්‍ය දර්ශනය) මිථ්‍යායයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ වෙති. ආත්මය කෙළවර නැත්තේය. මේ (අපගේ දර්ශනයම සත්‍යය අන්‍ය දර්ශනය හිස්යයි ඇත්තාහුය. (යම් ශරීරයෙක් වේද එයම ජීව නම් වස්තුව වෙයි. (යම් ජීවයෙක්වේද එයම ශරීරය වෙයි. (මේ අපගේ දර්ශනයම) සත්‍යය අන්‍ය දර්ශන හිස්යයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ වෙති. ජීවය අනිකෙක සිරුර අනෙකක, (අපගේ) මේ දර්ශනයම සත්‍යය අන්‍ය දර්ශන මිථ්‍යායයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ විද්‍යමාන වෙත්. සත්වතෙම මරණින් මත්තෙහි වන්නේය. මේ (අපගේ දර්ශනයම) සත්‍යය අන්‍යදර්ශන මිථ්‍යාවේයයි මෙසේ කියන්නාහු මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ වෙත්. සත්ව තෙම මරණින් මත්තෙහි නොවෙයි. මේ (අපගේ දර්ශනයම) සත්‍යය අන්‍ය දර්ශන බොරුයයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. සත්වතෙම මරණින් මත්තෙහි ඇත්තේත් වෙයි. නැත්තේද වේය. මේ (අපගේ දර්ශනයම) සත්‍යය අන්‍ය දර්ශන බොරුයයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුය. ආත්මය මරණින් මත්තෙහි නොම වෙයි. නොවන්නේ නොවෙයි මේ අපගේ දර්ශනයම සැබෑය අන්‍ය දර්ශන බොරුයයි මෙසේ කියන්නාවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහුය. ඒ දෘෂ්ටි ගතිකයෝ හටගත් ඩබර ඇත්තාහු හටගත් කෝලාහල ඇත්තාහු විරුද්ධවාදයට පැමිණියාහු එකිනෙකා මුඛ නමැති අඩයටියෙන් අනින්නා රළුබස් කියන්නාහු වාසය කෙරෙත්. විපර්යාස නොවන ස්වභාව ඇත්තේය, එබඳුවූයේ ධර්මය වන්නේය, තොපවිසින් කියන ලද්ද පෙරලෙන ස්වභාව ඇත්තේය, එබඳුවූයේ ධර්මය නොවන්නේ, ධර්මය එබඳු නොවන්නේය, මෙබඳු වූයේ ධර්මය වන්නේය”යි.

**4.** ඉක්බිති බොහෝ භික්ෂූහු පෙරවරුවෙහි එක් වේලාවෙක හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සැවතට පිඬුපිණිස වන්හ. සැවැත් නුවර පිඬු සිඟා හැසිර පස් වරුයෙහි පිඬු සෙවීමෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක (වෙසෙද්ද) එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාව වැඳ එක් පැත්තක හුන්හ. එක් පැත්තක හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ පුවත දැන්වූහ.

**5.** "ස්වාමීනි, මේ සැවැත් නුවර නොඑක් දෘෂ්ටි ඇත්තාවූ නොඑක් ක්ෂාන්ති ඇත්තාවූ නොඑක් රුචි ඇත්තාවූ නොඑක් දෘෂ්ටියට හෙතුන් ඇසුරු කළාවූ බොහෝවූ නොඑක් තීර්ථකයෝද නොඑක් ශ්‍රමණයෝද නොඑක් පිරිවැජියෝද සැවැත්නුවර වෙසෙති. (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, අන්තොටු පිරිවැජියෝ අන්ධයහ. (මෙලෝ) වැඩ නො දනිත්, අනර්ථය නො දනිත්, ධර්මය නොදනිත්. අධර්ම නොදනිත්, ඔව්හු අර්ථය නො දන්නාහු ධර්මය නොදන්නාහු අධර්මය නො දන්නාහු හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විරුද්ධ වාදයට පැමිණියාහු එකිනෙකා මුව සැතින් විදින්නාහු හැසිරෙත්. මෙබඳු නොපෙරලෙන ස්වභාව ඇත්තේ ධර්මය වන්නේය, මෙබඳු පෙරලෙන ස්වභාවය ඇත්තේ ධර්මය නොවන්නේය. මෙබඳුවූයේ ධර්මය නොවන්නේය, මෙබඳු වූයේ ධර්මය වන්නේයයි' (කියායි)

**7.** "මහණෙනි, යටගිය දවස මෙම සැවැත් නුවර නාම ගොත්‍රයෙන් අප්‍රකටවූ එක් රජෙක් වීය. මහණෙනි, ඉක්බිති ඒ රජතෙම නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ එක් පුරුෂයෙකු කැඳවීය. 'එම්බල පුරුෂය, තෝ මෙහි එව, සැවැත් නුවර යම් පමණ ජාත්‍යන්ධයෝ වෙද්ද, ඒ සැවෝම එක් තැනෙක්හි රැස්කරව"යි (කීය.) මහණෙනි, ඒ පුරුෂ තෙම "එසේය දෙවයන් වහන්සැයි" කියා ඒ රජහට ප්‍රති උත්තරදී සැවැත් නුවර යම් පමණ ජාත්‍යන්ධයෝ වෙද්ද, ඒ සියල්ලන්ගෙන ඒ රජතෙම යම් තැනෙක (වෙසේ ද) එතැනට පැමිණියේය. පැමිණ ඒ රජහුට මේ පුවත කීයේය:- "දේවයන් වහන්ස, සැවැත් නුවර යම්

පමණ ජාත්‍යාන්ධයෝ වෙද්ද, ඔව්හු (මා විසින් රැස් කරවන ලද්දාහුමය") "එසේවීනම් කොළ ජාත්‍යන්ධයන්ට ඇතෙකු දක්වාලව'යි කීයේය. මහණෙනි, 'එසේය දෙවයන් වහන්සැ'යි ඒ පුරුෂතෙම ඒ රජහට පිළිතුරුදී ජාත්‍යන්ධයනට ඇතෙකු දැක්වීය. ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු"යයි ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ හිස දැක්වීය. ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳුය'යි ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ කණ දැක්වීය. 'ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු'යයි. ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ දළ දැක්වීයඃ- 'ජාත්‍යාන්ධයෙනි, ඇතා මෙබඳු' යයි, ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ සොඬ දැක්වීය. 'ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු යයි ඇතැම් ජාත්‍යන්ධයනට ආතාගේ කය දැක්වීය. 'ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු'යයි ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ පා දැක්වීය. "ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු"යයි, ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ පිට දැක්වීය. "ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳුය"යි, ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ (වලිගයේ මතු පෙදෙස) දැක්වීය. "ජාත්‍යන්ධයෙනි, ඇතා මෙබඳු"යයි ඇතැම් ජාත්‍යන්ධයනට ඇතාගේ වලිගය (වාලධියෙ අග පෙදෙස) දැක්වීය.

"මහණෙනි, ඊටපසු ඒ පුරුෂ තෙම ජාත්‍යන්ධයනට, ඇතා දක්වා ඒ රජතෙම යම් තැනෙක (වෙසේද) එතැනට පැමිණියේය, පැමිණ ඒ රජුට මෙය සැළ කෙළේය. "දෙවයන් වහන්ස, ඒ ජාත්‍යන්ධයන් විසින් ඇතා දක්නා ලද්දේමය. යමකට දැන් කල් දන්නෙහි නම් (ඊට කාලයයි" කීයේය.)

8. "මහණෙනි, එකල්හි ඒ රජතෙම ඒ ජාත්‍යන්ධයෝ යම් තැනෙක (වෙද්ද,) එතැනට පැමිණියේය. පැමිණ ඒ ජාත්‍යන්ධයන්ට මෙය කීයේයඃ- "ජාත්‍යන්ධයෙනි, තොප විසින් ඇතා දක්නා ලද්දේ දැ"යි - "එසේය දෙවයන් වහන්ස අප විසින් ඇතා දන්නා ලද්දේයයි (කීහ.) කියවු ජාත්‍යන්ධයෙනි, ඇතා කෙබඳුද? මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ හිස දක්නා ලද්දේ වීද, ඔහු මෙසේ කීහුඃ- "දෙවයන් වහන්ස කළය යම්සේද ඇතා එබඳුයයි" (කීහ.) මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ කණ දක්නා ලද්දේ වීද, ඔව්හු

මෙසේ කීහ:- 'දෙවයන් වහන්ස, කුල්ල යම්සේද, ඇතා එබඳුයයි" (කීහ.) මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ දළ දක්නා ලද්දේවීද ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, සීවැල (නොහොත්) එල්ලන කෙක්ක යම්සේද, ඇතා එබඳු වේයයි" (කීහ) මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ සොඬ දක්නා ලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, නගුලිස යම්සේද, ඇතා එබඳුයයි" (කීහ) මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ කය දක්නා ලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, කොටුව යම්සේද, ඇතා එබඳුයයි" මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ පා දක්නා ලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, ටැඹ (කණුව) යම්සේද ඇතා එබඳුයයි" මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ පිට දක්නා ලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, වංගෙඩිය යම්සේද, ඇතා එබඳුයයි." මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ නගුට (වාලධියේ මතු පෙදෙස) දක්නාලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, මොහොල යම්සේද ඇතා එබඳුයයි" මහණෙනි, යම් ජාත්‍යන්ධයන් විසින් ඇතාගේ වලිගය දක්නාලද්දේවීද, ඔහු මෙසේ කීහ. "දෙවයන් වහන්ස, මුස්න යම්සේද, ඇතා එබඳුයයි" ඒ ජාත්‍යන්ධයෝ ඇතා එබඳු වෙයි. ඇතා මෙබඳු නොවෙයි. ඇතා එබඳු නොවෙයි, ඇතා මෙබඳු වේයයි එකිනෙකා ගුටිබැට ගැසූහ. මහණෙනි, එකල්හි වනාහි ඒ රජ තෙම සතුටු සිත් ඇත්තේ විය.

**9.** මහණෙනි, එපරිද්දෙන්ම අඳවූ (එහෙයින්ම) නුවණ නැත්තාවූ අන්තොටු පිරිවැජ්ජෝ අර්ථය නොදනිත්, අනර්ථය නොදනිත්. ධර්මය නොදනිත්, අධර්මය නොදනිත්, ඔහු අරුත් නොදන්නාහු අවැඩ නොදන්නා දහම් නොදන්නාහු අදහම් නොදන්නාහු උපන් ඩබර ඇත්තාහු උපන් කලහ ඇත්තාහු විරුද්ධ වාදයට පැමිණියාහු ඔවුනොවුන් මුවසැතින් විදින්නාහු ධර්මය එබඳුය. ධර්මය මෙබඳු නොවෙයි, ධර්මය මෙබඳු වූයේ ධර්මය නොවෙයි, එබඳුවූයේ ධර්මයයි (විරුද්ධ බස් බෙණෙමින්) වෙසෙති."

**10.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු සියලු අයුරෙන් දැන ඒ වේලාවෙහි අරුත් දැක්වෙන මේ උදන් පහළකළසේක.

"ඇතැම් මහණ බමුණෝ මේ දෘෂ්ටීන්හි මේ රූපාදී පඤ්චොපාදානස්කන්ධයන්හි එක එක අවයවය දක්නා ඒ ජාත්‍යන්ධ ජනයෝ විවාද කළාහුද, එමෙන් විවාද කෙරෙත්. (නොහොත්) විරුද්ධව ගෙන විවාද කෙරෙත්. විශෙෂයෙන් දන්නා ලද්දේයයි අවිපරිතයක් කොට පිහිටා කියත්යයි."

**55. (ද්විතීය) තීර්ථය සූත්‍රය:-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

**2.** එකල්හි වනාහි නොඑක් ලබ්ධි ඇත්තාවූ නොඑක් ක්ෂාන්ති ඇත්තාවූ නොඑක් රිසි ඇත්තාවූ නොඑක් ලබ්ධියට හෙතු ඇසුරු කළාවූ බොහෝ නන්තොටුවෝද ශ්‍රමණයෝද බමුණෝද පිරිවැජියෝද සැවැත් නුවරට ඇතුළු වෙත්.

**3.** "ආත්මයද ලොකයද සදාකාලිකය (නිත්‍යය) අපගේ දර්ශනයම සත්‍යය. අන්‍ය දර්ශන හිස්ය, බොරුයයි මෙසේ කියන සුලුවූ මෙබඳු ලබ්ධි ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ. තමාද ලොකයද සදාකාලික නොවන්නේය. මේ (අපගේ) දර්ශනයම සැබෑය. අන්‍ය දර්ශන හිස්යයි මෙසේ කියන සුලුවූ මෙබඳු ලබ්ධි ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ.

"ආත්මයද ලොකයද (සමහරෙක්) සදාකාලිකද (සමහරෙක්) සදාකාලික නොවන්නේත් වෙයි. මේ අපගේ දර්ශනයම සැබෑය. අන්‍ය දර්ශන බොරුයයි මෙසේ කියන සුලුවූ මෙබඳු ලබ්ධි ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ. තමාද (අන්‍ය) ලොකයද නොම සදාකාලිකය, සදාකාලික නොවන්නේත් නොවෙයි. (ii) මේ (අපගේ) දර්ශනයම සත්‍යය, අන්‍ය දර්ශන මිථ්‍යායයි මෙසේ කියන සුලුවූ මෙබඳු ලබ්ධි ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ. (iii) (ඒ ඒ සත්වයන්ගේ ආත්මයද ලොකයද තමා විසින්ම කරන ලද්දේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) තමාද ලොකය (අන්‍යයා) ද අන්‍ය (දෙවියකු) විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මවන ලද්දේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) තමාද ලොකයද තමා විසින් කරන ලද්දේත් වෙයි. අන්‍ය මවන්නෙකු විසින් කරන ලද්දේත් වෙයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) ආත්මයද ලොකයද තමා කරන්නේ නැත. අනිකෙක් කරන්නේ නැත. කිසියම් කාරණයක් නැතිව උපන්නේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද ලොකයාද සදාකාලිකය, (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද අන්‍යයාද සදාකාලික නොවන්නේය, (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද ලොකයාද සදාකාලිකත්වෙයි. අසදාකාලිකත් වෙයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද ආත්මයද ලොකයාද නොමසදාකාලිකත් වෙයි. අසදාකාලිකත් නොවෙයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද අන්‍යයාද තමා විසින්ම කරන ලද්දේය, මේ (අපගේ) දර්ශනයම සැබෑය, අන්‍ය දර්ශන සැබෑනොවේයයි (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද අන්‍යයාද අන්‍ය (මාපකයෙකු) විසින් කරන ලද්දේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද ලොකයාද තමා විසින් කරන ලද්දේත් වෙයි. (මවන්නාවූ) අන්‍යයෙකු විසින් කරන ලද්දේත් වෙයි. (මෙහි 3 (ii) යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද අන්‍යයාද තමා කළේත් නොවෙයි අන්‍ය දෙවියන් කෙළේත් නොවෙයි. කිසියම් හෙතුවක් නැතිව උපන්නේය. (මෙහි 3 (ii) යෙදිය යුතුයි.)

"ඔව්හු ධර්මය එබඳුය, ධර්මය මෙබඳු නොවෙයි. මෙබඳු වූයේ ධර්මය වෙයි, එබඳුවූයේ ධර්මය වේයයි හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විරුද්ධවාදයට පැමිණියාහු එකිනෙකා මුවසැතින් විදින්නාහු වාසය කෙරෙත්.

4. ඉක්බිති බොහෝ භික්ෂූහු පෙරවරුයෙහි එක් වේලාවෙක්හි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සැවැත් නුවර පිඬු පිණිස වන්හ. සැවතෙහි පිඬු සිඟා ඇවිද පස්වරුයෙහි පිඬු සෙවීමෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි වෙසෙද්ද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්හ. එක්පසෙක හුන්නාවුම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්වූහ.

**5.** "ස්වාමීනි, මේ සැවැත් නුවර නොඑක් දෘෂ්ටි ඇත්තාවූ නොඑක් ක්ෂාන්ති ඇත්තාවූ නොඑක් රිසි ඇත්තාවූ නොඑක් ලබ්ධියට කරුණු ඇසුරුකළාවූ බොහෝවූ නොඑක් තීර්ථකයෝද ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද පිරිවැජියෝද වෙසෙති. (ii) (මෙහි 3 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, අන්තොටු පිරිවැජ්ජෝ අන්ධවූවාහු (එහෙයින්ම) ප්‍රඥානමැති ඇස් නැත්තාහු අර්ථය නොදනිත් අනර්ථය නොදනිත්, ධර්මය නොදනිත්, අධර්මය නොදනිත්, ඔහු අරුත් නොදන්නාහු අවැඩ නොදන්නාහු දහම් නොදන්නාහු අදහම් නොදන්නාහු හටගත් ඩබර ඇත්තෝව හටගත් කෝලාහල ඇත්තෝව විරුද්ධවාදයට පැමිණියෝව එබන්ද ධර්මයවෙයි, මෙබන්ද ධර්මය නොවෙයි, ධර්මය මෙබඳු නොවෙයි, ධර්මය එබඳු වේයයි ඔවුනොවුන් මුවසැතින් විදිමින් වාසය කෙරෙත්යයි."

**7.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි ඒ කරුණ දක්වන මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක.

> "ඇතැම් මහණ බමුණෝ මේ දෘෂ්ටීන්හි ඇලෙත්, අහෝ අනිසය මුළාවකි. අතරම "ඔෂධ" යයි කියන ලද නිවනට (නොහොත්) ඒ නිවනට පැමිණෙන උපායවූ ආර්යමාර්ගයට නොපැමිණම අතිසයින් ගැලෙත්" යයි.

**56. (තෘතීය) තීර්ථ සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

**2.** එකල්හි වනාහි සැවතෙහි නොඑක් ලබ්ධි ඇත්තාවූ නොඑක් ක්ෂාන්ති ඇත්තාවූ නොඑක් කැමැත්ත ඇත්තාවූ නොඑක් ලබ්ධියට හෙතුන් ඇසුරුකළාවූ බොහෝවූ නන්තොටු ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද පිරිවැජියෝද වෙසෙති.

**3.** (ඔවුන් අතුරෙහි) තමාද ලොකයාද සදාකාලිකය (ii) මෙයම සැබෑය, අන්‍යදර්ශන හිස්යයි මෙසේ කියන්නාවූ මෙබඳු ලබ්ධි ඇත්තාවූ සමහර ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙත් (iii) තමාද ලොකයාද සදාකාලික නොවෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද ලොකයාද (ඇතැමෙක්) සදාකාලිකත් වෙයි.

(ඇතැමෙක්) අසදාකාලිකත් වෙයි. (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද (අන්‍ය) සත්වයාද නොම සදාකාලිකත්වෙයි. අසදාකාලිකත් නොවෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද ලොකයාද තමා විසින්ම කරන ලද්දේය. (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද ලොකයාද අනිකෙකු විසින් කරන ලද්දේය. (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද අන්‍ය සත්වයාද තමා විසින් කරන ලද්දේත්වෙයි, අන්‍යයන් විසින් කරන ලද්දේත්වෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) තමාද අන්‍ය ලොකයාද තමා කෙළේත් නොවෙයි අනෙකෙක් කෙළේත් නොවෙයි. කිසිහෙතුවක් නැතිව උපන්නේය, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද ලොකයාද සදාකාලිකය. (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද (අන්‍ය) ලොකයාද අසදාකාලිකය, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක්දෙකද තමාද (අන්‍ය) සත්වයාද සදාකාලිකත්වෙයි, අසදාකාලිකත්වෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද (අන්‍ය) සත්වයාද සදාකාලිකත්වෙයි. අසදාකාලිකත්වෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද (අන්‍ය) සත්වයාද නොම සදාකාලිකත්වෙයි. අසදාකාලිකත් නොවෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද ලොකයාද තමා විසින් කරන ලද්දේය, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද (අන්‍ය) සත්වයාද අනිකෙකු විසින් කරන ලද්දේය, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සුවදුක් දෙකද තමාද (අන්‍ය) සත්වයාද තමා විසින් කරන ලද්දෙක්වෙයි, අනෙකෙකු විසින් කරන ලද්දෙක්වෙයි, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි) සුවදුක් දෙකද තමාද (අන්‍ය ලොකයාද තමා කෙළේත් නොවෙයි, අනිකෙක් කෙළේත් නොවෙයි, කිසිහෙතුවක් නැතිව උපන්නේය, (මෙහි 3 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

4. (මේ ඡෙදය මේ වර්ගයේ 55 සූත්‍රයේ 4 ඡෙදයමෙනි)

5. (මෙහි මේ වර්ගයේ 55 සූත්‍රයේ 5 (i) සහ මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** (මෙය මේ වර්ගයේ 55 සූත්‍රයේ 6 ඡේදයමෙනි.)

**7.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒවා දුරින් දුරුකොට සංස්කාරයන් තත්වූ පරිද්දෙන් දක්නහුගේද එහි ආදීනව නොදක්නා බැවින් මිථ්‍යාවට බැසගත්තාවූ තත්වූ පරිද්දෙන් නොදක්නහුගේද පිළිවෙළින් සසරින් ඉක්ම පැවැත්ම හා නොඉක්ම පැවැත්මද යන මේ කරුණ (සියලු අයුරෙන්) දැන එය දක්වන ප්‍රීතිවාක්‍යය ඒ වෙලාවෙහි ප්‍රකාශ කළසේක.

"මේ ප්‍රජාතොමෝ අහංකාර දෘෂ්ටියෙහි යෙදුනීද වෙයි. අනිකෙක් කෙරෙයි යන දෘෂ්ටිය ඇසුරුකළා වෙයි. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ දෘෂ්ටි දෙක අනුනොදත්හ. ඒ දෘෂ්ටි උලයයි නොදැක්කාහුය.

"මේ විපරිත දර්ශනය උලයයි පළමුකොටම දක්නාවූ තැනැත්තාහට මම කරමියි යන දෘෂ්ටිය නොවේ. ඕහට අනිකෙක් කෙරෙයි යන දෘෂ්ටියද නොවෙයි."

"මානයෙන් යුක්තවූ මානග්‍රන්ථය ඇත්තාවූ ඒ මානයෙන් විශෙෂයෙන් බැඳුනාවූ අන්‍යයින්ගේ දෘෂ්ටීන්හි විරුද්ධ කථා ඇත්තාවූ මේ ප්‍රජාව සසර නොඉක්මවයි."

**57. සුභූති පසංසා සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

**2.** එකල්හි වනාහි ආයුෂ්මත් සුභූති ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට නුදුරු තන්හි පලක් බැඳ (-එරමිණියගොතා හිඳ) කය සෘජු කොට තබා විතර්කය නැත්තාවූ සමවැද වැඩ හුන්නේවෙයි. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පලක්බැඳ කය සෘජුකොට තබා චතුර්ථධ්‍යානපාදක අර්හත්ඵල සමාධියට සමවැද හුන්නාවූ ආයුෂ්මත් සුභූති තෙරුන් දුටුසේක්මය.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (ආයුෂ්මත් සුභූති තෙරුන්ගේ සියලු මිථ්‍යාවිතර්ක සියලු සංක්ලෙශයන් පහකිරීමයයි කියනලද) මේ කරුණ දැන ඒ වේලාවෙහි ඒ කාරණය ප්‍රකාශ කරන මේ උදන් (ප්‍රීතිවාක්‍ය) ප්‍රකාශ කළසේක.

4. "යම් ආර්ය පුද්ගලයකු විසින් විතර්කයෝ (ආර්ය මාර්ගයෙන්) තබන ලද්දාහුද, තමාගේ සන්තානයෙහි කිසිවක් ශෙෂ නොකොට මනාව සිඳින ලද්දාහුද, රාගාදී පඤ්ච සංගය ඉක්මවීම් හෙතුවෙන් අරූපයයි ලද නම් ඇති නිර්වානය අරමුණුකොට පැවැත්තාවූ මාර්ගඵල සංඥාවන්ගෙන් අරූපසංඥාව ඇත්තාවූ සතර යොගයන් ඉක්මවා ගියාවූ (රහත්තෙම) ඒකාන්තයෙන් නැවත ඉපදීමට නොඑන්නේයයි."

58. **ගණිකා පූග සූත්‍රයː**- 1 (මේ ඡෙදය 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡෙදයමෙනි.)

2. එකල්හි වනාහි (ii) සමූහ දෙකක මිනිස්සු එක්තරා වෙසඟනක කෙරෙහි ඇලුනාහුවෙත්. පිළිබඳ සිත් ඇත්තාහු හටගත් ඩබර ඇත්තාහු උපන් කෝලාහල ඇත්තාහු විරුද්ධවාදයට පැමිණියාහු එකිනෙකා අතින්ද ගසත්, කැට කැබලිතිවලින්ද ගසත්, මුගුරුවලින්ද ගසත්, ශස්ත්‍රවලින්ද ගසත්, ඔහු එහි මරණයටද පැමිණෙත්, මරණය සමාන දුකටද පැමිණෙත්.

3. ඉක්බිති බොහෝ භික්ෂූහු පෙරවරු එක් වේලාවෙක්හි හැඳ පොරවා පාත්‍රසිවුරුගෙන රජගහ නුවරට පිඬු පිණිස පැමිණියාහුය. රජගහනුවර පිඬුසිඟා ඇවිද පස්වරුයෙහි පිඬු සෙවීමෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. "ස්වාමීනි, මේ රජගහනුවර (මෙහි 2 (ii) යෙදිය යුතුයි.)

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වෙලාවෙහි, මේ ප්‍රීති වාක්‍ය පහළ කළසේක.

"(රාගාදී) ක්ලෙශයෙන් පෙළුනාහටද ඔහුගේ විපාකයෙන් දුකින් පෙළුනාහටද අනුව නික්මෙන්නාහට යම් පස්කම් ගුණ සමූහයෙක් පැමිණියේද, යම් කාමගුණ සමූහයෙක්

පැමිණියයුතුද මේ දෙකම (රාගාදී) ක්ලේශයෙන් ගැවසී ගත්තේය.

5. "දුකින් පෙළුනාවූ පැමිණියාවූ යම් ආත්ම පරිතාපනයෙක් (-තැවීමෙක්) වේද, පැමිණියයුතු යම් ඵලයකුත්වේද, ඒ දෙකම දුක් රජසින් ගැවසී ගත්තේය. යම් කෙනෙක් වනාහි ශික්ෂාව සාරකොට ඇත්තාහු වෙත්.

6. "ශීලයද ව්‍රතයද පලා අනුභව කරන බව වූ චූල ජීවිකාවද බඹසරද මෙසේ සාරයෝයයි කියන්නාහුවෙද්ද, මේ එක් අන්තයෙක්මය, කාමයන්හි දොසෙක් නැතැයි මේ කාම සුඛල්ලිකානුයොගය දෙවන අන්තයවේ.

7. "මෙසේ මේ අන්ත දෙක කටසි නම්වූ අවිද්‍යා තෘෂ්ණාවන් වඩන්නාහු වෙත්, ඒ කටසි නම්වූ තෘෂ්ණා අවිද්‍යාවෝ දෘෂ්ටීහු වඩත්, මේ අන්ත දෙක නොදැනීම හෙතු කොටගෙන ඇතැම් කෙනෙක් හැකිලීමට පැමිණෙත්, ඇතැම් කෙනෙක් අතිධාවනය කෙරෙත්, ඇතැම් කෙනෙක් හැකිලෙත්, ඇතැම් කෙනෙක් අතිධාවනය කෙරෙත්.

8. "යම් ඒ ආර්යපුද්ගල කෙනෙක් වනාහි ඒ අන්ත දෙක විශිෂ්ඨවූ විදර්ශනාඥානය සහිත මාර්ග ප්‍රඥාවෙන් දැන ඒ අන්ත දෙක්හි වැටුනෝ නොවූවාහුද, ඒ ආර්ය පුද්ගලයෝ ඒ අන්තදෙක පහකිරීමෙන් නොසිතූහ. ඒ උත්තම පුරුෂයන්ගේ පැනවීම පිණිස වෘත්තය නැත."

**59. උපාති (අධිපාතක) සූත්‍රයඃ-** 1. (මෙය මේ වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදයමෙනි.)

**2.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ රෑ මහගන අඳුරෙහි තෙල්පහන් දැල්වෙන කල්හි විහාර මලුවෙහි වැඩහුන්සේක. එකල්හි වනාහි බොහෝ පලඟැටියෝ ඒ තෙල් පහන්වල අභිමුඛව වැටීමද කරකැවී වැටීමද කොට දුකටද පැමිණෙත්. විනාශයටද පැමිණෙත්, අනයව්‍යසනයටද පැමිණෙත්, භාග්‍යවතුන් වහන්සේ ඒ තෙල්පහන්වල අභිමුඛව වැටීමටද කරකැවීවැටීමටද පැමිණෙන්නාවූද දුකට පැමිණෙන්නාවූද මරණයට

පැමිණෙන්නාවූද අනයව්‍යසනයට පැමිණෙන්නාවූද ඒ බොහෝ පලගැටියන් දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි බැස මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක.

"මෙසේ ඇතැම් මහණ බමුණෝ (තමා විසින්) චක්ෂුර් විඥානයෙන් දෘෂ්ටීන් දැකීමෙන් හෝ ශ්‍රොත විඥානයෙන් ආරන්වය ලැබීම් පමණින් හෝ මෙසේයයි පිහිටියාහු සාරයට නොපැමිණෙත්, ඉක්මවායෙත්, එසේ ගන්නාහු තෘෂ්ණා දෘෂ්ටිනම්වූ අලුත් අලුත් බන්ධන වඩත්, පහනෙහි (වැටෙන) මේ පළගැටියන්මෙන් වැටෙත්යයි."

**60. උප්පජ්ජන්ති (බුද්ධුප්පාද) සූත්‍රය**:- 1 (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේයː-

3. "ස්වාමීනි, යම් පමණ කලෙක්හි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලොකයෙහි නොඋපදීද්ද ඒතාක් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ සත්කාර කරන ලද්දාහු වෙත්, ගෞරව කරනලද්දාහුවෙත්, බුහුමන් කරන ලද්දාහු වෙත්, පුදන ලද්දාහුවෙත්, සලකනලද්දාහු වෙත්, සිවුරුය පිණ්ඩපාතය සෙනසුන්ය. ගිලනුන්ට ප්‍රත්‍යයවූ බෙහෙත් පිරිකරය (යන මේවා) ලබන්නාහුවෙත්, යම් කලෙක්හි වනාහි පූජාවන් පිළිගැනීමට සුදුසුවූ චතුස්සත්‍ය ධර්මයන් මනාව අවබොධ කළාවූ තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදිද්ද. එකල්හි වනාහි අන්තොටු පිරිවැජියෝ සත්කාර නොකරනලද්දාහු වෙති, ගෞරව නොකරනලද්දාහු වෙති, බුහුමන් නොකරනලද්දාහුවෙති, නොපුදනලද්දාහුවෙති, නොසලකනලද්දාහුවෙති, සිවුරුය ආහාරය සෙනසුන්ය ගිලන්පස බෙහෙත්බඩු නොලබන්නාහුවෙති, "ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේද

භික්ෂු සංඝයාද සත්කාර කරන ලද්දාහුය, ගෞරව කරන ලද්දාහුය, බුහුමන් කරන ලද්දාහුය, පුදනලද්දාහුය, සලකන ලද්දාහුය, සිවුරුය පිණ්ඩපාතය සෙනසුන්ය ගිලන්පස බෙහෙත් බඩු ලබන්නාහුය.”

**4.** “ආනන්දය, මේ කාරණය එසේමය, අනඳ යම්තාක් කල් අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලොකයෙහි නොඋපදිද්ද, ඒතාක් අන්තොටු පිරිවැජියෝ සත්කාරකරන ලද්දාහුවෙති, ගෞරව කරන ලද්දාහුවෙති. බුහුමන් කරන ලද්දාහුවෙති, පුදන ලද්දාහුවෙති, සලකන ලද්දාහුවෙති, සිවුරුය පිණ්ඩපාතය සෙනාසනය ගිලනුන්ට ප්‍රත්‍යයවූ බෙහෙත්බඩු ලබන්නාහුවෙති, ආනන්දය, යම්කලෙක වනාහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදිද්ද, එකල්හි වනාහි අන්තොටු පිරිවැජ්ජෝ සත්කාර නොකරන ලද්දාහුවෙති. ගෞරව නොකරන ලද්දාහු වෙති, බුහුමන් නොකරන ලද්දාහුවෙති, නොපුදන ලද්දාහු වෙති, නොසලකන ලද්දාහුවෙති, සිවුරුය අහරය සෙනසුන්ය ගිලන්පස බෙහෙත් පිරිකරය නොලබන්නාහුවෙති. මේ කාලයෙහි තථාගතයන් වහන්සේද භික්ෂු සංඝයාද සත්කාර කරන ලද්දාහුය, ගෞරව කරන ලද්දාහුය බුහුමන් කරන ලද්දාහුය, පුදන ලද්දාහුය, සලකන ලද්දාහුය, සිවුරුය පිණ්ඩපාතය සෙනසුන්ය ගිලන්පස බෙහෙත් පිරිකරද ලබන්නාහුයයි” (වදාළසේක.)

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය හැම අයුරෙන් දැන ඒ වේලාවෙහි ඒ අර්ථය ප්‍රකාශවන මේ ප්‍රීතිවාක්‍ය පහළ කළසේක:-

“යම්තාක් පහංකරයයි නම් ලද හිරු උදානොවේද, ඒතාක් කණමැදිරිතෙම බබළයි, අඳුරු නසා බබළන්නාවූ හිරු උදාවූ කල්හි (කණමැදිරිතෙම) නැසුණු එළිය ඇත්තේවෙයි, නොම බබළයි, යම්තාක් සම්බුදුන් වහන්සේ ලොකයෙහි නොඋපදිද්ද, එපරිද්දෙන් තීර්ථක සමූහයා බැබළුණේමවෙයි, තීර්ථකයෝ නොහොබිත්, ඔවුන්ගේ

ශ්‍රාවකයෝද නොහොබිත් මිසදිටුවෝ (සසර) දුකින් නොමිදෙත්"

**(6 ජාත්‍යන්ධ වර්ගය නිමි)**

---

## 7. චුල්ල වර්ගය

**61. ලකුණ්ටක භද්දික සූත්‍රයː-** 1. (මෙය 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**2.** එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙම ආයුෂ්මත් ලකුණ්ටක (මිටි) භද්දිය තෙරුන්ට නොඑක් කාරණයෙන් දැහැමිකතාවෙන් මනාව දක්වයි, මනාව ගන්වයි, මනාව තියුණු කරවයි, මනාව ප්‍රීතිකරවයි, ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් නොඑක් කාරණයෙන් දැහැමිකතාවෙන් දක්වනු ලබන්නාවූ ගන්වනු ලබන්නාවූ මනාව පිරිසිදු කරවනු ලබන්නාවූ මනාව සතුටු කරවනු ලබන්නාවූ ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදුණේය.

**3.** භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් නොඑක් කාරණයෙන් ධාර්මික කථාවෙන් මනාව දක්වනු ලබන්නාවූ මනාකොට ගන්වනු ලබන්නාවූ, මනාව පිරිසිදු කරවනු ලබන්නාවූ, මනාව සතුටු කරවනු ලබන්නාවූ, උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත මිදුනාවූ ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන් දුටුසේක්මය.

**4.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ දැක ඒ වේලාවෙහි (ඒ කරුණ ප්‍රකාශවන) මේ උදන් පහළ කළසේකː-

"(යමෙක්) උඩයට සියලු සංස්කාරයෙහි මිදුනේ වේද, අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද (අනාගත ස්කන්ධ ධාතුන්හිද වර්තමාන කාලයෙහිද) කාමාදි සියලු භවයෙහිද හැම භවයෙහිද මිදුනේවේද, පුද්ගලතෙම නොබලයි, නොමදක්නේය, මෙසේ මිදුනාවූ රහත්තෙම අනුපාදිශෙෂ නිර්වානධාතුව පිණිස එතෙර කෙළේයයි."

**62. (සෙක්ඛ) ලකුණ්ටක භද්දිය සූත්‍රයː-** (මේ ඡේදය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.) 2. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන් ශෛක්ෂයෙකැයි හඟිමින් ප්‍රමාණය ඉක්මවා වැඩියක් නොඑක් කාරණයෙන් දැහැමිකතාවෙන් මනාව දක්වයි, මනාව ගන්වයි, මනාව පිරිසිදු කරවයි, මනාව සතුටු කරවයි, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන් හික්මෙන්නෙකැයි හඟිමින් ප්‍රමාණය ඉක්මවා වැඩියක් නොඑක් කාරණයෙන් දැහැමි කතාවෙන් මනාව දක්වන්නාවූ මනාව සමාදන් කරවන්නාවූ මනාව පිරිසිදු කරවන්නාවූ මනාව සතුටු කරවන්නාවූ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුටුසේක්මය.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන්සේක්ම බුද්ධානුභාවයෙන් යම්සේ දම්සෙනෙවි සැරියුත් තෙර ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ කෙලෙස් ක්ෂය කිරීම දැනගනීද (එසේ) ඒ කාරණය දැන ඒ වෙලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේකː-

"(නිරවශෙෂයෙන් ක්ලෙශ) වෘත්තය සහමුලින් සින්දේය තෘෂ්ණාව නැති නිවනට විශෙෂයෙන් පැමිණියේය. තෘෂ්ණා නමැති ගංගාතොමෝ නිරවශෙෂයෙන් වියලන ලදු, නොගලයි (-නොපවතී) සිඳිනලද කමවට නොපවතී. එනොඉපදවීමම සියලු සසර දුකෙහි කෙළවරවේ."

**63. (ප්‍රථම) කාම සත්ත සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි (ii) සැවතෙහි මනුෂ්‍යයෝ බෙහෙවින් (වස්තු) කාමයන්හි වේලාව ඉක්මවා ඇලුනාහු වෙත් රැඳුනාහු ගිජුවූවාහු වෙත්, බැඳුනාහුවෙත්, මුළාවට පැමිණියාහු වෙත්, ගිලගෙන සිටියාහු බැසගත්තාහු වෙත්, කාමයන්හි ඇලීමට පැමිණියාහු වාසය කෙරෙත්. (iii) ඉක්බිති බොහෝ භික්ෂූහු පෙරවරු එක් වේලාවෙක්හි හැඳ පොරවා පාත්‍ර සිවුරු රැගෙන සැවතට පිඬු පිණිස වන්හ. සැවතෙහි පිඬු සිගා ඇවිද පස්වරුවෙහි පිඬු සෙවීමෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ

යම් තැනෙකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන්නාවූම ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කළාහුයඃ-

3. "ස්වාමීනි, (මෙහි 2 (ii) (යෙදිය යුතුයි) එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ ආදීනව නොදැකීම දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේකඃ-

4. යම් කෙනෙක් වස්තුකාමයන්හි (ක්ලේශකාමයෙන්) ඇලුනාහුද වස්තුකාමයන්හි (ඒ ක්ලෙශකාමයෙන්) ඇලීම හෙතුකොට ගෙනම වස්තුකාමයන්හි රාගසංගයෙන්ද දෘෂ්ටි මානද්වෙෂ අවිද්‍යා සංගයන්ගෙන්ද ඇලුනාහුද සංයොජක නම් වූ කාමරාගාදී ක්ලෙශ සමූහයෙහි දොෂය නොදක්නාහුද සංයොජන නම්වූ සංගයෙන් ඒ සංගයනට විෂයවූ ත්‍රෛභූමක ධර්මයන්හි ඇලුනාහුද, මහත්වූද, පතළාවූද ඔඝය (නොහොත්) සංසාරොඝය තරණය නොකරන්නාහුය."

**64. (ද්විතීය) කාම සත්ත සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි සැවැත් නුවර මනුෂ්‍යයෝ බොහෝ සෙයින් (වස්තු) කාමයන්හි (දොෂය නොසලකා ආශ්වාදයම සිහි කොට) ඇලුනාහු වෙති. (මෙහි මේ වර්ගයේ 63 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි) ඉතා ඇලුනාහු වෙති.

3. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු එක් වේලාවෙක්හි හැඳ පොරොවා පාත්‍ර, සිවුරු ගෙන සැවැත්නුවර පිඬු පිණිස වන් සේක. භාග්‍යවතුන් වහන්සේ (මෙහි මේ වර්ගයේ 63 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි) ඒ මිනිසුන් දුටු සේක්මය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (සැවැතින් නික්ම දෙවුරමට වඩනාසේක් අතර මග අචිරවතී නදියෙහි කෙවුළන් අටවන ලද කෙමිනකට වැද නික්මෙන්නට නොහැකිවූ බොහෝ මසුන් දුටුසේක. ඉන් ඔබ්බෙහි කිරිබොන එක් වස්සෙකු හඬා ලුහුබැඳ කිරිබීම පිණිස බෙල්ල දික්කරගෙන මවගේ කළවා අතරට මුව එළවන්නාහු දුටු සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෙහෙරට

වැඩ පා සෝදා පනවන ලද බුද්ධාසනයෙහි වැඩහුන් සේක්. මේ කරුණු දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේකැ:-

4. "(වස්තුකාමයන්හි) ක්ලෙශකාමයෙන් අන්ධවූ නුවණැස් නැතිකරන ලද්දාවූ සත්වයෝ සියුම් සිදුරු ඇති දැලකින්වට කරන ලද විලක්සේ අනිත්‍යාදී වශයෙන් නොඑක් භෙදයෙන් බිඳී ගියාවූ අන්‍ය ආත්මභාවයන්හි හා ස්වකීය ආත්ම භාවයෙහිද ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හිද එය ඇසුරු කළ ධර්මයන්හිද යටවීම් මතුවීම් වශයෙන් ඔබ මොබ ඉපදීමෙන් ඇතුළත්හි වූවන්ට අනර්ථ පමුණුවන හෙයින්, දැලක් බඳුවූ තෘෂ්ණාවෙන් වැසුණාහු තෘෂ්ණා නමැති වැසිල්ලෙන් වැසුනාහු වෙත්, කෙමන් කටෙහි (වන්) මසුන් මෙන් ප්‍රමාදවූ සත්ත්වයන් අනර්ථයෙන් බඳින්නාවූ ක්ලේශ මාරයා විසින්ද දිව්‍යපුත්‍ර මාරයා විසින්ද බඳින ලද්දාහු වෙත්. කිරි බොන වස්සා මව අනුව යන්නා සේ ජරා මරණයට පැමිණෙත්."

**65. ලකුණ්ටක සූත්‍රය**:- 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය ස්ථවිර තෙම බොහෝ භික්ෂූන්ගේ පිටිපසින් පිටිපසින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි එතැනට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ දුරදීම බොහෝ භික්ෂූන්ගේ පිටිපසින් පිටිපසින් එන්නාවූ දුර්වර්ණවූ ප්‍රසාද එළවන දැකුම් නැත්තාවූ මිටිවූ බොහෝ සෙයින් භික්ෂූන්ට පිළිකුල් ස්වභාවය ඇති ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන් දුටුසේක්මය. දැක භික්ෂූන් ඇමතූසේකැ:-

3. "මහණෙනි, තෙපි දුර්වර්ණවූ පැහැදීම එළවන දැකුම් නැත්තාවූ මිටිවූ බෙහෙවින් භික්ෂූන්ට නොරිසිවූ අර මහණ බොහෝ සාමණෙරවරුන්ගේ පසුපස්සෙන් දුරින්ම එනු දක්නහුදැ?"යි

"එසේය ස්වාමීනි"යි (කීහ) "මහණෙනි, ඒ මහණහු මහත් ඍද්ධි ඇත්තෙක, මහත් ආනුභාවය ඇත්තෙක. ඒ මහණහු

නොසමවන් විරූ යම් සමවතක් (වේද,) ඕ සමවත සුවසේ ලැබිය හැකි ස්වභාව ඇත්තී නොවේ. කුලපුත්‍රයෝ යම් අර්හත් ඵලයක් පිණිස මනාකොටම ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, නිරුත්තරවූ මාර්ග බ්‍රහ්මචර්ය කෙළවර කොට ඇති ඒ රහත්බව මේ අත් බවෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වෙසේ යයි" (වදාළසේක)

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ මහර්ධිභාව මහත් ආනුභාව ඇති බව ආදි ප්‍රභෙදවූ මේ ගුණ සමූහයවූ අර්ථය හැම අයුරෙන් දැන ඒ වේලාවෙහි ඒ කරුණ දක්වන මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

> "නිර්දොෂවූ ප්‍රධානවූ අර්හත් ඵල ශීල නමැති අග ඇත්තාවූ පලස වැනි අර්හත් ඵල විමුක්ති නමැති ඉතා සුදු පලස් ඇත්තාවූ සිහි නමැති අර (දැවී) ඇත්තාවූ (ලකුණ්ටක භද්දිය නමැති) රථයතෙම පවත්නේය. නිදුක්වූ කෙලෙසුන්ගෙන් සැලීමක් නැත්තාවූ, එන්නාවූ, සිඳින ලද ස්‍රොතස් (වැගිරීම්) ඇත්තාවූ බැමි නැත්තාවූ (ඒ ලකුණ්ටක භද්දිය නමැති රථය) බලවයි."

**66. කොණ්ඩඤ්ඤ පසංසා සූත්‍රයː-** 1. (මෙය 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය මෙනි.) 2. "එකල්හි වනාහි ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි තුන් සන්ධියක් ඇති ඌරුබද්ධාසනය අවුලුවා (-එරමිණිය ගොතා) කය ඍජු කොට තබා තෘෂ්ණා ක්ෂය සංඛ්‍යාත නිර්වානයෙහි විමුක්තිය (-කෙලෙසුන්ගෙන් මිදීම) (නොහොත්) අර්හත් ඵල සමාපත්තිය ප්‍රත්‍යවෙක්ෂා කරමින් වැඩහුන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පලක් බැඳ කය ඍජුකොට තබා තෘෂ්ණාක්ෂය නම් අර්හත් ඵල විමුක්තිය ප්‍රත්‍යවෙක්ෂා කරමින් වැඩහුන්නාවූ අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් දුටුසේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි (ඒ කරුණ දක්වන) මේ ප්‍රීති වාක්‍ය පහළ කළ සේක.

"යම් ආර්යපුද්ගලයකුගේ මුල පොළොවද නැත්තේද ලතාවක් නැත්තේද, පත්‍රයෝ කොයින්ද? පත්‍ර නැත්තේද,

"ධෘතිමත්වූ බන්ධනයෙන් මිදුණාවූ ඒ ක්ෂීණාශ්‍රවයාට කවර නම් නුවණැත්තෙක් ගරහන්නට සුදුසුවේද, ඒ ක්ෂීණාශ්‍රවයාට දෙවියෝද පසසත්, මහා බ්‍රහ්මයා විසිනුදු පසසන ලද්දේමයයි."

**67. ප්‍රපඤ්චක්ෂය සූත්‍රයː-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) 2. "එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ ප්‍රපඤ්ච නම්වූ බොහෝ කල් පවත්වන්නාවූ රාග ද්වෙෂ මොහ මාන ක්ලෙශයන්ගේ ප්‍රහානය ප්‍රත්‍යවෙක්ෂා කරමින් වැඩහුන්සේක.

**3.** "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ රාග ද්වෙෂ මොහ තෘෂ්ණා දෘෂ්ටි මාන නම් බොහෝකල් සිටුවන්නාවූ ක්ලෙශයන්ගේ ප්‍රහානය ප්‍රපඤ්ච නම්වූ කෙලෙසුන් සමග පවත්නා සංඥා කොට්ඨාසයන්ගේ ප්‍රහානය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

> **4.** "යම් පුද්ගලයකුගේ ප්‍රපඤ්චයෝද සිටීමද, අනුසයත් නැත්තේද, බන්ධනයයි ලද නම් ඇති තෘෂ්ණා දෘෂ්ටීන්ද පලිඝ (ඉදිරුව) යයි කියනලද අවිද්‍යාවද විශෙෂයෙන් ඉක්මවූයේද, තෘෂ්ණාව නැත්තාවූ මුනිවූ හැසිරෙන්නාවූ ඒ පුද්ගලයාට දෙවියන් සහිතවූ සියලු සත්ව ලොකයා අවමන් නොකෙරේ" යයි.

**68. කම්මාන පසංසා සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) 2. "එකල්හි වනාහි ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරතෙම පලක්බැඳ (-එරමිණිය ගොතා) කය ඍජු කොට තබා ගොචරාත්මයවූ කමටහන් අරමුණෙහි මනාකොට පැමිණ සිටියාවූ කායගතාසතියෙහි (කය අනුව බලන) සිහියෙහි අභිමුඛකොට භාග්‍යවතුන් වහන්සේට නුදුරුැතන්හි වැඩහුන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ මහාකච්චායන තෙර භාග්‍යවතුන් වහන්සේට නොදුරු තන්හි පලක් බැඳ කය ඍජු කොට තබා තමාට ගොචරවූ කර්ම

ස්ථානාරම්මණයෙහි අභිමුඛව මනාකොට පැමිණ සිටියාවූ කය අනුව බලන සිහියෙන් යුක්තව වැඩහුන්සේක්මය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා කච්චායන තෙරුන්ගේ සතිපට්ඨාන භාවනා වශයෙන් ලබන ලද ධ්‍යානය පාදක කොට සමවැදීම්වූ මේ කරුණ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

"යමකුගේ හැමකල්හිම සිහිය කය අනුව බැලීමට පැමිණ සිටියාවන්නීද, මාගේ ක්ලෙශ කර්මයෙක් ඉදින් නොවීනම් මාගේ මේ ආත්මභාවය නො උපදින්නේය. මේ අත්බවෙහි ක්ලෙශ කර්මයෙක්ද නොවන්නේය, මට මත්තෙහි විපාක වෘත්තයෙක්ද නොවන්නේය, නොදනොවන්නේ නම් මා සතුවූ කිසිවක් නොවන්නේය. කරුණුවූ කිසිවක් නොවන්නේය. මත්තෙහිද තමාට අයත්වූ කිසිවක් නම් මට නොවන්නේයයි (මෙසේ තුන් කල්හිම) අනුපූර්ව විහාර ඇත්තාවූම යොගාවචර තෙම ඉඳුරන් මුහුකුරාගිය කල්හිම විසත්තිකායයි කියනලද තෘෂ්ණාව තරණය කරන්නේය."

**69. උදපාන සූත්‍රයː-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයෙහි අතුරිත චාරිකා වශයෙන් (නොඉක්මන් හැසිරීම් වශයෙන්) මහා මණ්ඩල ජනපද චාරිකාවෙහි වඩනාසේක් මහා භික්සඟන සමග මල්ල නම් දනව් වැස්සන්ගේ ගම යම් තැනෙක්හිද ඒ මාර්ගයට පැමිණිසේක. ථූන නම් ගම්වැසිවූ බමුණු ගැහැවියෝ "පින්වත්නි, ශාක්‍ය රජුගේ පුත්වූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතමතෙම මල්ල ජනපදයෙහි චාරිකා කරමින් මහ භික්සඟන සමග ථූන නම් ගමට පැමිණියේල"යි ඇසූවාහුමය. "ඒ නින්දිත මුඩු මහණෝ පැන් නොබොත්වා"යි තෘණරොඩු ගොඩ ගසා ළිං වැසූහ.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත්ව එක්තරා රුක්මුල යම් තැනෙක්හිද එතැනට වැඩිසේක. වැඩ පනවන ලද බුද්ධාසනයෙහි වැඩ හුන්සේක. වැඩහිඳ වනාහි

ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූසේක. "එහෙනම් අනඳ! තෝ මට අර ළිඳෙන් පැන් ගෙන එව"යි (වදාළසේක) මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් අනඳ තෙර භාග්‍යවතුන් වහන්සේට මෙපුවත දැන්වීය.

3. "ස්වාමීනි, (ii) දැන් (අප එන වේලාවෙහි) ඒ ළිඳ වූන ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතීන් විසින් 'ඒ නින්දිත මුඩු මහණහු පැන් නොබොත්වා'යි රොඩුවලින්ද බොල් වියෙන්ද ළිං කට තෙක් පුරවන ලද්දේය. (iii) දෙවැනිවද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් කැඳවූසේක. "එහෙනම් ආනන්දය, අර ළිඳෙන් පැන් ගෙනඑව"යි (වදාළසේක.) දෙවැනි වත් ආයුෂ්මත් අනඳ තෙර භාග්‍යවතුන් වහන්සේට මේ ප්‍රවෘත්තිය දැනුම් දුන්නේය. "ස්වාමීනි, (මෙහි 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) තුන් වෙනුවද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දයයි, තෙරුන් කැඳවූසේක. 'එහෙනම් ආනන්දය, අර ළිඳෙන් මට පැන් ගෙන එව"යි (වදාළසේක.)

"එසේය ස්වාමීනි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, පාත්‍රය ගෙන ඒ ළිඳ යම් තැනෙකද එතැනට පැමිණියේය. එකල්හි ඒ ළිඳ ආයුෂ්මත් අනඳ තෙරුන් පැමිණෙත් පැමිණෙත්ම ඒ හැම තණද දහවියාද ළිං කටින් (ඉල්පී) ඉවත්ව නිර්මලවූ නොකැලත්වූ විශෙෂයෙන් පෑදුනාවූ දියෙන් ළිං කට තෙක් පිරුණේ ගලා බසින්නාසේ සිටියේය.

4. "එකල්හි ආයුෂ්මත් අනඳ තෙරුන්ට මෙබඳු අදහසෙක් විය. "පින්වත්නි, ඒකාන්තයෙන් තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇතිබව මහානුභාව ඇතිබව ආශ්චර්යයයි, පුදුමයි. මේ ඒ ළිඳ වනාහි මා පැමිණෙන කල්හි සියලු ඒ තෘණද බොල් වියද ළිං කටින් (ඉල්පී) ඉවත්ව නිර්මලවූ නොකැලඹුනාවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ ජලයෙන් ළිං කට තෙක් පිරුණේ ගලා බස්නාක් මෙන් සිටියේයයි," පාත්‍රයෙන් පැන් ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට මේ පුවත කීයේය. "ස්වාමීනි තථාගතයන්

වහන්සේගේ මහර්ධි ඇති බව මහානුභාව ඇතිබව ආශ්චර්යය, පුදුමය. ස්වාමීනි, මේ ඒ ළිඳ වනාහි මා පැමිණෙන කල්හි සියලු ඒ තෘණද දහවියාද, ළිං කටින් (ඉල්පී) ඉවත්ව නිර්මලවූ නොකැළඹුනාවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ ජලයෙන් ළිං කට තෙක් පිරී ගියේ ඉතිරයන්නාසේ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ පැන් පානය කරණ සේක්වා, සුගතයන් වහන්සේ පැන් පානය කරන සේක්වායි" (කීයේය)

**5.** "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

"ඉදින් (යමකුට) හැමදා (හැම තන්හිම) දිය වන්නාහු නම් (ජලය ලැබේ නම්) (ඔවුන්ගේ ඒ) ළිඳෙන් පීම පමණක් පිළිබඳවූ ලාභය වේ නම් ළිඳෙන් කුමක් කරන්නේද, ඒ තෘෂ්ණාවගේ මුල හෝ මුලෙහිම සිඳ කවර කරුණකින් පැන් සෙවීමෙහි හැසිරෙන්නේද?"

**70. උදෙන සූත්‍රයඃ-** 1. මා විසින් "මෙසේ අසන ලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර සමීපයෙහිවූ ඝොෂිත සිටුහු විසින් කරවන ලද ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි උයනට ගියාවූ උදෙන රජහුගේ අන්තඃපුරය දෑවේ වෙයි, සාමාවති බිසව ප්‍රධානකොට ඇත්තාවූ ස්ත්‍රීන් පන්සියයක් (ගින්නෙන් දැවී) කළුරිය කළාහු වෙත්. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු පෙරවරුවෙහි හැඳ පොරොවා පාත්‍ර සිවුරු ගෙන කොසඹෑ නුවරට පිඬු පිණිස වන්හ. කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර පස්වරුවෙහි පිඬු සෙවීමෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිඳ එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙහි හුන්නාවුම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීහ.

**2.** "ස්වාමීනි, මෙහි උදෙන රජහු උයන් කෙළියට ගියදී අන්තඃපුරය දැවිණ. සාමාවතී දෙවිය ප්‍රධාන කොට ඇති ස්ත්‍රීන් පන්සියයක් කළුරිය කළාහුය, "ස්වාමීනි, ඒ උපාසිකාවන්ගේ ගති තොමෝ කවරීද? පරලොව කවරේදැ"යි (විචාළහ.)

3. "මහණෙනි, මේ උපාසිකාවන් අතුරෙහි සොවාන් උපාසිකාවෝත් ඇත්තාහ. සකෘදාගාමි උපාසිකාවෝත් ඇත්තාහ. අනාගාමි උපාසිකාවෝත් ඇත්තාහ. මහණෙනි, ඒ උපාසිකාවෝ සැදැහැ ඇත්තියෝය, නිෂ්ඵල නොවූවාහු මාර්ග ඵල ඇත්තාහු කළුරිය කළාහුයයි" වදාළසේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය (සියලු අයුරෙන්) දැන මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

"(මෙහි) සත්ව ලොකයතෙම හෙතු සම්පන්නයකු වැනිව පෙණෙයි, (හෙතෙමේද) මොහය සම්බන්ධකොට ඇත්තේය. අන්ධ බාල ලොකය තෙම උපධි සම්බන්ධ කොට ඇත්තේද, අවිද්‍යා නමැති අන්ධකාරය විසින් පිරිවරන ලද්දේය. ඔහුට කාමයෝ නිත්‍යය හැමකල්හි වන සුලුයයි වැටහෙයි."

"විශෙෂයෙන් විදර්ශනා ප්‍රඥාව සහිතවූ මාර්ග ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් බලන්නාවූ ඕහටම එසේ නොදන්නේම අවිද්‍යා තෘෂ්ණා දෘෂ්ටි ආදී බන්ධනයෙන් සසර බැඳුනේ වන්නේය."

**(7 වෙනි චුල්ල වර්ගය නිමි.)**

---

# 8. පාටලීගාම වර්ගය

71. **(ප්‍රථම) නිර්වාණ සූත්‍රයඃ-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට අසංස්කෘත ධාතුවවූ නිවන පැවසීම් වශයෙන් පැවැති ධර්ම දෙශනාවෙන් දක්වනසේක. (ලවා) ගන්වනසේක. බබුළුවනසේක. (නිර්වාන) ගුණයෙන් මනාකොටම සර්වප්‍රකාරයෙන් සතුටු කරවන සේක. මනාව දක්වනසේක. සමාදන් කරවනසේක.

3. ඒ භික්ෂූහුද ප්‍රයෝජන ඇත්තෝව සිතේ තබා දෙශනාව ආවර්ජනාකොට (සියලු සිතින්) මනාව දරා මනාව තබනලද කන් ඇත්තෝව දහම් අසති.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය (හැම අයුරෙන්) දැන මේ ප්‍රීතිවාක්‍යය ඒ වේලාවෙහි පහළකළසේක.

"මහණෙනි, යම් නිවනෙක්හි පෘථිවිධාතුව නොම ඇත්තේද, ආපෝධාතුව නැත්තේද, තෙජෝ ධාතුව නැත්තේද, වායෝධාතුව නැත්තේද, ආකාසානඤ්චායතන චිත්තෝත්පාදය නැත්තේද, විඤ්ඤාණඤ්චායතන සිතෙහි ඉපදීමෙක් නැත්තේද, ආකිඤ්චඤ්ඤායතන සිතෙහි ඉපදීමෙක් නැත්තේද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිතෙහි ඉපදීමෙක් නැත්තේද, මේ ආත්මභාවය සඳ හිරු දෙදෙනද නැත්තේය. මහණෙනි, ඒ නිවණෙහි ඒමක්ද නොමකියමි, යාමක්ද නොම කියමි. සිටීමක්ද නොම කියමි. ඉපදීමද නොමකියමි. චුතවීමද නොමකියමි, ඒ නිවණ නොපිහිටියේය. නොපවත්නේය ඒ නිවණ අරමුණක් නැත්තේමය, කෙළවර වූයේම මේ නිවණ යයි."

**72. (ද්විතීය) නිර්වාණ සූත්‍රය:-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.) 2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිර්වාණය පිළිබඳ ධර්ම කථාවෙන් මනාව දක්වනසේක. මනාව ගන්වනසේක. සමාදන් කරවනසේක. (ඒ අර්ථය ගැනීමෙහි උත්සාහය දන්වමින්) බබුළුවනසේක. උත්සාහ කරවනසේක, (එහි සිත හෝ පිරිසිදු කරවනසේක. සතුටු කරවනසේක. සනසනසේක. ඒ භික්ෂූහුද (මේ ධර්මය අප විසින් අවබොධ කළයුතු යයි මෙසේ සලකා ඒ දෙශනාවෙන් ප්‍රයෝජන ඇතිව සිතේ තබා සියල්ල සිතින් ගෙන බණ අසත්.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දැක මේ ප්‍රීති වාක්‍යය පහළකළසේක.

4. "දක්නට නොපිළිවන්වෙයි, කෙළවර රහිතය, සත්‍ය නම් වෙයි. සුවසේ නොදැක්ක හැකි වෙයි. අවබොධ කරන්නාහු විසින් තෘෂ්ණාතොමෝ පිළිවිදින ලදුද, දන්නාහට, දක්නාහට කිසි තෘෂ්ණා පළිබොධයක් නැත්තේයයි

කර්මවිපාක වෘත්තයන්ගේද නො ලැබීම වේ. ඊට හේතුවූ අමාමහ නිවනෙහි ආනුභාවය ප්‍රකාශ කළසේක."

**73. (තෘතීය) නිර්වාණ සූත්‍රයඃ-** 1 (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) 2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිර්වානය පිළිබඳවූ දැහැමි කථාවෙන් මනාව දක්වනසේක මනාව ගන්වනසේක. ඒ භික්ෂූහු මෙනෙහිකොට සියල්ල සිතින් ගෙන පිහිටුවන ලද කන් ඇතිව දහම් අසත්.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

"මහණෙනි, නූපන්නාවූ නොවූ නොකරණ ලද්දාවූ සකස් නොකරන ලද්දාවූ නිවන ඇත්තේය. මහණෙනි. නොඋපන්නාවූ නොවූ නොකරන ලද්දාවූ එක්ව නො සකස්කරන ලද්දාවූ නිවන ඉදින් නොවීනම් උපන්නාවූ එක්ව සකස්කරන ලද්දාවූ මේ නොපැවැත්ම නො පෙණෙන්නේය, මහණෙනි, යම්හෙයකින් වනාහි නූපන්නාවූ නොවූ නොකරන ලද්දාවූ, පිළියෙළ නොකරණ ලද්දාවූ නිවන ඇත්තේද, එහෙයින් උපන්නාවූ කරනලද්දාවූ පිළියෙළ කරන ලද්දාවූ නොපැවැත්ම පෙනෙන්නේයයි."

**74. (චතුර්ථ) නිර්වාණ සූත්‍රයඃ-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) 2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිවන් පිළිබඳ දැහැමිකතාවෙන් මනාව දක්වනසේක, එම අර්ථය ඒ භික්ෂූන් ලවා මනාවගන්වනසේක. කරවනසේක, නිර්වාණාධිගමය පිණිස උත්සාහ උපදවමින් එහි සිත පිරිසිදු කරවනසේක, නිර්වාණ ගුණයෙන් මනාවම සර්වප්‍රකාරයෙන් සතුටු කරවනසේක, ඒ භික්ෂූහුද ප්‍රයෝජන ඇත්තෝව සිතේ තබා දෙශනාව සියල්ල තමාගේ සිතට ගෙන පිහිටුවනලද කන් ඇතිව දහම් අසත්.

3. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අර්ථය දැන මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේකඃ-

4. "(රූපාදී සංස්කාරයන් තෘෂ්ණාදෘෂ්ටීන් විසින්) ඇසුරුකළහුගේ සැලුනේ වෙයි. සැලීම වෙයි. ඇසුරු නොකළාවූ

ඔහුගේ සැලීමෙක් නැත. (යථොක්ත) සැලීම නැති කල්හි සංසිඳීම ඇතිකල්හි (භවයෙහි) ඇලීම තෘෂ්ණාව ඊමෙක්ද යාමෙක්ද නොවේ. යාමද නැති කල්හි (ඔබිනොබ) චුති උත්පත්ති දෙක නොවේ. චුති උත්පත්ති දෙක නැති කල්හි මේ ලෙව්හි නොවේ. පරලෙව්හි නොවේ. මේ නිවනම ක්ලේශ දුඃඛයේද වෘත්තදුඃඛයේද කෙළවර වන්නේය.”

**75. චුන්ද සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයෙහි චාරිකාව කරනසේක් මහබික්සඟන සමග පාවා නම් නුවර යම් දිශාවෙක්හිද ඒ මගට වන්සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර සමීපයෙහිවූ චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ අඹවන (වෙහෙරෙහි) වැඩවසනසේක.

2. චුන්ද නම් ස්වර්ණකාර පුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙමින් මහත් භික්ෂු සංඝයා සමග නගරයට පැමිණිසේක් පාවානුවර වෙත වූ මාගේ අම්බවනාරාමයෙහි වැඩවසනසේක්ල’යි ඇසූයේමය. ඉක්බිති ස්වර්ණකාරයාගේ පුත්‍රවූ චුන්දතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හිඳගත. එකත්පසෙක හුන්නාවූම සුවන්කරු පුත්වූ චුන්දයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතාවෙන් (නිවන) මනාව දැක්වූසේක. මනාව උත්සාහ කරවූසේක. මනාව සිත පිරිසිදු කරවූසේක.

3. ඉක්බිති චුන්ද නම් සුවන්කරුගේ පුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධාර්මික කථාවෙන් මනාව දක්වන ලද්දේ, මනාව ගන්වන ලද්දේ (එහි) උත්සාහ දන්වනලද්දේ (නිර්වාණ ගුණයෙන්) මනාව සතුටු කරවන ලද්දේ “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ බික්සඟන සමග සෙට දවසෙහි මාගේ බත ඉවසනසේක්වායි” භාග්‍යවතුන් වහන්සේට මේ වචනය කීයේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසා වදාළසේක. එකල්හි වනාහි චුන්ද නම් ස්වර්ණකාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට ගියේය.

**4.** ඉක්බිති රන්කරුගේ පුත් චුන්දතෙමේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් සිය නිවසෙහි ප්‍රණීතවූ කැවිලිද, බොජුන්ද බොහෝ මොළොක් සිනිඳු හතු පිළියෙළ කරවා "ස්වාමීනි බත නිමියේය. (දනට) කල් වන්නේ" යයි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා යැවීය.

**5.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරවා පා සිවුරු රැගෙන භික්ෂු සංඝයා සමග චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ ගෙය යම් තැනෙකද එතැනට වැඩි සේක. වැඩ පනවනලද අස්නෙහි වැඩහුන්සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ චුන්ද නම් ස්වර්ණකාරයා අමතා වදාළසේක.

"චුන්දයෙනි, තොප යම් හතුමද්දවයක් පිළියෙළ කරන ලද්දේද, එයින් මා වළඳව, අන්‍යවූ ඛාද්‍යයක්, භොජ්‍යයක් පිළියෙළ කරණ ලද්දේද, එයින් භික්ෂු සංඝයා වළඳව"යි (වදාළහ) "එසේය ස්වාමීනි" කියා චුන්ද නම් ස්වර්ණකාර පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තරදී පිළියෙළ කළාවූ යම් මොළොක් සිනිඳු හතුවීද, එයින් භාග්‍යවතුන් වහන්සේ වැළඳවීය. පිළියෙළකළාවූ අන් යම් කෑයුතුදැයක් බුදියයුතු දැයක්වී ද, ඒ ඛාජ්‍ය භොජ්‍යයෙන් භික්ෂු සංඝයා වැළඳවීය.

**6.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කර්මාර පුත්‍රවූ චුන්දයා අමතා වදාළසේක.

"චුන්දයෙනි, තොපගේ යම් මොළොක් සිනිඳු හතු ඉතිරිවීද, ඒ ඉතිරි උෟරු කෑම වළෙක ලවයි (වදාළසේක.) චුන්දයෙනි, යමෙකු විසින් ඒ හතු අනුභව කරනලද්දේ මනාව දිරවීමට යන්නේද, තථාගතයන් වහන්සේහැර මම දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ බඹුන් සහිතවූ ලොකයෙහි මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි එබඳු පුගුලකු නොමදකිමියි" (වදාළහ.) එසේය ස්වාමීනි, කියා චුන්ද නම් ස්වර්ණකාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිඥාව දී යම් හතු කෑමක් ඉතිරිවීද, එය වළලා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක

හුන්නාවූම චුන්ද නම් කර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාවෙන් (දානානිසංස) මනාව දක්වා, මනාව සිතවිගන්වා මනාව උත්සාහ උපදවා (හැම අයුරෙන්) සිත සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩිසේක.

7. ඉක්බිති ස්වර්ණකාර පුත්‍රවූ චුන්දගේ දානය වැළඳූ භාග්‍යවතුන් වහන්සේට රළු විෂභාග රෝගයෙක් උපන, දැඩි ගිලන් බැව් ඇත්තාවූ මරුවෙතැ පැමිණවීමට සමත්වූ ලේ අතීසාරය පවත්නීය, එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සිහිනුවණ ඇතිසේක් නොපෙළෙනසේක් ඉවසා වදාළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන්ට අඬගා වදාළසේකැ:- "අනඳ! (එව) යමු," කුසිනාරා නුවර යම් අතෙකද, ඒ අතට පැමිණෙන්නෙමුයි," - "එසේය ස්වාමීනි' කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදින.

8. ධෘතිමත්වූ සර්වඥයන් වහන්සේ චුන්දනම් ස්වර්ණකාරයාගේ බත වළඳා ඉතාදැඩිවූ මරණය කෙළවර කොට ඇත්තාවූ රෝගය අතිසයින් ස්පර්ශ කෙළසේකැයි මා විසින් අසන ලද්දේය, සූකරමද්දවය වැළඳූ ශාස්තෲන් වහන්සේට ඉතාබලවත් රෝගයෙක් හටගත්තේය, විරේකවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ "මම කුසිනාරා නුවරටයමි"යි වදාළසේක.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත්ව එක්තරා රුක්මුල යම්තැනෙකද එහි වැඩිසේක, වැඩ ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා වදාළසේක. 'මෙහි එව අනඳ තෝ මට සඟළ සිවුර සතර පොටක් කොට පණවාලව, ක්ලාන්ත වෙමි, හිඳගන්නෙමි,"යි වදාළසේක. "එසේය ස්වාමීනි," කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ (වචනය) පිළිගෙන සඟළ සිවුර සතර පොටක් කොට පණවාලීය, භාග්‍යවතුන් වහන්සේ පණවනලද ආසනයෙහි වැඩහුන්සේක, වැඩ හිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා වදාළසේකැ:- "මෙහි එව, අනඳ තෝ මට පැන් ගෙන එව. අනඳ පිපාස ඇත්තේවෙමි. පානය කරන්නෙමි, මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන්

වහන්සේට මේ කරුණ කීයේය. (ii) "දැන් ස්වාමීනි; පන්සියයක් පමණ ගැල්ඉක්ම ගියාහුය, රිය රෝදවලින් කැඩීගිය ඒ දිය කඩිත්ත මඩින ලද්දක්සේ කැලැත්ව බොරව ගලාබස්නේය.

"ස්වාමීනි, නුදුරෙහි (තිබෙන) මේ කුකුත්ථානදී තොමෝ තුනීවූ ප්‍රසන්න ජලය ඇත්තීය, මිහිරි ජලය ඇත්තීය, සිහිල්දිය ඇත්තීය, (බොරනොවූ) සුදුදිය ඇත්තීය, මනාකොට ඇත්තීය, සිත්කලුවූවාය. අර කුකුත්ථානදියෙහි භාග්‍යවතුන් වහන්සේ පැන් පානය කරනසේක්වා, සිරුර අවයවයන් සිසිල් කරනසේක්වා"යි (කීය)

**10.** දෙවැනිවද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා වදාළසේක "මෙහි එන්න, අනඳ, තෝ මට පැන්ගෙන එව, අනඳ පිපාසාව ඇත්තේවෙමි, පානය කරන්නෙමි"යි (වදාළසේක) දෙවැනිවද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භගවතුන් වහන්සේට මේකරුණ සැළකෙළේය. (මෙහි 9 (ii) යෙදිය යුතුයි.) (කීය)

**11.** තුන්වැනිවද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් කැඳවා වදාළසේක. "මෙහි එන්න, අනඳ, තෝ මට පැන්ගෙන එව, අනඳ, පිපාස ඇත්තේවෙමි, පැන් පානය කරන්නෙමි"යි (වදාළසේක.) " එසේය ස්වාමීනි" කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන්දී පාත්‍රයගෙන ඕ නදීතොමෝ යම් තැනෙකද, එහි ගියේය, එකල්හි කරත්තරෝදවලින් සුන්වූ කැලැත්ව බොරව ගලාබස්නාවූ ඕ කුඩා නදීතොමෝ ආයුෂ්මත් අනඳ තෙරුන් එළඹෙත්ම නිර්මලවූවා විශෙෂයෙන් ප්‍රසන්නවූවා බොරනොවූවා ගලායයි, ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරුන්ට මෙබඳු අදහසෙක්වීය, "පින්වත්නි, එකාන්තයෙන් තථාගතයන් වහන්සේගේ මහර්ධි ඇති බව ආශ්චර්යය, පින්වත්නි එකාන්තයෙන් තථාගතයන් වහන්සේගේ මහානුභාවය ඇතිබව අද්භූතය, කරත්තරෝදවලින් කැඩුනාවූ කැලැත්ව බොරව ගලාබස්නාවූ ඕ මෝ කුඩා නදීතොමෝ මා එළඹෙත්ම නිර්මලවූවා විශෙෂයෙන් ප්‍රසන්නවූවා නො කැළැත්වූවා ගලාබස්නීයයි, පාත්‍රයෙන් පැන්ගෙන

භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය. "ස්වාමීනි, තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇතිබව මහත් අනුභාවය ඇතිබව ආශ්චර්යය, ස්වාමීනි! අද්භූතය, ස්වාමීනි රියසක්වලින් සුන්වූ කැලැත්ව බොරව ගලාබස්නාවූ ඕ මෝ කුඩා නදීතොමෝ මා එළඹෙනවිට නිර්මලවූවා විශෙෂයෙන් ප්‍රසන්නවූවා ගලායන්නීය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පැන්පානය කරනසේක්වා, සුගතයන් වහන්සේ පැන් පානය කරනසේක්වායි" (කීය.) එකල්හි භාග්‍යවතුන් වහන්සේ පැන් පානය කළසේක.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහබික් සඟන සමග කුකුත්ථානදී තොමෝ යම් තැනෙකද, එහි වැඩිසේක, වැඩ කුකුත්ථානදියට බැස ස්නානයද කොට පැන් පානයද කොට ගොඩනැගී අඹවනය යම්තැනෙකද, එහි වැඩිසේක, වැඩ ආයුෂ්මත් චුන්ද තෙරුන් කැඳවා වදාළසේක, 'චුන්ද මෙහි එන්න, තෝ මාගේ සඟළ සිවුර සතර පොටක් කොට පණවාලව, චුන්දය, වෙහෙසුනේවෙමි, හොවින්නෙමි"යි (වදාළසේක) "එසේය ස්වාමීනි," කියා ආයුෂ්මත් චුන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචනදී දෙපොට සිවුර සතර පොටක් කොට පණවාලීය.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිහි නුවණ ඇතිව දකුණුපයෙහි වම්පය ඉක්මවා තබා නැගී සිටිමි යන සංඥාව සිතෙහි කොට දකුණැලයෙන් සිංහශෙය්‍යාව කළසේක. ආයුෂ්මත් චුන්ද ස්ථවිරතෙම එතැනම භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි හුන්නේය.

14. (දෙවියන්) සහිත මේ ලොකයෙහි තමහට සම පුද්ගලයකු නැත්තාවූ දෙවිමිනිසුන්ට අනුශාසනය කරන්නාවූ චතුස්සත්‍යාවබොධය කළාවූ තථාගතයන් වහන්සේ අතිශයින් ක්ලාන්ත ස්වභාව ඇතිසේක් නිර්මල ජලය ඇත්තාවූ මිහිරි ජලය ඇත්තාවූ විශෙෂයෙන් පහන්වූ කුකුත්ථානම් නදිය කරා වැඩ (ඒ නදියට) බැස්සසේක.

**15.** (භික්ෂු සංඝයා විසින්) පිරිවරන ලද්දාවූ ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා මැද නැමද කොට පැන්ද පානය කොට ගොඩනැංගසේක, මේ ශාසනයෙහි ශීලාදි ශාසනධර්මයන් හෝ සුවාසුදහසක් ධර්මස්කන්ධයන් දෙශනා කළාවූ සත්වයන්ට අනුශාසනය කරන්නාවූ මහත් ශීලස්කන්ධාදිය සොයන්නාවූ භාග්‍යවතුන් වහන්සේ අඹවනය වෙත පැමිණිසේක.

**16.** චුන්ද නම් භික්ෂුව අමතා වදාළසේක. මාගේ (සඟළ) සිවුර සතර පොටක් කොට පණවාලව, හොවින්නෙමි, වඩනලද සිත් ඇති තථාගතයන් වහන්සේ විසින් මෙහෙයන ලද්දාවූ ඒ චුන්ද ස්ථවිරතෙම වහාම (සඟළ සිවුර) සතර පොටක් කොට පණවාලීය, ශාස්තෘන් වහන්සේ අතිශයින් වෙහෙසුණු ස්වභාව ඇතිසේක් වැදහොත්සේක. චුන්ද ස්ථවිර තෙමේද එහි ඉදිරියෙහි හුන්නේයි.

**17.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් අමතා වදාළසේක. "ආනන්දය, චුන්දනම් ස්වර්ණකාර පුත්‍රයාට කිසිවෙක් පසුතැවීම උපදවන්නේද, 'තථාගතයන් වහන්සේ යම්බඳු තොපගේ අවසාන පිණ්ඩපාතය වළඳා පිරිනිවිසේක්ද, ඇවත, චුන්දයෙනි, ඒ තොපට අලාභයෝ වෙති, ඇවත, චුන්දයෙනි, ඒ තොපට (මිනිසත්බැව) අයහපත් ලැබීමෙක් වී යයි' වන්නේමය.

**18.** "ආනන්දය, චුන්දනම් කර්මාර පුත්‍රයාගේ පසුතැවිල්ල මෙසේ දුරුකළ යුත්තේය. 'ඇවත, චුන්දයෙනි, යම්බඳු තොපගේ කෙළවරවූ පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ පිරිනිවිසේක්ද, ඇවත, චුන්දයෙනි, ඒ තොපට ලාභයෝවූහ. ඒ තොපට මනා මිනිසත්බව ලැබීමවීයයි කියායි. 'ඇවත, චුන්දයෙනි, මේ (මතුකියන) කරුණ භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙන් අසන ලද්දේය. සම්මුඛයෙහි පිළිගන්නා ලද්දේය. මේ පිණ්ඩපාත දෙක සමානවූවාහුවෙත්, සමඵල ඇත්තාහුවෙත්, සමවූවාහු සමාන විපාක ඇත්තාහුවෙත්, අන්‍ය පිණ්ඩපාතයනට වඩා ඉතාම අතිශයින් මහත් ඵලවූවාහුදවෙත්, අතිශයින් මහත් ආනිසංස ඇත්තාහුද වෙත්.

**19.** 'කවර දෙකක්දයත්, තථාගතයන් වහන්සේ යම් පිණ්ඩපාතයකුත් වළඳා නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක්ද, තථාගතයන් වහන්සේ යම් පිණ්ඩපාතයකුත් වළඳා පඤ්චස්කන්ධයන්ගේ ශෙෂය නැත්තාවූ නිර්වාන ධාතුවෙන් පිරිනිවන්පානසේක්ද, මේ දෙපිණ්ඩපාතයෝ සමානවෙත්, සමඵලය ඇත්තාහුවෙත්, සමානවූවාහු සමවිපාක ඇත්තාහුවෙත්, ඉතාම අන් පිණ්ඩපාතයනට වඩා අතිශයින් මහාවිපාක ඇත්තාහුවෙත්, අතිශයින් මහානිසංස ඇත්තාහු වෙත්.

**20.** "ස්වර්ණකාරයාගේ පුත්‍රවූ ආයුෂ්මත් චුන්දයා විසින් (දීර්ඝා) යුෂ ලැබීම පිණිස පවත්නාවූ (කුශල) කර්මයක් රැස් කරන ලද්දේය, ස්වර්ණකාරයාගේ පුත්‍රවූ ආයුෂ්මත් චුන්දයා විසින් වර්ණය ලැබීම පිණිස පවත්නාවූ (කුශල කර්මයක් රැස්කරන ලද්දේය, කර්මාර පුත්‍රවූ ආයුෂ්මත් චුන්දයා විසින් සැපලැබීම පිණිස පවත්නාවූ (කුශල) කර්මයක් රැස්කරන ලද්දේය, ස්වර්ණකාර පුත්‍රවූ ආයුෂ්මත් චුන්දයා විසින් පිරිවර ලැබීම පිණිස පවත්නාවූ (කුශල) කර්මයක් රැස්කරන ලද්දේය, රන්කරුගේ පිත් ආයුෂ්මත් චුන්දයා විසින් ස්වර්ගයෙහි ඉපදීම පිණිස පවත්නාවූ (කුශල) කර්මයක් රැස්කරන ලද්දේය, ස්වර්ණකාරයාගේ පුත්‍රවූ ආයුෂ්මත් චුන්දයා විසින් අධිපති (ශ්‍රෙෂ්ඨ) පිණිස පවත්නාවූ (කුශල) කර්මයක් රැස්කරන ලද්දේයයි' ආනන්දය, කර්මාර පුත්‍රවූ චුන්දගේ පසුතැවිල්ල මෙසේ දුරුකළ යුත්තේයයි" වදාළසේක.

**21.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය පහළ කරන මේ ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළසේක.

> **22.** "දන්දෙන්නාහට පින වැඩෙයි. ශීලසංයමයෙන් සංවරවූවාහට වෛරය නොපවතී. දක්ෂ පුද්ගලතෙම වනාහි ලාමකවූ අකුශලය පහකෙරෙයි. ක්ලේශ පරිනිර්වානය හෙතුවෙන් (ඉන්පසු) ස්කන්ධ පරිනිර්වානයෙන් පිරිනිවියේ වේයයි."

**76. පාටලිගාමිය සූත්‍රයː-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මගධරට සැරිසරන සේක්

පළොල්ගම යම්තැනෙක්හිද, එගමට වැඩිසේක. පළොල්ගම්වැසි උපාසකයෝ "භාග්‍යවතුන් වහන්සේ පළොල් ගමට වැඩිසේක්ය"යි ඇසුවාහුමය. ඉක්බිති පළොල් ගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියාහුය, පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්හ. එක්පැත්තක හුන්නාවූම පළොල්ගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීහ. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපගේ ආවසථාගාරය (අමුත්තන්ගේ වාසය පිණිස කළ ගෙය) ඉවසා වදාරණ සේක්වායි, භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දයෙන් ඉවසා වදාළසේක.

2. ඉක්බිති පළොල් ගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැක හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට ආවසථාගාරය යම්තැනෙකද එහි පැමිණියාහුය. පැමිණ ආවසථාගාරයෙහි ඇතිරිය යුතු සියළු තැන් අතුරා අසුන් පණවා කදාමිණියෙන් කළ මහ දිය සැල් තබ්බවා පහන් දල්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක සිටියාහුය. එක්පැත්තක සිටියාවූම පළොල්ගැමි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ.

3. "ස්වාමීනි, ආවසථාගාරය ඇතිරියයුතු හැමතැන (කළාල) අතුරා අසුන් පණවන ලද්දාහුය, දියසැළවල් තබන ලද්දාහ, තෙල් පහන් දල්වන ලද්දේය ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යමකට කල්දන්නාසේක්ද දැන් එයට කල්වන්නේ යයි" කීහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ හැඳපොරවා පාත්‍ර සිවුරු රැගෙන භික්ෂුසංඝයා සමග ආවසථාගාරය යම් තැනෙකද එහි වැඩිසේක. වැඩ පා සෝදා ආවසථාගාරයට ඇතුල්වී පෙරදිගට මුහුණලා වැඩහුන්සේක. භික්ෂු සංඝ තෙමේද පා දෝවා ආවසථාගාරයට වැද පෙරදිගට මුහුණලා භාග්‍යවතුන් වහන්සේම පිරිවරා වැඩහුන්නේය. පළොල් ගම් වැසි උපාසකයෝද පා සෝදා ආවසථාගාරයට වැද නැගෙනහිර බිත්තිය නිසා භාග්‍යවතුන් වහන්සේම පිරිවරා බස්නාහිර බලා හුන්හ.

**4.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පළොල් ගම් වැසි උපාසකයන් ඇමතූසේක.

"ගෘහපතියෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි මේ පස්දොෂයෝ වෙත්ඃ කවර පසක්දයත්? ගෘහපතියෙනි, මේ ලෝකයෙහි බිඳුණු සංවර ඇති දුශ්ශීලතෙම ප්‍රමාද කාරණයෙන් මහත් සම්පත්හුගේ පිරිහීමට පැමිණෙයි, දුශ්ශීලයාගේ ශීලවිපත්තිය හේතුකොට (වන්නාවූ) මේ පළමුවන දෝෂයවේ. තවද ගෘහපතියෙනි, ශීලය විනාශවූ දුසිල් පුගුලාගේ ලාමක කීර්ති ශබ්දය පැනනගී, සිල් නැත්තහුගේ ශීල විනාශය හෙතුකොට (වන්නාවූ) මේ දෙවන ආදීනවය වේ. තවද ගෘහපතියනි, ශීල සංවරය නැත්තාවූ දුශ්ශීලතෙම රජ පිරිසකට හෝ බමුණු පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ මහණ පිරිසකට හෝ යම් යම් පිරිසකට පැමිණේද, භය ඇත්තෙක්වම පැමිණෙයි. දුශ්ශීලයාගේ ශීල විපත්තිය හේතුකොට (වන්නාවූ) මේ තුන්වන දොෂය වෙයි, තවද ගෘහපතියෙනි, ශීලය වැනසුණු දුශ්ශීලතෙම අතිශයින් මුළාවූයේ කලුරිය කෙරෙයි, බුන් සිල් ඇති දුශ්ශීලයාගේ ශීල විනාශ හේතුවෙන් මේ සතරවන දොෂය වේ. තවද ගෘහපතියෙනි, සිල් බිඳුණු දුශ්ශීලතෙම ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි පිනෙන් හෝ සැපයෙන් තොරවූ දුකට පිළිසරණවූ දුෂ්ටවූ කර්මයෙන් උපදින ගතියවූ වැටෙන්නාවූ හෝ වැනසෙන්නාවූ සැනසීමෙක් නැත්තාවූ නරකයෙහි උපදනේය. ශීලය විනාශවූ දුශ්ශීලයාගේ ශීල විපත්තිය හේතුකොට මේ පස්වන දොෂය වෙයි. ගෘහපතියෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තිය හේතුකොට මේ පස් ආදීනවයෝ වෙත්.

**5.** "ගෘහපතියෙනි, සිල්වත්හුගේ ශීලසම්පත්තිය හේතුකොට මේ පස් අනුසස් කෙනෙක් වෙති. ඒ කවර පසෙක්ද යත්? ගෘහපතියෙනි, මේ ලොකයෙහි පිරිසිදුවූද, සම්පූර්ණවූද සිහියෙන් යුත් සිල් ඇති පුද්ගලතෙම අප්‍රමාදය (එළඹ සිටි සිහිය) හේතුකොට මහත් භොගරාශියට පැමිණෙයි, සිල්වත්හුගේ ශීලසම්පත්තිය හේතුකොට මේ පළමුවන අනුසස වන්නේය. තවද ගෘහපතියෙනි, පිරිසිදුවූද සම්පූර්ණවූද, ශීලයෙන් යුත්

සිල්වතාගේ යහපත් කීර්ති ඝොෂය පැනනගී. සිල්වතාගේ ශීල සම්පත්තිය හේතුකොට මේ දෙවන අනුසස වන්නේය, තවද ගෘහපතියෙනි, පිරිසිදුවූද, සම්පූර්ණවූද ශීලයෙන් යුත් සිල්වත්තෙම ක්ෂත්‍රියයන්ගේ පිරිසකට වේවයි බමුණන්ගේ පිරිසකට වේවයි, ගෘහපතියන්ගේ පිරිසකට වේවයි, ශ්‍රමණයන්ගේ පිරිසකට වේවයි, යම් යම් පිරිසක් කරා පැමිණේද, නිර්භයව පැමිණේ. සිල්වතාගේ ශීලසම්පත්තිය හේතුකොට මේ තුන්වන අනුසස වන්නේය. තවද ගෘහපතියෙනි, පිරිසිදුවූද, සම්පූර්ණවූද, ශීලයෙන් යුත් සිල්වත්තෙම සිහිමුළානොවූයේ කලුරිය කෙරෙයි. සිල්වතාගේ ශීල සම්පත්තිය හේතුකොට මේ සිව්වන අනුසස වන්නේය. තවද ගෘහපතියෙනි, පිරිසිදුවූද සම්පූර්ණවූද ශීලයෙන් යුත් සිල්වත් තෙම කයබිඳී මරණින් මත්තෙහි සොඳුරු ගති ඇත්තාවූ අග්‍රවූ දිව්‍යලොකයට පැමිණෙයි, සිල්වතාගේ ශීලසම්පත්තිය හෙතුකොට මේ පස්වන අනුසස වන්නේය. ගෘහපතියෙනි, සිල් ඇත්තහුගේ ශීලසම්පත්තිය හේතුකොට (වන්නාවූ) මේ පස් අනුසස් වෙත් යයි" (වදාළසේක.)

**6.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පාටළිග්‍රාමවාසී උපාසකයනට රෑ බොහෝ වේලාවක් දැහැමි කතාවෙන් මනාව සිතට ගන්වා උත්සාහ උපදවමින් සිත්සතන් පිරිසිදු කරවා සියලු අයුරෙන් සිත් සතුටුකරවා යැවූසේක "ගෘහපතියෙනි, රාත්‍රිතොමෝ ඉක්ම ගියාය. යම්ගමනකට තෙපි කල් දන්නහුනම් දැන් ඊට කල්වන්නේයයි" (වදාළසේක.) "එසේය ස්වාමීනි" කියා පළොල් ගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වන්සේගේ වචනය ගිවිස හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පළොල් ගම්වැසි උපාසකයන් බැහැරගිය නොබෝ කලෙක්හි ශුන්‍යාගාරයට (ජනයන්ගෙන් හිස්වූ ගෙට) වැඩිසේක.

**7.** එකල්හි වනාහි (ඓශ්වර්ය මදයෙන්) මත්වූ මගධරට හෝ මගධ රජහුගේ මහඇමතිවූ සුනිධය වස්සකාරය යන නම් ඇත්තාවූ දෙබමුණු මහ ඇමැත්තෝ වජ්ජීන් වළක්වනු පිණිස පළොල්ගමෙහි නුවරක් මවත්.

එකල්හි වනාහි බොහෝ දෙවතාවෝ පාටලිග්‍රාමයෙහි (එක එක ගෙය වශයෙන්) දහසක් දහසක්කොට ගෘහ වස්තූන් පිරිවරා ගනිති. යම් පෙදෙසෙක්හි මහේශාක්‍ය දෙවතාවෝ ගෘහවස්තූන් පිරිවරා ගණිත්ද, ඒ ප්‍රදෙශයෙහි රජුන්ටද, රජමහ ඇමැත්තන්ටද ගෙවල් තනන්නට (වාස්තු විද්‍යා පාඨකයන්ගේ) සිත් නැමෙති, යම් ප්‍රදෙශයෙක්හි මධ්‍යම දෙවතාවෝ ගෘහවස්තූන් (ගෙබිම්) පිරිවරා ගණිද්ද, ඒ පෙදෙසෙහි මධ්‍යම රජුටද, රජමහ ඇමතියන්ටද ගෙවල් තනන්නට (වස්තුවිද්‍යාඥයන්ගේ) සිත් නැමෙත්, යම් ප්‍රදෙශයෙක්හි නීච දෙවතාවෝ ගෙබිම් පරීක්ෂාකොට ගණිද්ද, ඒ පෙදෙසෙහි හීනවූ රජුන්ටද රජමහ ඇමතියන්ටද ගෙවල් තනන්නට (භූමිශාස්ත්‍රඥයන්ගේ) සිත් නැමෙත්.

8. භාග්‍යවතුන් වහන්සේ "යම් ප්‍රදේශයෙක මහානුභාව සම්පන්න දෙවතාවෝ ගෙබිම් පිරිවරා ගණිත්ද, ඒ පෙදෙසෙහි මහේශාක්‍ය රජුන්ටද, රජමහ ඇමතියන්ටද ගෘහයන් නිර්මාණය කරන්නට සිත් නැමෙත්ය. යම් ප්‍රදෙශයෙක්හි මධ්‍යම දෙවතාවෝ ගෙබිම් පිරිවරා ගණිත්ද, ඒ ප්‍රදෙශයෙහි මධ්‍යම රජුන්ටද රජ මහ ඇමැත්තන්ටද ගෙවල් තනන්නට (වාස්තුවිද්‍යා පාඨකයන් ගේ) සිත් නැමෙත්ය. යම් පෙදෙසෙක හීනදේවතාවෝ ගෙබිම් පිරිවරා ගණිද්ද, ඒ පෙදෙසෙහි හීනවූ රජුන්ටද, රජමහ ඇමැත්තන්ටද ගෙවල් තනන්නට (වාස්තුවිද්‍යාඥයන්ගේ) සිත් නැමෙත්යයි පළොල්ගමෙහි දහස දහස ගෘහවස්තූන් පිරිවරා ගන්නාවූ දෙවතාවන් මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ පිරිසිදු දිවැසින් දුටුසේක්මය.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැයේ අලුයම් වේලෙහි නැගීසිට ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට ආමන්ත්‍රණය කළසේක.

"ආනන්දය, කවර කෙනෙක් පළොල්ගමෙහි නුවරක් ඉදිකෙරෙද්ද?" - "ස්වාමීනි, මගධ මහාමාත්‍යවූ සුනීධය වස්සකාරය යන නම් ඇත්තාවූ දෙබමුණෝ ලිච්ඡවි රජුන් මැඩලීම පිණිස පළොල්ගමෙහි නුවරක් ඉදිකෙරෙති"යි (කීයේය.)

**10.** "ආනන්දය, යම්සේ වනාහි තව්තිසා වැසි දෙවියන් සමග මන්ත්‍රණයකොට (ඉදිකෙරෙද්ද) එපරිද්දෙන්ම ආනන්දය, සුනීධය, වස්සකාරයයි ප්‍රසිද්ධවූ මගධ මහාමාත්‍යයෝ පළොල්ගමෙහි ලිච්ඡවි රජුන්ගේ නුවර ඉදිකෙරෙති.

"ආනන්දය, මෙහි මම මිනිස් ඇස ඉක්ම පැවැති පිරිසිදු දිවැසින් යම් ප්‍රදෙශයෙක්හි මහෙශාක්‍ය දෙවතාවෝ ගෙබිම් පිරිවරාගණිත්ද ඒ පෙදෙසෙහි මහෙශාක්‍ය රජුන්ටද, රජමහ ඇමැත්තන්ටද ගෙවල් ඉදිකරන්නට සිත් නැමෙත්ය. යම් පෙදෙසෙක මධ්‍යම දෙවතාවෝ ගෘහවස්තූන් පිරිවරා ගණිත්ද, ඒ පෙදෙසෙහි මධ්‍යම රජුන්ටද රජමහ ඇමැත්තන්ටද ගෙවල් ඉදිකරන්නට සිත් නැමෙත්ය. යම් පෙදෙසෙක්හි හීන දෙවතාවෝ ගෙබිම් පිරිවරාගණිත්ද, ඒ පෙදෙසෙහි හීනවූ රජුන්ටද රජමහ ඇමැත්තන්ටද ගෙවල් ඉදිකරන්නට සිත් නැමෙත්යයි පළොල් ගමෙහි (එක එක වර්ගයෙහි) දහස දහස ගෘහවස්තූන් පිරිවරා ගත්තාවූ බොහෝ දේවතාවන් දිටිමි.

**11.** "ආනන්දය, යම් පමණ ආර්ය මනුෂ්‍යයන්ගේ රැස්වන තැනෙක් නම් ඇද්ද, යම් පමණ වෙළෙඳුන් ගෙන එන ලද බඩු රාසි වශයෙන් මිළයට ගන්නාවූද මිළදී ගන්නා වූද, තැනෙක් නම් වේද, (නොහොත්) වෙළඳුන්ගේ වාසස්ථානයෙක් වේද, මෙය බඩු පොදි ලිහන ස්ථානය වූ පාටලීපුත්‍ර නම් අගනුවර වන්නේය. ආනන්ද මේ පැළලුප් නුවරට වනාහි ගින්නෙන්ද, වතුරෙන්ද ඔවුනොවුන් බිඳීමෙන්දැයි ත්‍රිවිධ අන්තරායෝ වන්නාහුයයි" (වදාළසේක.)

**12.** ඉක්බිති සුනීධය, වස්සකාරය යන නම් ඇත්තාවූ මගධ මහ ඇමැත්තෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එක් පැත්තක සිටියාහුය. එක්පැත්තක සිටියාවූම මගධ මහා අමාත්‍ය වූ සුනීධය, වස්සකාරය යන දෙබමුණෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

"භවත් ගෞතමයන් වහන්සේ අද දවස පිණිස අපගේ බත භික්ෂු සංඝයා සමග ඉවසන සේක්වායි' භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදාළසේක.

13. ඉක්බිති සුනීධය වස්සකාරයයි ප්‍රසිද්ධවූ මගධ මහ ඇමැත්තෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන ස්වකීය වාසස්ථානය යම් තැනෙකද, එහි පැමිණියාහුය. පැමිණ ස්වකීය වාසස්ථානයෙහි ප්‍රණීතවූ කෑ යුතු දේද, අනුභව කටයුතු දේද, පිළියෙළකරවා භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, බත නිමියේය, (දැන්) කල් වන්නේ" යයි කල් දන්වා යැවීය.

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි අඳනය හැඳ කාබාණ බැඳ පාත්‍ර සිවුරු රැගෙන භික්ෂුසංඝයා සමග මගධ මහාමාත්‍යවූ සුනීධ වස්සකාරයන්ගේ ගෘහය යම් තැනෙකද එහි වැඩිසේක. වැඩ පණවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. එකල්හි වනාහි මගධ මහ ඇමතිවූ සුනීධ වස්සකාර දෙබමුණෝ බුදුපාමොක් බික්සඟන ප්‍රණීතවූ කැවිල්ලෙන්ද, බොජුනෙන්ද සිය අතින් සතප්වා මනාව පැවරවූහ. එකල්හි වනාහි මගධ මහ ඇමතිවූ සුනීධ වස්සකාර යන දෙබමුණෝ දන්වැළඳූ පාත්‍රයෙන් ඉවත්කරන ලද අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත එක් මිටි ආසනයක් ගෙන එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ මගධ මහ ඇමතිවූ සුනීධ වස්සකාර නම් දෙ බමුණන්ට මේ ගාථාවලින් අනුමෙවෙනි දහම් වදාළසේක.

15. "යම් ප්‍රදෙශයෙක්හි පණ්ඩිත ජාති ඇත්තෝ වාසය කෙරේද, ඒ තමාගේ වාසස්ථානයෙහි සංවරවූ බඹසර හැසිරෙන්නාවූ සිල්වතුන් වළඳවා

"එහි යම් දෙවතාකෙනෙක් වූවාහුද, ඒ ගෘහාධිගෘහිත දෙවතාවන්හට පින් දෙන්නේය. පුදන ලද්දාවූ ඒ දෙවතාවෝ පුදත් බුහුමන් කරන ලද්දාවූ ඒ දෙවතාවෝ ඔහු (උපන් උවදුරු දුරලීමෙන්) පාලනය කෙරෙත්.

"එහෙයින් ඒ (පණ්ඩිත ස්වභාව ඇති) පුරුෂයාට ලෙහි වඩා පොෂණය කරන ලද පුත්‍රයාට මවක සේ අනුකම්පා කරත්. දෙවියන් විසින් අනුකම්පා කරණ ලද, පුරුෂතෙමේ සදහටම හොඳ කරුණු දකීයයි" (වදාළසේක.)

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මගධ මහ ඇමතිවූ සුනීධ වස්සකාර නම් වූ දෙබමුණන්ට මේ ගාථාවලින් අනුමෙවෙනි බණ වදාරා හුනස්නෙන් නැගිට වැඩිසේක.

**16.** එසමයෙහි වනාහි සුනීධය වස්සකාරය යන නම් ඇත්තාවූ මගධ මහ ඇමතියෝ පිටිපසින් පිටිපසින් භාග්‍යවතුන් වහන්සේ ලුහුබැන්දාහු වෙත්. "අද මහණ ගෞතමයන් වහන්සේ යම් දොරකින් නික්මෙනසේක්ද, ඒ ගෞතමද්වාර නම් වන්නේය. යම් තොටකින් ගංගා නදිය තරණය කරණ සේක්ද, ඒ ගොයුම්තොට නම් වන්නේය" යන (අදහසින්ය.)

**17.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ යම් දොරකින් නික්මුණුසේක්ද, ඒ ගෞතමද්වාර නම් වීය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ගංගා නදීතොමෝ යම් දිශාවෙක්හිද, එහි පැමිණිසේක. එකල්හි වනාහි ගංගානදී තොමෝ පිරුණිවෙයි. (ඉවුර) සමව දියෙන් ගැවසීගත්තීවෙයි. ඉවුරෙහි සිටි කවුඩන් විසින් පිවහැකි ජලය ඇත්තීවෙයි. සමහර මිනිස්සු නැව් සොයති. සමහරු පසුරු සොයති සමහරු ඔබමොබ යනු කැමැත්තාහු කරනලදී.

**18.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ශක්තිමත් පුරුෂයෙක් වකුටුකළ අතක් දිගුකරන්නේ යම්සේද, දික්කළ අතක් හෝ හකුලන්නේ යම්සේද, එපරිද්දෙන්ම ගංගා නදියගේ මෙතෙරදී නොපෙණී වැඩිසේක් එතෙර භික්ෂුසංඝයා සමග නැගීසිටිසේක. භාග්‍යවතුන් වහන්සේ ඔබමොබ යනු කැමති ඒ මිනිසුන් සමහරුන් නැව් සොයන්නවුන්ද සමහරුන් පසුරු සොයන්නවුන්ද දුටු සේක්මය.

**19.** එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලාවෙහි ඒ අරුත් පැවසෙන මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්වල්පමාත්‍ර ජලය තරණය කරනු කැමති ඒ ජනයා පසුරු බඳී. යම් කෙනෙක් (ගැඹුරු පළලවූ සසර නමැති) මහ නදිය හා (තෘෂ්ණා නමැති) මහ නදියද තරණය කරද්ද, ඔහු (ආර්යමාර්ග) නමැති හෙයකොට දිය පිරුණු වළ තැන් (මඩ) නොතැවරී දුරුකොට තරණය කරත්. ආර්යමාර්ගඥානයෙන් යුත් පණ්ඩිත බුදුවරයෝද බුද්ධශ්‍රාවකයෝද තරණය කළාහුය."

**77. විධාපථ (නාගසමාල) සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට දීර්ඝ මාර්ගයට පසුව යන මහණකු වූ ආයුෂ්මත් නාගසමාල තෙරුන් සමග පිළිපන්සේක. ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම අතරමග දෙමං සන්ධියක් දුටුයේමය. දැක භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ මගය, මේමගින් යම්හ"යි මේ වචනය කීයේය. මෙසේ කීකල්හි ආයුෂ්මත් නාගසමාල තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ "නාගසමාලයෙනි, මේ (යායුතු මාර්ගය වෙයි. මේ මාර්ගයෙන් යමු"යි මේ වචනය වදාළසේක.

2. දෙවනුවද ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම භාග්‍යවතන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ යායුතු මාර්ගය වෙයි. මේ මාර්ගයෙන් යමු"යි මේ වචනය කීයේය. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගසමාල තෙරුන්ට "නාගසමාලයෙනි, මේ (යායුතු) මාර්ගය වෙයි. මේ මගින් යම්හ"යි මේ වචනය වදාළසේක.

3. තුන්වැනිවත් ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ (යායුතු) මාර්ගය වෙයි. මේ මාර්ගයෙන් යමු"යි මේ වචනය වදාළසේක.

ඉක්බිති ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, (නුඹවහන්සේගේ) පාත්‍ර සිවුරු මෙහි යයි" භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍ර සිව්රු බිම තබා ගියේය.

4. එකල්හි වනාහි ඒ මගින් යන්නාවූ ආයුෂ්මත් නාගසමාල ස්ථවිරයන් වහන්සේට අතරමග සොරු නික්ම අවුත් (බිම හෙලා) අතින්ද, පයින්ද ගැසූ පාත්‍රයද බින්දාහුය. සඟල සිවුරද ඉරූහ. ඉක්බිති ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම බිඳුනු පාත්‍රයෙන්ද, කැබලිකොට ඉරනලද සඟළ සිවුරෙන්ද, භාග්‍යවතුන් වහන්සේ යම් (දිශාවෙක්හි වැඩිසේක්ද,) එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූම ආයුෂ්මත් නාගසමාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

"ස්වාමීනි, ඒ මාර්ගයෙන් යන්නාවූ මට අතරමගදී සොරු නික්ම අවුත් අතින්ද, පයින්ද ගැසූහ. පාත්‍රයද බින්දාහුය. සඟළ සිවුරද (කැබලිකොට) ඉරාදැම්මාහුය."

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි ඒ කරුණ පහළවන මේ උදන් පහළකෙළේය.

"වෙදයයි කියනලද චතුස්සත්‍ය ධර්මය ආර්ය මාර්ග ඥානයෙන් අවබොධ කළාවූ පරතෙරට ගියාවූ පණ්ඩිත වූ සර්වඥයන් වහන්සේ (තමහට වැඩ) නොදත් මූඪජනයා සමග හැසිරෙනසේක්, එකතැන වසනසේක් මිශ්‍රවූසේක් කිරි පමණක්ම බොන්නවූ කොස්ලිහිණිතෙම පාත් බිම කරා ගලා යන්නාවූ දිය සේ (දුක් එළවන) ලාමක දෙය දුරුකරණසේකැ"යි

78. **විශාඛා සූත්‍රය**:- 1. මා විසින් මෙසේ අසනලදී එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි පූර්වාරාම නම්වූ විශාඛා උපාසිකාව විසින් කරවන ලද ප්‍රාසාදයෙහි වැඩ වසන සේක.

2. එකල්හි වනාහි මිගාර මාතෘවූ විශාඛා උපාසිකාවගේ ප්‍රියවූ මනවඩන්නාවූ මිනිපිරී තොමෝ කලුරිය කළා වෙයි. එකල්හි වනාහි මිගාර මාතෘවූ විශාඛා උපාසිකා තොමෝ (ආදාහනය කරවා ස්නානය කොට) තෙත සළු ඇත්තී තෙත්වූ ඉස කෙස් ඇත්තී දවල් ඉරමුදුන් වේලෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියාය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට

වැඳ එකත් පසෙක හුන්නාය. එකත්පසෙක හුන්නාවූම මිගාර සිටුහුගේ මව් නම්වූ විසාකා උපාසිකාවට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

3. "එම්බා විශාඛාවෙනි, දවල් ඉරමුදුන් වේලෙහි මෙහි පැමිණෙන්නාවූ තී තෙත් වස්ත්‍ර ඇතිව තෙත් කෙස් ඇතිව කොහි සිට එන්නෙහිද?" "ස්වාමීනි, මාගේ ප්‍රියවූ මනාපවූ මිනිපිරී තොමෝ කලුරිය කළාය. එහෙයින් දවල් ඉරමුදුන් වේලෙහි තෙත් වස්ත්‍ර ඇත්තාවූ තෙත් කෙස් ඇත්තාවූ මම මෙහි පැමුණුනී වෙමි"යි (කීව) "විශාඛාවෙනි, සැවැත් නුවර යම් පමණ මනුෂ්‍යයෝ වෙද්ද, එපමණ දරුවන්ද මුනුබුරන්ද තෝ කමැති වන්නෙහි දැ"යි (ඇසූහ) "භාග්‍යවතුන් වහන්ස, මම සැවැත් නුවර යම් පමණ මනුෂ්‍යයෝ වෙද්ද, එපමණ පුතුන්ද මුණුපුරන්ද කැමැති වන්නෙමි"යි (කිව) "විශාඛාවෙනි, කොපමණ බොහෝ මිනිස්සු දවස් පතා සැවැත් නුවර කලුරිය කෙරෙත් දැ"යි (ඇසූහ) "ස්වාමීනි, සැවැත් නුවර දිනපතා මනුෂ්‍යයෝ දසදෙනෙක්ද කලුරිය කෙරෙති ස්වාමීනි, සැවැත් නුවර දවස් පතා මනුෂ්‍යයෝ නවදෙනෙක්ද කලුරිය කෙරෙති, "ස්වාමීනි, සැවැත් නුවර දිනපතා මිනිස්සු අට දෙනෙක්ද කලුරිය කෙරෙති, ස්වාමීනි සැවැත් නුවර දවස් පතා මිනිස්සු සත් දෙනෙක්ද කලුරිය කෙරෙති. ස්වාමීනි, සැවැත් නුවර දිනපතා මනුෂ්‍යයෝ සදෙනෙක්ද කලුරිය කෙරෙති, ස්වාමීනි, දිනපතා සැවැත් නුවර මනුෂ්‍යයෝ පස්දෙනෙක්ද කලුරිය කෙරෙති. ස්වාමීනි, සැවැත්නුවර දිනපතා මනුෂ්‍යයෝ සතර දෙනෙක්ද කලුරිය කෙරෙති. ස්වාමීනි සැවැත්නුවර දිනපතා මනුෂ්‍යයෝ තුන්දෙනෙක්ද කලුරිය කෙරෙති. ස්වාමීනි, සැවැත්නුවර දිනපතා මනුෂ්‍යයෝ දෙදෙනෙක්ද කලුරිය කෙරෙති. ස්වාමීනි සැවැත්නුවර දිනපතා එක් මිනිසෙක්ද කලුරිය කෙරෙයි. ස්වාමීනි, කලුරිය කරන මිනිසුන්ගෙන් සැවැත් නුවර හිස් නොවීයයි" (කිව.)

4. "විශාඛාවෙනි, ඒ කුමැයි සිතන්නෙහිද? කිම? තෝ කිසි කලෙකත් තෙත් නොවූ වස්ත්‍ර ඇත්තී හෝ තෙත් නොවූ කෙස් ඇත්තී හෝ වෙහිදැයි' (වදාළ සේක.) "විශාඛාවෙනි, යම්

කෙනෙකුන්ට වනාහි සියයක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුන්ට සියයක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට අනූවක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුන්ට අනූවක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට අසූවක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට අසූවක් දුක්වෙත්, යම් කෙනෙකුන්ට සැත්තෑවක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට සැත්තෑවක් දුක් වෙත්. යම් කෙනෙකුන්ට සැටක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට සැටක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට පණහක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට පණහක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට සතළිහක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට සතළිසක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට තිහක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට තිහක් දුක් වෙත්. යම් කෙනෙකුන්ට විස්සක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට විස්සක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට දසයක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට දහයක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට නවයක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට නවයක් දුක්වෙත්. යම් කෙනෙකුන්ට අටක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට අටක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට සතක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට හතක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට සයක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට සයක් දුක් වෙත්. යම් කෙනෙකුන්ට පහක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට පහක් දුක් වෙත්, යම් කෙනෙකුන්ට සතරක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට දුක් සතරක් වෙත්, යම් කෙනෙකුන්ට තුණක් ප්‍රිය වස්තූහු වෙද්ද, ඔවුනට දුක් තුණෙක් වෙත්. යම් කෙනෙකුන්ට ප්‍රිය වස්තූහු දෙකක් වෙද්ද, ඔවුන්ට දුක් දෙකෙක් වෙත්, යම් කෙනෙකුන්ට ප්‍රිය වස්තූ එකෙක් වේද, ඔවුනට එක් දුකෙක් වේ, යම් කෙනෙකුන්ට ප්‍රිය වස්තුවෙක් නැත්තේද, ඔවුනට දුකෙක් නැත, ඔහු ශෝක නැත්තාහුය, ඇලුම් නැත්තාහුය, දැඩි ආයාස නැත්තාහුයයි කියමියි” (වදාළ සේක)

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ (හැම අයුරෙන්) දැන ඒ වේලාවෙහි ඒ අර්ථය පහළ කරන මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක.

“සත්ව ලොකයෙහි යම් කිසි ශොකයෝ හෝ කිසි වැලපීම් හෝ කායික දුක්ඛයෝ හෝ නානාවිධවූ දුක් හෝ වෙද්ද, ඒ සියලු දුක් ප්‍රිය ස්වභාවය කරන්නාවූ ඡන්දරාගය ඇති

කල්හි ප්‍රිය ස්වභාවය ඇති දෙය නිසා උපදිත්, ප්‍රිය ස්වභාවය කරන ඡන්ද රාගය නැති කල්හි ප්‍රහීනවූ කල්හි මේ දුක් නො උපදිත්.”

“යම් ආර්ය කෙනෙකුන්ගේ ප්‍රියයෙක් නැද්ද, එහෙයින්ම ආර්යයෝ සුවපත් වූවාහු වෙත්, පහව ගිය ශොක ඇත්තාහු වෙත්, එහෙයින් ශොක නැති බවවූ නොඇලෙන බවවූ ශොකයගේ නොවීමට හෙතුවන බැවින් අශොක නම් වූ කෙලෙස් ධූලි නැති නිවන පතන්නේ ලොකයෙහි කිසි ප්‍රියවීමක් නොකරන්නේයි.”

**79. (ප්‍රථම) දබ්බ සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡෙදය යුතුයි.)

**2.** ඉක්බිති ආයුෂ්මත් මල්ලරාජ පුත්‍රවූ දබ්බ ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූම මල්ල රජුගේ පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට “සුගතයන් වහන්ස, දැන් මාගේ පිරිනිවන්පාන කාලයයි” යන මේ වචනය කීයේය. “දබ්බයෙනි, තෝ යම් ගමනකට කල් සිතන්නෙහිද, දැන් එයට කලැයි” (වදාළ සේක.)

**3.** ඉක්බිති මල්ල රාජ පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිර තෙම හුනස්නෙන් නැගීසිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට අහසට පැනනැගී ඉහළ අහසෙහි බද්ධපර්යංකයෙන් වැඩහිඳ තෙජොධාතු කසිණ චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැද පිරිනිවියේය.

**4.** ඉක්බිති අහසට නැගී ඉහළ අහසෙහි බද්ධපර්යංකයෙන් වැඩහිඳ තෙජොධාතු කසිණ සමාපත්තියට සමවැද ඉන් නැගිට පිරිනිවියාවූ මල්ල රජුගේ පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන්ගේ සිරුරට ගිනි ඇවුලුණු කල්හිද ගිනි නිවීගිය කල්හිද හලු නොපැමිණි නම් දැලි නොපැමිණිනම් යම්සේ වනාහි ගිනි ඇවිල ගත්තාවූද, ගිනි නිවුනාවූද, ගිතෙල් හෝ තල තෙල් හෝ

හලු නොපෙණේද, අඳුන් නොපෙණේද, එපරිද්දෙන්ම අහසට පැන නැගී ඉහළ අහසෙහි පලගින් වැඩහිඳ තෙජොධාතු කසිණ චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැද (ඉන්) නැගිට පිරිනිවියාවූ මල්ල රාජ පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ තෙරුන්ගේ ගිනි ඇවිලෙන්නාවූද ගිනිදැල් පහව ගියාවූද සිරුර පිළිබඳ හලු නොපෙණුනේය. දැලි නොපෙණුනේය.”

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දබ්බ තෙරුන් අනුපාදා පරිනිර්වානය සියලු අයුරෙන් දැන ඒ වේලාවෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

“රූපකයෙක් වීද, නිරුද්ධ වීය, සංඥාවෝ නිරුද්ධ වීය, වේදනාවෝ සිහිල් වූහ. සියලුම සංස්කාරයෝ විශෙෂයෙන්ම සංසිඳුනාහුය, සියලු විඤ්ඤාණය විනාසයට ගියේයයි.”

**80. (ද්විතීය) දබ්බ සූත්‍රයː-** 1. (මෙහි 1 වර්ගයේ 5 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි” කියා භික්ෂූන් අමතා වදාළ සේක. ඒ භික්ෂූහු “පින්වතුන් වහන්සැයි” භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ, භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**3.** “මහණෙනි, අහසට පැන නැගී අහසේ ඉහළ පළක් බැඳවැඩහිඳ තෙජොධාතු කසිණ චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැද ඉන් නැගිට පිරිනිවියාවූ මල්ල රජහුගේ පුත්‍රවූ ආයුෂ්මත් දබ්බයන්ගේ සිරුර ගිනි ඇවිලෙද්දීද ගිනි නිවෙද්දීද හලු නොමපෙණින, අඳුන් නොමපෙණින, යම්සේ වනාහි ගිතෙල් වේවයි තලතෙල් වේවයි ගිනි ඇවිලෙද්දීද ගිනි නිවෙද්දීද හලු නොමපෙණේද, අඳුන් නොමපෙණේද, මහණෙනි, එපරිද්දෙන්ම අහසට පැනනැග උස් අහසෙහි එරම්ණිය ගොතා වැඩහිඳ තෙජොධාතු කසිණ චතුර්ථධ්‍යානයට සමවැද (ඉන්) නැගිට පිරිනිවියාවූ මල්ල රජුත් ආයුෂ්මත් දබ්බයන්ගේ සිරුරට ගිනි ඇවිලෙද්දීද ගිනි නිවෙද්දීද හලු නොපෙණුනේය. දැලි නොපෙණුනේයයි” (වදාළසේක)

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි මේ කාරණය දැන ඒ කරුණ (පහළ කරණ) මේ උදන් පහළ කළ සේක.

"යම්සේ යකුළු ගසන ලද්දාවූ ලොහෝ භාජනාදීගතවූ ශබ්දයන් හෝ දැල්වෙන ගින්න ක්‍රමයෙන් සන්සිඳුණු ගිය තැන නොදන්නා ලැබේද, එපරිද්දෙන්ම මනාව මිදුණාවූ කාමප්‍රබන්ධයයි කියනලද කාමොඝ භවොඝාදී භෙදවූ ඉතිරි ඔඝයද තරණයකොට සිටි බැවින් කාමබන්ධ ඔඝයන් තරණය කළාවූ නිශ්චලවූ සුවයට පැමිණියාවූ ක්ෂීණාශ්‍රවයන්ගේ ගතියක් පණවන්නට නැත."

(අටවන පාටලී ගාම වර්ගය නිමි.)

උදානය නිමි.

---

# 4. ඉතිවුත්තකය

## ඒකක නිපාතය

### 1. භොග වර්ගය

1. **ලොභ පජහන සූත්‍රයඃ-** 1. "භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය වදාරන ලද්දේමය, කෙලෙස් නැසූ (බුදුන් වහන්සේ විසින්) වදාරන ලද ධර්මය මා විසින් මෙසේ අසන ලදී.

2. "(i) මහණෙනි, එක් ස්වභාවයක් දුරුකරවූ, තොපට මම අනාගාමි භාවය පිණිස ඇප වෙමි. කවර එක් ස්වභාවයෙක්ද යත්? (ii) මහණෙනි, ලොභයවූ එක් ස්වභාවය දුරු කරවූ, තොපට මම අනාගාමි බව පිණිස ඇපවෙමි'යි

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථ සමූහය මෙසේ කියනු ලැබේ.

"යම් ලොභයකින් ගිජුවූ සත්වයෝ දුගතියට යෙද්ද, (අනිත්‍යාදී වශයෙන්) දක්නාසුලු ප්‍රාඥයෝ ඒ ලොභය

මනාව දැන පහකෙරෙත්. පහකොට මේ (කාම) ලොකයට නැවත කිසිකලෙකත් (උත්පත්ති වශයෙන්) නොපැමිණෙත්යයි"

4. මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේයයි මා විසින් අසන ලද්දේයි."

**2. ද්වෙෂ සූත්‍රයः-** (ඉතිවුත්තකයේ සෑම සූත්‍රවලම පළමුවෙනි ඡෙදයද අවසාන ඡෙදයද 1 සූත්‍රයේ 1 සහ 4 ඡෙද මෙන් වෙත්.)

2. (මෙහි 1 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි.) මහණෙනි, ද්වෙෂයවූ එක් ස්වභාව ධර්මය පහකරවූ, මම තොපට අනාගාමිඵලය පිණිස ඇපවෙමි.

3. භාග්‍යවතුන් වහන්සේ මේ අරුත වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් තරහවකින් දූෂ්‍යවූ සත්වයෝ දුගතියට යෙද්ද, විදර්ශනාව වඩන නුවණැත්තෝ ඒ ද්වෙෂය මනාව දැන පහකෙරෙත්. පහකොට නැවත මේ (කාම) ලොකයට නොපැමිණෙත්යයි."

**3. මොහ සූත්‍රයः-** 2. (මෙහි 1 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි) මහණෙනි, මොහය (නොදැනීම) වූ එක් ස්වභාවය දුරු කරවූ, මම තොපට අනාගාමි බව පිණිස ඇපවෙමියි භාග්‍යවතුන් වහන්සේ මේ අරුත වදාළසේක.

"යම් නොදැනීමකින් මුළාවූ සත්වයෝ දුගතියට යෙද්ද, දක්නාවූ නුවණැත්තෝ ඒ මුළාව මනාව දැන පහකෙරෙත්. දුරුකොට නැවත කිසිකලෙකත් මේ (කාම) ලොකයට (ඉපදීම් වශයෙන්) නොපැමිණෙත්යයි"

**4. ක්‍රොධ සූත්‍රයः-** 2. (මෙහි 1 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි.) මහණෙනි, ක්‍රොධයවූ එක් ධර්මය දුරුකරවූ, මම තොපට අනාගාමිඵලය පිණිස ඇපවෙමියි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ක්‍රොධයකින් කිපියාවූ සත්වයෝ දුගතියට යෙද්ද, පණ්ඩිතයෝ ඒ ක්‍රොධය මනාව දැන පහකෙරෙත්, පහකොට නැවත මේ (කාම) ලොකයට කිසි කලෙකත් (ඉපදීම් වශයෙන්) නොපැමිණෙති"යි

**5. මක්ඛ සූත්‍රය:-** 2. (මෙහි 2 (i) යෙදිය යුතුයි) "මහණෙනි, (අනුන්ගේ ගුණ) මැකීමවූ (ගුණ මකනාකාරයෙන් පැවති දොම්නස් සහගිය සිතිවිල්ල වූ එක් ස්වභාව ධර්මය දුරුකරවූ මම තොපට අනාගාමි බව පිණිස පොරොන්දු වෙමියි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ගුණ මැකීමකින් (ගුණ) මකන්නාවූ සත්වයෝ දුගතියට යෙද්ද, පණ්ඩිතයෝ ඒ ගුණමැකීම මනාව දැන දුරුකෙරෙති. දුරුකොට නැවත කිසිකලෙකත් මේ (කාම) ලොකයට (ඉපදීම් වශයෙන්) නොපැමිණෙත්."

**6. මාන සූත්‍රය:-** 2. (මෙහි 1 සූත්‍රයේ 2 (i) යෙදිය යුතුයි) 'මහණෙනි, (නවවිධ) මානයවූ එක් ස්වභාව ධර්මය දුරුකරවූ, මම තොපට අනාගාමි බව පිණිස පොරොන්දු වෙමි"යි

3. මේ අරුත භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ ක්‍රමයෙන් කියනු ලැබේ.

"යම් මානයකින් මත්වූ සත්වයෝ දුගතියට යෙද්ද, නුවණැත්තෝ ඒ මානය මනාකොට දැනගෙන පහකෙරෙත්. පහකොට නැවත කිසිකලෙකත් මේ (කාම) ලොකයට (උත්පත්ති වශයෙන්) නොපැමිණෙත්."

**7. සර්ව සූත්‍රය:-** 2. "මහණෙනි, සර්වය නොදන්නේ පිරිසිඳ නොදන්නේ ඒ මනාව දතයුතු විශෙෂයෙහි නොඇලෙන්නේ පහනොකරන්නේ දුඃඛය ක්ෂය කරනු පිණිස (නිවන් පිණිස) සමර්ථ නොවේ.

"මහණෙනි, සියලුම සක්කායදෘෂ්ටිය දන්නේ පිරිසිඳ දන්නේ එහි සිත නොඇලෙන්නේ පහකරන්නේ නිර්වාණය පිණිස සමර්ථ වේ"යයි

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් යොගාවචරයෙක් තෙමේ සියලු ධර්ම සමූහය සියලු අයුරෙන් අවබොධකොට සියලු සක්කාය ධර්මයන්හි නොඇලේද, ඒ ආර්යතෙමේ සියල්ල පිරිසිඳ දැනීමෙන් ඒකාන්තයෙන් සියලු (සසර) දුක ඉක්මවීය"

**8. (දෙවන) මාන සූත්‍රය:-** 2. "මහණෙනි, මානය විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ ඒ මානයෙහි සිත නොඇලෙන්නේ පහනොකරන්නේ දුක් ක්ෂය කිරීමට සමර්ථ නොවේ. මහණෙනි, මානයද විශිෂ්ට ඥානයෙන් දන්නේ පිරිසිඳ දන්නේ ඒ මාන නොඋපදවන්නේ පහකරන්නේ දුක් ගෙවීමට සමර්ථ වේ"යයි

**3.** මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ වදාසේක. එහි මෙසේ කියනු ලැබේ.

> "ප්‍රජායයි ලද නම් ඇති මේ සත්ව සමූහය මානයෙන් යුක්තවූවාය. මානයෙන් ගැටගැසුනීය, භවයෙහි ඇලුනීය, මානය පිරිසිඳ නොදන්නාවූ සත්වයෝ නැවත භවයට පැමිණෙන්නාහ.
>
> "යම් රහත් කෙනෙක් වනාහි මානය පහකොට මානයාගේ අතිශයින් ක්ෂයවූ නිවනෙහි මනාව මිදුනාහුද, මාන බැම්ම මුලින් සිඳීමෙන් මැඩසිටියාවූ ඒ රහත්හු සියලු සංසාර දුක්ඛය ඉක්මවූහ"යි

**9. (ද්විතීය) රාග සූත්‍රය:-** 2. "මහණෙනි, ලොභය විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ එහි චිත්තසන්තානය නොඅලවන්නේ දුරුනොකරන්නේ දුක් ක්ෂය කිරීම (නිවන්) පිණිස අසමර්ථවේ.

"මහණෙනි, ලොභයද විශිෂ්ට ඥානයෙන් දන්නේම පිරිසිඳ දන්නේ එහි (තමාගේ) සිත නොඅලවන්නේ දුරු කරන්නේ දුඃඛක්ෂයය පිණිස සමර්ථවේ. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ලොභයකින් ගිජුවූ සත්වයෝ දුගතියට යෙද්ද, පණ්ඩිතයෝ ඒ ලොභය මනාව දැනගෙන පහකෙරෙත්. පහකොට කිසිකලෙකත් මේ (කාම) ලොකයට නැවත නොපැමිණෙත්යයි"

**10. (ද්විතීය) ද්වෙෂ සූත්‍රයඃ-** 2. "මහණෙනි, ද්වෙෂය විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ එහි (තමාගේ) සිත අලවන්නේ පහ නොකරන්නේ දුඃඛ ක්ෂය සංඛ්‍යාත නිර්වාණය පිණිස සමර්ථ නොවේ.

"මහණෙනි, ද්වෙෂයද විශෙෂයෙන් දන්නේම පිරිසිඳ දන්නේ එහි සිත නොඅලවන්නේ පහකරන්නේ දුඃඛ ක්ෂයයි කියනලද නිවණට පැමිණීම පිණිස සමර්ථ වේ.

3. "මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ද්වෙෂයකින් දුෂ්ඨවූ සත්වයෝ දුගතියට යෙද්ද, විදසුන් නැණින් දක්නා සුලු පණ්ඩිතයෝ ඒ ද්වෙෂය මනාව දැන පහකරත්. පහකොට කිසිකලෙකත් මේ (කාම) ලොකයට නැවත (ඉපදීම් වශයෙන්) නොපැමිණෙතියි"

(1 පාටිභොග වර්ගය නිමි.)

---

## 2 බහුපකාර වර්ගය

**11. මොහානභිජානන සූත්‍රයඃ-** 2. "මහණෙනි, (අරමුණු වල) මුළාවන ස්වභාවය විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ එහි සිත අලවන්නේ පහනොකරන්නේ දුඃඛ ක්ෂය යයි කියන ලද නිර්වාණය පිණිස අසමර්ථ වේ.

"මහණෙනි, මොහයද විශෙෂයෙන් දන්නේම පිරිසිඳ දන්නේ එහි සිත නොඅලවන්නේ පහ කරන්නේ දුඃඛ ක්ෂය යයි කියන ලද නිවනට (පැමිණීම පිණිස) සමර්ථවේ"යයි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. ඒ සූත්‍රයෙහි මේ (ගාථා බන්ධනය) මෙසේ කියනු ලැබේ.

"යම් මොහයකින් මුළාවූ සත්වයෝ දුගතියට යෙද්ද, පණ්ඩිතයෝ ඒ මොහය මනාව දැන පහකරත්. පහකොට කිසිකලෙකත් මේ (කාම) ලොකයට නැවත (ඉපදීම් වශයෙන්) නොපැමිණෙතියි"

12. **කොධානභිජානන සූත්‍රයः-** 2. "මහණෙනි, ක්‍රොධය විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ එහි සිත අලවන්නේ පහනොකරන්නේ නිර්වාණයට අසමර්ථ වේ.

"මහණෙනි, ක්‍රොධයද විශෙෂයෙන් දන්නේම පිරිසිඳ දන්නේම එහි සිත නොඅලවන්නේම පහකරන්නේ නිර්වාණයට සමර්ථ වේයයි"

3. මේ අරුත භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ක්‍රොධයකින් සිටියාවූ සත්වයෝ දුගතියට යෙද්ද, පණ්ඩිතයෝ ඒ ක්‍රොධය මනාකොට දැන පහකෙරෙත්. පහකොට කිසිකලෙකත් මේ (කාම) ලොකයට (ඉපදීම් වශයෙන්) නොපැමිණෙතියි"

13. **මක්ඛානභිජානන සූත්‍රයः-** 2. "මහණෙනි, (අනුන්ගේ) ගුණමැකීම විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ එහි සිත අලවන්නේ පහ නොකරන්නේ නිවණට අසමර්ථවේ, "මහණෙනි, (අනුන්ගේ) ගුණ මැකීමද, විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ එහි සිත නොඅලවන්නේ පහකරන්නේ නිවනට සමර්ථවේ යයි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් (අනුන්ගේ) ගුණ මැකීමකින් මකුවූ සත්වයෝ දුගතියට යෙද්ද, නුවණැත්තෝ ඒ ගුණ මකන (ස්වභාවය) මනාකොට දැන දුරුකරත්, පහකොට මේ (කාම) ලොකයට නැවත කිසිකලෙකත් (ඉපදීම් වශයෙන්) නොපැමිණෙත් යයි.

14. **අවිජ්ජානීවරණ සූත්‍රයः-** 2. "මහණෙනි, යම් නීවරණයකින් වැසුනාවූ සත්වයෝ දීර්ඝකාලයක් මුලුල්ලෙහි

සර්වප්‍රකාරයෙන් දුවද්ද, සැරිසරද්ද මහණෙනි, මේ අවිද්‍යා නීවරණය යම්සේද, (මින්) අන්‍යවූ එකනීවරණයකුදු මම නොමදකිමි. මහණෙනි, අවිද්‍යානීවරණයෙන් වැසුණු සත්වයෝ බොහෝකලක් (සසර) නැවත නැවත දුවති, සැරිසරති'යි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "යම් නීවරණයකින් සත්වයෝ මෙසේ වැසුණාහුද, යම් ප්‍රකාරයකින් මොහයෙන් වැසුණාවූ (සත්වයෝ) රෑ දාවල්හි සසර සැරිසරද්ද, එබඳු මෙයින් අනාථවූ එකද ස්වභාවයෙක් (නීවරණයක්) නැත්තේමය.

යම් ("ආර්යශ්‍රාවක) කෙනෙක් වනාහි මොහය පහකොට මොහ නමැති අඳුරු රැස ගැසුවාහුද, ඔහු තුමූ නැවත සසර) සැරිනොසරති. ඔවුන්ගේ (සැරිසැරීමට මුල්) කාරණයක් වේද, නැත්තේ යයි

15. **තණ්හාසඤ්ඤොජන සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ සංයෝජනයකින් (බැම්මකින්) බැඳුණු සත්වයෝ බොහො කලක් මුලුල්ලෙහි (සසර ඔබිනොබ) දුවද්ද, සැරිසරද්ද, මහණෙනි, මේ තෘෂ්ණා සංයෝජනය යම්සේද, (එබඳු) අන් එක සංයෝජනයකුදු මම නොම දකිමි.

"මහණෙනි, තෘෂ්ණා බන්ධනයෙන් බැඳුණු සත්වයෝ වනාහි බොහෝ කලක් මුලුල්ලෙහි දුවත්, හැසිරෙත්යයි"

3. "මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"බොහෝ කලක් මුලුල්ලෙහි සැරිසරන්නාවූ සත්වතෙමේ තෘෂ්ණාව යහළුකොට ඇත්තේය. මේ මිනිසත්බවද වර්තමාන ආත්මභාවය හා අනාගතාත්මභාවයද එබඳු අන්‍යාත්මභාවයද ඇත්තාවූ සසර නොඉක්මවයි.

"මෙසේ දුඃඛයට මූලකාරණයවූ තෘෂ්ණාව දොෂවශයෙන් දැන (නොහොත්) සසර නොඉක්මවන දොෂය දැන තෘෂ්ණාවද සසර දුකට ප්‍රමාණ කාරණයයි දැන පහවූ තෘෂ්ණාව ඇත්තාවූ මතු ප්‍රතිසන්ධිය නොගන්නාවූ සිහි ඇත්තාවූ භික්ෂුතෙම පිරිනිවන් පාන්නේයයි"

**16. බහුපකාර මනසිකාර සූත්‍රය:-** 2. "මහණෙනි, මේ නුවණින් මෙනෙහි කිරීම යම් ප්‍රකාරයකින්වේද, මහණෙනි, නොපැමිණි අර්හත්ඵලය ඇත්තාවූ ශ්‍රෙෂ්ඨවූ නිර්භයවූ (අර්හත් ඵලය) පතමින් වසන්නාවූ ශෛක්ෂ (මතුමාර්ග ඵලයන් පිණිස හික්මෙන්නාවූ සෝවාන්) මහණහට මෙසේ බොහෝ උපකාරවූ තමාගේ සන්තානයෙහි උපන් කාරණයයි. මෙසේ කොට අන් එකද කාරණයක් නොම දකිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කරණු යේ අකුසල් පහ කෙරෙයි, කුසල් වඩායයි."

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

> "ශෛක්ෂ භික්ෂුවට උතුම් රහත්බවට පැමිණීම පිණිස නුවණින් මෙනෙහි කිරීම බොහෝ උපකාරවූ ස්වභාව ධර්මයෙකි. එසේ (උපකාරවූ) අනික් ධර්මයෙක් නැත. නුවණින් වීර්යය කරන්නාවූ මහණතෙම දුක් ක්ෂය කිරීමවූ නිවණට පැමිණෙන්නේයයි"

**17. බහුපකාරමිත්ත සූත්‍රය:-** 2. "මහණෙනි, මේ කල්‍යාණ මිත්‍රයන් ඇතිබව යම්සේද නොපැමිණි රහත් බව ඇති නිරුත්තරවූ යොගයන්ගෙන් උපද්‍රව නැති රහත් බව පතමින් වසන්නාවූ ශෛක්ෂ භික්ෂුවට මෙසේ බොහෝ උපකාරවූ බැහැර කරුණැයි කොට අන් එක් කරුණකුදු මම නොමදකිමි.

"මහණෙනි, කලණ මිතුරන් ඇත්තේ අකුසල් දුරුකරයි. කුසල් වඩා යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ:-

> "යම් මහණෙක් තෙම කලණ මිතුරන් ඇත්තේ වේද, ගුරුන් කෙරෙහි බුහුමන් බහුලකොට ඇත්තේවේද, සුවච වේද, ගෞරවයෙන් යුක්තවේද, මිතුරන්ගේ (අවවාද) වචනය කරන්නාවූ සම්‍යක් ප්‍රඥා ඇත්තාවූ සිහියෙන් යුක්තවූ (ඒ මහණතෙම) පිළිවෙළින් සියලු (දස) සංයෝජනයන්ගේ ක්ෂයවූ රහත්බවට පැමිණෙන්නේ යයි."

18. **සංඝභෙද සූත්‍රය:-** 2. "මහණෙනි, ලොකයෙහි එකම (මහාසාවද්‍ය අකුශල) ධර්මයෙක් උපදින්නේ බොහෝ දෙනාට අවැඩ පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝ දෙනාට අනර්ථය පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස උපදී. කවර එක් ධර්මයෙක්දයත්? සංඝ භෙදයවේ, "මහණෙනි, සංඝයා වනාහි භෙදවීම නිමිතිකොට ඔවුනොවුන්ගේ විවාදයෝද වෙත්. එකිනෙකාගේ (භය ඉපදවීම් වශයෙන් තර්ජනයෝද වෙත්, ඔවුනොවුන්ගේ පිරිභෙලා කියන ගර්හාවෝද වෙත්. ඔවුනොවුන්ගේ (සංඝයාගෙන් බැහැර කිරීම්ද) වෙත්. ඒ සංඝ භෙදය නිමිතිකොට නොපැහැදුනාහුද නොපහදිත් පැහැදුනාවූද සමහරුන්ගේ පැහැදීමේ වෙනස් බව යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ:-

> "සංඝ භෙද කරන තැනැත්තේ අපායෙහි උපදින්නට සුදුස්සෙක් වන්නේය. අවීචිමහ නිරයෙහි උපදින්නේ වේ, (අන්තර) කල්පයක් සිටින්නේවේ. (සංඝභෙදයයි කියනලද) වර්ගයෙහි ඇලුනාවූ අධර්මයෙහි පිහිටියාවූ (ඒ පුද්ගල තෙමේ) හිතයෙන් (නොහොත්) අර්හත් ඵලයෙන් හෝ නිර්වානයෙන් පිරිහෙයි. සමගි සංඝයා භෙදකොට (අවීචි) මහා නිරයෙහි (ආයුෂ කල්පයක් මුළුල්ලෙහි පැසේ යයි."

19. **සංඝසාමග්ගි සූත්‍රය:-** 2. "මහණෙනි, (සත්ව) ලොකයෙහි එක් (කුශල) ධර්මයෙක් උපදින්නේ මහජනයාට වැඩපිණිස බොහෝ දෙනාට සුවපිණිස බොහෝදෙනාට අර්ථ පිණිස දෙවිමිනිසුන්ට හිත පිණිස සුව පිණිස උපදී, කවර එක ධර්මයෙක්දයත්, සංඝයාගේ සමගි බවය.

3. "මහණෙනි, සංඝයා වනාහි සමගිවීම නිමිතිකොට ඔවුනොවුන්ගේ විවාදයෝද, නොමවෙත්, ඔවුනොවුන්ගේ පිරිභෙලා බිණීම්ද නොවෙත්, ගැරහීම්ද නොවෙත්, නෙරපීම්ද නොවෙත්, ඒ සංඝසාමග්‍රිය නිමිතිකොට (තෙරුවන් කෙරෙහි) පහන් නොවූවෝද පහදිත්, ප්‍රසන්නවූවන්ගේ පැහැදීම වැඩියක්ම වේයයි."

3. "මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සංඝයාගේ සමගියද සමගිවූවන්ගේ (සමගිය අනුමෝදන්වීමෙන්) අනුබලදීමද සැපය, සමගියෙහි ඇලුණාවූ ධර්මයෙහි සිටියාවූ (පුද්ගලතෙම) රහත් බැවින් හෝ නිවනින් නොපිරිහෙයි, සංඝයා සමගිකොට (ආයුෂ්කල්පය මුලුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවේයයි"

**20. දුට්ඨ පුද්ගල සූත්‍රයః-** "මහණෙනි, මේ ලොකයෙහි (ද්වෙෂයෙන්) ප්‍රදූෂ්‍යවූ සිත් ඇත්තාවූ එක්තරා සත්වයකු (මෙසේ) සිතින් සිත පිරිසිඳ ඉදින් මෙකල්හි මේ පුද්ගලතෙම කළුරිය කරන්නේ නම් ගෙන එනලද බඩුවක් බිම බහා තබන්නේ යම්සේද එසේ නිරයෙහි (උපදී) යයි දනිමි. ඊට හේතු කවරේද, මහණෙනි, යම්හෙයකින් ඔහුගේ සිත දූෂ්‍යවූයේද එහෙයිනි. මහණෙනි, සිත් අතිසයින් දූෂ්‍යවීම හෙතුකොට වනාහි මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට පිහිටවූ නපුරු සේවැටෙන්නාවූ නරකයෙහි උපදිත්යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. බුදුරජාණන් වන්සේ මේ ලොකයෙහි අතිශයින් දූෂ්‍යවූ සිත් ඇති ඇතැම් පුද්ගලයෙකු දැන භික්ෂූන්ගේ සමීපයෙහි මේ අර්ථය ප්‍රකාශ කළසේක.

"ඉදින් මෙකල්හි මේ පුද්ගලයා කළුරිය කරන්නේ නම් නරකයෙහි උපදින්නේය, යම්හෙයකින් ඔහුගේ සිත (ද්වෙෂයෙන්) අතිසයින් දූෂිතවීද (එහෙයිනි.)

"යම්සේ (බඩුවක්) ගෙනවුත් (බිම) බහාතබන්නේද, එපරිද්දෙන්ම එබඳු පුද්ගලතෙම සිත අතිසයින් දූෂ්‍යවීම් හෙතුවෙන් වනාහි සත්වයෝ දුගතියට යෙතියි"

**(2 බහුපකාර වර්ගය නිමි.)**

# 3. චිත්ත වර්ගය.

**21. චිත්ත සූත්‍රය:-** 2. "මහණෙනි. මේ ලොකයෙහි මම පහන් සිත් ඇති ඇතැම් පුද්ගලයෙකු ඉදින් මේ පුද්ගලතෙම මෙකල්හි කළුරිය කෙරේනම් යම්සේ ගෙනඑනලද (බරක් බිම) බහා තබන ලද්දේද එපරිද්දෙන් ස්වර්ගයෙහි වේයයි මෙසේ (තමාගේ) සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි. ඊට හෙතු කවරේද? මහණෙනි; යම් හෙතුවකින් ඔහුගේ සිත පැහැදුනේද (එහෙයිනි.)

"මහණෙනි; සිත පැහැදීම හෙතුකොට වනාහි මෙසේ මේ ලොකයෙහි සමහර සත්වයෝ (කරජ) කය බිඳීමෙන් මරණින්මතු මනාගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ දෙව්ලොව උපදී'යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. ඒ සූත්‍රයෙහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"බුදුන්වහන්සේ මේ ලොකයෙහි පහන් සිතැති ඇතැම් පුද්ගලයෙකු දැන මේ කරුණ භික්ෂූන් සමීපයෙහි ප්‍රකාශ කළසේක.

"ඉදින් මෙසමයෙහි මේ පුද්ගලතෙම කළුරිය කෙරේ නම් සුගතියෙහි උපදින්නේය. යම්හෙයකින් ඒ පුද්ගලයාගේ සිත ප්‍රසන්නද (එහෙයිනි.)

"යම්සේ (බරක්) ගෙනවුත් (බිම) බහා තබන්නේද, එපරිද්දෙන්ම එබඳු පුද්ගලතෙමේ (කුශලකර්මය විසින් ස්වර්ගයෙහි තබන ලද්දේවේ, සිත පැහැදීම් හෙතුවෙන් වනාහි සත්වයෝ සුගතියටයති'යයි"

**22. ව්‍යාධි සූත්‍රය:-** 2. "මහණෙනි, පිණෙන් බිය නොවව්, යම් මේ පින් වෙද්ද, මහණෙනි, ඉෂ්ටවූ කැමතිවූ ප්‍රියවූ මනවඩන්නාවූ සැපයට මේ නමෙකි. මහණෙනි, මම දීර්ඝ කාලයක් මුළුල්ලෙහි කරන ලද්දාවූ (දානාදී) පින්වල නැවත නැවත විඳින ලද්දාවූ ඉෂ්ටවූ කැමතිවූ ප්‍රියවූ මනාපවූ විපාක දනිමි. සත්අවුරුද්දක් මෙත් සිත වඩා නැසෙන්නාවූද

හටගන්නාවූද සත් මග කල්පයෙක්හි මේ (කාම) ලොකයට නැවත නොපැමිණියෙමි.

"මහණෙනි, කල්ප නැසෙනකල්හි ආභස්සර බ්‍රහ්මලොකයට පැමිණියේ වෙමි. කල්පය හටගන්නා කල්හි හිස්වූ බඹ විමනෙක උපදිමි. මහණෙනි, ඒ බඹ ලොව මැඩසිටියාවූ (කිසි ගුණයකින්) නොමඩින ලද්දාවූ ඒකාන්තයෙන් අභිඥා ඥානයෙන් දක්නාසුළුවූ බ්‍රහ්මවූ මහාබ්‍රහ්මයෙක් වෙමි. අණෙහි පවත්වන්නේ වෙමි.

"මහණෙනි සතිස්වරෙක අධිපතිවූ ශක්‍ර වීමි, නො එක්වර ධර්මයෙහි හැසිරෙන්නාවූ දැහැමින් රජවූ අධිපතිවූ ජය ගත්තාවූ දනවුවෙහි තහවුරු බවට පැමිණියාවූ සත්රුවනින් යුක්තවූ සක්විති රජවීමි, ප්‍රදේශරජය පිළිබඳ කථාවක් නැත.

"මහණෙනි, ඒ මට මෙබඳු අදහසක් විය. මම යම් පිනකින් දැන් මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක් වෙම්ද, මෙබදු මහත් ආනුභාව ඇත්තෙක් වෙම්ද, මාගේ කවර කුශල කර්මයක්හුගේ මේ ඵලයදෝ කීනම් කර්මයක්හුගේ විපාකය දෝ හෝයි.

"මහණෙනි, ඒ මට මෙබඳු අදහසක් වීයඃ- මම මේ කාලයෙහි යම් පිනකින් මෙබඳු මහත් ඍද්ධි ඇත්තේවේද, මෙබඳු මහත් ආනුභාවය ඇත්තෙක් වෙම්ද, දානයගේද, (චක්ෂුරාදී ඉන්ද්‍රිය) දමනයන්ගේද, (ක්ලේශ) දමනයගේද (කායවාක්) සංයමයගේද (යන) ත්‍රිවිධ (කුශල) කර්මයන්ගේම මේ ඵලය වන්නේය. ත්‍රිවිධ (කුශලකර්මයන්ගේම මේ විපාකය වන්නේයයි"

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "(යමෙක් වැඩකැමැත්තේද) හෙතෙම (විපුල ඵලය ඇතිබැවින් හෝ ප්‍රියමනාප ඵලය ඇති බැවින් මත්තෙහි උතුම්වූ අග්‍රවූ සැප විපාක ඇත්තාවූ පිනවන්නාවූ ත්‍රිවිධ කුශලයම රැස්කරන්නේය. දානයද විශුද්ධ ශීලයද මෙත් සිතද වඩන්නේය.

"පණ්ඩිතතෙමේ සුව අනුසස් ඇත්තාවූ (දානාදී) මේ තුන් සුසිරි දහම් වඩා නිදුක්වූ (ඒකාන්ත) සැපවූ (බඹ) ලොවෙහි උපදීයයි."

**23. උභො අර්ථසූත්‍රයඃ-** 2. "මහණෙනි, එක ධර්මයක් වඩනලද්දේ (නොහොත්) උපදවන ලද්දේ නැවත නැවත කරනලද්දේ මේ ආත්මයෙහිවූද පරලෙව්හිවූද දෙ වැඩ මනාව ගෙන පවතීද, කවර එක ධර්මයක්දයත් කුශල ධර්මයන්හි අප්‍රමාදයවේ.

"මහණෙනි, මේ එක ධර්මය වනාහි වඩනලද්දේ හෝ උපදවන ලද්දේ නැවත නැවත කරණලද්දේ මේ ආත්ම බවයෙහි ඇතුළත්වූද පරලොව ඇතුළත්වූද දෙවැඩ මනාකොට ගෙන සිටියයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සප්‍රාඥයෝ පින්කිරිය අතුරෙන් අප්‍රමාදයට පසසත්, අප්‍රමාදවූ පණ්ඩිතතෙම දෙවැඩ මනාකොටගණී, මේ ආත්මබවෙහි යම් වැඩෙක් වේද, පරලෙව්හිවූ යම් වැඩෙක්වේද, දෙවැදෑරුම් අර්ථ ප්‍රතිලාභය හා නිර්වානයද හමුවීමෙන් නුවණ ඇත්තා පණ්ඩිතයයි කියනු ලැබේයයි"

**24. පුඤ්ජ සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ වෙපුල්ල පර්වතය යම්සේද, (මහ) කපක් මුලුල්ලෙහි නැවත නැවත දුවන්නාවූ නැවත නැවත සැරිසරන්නාවූ සත්වයෙකුගේ ඉදින් රැස්කරන්නෙක් වන්නේද, රැස්කරනලද (ඇට) ද නොවැනසෙන්නේද, එබඳු මහ ඇට ගොඩක් ඇට සමූහයෙක් ඇට රැසෙක් වන්නේ යයි"

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"එක කල්පයෙක්හි එක් සත්වයෙකුගේ ඇටගොඩ පර්වතය සමවූ රැසෙක් වන්නේ යයි මහර්ෂිවූ බුදුන් වහන්සේ විසින් වදාරන ලදී."

"දුකද දුක ඉපදීමට හෙතුවද දුක ඉක්ම වීමද දුක සංසිඳීමට පමුණුවන්නාවූ ආර්ය අෂ්ටාංගික මාර්ගයද (යන) චතුරාර්ය සත්‍යයන් යම් කලෙක්හි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද."

("ඒ ආර්ය සත්‍යයන් දුටු ස්‍රොතාපන්න පුද්ගල තෙමේ සත්වරක් කෙළවර කොටද ගොස් සියලු සංයොජනයන් ක්ෂය කිරීමෙන් දුක කෙළවර කරන්නේ වේයයි."

**25. සම්පජාන මුසාවාද සූත්‍රයː-** 2. "මහණෙනි, (වාක් සංඛ්‍යාතවූ එක් ධර්මයක් ඉක්මවා (සිටි) ඒ පුද්ගලයා විසින් නොකළ හැකි පාපකර්මයක් මම නොකියමි. කවර එක ධර්මයෙක්ද යත්?"

"මහණෙනි, යම් මේ දැන දැන මුසාවාද කීමෙක් වේද, (ඒ ධර්මයයි)

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "එකම ධර්මය ඉක්මවූ බොරු කියන සුලුවූ හරින ලද පරලොව ඇත්තාවූ සත්වයා විසින් නොකළ හැකි පවක් නැතැයි."

**26. දාන සූත්‍රයː-** 2. "මහණෙනි, මම යම් ප්‍රකාරයකින් දාන සංවිභාගයාගේ විපාකය එපරිද්දෙන් සත්වයෝ ඉදින් දන්නාහු නම් නොදී අනුභව නොකරන්නාහුය. ඔවුන්ගේ මසුරු මලද (නොහොත්) මසුරු බව හා දානයට අන්තරාය කරන්නාවූ ඊර්ෂ්‍යා (ලොභ ද්වෙෂාදී ක්ලෙශමලද සිත මැඩ නොම සිටින්නේය, ඔවුන්ගේ (සියල්ලට) පසුවූ ආලොපයෙක් අන්තිම බත් පිඬෙක් වන්නේද, ඉනිදු බෙදා නොදී අනුභව නොකරන්නාහුය,

"ඉදින් ඔවුනට ප්‍රතිග්‍රාහකයෝ වන්නාහුනම් (දෙත්මය)

"මහණෙනි, යම් හෙයකින් වනාහි යම්සේ මම දාන සංවිභාගයාගේ විපාකය දනිම්ද එපරිද්දෙන් සත්වයෝ නොදනිද්ද, එහෙයින් නොදී අනුභව කරති, මසුරු මලද ඔවුන්ගේ සිත මැඩගෙන සිටීයයි."

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහර්ෂීවූ බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද පරිද්දෙන් යම්සේ මහත් විපාක ඇත්තේ වේද, ඉදින් එසේ සත්වයෝ දාන සංවිභාගයාගේ විපාකය දන්නාහු නම්.

"විශෙෂයෙන් ප්‍රසන්නවූ සිතින් (ඔහු) මසුරු මල දුරු කරන්නාහුය, යම් කෙනෙකුන්ට දෙන ලද්ද මහත් ඵල වේද, (ඒ) ආර්යයන්ට සුදුසු කාලයෙහි දෙන්නාහුය.

"බොහෝ ජනයාහට ආහාරද බොහෝ ආහාරද දක්ෂිණාව පිළිගන්නට සුදුසු ආර්යයන්ටදී මේ මිනිසත් බැවින් චුතවූ දායකයෝ ස්වර්ගයට යෙත්.

"මසුරු නොවූ ඔව්හුද දෙව්ලොවට ගියාහු එහි (සියලු) කාමසම්පත්තියෙන් යුක්තවූවාහු සතුටු වෙත් යයි."

**27. මෙත්තාවාච සූත්‍රය**:- 2. "මහණෙනි, උපදවන්නාවූ යම්කිසි පුණ්‍යක්‍රියාවෝ වෙද්ද, ඒ හැම පින්කිරියවත් මෛත්‍රී චෙතො විමුක්තියගේ ත්‍රික චතුෂ්කධ්‍යාන සම්පත්තියගේ සොළොස් වන කොටසින් කොටසටද නොඅගිත්. චෙතො විමුක්තියයි කියනලද මෛත්‍රිය ඒ පින් කිරියවත් මැඩගෙන බබළාමය, තවයි, විශෙෂයෙන් බබළයි."

3. "මහණෙනි, මෙසේ වනාහි උපධි සම්පත්තිය පිණිස පවත්නාවූ යම් පුණ්‍ය ක්‍රියා වස්තූහු වෙද්ද, ඒ සියල්ලන් මෛත්‍රී චෙතො විමුක්තියගේ සොළොස් වන කොටසින් කොටසටද නොවටිත්. මෛත්‍රී චෙතෝ විමුක්ති තොමෝ ඒ පින් කිරියවත් මැඩ පවත්වා බබළාමය, අතිසයින් තවයි. (එහෙයින්ම) විශෙෂයෙන් බබළයි."

"මහණෙනි, යම්සේ වනාහි වර්ෂා මාසයන්ගේ අන්තිම (ඉල්) මාසයෙහි සරත් කාලයෙහි වැසි දුරුවූ කල්හි පහවූ වලාකුල් ඇති අහසෙහි සඳ (උදාවූ තැනින්, අහස මුදුනට නගින්නේ අහසට ගිය සියලු අඳුරු නසා බබළාද, දිළියේද, වෙසෙසින් බබළාද, එපරිද්දෙන්ම මහණෙනි, ආත්මභාව සමාධිය පිණිස පවත්නාවූ යම්කිසි පින් කිරියවත් කෙනෙක් ඇද්ද, සියලු ඒවා මෛත්‍රී චෙතොවිමුක්තියගේ සොළොස්වන කොටසින් කොටසටද නොවටිත්' මෛත්‍රීචෙතොවිමුක්තියම ඒවා මැඩ බබළාමය, වොරජනේම, වෙසෙසින් බබළාමය,

**4.** "මහණෙනි, යම්සේ වනාහි රැයේ අලුයම් වේලෙහි දවහත් (සිකුරු) තරුව බබළාද, දිළියේද, වෙසෙසින් බබළාද, එපරිද්දෙන්ම මහණෙනි, උපධිසම්පත්තිය පිණිස පවත්නාවූ යම්කිසි පින් කිරියවත් කෙනෙක් වෙද්ද, ඒ සියල්ලෝ මෛත්‍රී චෙතො විමුක්තියගේ සොළොස් වන කොටසින් කොටසටද නොවටිත්. මෛත්‍රී චෙතො විමුක්ති තොමෝම ඒ පින් කිරියවත් මැඩ බබළාමය, වොරජනේමය, වෙසෙසින් බබළාමය"යි.

**5.** "භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "යමෙක් වනාහි සිහි ඇත්තේ අප්‍රමාණවූ මෛත්‍රිය වඩාද, නිවන දක්නාහුගේ තුනීවීමෙන්, උපධික්ෂය නම් අර්හත් ඵලයට පැමිණ එය දන්නහුගේ (දස සංයොජනයෝම) තුනීවෙත්.

"එකසත්වයෙකුටද දූෂිත නොවූ සිත් ඇත්තේ මෛත්‍රිය කෙරේද, ඒ මෛත්‍රියෙන් අතිශයින් කුසල් ඇත්තෙක්වේ. සියලු සතුන්ට සිතින් අනුකම්පා කරන්නාවූ ආර්ය තෙම බොහෝ පින් කෙරෙයි.

"යම් සත්ව කෙනෙක් සත්ව සමූහයාගෙන් ගැවසීගත් පොළොව ජයගෙන තවුසන් වැනි දැහිමි රජවරු දන්දෙමින් හැසුරුණාහුද, අශ්ව මෙධය පුරුෂ මෙධය සම්මාපාසය වාචපෙය්‍යය නිරග්ගළයයි (යන යාග) කළාහුද "සියලු තරු සමූහයෝ එසඳඑළියේ සොළොස් වන කලාවෙන් කලාවටද නොපැමිණෙත් ඒ අශ්වමෙධාදී යාගයෝ මනාව වැඩූ මෙත් සිතගේ සොළොස්වන කලාවෙන් කලාවටද නොපැමිණෙත්.

"යම් පුද්ගලයෙක් තෙම (කිසි සත්වයෙකු) නොවෙහෙසාද, (අනුන්ලවා) නොවෙහෙසවාද, නොදිනාද, (අනුන්ලවා) ධන හානිය නොකරවාද, (හෙතෙම) මෛත්‍රී අවයව ඇත්තේවේ. (එහෙයින්ම) කිසි කරුණකින් ඔහට අකුශල වෛරයෙක් නැත, (නොහොත්) කිසි පුරුෂයෙකු සමග වෛරයෙක් නැතැයි."

**(චිත්ත වර්ගය නිමි.)**

**(එකක නිපාතය නිමි.)**

---

# දුක නිපාතය

## 4. සංවේජනීය වර්ගය.

**28. (අගුත්තද්වාරින්ද්‍රිය) භික්ෂු සූත්‍රය:-** 2. "මහණෙනි, (අකුශල) ධර්ම දෙකකින් යුක්තවූ මහණ තෙමේ මේ ආත්ම බවෙහිම බලවත් ආයාස ඇතිව ක්ලෙශ සන්තාපයෙන්ද ක්ලෙශ පරිදාහයෙන්ද දැවිලි ඇතිව දුකසේ වෙසෙයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි දුගති තොමෝ කැමතිවිය යුත්තීය. කවර දෙකකින්ද යත් නොවසන ලද දොර ඇති බවද අහරෙහි පමණ නොදන්නා බවද (යන දෙකිනි.)

3. "මහණෙනි, මේ (අකුශල) ධර්ම දෙකින් යුත් මහණ තෙමේ මේ ආත්ම බවෙහිම පීඩා ඇතිව දැඩි ආයාස ඇතිව හාත්පස දාහ ඇතිව දුකසේ වාසය කෙරේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි දුගති තොමෝ කැමැති විය යුත්තීයයි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

මේ සස්නෙහි යම් මහණෙකුගේ ඇසද, කණද, නැහැයද, දිවද, කයද එසේම සිතද (යන) මේ දොරවල් නොවසන ලද්දාහු වෙද්ද.

"ඉඳුරන්හි සංවර නැත්තාවූ බොජුනෙහි පමණ නොදත් ඒ මහණතෙමේ කායික දුකටද චෛතසික දුකටද පැමිණේ.

"එබඳු පුද්ගලතෙමේ ඉදින් දවල්හි වේවයි, රෑ වේවයි දනුලබන්නාවූ කයින්ද දැවෙන සිතින්ද දුකසේ වෙසේයයි."

**29. (ගුත්තද්වාරින්ද්‍රිය) සූත්‍රය:-** 2. "මහණෙනි (කුශල) ධර්ම දෙකකින් යුත් මහණතෙමේ මේ ආත්මභාවයෙහිම පීඩා නැතිව දැඩි ආයාස නැතිව හැම ලෙසින් දැවිලි නැතිව සුවසේ වෙසෙයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි, සුගති තොමෝ කැමැති විය යුත්තීය. කවර දෙකකින්ද යත් ඉඳුරන්හි වසන ලද දොර ඇති බැවින්ද ආහාරයෙහි පමණ දත් බැවින්ද යන දෙකිනි.)

"මහණෙනි, මේ ධර්ම දෙකින් යුත් මහණ තෙමේ මේ ආත්මභාවයෙහිම පීඩා නැතිව දැඩි ආයාස නැතිව හාත්පස දාහ නැතිව සුවසේ වෙසේය."

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි (ගාථාවෙන්) මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මේ සස්නෙහි යම් මහණෙකුගේ ඇසද, කණද, නැහැයද, දිවද කයද යළි සිතද (යන) මේ දොරවල් මනාව වසන ලද්දාහු වෙද්ද.

"ඉන්ද්‍රියයන්හිද සංවරවූ ඒ මහණතෙම බොජුනෙහි පමණ දන්නේත් වේද, (ඒ මහණතෙමේ) කායික සැපය චෛතසික සැපය (යන) හැම සැපයට පැමිණේ.

"එබඳු මහණතෙමේ දවල්හි හෝ රෑ හෝ නොදැවෙන කයින්ද නොදැවෙන සිතින්ද සුවසේ වෙසේයයි."

**30. තපනීය ධම්ම සූත්‍රයඃ-** 2. මහණෙනි, (මෙලොවද පරලොවද) වෙහෙසන්නාවූ හෝ දුකම සිතවූ හෝ පසු තැවිල්ලට හෙතුවූ ධර්ම (කරුණු) දෙකක් වෙත්, කවර දෙකක්ද යත්?

"මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙමේ නොකරන ලද පින් ඇත්තේ වේද, නොකරන ලද කුසල් ඇත්තේ වේද, නොකරන ලද දුකට රැකවල් ඇත්තේ වේද, කරන ලද පව් ඇත්තේ වේද, කරන ලද රෞද්‍ර ක්‍රියා ඇත්තේ වේද, කරන ලද දුසිල් බැව් ඇත්තේ වේද, හෙතෙම මා විසින් පින් නොකරන ලද්දේ" යයි ද තැවෙයි. 'මා විසින් පව් කරන ලද්දේයයිද තැවෙයි, මහණෙනි, මේ වනාහී තැවියයුතු ධර්මදෙක වෙත්යයි."

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"කයින් දුශ්චරිත කොට වචනයෙන්ද දුශ්චරිතයක් කොට සිතින්ද දුසිරිකොට දොෂ යයි දන්නා ලද අන්‍යවූ යම් අපරාධ වේද එයද කොට,

"කුසල් දහම් නොකොට බොහෝ අකුසල් කොට ඒ දුෂ්ප්‍රාඥතෙමේ ශරීරයාගේ භෙදයෙන් නරකයෙහි උපදීයයි"

**31. අතපනීය ධම්ම සූත්‍රයඃ-** 2. "මහණෙනි, පසුතැවිලි නොවිය යුතුවූ මේ ධර්මදෙකක් වෙත්, කවර දෙකක්ද යත්?

"මහණෙනි, මේ ලොකයෙහි සමහර පුද්ගලයෙක් තෙම කරන ලද යහපත ඇත්තේ වේද, කරනලද කුසල් ඇත්තේ වේද, කරන ලද රක්ෂා ස්ථාන ඇත්තේ වේද, නොකරන ලද පව් ඇත්තේ වේද, නොකරන ලද රෞද්‍ර ක්‍රියා ඇත්තේ වේද, නොකරන ලද දුශ්චරිත ඇත්තේ වේද, ඒ පුද්ගල තෙමේ මා විසින් කුසල් කරන ලද්දේයයිද පසුතැවිලි නොවෙයි. මා විසින් පව් නොකරන ලද්දේයයිද පසුතැවිලි නොවෙයි. මහණෙනි, මේ වනාහි පසුතැවිලි නොවිය යුතු කරුණු දෙක වෙත් යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "කයින් (කටයුතු) දුශ්චරිතයද වාක් දුශ්චරිතයන්ද මනො දුශ්චරිතයන්ද හැර දොෂයයි දන්නා ලද අන්‍යවූ යම් (කර්ම පථභාවයට නො පැමිණි පිනක් වේද (එයද) හැර අකුශල කර්මයක් නොකොට බොහෝ කුසල් කොට සප්‍රාඥවූ ඒ පුද්ගල තෙම ශරීරයාගේ බිඳීමෙන් (මරණයෙන් මතු) ස්වර්ගයෙහි උපදීයයි.'

**32. පාපක සීල සූත්‍රයඃ-** 2. "මහණෙනි, ධර්ම දෙකකින් යුක්තවූ පුද්ගලතෙම ගෙනඑනලද (බරක්) බිම බහා තබනලද්දේ යම්සේද, එපරිද්දෙන් නරකයෙහිවේ. කවර කරුණු දෙකකින්ද, ලාමකවූ ශීලයෙන්ද ලාමකවූ (මිථ්‍යා) දෘෂ්ටියෙන්ද (යන දෙකිනි.) මහණෙනි, මේ කරුණු දෙකින් වනාහි සමන්විතවූ පුද්ගලයා යම්සේ ගෙනඑනලද (බරක්බිම) බහාතබන ලද්දේවේද, එපරිද්දෙන් නිරයයෙහි වේයයි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් සත්වයෙක් තෙමේ ලාමක ශීලයෙන්ද ලාමක දෘෂ්ටියෙන්ද (යන) කරුණු දෙකින් යුක්ත වූයේවේද, දුෂ්ප්‍රාඥ වූ සත්ව තෙමේ කය බිඳීමෙන් නරකයට පැමිණේයයි."

**33. භද්දක සීල සූත්‍රය:-** 2. "මහණෙනි, ධර්ම දෙකකින් යුක්ත වූයේ යම්සේ ගෙනඑනලද (බරක් බිම) බහාතබන ලද්දේවේද, එපරිද්දෙන් ස්වර්ගයෙහිවේ. කවර දෙකකින්දයත්, යහපත් ශීලයෙන්ද යහපත්වූ දෘෂ්ටියෙන්ද (යන දෙකිනි.)

"මහණෙනි, මේ කරුණු දෙකින් යුක්තවූයේ යම්සේ ගෙනඑනලද (බරක් බිම) බහාතබන ලද්දේවේද එපරිද්දෙන් ස්වර්ගයෙහි (තබන ලද්දේ) වේ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සොඳුරු ශීලයෙන්ද මනාදෘෂ්ටියෙන් යන මේ ධර්ම දෙකින් යම් සත්වයෙක් යුක්තවූයේවේද, ඒ පණ්ඩිත තෙමේ කය බිඳීමෙන් (මරණින්මතු) ස්වර්ගයට පැමිණේයයි."

**34. අනාතාපී සූත්‍රය:-** 2. "මහණෙනි, කුසීතවූ පාපයට භය නැත්තාවූ මහණතෙමේ ආර්ය මාර්ගය පිණිස සුදුස්සෙක් නොවේ. නිවන පිණිස සුදුස්සෙක් නොවේ. නිරුත්තරවූ (සතර) යොගයන්ගෙන් නිර්භයවූ අර්හත්ඵලය ලැබීමට සුදුස්සෙක් නොවේ.

"මහණෙනි, කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ (පාපයට) භය ඇත්තාවූ මහණ තෙමේ වනාහි ආර්ය මාර්ගය පිණිස සුදුසුවේ. නිර්වාණය පිණිස සුදුසුවේ. ශ්‍රෙෂ්ඨවූ (සතර) යොගයන්ගෙන් නිර්භයවූ රහත්බව ලැබීමට සුදුසුවේයයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් මහණෙක්තෙම කෙලෙස් තවනවීර්ය නැත්තේවේද, පවට බිය නැත්තේවේද, කුසීතවේද, ගිලිහුණේවේද, හීනවූවීර්ය ඇත්තේවේද, (සිතේ අලස බවවූ) ථීනයද (කයේ අලස බවවූ) මිද්ධයද බහුල කොට ඇත්තේවේද, වැඩට නොයෙදෙන බව බහුලකොට ඇත්තේවේද, පව්කිරීමෙහි ලජ්ජා නැත්තේවේද, ආදර නැත්තේවේද, එබඳු මහණතෙම උතුම්වූ රහත්බවට පැමිණෙන්නට නුසුදුස්සෙක් වේ.

"යමෙක් තෙමෙ වනාහි සිහි ඇත්තේවේද, සිහි නුවණින් හා කමටහන් පරිහරණය කරන මුහුකුරා ගිය නුවණින්ද යුක්තවූයේවේද, ධ්‍යාන කරන සුලුවේද, කෙලෙස් තවන වීර්‍ය ඇත්තේවේද, පාපයට භය ඇත්තේවේද, අප්‍රමාදයෙන් යුක්තවේද, ජාතිය හා ජරාව සමගද දසසංයොජනය මේ අත්බවෙහිම සිඳ නිරුත්තරවූ අර්හත්ඵලයට පැමිණේයයි."

**35. ජනකුහන බ්‍රහ්මචරිය සූත්‍රයඃ-** 2. "මහණෙනි, ජනයා විස්මය පත් කරවනු පිණිස ජනයා ලවා කියවනු පිණිස "මෙසේ ජනයා මා හඳුනාවා"යි සිව්පස ලැබීමය ආදර බුහුමන් ගරු කිරීමයයි කියනලද සත්කාරය උස්වනැංගාවූ කීර්ති ඝොෂය පැසසීමය යන අනුසස් පිණිස මේ ශාසන මාර්ග බ්‍රහ්මචර්‍යයෙහි නොහැසිරෙන්නේය.

"මහණෙනි, කුහනාදියෙන් අන්‍ය ප්‍රයොජනයවූම සංවරය පිණිසද ක්ලෙශ ප්‍රහානය පිණිස බඹසර වසන්නේයයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "ඒ භාග්‍යවතුන් වහන්සේ උවදුරු නසන්නාවූ සැකනැත්තාවූ ආර්ය මාර්ගයට පමුණුවන්නාවූ පහකරනු පිණිසද දෙසූසේක.

"මහත් අදහස් ඇත්තාවූ මහර්ෂීන් විසින් මේ මාර්ගය අනුව යන ලද්දේය. බුදුරජුන් දෙසනලද පරිද්දෙන් යම් යම් කෙනෙක් මේ මාර්ගයට පිළිපදිද්ද, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරන්නාවූ (ඔහු) සියලු සංසාර දුඃඛය කෙළවර කරන්නාහුය. (නිවන ප්‍රත්‍යක්ෂ) කරන්නාහුයයි."

**36. අභිඤ්ඤත්ථ බ්‍රහ්මචරිය සූත්‍රයඃ-** 2. "මහණෙනි, ජනයා පුදුම කරවනු පිණිස ජනයාලවා කියවනු පිණිස "මෙසේ ජනතෙම මා දනීවා"යි ලාභය සත්කාරය කීර්ති ප්‍රශංසාය යන අනුසස් පිණිස මේ බඹසර නොවසන්නේය, මහණෙනි, කුහනාදියෙන් අන්‍යවූම දැනීම පිණිසද පිරිසිඳ දැනීම පිණිසද මේ බඹසර වසන්නේයයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ප්‍රසිද්ධවූ භාග්‍යවතුන් වහන්සේ උවදුරු හෝ උප ක්ලෙශයන් නසන්නාවූ ආර්ය මාර්ගයට හෝ නිවනට පමුණුවන්නාවූ (මේ) බඹසර විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිසද පිරිසිඳ දැනීම පිණිසද දෙසූසේක. මහ අදහස් ඇත්තාවූ මහර්ෂීන් විසින් මේ මාර්ගය පිළිපදින ලද්දේය. බුදුරජුන් විසින් දෙසූ පරිද්දෙන් යම් යම් කෙනෙක් මේ මාර්ගය පිළිපදිද්ද, ශාස්තෘන් වහන්සේගේ අවවාදය කරන්නාවූ (ඔහුතුමූ) දුක් කෙළවර කරන්නාහුය යයි."

37. **සුඛසොමනස්ස බහුල සූත්‍රයඃ-** 2. "මහණෙනි, කරුණු දෙකකින්යුත් මහණතෙම සුවසොම්නස් බහුලකොට ඇත්තෙක්ව වෙසෙයි, ඔහු විසින් ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම (අර්හත්ඵලය) පිණිස කාරණය පිහිටුවන ලද්දීවේ. කවර ධර්ම දෙකකින්දයත්, සංවෙග ඉපදවියයුතුවූ කරුණු අටෙහි සංවෙග ඉපදවීමෙන්ද උපන් සංවෙග ඇත්තහුගේ උපාය ප්‍රධානයෙන්ද (යන දෙකෙනි.)

"මහණෙනි, මේ ධර්ම දෙකින්යුත් මහණතෙම මේ ආත්මයෙහිම සුවසොම්නස් බහුලකොට ඇත්තෙක්ව වෙසෙයි, ඒ මහණහු විසින් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම (රහත්බව) පිණිස කාරණයද සම්පූර්ණ කරන ලද්දීවේ (සපයන ලද්දීවේ) යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"කෙලෙස් තවන වීර්ය ඇත්තාවූ ස්ථානොචිත ප්‍රඥාව ඇත්තාවූ පණ්ඩිතතෙම ප්‍රඥාවෙන් මනාව දැක "මෙසේ වසන්නාවූ කෙලෙස් තවනවීර්ය ඇත්තාවූ සන්සුන් පැවතුම් ඇත්තාවූ චෙතොසමථයයි කියන ලද ආර්ය මාර්ගයෙහි යෙදුනු මහණතෙම දුඃඛ ක්ෂය සංඛ්‍යාත අර්හත් ඵලයට හෝ නිවනට පැමිණෙන්නේයයි."

---

# 5. ජාගරිය වර්ගය.

**38. තථාගත විතක්ක සූත්‍රය:-** 2. "මහණෙනි, අර්හත්වූ සියලු දතයුතු ධර්මයන් මනාව අවබොධ කළාවූ තථාගතයන් වහන්සේගේ (සම්‍යක්) විතර්ක දෙකක් සීමාව නොඉක්මවමින් පවතිත්. කවර දෙකක්ද යත්, ක්ෂේම විතර්කයද පවිවෙක විතර්කයද යන දෙකයි. මහණෙනි, තථාගතයන් වහන්සේ (සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී විහරණ කරුණා විහරණ දෙක්හි ඇලීම ඇතිසේක. අව්‍යාපාදයෙහි නිතර ඇලුණුසේක.

**3.** "මම මේ ක්‍රියාවෙන් චඤ්චල වන්නාවූ හෝ නොසැලෙන්නාවූ හෝ කිසි සත්වයෙකු නොපෙළමි. (යන) මේ කල්පනාවම අව්‍යාපාදයෙහි ඇලීම ඇත්තාවූ නිදුක් බවෙහි ඇලුනාවූ ඒ තථාගතයන් වහන්සේගේ බහුලව පවතී.

**4.** "මහණෙනි, තථාගතයන් වහන්සේ අතිශය විවෙකයෙහි ඇලීම ඇතිසේක. උතුම් විවේකයෙහි ඇලුණුසේක. ඒ උතුම් විවෙකයෙහි ඇලුම් ඇත්තාවූ අතිශය විවේකයෙහි ඇලුනාවූ තථාගතයන් වහන්සේගේ යම් අකුශලයක්වීද, ඒ සියලු අකුසල් ප්‍රහීනවීය. (එහෙයින්) මේ අතිශය විවේක විතර්කයම බහුලව පවතී.

**5.** "එහෙයින් මහණෙනි, තෙපිද නිදුක් බවෙහි ඇලීම ඇත්තෝව අව්‍යපාදයෙහි ඇලුනෝම වසවු, "අපි මේ ක්‍රියාවෙන් තස නම් වූද තහවුරුවූද (රහත්වූද) කිසිසතෙකු නොවෙහෙසමි." අව්‍යාපාදයෙහි ඇලුම් ඇත්තාවූ නිදුක් බවෙහි ඇලුනාවූ ඒ තොපගේද මේ උතුම් විවේකයම බහුලව පවතින්නේය.

**6.** "මහණෙනි, උතුම් විවේකයෙහි ඇලුම් ඇත්තෝව උතුම් විවේකයෙහි ඇලුනේව වසවු, කුමක් අකුසල්ද, කුමක් ප්‍රහීන නොවීද, කුමක් පහකරමුදැයි, අතිශය විවේකයෙහි ඇලුම් ඇත්තාවූ ප්‍රකර්ෂවිවේකයෙහි ඇලුනාවූ ඒ තොපගේ මේ ප්‍රකර්ෂවිවේකය පිළිබඳ කල්පනාවම බහුලව පවතින්නේයයි.

**7.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"අවබොධ කළාවූ (අන්‍යයන් විසින් නොඉසිලිය හැකි බුදුවරයන් විසින්ම කළයුතු දේ උසුලනසුලුවූ ඒ තථාගතයන් වහන්සේගේ කල්පනාවෝ දෙදෙනෙක් පවතිත්, නිර්භයවූ කල්පනාව පළමු වදාරන ලද්දේය. ඉන් අනතුරුව අතිශය විවේකය දෙවනුව ප්‍රකාශ කරන ලද්දේය.

8. "මොහාන්ධකාරය දුරුකරන්නාවූ නිවනට පැමිණියාවූ (නොහොත්) ප්‍රාර්ථනාවගේ හෝ සියලු සසරදුකේ හෝ සර්වඥ ගුණයන්ගේ හෝ කෙළවරට ගියාවූ මහර්ෂීවූ පැමිණියයුතු සියල්ලට පැමිණියාවූ වසීභාවයද ඇත්තාවූ (කාමාදි) ආශ්‍රව නැත්තාවූ (කාය විෂමාදී) විෂම වචනයකළාවූ වෙසෙසින් මිදුනාවූ මොන නම් ඥානයෙන් හෝ කායමොනෙය්‍යාදි ප්‍රතිපදාවෙන් අතිශයින් යුක්තවූ අන්තිම ශරීරය දරන්නාවූ පස්මරුන් පහකළාවූ ජරාවගේ එතෙරට ගියාවූ ඒ තථාගතයන් වහන්සේගේයයි කියමි.

**9.** යම්සේ ශෛල පර්වතයක් මුදුනෙහි සිටියෙක් සිටිවනම අවට ජනසමූහයා දක්නේද, ඒ ශෛල පර්වතය බඳු දහමින් කළ පහයට නැගී පහවූ ශොක ඇත්තාවූ සොඳුරු නුවණ ඇත්තාවූ සමතැස් ඇති භාග්‍යවතුන් වහන්සේ ශොකයෙන් ගැවසීගත් ජාතිජරාවන් විසින් මඩනා ලද්දාවූ ජනසමූහයා දක්නාසේකැයි."

**39. දෙශනා ද්වය සූත්‍රයː-** 2. "මහණෙනි, තථාගත නම්වූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පිළිවෙළක් අනුව ඇති දහම් දෙසුන් දෙකක් වෙත්. කවර දෙකෙක්ද යත්? පාප ධර්මය ලාමක වශයෙන් දකිව්යයි මෝතොමෝ පළමුවන ධර්ම දෙශනාවය. පව පව් වශයෙන් දැක ඒ පවෙහි කලකිරෙවු, නොඇලෙවු, මිදෙවුයයි මෝ තොමෝ දෙවන දහම් දෙසුමය.

"මහණෙනි, අර්හත්වූ මනාව අවබොධ කළාවූ තථාගතයන් වහන්සේගේ මේ දහම් දෙසුන් දෙකක් පිළිවෙළක් අනුව ඇත්තේ වෙත් යයි."

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"අනුකම්පා කරන සුලුවූ තථාගතවූ සර්වඥ බුදුරජාණන් වහන්සේගේ කාරණයෙන් හෝ වාරයෙන් දෙසීම බලව, ධර්මයෝ දෙදෙනෙක් ප්‍රකාශ කරන ලද්දාහුය.

"පව (පව් වශයෙන්) දකිවු. (යනු) එක් දෙසුමෙකි. ඒ පවෙහිද නොඇලෙවු, ඒ පවෙහි නොඇලුණු සිත් ඇත්තාවූ (තෙපි) දුක් කෙළවර කරන්නාහුය යනු දෙවන දෙසුමයයි"

**40. අවිජ්ජාපුබ්බංගම සූත්‍රයः-** 2. "මහණෙනි, අකුශල ධර්මයනට අවිද්‍යාතොමෝ පෙරදැරි වන්නීය, (අවිද්‍යාවගේ) පැමිණීමට අනුවම පවට ලජ්ජා නැතිබවද පවෙහි බිය නැති බවදවේ.

"මහණෙනි කුශලධර්මයනට විද්‍යාතොමෝ වනාහි පූර්වංගමවේ. (විද්‍යාවගේ) පැමිණීමට අනුවම හිරිඔතප් (ලජ්ජා භය) දෙක වේ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මේ ලෙව්හිද පරලෙව්හිද දූෂිතවූ යම්කිසි මේ ගතීහු වෙද්ද, විෂයයන් සෙවීම ලක්ෂණකොට ඇති ඉච්ඡාවෙන් හා සම්ප්‍රාප්ත විෂයයෙහි ඇලීම ලක්‍ෂණ කොට ඇති ලොභයෙන්ද රැස්කරනලද්දාවූ සියලු විපත් අවිද්‍යාව මුල්කොට ඇත්තීය.

"යම් අවිද්‍යා හෙතුවකින් වනාහි ලාමක අදහස් ඇති මහණතෙම පාපයට ලජ්ජා නැත්තේ වේද, ඒ හෙතුවෙන් පව් රැස්කෙරෙයි. ඒ පාපය හෙතුකොට අපායට යෙයි.

"එහෙයින් ඡන්දයද ලොභයද අවිද්‍යාවද පහකරන්නාවූ අර්හත් මාර්ගඥානය උපදවන්නාවූ මහණතෙම දුශ්චරිත සංඛ්‍යාත සියලු දුර්ගතීන් නොහොත් සසර දුකට පිහිට වන බැවින් සියලු පඤ්චගතීන් දුරුකරන්නේයයි"

**41. අරියපඤ්ඤා සූත්‍රයः-** 2. "මහණෙනි, යම් සත්ව කෙනෙක් ආර්ය ප්‍රඥාවෙන් ඒ සත්වයෝ අතිශයින් පිරිහුනෝ වෙති. ඒ සත්වයෝ මේ ආත්මයෙහිම පීඩා සහිතව දැඩි ආයාස

සහිතව හාත්පස දාහ සහිතව දුකසේ වෙසෙති. තමාගේයයි සිතාගත් ස්කන්ධයන්ගේ භෙදයෙන් මරණින් මත්තෙහි දුගතියක් කැමති විය යුත්තීය.

"මහණෙනි, යම් සත්වකෙනෙක් ආර්ය ප්‍රඥාවෙන් නොපිරිහුනෝ වෙද්ද, ඒ ස්කන්දයෝ මේ අත්බවෙහිම පීඩානැතිව දැඩි ආයාස නැතිව හාත්පස දැවිලි නැතිව සුවසේ වෙසෙති. ශරීරයාගේ භෙදයෙන් චුති චිත්තයන් මත්තෙහි සුගතියක් කැමති විය යුත්තීයයි."

**3.** මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි ගාථාවෙන් මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"පිරිහීමෙන් නාමරූප දෙක්හි උපාදානස්කන්ධය පසෙහි පිහිටියාවූ දෙවියන් සහිත ලෝවැස්සා බලව, මෙයම සත්‍යය හඟී.

"සංස්කාර ලොකයෙහි යම් ප්‍රඥාවක් තොමෝ පළමින් යන සුලුවේද, යම් ප්‍රඥාවකින් ඉපදීම හා භවයද ක්ෂය කරන්නාවූ නිවන මනාව දැන ගනීද, ඒ මාර්ග ප්‍රඥා තොමෝ ශ්‍රෙෂ්ඨ වන්නීමය.

"දෙවියෝද මිනිස්සුද මනාව අවබොධකළාවූ සිහි ඇත්තාවූ සන්තොෂප්‍රමෝද්‍ය බහුල ප්‍රඥාව ඇත්තාවූ (නොහොත්) විපුලභාවයට පැමිණි හාස ප්‍රඥාව ඇත්තාවූ අන්තිම ශරීරය දරණ ක්ෂීණාශ්‍රවයන්ට ප්‍රියවෙත්. (ඒ රහත් බව ලබන්නට කැමැති වෙත්.) යයි"

**42. සුක්කධම්ම සූත්‍රය:-** 2. "මහණෙනි, මේ ශුක්ලධර්මයෝ දෙදෙනෙක් සත්ව ලොකය රකිත්. කවර දෙදෙනෙක්ද යත්? පවට ලජ්ජාවද පවට භයද (යන දෙකය.)

"මහණෙනි, මේ කුසල් දහම් දෙක මේ ලොව නොරක්නාහු නම් මේ සත්ව ලොකයෙහි මවයයි කියා හෝ කුඩා මව යයි කියා හෝ නැන්දනියයි කියා හෝ ආචාර්යයන්ගේ භාර්යාවයයි කියා හෝ ගරුකටයුත්තන්ගේ බිරියයි කියා හෝ නොපෙණෙන්නේය. එළු තිරෙළුවෝද කුකුළු ඌරෝද බලු

සිවල්ලුද යම්සේද ලෝවැස්සා (එපරිද්දෙන්) සංකරයට සීමා භෙදයට හෝ පැමිණෙන්නේය.

"මහණෙනි, යම් හෙතුවකින් වනාහි මේ අනවද්‍ය ධර්මයෝ දෙදෙන ලොව රකිද්ද, එහෙයින් මවයයි කියාද කුඩා මවයයි කියාද නැන්දනීයයි කියාද ඇදුරු බිරියයයි කියාද ගරුකටයුත්තන්ගේ අඹුවයයි කියාද, පෙණෙන්නේ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අරුත මෙසේ කියනු ලැබේ.

"යම් සත්වයන්ගේ හිරිඔතප් දෙක හැමදාම නොලැබේද, කුසල් මුලින් ඉවත්වූ ඒ සත්වයෝ ජාති මරණයන්ට පැමිණෙන්නාහුය.

"යම් සත්වයන්ගේ වනාහි හැමකල්හි හිරිඔතප් දෙක මනාව එළඹ සිටියාහුද, වැඩුණු ශාසන මාර්ග බ්‍රහ්මචරිය ඇත්තාහු වෙද්ද, සත්පුරුෂවූ (ඔහු) ක්ෂයවූ නැවත ඉපදීම ඇත්තෝ වෙත්යයි."

43. **අජාතභූත සූත්‍රයː**- 2. "මහණෙනි, නොඋපන්නාවූ පහළනොවූ නොකරන ලද්දාවූ නිවන ඇත.

"මහණෙනි, ඉදින් නොඋපන්නාවූ පහළ නොවූ නොකරන ලද්දාවූ සකස් නොකරන ලද්දාවූ ඒ නිවන නොවීනම් මෙලොකයෙහි උපන් පහළවූ කරන ලද්දාවූ සංස්කරනය කරන ලද්දාවූ ස්කන්ධ පඤ්චකයාගේ නිස්සරණයෙන් නොපෙණෙන්නේය. මහණෙනි, යම්හෙයකින් වනාහි නොඋපන් පහළ නොවූ නොකරන ලද්දාවූ පිළියෙල නොකරන ලද්දාවූ නිවන විද්‍යමාන වේද, එහෙයින් උපන්නාවූ පහළවූ කරන ලද්දාවූ සකස් කරන ලද්දාවූ, පඤ්චස්කන්ධයාගේ නිස්සරණය සංසිඳීම පෙණේයයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"උපන්නාවූ ප්‍රත්‍යයන් කරන ලද්දාවූ ස්ථිර නොවූ ජරා මරණයෙන් පෙළෙන ලද්දාවූ ගැටුණු රොගයන්ට

කැදැල්ලක් බඳුවූ නැසෙනසුලුවූ ආහාරය හා තෘෂ්ණාවද ප්‍රභවකොට ඇත්තාවූ ඒ පඤ්චුපාදානස්කන්ධය (දෘෂ්ටීන්) සතුටු වන්නට සුදුසු නොවේ.

"ඒ සත්කායයාගේ නැතිකිරීමවූ ශාන්තවූ තර්කඥානයට ගොචර නොවූ ස්ථිරවූ නොඋපන්නාවූ පහළ නොවූ ශොක නැත්තාවූ පහවූ කෙලෙස් රජස් ඇත්තාවූ පිළිපැදිය යුතුවූ දුඃඛ ධර්මයන්ගේ නිරොධයවූ සංස්කාරයන්ගේ සංසිඳීමවූ සැපයවූ නිවන ඇත."

**44. නිබ්බානධාතුමය සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ නිර්වාණ ධාතුහු දෙදෙනෙක් වෙත්. කවර දෙකක්දයත්? සවුපාදිශෙෂ නිර්වාණ ධාතුවය, අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවය (පඤ්චස්කන්ධයශෙෂ නොවූ නිර්වාණධාතුවය යන දෙකය.)

"මහණෙනි, සවුපාදිශෙෂ නිර්වාණධාතුතොමෝ කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ක්ලෙශයන්ගෙන් දුරුවූයේ වේද, ක්ෂය කරනලද ආශ්‍රවයන් ඇත්තේවේද, නිමවූ විසීම ඇත්තේවේද, කරනලද කටයුතු ඇත්තේවේද, බහා තබනලද තුන්බර ඇත්තේවේද, පැමිණි ස්වකීය අර්ථය ඇත්තේවේද, ක්ෂයවූ භව සංයෝජනයන් ඇත්තේවේද, මනාකොට දැන ක්ලේශයන්ගෙන් මිදුනේවෙද, ඒ රහත්හුගේ පඤ්චෙන්ද්‍රියයෝ සිටිත්මය. යම් ඉඳුරන්ගේ මනවඩන්නාවූද මන නොවඩන්නාවූද, රූපාදි ගෝචරය විඳී, (ලබයි.) (විපාකය) සුවදුක් විඳියි ඔහුගේ රාගය ක්ෂය වීය. ද්වෙෂය ක්ෂයවිය, මෝහය ක්ෂයවීය. මහණෙනි මේ සවුපාදිශෙෂ නිර්වාණධාතු යයි කියනු ලැබේ.

3. "මහණෙනි, අනුපාදිශෙෂ නිර්වාණධාතු තොමෝ කවරීද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම රහත්වේද, ක්ෂයවූ ආශ්‍රවයන් ඇත්තේ වේද, නිමවූ බඹසර විසීම ඇත්තේ වේද, කරනලද කටයුතු ඇත්තේවේද, බහා තබනලද බර ඇත්තේවේද? පැමිණි ස්වකීය අර්ථ ඇත්තේවේද, ක්ෂය කරන ලද භවයංයෝජනයන් ඇත්තේවේද, මනාව දැන මිදුණේවේද, මහණෙනි, ඒ භික්ෂුවගේ වේදනාවෝ සතුටු නොවන ලද්දාහු

සංස්කාර සමථයන්ගේ සංසිඳීමෙන්ද සිහිල් වන්නාහුය. මහණෙනි, මෝ අනුපාදිශෙෂ නිර්වාණධාතුයයි කියනු ලැබේ.”

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“ඇසුරු නොකළාවූ රාගාදිබන්ධනයෙන් නොබැඳුණාවූ එක ස්වභාව ඇත්තාවූ පසැස් ඇත්තාවූ බුදුන් වහන්සේ විසින් මේ නිර්වාණ ධාතුදෙකෙක් ප්‍රකාශ කරනලද්දාහුය. (ඔවුනතුරින්) මේලොකයෙහි මේ ආත්ම බවෙහිවූ (වර්තමානවූ) තෘෂ්ණාව ක්ෂයවූ එක් නිර්වාණ ධාතුවක් වනාහි සඋපාදිශෙෂ නිර්වාණධාතු නම් වේ.

“යම් අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙක්හි සර්වප්‍රකාරයෙන් ඉපදීම භවයෝ නොපවතිද්ද, යම් ආර්ය කෙනෙක් ප්‍රත්‍යයන් විසින් නොකරනලද්දාවූ පැමිණෙන ලද්දාවූ මේ නිවන දැන තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් (කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇත්තාහුවෙද්ද, ඒ ආර්යයෝ ධර්මයන්හි සාරයවූ රහත් බව ලැබීමෙන් නිර්වාණයෙහි ඇලුනාහු නොසැලෙන්නාහු සියලු භවයන් පහකළහ. ඉන් ඔබ්බෙහි අනුපාදිශෙෂ නිර්වාණධාතුව නමි.”

**45. පටිසල්ලානරත සූත්‍රයः-** 2. “මහණෙනි, කාය විවේකයෙහි ඇලුනෝව තමාගේ චිත්ත සමථයෙහි යෙදුනෝව නොසනසන ලද ධ්‍යාන ඇත්තෝව විදර්ශනා ඥානයෙන් යුක්ත වූවෝව ශූන්‍යාගාරයන් වඩන්නෝව වසවු.

“මහණෙනි, කාය විවේකය වූ කාය විවේකයෙහි ඇලුනාවූ තමාගේ සිත සංසිඳීමෙහි යෙදී වසන්නාවූ බැහැර නොකරන ලද ධ්‍යාන ඇත්තාවූ විදර්ශනාඥානයෙන් යුක්තවූ ශූන්‍යාගාරයන් වඩන්නවුන්ට මේ ආත්මභාවයෙහිම රහත් බව හෝ උපාදිශෙෂය කල්හි අනාගාමිබව හෝ (යන) දෙපලයන් අතුරෙන් එක්තරා පලයක් කැමතිවිය යුතුයයි.

3. “මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් යෝගාවචරකෙනෙක් සන්සුන් සිත් ඇත්තාහු වෙද්ද, නුවණ ඇත්තාහු වෙද්ද, සිහි ඇත්තාහුම වෙද්ද, ධ්‍යාන කිරීමෙහි යෙදුනාහු වෙද්ද, ඇලුම් නැත්තා වූ (ඒ යෝගීහු) මනාකොට (පඤ්චස්කන්ධ) ධර්මය වෙසෙසින් බලත්,

"අප්‍රමාදයෙහි ඇලුනාවූ ශාන්තවූ කුසල් සිත නොයෙදීම නම් ප්‍රමාදයෙහි භය දක්නාවූ පුද්ගලයෝ පිරිහීමට නුසුදුස්සෝ වෙත්, නිර්වාණයාගේම සමීපයෙහි වේ යයි."

**46. ශික්ෂානිසංස සූත්‍රයඃ-** 2. "මහණෙනි, ත්‍රිවිධ ශික්ෂාවන්ගේ අනුසස් ඇත්තෝව ප්‍රඥාව උතුම්කොට ඇත්තෝව විමුක්ති සාරය ඇත්තෝව සිහිය අධිපතිකොට ඇත්තෝව වසවු.

**3.** "මහණෙනි, ශික්ෂාවන් අනුසස්කොට ඇතිව ප්‍රඥාව ප්‍රධානකොට ඇතිව විමුක්ති සාරය ඇතිව සිහිය අධිපති කොට ඇතිව වසන්නවුන්ට මේ ආත්මභාවයෙහිම අර්හත්ඵලය හෝ ක්ලේශොපාදිශෙෂය පහකරන්ට නොහැකි නුවණ ඇති කල්හි අනාගාමි ඵලය හෝ එක්තරා ඵලයක් කැමැතිවිය යුතුයයි."

**4.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සම්පූර්ණවූ ශික්ෂාව ඇත්තාවූ නොකිපුණු (නොපිරිහුණු) ධර්ම ඇත්තාවූ ප්‍රඥාව ශ්‍රෙෂ්ඨකොට ඇත්තාවූ ජාතියගේ ක්ෂයවූ නිවන (නොහොත්) ඉපදීම හා මරණයගේ ක්ෂයවූ නිවණ දක්නාසුලුවූ අවසන් සිරුර දරන්නාවූ මානය පහකළාවූ ජරාවගේ කෙළවරවූ නිවණට පැමිණියාවූ ඒ රහත්හු ඒකාන්තයෙන් මුනි යයි කියමි.

"එහෙයින් මහණෙනි, සදහටම ධ්‍යානයෙහි ඇලුනාහු සමාධියෙන් යුක්තවූවාහු කෙලෙස් තවන වීර්ය ඇත්තාහු ජාතියගේ ක්ෂයවූ නිවන දක්නාසුලු වූවාහු සෙනාව සහිතවූ (සතර) මරහුම මැඩ ජාති මරණයාගේ එතෙරට ගියාහුවමු යයි"

**47. ජාගරකාල විපස්සී සූත්‍රයඃ-** 2. "මහණෙනි, මහණතෙම නිදිදුරුකරන්නෙක්ද වන්නේය. සිහි ඇත්තෙක්ද වන්නේය.

සම්‍යක් ප්‍රඥා ඇත්තෙක්ද වන්නේය. එකඟ සිත් ඇත්තෙක්ද වන්නේය. සතුටු සිතැත්තෙක්ද වන්නේය. විශෙෂයෙන් පැහැදුනෙක්ද වන්නේය. කුශල ධර්මයන්හි එකල්හි හෝ කර්මස්ථානානුයෝගයෙහි කාලානුරූපව හෝ විදර්ශනාව කරන්නෙක්ද වන්නේය.

3. "මහණෙනි, නිදි දුරුකරන්නෙක්ව වසන්නාවූ සිහි ඇත්තාවූ සම්‍යක් ප්‍රඥාව ඇත්තාවූ ප්‍රමුදිතවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ කුශල ධර්මයන්හි එකල්හි හෝ ඒ කමටහන්හි යෙදීමෙහි හෝ කලට සුදුසු පරිද්දෙන් විදර්ශනා කරන්නාවූ මහණහු විසින් මේ ආත්මයෙහිම රහත්බව හෝ උපාදිශෙෂය ඇතිකල්හි අනාගාමීබව හෝ දෙපලයන් අතුරෙන් එක් ඵලයක් කැමතිවිය යුතුයයි.

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "නිදි දුරුකරන්නාහු මේ (මාගේ) වචනය අසවු, යම් කෙනෙක් නිද්‍රෝපගතවූවාහු වෙද්ද, ඒ තෙපි පිබිදෙවු, නිදීමට වඩා නිදි දුරු කිරීම අතිශයින් පැසසිය යුත්තේය. නිදි දුරුකරන්නාහට භය නැත.
>
> "යමෙක් ප්‍රමාද නිද්‍රාව දුරුකරන්නේවේද, සිහි ඇත්තේවේද, සම්‍යක් ප්‍රඥාව ඇත්තේවේද, සමාධියෙන් යුක්තවේද, සතුටු සිත් ඇත්තේවේද, විශෙෂයෙන් ප්‍රසන්නවූයේවේද, කාලයෙහි සුදුසු ත්‍රෛභූමක ධර්මය මනාව විමසන්නේ (සියලු අයුරෙන් විදර්ශනා කරන්නේ සුදුසු උපන් මාර්ග සමාධිය ඇත්තේ මාර්ග ප්‍රතිවේධ කාලයෙහි මනාකොට චතුස්සත්‍ය ධර්මය පරිඥ්ඥාභිසමයාදී වශයෙන් විමසන්නේවේද, ඒ ආර්ය ශ්‍රාවකතෙමේ (අර්හත් මාර්ගයෙන් මොහය නසන්නේය. එහෙයින් ඒකාන්තයෙන් නිදි දුරුකිරීම සෙවුනේය. කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ ස්ථානොචිත ප්‍රඥාව ඇත්තාවූ ධ්‍යානලාභීවූ ඒ මහණතෙම (දස) සංයෝජනයද ජාති ජරාවන්ද සිඳ මෙහිදීම උතුම්වූ අග්‍රඵල සංඛ්‍යාත සම්බොධියට පැමිණෙන්නේ යයි."

**48. අපායික අභූතවාදී සූත්‍රය**:- 2. "මහණෙනි, මේ නොහැර අපායෙහි උපදින්නාවූ නිරයෙහි උපදින්නාවූ මේ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්ද යත්? යමෙක්තෙම බඹසර නොහැසිරෙන සුලුවූයේ (මම) බ්‍රහ්මචාරීයයි ප්‍රතිඥා කිරීම ඇත්තේ වේද, යමෙක් වනාහි සම්පූර්ණවූ පිරිසිදු බඹසර හැසිරෙන්නාවූ භික්ෂුවකට බඹසර නැතැයි චොදනා කෙරේද?

"මහණෙනි, මේ පාප සමාචාරය අත්නොහැර (සතර) අපායෙහි උපදින්නාවූ, නරකයෙහි උපදින්නාවූ මේ පුද්ගලයෝ දෙදෙන වෙත් යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ:-

"අසත්‍යයෙන් යමෙක් වනාහි (පව්කම්) කොට මම නොකරමියි කියාද, පරලෙව්හි මෙයින් ගොස් ලාමක ක්‍රියා ඇත්තාවූ ඒ මනුෂ්‍යයෝ දෙදෙනම (ගතියෙන්) සමාන වෙත්.

"කසට පෙවූ වස්ත්‍රයෙන් හාත්පස දැවටූ ග්‍රීවය ඇත්තාවූ ලාමක ස්වභාව ඇත්තාවූ සංයමය නැත්තාවූ ඒ බොහෝ එබඳු පාපපුද්ගලයෝ පව්කමින් නරකයෙහි උපදිත්. සංවර නැත්තාවූ සිල් නැති පුද්ගලයෙක් ඉදින් රටවැස්සන් විසින් දෙන යම් ආහාරයක් වළඳන්නේද, දිලිසෙන්නාවූ ගිනිසිළක් බඳුවූ යකඩගුලි අනුභව කරන ලද්දේ උතුම්යි."

**49. දිට්ඨිගතද්වය සූත්‍රය**:- 2. "මහණෙනි, මේ දෘෂ්ටි දෙකකින් මැඩුණු (නොහොත්) පළිබොධවූ දිව්‍යමනුෂ්‍යයෝ ඇලෙත්. ඇතැම් කෙනෙක් (උච්ඡෙදයෙහි) අතිධාවනය කෙරෙත්. ඇතැම් කෙනෙක් දිවැස් ඇත්තවුන් මෙන් දකිත්.

"මහණෙනි, කෙසේ නම් ඇතැම් කෙනෙක් ඇලෙද්ද? මහණෙනි, භවයෙන් සතුටුවන්නාවූ භවයන්හි ඇලුනාවූ භවයන්හි මනාව සන්තොෂ වන්නාවූ දිව්‍ය මනුෂ්‍යයෝ වෙත්. ඔවුන්ට භවයන් නූපදවනු පිණිස දහම්දෙසනු ලබන කල්හි සිත බැස නොගණී, නොපහදී, නොපිහිටයි නොඅදහයි. මහණෙනි, මෙසේ වනාහි ඇතැම් කෙනෙක් ඇලෙති.

3. "මහණෙනි, කෙසේ නම් ඇතැම් කෙනෙක් අති ධාවනය කෙරෙද්ද, "මහණෙනි, ඇතැම් කෙනෙක් භවයෙන්ම පෙළෙන්නාහු ලජ්ජාවන්නාහු, පිළිකුල්වන්නාහු 'පින්වත්නි' යම් කලෙක්හි තෙමේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සිඳෙන්නේය. වැනසෙන්නේය. මරණයෙන් මතු නොවන්නේය. මේ උච්ඡේදය ශාන්තය, මේ උච්ඡේදය ප්‍රණීතයයි මෙසේ දෘෂ්ටියට සතුටුවීමෙන් සත්‍යයට විපරිත වශයෙන් දුවද්ද, (ඔහු) උච්ඡේදයට සතුටු වෙති. මහණෙනි, මෙසේ වනාහි ඇතැම් කෙනෙක් අතිධාවනය කෙරෙත්.

4. "මහණෙනි, කෙසේවනාහි ඇතැම් කෙනෙක් නුවණ ඇස් ඇත්තහු දකිත්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ භූත නම්වූ ස්කන්ධ පඤ්චකය දැක භූත නම් ත්‍රෛභූමක ධර්ම සමූහයට කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේවේද, මහණෙනි, මෙසේ වනාහි ඇතැම් කෙනෙක් නුවණ ඇස් ඇත්තාහු දකිත් යයි."

5. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "යම් ආර්යශ්‍රාවක කෙනෙක් පඤ්චස්කන්ධය අවිපරීත ස්වභාවයෙන් දැක ස්කන්ධ පඤ්චක භාවනාභිසමයෙන් ඉක්මවූවාහු වෙද්ද, භව තෘෂ්ණාව අවිපරීත සත්‍ය ස්වභාවයවූ නිර්වාණයෙහි මිදෙත්. පිරිසිඳ දක්නා ලද පඤ්චස්කන්ධය ඇත්තාවූ ලොකු කුඩා භවයෙහි (රහත්) මහණතෙම උපාදානස්කන්ධයයි කියනලද ආත්මභාවය නොඉපදවීමෙන් පැනවීමක් නැති බවට යෙත් යයි."

(දුක නිපාතය නිමි.)

---

## 6. මාරධෙය්‍ය වර්ගය

**50. අකුසල මූල සූත්‍රයː-** 2. "මහණෙනි, මේ අකුසල්මුල් තුනක් වෙත්. කවර තුනක්ද යත්? ලොභය අකුසල් මුලෙක,

ද්වෙෂය අකුසල් මුලෙක, මොහය අකුසල් මුලෙක. මහණෙනි, මේ වනාහි අකුසල් මුල් තුන වෙත් යයි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"තමා කෙරෙහි උපන් ලොභයද ද්වෙෂයද මොහයද පොත්ත හරයකොට ඇතිඋණ බටාදීගස් ස්වකීය පීදීම මෙන් ලාමක සිත් ඇති පුද්ගලයා මත්තෙහි විපාක අවස්ථාවෙහි පෙළත් යයි"

**51. ධාතුත්තය සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ ධාතු තුනක් වෙත්. කවර තුනක්ද යත්? රූප ධාතුවය (රූපභවය) අරූප ධාතුවය (අරූපභවය) නිරොධ ධාතුවය (නිර්වාණය) යන තුන වෙත්. මහණෙනි, මේ වනාහි තුන් ධාතුහු වෙත්යයි"

8. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි (ගාථාවෙන්) මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් කෙනෙක් රූපය පිළිබඳ ධර්මප්‍රවෘත්තිය දැන අරූපාවචර ධර්මයන්හි නොපිහිටියාහු වෙද්ද, යම් කෙනෙක් නිවණෙහි මිදෙද්ද, ඒ රහතුන් වහන්සේ මරණය ඉක්මවූවාහු වෙති.

"ආශ්‍රවයන් නැත්තාවූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ නාම කයින් ස්කන්ධාදී උපාධිරහිතවූ (නැවත ඉපදීමට හේතුවන දේ නැති) නිර්වාණ ධාතුවට පැමිණ (ඒ ස්කන්ධාදී සියලු උපධීන්ගේ දුරලීමට කරුණු ප්‍රත්‍යක්ෂ කොට ශොක නැත්තාවූ කෙලෙස් නැත්තාවූ නිර්වාණ පදය දෙසූසේකැයි"

**52. වේදනාත්තය සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ වේදනාවෝ තුන්දෙනෙක් වෙති. කවර තුන්දෙනෙක්ද යත්? සැප වේදනාවය, දුඃඛ වේදනාවය, උපෙක්ෂා වේදනාවය (යන තුනය.) මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ වේදනාවෝ වෙත්යයි"

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"බුදුරජුන්ගේ මනාකොට දන්නාවූ සිහි ඇත්තාවූ ශ්‍රාවකතෙමේ වේදනාවන්ද වේදනාවන්ගේ ඉපදීමද වේදනාවෝ මෙතෙකැයිද විශෙෂයෙන් දනී.

"යම් අරමුණෙක්හි වෙදනාවෝ නිරුද්ධ වෙද්ද, වෙදනාවන් ක්ෂය කිරීමට පමුණුවන්නාවූ (ආර්‍ය) මාර්ගයද දනී. (රහත්) මහණ තෙම වෙදනාවන්ගේ ක්ෂය කිරීමෙන් (ප්‍රහීණවූ) තෘෂ්ණාව ඇත්තේ ක්ලෙශපරිනිර්වාණයෙන්ද ස්කන්ධපරිනිර්වාණයෙන්ද පිරිනිවියේ වේයයි"

**53. දට්ඨබ්බ වෙදනා සූත්‍රය:-** 2. "මහණෙනි, මේ වෙදනා තුනක් වෙත්. කවර තුනක්ද යත්? සැප වෙදනාවය, දුක් වෙදනාවය, උපෙක්ෂා වෙදනාවය. මහණෙනි, සැප වෙදනා තොමෝ දුක් වශයෙන් දතයුත්තීය. දුක් වෙදනා තොමෝ උලයයි දතයුත්තීය. උපෙක්ෂා වෙදනා තොමෝ අනිත්‍ය වශයෙන් දතයුත්තීය.

3. "මහණෙනි, යම් කලෙක්හි හෝ යම්හෙයකින් මහණහු විසින් සැප වෙදනා තොමෝ දුක් වශයෙන් දක්නා ලද්දී වේද, දුක් වේදනා තොමෝ උල් වශයෙන් දක්නාලද්දී වේද, උපෙක්ෂා වේදනා තොමෝ අනිත්‍ය වශයෙන් දක්නා ලද්දී වේද, මහණෙනි, මේ මහණතෙමේ (කෙලෙසුන්ගෙන්) දුරුව සිටියේය. මනාකොට දක්නාසුලුය, තෘෂ්ණාව සින්දේය. සංයෝජනය මුල් නැත්තක් කෙළේය. මානයාගේ දැකීමෙන්ද දුරුකිරීමෙන්ද සංසාර දුඃඛය කෙළවර කෙළේ යයි කියනු ලැබේ යයි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් ආර්‍ය ශ්‍රාවකයෙක් සුඛ වේදනාව දුක් වශයෙන් දිටීද, දුක්ඛ වේදනාව උල්වශයෙන් දිටීද, ශාන්තවූ ඒ උපෙක්ෂා වෙදනාව අනිත්‍ය වශයෙන් දිටීද,

"යම් හෙයකින් ඒකාන්තයෙන් මනාකොට දක්නා සුලුවූ ඒ මහණතෙමේ ඒ වේදනාවෙහි මිදේද, ඉර්ධි විධාදී අභිඥාසයින් අවසන් කළාවූ සන්සිඳවූ ඒ මුනිතෙමේ ඒකාන්තයෙන් යොගයන් ඉක්මවූයේයයි"

**54. එසනා සූත්‍රය**:- 2. "මහණෙනි, මේ සෙවීම් තුනක් වෙත්. කවර තුනක්ද යත්? කාමයන්ගේ සෙවීමය, භවයන්ගේ සෙවීමය, බ්‍රහ්මචරියාවගේ සෙවීමය (යනතුන වෙත්.)

"මහණෙනි, මේ සෙවීම් තුන වෙත්යයි මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

"එකඟ සිත් ඇත්තාවූ සම්‍යක් ප්‍රඥාව ඇත්තාවූ සිහි ඇත්තාවූ බුද්ධ ශ්‍රාවකතෙම සෙවීම්ද සෙවීම් ඉපදීමට හෙතුවූ අවිද්‍යාදීන්ද දනීද,

"යමෙකුගේ මේ සෙවීම් නිරුද්ධ වෙද්ද, සෙවීම් ක්ෂය කිරීමට පමුණුවන මාර්ගයද විශෙෂයෙන් දනීද, මහණ තෙම සෙවීම් ක්ෂයවීමෙන් තෘෂ්ණාව නැත්තේ පිරිනිව්යේයයි."

**55. (දෙවන) එසනා සූත්‍රය**:- 2. "මහණෙනි, මේ සෙවීම් තුනක් වෙති. කවර තුනක්ද යත්? කාමයන් සෙවීමය භවයන් සෙවීමය, බඹසර සෙවීමය (යන තුනය) මහණෙනි, මේ වනාහි සෙවීම් තුනයයි.

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක, එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

"බඹසර සෙවීම සමග කාමයන් සෙවීමය භවයන් සෙවීමය මෙසේ වරදවා ගන්නාවූ සියලු අනර්ථ දෘෂ්ටීහු සියලු රාගයෙන් නොඇලුනාවූ තෘෂ්ණා ක්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි මිදුණු (රහත්) හු විසින් සෙවීම පහකරන ලද්දීය. බ්‍රහ්මචරිය පරියෙසනායයි කියන ලද (මිථ්‍යා) දෘෂ්ටීහු සහමුලින් නසන ලද්දාහුය. සෙවීම ක්ෂය වීමෙන් (යොගීතෙමේ) බිඳදැමූ කෙලෙස් ඇත්තේ වේ. ආශ්‍රවයන් නැත්තේවේ. කෙසේදෝ කෙසේදෝ (පැවැති) සැකය නැත්තේ වේයයි"

**56. (පළමුවන) ආශ්‍රව සූත්‍රය**:- 2. "මහණෙනි, මේ ආශ්‍රවයෝ (කලක් පවතිමින් එන කෙළෙස්) තුන්දෙනෙක් වෙත්. කවර

තුනක්ද යත්? කාමාශ්‍රය, භවාශ්‍රවය අවිද්‍යාශ්‍රවය (යන තුනය) මහණෙනි, මේ වනාහි තුන් ආශ්‍රවයෝ වෙති.”

**2.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

“එකඟවූ සිත් ඇති සම්‍යක් ප්‍රඥාව ඇත්තාවූ සිහිය ඇත්තාවූ බුද්ධ ශ්‍රාවකතෙම ඉදින් ආශ්‍රවයන්ද ආශ්‍රවයන්ගේ ඉපදීමට හෙතුව විශෙෂයෙන් දනීද,

“යම්තැනෙක්හි මේ ආශ්‍රවයෝ නොපවතිද්ද, ක්ෂය කිරීමට පමුණුවන්නාවූ මාර්ගයද දනීද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් තෘෂ්ණාව නැත්තාවූ (රහත්) මහණ තෙම පිරිනිවියේයයි”

**57. (දෙවන) ආශ්‍රව සූත්‍රයඃ-** 2. “මහණෙනි, මේ ආශ්‍රවයෝ තුන්දෙනෙකි. කවර තුනක්ද යත්? කාමාශ්‍රවය, භවාශ්‍රවය අවිද්‍යාශ්‍රවය (යන තුනය.) මහණෙනි, මේ වනාහි ආශ්‍රවයෝ තුන්දෙන වෙත් යයි.”

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“යමෙකුගේ කාමාශ්‍රවය ක්ෂයවීද, අවිද්‍යා තොමෝද පහවූවාද, භවාශ්‍රය සර්වප්‍රකාරයෙන් ක්ෂයවූයේද ක්ලෙශයන්ගෙන් විශෙෂයෙන් මිදුනාවූ කෙලෙස් නැත්තාවූ ඒ මහණතෙම සේනාව සහිත මාරයා සිඳ අන්තිම ශරීරය දරා යයි.”

**58. තෘෂ්ණා සූත්‍රයඃ-** 2. “මහණෙනි, මේ තෘෂ්ණා තුනක් වෙත්. කාමතෘෂ්ණාවය, භවතෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යන තුනය. මහණෙනි, මේ වනාහි තෘෂ්ණා තුනයයි.”

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“තෘෂ්ණා නම් යොගයෙන් භවයොගයෙන්ද බැඳුනාවූ ඇලුණු සිත් ඇත්තාවූ මාරයාගේ මලපුඩුවේ බැඳුනාවූ උපදවන්නාවූ ඒ පුද්ගලයෝ නිර්භයවූවාහු නොවෙති.

"ඉපදීමට හා මරණයට පැමිණෙනසුලුවූ (ඒ) සත්වයෝ සසරට යෙති. යම් සත්වකෙනෙක් වනාහි තෘෂ්ණාව පහකොට ලොකු කුඩා භවයෙහි තෘෂ්ණාව නැත්තාහු වෙද්ද, යම්කෙනෙක් ආශ්‍රව ක්ෂය සංඛ්‍යාත අර්හත්ඵලයට පැමිණියාහු වෙද්ද, ඒ සත්වයෝම එතරට (නිවණට) ගියාහු වෙත් යයි"

**59. මාරධෙය්‍ය සූත්‍රයː-** 2. "මහණෙනි, කරුණු තුනකින් යුත් මහණතෙමේ මාරයාට යටත් පෙදෙස ඉක්මවා හිරුමෙන් බබළයි. කවර කරුණු තුනකින්ද යත්?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ අශෛක්ෂවූ (මතුමත්තෙහි නොහික්මිය යුතු බැවින්) අශෛක්ෂයනට අයත්වූ ශීලරාශියෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂ සමාධි රාශියෙන් යුක්තවූයේ වේද අශෛක්ෂ ප්‍රඥා රාශියෙන්ද යුක්තවූයේ වේද, මහණෙනි, මේ කරුණු තුනෙන් වනාහි යුක්තවූ මහණතෙමේ මාරයාට අධිපති තැන මැඩ හිරුසේ බබළායයි."

**3.** භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් රහත් පුද්ගලයෙකු විසින් ශීලයද සමාධියද ප්‍රඥාවද යන මේ අශෛක්ෂ ධර්මයෝ නොකොට වඩන ලද්දාහුද (හෙතෙම) මාරයාට යටත් පෙදෙස ඉක්මවා හිරුමෙන් බබළා යයි"

**(6 මාරධෙය්‍ය වර්ගය නිමි.)**

---

## 7. පුණ්‍යක්‍රියා වර්ගය

**60. පුණ්‍යක්‍රියා සූත්‍රයː-** 2. "මහණෙනි, මේ පින් කිරියවත් තුනෙකි. කවර තුනෙක්ද යත්? දානමය පුණ්‍යක්‍රියාවස්තුවය. ශීලමය පුණ්‍යක්‍රියා වස්තුවය, භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුවය, මහණෙනි, මේ වනාහි තුන් පින් කිරියවතියි.

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"හෙතෙමේ මත්තෙහි අග්‍රවූ හෝ මත්තෙහි උතුම්වූ හෝ අතිශයින් අග්‍රවූ හෝ මනොඥ ඵලයෙන් අග්‍රවූ හෝ සැප විපාක ඇති පිනම රැස්කරන්නේය. දානයද චරියාවවූ ශීලයද මෙත් සිතද වඩන්නේය. සප්‍රාඥතෙම සුව අනුසස් ඇති මේ කුසල ධර්ම තුන වඩා නිදුක්වූ සුවවූ බඹ ලොවට උත්පත්ති වශයෙන් පැමිණේයයි."

**61. චක්ඛුස් සූත්‍රයː-** 2. "මහණෙනි, මේ ඇස් තුනෙකි. කවර තුනෙක්ද යත්? මසැසය දිවැසය නුවණ ඇසය. මහණෙනි, මේ වනාහි ඇස්තුනයයි."

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"පුරුෂයනට උතුම්වූ සම්මාසම්බුද්ධයන් වහන්සේ මසැසය, (ප්‍රකෘතියෙන් පිහිටි ඇස) දිවැසය, නිරුත්තරවූ නුවණ ඇසය (යන) මේ ඇස්තුන වදාළසේක.

"මසැසගේ ඉපදීම දිවැසට උපාය හෙවත් කරුණු වේ. යම්කලෙක්හි ඥානය පළවේද, යම් නුවණැසකගේ ලැබීමෙන් සියලු සසර දුකින් මිදේද, ඒ නුවණ ඇස නිරුත්තර වේයයි"

**62. ඉන්ද්‍රිය සූත්‍රයː-** 2. "මහණෙනි, මේ (අධිපති අර්ථයෙන්) ඉන්ද්‍රියයෝ තුන්දෙනෙක් වෙත්. කවර තුනෙක්ද යත්? අනඤ්ඤාතඤ්ඤාස්සාමින්ද්‍රිය නම්වූ සොතාපත්ති මාර්ග ප්‍රඥාව හෝ ඉන්ද්‍රියය, අඤ්ඤින්ද්‍රිය නම්වූ සොතාපත්ති ඵලඥාණයෙහි පටන් අර්හත්මාර්ගඥානය තෙක් සය තන්හිවූ ඤාණය, අඤ්ඤාතාවින්ද්‍රිය නම්වූ අර්හත්ඵල ප්‍රඥාවය (යන තුනය) මහණෙනි, මේ වනාහි තුන් ඉන්ද්‍රියයෝ වෙත්යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ඍජු මාර්ගයවූ ආර්ය මාර්ගයට පිළිවෙලින් පැමිණෙන්නාවූ හැම කෙලෙස් පහකරන බැවින් ක්ෂය නම් අග්‍රමාර්ගයෙහි නුවණ පළමුව (උපදී) ඒ පළමු මාර්ගයට

අනතුරුව අර්හත්ත්වය අනුව යන්නාහට ගොත්‍රභූඥානයට අනතුරුව සොතාපත්ති මාර්ගයෙහි පළමු ඥානයවූ අනඤ්ඤාතඤ්ඤස්සාමීන්ද්‍රියය (උපදී) ඒ පළමු ඥානයට අනතුරුව පටන් අග්‍රමාර්ගයතෙක් අන්‍යවූ අඤ්ඤීන්ද්‍රියය (උපදී.)

"ඒ අඤ්ඤීන්ද්‍රියයෙන් පසුව අඤ්ඤතාවීන්ද්‍රියයෙන් මිදුනාවූ එකසමානවූ ක්ෂීණාශ්‍රවයාහට භවසංයෝජනයන් ක්ෂයකිරීම හෙතුකොට මාගේ විමුක්ති තොමෝ කොප්‍ය නොවන්නීය. (නොනැසෙන්නී) යයි ප්‍රත්‍යවෙක්ෂා ඥානය වේ.

"ඉදින් ඉඳුරන්ගෙන් සම්පූර්ණවූ පඤ්චෙන්ද්‍රියයෙන් යුක්තවූ සන්සිඳුනු නිර්වාණපදයෙහි ඇලුනාවූ ක්ෂීණාශ්‍රවතෙමේ සේනා සහිත මාරයා ජයගෙන අන්තිම ශරීරය දරායයි."

**63. අද්ධා සූත්‍රයː-** 2. "මහණෙනි, මේ කාල තුණෙක් වෙත්. කවර තුණෙක්ද යත්? අතීත කාලය, අනාගත කාලය, වර්තමාන කාලය (යන තුණය) මහණෙනි, මේ වනාහි තුන් කාලයෝ වෙත් යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සත්වයෝ අක්ඛෙය්‍ය නම්වූ පඤ්චස්කන්ධය කෙරෙහි සංඥා ඇත්තෝ වෙත්. පඤ්චොපාදානස්කන්ධයෙහි පිහිටියාහුය. පඤ්චොපාදානස්කන්ධය ත්‍රිවිධ දැනීමෙන් නොදැන මාරයාගේ උපායට පැමිණෙති.

"පඤ්චොපාදානස්කන්ධයද (විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් පිරිසිඳ දැනීමෙන් ආත්මයක් නොමදනී. විමොක්ෂ යයිද සන්තිපදයයිද උතුම් නිර්වාණ ධර්මය සිතින් ස්පර්ශ කෙළේ පැමිණියේ වෙයි. ආර්ය මාර්ගය තෙමේ විමොක්ෂ නම් වෙයි. (ඒ ක්ෂීණාශ්‍රවයා විසින් මාර්ග සිතින් නිරුත්තරවූ නිර්වාණ පදය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේවේ.

ඒකාන්තයෙන් පඤ්චොපාදානස්කන්ධයන් පිරිසිඳ දැනීමෙන් උපන් සම්පත්තීන් යුක්තවූ කෙලෙස් සන්සිඳුනාවූ

ශාන්තිපද නම්වූ නිවනෙහි ඇලුනාවූ නුවණින් සලකා සේවනය කරන දැන සෙවනය කරන (අශෛක්ෂ ධර්මයන්හි පිහිටියාවූ සිටියාවූ පරතෙරට ගියාවූ ඒ රහත්තෙම ගණනට නොපැමිණේයයි."

**64. දුච්චරිතත්තය සූත්‍රය:-** 2. "මහණෙනි, මේ අයහපත්වූ හෝ දුෂ්ටවූ හෝ හැසිරීම් තුණෙකි. කවර තුණෙක්ද යත්? කයින් වැරදි හැසිරීමය, වචනයෙන් වැරදි හැසිරීමය, සිතින් වැරදි හැසිරීමය (යන තුණය.) මහණෙනි, මේ වනාහි තුන් දුසිරිතියි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

("යම්) මෝඩයෙක් වේද, හෙතෙම කයින් දුශ්චරිත (පව්) ද වචයෙන් පව්ද සිතින් පව්ද කොට දෝෂ යයි දක්නා ලද්දාවූ යම් අනාවූ වරදෙක් (ඇද්ද) එයද කොට කුශල කර්ම නොකොට බොහෝ අකුශල් කොට ශරීරයාගේ බිඳීමෙන් නරකයෙහි උපදී."

**64. සුචරිතත්තය සූත්‍රය:-** 2. "මහණෙනි, මේ මනා හැසිරීම් සොඳුරු චරිත තුණෙකි. කවර තුණෙක්ද යත්? කයින් මනා හැසිරීමය වචනයෙන් මනා හැසිරීමය සිතින් මනා හැසිරීමය (යන තුණය) මහණෙනි, මේ වනාහි තුන් සුසිරි වෙත්යයි."

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. "(යම්) නුවණැත්තෙක් වේද, හෙතෙමේ කයින් හෝ කායද්වාරයෙහි පැවති දුශ්චරිත (පව්) ද වචනයෙන් හෝ වාග් ද්වාරයෙහි පැවති දුශ්චරතයෙන් ද සිතින් හෝ මනොද්වාරයෙහි පැවති දුශ්චරිතද හැරපියා වරදයයි දක්නා ලද්දාවූ (එයද) හැරපියා අකුශල කර්ම කොට බොහෝ කුසල් නොකොට ශරීරය බිඳීයාමෙන් (මරණින් මත්තෙහි) ස්වර්ගයෙහි උපදී. (නොහොත්) ස්වර්ගයට උත්පත්ති වශයෙන් පැමිණේ යයි." මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ යයි. මාගේ ඇසීමය."

**66. සොචෙය්‍ය සූත්‍රය:-** 2. "මහණෙනි, මේ පිරිසිදු බැව් තුණෙකි. කවර තුණෙක්ද යත්? කාය සුචරිතය වාග්සුචරිතය

මනොසුචරිතය (යන තුණය). මහණෙනි, මේ වනාහි තුන් පිරිසිදු බැව් වෙත්ය”යි.

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“කයින් පිරිසිදු බවය වචනයෙන් පිරිසිදු බවය (කාමාදි) ආශ්‍රවයන් නැත්තාවූ සිතින් පිරිසිදු බවය ඉතා පිරිසිදුවූ පිරිසිදු සම්පත්තියෙන් යුක්තවූ සියලු (අකුසල්) පහකරන්නාවූ පවිත්‍ර භාවයයි කියත්යයි.”

**67. මොනෙය්‍ය සූත්‍රයː-** 2. “මහණෙනි, මේ මුනිභාවයෝ තිදෙනෙක් වෙත්, කවර තිදෙනෙක්ද යත්? කායද්වාරයෙහි පැවැති මුනීන්ට සිත ප්‍රතිපදාවය වාග්ද්වාරයෙහි පැවැති මුනීන්ට හිත ප්‍රතිපදාවය මනොද්වාරයෙහි පැවති මුනීන්ට හිත ප්‍රතිපදාවය (යන තුණය) මහණෙනි මේ වනාහි තුන් මුනී භාවයෝයයි.”

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ මෙසේ අර්ථය කියනු ලැබේ.

“කායද්වාරයෙහි මෙලෝ පරලෝ දෙකට හා තමහටද පරහටද හිත ප්‍රතිපදාව දන්නාවූ වාග්ද්වාරයෙහි ප්‍රතිපදාව දන්නාවූ මනොද්වාරයෙහි ප්‍රතිපදාව දන්නාවූ මුනිහු ආශ්‍රව රහිතවූ මුනිභාවයෙන් යුක්තවූ මනාකොට සෝදන ලද ප්‍රතිපදාව කියත්යයි.”

**68. (පළමුවන) රාග සූත්‍රයː-** 2. “මහණෙනි, යම් කිසිවකු රාගය පහ නොකරන ලද්දේ වේද, ද්වෙෂය පහ නොකරන ලද්දේ වේද, මෝහය පහ නොකරන ලද්දේ වේද, මහණෙනි මේ තෙමේ (ක්ලේශ) මාරයා විසින් බඳනා ලද්දේ යයිද මාරපාස යයි කියන ලද ක්ලෙශය ඇතුල් කරවන ලද්දේ යයිද (නොහොත්) මාරයාගේ පුඩුව දැඩි වූයේ වන්නේ යයිද, පව් ඇති මාරයා විසින් කැමැතිසේ කටයුත්තෙක් වන්නේයයිද කියනු ලැබේ.

“මහණෙනි, යම් කිසිවෙකුගේ රාගය ප්‍රහීණ වූයේවේද, ද්වෙෂය ප්‍රහීනවූයේ වේද, මොහය ප්‍රහීණවූයේ වේද, මහණෙනි,

මෙතෙමේ මාරයා විසින් නොබඳනා ලද්දේයයිද, ක්ලෙශමාරයාගේ පුඩුව ඉවත් කරන ලද්දේයයිද, මාරයා විසින් කැමැතිසේ නොකට යුත්තක් වන්නේයයිද කියනු ලැබේ යයි.”

**3.** භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක, එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

“යම් ආර්ය පුද්ගලයෙකු විසින් රාගයද ද්වෙෂයද අවිද්‍යාවද (අග්‍රමාර්ගයෙන් නිරුද්ධ කරන ලද්දාහුද, වැඩුණු කාය ශීල චිත්ත ප්‍රඥාවන් ඇති රහතුන් අතුරෙහි ඇතුළත්වූ ශ්‍රෙෂ්ඨවූ හෝ ශ්‍රෙෂ්ඨ අර්හත්ඵලයට පැමිණියාවූ හෝ නිවන අවබෝධ කළාවූ එසේ අවබොධ කළාවූ එසේ දැනගත්තාවූ එසේ දුටුවාවූ එසේ කිරීමට අනුරූපව කියන්නාවූද කීමට සුදුසු නියායෙන් කරන්නාවූද චතුස්සත්‍යය අවබොධ කළාවූ (පුද්ගලයන්ගේ) වෛරයද ක්ලෙශ වෛරයද ආත්මවාදානු වාදාදී භයද ඉක්මවූ හැම ක්ලෙශ රැස්කිරීම් පහකළාවූ ඒ ආර්යයා බුද්ධාදී ආර්යයෝ කියත් යයි.”

**69. (දෙවෙනි) රාග සූත්‍රයඃ-** 2. “මහණෙනි, යම්කිසි මහණෙකුගේ හෝ මෙහෙණකගේ හෝ රාගය පහ නොවූයේ වේද, ද්වෙෂය පහ නොවූයේවේද, මොහය පහ නොවූයේ වේද, මහණෙනි, මෙතෙමේ බලවත් ක්‍රොධ නමැති මහරළ ඇත්තාවූ පස්කම් ගුණ නමැති දිය සුළි ඇත්තාවූ ස්ත්‍රීන් නමැති සැඩ මෝරමසුන් ඇත්තාවූ ස්ත්‍රීන් නමැති දිය රකුසන් ඇත්තාවූ සසර නමැති මුහුද තරණය නොකළේයයි කියනු ලැබේ.

“මහණෙනි, යම්කිසි මහණෙකු විසින් හෝ මෙහෙණක විසින් හෝ රාගය පහකරණ ලද්දේ වේද, ද්වෙෂය පහ කරන ලද්දේ වේද මොහය පහකරණ ලද්දේ වේද, මහණෙනි, මෙතෙමේ බලවත් ක්‍රොධ නමැති මහරළ ඇත්තාවූ පස්කම් ගුණ නමැති දියසුළි ඇත්තාවූ ස්ත්‍රීන් නමැති සැඩ මෝරමසුන් ඇත්තාවූ ස්ත්‍රීන් නමැති දිය රකුසන් ඇත්තාවූ සසරනැමැති සමුද්‍රය තරණය කළේයයිද එහෙයින්ම බැහැර කරණ ලද පව් ඇති බ්‍රහ්මණ තෙමේ සිටීයයිද කියනු ලැබේයයි.”

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යමෙකු විසින් රාගයද ද්වෙෂයද අවිද්‍යාවද නොපැවැත්ම කරණ ලද්දාහු වෙද්ද, හෙතෙම ස්ත්‍රීන් නැමැති (සැඩ මෝර මසුන් සහිතවූ ස්ත්‍රීන් නමැති දිය රකුසන් සහිතවූ (ක්‍රොධ නමැති ඉතා බිය වියයුතු රළ ඇත්තාවූ එතරවීමට දුෂ්කරවූ මේ (සසර නමැති) මුහුද ඉක්මවීය. කෙලෙස් මාරයා දුරු කළාවූ (කාමාදි) උපධි රහිතවූ හෙතෙම නැවත නොඋපදනා පිණිස දුක පහ කෙළේය. අස්තයට ගියාවූ එබඳු රහත් තෙමේ ප්‍රමාණයට නොපැමිණෙයි. (මරුවා) මුලාකරවී යයි කියමියි."

**(පුණ්‍ය ක්‍රියා වර්ගය නිමි.)**

---

## 8. දිට්ඨ වර්ගය.

**70. දිට්ඨ දුග්ගති සූත්‍රයː-** 2. "මහණෙනි, මා විසින් කාය දුශ්චරිතයෙන් යුක්තවූද වාග් දුශ්චරිතයෙන් යුක්ත වූද මනො දුශ්චරිතයෙන් යුක්තවූද ආක්‍රොශ කළාවූද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූද (වරදවා දක්නාවූද මිථ්‍යා දර්ශන හෙතුවෙන් සමාදන් වන ලද නොඑක් කර්මයන් ඇත්තාවූද සත්වයෝ දක්නා ලද්දාහුය, ඒ සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණයෙන් මත්තෙහි සැපයෙන් පහවූ දුකට පිහිටවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය, "මහණෙනි, මා විසින් කයින් දුශ්චරිත කිරීමෙන් යුක්තවූද වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරීමෙන් යුක්තවූද, සිතින් දුශ්චරිතයෙහි හැසිරීමෙන් යුක්තවූද, ආර්යයන්ට උපවාද කළාවූද, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූද, මිථ්‍යාදෘෂ්ටීන් ගන්නා ලද නොඑක් කර්මයන් ඇත්තාවූද සත්වයෝ දක්නා ලද්දාහුය, ඒ සත්වයෝ කය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට පිහිටවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහු"ය යන ඒ කීම වනාහි අන්‍ය ශ්‍රමණයෙකුගේ හෝ බමුණෙකුගේ හෝ බස් අසා මම නොම කියමි.

3. "තවද මහණෙනි, කාය දුශ්චරිතයෙන් යුක්තවූද වාග් දුශ්චරිතයෙන් යුක්තවූද, මනො දුශ්චරිතයෙන් යුක්ත වූද, ආර්යයන්ට ගර්හාකළාවූද, විපරීත දර්ශනයෙන් යුක්තවූද

මිථ්‍යාදෘෂ්ටි කර්මයන් සමාදාන කොට ඇත්තාවූද සත්වයෝ මා විසින් දක්නා ලද්දාහුය. මහණෙනි, ඒ සත්වයෝ කය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ දුකට පිහිටවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුයයි මහණෙනි, යමක්ම තමා විසින් දන්නාලද්දේද තමා විසින් දක්නා ලද්දේද, තමා විසින් ප්‍රකට කොට දන්නා ලද්දේද, එයම මම කියමියි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මේ ලොකයෙහි පුද්ගලතෙමේ සිත වරදවා පිහිටුවා මිථ්‍යා වචන කියා කයින් වැරදි කර්මයන් කොට (හැසුරුණේද)

"මේ මිනිස් ලොව ස්වල්ප ජීවිතය ඇතිකල්හි ද තොරවූ පව් කරන්නාවූ ඒ නුවණ නැති පුද්ගල තෙමේ කය බිඳීමෙන් පසු නරකයට (උත්පත්ති වශයෙන්) පැමිණේයයි."

**71. දිට්ඨ සුගති සූත්‍රයː-** 2. "මහණෙනි, කයින් පින් කිරීමෙන් යුක්තවූද, වචනයෙන් සුචරිතයෙහි හැසිරීමෙන් යුක්තවූද, සිතින් සුචරිතයෙහි හැසිරීමෙන් යුක්තවූද, ආර්යයන්ට උපවාද නොකළාවූද, සම්‍යග් දෘෂ්ටියෙන් යුක්ත වූද මනා දර්ශනය හෙතුකොට ගන්නා ලද කර්මයන් ඇත්තාවූද සත්වයෝ මා විසින් දක්නා ලද්දාහුය. ඒ සත්වයෝ ශරීරය බිඳීයාමෙන් (මරණින් මතු) මනා ගති ඇත්තාවූ සුවයෙන් අග්‍රවූ දෙව්ලොවට පැමිණියාහුය. මහණෙනි, මා විසින් කාය සුචරිතයෙන් යුක්තවූද වාග්සුචරිතයෙන් යුක්ත වූද මනො සුචරිතයෙන් යුක්තවූද ආර්යයනට උපවාද නොකළාවූද, සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූද, සම්‍යක් දර්ශනයෙන් මනාකොට ගන්නාලද කර්මයන් ඇත්තාවූද සත්වයෝ දක්නා ලද්දාහුය, ඒ සත්වයෝ කය බිඳීමෙන් පසු ශෝභනගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ දිව්‍යලොකයට පැමිණියාහ"යි ඒ ප්‍රකාශය වූකලි අන් මහණෙකුගේ වේවයි බමුණෙකුගේ වේවයි තෙපුල් අසා නොම කියමි.

3. "නැවතද කරුණක් ඇතː- "මහණෙනි, කයින් සුසිරි කිරීමෙන් යුක්තවූද වචනයෙන් සුචරිතයෙහි හැසිරීමෙන් යුක්තද සිතින් සුචරිතයෙහි හැසිරීමෙන් යුක්තවූද ආර්යයනට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගර්හා නොකළාවූද සම්‍යග්දෘෂ්ටි ඇත්තාවූද, සම්‍යක් දෘෂ්ටි හෙතුවෙන් මනාව ගන්නාලද කර්මයන් ඇත්තාවූද සත්වයෝ මා විසින් දක්නාලද්දාහුය, ඒ සත්වයෝ ශරීරය බිඳීයාමෙන් මරණින් මත්තෙහි සුන්දරගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ දෙව්ලොවට පැමිණියාහුය, (යන) යමක් තමා විසින්ම දන්නා ලද්දේද, තමා විසින් දක්නා ලද්දේද, තමා විසින් ප්‍රකටව දන්නා ලද්දේද, මම එයම කියමියි.

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මේ ලොකයෙහි (යම්) පුද්ගලයෙක් සිත මනාව පිහිටුවා වචනයෙන් (මුසාවාදාදිය) නොකියා මනාව (පිහිටුවා) කයින් මනා කර්මාන්තයන් කොට (විසීද,)

"මේ මිනිස් ලොව ස්වල්ප ජීවිතය ඇතිකල්හි බහුශ්‍රැතවූ පින්කළාවූ සප්‍රාඥවූ ඒ පුද්ගලතෙමේ ශරීරයාගේ බිඳීමෙන් (මැරීමෙන්) ස්වර්ගයට පැමිණේය"යි.

72. **නිස්සාරණීයධාතු සූත්‍රයː**- 2. "මහණෙනි, නික්මීම පිළිබඳවූ සත්තශුන්‍ය ස්වභාවයෝ තුන්දෙනෙක් වෙති. කවර තුණක්ද යත්? මේ ප්‍රථමධ්‍යානයෙක් වේද, මේ කාමයන්ගේ පහවීමය, යම් මේ අරූපාවචර ධ්‍යානයෙක්වේද, මේ රූපාවචර ධර්මයන්ගේ පහවීමය, උපන්නාවූ කරන ලද්දාවූ හෙතුවෙන් උපන්නාවූ යම් කිසි ධර්මයෙක් වේද, ඒ යම් හේතුවකින් ඇතිවූ ධර්මයාගේ පහවීම නිර්වාණය වේ. මහණෙනි, මේ වනාහි පහවීමට හෙතුවූ තුන් ධාතුහු වෙත්යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මේ කාමයන්ගේ පහවීම දැන රූපාවචර ධර්මයන්ගේද ඉක්මවන උපායවූ සියලු සංස්කාරයන් සංසිඳීම ඇති නිවන (නුවණින්) ස්පර්ශ කරන්නාවූ සදහටම කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ,

"යම් හෙයකින් සංයමවූ මනාව දක්නා සුලුවූ ඒ මහණ තෙමේ ඒකාන්තයෙන් ඒ පඤ්චොපාදානස්කන්ධයන්හි මිදේද,

ඒකාන්තයෙන් අභිඥාසයෙන් අවසන් කළාවූ කෙලෙස් සංසිඳවූ දන්නාවූ ඒ මහණතෙමේ (කාමාදී සතර) යෝගයන් ඉක්මවූයේයයි."

73. **සන්තතර සූත්‍රය:-** 2. මහණෙනි, රූපාවචර ධර්මයනට වඩා අරූපාවචර ධ්‍යානයෝ අතිශයින් ශාන්තයහ. අරූපාවචරධ්‍යානට වඩා නිර්වාණය අතිශයින් ශාන්තයයි."

3. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක, එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"රූපභවයට පැමිණි යම් සත්වකෙනෙක් වෙද්ද, අරූපාවචරවූ යම් සත්ව කෙනෙක් වෙද්ද, නිර්වාණය නොදන්නාවූ (ඒ) සත්වයෝ පුනරුත්පත්තියට එන්නාහුය.

"යම් කෙනෙක් වනාහි රූපාවචර ධර්මයන් පිරිසිඳ දැන, අරූප භවයන්හි නොසිටින්නාහු නිර්වාණයෙහි (කෙලෙසුන් ගෙන්) මිදෙද්ද, ඒ ක්ෂීණාශ්‍රව ජනයෝ (පඤ්ච) මාරයන් පහකරන්නාහුය.

"(කාමාදි) ආශ්‍රවයන් නැත්තාවූ මනාව අවබොධ කළාවූ සර්වඥයන් වහන්සේ (නාම) කයින් (මාර්ගඵලයන් ගෙන්) නිර්වාණ ධාතුවට පැමිණ උපධීන් දුරලීමට කරුණුවූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කොට ශොක නැත්තාවූ කෙලෙස් රජස් නැත්තාවූ නිර්වාණය දෙසන සේකැයි"

74. **පුත්තත්තය සූත්‍රය:-** 2. "මහණෙනි, ලොකයෙහි මේ සූත්‍රයෝ තුන්දෙනෙක් ලැබෙන්නාහුය, විද්‍යමාන වන්නාහුය, කවර තුන්දෙනෙක්ද යත්? (තමාගේ ගුණයෙන් මවුපියන් ඉක්මවා) උපන්නාවූ (මවුපියනට වඩා ගුණ ඇති) පුත්‍රයාය (ගුණයෙන් මවුපියනට අනුරූපව) උපන්නාවූ (මව්පියන් හා සමාන ගුණ ඇති) පුත්‍රයාය මව්පියනට වඩා හීනගුණ ඇති පුත්‍රයාය යන තිදෙනය.

3. "මහණෙනි, කෙසේ වනාහි පුත්‍රතෙමේ අධික ගුණ ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි පුතාගේ මවුපියෝ බුදුන් සරණ නොගියාහු වෙද්ද, දහම් සරණ නොගියාහු වෙද්ද,

සඟ සරණ නොගියාහු වෙද්ද, ප්‍රාණඝාතයෙන් නොවැළකුණාහු වෙද්ද, (හිමියන් විසින්) නුදුන් දැය ගැණීමෙන් නොවැළකුණාහුද වෙද්ද, කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැළකුණාහු වෙද්ද, බොරුකීමෙන් නොවැළකුණාහු වෙද්ද, මදප්‍රමාදයට කරුණුවූ රහමෙර පීමෙන් නොවැළකුණාහු වෙද්ද, සිල් නැත්තාහු වෙද්ද, ලාමක ස්වභාවය ඇත්තෝ වෙද්ද, ඔවුන්ගේ පුතා වනාහි බුදුන්සරණ ගියේ වේද, දහම් සරණ ගියේ වේද, සඟ සරණ ගියේ වේද, ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වේද, හොරකම් කිරීමෙන් වෙන්වූයේ වේද, කාම මිථ්‍යාචාරයෙන් වෙන්වූයේ වේද, මුසාවාදයෙන් වෙන්වූයේ වේද, මත්වීමට හා ප්‍රමාදයට හෙතුවූ රහමෙරපීමෙන් වෙන්වූයේ වේද, සිල්වත්වේද, යහපත් ස්වභාවය ඇත්තේ වේද, මහණෙනි මෙසේ වනාහී පුත්‍රතෙමේ (මවු පියනට වඩා) අධික ගුණ ඇත්තේ (අතිජාතපුත්‍ර) වේ.

4. "මහණෙනි, කෙසේ වනාහි පුත්‍රතෙමේ (මවුපියන් අනුරූපව උපන් හා සමාන ගුණ ඇත්තේවේද, මහණෙනි, මේ ලොකයෙහි පුත්‍රයාගේ මවුපියෝ බුදුන් සරණ ගියෝවෙද්ද, දහම් සරණ ගියෝවෙද්ද, සඟ සරණ ගියෝවෙද්ද, සත්වඝාතනයෙන් වැළකුණෝ වෙද්ද, සොරකම් කිරීමෙන් වැළකුණෝ වෙද්ද, කාම මිථ්‍යාචාරයෙන් වැළකුණෝ වෙද්ද, බොරුකීමෙන් වැළකුණෝ වෙද්ද, මත්වීමට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පීමෙන් වැළකුණේ වෙද්ද, සිල් ඇත්තෝ වෙද්ද, කලණ දහම් ඇත්තෝ වෙද්ද, ඔවුන්ගේ පුත් තෙමේද බුදුන්සරණ ගියේ වේද, ධර්මය සරණ ගියේ වේද, සංඝයා සරණ ගියේ වේද, සතුන් මැරීමෙන් වැළකුණේ වේද, අදත්තාදානයෙන් වැළකුණේ වේද, කාම මිථ්‍යාචාරයෙන් වැළකුණේ වේද, මුසාවාදයෙන් වැළකුණේ වේද, මත්වීමටද ප්‍රමාදයටද හෙතු සුරාමෙරය පානයෙන් වැළකුණේ වේද, සිල්වත් වේද කුසල් දහම් ඇත්තේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුත්‍රතෙමේ අනුජාතයෙක් වේ. (මව්පියනට සමාන ගුණ ඇත්තේ වේ.)

5. "මහණෙනි, කෙසේ වනාහි පුත්‍රතෙමේ අවජාත වේද, මහණෙනි, මේ ලොකයෙහි පුත්‍රයාගේ මවුපියෝ බුදුන් සරණ ගියාහු වෙද්ද, ධර්මය සරණ ගියාහු වෙද්ද සංඝයා සරණ ගියාහු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වෙද්ද, ප්‍රාණ වධයෙන් වැළකුණාහු වෙද්ද, අදත්තාදානයෙන් වැළකුණාහු වෙද්ද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණාහු වෙද්ද, බොරුබස් බිණුමෙන් වැළකුණාහු වෙද්ද, මත්වීමට හා සිහියෙන් වෙන්වීමට හෙතුවූ රහමෙර පීමෙන් වැළකුණාහුවෙද්ද, සිල්වත්වූවාහු වෙද්ද, යහපත් ස්වභාවය ඇත්තාහු වෙද්ද, ඔවුන්ගේ පුත්‍රතෙමේ වනාහි බුදුරුවන් සරණ නොගියේ වේද, දහම්රුවන් සරණ නොගියේ වේද, සඟුරුවන් සරණ නොගියේ වේද, ප්‍රාණඝාතයන් නොවැළකුණේවේද හොරකම් කිරීමෙන් නොවැළකුණේ වේද, කාමමිථ්‍යාචාරයෙන් නොවැළකුණේ වේද, මුසාවාදයෙන් නොවැළකුණේවේද, මත්වීමට කරුණුවූ රහමෙර බීමෙන් නොවැළකුණේ වේද, දුශ්ශීල වේද, පව් ස්වභාවය ඇත්තේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුත්‍ර තෙමේ අවජාතවේ. (මව්පියනට වඩා හීන ගුණ ඇත්තේ වේද, මහණෙනි, මේ පුත්‍රයෝ තුන්දෙන වනාහි ලොකයෙහි ඇත්තාහුය, විද්‍යමානවන්නාහු යයි"

**6.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"පණ්ඩිතයෝ අතිජාත (මව්පියනට වඩා අධික ගුණ ඇතිව උපන්) පුත්‍රයාද අනුජාත (මවුපියනට සමාන ගුණ ඇතිව උපන්) පුත්‍රයාද කැමැති' වෙත්, යමෙක් කුලය නසන්නේ වේද, (එබඳු) අවජාත (මව්පියනට වඩා හීන ගුණ ඇතිව උපන්) පුත්‍රයා නොකැමැති වෙති.

"ලොකයෙහි මේ තුන්දෙනම පුත්‍රයෝ වෙති, යම් (පුත්‍ර) කෙනෙක් උපාසකයෝ වෙද්ද, ශ්‍රද්ධාව ඇත්තාහු වෙද්ද, යුක්තවූවාහු වෙද්ද, (යාචකයන්ගේ) වචන දන්නාහු වෙද්ද, අදහස් දන්නාහු වෙද්ද, (නොහොත් 'දෙව යන ඒ යාචකයන්ගේ බස් අසා මොහු පෙර දන් නොදී මෙබන්දෝ වූහ. මා එසේ නොවිය යුතුයයි' ඔවුනට පරිත්‍යාගයෙන් ඒ අර්ථය දන්නාහු වෙද්ද, (පණ්ඩිතයන්ගේ කර්මය ස්වකීය කොට ඇති බව ආදිය ප්‍රකාශ කරණ වචන හේ දන්නාහු වෙද්ද පහවූ මසුරු මල ඇත්තාහු වෙද්ද වලාකුළෙන් හා වැසිවලාකුළෙන් මිදුනු සඳසේ (ක්ෂත්‍රියාදි) අටපිරිසෙහි බබළත්යයි.

**75. අවුට්ඨිකසම සූත්‍රයː-** 2. "මහණෙනි, මේ (සත්ව) ලොකයෙහි තුන් පුද්ගල කෙනෙක් ඇත්තාහුය, විද්‍යමාන වන්නාහුය, කවර තුන් පුද්ගලයෝද යත්? නොවසින මෙඝය වැසි වලාකුළ සමාන පුද්ගලයාය එක් ප්‍රදෙශයකට වසින මෙඝය සමාන පුද්ගලයාය සියලු තන්හි වස්නා මෙඝය සමාන පුද්ගලයාය (යන තිදෙනය.)

"මහණෙනි, නොවස්නා මෙඝය වැනි පුද්ගල තෙම කෙසේ වේද? මහණෙනි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙම මහණ බමුණෝය, දුගී මගීහුය යන මොවුන්ට ආහාරය, පානවර්ගය, වස්ත්‍රය, මල්ය, සුවඳය විලවුන්ය (ඇඳ පුටු පලස් ආදී) හෝනාදෑය ගෙවල්ය පහන්ය, (යන කිසිවක්) නොදෙන්නේ වේද මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම නොවස්නා මෙඝය බඳු වේ.

3. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙමේ (එක්) දේශයකට වස්නා මෙඝය වැනි වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙමේ අහරද පාන වර්ගද වස්ත්‍රද යහන්ද මල් ගඳ විලවුන්ද සයනාසන ගෘහ පහන් උපකරණද ශ්‍රමණ බ්‍රාහ්මණ දිළින්දෝය, මග යන දුප්පතුන්ය, පුලන්නෝය, සිඟන්නෝය යන මොවුන් අතුරෙන් ඇතැම් කෙනෙකුන්ට දෙන්නේ වෙයි. ඇතැම් කෙනෙකුන්ට නොදෙන්නේ වෙයි, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙමේ (එක්) දේශයකට වස්නා මෙඝය බඳු වේ.

4. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙමේ හැමතන්හි වස්නා මෙඝය බඳු වේද? මහණෙනි, මහණ බමුණන්ටද දුගී මගීන්ටද ගුණවණා ඉල්ලන්නවුන්ටද සිඟන්නන්ටද යන සියල්ලන්ටම ආහාරද පාන ජාතිද වස්ත්‍රද යහන්ද මල් ගඳ විලවුන්ද සයනාසනද ආවාසය පහන් යන මෙයද දෙන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙමේ සියලු තන්හි වස්නා මේඝය බඳු වේ.

"මහණෙනි, මේ තුන්පුද්ගලයෝ වනාහි මේ ලොකයෙහි ඇත්තාහුය විද්‍යමාන වන්නාහුයයි."

5. "භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"(යමෙක්) අහරද පාන වර්ගද භොජන වර්ගද ලැබ ශ්‍රමණයනට නොදේද, බ්‍රාහ්මණයනටත් නොදේද, දුගී මගී යදියනටත් නොදේද, තමාගේ කොටසින් බෙදාදීමකුත් නොකෙරේද,

"ඒකාන්තයෙන් එබඳු (තද මසුරුවූ) ඒ නිහීනවූ පුරුෂයා නොවස්නා මෙඝය බඳුයයි (පණ්ඩිතයෝ) කියත් (යමෙක්) සමහරුන්ට නොදේද, සමහරුන්ට දේද, ඒකාන්තයෙන් ඔහු (එක්) ප්‍රදෙශයකට වස්නා මෙඝය බඳු යයි නුවණැති දනෝ කියති.

"ඒ පුද්ගලතෙම සියලු සත්නට අනුකම්පාව කරන්නේ තුටුපහටු සිත් ඇත්තේ වපුරන්නාක්, මෙන් කෙරේද, දෙවු දෙවුයයි කියාද,

"යම්සේ වනාහී මෙඝය ශබ්ද කොට ගුගුරා වස්නේද දියෙන් ගොඩද වළද ගලමින් පුරාද,

"එපරිද්දෙන්ම මේ සත්ව ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මහා මෙඝය වැනි වේ. (තමාගේ) උට්ඨාන වීර්යයෙන් ලබන ලද (යම්) ධනය වේද, දැහැමින් රැස්කොට (උපන්) ආහාර පානයෙන් මනාව පැමිණියාවූ යාචකයන් පිනවායයි.'

**76. සුඛපත්ථනා සූත්‍රයඃ**- 2. "මහණෙනි, මේ තුන් සුව නිමිති කැමැතිවන්නාවූ පණ්ඩිත තෙමේ සිල්රක්නේය, කවර තුනක්දයත්? පණ්ඩිතතෙමේ "මට පැසසීම පැමිණේවා"යි සිල්රක්නේය, "මට භොගයෝ (සම්පත්) උපදිත්වා"යි පණ්ඩිතතෙම සිල්රක්නේය, (ශරීරයාගේ) බිඳීමෙන් මරණින් මත්තෙහි සොඳුරුගති ඇත්තාවූ සැපයෙන් අගුවූ දෙව්ලොව උපදීවා"යි පණ්ඩිත තෙමේ සිල් රක්නේය, මහණෙනි, මේ සුවකරුණු තුන වනාහි පතමින් පණ්ඩිතතෙම සිල්රක්නේයයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ප්‍රශංසාවද ධනය ලැබීමද පරලොව ස්වර්ගයෙහි සතුටුවීමද (යන) තුන් සුවපතමින් ප්‍රාඥතෙම සිල් රක්නේය. "ඉදින් (යමෙක්) පව් නොකරන්නේද (පව්) කරන්නෙකු සේවනය කෙරේද, පවෙහි සැක කටයුත්තෙක් වන්නේය, ඒ පුද්ගලයාගේ අවර්ණයද පැතිරෙයි.

"(යමෙක්) යම්බඳුවූ මිතුරෙකු ආශ්‍රය කෙරේද, යම්බඳු පුද්ගලයකු සේවනය කෙරේද, ඒ පුද්ගල තෙමේ ඒකාන්තයෙන් එබන්දෙක්වෙයි, යම්හෙයකින් එක්ව විසීමවේද, හෙතෙමේද එබන්දෙක්වෙයි. පිරිසිදු අන්‍යවූ පුද්ගලයෙකු සෙවනය කරන්නාවූ පුද්ගලයෙක් කලින් කල පාපියා සෙවුනා ලබන්නේ වේද, (යම්සේ) විස පොවනලද ඊය (විෂ නොපොවන ලද්දාවූද ඊ සමූහයෙහි තිබුනේ ඊ සියල්ලෙහිම විෂ තැවරේද, එමෙන් තැවරෙන බියෙන් පණ්ඩිත පුරුෂතෙමේ පවිටු යහළුවන් ඇත්තෙක් නොවන්නේය.

"යම් මිනිසෙක් (පිළිකුල් බැවින්) කුණුමස් කුස තණ අගින් බඳීද, කුසතණද කුණු ගඳම හමද්ද, බාල ජනයන් සේවනය කිරීම එබඳුමවේ.

"යම් පුරුෂයෙක් තෙමේ තුවරළා නමැති සුවඳ අන්‍යවූ කොළයක් හා බඳීද, (සුවඳ නැති) පුත්‍රයෝද (තුවරළා නමැති සුවඳ හා සම්බන්ධයෙන් සුවඳ හමද්ද, නුවණැත්තන්ගේ සේවනයද එබඳුම වේ.) "එහෙයින් කොළයේ සුවඳ හා දුගඳමෙන් තමහට (වන) විපාකය දැන පණ්ඩිතතෙම අසත්පුරුෂයන් සේවනය නොකරන්නේය. සත්පුරුෂයන් සේවනය කරන්නේය, (එය එසේමැයි) අසත්පුරුෂයෝ නිරයට යෙත්, සත්පුරුෂයෝ සුගතියට පමුණුවත්යයි."

**77. භිදුරකාය (භින්දන) සූත්‍රයː**- 2. "මහණෙනි, මේ රූප කය බිඳෙන (වැනසෙන) සුලුය, විඥානය නැසෙන ස්වභාවය ඇත්තේය, සියලු සසර ඉපදීමට හේතුවන දේ අනිත්‍යයහ, දුක්වෙති, පෙරලෙන ස්වභාවය ඇත්තෝවෙත්යයි"

3. "භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"රූප කයද බිඳෙන සුලුයයිද විඤ්ඤාණය නැසෙන ස්වභාවය ඇත්තේයයි දැන උපධීන්හි බියදැක ජරාමරණය ඉක්මවූ වැඩුණු රහත්තෙමේ උතුම්වූ නිර්වාණය අවබොධකොට කාලය කැමතිවේයයි."

78. **ධාතු සංසන්දන සූත්‍රය:-** 2. "මහණෙනි, සත්වයෝ අදහස් ස්වභාවයෙන් සත්වයන් සමග එකතුවෙත්, පැමිණෙත්, ලාමක අදහස් ඇති සත්වයෝ ලාමක අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙත් සමබවට පැමිණෙත්, යහපත් අදහස් ඇති සත්වයෝ මනා අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙත්, සමානව පැමිණෙත්.

3. "මහණෙනි, යටගිය දවසෙහිද සත්වයෝ සත්වයන් සමග ධාතුවශයෙන් අදහස් වශයෙන් සැසැඳුනාහ. එක්වූහ, හීන අදහස් ඇති සත්වයෝ හීන අදහස් ඇති සත්වයන් සමග සැසැඳුනාහුය. එක්වූවාහුය. කලණ අදහස් ඇති සත්වයෝ කලණ අදහස් ඇති සත්වයන් සමග සැසැඳුනාහුය එක්වූවාහුය.

4. "මහණෙනි, අනාගතකාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ සත්වයන් සමග සැසැඳෙන්නාහුය, එක්වන්නාහුය, ලාමක අදහස් ඇති සත්වයෝ ලාමක අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙන්නාහ, එක්වන්නාහ, හොඳ අදහස් ඇති සත්වයෝ හොඳ අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙන්නාහුය.

5. මහණෙනි, වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් සත්වයන් සමග සැසැඳෙති, එක්වෙති, ලාමක අදහස් ඇති සත්වයෝ ලාමක අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙති, එක්වෙති, සොඳුරු අදහස් ඇති සත්වයෝ සොඳුරු අදහස් ඇති සත්වයන් සමග සැසැඳෙති, එක්වෙතියි."

6. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"එක්ව යෙදීමෙන් තෘෂ්ණා ස්නෙහයෙන් කෙලෙස් වනයක් හටගත්තේද, එක්ව නොසිටීමෙන් නොඇලීමෙන් විනාශ

වෙයි. යම්සේ කුඩා ලීයෙන් කළ පසුරකට නැග මහමුහුදේ ගිලෙන්නේද, එපරිද්දෙන්ම පිරිසිදු දිවි පැවැත්ම ඇති සත්පුරුෂතෙමේද අලසවූ පුද්ගලයා නිසා ගිලෙයි, එහෙයින් අලසවූ වීර්යය කිරීමෙන් තොරවූ ඒ පුද්ගලයා දුරු කරන්නේය, විවේකය ඇත්තාවූ පිරිසිදුවූ නිවන් පිණිස යවන ලද සිත් ඇත්තාවූ ධ්‍යාන කරන සුලුවූ නිතර පටන්ගන්නා ලද වීර්යය ඇති පණ්ඩිතයන් සමග වසන්නේයයි.”

**79. සෙඛ පරිහානි සූත්‍රය:-** 2. “මහණෙනි, ශෛක්ෂ (රහත් බවට හික්මෙන) භික්ෂුවගේ පිරිහීම පිණිස මේ කරුණු තුනක් පවතිත්. කවර තුනක්ද, මහණෙනි, මේ ශාසනයෙහි ශෛක්ෂ භික්ෂුතෙමේ කර්මාන්තයෙහි ඇලීම ඇත්තේවේද, කර්මාන්තයෙහි ඇලුනේවේද, කර්මාන්තයෙහි ඇල්මෙහි යෙදුනේවේද, කථාවෙහි ඇලීම ඇත්තේවේද, (දෙතිස්) කථාවෙහි ඇලුනේ වේද, (දෙතිස්) කථාවේ ඇල්මෙහි යෙදුනේවේද, (නිතර) නිදීමෙන් ඇලීම ඇත්තේවේද, නිදීමෙහි ඇලුනේවේද, නිදීමේ ඇල්මෙහි යෙදුනේවේද, මහණෙනි, මේ ධර්ම තුන වනාහි ශෛක්ෂ භික්ෂුවගේ පිරිහීම පිණිස පවතිත්.

3. “මහණෙනි, මේ තුන්ධර්මයෝ ශෛක්ෂ භික්ෂුවගේ නොපිරිහීම පිණිස පවතිත්, කවර තුන් ධර්මයෝද යත්, මහණෙනි, මේ සස්නෙහි ශෛක්ෂ භික්ෂු තෙමේ කර්මාන්තයෙහි ඇලීම නැත්තේවේද කර්මාන්තයෙහි නොඇලුනේවේද, කර්මාන්තයේ ඇල්මෙහි නොයෙදුනේවේද, (දෙතිස්) කථාවෙහි නොඇලීම ඇත්තේවේද, (දෙතිස්) කථාවෙහි නොඇලුනේවේද, (දෙතිස්) කථාවෙහි ඇලුනුබැව්හි නොයෙදුනේ වේද, නිද්‍රාවෙහි ඇල්ම නැත්තේවේද, නිද්‍රාවෙහි නොඇලුනේවේද, නිදීමේ ඇලුනු බවෙහි නොයෙදුනේවේද, මහණෙනි, මේ තුන්ධර්මයෝ ශෛක්ෂ භික්ෂුහුගේ නොපිරිහීම පිණිස පවතිත්යයි.”

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“කර්මාන්තයෙහි ඇලීම ඇත්තාවූද (දෙතිස්) කථාවෙහි ඇලුනාවූද නිදීමෙහි ඇලීම ඇත්තාවූද නොසන්සුන්වූ එබඳු

මහණ තෙමේ උතුම්වූ මාර්ගය ඥානය ලබන්නට යොග්‍ය නොවේ.

"එහෙයින්ම (මහණතෙමේ) අනුදන්නාලද කෘත්‍යය සුදුසු කාලයෙහිම කිරීමෙන්) ස්වල්ප කෘත්‍යය ඇත්තෙක්ද ස්වල්ප නිද්‍රාව ඇත්තෙක්ද සන්සිඳුනු සිත් ඇත්තෙක්ද වන්නේය, එබඳු මහණ තෙමේ උතුම් සතර මාර්ගඥානය ලබන්නට සුදුසු වේයයි."

(දිට්ඨ වර්ගය නිමි.)

## 9. විතක්ක වර්ගය.

**80. අකුසල විතක්ක සූත්‍රයː-** 2. "මහණෙනි, මේ තුන් අකුශල විතර්ක කෙනෙක් (මිථ්‍යා කල්පනාවෝ) වෙත්, කවර තුන් විතර්කයෝද යත්, "(පිරිහෙලා නොබණින බව කැමැති බැවින් යුක්තවූ හෝ ඒ අරහයා පැවැති විතර්කය ලැබීමය සත්කාරය කීර්තිය යනමොවුන් පිළිබඳ විතර්කය, අනුන් කෙරෙහි අනුකම්පා බව බඳු කාමයෙහි ඇළුන ප්‍රෙමය පිළිබඳවූ විතර්කය (යන තුනය) මහණෙනි, මේ වනාහි තුන් අකුශල විතර්කයෝ වෙතියි.

3. "භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"අන්‍යයෝ අවමන් නොකරන්නේ නම් මැනවයි පැවැති කැමැති කල්පනාවෙන් යුක්තවූ පුද්ගල තෙමේද, ලාභසත්කාරයෙහි ගෞරවය ඇති පුද්ගල තෙමේද ඇමතියන් සමග සතුටුවනසුලු පුද්ගල තෙමේද, සංයොජනයන්ගේ ක්ෂයකිරීමෙන් දුරෙහි වේ.

"යමෙක් වනාහි දරුවන් හා සිවුපාවුන්ද විවාහයන්ද පිරිකර (බඩුද) හැරපියා (පැවිදිවීද,) එබඳු ඒ මහණතෙමේ උතුම් අර්හත්මාර්ගඥානය ලබන්නට සුදුසුවේයයි.

**81. සත්කාරාභිභූත සූත්‍රයː-** 2. "මහණෙනි, සත්කාරයෙන් මඩනාලද්දාවූ හාත්පස අල්වා ගන්නාලද්දාවූ සිත් ඇති යටපත් කරනලද්දාවූ ක්ෂයයට පමුණුවනලද සිත් ඇත්තාවූ සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට පිළිසරණවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නෝ මා විසින් දක්නා ලද්දාහ. මහණෙනි, යටපත් කරනලද්දාවූ හාත්පස අල්වාගන්නා ලද සිත් ඇති සත්වයෝ කයබිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ දුකට පිහිටවූ නපුරුසේ වැටෙන්නාවූ නිරයයෙහි උපන්නෝ මා විසින් දක්නා ලද්දාහුය. මහණෙනි සත්කාරයෙන්ද අසත්කාරයෙන්ද ඒ සත්කාර අසත්කාර දෙකින්ද, මැඩුනාවූ අල්වාගන්නාලද සිත් ඇති සත්වයෝ කය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් තොරවූ දුකට පිහිටවූ නපුරු සේ වැටෙන්නාවූ නිරයයෙහි උපන්නෝ මා විසින් දක්නා ලද්දාහුය.

3. "මහණෙනි, මම ඒ ප්‍රකාශය වූකලි අන් මහණෙකුගේ හෝ බමුණෙකුගේ හෝ බස් අසා නොව "මහණෙනි, සත්කාරයෙන් හෝ සත්කාර හෙතුකොට ඇති මාන මදාදියෙන් හෝ මඩනාලද්දාවූ හාත්පසින් අල්ලාගන්නාලද සිත් ඇත්තාවූ සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරුගති ඇත්තාවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහු මා විසින් දක්නා ලද්දාහුය. මහණෙනි, අසත්කාරයෙන් මඩනාලද්දාවූ හාත්පස අල්ලාගන්නාලද සිතැත්තාවූ සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් වෙන්වූ දුර්ගති ඇත්තාවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නෝ ම විසින් දක්නා ලද්දාහුයයි නොමකියමි. මහණෙනි, සත්කාරයෙන්ද අසත්කාරයෙන්ද ඒ සත්කාර අසත්කාර දෙකින්ද මඩනා ලද්දාවූ සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරුගති ඇත්තාවූ නපුරු සේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නෝ මා විසින් දක්නා ලද්දාහුය.

4. "නැවතද කරුණක් ඇත. මහණෙනි, සත්කාරයෙන් මඩනාලද්දාවූ හාත්පස අල්ලාගන්නාලද සිතැත්තාවූ සත්වයෝ

ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහවූ දුක්ගති ඇත්තාවූ නපුරුසේ වැටෙන්නාවූ නිරයයෙහි උපන්නාහු මා විසින් දක්නා ලද්දාහුය. මහණෙනි, අසත්කාරයෙන් මඩනා ලද්දාවූ හාත්පස අල්ලාගන්නාලද්දාවූ සිතැති සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුක්ගති ඇත්තාවූ නපුරුසේ වැටෙන්නාවූ නරකයෙහි උපන්නෝ මා විසින් දක්නා ලද්දාහුය. මහණෙනි, සත්කාරයෙන්ද අසත්කාරයෙන්ද ඒ දෙකින්ද මඩනා ලද්දාවූ හාත්පස අල්ලා ගන්නා ලද්දාවූ සිතැති සත්වයෝ මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුකට පිළිසරණවූ විවිධව හෝ විකාරයෙන් වැටෙනු ලබන්නාවූ නරකයෙහි උපන්නෝ මා විසින් දක්න ලද්දාහුයයි මා විසින් යමක්ම තමා විසින් දන්නා ලදද, තමා විසින් දක්නා ලදද, තමා විසින් ප්‍රකටකොට දන්නා ලදද, එයම මම කියමියි."

**5.** මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේයයි මා විසින් අසනලදී.

"සත්කාර කරනු ලබන්නාවූ අප්‍රමාණ විහරණය ඇත්තාවූ යම්රහතන් වහන්සේ කෙනෙකුන්ගේ සමාධිය (සත්කාරයෙන්ද අසත්කාරයෙන්ද සත්කාර අසත්කාර දෙකින්ද) නොසැලේද, (එකඟ බවෙහිම සිටීද.)

"ධ්‍යාන කරන සුලුවූ නිතර පැවැති කායික චෛතසික වීර්යය ඇත්තාවූ සියුම් දෘෂ්ටි ප්‍රඥාවෙන් විදර්ශනාව ඇත්තාවූ (සතර උපාදානයන්ගේ ක්ෂය ඇලුම්කොට ඇත්තාවූ ඒ රහත්හු ශාන්ත පුරුෂයයි (බුද්ධාදීහු) කියත් යයි."

**82. දෙව සද්ද සූත්‍රයඃ-** 2. "මහණෙනි, දෙවියන් කෙරෙහි කලින් කල දෙවියන්ගේ මේ තුන් ශබ්දයෝ පවතිත්. කවර තුන් හඬද යත්? මහණෙනි, යම්කලෙක්හි ආර්ය ශ්‍රාවකතෙමේ කෙස් රැවුල් බා සිවුරු හැඳ පොරොවා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීම පිණිස සිතාද, එම ආර්ය ශ්‍රාවකතෙමේ (ක්ලෙශ) මාරයා සමග සටන් කරනු පිණිස සිතා"යයි එකල්හි දෙවියන් කෙරෙහි දෙවියන්ගේ ශබ්දය කලින් කල පැතිරෙයි. මහණෙනි, දෙවියන් කෙරෙහි කලින් කල මේ පළමුවන දෙව්හඬ පැතිරෙයි.

3\. "නැවතද මහණෙනි, යම්කලෙක්හි ආර්ය ශ්‍රාවක තෙමේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්හි භාවනානු යොගයෙහි නැවත නැවත යෙදුනේ වේද, එකල්හි "එම ආර්ය ශ්‍රාවක තෙමේ (කෙලෙස් නමැති) මරුවා සමග යුද කෙරේ"යයි දෙවියන් කෙරෙහි දෙවියන්ගේ හඬ කලින් කල පැතිරෙයි. මහණෙනි, දෙවියන් කෙරෙහි කලින් කල මේ දෙවන දෙව් හඬ පැතිරෙයි.

4\. "නැවතද මහණෙනි, ආර්ය ශ්‍රාවකතෙමේ (කාමාදී) ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම හෙතුකොටගෙන ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියද අර්හත්ඵලය හා යෙදුන ප්‍රඥාවද මේ ආත්ම භාවයේදීම තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කෙරේද, මහණෙනි, එකල්හි අර ආර්ය ශ්‍රාවක තෙමේ දිනන ලද ක්ලෙස යුද්ධ ඇත්තේ වෙසේයයි දෙවියන් කෙරෙහි කලින් කල දෙවියන්ගේ හඬ පැතිරෙයි. මහණෙනි, දෙවියන් කෙරෙහි කලින් කල මේ තුන්වන දෙව් හඬ පැතිරෙයි. මහණෙනි, දෙවියන් කෙරෙහි කලින් කල මේ තුන් හඬවල් වනාහි පැතිරෙත් යයි."

5\. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"දිනන ලද (ක්ලෙශ) යුද්ධය ඇත්තාවූ (ගුණයෙන් මහත්වූ හෝ පූජ්‍යවූ) පහවගිය (කෙලෙස්) බිය ඇත්තාවූ සම්‍යක් සම්බුදුහුගේ ශ්‍රාවකයා දැක දෙවියෝද වඳිත්.

"යම් බඳුවූ නුඹවහන්සේ වැළකීමක් නැත්තාවූ මරහුගේ සේනාව ආර්ය මාර්ගයෙන් ජයගෙන දුෂ්කරවූ දිනීම ලබාගත්තේද, එහෙයින් ඔබට නමස්කාර වේවා"යි

"යම් හෙයකින් ඒ ශ්‍රෙෂ්ඨ පුරුෂයාගේ ප්‍රාර්ථනාව සොයන්නේද දෙවියෝ ස්වල්ප මාත්‍රයකුදු ඒ කාරණය නොදනිත්ද, යම්හෙයකින් හෙතෙම මරුවාගේ වසඟයට යන්නේද, එහෙයින් මේ ප්‍රකාරයෙන් පැමිණි අර්හත් ඵලය ඇති මේ ක්ෂීණාශ්‍රවවූ විශුද්ධ දෙවියාට දෙවියෝ නමස්කාර කෙරෙත්යයි."

**83. දෙව පුබ්බ නිමිත්ත සූත්‍රයː-** 2. "මහණෙනි, යම් කලෙක (උත්පත්ති) දෙවි තෙමේ දිව්‍ය සමූහයෙන් හෝ දෙව්ලොවින් චුතවන ස්වභාවය ඇත්තේ වේද, (එකල්හි) ඔහුට පෙරනිමිති පසෙක් පහළවෙත්. පළඳනා ලද මල් මලානික වෙත්. හඳනා පොරොවනලද වස්ත්‍ර කිලිටිවෙත්. කිසිලිවලින් මඩදිය දහරා වැගිරෙති. කයෙහි දුර්වර්ණභාවය පිහිටයි. ස්වකීය (තමාගේ) දිව්‍යාසනයෙහි නොඇලෙයි.

3. "මහණෙනි, දෙවියෝ ඔහු මේ දේවපුත්‍ර තෙමේ චුතවන ස්වභාවය ඇත්තේ යයි මෙසේ දැන 'පින්වත, මේ දෙව්ලොවින් චුතව සොඳුරු ගති ඇති (මිනිස් ලොවට) යව, සුගතියට ගොසින් මනාව ලත් ලැබීම ලබව, මනාව ලත් ලැබීම ලැබ මනාව පිහිටියෙක් වෙව'යි වචන තුනින් සතුටු උපදවත්. මෙසේ වදාළ කල්හි නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධ මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්වීය. වහන්ස, දෙවියන්ගේ සුගතියට යාමයයි වදාරණ ලද්දේ කිමෙක්දෝහෝ? වහන්ස, දෙවියන්ගේ මනාව ලද ලැබීමයයි වදාරණ ලද්දේ කුමක්ද? වහන්ස, දෙවියන්ගේ මනාව පිහිටීම යයි වදාරණ ලද්දේ කුමක්දැයි?"

**4.** "මහණ, මිනිසත් බව දෙවියන්ගේ සුගතියට යාමයයි මා විසින් කියන ලද්දේය. මිනිස්වූයේම තථාගතයන් විසින් දෙසන ලද ධර්මවිනයෙහි යම් ශ්‍රද්ධාවක් ලබාද, මහණෙනි, මේ වනාහි දෙවියන්ගේ මනාව ලද ලැබීමයයි කියන ලද්දේය. ඔහුගේ ශ්‍රද්ධාතොමෝ වනාහි සිත් සතනට වැදුනී වන්නීද, හටගත් මුල් ඇත්තීවන්නීද, පිහිටියාවේද තරවූවා වේද, ලොකයෙහි මහණෙකු විසින් වේවයි බමුණෙකු විසින් වේවයි දෙවියෙකු විසින් වේවයි මරෙකු විසින් වේවයි බඹෙකු විසින් වේවයි අන්කිසිවෙකු විසින් වේවයි හැරගන්නට හෝ පිරිහෙලන්නට හෝ ඉවත් කරන්නට හෝ නොහැකි වන්නී වේද, මහණෙනි, මේ වනාහි දෙවියන්ගේ මනාව පිහිටීමයයි කියන ලද්දේයයි."

**5.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි යම් අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් කලෙක්හි දෙවිතෙමේ ආයු ගෙවීමෙන් මැරේද (එකල්හි) සතුටු උපදවන්නාවූ දෙවියන්ගේ තුන් හඬක් පැතිරෙත්.

"පින්වත, මේ දෙව්ලොවින් මිනිසුන් හා එකී භාවයවූ සුගතියට යව, මනුෂ්‍යවූයේ සද්ධර්මයෙහි උතුම්වූ ශ්‍රද්ධාව ලබව.

"මොනවට ප්‍රකාශ කරන ලද්දාවූ සද්ධර්මයෙහි තොපගේ සැදැහැ තොමෝ චිත්තසන්තානයට ප්‍රවිෂ්ට වූවා හටගත් මුල් ඇත්තී පිහිටියා දිවිහිම් කොට හැර ගන්නට හෝ පිරිහෙලන්නට හෝ පහකරන්නට නොහැක්කි වේවා. (කයින් කරන) දුසිරිද වාග් දුශ්චරිතයන්ද සිතින් (කරන) දුශ්චරිතයන්ද හැර වරදයයි දන්නා ලද අන්‍යවූ යම් පවක් වේද, (එයද) හැර

"කයින් කුසල්ද වචනයෙන් බොහෝ කුසල්දකොට අපමණවූ (සකසා බොහෝවර හෝ මහත්කොට කිරීම වශයෙන් ප්‍රමාණ රහිතවූ) සත්වැනි භවයෙහි හෝ ඉපදීමට සුදුසුවූ ස්කන්ධූපධියගේද එය උපදවන කුශල චෙතනා නම් අභිසංස්කාරොපධියගේද ඒ ඒ මාර්ගයෙන් නැසියයුතු ක්ලෙශොපධියගේද ප්‍රහාණයෙන් ඔවුන් නොඋපදවන හෙයින්ද නිරුපධි නම් නිර්වාණය ඇසුරු කළ බැවින්ද උපධිරහිතවූ කුසල් සිතින් කොට,

"එහෙයින් දන්දීමෙන් ආත්මභාව සම්පත්තියද භොග සම්පත්තියද උපදවන්නාවූ ඒ බොහෝ පින් කොට අන් මිනිසුන්ද සද්ධර්මයෙහිද බඹසරෙහිද යොදවන්නේය.

"යම්කලෙක්හි දෙවියෝ චුතවන දෙවියෙකු දැනගන්නාහුද (එකල්හි) මේ අනුකම්පාවෙන් (එම්බා) දෙවිය නැවත නැවත (මෙහි) එවයි' සතුටු උපදවත් යයි"

**84. ලොකානුකම්පා සූත්‍රය**:- 2. "මහණෙනි, සත්ව ලොකයෙහි මේ තුන් පුද්ගල කෙනෙක් උපදනාහු බොහෝ දෙනාට වැඩ පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට

අනුකම්පාව පිණිස දෙව්මිනිසුන්ට ප්‍රයෝජන පිණිස වැඩ පිණිස උපදිත්. කවර තුන්දෙනෙක්ද යත්? මහණෙනි, මේ ලොකයෙහි අර්හත්වූ මනාකොට ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ සුගත නම්වූ ලෝ දන්නාවූ ගුණයෙන් තමහට වැඩි තරම් උතුමෙකු නැත්තාවූ නොදැමුණු දැමීමට සුදුසු පුරුෂයන් හික්මවීමෙහි රථාචාර්යයකු වැනිවූ හෝ ගැල්නායකයකුසේ සතුන් සසර කතරින් එතෙර කරන්නාවූ දෙව්මිනිසුන්ට අනුශාසනය කරන්නාවූ චතුස්සත්‍යයන් අවබොධකළාවූ සියලු කෙලෙසුන් නැසීම් ආදී අර්ථයෙන් භගවත්වූ තථාගතයන් වහන්සේ උපදින සේක්ද, ඒ තථාගතයන් වහන්සේ (ශීලයෙන්) මුල යහපත්වූ (මාර්ගඵලයෙන්) මැද යහපත්වූ (නිවණින්) අග යහපත්වූ (ගැඹුරු අදහස් ඇති) අර්ථයෙන් යුක්තවූ පදයෙන් යුක්තවූ සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දෙසනසේක්ද පිරිසිදුවූ බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරනසේක්ද, මහණෙනි, මේ පළමුවන පුද්ගලතෙමේ සත්ව ලොකයෙහි උපදනේ මහාජනයාට හිත පිණිස මහාජනයාට සැප පිණිස සත්ව ලොකයට කරුණාව පිණිස දිව්‍ය මනුෂ්‍යයන්ට ප්‍රයෝජන පිණිස වැඩ පිණිස සුව පිණිස උපදී.

**3.** "මහණෙනි, නැවතද ඒ ශාස්තෲන් වහන්සේගේම ශ්‍රාවක තෙමේ රහත් වේද, ක්ෂය කරන ලද ආශ්‍රවයන් ඇත්තේ වේද, වැස නිමවන ලද බඹසර ඇත්තේ වේද ආර්ය මාර්ගයෙන් කරනලද කටයුතු ඇත්තේ වේද, බහා තබන ලද ක්ලෙශභාර ඇත්තේ වේද, පැමිණි රහත් ඵලයයි කියන ලද ස්වකීය අර්ථය ඇත්තේ වේද, ක්ෂයවූ භවය හා දස සංයෝජනයන් ඇත්තේ වේද, මනාව දැන කෙලෙසුන්ගෙන් වෙසෙසින් මිදුනේ වේද, ඒ ශ්‍රාවකතෙමේ ආදියෙහි යහපත් වූද මැද යහපත්වූද අවසානයෙහි යහපත්වූද අර්ථවත්වූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණ දහම් දෙසාද පිරිසිදුවූ බ්‍රහ්මචර්යය ප්‍රකාශ කෙරේද, මහණෙනි, මේ දෙවන පුද්ගල තෙමේ සත්ව ලොකයෙහි උපදනේ බොහෝදෙනාට වැඩ පිණිස බොහෝදෙනාට සැප පිණිස සත්ව ලොකයාට කරුණාව පිණිස දෙව් මිනිසුන්ට ප්‍රයෝජන පිණිස හිත පිණිස සුව පිණිස උපදී.

**4.** "මහණෙනි, නැවතද එම ශාස්තෲන් වහන්සේගේ ශ්‍රාවකතෙමේ ශෛක්ෂයෙක් වේද, පිළිපැදීමයයි කියන ලද ආර්ය මාර්ගයෙන් උපන්නේ වේද බොහෝ අසන ලද්දේ වේද ශීලයෙන් ධුතාංගයෙන් යුක්තවූයේ වේද, හෙතෙමේද ආදියෙහි මනාවූ මැද කලණවූ අවසනෙහි කලණවූ (ගැඹුරු) අර්ථ ඇත්තාවූ ව්‍යඤ්ජනයෙන් යුක්තවූ සියල්ලෙන් සම්පූර්ණ ධර්මය දෙසාද පිරිසිදු බඹසර ප්‍රකාශ කෙරේද, මහණෙනි, මේ තුන්වන පුද්ගලතෙමේ ස්කන්ධ ලොකයෙහි උපදනේ මහජනයාට වැඩ පිණිස මහජනයාට සුව පිණිස ලොවට කුළුණු පිණිස දෙවිමිනිසුන්ට ප්‍රයෝජන පිණිස වැඩ පිණිස සුව පිණිස උපදී. මහණෙනි, මේ තුන් පුද්ගලයෝ වනාහි සත්ව ලොකයෙහි උපදනාහු බොහෝදෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පාව පිණිස දෙවිමිනිසුන්ට ප්‍රයෝජන පිණිස වැඩ පිණිස සුව පිණිස උපදිත්යයි මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේයයි මාගේ ඇසීමයයි.

**5.** "මහත් ශීල ස්කන්ධාදිය සෙවූ ශාස්තෲන් වහන්සේ වනාහි සත්ව ලොකයෙහි පළමු පුද්ගලයා වේ. උන්වහන්සේගේ අනුජාත පුත්‍රවූ වඩන ලද සිත් ඇති ශ්‍රාවක තෙමේ දෙවන පුද්ගලයා වේ. නැවත උපන්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාවූ ශීල ව්‍රත දෙකින් යුත් ශෛක්ෂ ශ්‍රාවක තෙමේ අන්‍යවූ තුන්වන පුද්ගලයා වේ. ධර්මාලොකය කරන්නාවූ ධර්මය කියන්නාවූ දෙවිමිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූ මේ තුන් පුද්ගලයෝ නිවන (පිළිබඳ) දොර (ආර්ය මාර්ගය) අරිත්. ඔහු තුමූ බොහෝදෙනා (කාමාදී සතර) යොගයෙන් මුදවත්.

**6.** "යම් කෙනෙක් උතුම්වූ ජනයන් උසුලන්නාවූ සාර්ථවාහකයෙකු බඳු බුදුරදුන් විසින් මොනවට දෙසන ලද ආර්ය මාර්ගයට බුදුන් වහන්සේගේ සස්නෙහි යම් කෙනෙක් අප්‍රමාදයෙන් මේ ආත්මභාවයෙහි සසර දුක් කෙළවර කෙරෙත්යයි."

**85. අසුභානුපස්සී සූත්‍රයː-** 2. "මහණෙනි, කයෙහි අශුභයයි (අශුභ අයුර) අනුව බලන්නෝව වසවු. තොපගේ ආශ්වාස

ප්‍රශ්වාසයෙහි යොදන සිහිය අනිත්‍යයයි අනුව බලන්නෝව වසවු මහණෙනි, කයෙහි අශුභයයි අනුව බලමින් වසන්නවුන්ගේ ශුභ නිමිත්තෙහි ශුභ අරමුණෙහි ඉපදීමට සුදුසු කාම රාගානුසයයෙක් වේද, ඒ අනුසයය පහවෙයි, තමා කෙරෙහි කර්මස්ථානයට අභිමුඛව ආශ්වාස ප්‍රාශ්වාසයන් අරමුණු කොට ඇති සිහිය මනාව වැටහුනු කල්හි බැහැරවූ ආසයානුගතවූ යම් (කාමවිතර්කාදී) මිථ්‍යා විතර්කයෝ වෙද්ද, දුක් කොටස් ඇත්තාවූ හෝ ආශාවිනාසය ඉපදීම ඇත්තාවූ හෝ ඒ මිථ්‍යා සංකල්පනාවෝ පහවෙත්. සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යයයි අනුව බලමින් වසන්නවුන්ගේ යම් අවිද්‍යාවක් වේද, ඕ තොමෝ පහවෙයි. යම් (අර්හත් මාර්ග විද්‍යාවක් (ඥානයක්) වේද, ඒ මාර්ග විද්‍යාතොමෝ උපදී යයි."

**3.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "කයෙහි අශුභය අනුව බලන්නාවූ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තෙහි එළඹ සිටි සිහිය ඇත්තාවූ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමවූ නිවන දක්නාවූ හැමදා කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ මනාව (දුක් ආදී වශයෙන්) දක්නාසුලුවූ වෑයම් කරන්නාවූ හෝ නිවැරදි නියමිත බැවින් නියතවූ හෝ ඒ මහණතෙම ඒකාන්තයෙන් ඒ නිවනෙහි රාගාදී කෙලෙස් සංසිඳවූ මෙලෝ පරලෝ වැඩ දන්නාවූ ඒ මහණතෙමේ යෝගය ඉක්ම වූයේ වේයයි"

**86. ධම්මානුධම්ම සූත්‍රය:-** 2. "මහණෙනි, ධර්මයට පිළිපන් මහණහුගේ මේ සුදුසු ස්වභාවය වේ. කියන කල්හි යම් අනුධර්මයකින් කියන්නේ (දශ කථාවස්තු) ධර්මයම කියයි (එයට විරුද්ධ බොහෝදේට ආශාවීමාදී) අධර්මය නොකියයි. කල්පනා කරනු ලබන්නේ හෝ ධර්මයෙන් වෙන් නොවූ විතර්කයක්ම කල්පනා කෙරෙයි. (කාම විතර්කාදී) අධර්ම කල්පනාවක් කල්පනා නොකරයි. නොකොට උදාසීනව සිහි ඇත්තෙක්ව සම්‍යක් ප්‍රඥාව ඇත්තෙක්ව වෙසේ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ඒ ධර්මයම මතුමත්තෙහි භාවනා වශයෙන් සිහි කරන්නාවූ ඇලුම්කොට ඇත්තාවූ (එසේම ඒ) ධර්මයෙහි ඇලුනාවූ ධර්මය සිතන්නාවූ සිහිකරන්නාවූ මහණ තෙමේ බොධිපාක්ෂික දහමින්ද නවලොවුතුරා දහමින්ද නොපිරිහෙයි.

"පිඩුසිඟීම් වශයෙන්ද සක්මන් කිරීම් වශයෙන්ද හැසිරෙන්නේ හෝ සිටින්නේ හෝ හිඳින්නේ හෝ හොවින්නේ හෝ තමාගේ සිත සංසිඳුවන්නේ නිවණටම පැමිණේයයි."

87. **අන්ධකරණ සූත්‍රයː-** 2. "මහණෙනි, අඳුරු කරන්නාවූ නුවණැස වසන්නාවූ නොදැනීම කරන්නාවූ ප්‍රඥා නොපැවැත්ම කරන්නාවූ දුක් පක්ෂයෙහි පවත්නාවූ නිර්වාණයට නොපවත්නාවූ මේ තුන් අකුශල විතර්ක කෙනෙක් වෙති. කවර තුනෙක්දයත්? මහණෙනි, කාම ප්‍රතිසංයුක්ත විතර්කය ඇදිරිය කරන්නේය. නුවණැස වසන්නේය. නොදැනීම කරන්නේය. ප්‍රඥාව නිරුද්ධ කරන්නේය. දුක් නම් පීඩා පක්ෂයෙහි පවත්නේය. (ක්ලේශ) නිර්වාණය පිණිස නොපවත්නේය.

3. මහණෙනි, ක්‍රොධය පිළිබඳ කල්පනාව අඳුරු කරන්නේය. නුවණැස වසන්නේය, නොදැනීම කරන්නේය. ප්‍රඥාව නොපැවැත්ම කරන්නේය. දුක් පක්ෂයෙහි පවත්නේය. (ක්ලේශ) නිර්වාණය පිණිස නොපවත්නේය. මහණෙනි, විහිංසා විතර්කය (වෙහෙසකිරීම පිළිබඳ කල්පනාව) අඳුරු කරන්නේය. නුවණැස වසන්නේය. නොදැනීම කරන්නේය. ප්‍රඥාව නොපැවැත්ම කරන්නේය. දුක් පක්ෂයෙහි පවත්නේය. (ක්ලේශ) නිර්වාණය පිණිස නොපවත්නේය. අඳුරු කරන්නාවූ නුවණැස වසන්නාවූ නොදැනීමකරන්නාවූ ප්‍රඥාව නොපැවැත්ම කරන්නාවූ දුක් පක්ෂයෙහි පවත්නාවූ (ක්ලේශ) නිර්වාණය පිණිස නොපවත්නාවූ මේ වනාහි තුන් අකුශල විතර්කයෝ වෙත්.

**4.** "මහණෙනි, අන්ධ නොකරන්නාවූ නුවණ ඇස ඇති කරන්නාවූ දැනීම කරන්නාවූ ප්‍රඥාවගේ වැඩීම කරන්නාවූ දුක් පක්ෂයෙහි නොපවත්නාවූ (ක්ලේශ) නිර්වාණය පිණිස පවත්නාවූ මේ තුන් කුශල විතර්ක කෙනෙක් වෙති. කවර තුන් විතර්කයෝද යත්? මහණෙනි, නිවන් පිළිබඳ කල්පනාව අන්ධ නොකරන්නේය. නුවණැස ඇති කරන්නේය. දැනීම් කරන්නේය. ප්‍රඥාවෘද්ධිය කරන්නේය. දුක් පක්ෂයෙහි පවත්නේය. නිවණ පිණිස පවත්නේය.

"මහණෙනි, මෛත්‍රිය පිළිබඳ කල්පනාම ඇඳිරිය නොකරන්නේය. නුවණැස ඇතිකරන්නේය. දැනීම කරන්නේය. ප්‍රඥාවගේ වැඩීම කරන්නේය. දුක් පක්ෂයෙහි නොපවත්නේය. නිවන් පිණිස පවත්නේය.

"මහණෙනි, කරුණාව පිළිබඳ කල්පනා අඳුරු නොකරන්නේය. නුවණැස ඇතිකරන්නේය. දැනීම කරන්නේය. ප්‍රඥාවගේ වැඩීම කරන්නේය. දුක් පක්ෂයෙහි පවත්නේය. නිවන් පිණිස පවත්නේය. මහණෙනි, මේ තුන් කුශල විතර්කයෝ වනාහි අන්ධ නොකරන්නාහුය. නුවණැස ඇතිකරන්නාහුය. දැනීම කරන්නාහුය. ප්‍රඥාවෘද්ධිය කරන්නාහුය. දුක් පක්ෂයෙහි පවත්නාහුය නිවන් පිණිස පවත්නාහුයයි."

**5.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "තුන් කුශල විතර්කයන් කල්පනා කරන්නේය, තුන් අකුශල විතර්කයන් දුරුකරන්නේය. හාත්පසින් නැංගාවූ ධූලි මහා අකාල මෙඝය සර්වප්‍රකාරයෙන් සංසිඳුවන්නාසේ ඒ මහණතෙමේ ඒකාන්තයෙන් (මිථ්‍යා විතර්කයන්ද ඒ විතර්කයන් හා එක්ව යෙදුනාවූ විචාරයන්ද සහමුලින් නසයි. ඒ මහණතෙමේ ඒකාන්තයෙන් මේ භවයෙහිම නිර්වාණ පදයට පැමිණියේ යයි."

**88. අන්තරාමල සූත්‍රය:-** 2. "මහණෙනි, විරුද්ධ හෙයින් සිතට අමිතුරුවූ සිතට මිතුරුවූ සිතට හිංසනය කරන්නාවූ සිතට පසමිතුරුවූ මේ සිතෙහි මල තුනෙක් වෙත්, කවර තුනෙක්දයත්?

"මහණෙනි, ලොභයතෙම සිත කෙලෙසන මලයක, සිතට අමිතුරෙක, සිතට සතුරෙක, සිත පෙළන්නෙක, හිතට පසමිතුරෙක, මහණෙනි, ද්වෙෂය තෙම සිත කෙලෙසන මලයෙක, සිතට අමිත්‍රයෙක, සිතට සතුරෙක, සිත පෙළන්නෙක, සිතට පසමිතුරෙක, මහණෙනි, මොහය සිත කෙලෙසන මලයෙක, සිතට අමිතුරෙක සිත පෙලන්නෙක. සිතට පසමිතුරෙක. මහණෙනි, මේ තුන් ධර්මයෝ වනාහි සිත කෙලෙසන මලයෝය. සිතට අමිතුරෝය. සිතට සතුරෝය. සිතට හිංසා කරන්නෝය සිතට පසමිතුරෝ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ලොභයතෙම (තමහටද පරහටද) අවැඩ උපදවන්නේය. ලොභය සිත කලඹන්නේය. සිතෙහිම උපන් ලෝභය බියට හේතුයයි ජනතෙමේ නොදනී. ලෝභී පුද්ගලතෙමේ වැඩ නොදනී, ලොභි පුද්ගලතෙමේ ධර්මය පවා නොදනී. යම් කලෙක්හි ලොභය මිනිසාද මඩීද එකල්හි අඳබව කරන අඳුරුවෙයි.

"යමෙක් වනාහි ලොභය පහකොට ඇලුම් කටයුතු දිව්‍යමය රූපාදියෙහි නොඇලේද නෙලුම් කොළයකින් දියබිඳුසෙයින් ලොභය ආර්යමාර්ගයෙන් පහවෙයි. ද්වෙෂය තෙම අනර්ථ උපදවන්නේය. ද්වෙෂය තෙම සිත කළඹන්නේය. අභ්‍යන්තරයෙහි උපන් ද්වෙෂය භය හේතුයයි ජනතෙමේ නොදනී.

"ද්වෙෂයෙන් දූෂිත පුද්ගලතෙමේ අර්ථය නොදනී. ද්වෙෂයෙන් දූෂිතවූ පුද්ගල තෙමේ ධර්මයද නොදනී. යම් කලෙක්හි ද්වෙෂයතෙම සත්වයා මැඩලාද, එකල්හි අඳබව කරන (මොහ නමැති) අඳුර වෙයි.

"යමෙක් වනාහි ද්වෙෂය සුදුසු පරිද්දෙන් පහකොට ද්වෙෂකටයුතු අනිටු අරමුණෙහි දූෂ්‍ය නොකෙරේද, තැරියෙන් ගිලිහුණු තල් ගෙඩියක් සේ ඒ පුද්ගලයාගේ සිතින් ද්වෙෂය ප්‍රහීන වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මෝහයතෙමේ අවැඩ උපදවන්නේ වෙයි. මොහය තෙමේ සිත කළඹන්නේවෙයි. අභ්‍යන්තරයෙහි උපදනා මෝහය භය හෙතුයයි.

"මුළාවූ පුද්ගලතෙමේ වැඩ නොදනී. මුළාවූ පුද්ගල තෙමේ ධර්මයද නොදකී. යම් කලෙක්හි මොහය තෙමේ සත්වයා මඩීද, එකල්හි (ඔහුගේ) අන්ධභාවය කරන්නාවූ අඳුර වේ.

"යමෙක් වනාහි මොහය පහකොට මුළාවියයුතු අරමුණෙහි මුළා නොවේද, ඒ ආර්ය පුද්ගලතෙමේ උදාවන හිරු අඳුරු (නසන්නාසේ) සියලු මොහය (අර්හත් මාර්ගයෙන්) සහමුලින් නසා යයි."

**89. දෙවදත්ත අසද්ධම්ම සූත්‍රයː-** 2. "මහණෙනි, අසත්පුරුෂයන්ගේ තුන්ධර්මයකින් (හෝ) අශාන්තවූ තුන් දහමකින් මඩනාලද්දාවූ හාත්පස අල්ලාගන්නාලද සිත් ඇත්තාවූ දෙව්දත් තෙමේ අපායයෙහි ඉපදීමට සුදුස්සෙක්විය. (අවීචිමහ) නිරයයෙහි උපදින්නෙක්වීය. (සම්පූර්ණ) එක්අන්තරකල්පයක් සිටින්නෙක්වීය, පිළියම් නොකොට හැක්කෙක්වීය. කවර අසද්ධර්ම තුණකින්දයත්, මහණෙනි, "ලාමක අදහසින් මඩනාලද්දාවූ හැමපසින් අල්ලා ගන්නා ලද සිත් ඇති දෙව්දත් තෙමේ අපායයෙහි ඉපදීමට සුදුස්සෙක්ද (අවීචිමහ) නිරයෙහි උපදින්නෙක්ද අන්ත කල්පයක් මුලුල්ලෙහි සිටින්නෙක්ද පිළියම් නොකට හැක්කෙක්ද වීය. මහණෙනි, පවිටු මිතුරන් ඇතිබැවින් මඩනාලද්දාවූ හාත්පසින් අල්ලාගන්නාලද සිත් ඇත්තාවූ දෙවදත්ත තෙමේ අපායයෙහි ඉපදීමට සුදුස්සෙක්ද නිරයයෙහි උපදින්නෙක්ද අන්තඃකල්පයක් සිටින්නෙක්ද පිළියම් නොකට හැක්කෙක්ද විය. මත්තෙහි කටයුතුද, ඇති කල්හිද ස්වල්පවූ ධ්‍යානාභිඥාමාත්‍රයකින් විශෙෂවූ අතර (මැද) "නොකරනලද කටයුතු ඇත්තේම කරනලද කටයුතු ඇත්තේ වෙමි"යි මහණුවමින්) විනාශයට පැමිණියේය. මහණෙනි, මේ අසද්ධර්ම තුණෙන් වනාහි මඩනාලද්දාවූ හාත්පස අල්ලාගන්නාලද සිතැත්තාවූ දෙව්දත්තෙමේ අපායයෙහි ඉපදීමට සුදුස්සෙක්ද (අවීචිමහා) නිරයයෙහි උපදින්නෙක්ද (සම්පූර්ණ)

අන්තඃකල්පයක් සිටින්නෙක්ද පිළියම් නොකට හැක්කෙක්ද වීයයි.”

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“සත්ව ලොකයෙහි ඒකාන්තයෙන් ලාමක අදහස් ඇත්තාවූ කිසිවෙක් නූපදීවා, ලාමක අදහස් ඇත්තවුන්ගේ යම්බඳුගතියක්වේද එයද මේ කරුණෙන් දනිවු, දෙව්දත්තෙමේ පණ්ඩිතයෙකැයි ප්‍රසිද්ධවිය. වැඩුණු සිතැත්තෙකැයි ගෞරව කරනලද්දේය, ඒ දෙව්දත් තෙමේ සම්මා සම්බුදුන් වහන්සේ තමා හා සමාන බවට සිතුවේ ඒ තථාගතයන් වහන්සේ පෙළා ඉතා භයානකවූ දොර සතරක් ඇත්තාවූ අවීචිමහ නිරයට පැමිණියේය.

“යමෙක් පව්කම් නොකරන්නාවූ දූෂ්‍ය නොවූ සිත් ඇත්තහුට ද්වෙෂ කරන්නේද, දුෂ්ටවූ සිත් ඇති ආදර නැත්තාවූ ඒ පාප පුද්ගලයා කරා පාපඵලය පැමිණෙයි.

“යමෙක් විෂ පිරුණු කළයකින් මුහුද දූෂ්‍ය කරන්නට සිතන්නේද, භයගන්වන්නාක් බඳුවූ ඒ මහමුහුද ඒ දුෂ්ටසිත් ඇති පුද්ගලයා විසින් ප්‍රදූෂ්‍ය නොකට හැක්කේය, එපරිද්දෙන්ම යමෙක් දොෂයෙන් සමබවට පැමිණි සන්සුන් සිතැත්තාවූ තථාගතයන් වහන්සේ පෙළාද, ඒ තථාගතයන් වහන්සේ කෙරෙහි දොෂය නොපිහිටයි.

“යමෙකු අනුව ගියාවූ මහණ තෙමේ දුකෙහි අවසානයට පැමිණෙන්නේද, නුවණැති පුද්ගලතෙමේ එබඳු මිතුරෙකු කරන්නේය, ඔහුම සේවනය කරන්නේ යයි.”

**(විතක්ක වර්ගය නිමි)**

---

## 10. පසාද වර්ගය.

**90. අග්ගප්පසාද සූත්‍රයː-** 2. “මහණෙනි, මේ අග්‍රවූ රත්නත්‍රය කෙරෙහි හෝ ශ්‍රෙෂ්ඨවූ පැහැදීම් තුණක්වෙත්, කවරතුණක්ද

යත්, මහණෙනි, පානැත්තාවූද දෙපා ඇත්තාවූද සිවුපා ඇත්තාවූද බොහෝ පා ඇත්තාවූද රූ ඇත්තාවූද රූනැත්තාවූද සංඥාව ඇත්තාවූද සංඥාව නැත්තාවූද භවාග්‍රයට ඇතුළත්වූද යම් පමණ සත්වයෝ වෙද්ද, ඒ සත්වයන් අතුරෙන් තථාගත නම්වූ අර්හත් සම්‍යක් සම්බුදුන් වහන්සේ ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබෙයි. මහණෙනි, යම්කෙනෙක් බුදුරජුන් කෙරෙහි පහන්වූවාහුද ඔහුතුමූ ශ්‍රෙෂ්ඨයා කෙරෙහි පැහැදුනෝවෙත්, ශ්‍රෙෂ්ඨවූ බුදුරුවනෙහි ප්‍රසන්නවූවන්ට ශ්‍රෙෂ්ඨවූ විපාකය වෙයි.

3. "මහණෙනි, ප්‍රත්‍යයන් එකතුව කරනලද්දාවූද හෙතු ප්‍රත්‍යයන් විසින්ද කිසිවෙකු විසින්ද නොකරනලද්දාවූද යම් පමණ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අතුරින් මත්ගති මර්දනය කිරීමට නිමිතිවූ පිපාස නැසීමට නිමිතිවූ සියලු ආලයන් වැනසීමට නිමිතිවූ සංසාරය සිඳීමට නිමිතිවූ තෘෂ්ණාව ක්ෂයවීමට නිමිතිවූ රාගය වැනසීමට නිමිතිවූ නොපැවැත්මවූ තෘෂ්ණාව නැත්තාවූ යම් මේ නිවනෙක්වේද, (ඒ නිවන) අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි යම්කෙනෙක් නිර්වාණ ධර්මයෙහි ප්‍රසන්නාවූවාහුද, ඔව්හු ශ්‍රෙෂ්ඨ ස්ථානයෙහි පැහැදුනෝවෙත්, අග්‍රස්ථානයෙහි පැහැදුනවුන්ට අග්‍රවූ විපාකයවෙයි.

4. "මහණෙනි, යම්පමණ (ජන) සමූහයෝද ගණයෝද වෙද්ද, ඔවුන් අතුරෙන් යම් මේ පුරුෂයුගල සතරක් වෙද්ද, පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක් වෙද්ද තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සමූහ තෙමේ අග්‍රයයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සමූහතෙමේ දුරිනුදු ගෙණ ආ දන් පිළිගැන්මට සුදුසුය, දුරිනුදු අවුත් දියයුතු සත්කාරාදිය පැමිණවීමට සුදුසුය, අමුතු මහදන් පිළිගැන්මට සුදුසුය, කරන සත්කාරය පිළිගැණීමට සුදුසුය, (පරලොව අදහා දියයුතු දක්ෂිණාව පිළිගැණීමට සුදුසුය, කරනු ලබන ඇඳිලිබැඳීමට සුදුසුය. (සියලු) ලෝවැස්සාගේ අසමානවූ පින් කෙතවේ, මහණෙනි, යම් කෙනෙක් සංඝයා කෙරෙහි පැහැදුනාහුවෙද්ද, ඔහු තුමූ ශ්‍රෙෂ්ඨස්ථානයෙහි ප්‍රසන්න වූවාහුය, අග්‍රස්ථානයෙහි පැහැදුනවුන්ට අග්‍රවූ විපාකයවේ. මහණෙනි, මේ වනාහි තුන්

අග්‍රප්‍රසාදයෝ වෙත්යයි භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි (ගාථාවෙන්) මේ අර්ථය මෙසේ කියනු ලැබේ.”

**5.** “අග්‍රවූ තෙරුවන් කෙරෙහි හෝ ශ්‍රෙෂ්ඨ භාවයෙන් හෝ පැහැදුනාවූ (තෙරුවනගේ) අග්‍ර ස්වභාවය ගුණස්වභාවය දන්නවුන්ට විපාකය අග්‍රවේ. ශ්‍රෙෂ්ඨවූ දක්ෂිණාවට සුදුසුවූ අග්‍රවූ බුදුරජුන් කෙරෙහි පැහැදුනවුන්ටද, (සියලු) රාගයාගේ අතිශයින් නැසීමට හෙතුවූද සංසිඳුවීමට හේතුවූද (සංස්කාරයන්ගේ සංසිඳීම සුවය බැවින්ද සැප ඇත්තාවූ ශ්‍රෙෂ්ඨ ධර්මයෙහි පැහැදුනවුන්ටද, නිරුත්තර පින්කෙත්වූ ශ්‍රෙෂ්ඨවූ (ආර්ය) සංඝයා කෙරෙහිද පැහැදුනවුන්ටද ශ්‍රෙෂ්ඨ රත්නත්‍රය විෂයයෙහි දන්දෙන්නවුන්ට අග්‍ර පින් වැඩෙයි, අග්‍රවූ ආයුෂද රූප සම්පත්තියද පිරිවරද ගුණ ඝොෂයද සුවයද (කාය) බලය හා ඥාණ බලයද වැඩේ. ශ්‍රෙෂ්ඨරත්නත්‍රයට හෝ අග්‍රදානවස්තුව මහත්කොට හෝ දෙන්නාවූ නුවණැත්තාවූ අග්‍රවූ ප්‍රසාදධර්මයෙන් හෝ අග්‍රදෙය ධර්මයෙන් යුක්තවූ පුද්ගලතෙමේ දෙවිවූයේ හෝ මිනිස්වූයේ හෝ ශ්‍රෙෂ්ඨ බවට හෝ අග්‍රවූ ලොකොත්තර මාර්ගඵලයට හෝ පැමිණියේ විශෙෂයෙන් සතුටුවේයයි. මේ අර්ථයද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේයයි මාගේ ඇසීමවේ.”

**91. ජීවිත සූත්‍රයː-** 2. “මහණෙනි, ජීවිකාවන් අතුරින් පිඩු සෙවීමෙන් ජීවිකාව කරන්නහුගේ යම් ජීවිකාවක්වේද, මෙය ලාමකය, මහණෙනි, යම්හෙයකින් ලොකයෙහි පාත්‍රය ගත් අත් ඇත්තෙක්ම පිඩු සොයන්නේ හැසිරෙන්නෙහියයි දොස් කීමක්වේද, මහණෙනි, කුලපුත්‍රයෝ කරුණක් නිසා ඒ ඒ දොස් ලැබීමටද පැමිණෙත්, රජුන් විසින් (බන්ධනයට) පමුණුවනලද්දාහු නොම පැමිණෙත්, සොරුන් විසින් පමුණුවන ලද්දාහු නොම පැමිණෙත්, ණය ගැතියෝව නොමලබත්, භයින් පෙළුනාහු නොමලබත්, ජීවත්විය නොහෙන බැවින් මඩනලද්දාහු නොමලබත්,

3. “මෙහි කරුණක් ඇත ඉපදීමෙන්ද ජරාවෙන්ද මරණයෙන්ද ශොකයෙන්ද වැළපීමෙන්ද කායික දුඃඛයෙන්ද

චෛතසික දුඃඛයෙන්ද දැඩි ආයාසයෙන්ද ගැවසීගත්තෝ වම්හ. දුඃඛයන් විසින් ඇතුළත පමුණුවන ලද්දෝවම්හ. මඩනාලද්දෝවම්හ, මේ හැම දුක්රැසගේ කෙළවර කිරීම පෙණෙන්නේ නම් ඉතා යෙහෙකැයි”යි (පැවිදවීය.)

**4.** “මහණෙනි, මෙසේ පැවිදිවූ මේ කුලපුත්‍රතෙමේද විෂමලොභය බහුලකොට ඇත්තේවේද, වස්තුකාම ක්ලේශ කාමයන්හි දැඩිව ඇලුම් ඇත්තේවේද, ක්‍රොධයෙන් (යුක්ත බැවින්) විකාරයට පැමිණිසිත් ඇත්තේවේද, දුෂ්ටවූ කල්පනා ඇත්තේවේද, මුළාවූ සිහිය ඇත්තේවේද, ප්‍රඥාව නැත්තේවේද, නොපිහිටි සිත් ඇත්තේවේද, භ්‍රාන්තවූ සිත් ඇත්තේවේද, සංවරනොවූ ඉඳුරන් ඇත්තේවේද,

**5.** “මහණෙනි, යම්සේ වනාහි දෙකොණෙහි ගිනිගත් මැද අසූචි තැවරුණු සොහොන් පෙනෙල්ල ගමේ දර පිණිසද නොමගන්නේද, වනයෙහි දර පිණිසද නොම ගන්නේද, මහණෙනි, මම මේ දුසිල් පුද්ගලයා එසේ සොහොන් පෙනෙල්ල බඳුයයි කියමි. ගිහියන් විසින් සැපතින්ද පිරිහුණේය, ශ්‍රමණභාවයවූ ප්‍රයෝජනයද සම්පූර්ණ නොකෙරේයයි.”

**6.** භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> “කාලකණ්ණි තෙමේ ගිහිසැපතින්ද පිරිහිණ, වැනසෙන්නේ මහණකමේ අර්ථයද විනාශ කෙරෙයි. හෙතෙම සොහොන් පෙනෙල්ලක් මෙන් නැසෙයි. “කසාවතින් හාත්පස දැවටූ බොටුව ඇත්තාවූ ලාමක ස්වභාවය ඇත්තාවූ සංයම නැත්තාවූ බොහෝ පව්කමින් ඒ පව්ටෝ නිරයයෙහි උපදිත්,
>
> “සංවර නැත්තාවූ සිල්නැති පුද්ගලතෙමේ රට වැස්සන් විසින් දෙනලද යම් ආහාරයක් වළඳන්නේද, (එයට වඩා) රත්වූ ගිනිසිලක් බඳුවූ යකඩගුළියක් අනුභව කරනලද්දේ උතුම් වේයයි.”

**92. සංඝාටිකණ්ණ සූත්‍රය:-** 2. “මහණෙනි, ඉදින් මහණතෙමේ (මාගේ) සඟළ සිවුරුකොණ අල්වාගෙන පිටිපසින් පිටිපසින් (මාගේ) පාතැබූතැන (ඔහුගේ) පාතබමින් මා අනුව

යන්නෙක් වන්නේද ඒ මහණතෙමේද විෂම ලොභය බොහෝකොට ඇත්තේවේද, වස්තුකාම ක්ලේශ කාමයන්හි දැඩි ඇලුම් ඇත්තේවේද, ක්‍රොධවශයෙන් විකාරයට පැමිණි සිත් ඇත්තේවේද, ප්‍රදුෂ්‍යසිත් ඇත්තේවේද, මුළාවූ සිහිය ඇත්තේවේද, සම්‍යක් ප්‍රඥාව නැත්තේවේද, එකඟ නොවූ සිත් ඇත්තේවේද භ්‍රාන්තවූ සිත් ඇත්තේවේද, සංවර නොවූ ඉඳුරන් ඇත්තේවේද, එසේවුවද ඒ මහණ තෙමේ, මා කියනලද පිළිවෙත නොපුරන්නේ මා කෙරෙන් දුරෙහිමවේ, මමද ඔහුගෙන් දුරෙහිම වේ. ඊටහෙතු කවරේද? මහණෙනි, යම්හෙයකින් ඒ මහණතෙමේ නොදකීද, ධර්මය නොදක්නේ මා නොදකීද,

3. "මහණෙනි, ඉදින් ඒ මහණතෙමේ යොදුන් සියයක් සීයක් යොදුන් මත්තෙහි වසන්නේද, ඒ මහණ තෙමේ වනාහි විෂම ලොභය බහුලව නැත්තේවේද, වස්තුකාම ක්ලෙශකාමයන්හි දැඩි ඇලුම් නැත්තේවේද, (ක්‍රොධයෙන්) විකාරයට පැමිණි සිත් නැත්තේ වේද ප්‍රදුෂ්‍යසිත් නැත්තේවේද එළඹ සිටි සිහිය ඇත්තේවේද මනානුවණ ඇත්තේවේද, සමාධියෙන් යුක්තවූයේවේද එකඟ සිත් ඇත්තේවේද වැසුණු ඉඳුරන් ඇත්තේවේද, එසේවූ දුරසිටි හෙතෙම මාගේ සමීපයෙහිමවේ. මමද ඔහුගේ සමීපයෙහි වෙමි, ඊට හෙතු කවරේද, මහණෙනි, යම්හෙයකින් ඒ මහණ තෙමේ ධර්මය බලාද, ධර්මය බලන්නේ මා බලාද (එහෙයිනියි)"

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "ඉදින් මහත් ආශාව ඇත්තාවූ ක්‍රොධය ඇත්තාවූ, තෘෂ්ණාවට දාසයෙකු වැනිව අනුව යන්නාවූ නොනිවියාවූ තෘෂ්ණාව නැත්තාවූ කෙලෙස් පිරිනිවියාවූ (බුදුන් වහන්සේට) ලුහුබඳින්නේ වන්නේද,
>
> "ගිජුවූ ඒ පුද්ගලතෙම පහවූ තෘෂ්ණාව ඇත්තාවූ (බුදුන් වහන්සේට යම්පමණ දුරෙහිවේද, එයබලව, පණ්ඩිතවූ ඒ මහණතෙමේද (චතුස්සත්‍ය) ධර්මය දැන සුළං නැතිතන්හි විලක්සේ තෘෂ්ණාව නැත්තේ සංසිඳෙයි.

"තෘෂ්ණාව නැත්තාවූ කෙලෙස් පිරිනිවියාවූ ඒ මහණතෙමේ පහවූ තෘෂ්ණාව ඇත්තාවූ බුදුන් වහන්සේට (ධර්මය ස්වභාවයෙන්) සමීපයෙහිවූයේ යම් පමණද, (එය) බලවයි."

**93. අග්ගිත්තය සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ ගිනි තුණක් වෙත්, කවර තුනක්දයත්, රාග නමැති ගින්නය, ද්වෙෂ නමැති ගින්නය, මොහ නමැති ගින්නය (යන තුනය.) මහණෙනි, මේ වනාහි තුන් ගිනි වෙති. රාග නමැති ගින්න මිථ්‍යාචාරයට පැමිණියාවූ ඇලුනාවූ සත්වයන් දවයි, ද්වෙෂ නමැති ගින්න වනාහි විකාරයට පැමිණිසිත් ඇත්තාවූ ප්‍රාණඝාත කරන සුලුවූ සත්වයන් (දවයි) මොහ නමැති ගින්න වනාහි ආර්ය ධර්මයෙහි දක්ෂ නොවූ අතිශයින් මුළාවූ (සත්වයන් දවයි.) මේ තුන් ගිනි නොදන්නාවූ සත්වයෝ උපාදානස්කන්ධ පඤ්චකයෙහි ඇලුනාහුය.

3. "ඒ සත්වයෝ සියලු නරකයද තිරිසන් යෝනියද අසුරනිකායද ප්‍රෙතවිෂයයද වඩත්, (ඔව්හු) ක්ලේශ බන්ධනයෙන් නොමිදුනාහුය, යම්කෙනෙක් වනාහි රෑ දාවල් දෙක්හි සම්‍යක් සම්බුදුන්වහන්සේගේ අනුශාසනයෙහි යෙදුනාහුද, නිතර අශුභය යන සංඥාව ඇත්තාවූ ඒ යොගීහු රාග නමැති ගින්න නිවයි. මොහ නමැති ගින්න වනාහි උතුම් මිනිස්සු මෛත්‍රීභාවනාවෙන් නිවත්, කෙලෙස් රැස විනිවිද පවත්නාවූ යම් ප්‍රඥාවක් වේද, ඒ ප්‍රඥාවෙන් මොහ නමැති ගින්න (නිවයි.) (ඒ යොගීහු) සියලු (ගිනි) නිවා මුහුකුරාගිය ප්‍රඥාව ඇත්තාහු රෑ දාවල්හි අලස බැව් නැත්තාහු ස්කන්ධ ඉතිරිනොකොට පිරිනිවන්පාත්, සියලු (සංසාර දුඃඛය ඉක්මවූහ.)

4. "ආර්යවූ නිවන හෝ ආර්යවූ චතුස්සත්‍ය ධර්ම හෝ දක්නාවූ මාර්ගඥානයට හෝ මාර්ගඥානයෙන් ගියාවූ පණ්ඩිතයෝ මොනවට දැන ඉපදීම ක්ෂයවූ නිවන දැන පුනරුත්පත්තියට නොපැමිණෙත්යයි."

**94. උපපරික්ඛා සූත්‍රයඃ-** 2. "මහණෙනි, යම් යම් ප්‍රකාරයකින් නැවත නැවත පරීක්ෂා කරන්නාවූ හෝ සිහිකරන්නාවූ පටන්ගන්නාලද විදර්ශනා ඇති මේ භික්ෂුවගේ සිත එකඟවේද,

නොවිසුරුණේ වේද, යම් හෙයකින් වීර්යය මදව උසුලන කල්හි සමාධියගේ බලවත් බැවින්ද කුසීතයෙන් මඩනා ලද බැවින්ද කර්මස්ථාන අරමුණෙහි සිටියේ නම් වේද, වීර්ය සමතාවෙන් නොසිටියේවේද, රූපාදියක් නොගෙන ත්‍රස්ත නොවන්නේද, ඒ ඒ ප්‍රකාරයෙන් නැවත නැවත පරීක්ෂාකරන්නේය. මත්තෙහි ඉපදීමය. ජරාවය මරණය සියලු දුඃඛයන්ගේ ඉපදීම නොවේයයි.”

**3.** මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“තෘෂ්ණා, දෘෂ්ටි, මාන, ක්‍රොධ, අවිද්‍යා, ක්ලෙශ දුශ්චරිත සංඛ්‍යාත ඇලීම් සත ප්‍රහීණ කළාවූ සිඳින ලද භව තෘෂ්ණාව ඇත්තාවූ භික්ෂුවගේ ඉපදීමවූ සසර ක්ෂයවූයේය, නැවත ඉපදීමෙක් නැතැයි.”

**95. කාමුප්පත්ති සූත්‍රයඃ-** 2. “මහණෙනි, මේ කාමයන්ගේ උත්පත්තීහු තුන්දෙනෙකි. කවර තුන්දෙනෙක්ද යත්? පැමිණසිටි කාමයෝය, නිර්මානරතී කාමයෝය, පරනිර්මිතවශවර්ති (කාමයෝය) මහණෙනි, මේ වනාහි කාමයන්ගේ ප්‍රතිලාභ තුන වෙත් යයි.”

**3.** මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“පැමිණ සිටි කාමය ඇත්තෝය, අනුන් විසින් මවන ලද කාමයන් (තමාගේ) වශයෙහි පවත්වන්නාවූ යම් දෙවියෝ වෙද්ද, (තමා විසින්) මවනලද කාමයෙහි ඇලීම ඇත්තාවූ යම් දෙවියෝ වෙද්ද, කාමයන් අනුභව කරන්නාවූ අන්‍යවූ යම් කෙනෙක් (ඇද්ද, ඔහු)

“මේ (ලබනලද) ආත්මභාවයෙහිද නැවත උපදින අන්‍යභවයයි කියනලද මෙයින් සසර නොඉක්මවත්. දිව්‍යවූ යම්කාමයෝ වෙද්ද, මිනිසුන් සතු වූ යම් කාමයෝ වෙද්ද, (ඒ) හැම කාමයන් පහකරන්නේය.

“(යම් කෙනෙක්) ප්‍රිය ස්වභාවය ඇත්තාවූ රූපාදී අරමුණුවල සුඛ වෙදනා රසවිඳීමෙන් ගිජුවූ ඉක්මවන්නට දුෂ්කරවූ

තෘෂ්ණා දියපහර සිඳ සියලු සංසාරදුඃඛය ඉක්මවූවාහුද, (ඔහු තුමූ) සියලු (කෙළෙස් ගිනි) නිවත්.

"ආර්යවූ (බුද්ධාදීන් විසින්) දක්නාලද නිවණ හෝ චතුස්සත්‍යධර්මය දුටු මාර්ග ඥානයට පැමිණියාවූ හෝ මාර්ග ඥානයෙන් සසර කෙළවරට ගියාවූ දතයුතු දේ මනාව දැන (ඒ) පණ්ඩිතයෝ ජාතික්ෂය සංඛ්‍යාතවූ නිර්වාණය දැන නැවත භවයෙහි ඉපදීමට නොපැමිණෙත් යයි."

**96. යොගයුත්ත සූත්‍රයː-** 2. "මහණෙනි, පඤ්චකාම බන්ධනයෙහිවූ රාගයෙන් යුක්තවූද භව රාගයෙන් යුක්ත වූද, පුද්ගලතෙමේ එනසුලුවේ. මේ මිනිසත්බවට එන්නේවේ. මහණෙනි, කාම තෘෂ්ණාවෙන් තොරවූ භව රාගයෙන් යුක්තවූ පුද්ගලතෙමේ නොපැමිණෙනසුලු වෙයි. මේ මිනිසත් බවට නොඑන්නේ වෙයි. මහණෙනි, කාම තෘෂ්ණාවෙන් තොරවූද භවරාගයෙන් තොරවූද පුද්ගලතෙමේ ක්ෂය කරණලද ආශ්‍රවයන් ඇත්තාවූ රහත් වේයයි.

**3.** මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"කාම රාගයෙන් යුක්තවූද, භවරාගයෙන් යුක්තවූද කාම රාග භව රාග දෙකින් යුක්තවූද ඉපදීමට හා මැරීමටද පැමිණෙනසුලුවූ සත්වයෝ සසරට යෙති.

"යම් කෙනෙක් වනාහි කාමරාග යයි කියනලද ක්ලේශකාමය පහකොට චතුරාශ්‍රවයන්ගේ ක්ෂය කිරීමට නොපැමිණියාහුද, භව රාගයෙන් යුක්තවූ අනාගාමීහු කාමලෝකයට නොපැමිණෙන්නාහුයයි කියනු ලැබෙත්.

"සිඳින ලද සැකය ඇත්තාවූ යම් සත්වකෙනෙක් වනාහි ක්ෂයවූ නවවැදෑරුම් භයද මත්තෙහි පුනර්භවයද ඇත්තාහු වෙත්. යම් කෙනෙක් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමට පැමිණියාහු වෙද්ද, ඒ සත්වයෝ ඒකාන්තයෙන් ලොකයෙහි එතෙරට ගියාහුයයි."

**97. කල්‍යාණ සීල සූත්‍රයː-** 2. “මහණෙනි, සොඳුරු සිල් ඇත්තාවූ කල්‍යාණ බොධිපාක්ෂික ධර්ම ඇත්තාවූ කල්‍යාණ (මාර්ගඵල) ප්‍රඥා ඇත්තාවූ මහණතෙම මේ ශාසනයෙහි රහත් වූ වැස නිමවනලද මාර්ග බ්‍රහ්මචරියාව ඇත්තාවූ උත්තම යයි කියනු ලැබේ. මහණෙනි, මහණතෙමේ කෙසේ නම් කල්‍යාණ සිල් ඇත්තේවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ සිල් ඇත්තේවේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ වාසය කෙරේද, ස්වල්පමාත්‍ර දොෂයෙහි පවා භය දක්නාසුලුව, සමාදන්ව (මනාව ගෙන) ශික්ෂාපදයන්හි හික්මේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ මනා සිල් ඇත්තේ වෙයි. මනා සිල් ඇත්තේ මේ ප්‍රකාරයෙනි.

3. “කෙසේ නම් යහපත් බොධිපාක්ෂික ධර්ම ඇත්තේ වේද, මහණෙනි, මේ සස්නෙහි මහණතෙමේ සප්ත බොධි පාක්ෂික ධර්මයන් වැඩීමෙහි නැවත නැවත යෙදුනේ වාසය කෙරේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ සොඳුරු දහම් ඇත්තේ වෙයි, යහපත් සිල් ඇත්තේද, යහපත් දහම් ඇත්තේද මේ ප්‍රකාරයෙනි.

“කෙසේ නම් සුන්දර ප්‍රඥාව ඇත්තේවේද, මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙමේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රවයන් නැත්තාවූ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵලය හා එක්ව යෙදුනු ප්‍රඥාවද මේ ආත්මභාවයෙහි තෙමේම විශිෂ්ට ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම කලණ නුවණ ඇත්තේ වෙයි. මේ ප්‍රකාරයෙන් හොඳ සිල් ඇත්තේ හොඳ දහම් ඇත්තේ හොඳ ප්‍රඥාව ඇත්තේ මේ ශාසනයෙහි රහත්යයිද වැසනිමවන ලද මාර්ග බ්‍රහ්මචර්යය ඇත්තේයයිද උතුම් පුරුෂයයිද කියනු ලැබේ යයි.”

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි (ගාථාවෙන්) මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

“යමෙකුගේ කයින්ද, වචනයෙන්ද, සිතින්ද, දුශ්චරිතයන් නැත්තේද, ලජ්ජා ඇත්තාවූ නොහොත් හිරිඔතප් දෙකින්

යුත් සිත්ඇත්තාවූ ඒ මහණ සොඳුරු සිල් ඇත්තේ යයි කියත්.

"යමෙකු විසින් ආර්ය මාර්ග ඥානයට පමුණුවන්නාවූ සප්ත ධර්මයෝ මොනවට වඩන ලද්දාහුද, අධික රාගාදී කෙලෙස් නැත්තාවූ ඒ භික්ෂුව ඒකාන්තයෙන් සොඳුරු දහම් ඇත්තේයයි කියත්.

"යමෙක් සංසාරදුඃඛය (නොහොත්) සංසාරදුඃඛයට හේතූන්ද මේ ආත්මභාවයෙහිම ක්ෂයවන බව දනීද, ආශ්‍රවයන් නැත්තාවූ ඒ භික්ෂුව ඒකාන්තයෙන් සුන්දර ප්‍රඥාව ඇත්තේයයි කියත්.

"ඒ ධර්මයන්ගෙන් යුක්තවූ නිදුක්වූ සිඳිනලද සැක ඇත්තාවූ ඇසුරු නොකළාවූ සියලු සත්වලොකයෙහි හැම (කෙලෙස්) පහකළාවූ (රහත්හු) යයි කියත් යයි."

98. **ධම්මදාන සූත්‍රයඃ-** 2. "මහණෙනි, මේ දාන දෙකකි. ආමිෂ දානයද, ධර්ම දානයද (යන දෙකය) මහණෙනි, මේ දාන දෙක අතුරෙන් යම් මේ ධර්ම දානයක්වේද, මේ ධර්ම දානය අග්‍රවේ. මහණෙනි, මේ බෙදීම් දෙකෙකි, තමා විසින් අනුභව කරනලද සිව්පසයෙන් තමාම අනුභව නොකොට අනුන්ට බෙදාදීම ද තමා විසින් උගත් ධර්මයාගේ උපදේශය අනුන්ට දීම (යන දෙකය.) මහණෙනි, මේ (මනා බෙදීම්) දෙක අතුරෙන් යම් මේ ධර්මය බෙදීමක් වේද, මේ බෙදීම ශ්‍රෙෂ්ඨය.

3. "මහණෙනි, මේ අනුග්‍රහ දෙකෙකි. අමිෂානුග්‍රහයද ධර්මානුග්‍රහයද (යන දෙකය,) මහණෙනි, මේ අනුග්‍රහයන් දෙක අතුරෙන් යම් මේ ධර්මානුග්‍රහයෙක් වේද, මේ ධර්මානු ග්‍රහය උතුම්යි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ කරුණ මෙසේ කියනු ලැබේ.

"යම් දනක් උතුම්යයිද, නිරුත්තරයයි ද, කියද්ද, භාග්‍යවතුන් වහන්සේ උතුම් වූ අග්‍රවූ යම් බෙදීමක් වර්ණනා කළසේක්ද, උතුම් පින්කෙත්වූ බුද්ධ, බුද්ධ ශ්‍රාවකයන්

කෙරෙහි පහන් සිත් ඇති දන්නාවූ කවර නම් නුවණැත්තෙක් හමුවූ කල්හි නොදෙන්නේද?

"යම් කෙනෙක් වනාහි බුදුරජුන්ගේ ශාසනයෙහි ප්‍රසන්න සිත් ඇත්තාහු (දහම්) දෙසද්ද, අසද්ද, ඒ දෙදෙනා දන් පිළිගනිත්. යම් කෙනෙක් සුගතයන් වහන්සේගේ ශාසනයෙහි අප්‍රමාදවූවාහු වෙද්ද, ඔවුන්ගේ උතුම් වූ අර්ථය පිරිසිදු වේයයි."

**99. තෙවිජ්ජ (බ්‍රාහ්මණ) සූත්‍රයඃ-** 2. "මහණෙනි, මම න්‍යායයෙන් (මනා පිළිපැදීම යයි කියන ලද කරුණෙන්) ත්‍රිවිද්‍යාවෙන් යුත් බ්‍රාහ්මණයා හඳුන්වමි. (බමුණු යයි) කියන කියවන පමණින් අන්‍යවූ ජාතිමත් බ්‍රාහ්මණයා නොහඳුන්වමි.

**3.** "මහණෙනි, කෙසේ නම් න්‍යායයෙන් ත්‍රිවිද්‍යාව ඇත්තාවූ බාහිත පාපී බ්‍රාහ්මණයා පණවම්ද, කියන කියවන පමණින් ජාතිමත්වූ අන්‍ය බ්‍රාහ්මණයා නොපණවම්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ අනෙක ප්‍රකාරයෙන් පැවැති පෙර විසූ ජාති පිළිවෙළ සිහි කෙරෙයි. ඒ කෙසේද? එක් ජාතියක්ද (මෙහි අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ 1 වර්ගයේ 8 සූත්‍රයේ 4-11 ඡෙද යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහි න්‍යායයෙන් (කාරණයෙන්) ත්‍රිවිද්‍යාවෙන් යුත් බ්‍රාහ්මණයා ත්‍රිවිද්‍යාවෙන් යුක්තයයි හඳුන්වමි. (මින්) අන්‍යවූ (ජාතිමත් බ්‍රාහ්මණයා) යජුර්වෙදාදිය කියන කියවන ප්‍රමාණයෙන් ත්‍රිවිද්‍යාව ඇත්තේයයි නො පණවමියි."

**5.** "මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් මහණෙක් තෙමේ පෙරවිසූ ජාති පිළිවෙළ දනීද සදෙව් ලොවද නව බඹලොවද සතර අපායද දකීද, යළිදු ඉපදීම ක්ෂය කරන්නාවූ රහත් බවට හෝ නිවණට පැමිණියේද, විශෙෂයෙන් දැන කෙළවරට පැමිණියේද මුනිතෙම "(යථොක්ත) ත්‍රිවිද්‍යාවන් කරණ කොටගෙන ත්‍රිවිද්‍යාව ඇති බමුණු වෙයි. මම ඒ මහණහු

ත්‍රිවිද්‍යාවෙන් යුත් බමුණුයයි කියමි. කියන ලද තෙපුල් පමණක් ඇති අන්‍යවූ ජාතිමත් බ්‍රාහ්මණයා ත්‍රිවිද්‍යාවෙන් යුක්තයයි නොකියමි.”

10. පසාද වර්ගය නිමි.
(තික නිපාතය නිමි.)

---

# චතුක්ක නිපාතය.

## 11. බ්‍රාහ්මණ වර්ගය.

**100. සල්ලකත්ත බ්‍රාහ්මණ සූත්‍රය:-** 2. “මහණෙනි, මම බ්‍රාහ්මණ වෙමි. යාචකයන් හා යෙදුනේ වෙමි, ධර්ම දානයෙහි යෙදුනේ වෙමි. (නොහොත්) පරිත්‍යාග වැඩීමෙහි යෙදුනේ වෙමි. හැමකල්හි (සද්ධර්මදානය දීමට) පිරිසිදු කරණ ලද අත් ඇත්තේ වෙමි. (සද්ධර්මදානයෙහි) යුක්ත ප්‍රයුක්ත වූයේවෙමි. බ්‍රහ්මචර්ය වාසයෙන්ද, පශ්චිම ආත්මභාවය දන්නේ වෙමි. (පිළියම් කිරීමට දුෂ්කරවූ වෘත්ත දුඃඛ නමැති රෝගයට පිළියම් කරන හෙයින් උතුම්වූ වෙදා වෙමි. ශල්‍යකර්ම කරන වෙදා වෙමි. තෙපි ඒ මාගේ හෘදය සම්බන්ධවූ මුඛයෙන් උපන්නාවූ ද්වාරයවූ ප්‍රාති මොක්ෂයෙන් උපන්නාවූ විමොක්ෂ මුඛයෙන් හෝ උපන්නාවූ ශාසන ධර්මයෙහි හෝ ආර්ය ධර්මයෙහි උපන්නාවූ ඒ ධර්මයෙන්ම මැවුණාවූ බෝධිපාක්ෂික ධර්ම දායාද කොට ඇත්තාවූ (ලාභසත්කාරාදී) ආමිෂ දායාද කොට නැත්තාවූ පුත්‍රයෝ වෙමු.

“මහණෙනි, ආමිෂදානයද ධර්මදානයද (යන) මේ දාන දෙකකි. මහණෙනි, මේ දාන දෙක අතුරෙන් යම් මේ ධර්මදානයක් වේද, මේ ධර්මදානය උතුමි. මහණෙනි, තමා ලද සිව් පසය අනුන්ට බෙදා දීමද ධර්ම සංවිභාග (බණ කීම කියවීම උගැන්වීම් ආදිය) යන සංවිභාග දෙකෙකි. මහණෙනි, මේ බෙදීම් දෙක අතුරින් යම් මේ ධර්ම සංවිභාගයෙක් වේද, මේ ධර්ම සංවිභාගය ශ්‍රෙෂ්ඨය.

"මහණෙනි; මේ අනුග්‍රහ දෙකෙකි. ආමිෂානුග්‍රහය ධර්මානුග්‍රහය යන දෙකය. මහණෙනි, මේ අනුකම්පාවන් දෙක අතුරින් යම් මේ ධර්මානුග්‍රහයෙක් වේද, මෙය අග්‍රය.

"මහණෙනි, යාග (මහාදාන) දෙකෙකි. ආමිෂ යාගය ධර්ම යාගය (යන දෙකය) මහණෙනි, මේ මහාදාන දෙක අතුරෙන් යම් මේ ධර්ම යාගයෙක් වේද, මේ ධර්ම යාගය, උතුම්යි."

3. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මසුරු බැව් නැත්තාවූ සියලු සත්නට අනුකම්පා කරන්නාවූ තථාගත නම්වූ යම් බුදුවරයෙක් ධර්ම දානය දුන් සේක්ද, එබඳුවූ දෙව්මිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූ භවයන්ගේ පරතෙරවූ නිවනට පැමිණියාවූ උන්වහන්සේට සත්වයෝ වඳිතියි."

**101. අප්ප සුලභ සූත්‍රයඃ-** 2. "මහණෙනි, ස්වල්පවූද සුවසේ ලැබිය හැකිවූද, මේ කරුණු සතරෙකි. ඔව්හුද නිර්දොෂ වෙත්, කවර සතරක්ද යත්? මහණෙනි, සිවුරු අතුරෙන් පංසුකූල සිවුර ස්වල්පද වේ. සුවසේ ලැබිය හැකිද වේ. එයද නිර්දොෂය.

මහණෙනි, බොජුන් අතුරෙන් පිණ්ඩියා ලොප භොජනය ස්වල්පද වෙයි. ලබන්නට පහසුද වෙයි. එයද නිර්දොෂයි.

"මහණෙනි, සෙනසුන් අතුරෙන් වෘක්ෂමූලය මදද වෙයි. ලැබීම පහසුද වෙයි, එයද නිවරදය."

"මහණෙනි, බෙහෙත් අතුරෙන් (යම්කිසි ගොමූත්‍රයක් ස්වල්පද වෙයි. ලැබීමට පහසුද වෙයි, හෙද නිර්දොසය."

"මහණෙනි. මේ සතර වනාහි ස්වල්පද වෙත්, ලැබීමට පහසුද වෙත්, ඒවාද නිරවද්‍ය වෙති. මහණෙනි, යම් මහණෙක් වනාහි මද දැයින්ද ලැබීමට පහසු දැයින්ද සතුටු වූයේ වේද, මේ සතුටුවීම මේ භික්ෂුවගේ එක් ශ්‍රමණභාවයට කරුණ කැයි කියම්යි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"සෙනසුන්ද සිවුරුද පාන වර්ග හා බොජුන්ද අරබයා පීඩා විඳින බවෙක් නිර්දොෂවූද ස්වල්පවූද ලැබීමට පහසුවූද සතුටුවන්නාහට නොවේ. දිශාවෝ නොනැසෙත්.

"මේ ශ්‍රමණ භාවයට සුදුසුවූ යම් ප්‍රතිපත්ති ධර්ම කෙනෙක් වදාරන ලද්දාහුද අප්‍රමාදයෙන් යුක්තවූ භික්මෙන්නාවූ (ලද දැයින්) සතුටුවන මහණහු විසින් ඒ සියලු පිළිවෙත් ගන්නා ලද්දාහු යයි."

**102. ජානතො ආසවක්ඛය සූත්‍රයඃ-** 2. "මහණෙනි, මම දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂයය කියමි. නොදන්නහුගේ නොදක්නහුගේ (ආශ්‍රවක්ෂයය) නොකියමි. මහණෙනි, කුමක් දන්නහුගේ කුමක් දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම වේද?

3. "මහණෙනි, මේ දුක යයි දන්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම වෙයි. මහණෙනි, මේ දුක ඉපදීමට හෙතුවයයි. දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම වෙයි. මහණෙනි, මේ දුක නිරුද්ධ කිරීමයයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම වෙයි. මහණෙනි, මේ දුක නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිපදාවයයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම වේ. මහණෙනි, මෙසේ දක්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමවේ යයි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"හික්මෙන්නාවූ ඍජුවූ ආර්යමාර්ගයන් පිළිවෙළින් උපදවන්නාවූ ශෛක්ෂ පුද්ගලයාගේ ක්ෂය යයි කියන ලද අග්‍රමාර්ගයෙහි නුවණ පළමුව (උපදී) ඒ මාර්ග ඥානයට අනතුරුව රහත් බව උපදී. මාර්ගය අනුව යන්නහුගේ ක්ෂය නම්වූ ශ්‍රොතාපත්ති මාර්ගයෙහි පළමු ඤාණයවූ අනඤ්ඤාතඤ්ඤස්සාමීන්ද්‍රියය (උපදී,) ඒ පළමු ඤාණයෙන් අනතුරුව පටන් අනාවූ අඤ්ඤින්ද්‍රියය (උපදී,)

"ඒ අඤ්ඤින්ද්‍රියයෙන් ප්‍රඥා විමුක්තියවූ අඤ්ඤාතාවින්ද්‍රියයෙන් මිදුනහුගේ උතුම්වූ ඵලයෙහි හා

නිර්වාණයෙහිද ඥානය (උපදී,) ක්ෂය කරන්නාවූ (අනාර්ය මාර්ගයෙහි) ඤාණය (උපදී,) සංයොජනයෝ ක්ෂය කරන ලද්දාහුයයි (ප්‍රත්‍යවෙක්ෂාඥානය (උපදී,)

"සියලු ක්ලෙශ බැම්වල මිදීමට නිමිතිවූ මේ නිවන වූකලී අලසයා විසින්ද නොදන්නාවූ බාලයා විසින්ද නොම ලැබිය යුතුයයි."

**103. ජාති ජරූපග (ශ්‍රමණ බ්‍රාහ්මණ) සූත්‍රයඃ-** 2. "මහණෙනි, යම් කිසි ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ මෙතෙක් දුකයයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද, මේ මෙතෙක් දුක උපදින හෙතුයයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද, මේ දුක නිරුද්ධ කිරීමයයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද, මේ දුක නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද.

"මහණෙනි, ශ්‍රමණවූ හෝ බ්‍රාහ්මණවූ හෝ ඔව්හු මා විසින් ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි හෝ අනුනොදන්නා ලද්දාහුය. බමුණන් කෙරෙහි බමුණුයයි හෝ අනුනොදන්නා ලද්දාහුය. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණඵලය හෝ බ්‍රාහ්මණඵලය හෝ (නොහොත්) සතර ආර්ය මාර්ගය හෝ සතර ආර්යඵලය හෝ යම් ආත්මභාවයෙහිම තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ නොම වෙසෙත්.

**4.** "මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් වේවයි බමුණෝ වේවයි මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනිද්ද, මේ දුක උපදින හෙතුයයි තත්වූ පරිද්දෙන් දනිද්ද, මේ දුක නිරුද්ධ කිරීමයයි තත්වූ පරිද්දෙන් දනිද්ද, මේ දුක නිරුද්ධ කිරීමට පමුණුවන පිළිපැදීමයයි තත්වූ පරිද්දෙන් දනිද්ද, මහණෙනි ශ්‍රමණවූ හෝ බ්‍රාහ්මණවූ හෝ ඔහු තුමූ මා විසින් මැඩ පවත්වන ලද පව් ඇති ශ්‍රමණයන් කෙරෙහිද ශ්‍රමණයයි දන්නා ලද්දාහුය; බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ යයි දන්නා ලද්දාහුය. ඒ ආයුෂ්මත්හුම සතර ආර්ය මාර්ගයද සතර ආර්ය ඵලයද මේ ආත්ම භාවයෙහිම තුමූ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වෙසෙත් යයි."

**5.** මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක; එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් කෙනෙක් දුකද නැවත දුකෙහි ඉපදීම නොදනිද්ද, ඔහු යම් නිවනෙක්හි සියලු දුක නිරුද්ධ වේද; දුක සංසිඳුවීමට පමුණු වන්නාවූ ඒ මාර්ගයද නොදනිත්. චෙතො විමුක්තියෙන් හීනවූද යළි ප්‍රඥාවිමුක්තියෙන් හීනවූද ඔහු තුමූ සසර දුක කෙළවර කිරීමට යොග්‍යවූවෝ නොවෙත්. ඔහු තුමූ ඒකාන්තයෙන් ජාති ජරා දුක්වලට පැමිණෙන්නාහු වෙත්.

"යම් කෙනෙක් වනාහි දුකද නැවත දුක (ඉපදීමට) හෙතුවද දනිද්ද, යම් නිවනෙක්හි සර්වප්‍රකාරයෙන් සියලු දුක නිරුද්ධවේද දුක සංසිඳුවීමට පමුණුවන්නාවූ මාර්ගය දනිද්ද, චෙතො විමුක්තියෙන් යුක්තවූද නැවත ප්‍රඥා විමුක්තියෙන් යුක්තවූද ඒ සත්වයෝ සසර දුක් කෙළවර කිරීම පිණිස සුදුස්සෝ වෙත්; ඔව්හු ජාති ජරා දුක්වලට පැමිණෙන්නාහු නොවෙතියි."

104. **සම්පන්න ශීල සූත්‍රය**:- 2. "මහණෙනි, යම් ඒ භික්ෂූහු ශීලයෙන් යුක්තවූවාහු වෙද්ද, සමාධියෙන් යුක්ත වූවාහු වෙද්ද, ප්‍රඥාවෙන් යුක්තවූවාහු වෙද්ද, ඵලයෙන් යුක්තවූවාහු වෙද්ද, අවවාද කරන්නාහු වෙද්ද, කර්මඵලයන් හඟවන්නාහු වෙද්ද, සද්ධර්මය අවබොධ කරවන්නාහු වෙද්ද දක්වන්නාහු වෙද්ද සමාදන් කරවන්නාහු වෙද්ද මනාකොට තියුණු උත්සාහවත් කරන්නාහු වෙද්ද මනාකොට සතුටු කරවන්නාහු වෙද්ද කියන්නාහු වෙද්ද, මනාකොට දක්වන්නාහු වෙද්ද ගන්වන්නාහු වෙද්ද මනාකොට උත්සාහවත් කරන්නාහු වෙද්ද මොනවට සතුටු කරවන්නාහු වෙද්ද මනාකොට කියන්නාහු වෙද්ද, මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ (ඇසින්) දැකීම පවා බොහෝ උපකාරයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ ඇසීමද බොහෝ උපකාරයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ සමීපයට එළඹීමද බොහෝ උපකාරයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ වතාවත් ආදිය කිරීමද බොහෝ උපකාරයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ (සමීපයෙහි) පැවිදිවීමද බොහෝ උපකාරයයි කියමි. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, එබඳු ශීලාදී ගුණයෙන් සම්පූර්ණ ආර්යයන් සේවනය කරන්නාහට භජනය කරන්නාහට නිතර ආශ්‍රය කරන්නාහට සම්පූර්ණ නොවූද ශීලස්කන්ධය වැඩීමෙන්

සම්පූර්ණවීමට යෙයි. සම්පූර්ණ නොවූද සමාධිස්කන්ධය වැඩීමෙන් සම්පූර්ණවීමට යෙයි සම්පූර්ණ නොවූද ප්‍රඥාස්කන්ධය වැඩීමෙන් සම්පූර්ණවීමට යෙයි. සම්පූර්ණ නොවූද විමුක්ති ස්කන්ධය වැඩීමෙන් සම්පූර්ණවීමට යෙයි. සම්පූර්ණ නොවූද විමුක්ති ඥානදර්ශන ස්කන්ධය වැඩීමෙන් සම්පූර්ණවීමට යෙයි.

4. "මහණෙනි, එබඳු ගුණයෙන් යුත් ඒ භික්ෂූහු ශාස්තෲහු අනුශාසනය කරන්නාහු යයිද කියනු ලැබෙත්. ගැල්නායකයෝ එතෙර කරන්නාහු යයිද කියනු ලැබෙත්. අවිද්‍යා නමැති අන්ධකාරය දුරුකරන හෙයිනුදු දුරුකරවන හෙයිනුදු අඳුරු දුරු කරන්නෝ යයිද කියනු ලැබෙත්. ආලොකය කරන්නාහුයයිද කියනු ලැබෙත්. එළිය කරන්නෝ යයිද කියනු ලැබෙත්. බැබලීම කරන්නාහුයයිද කියනු ලැබෙත්. උල්කාව දරන්නාහුයයිද කියනු ලැබෙත්. ප්‍රභාව කරන්නාහුයයිද කියනු ලැබෙත්. ආර්යයෝයයිද කියනු ලැබෙත්. ඇස් ඇත්තෝයිද කියනු ලැබෙත්."

5. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යම් මේ වැඩුණු ස්වභාව ඇති වැඩුණු සිත් ඇත්තාවූ දැහැමින් ජීවත්වන්නාවූ දැහැමින් ආත්මභාව පවත්වන්නාවූ හෝ ආර්යයන්ගේ පිරිසිදු බව විශෙෂයෙන් තත්වූ පරිද්දෙන් දන්නවුන්ට එළිය කරන්නාවූ (ප්‍රඥා නමැති) ආලොකය කරන්නාවූ උත්සාහ සම්පන්නවූ නුවණැස් ඇත්තාවූ කෙලෙස් දුරුකළාවූ ඒ ආර්යයෝ සද්ධර්මය බබුළුවත්. එළි කරත්.

"ඉදින් පණ්ඩිතයෝ යම් ආර්යයන්ගේ අවවාද අසා මනාකොටම දැන ජාති ක්ෂයයයි කියන ලද අර්හත්ඵලය විශිෂ්ටඥානයෙන් දැන අවබොධකොට නැවත ඉපදීමට නොපැමිණෙත්යයි."

**105. තණ්හුප්පාද සූත්‍රය:-** 2. "මහණෙනි, යම් නිමිතිවල භික්ෂුවගේ උපදින සුලුවූ තෘෂ්ණා තොමෝ උපදීද, ඒ තෘෂ්ණාව උපදින හෙතු සතරෙකි. කවර සතරක්ද යත්? මහණෙනි, සිවුරු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හෙතුකොට හෝ මහණහුගේ උපදින සුලු තෘෂ්ණා තොමෝ උපදී. මහණෙනි, පිණ්ඩපාතය කරුණු කොට හෝ භික්ෂුවගේ උපදින සුලුවූ තෘෂ්ණා තොමෝ උපදී. මහණෙනි, සෙනසුන කරුණු කොට හෝ භික්ෂුවගේ උපදින සුලුවූ තෘෂ්ණා තොමෝ උපදී. ප්‍රණීත ගිතෙල් වෙඬරු ආදීන් හෙතුකොට හෝ භික්ෂුවගේ උපදින සුලුවූ තෘෂ්ණා තොමෝ උපදී. මහණෙනි, යම් නිමිතිවල භික්ෂුවගේ උපදින සුලුවූ තෘෂ්ණා තොමෝ උපදීද, මේ වනාහි ඒ තෘෂ්ණාවගේ උපදින කරුණු සතරෙකැයි"

3. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි අර්ථය මෙසේ කියනු ලැබේ.

"තෘෂ්ණාව දෙවන්නාකොට ඇති පුරුෂතෙමේ බොහෝ කලක් මුළුල්ලෙහි සසර ඇවිදින්නේ මේ පවත්නා ආත්ම භාවයද අනාගතාත්ම භාවයද මෙවැනි නොවූ අනෙක් ආත්මභාව ඇති සසර නොඉක්මවයි.

"තෘෂ්ණාව දුකේ හටගැන්මයයි. මෙසේ දොෂය දැන පහවූ තෘෂ්ණාව ඇත්තාවූ (තෘෂ්ණාදීන්) ගැණීමක් නැත්තාවූ සිහිය ඇත්තාවූ රහත් මහණතෙමේ වසන්නේයයි."

**106. සබ්‍රහ්මක කුල සූත්‍රයඃ-** 2. "මහණෙනි, යම් කුලයන්ගේ දරුවන් විසින් මවුපිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ බ්‍රහ්මයා ඇති කුලයෝ වෙත්. මහණෙනි, යම් කුලයන්ගේ දරුවන් විසින් මවුපියෝ ස්වකීය ගෘහයෙහි පුදනලද්දාහු වෙද්ද, ඒ පූර්ව දෙවියන් සහිතවූ කුලයෝ වෙත්. මහණෙනි, යම් කුලවල දරුවන් විසින් මවුපියෝ ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ පූර්වාචාර්යයන් ඇති කුලයෝ වෙත්. මහණෙනි, යම් කුලවල දරුවන් තමාගේ ගෘහයෙහි මවුපියෝ පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ සත්කාරයට සුදුස්සන් ඇත්තාහු වෙත්.

3. "මහණෙනි, බ්‍රහ්මයයි මවුපියනට නමෙකි. මහණෙනි, පූර්ව දෙවතාවෝ යයි මවුපියනට නමෙකි. මහණෙනි, පූර්වාචාර්යයෝ යයි මවුපියනට නමෙකි. මහණෙනි. (උපකාරයට කෙත් බැවින්) ආහුණෙය්‍යයෝයයි මවුපියනට

(නියම) නමෙකි. ඊට හෙතු කවරේද? මහණෙනි, මවුපියෝ දරුවන්ට බොහෝ උපකාර ඇත්තෝ වෙත්. දිවි රක්නාහුය පොෂ්‍ය රක්නාහුය, මේ ලොකයෙහි දක්නාහුයයි."

4. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි අර්ථය මෙසේ කියනු ලැබේ.

"පුත්‍රයන්ට මවුපියෝ බ්‍රහ්මයෝ යයිද පළමු ගුරුවරයෝයයිද සත්කාරයට සුදුස්සෝයයිද සත්වයාට උපකාර කරන්නාහුයයිද කියනු ලැබෙත්. එහෙයින්ම නුවණැති පුත්‍රතෙමේ මව්පියන්ට නමස්කාරකරන්නේය නැවත සත්කාරද කරන්නේය.

"අහරයෙන්ද නැවත පානයෙන්ද වතින්ද යහනින්ද ඇඟ ඇලීමෙන්ද නැහැවීමෙන්ද පය සේදවීමෙන්ද මව්පියන් කෙරෙහි ඒ මෙහෙකිරීමෙන්ද පණ්ඩිතයෝ තුමූ ඔහුට මේ ලෙව්හිම පසසත්. පරලෙව්හි ස්වර්ගයෙහිද සතුටුවේයයි"

**107. බහූපකාර සූත්‍රය**:- 2. "මහණෙනි, යම් බමුණු ගැහැවියෝ තොපට සිවුරුය, පිණ්ඩපාතය, සෙනසුන්ය ගිලන්පස බෙහෙත් පිරිකරය යන මෙයින් උපස්ථාන කරන්නාහු වෙද්ද, ඒ බමුණු ගැහැවියෝ බොහෝ උපකාර ඇත්තාහු වෙති. මහණෙනි, තෙපිදු ඒ බ්‍රාහ්මණ ගෘහපතියන්ට මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත්වූද අර්ථ සහිතවූද, ව්‍යඤ්ජන සහිතවූද, සියල්ලෙන් සම්පූර්ණවූද, දහම් දෙසවුද, පිරිසිදු බඹසර ප්‍රකාශකරවූද ඕඝය තරණය කරන පිණිසද සියලු සංසාර දුඃඛය කෙළවර කිරීම පිණිස මාර්ගබ්‍රහ්මචර්යය වසන්නේ යයි."

3. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"ගිහියෝද පැවිද්දෝද (යන) දෙපාක්ෂිකයෝ ඔවුනොවුන් මනාව ඇසුරුකරන්නාහු උතුම් (සතර) යොගයෙන් නිර්භයවූ රහත් ඵලයටද, නිවනටද (පැමිණීම පිණිස) ප්‍රතිපත්ති සද්ධර්මයද, ප්‍රතිවෙධ සද්ධර්මයද සපයත්.

"පැවිද්දෝ ගිහියන් කෙරෙන් හෝ ගිහියන්ගේ සමීපයෙන් සිවුරුද, පිණ්ඩපාතය හා ගිලන්පසද සයන හා අසුන්ද ආරාමාදිය ද පිළිගනිත්.

"ගෘහයෙහි, භොගය හා ශීලය සොයනසුලුවූ ගෘහස්තයෝ මනාව පිළිපත් නිසා රහතුන්ගේ වචන අදහන්නාහු විශෙෂයෙන් පිරිසිදු ප්‍රඥාවෙන් ධ්‍යාන කරන්නාහු වෙත්.

"මේ ආත්මයෙහි හෝ මේ සස්නෙහි මාර්ගයවූ ධර්මයෙහි හැසිර සුගතියට යන්නාහු සතුටුවන්නාහු දෙව්ලොව කැමැති පරිද්දෙන් කාමසම්පත් ඇත්තෝව සතුටු වෙති'යි"

108. කුහථද්ධ සූත්‍රයඃ- 2. "මහණෙනි, යම්කිසි මහණකෙනෙක් විජ්මය පත්කරන්නාහු වෙද්ද, තද සිත් ඇත්තාහු වෙද්ද, කියන්නාහු වෙද්ද, ඉදිරියෙහි යන ක්ලේශයෙන් යුක්ත වූවාහු වෙද්ද, උස්ව නැංගාවූ මාන නමැති නළ ඇත්තාහුවෙද්ද, සිතේ එකඟබව පමණකුදු නැත්තාහු වෙද්ද,

3. "මහණෙනි, මාගේ ඒ භික්ෂූහු මා සතුවූවෝ නොවෙති. මහණෙනි, ඒ භික්ෂූහු මේ සස්නෙන් පහවූවාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වැඩීමට විශෙෂයෙන් වැඩීමට විපුලබවට නොම පැමිණෙත්.

3. "මහණෙනි, යම් භික්ෂූහු වනාහි කුහක නොවූවාහු වෙද්ද, සිවුපසය ඉල්ලීමේ වචන ඇත්තාහු නොවෙද්ද, ධෛර්ය සම්පන්නයෝ වෙද්ද, තද සිත් ඇත්තාහු නොවෙද්ද, මනාව එකඟසිත් ඇත්තාහු වෙද්ද, මහණෙනි, මාගේ ඒ භික්ෂූහු වනාහි (මනාව පිළිපත් බැවින්) මමත්වය ඇත්තාහු (මා සතු වූවාහු) වෙත්. මේ ධර්ම විනයෙන් (ශාසනයෙන්) පහනොවූවාහුද වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි (අර්හත් මාර්ගය තෙක් ශීලාදි ගුණයෙන්) වැඩීමටද (නිසල බැවින්) විශෙෂයෙන් වැඩීමටද ශීලාදීන් සම්පූර්ණ වීමෙන් හැම තන්හි පතළවීමෙන්) මහත් බවටද පැමිණෙත් යයි."

4. භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"කුහකයෝද (ක්‍රොධයෙන් හා මානයෙන් දැඩි සිත් ඇත්තාහුද පොළඹ වන්නාහුද ප්‍රකට කෙලෙස් ඇත්තාහුද උස්වූ මාන නමැති නළ ඇත්තාහුද, සිතේ එකඟබව පමණකුදු නැත්තාහුද ඒ භික්ෂූහු සම්‍යක් සම්බුදුන් විසින් දෙනලද ධර්මයෙහි නොවැඩෙත්.

"කුහක නොවූවෝද (ජනයන් ප්‍රත්‍යය සඳහා නොපොළඹවන්නෝද ධෛර්ය ඇත්තෝද තදනුවූ සිත් ඇත්තෝද සිතෙහි මනා එකඟබව ඇත්තෝද (යන) ඒ භික්ෂූහු ඒකාන්තයෙන් සම්‍යක් සම්බුදුන් විසින් දෙසන ලද ධර්මයෙහි වැඩෙතියි."

**109. නදීසොතොපම සූත්‍රයː-** 2. "මහණෙනි, යම් සේ වනාහි පුරුෂයෙක් තෙමේ ගංගාවෙක්හි ප්‍රිය ස්වභාවය හා සැප ස්වභාවය කරණකොටගෙන වහා ගලාබස්නා සැඩ පහරින් යටි ගං බලාගෙන යනු ලැබේද, ඇස් ඇති පුරුෂයෙක් තෙමේ ඉවුරෙහි සිටියේ ඔහු දැක මෙසේ කියන්නේය. 'එම්බා පුරුෂය, කිසිසේත් තෝප්‍රිය ස්වභාවය හා සැප ස්වභාවය හෙතුකොටගෙන නදියෙහි සැඩපහරින් ගෙනයනු ලබන්නෙහිය. එම්බල පුරුෂය තෝ යම් විලකට පැමිණ මරණයට හෝ මරණ සමාන දුකට හෝ පැමිණෙන්නෙහිද, මේ නදියගේ යට මහ රළ ඇත්තාවූ දියසුළි ඇත්තාවූ සැඩමසුන් ඇත්තාවූ දියරකුසන් සහිතවූ විලෙක් ඇත."

**2.** "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂතෙමේ ඒ පුරුෂයාගේ හඬ අසා අතින් හා පයින්ද උඩුගං බලා පීණන්නේය. මහණෙනි, අර්ථය හඟවනු පිණිස මා විසින් මේ උපමාතොමෝ කරනලද මේ උපමාවෙහි මේ අර්ථයි.

"මහණෙනි, නදියෙහි මහවතුර යයි තෘෂ්ණාවට මේ නමෙකි. මහණෙනි, ප්‍රිය ස්වභාවය මිහිරි යයි අධ්‍යාත්මිකවූ සද්ධායතනයන්ට මේ නමෙකි. මහණෙනි, යට (මහ) විලයයි ඔරම්භාගිය සංයෝජනයන්ට මේ නමෙකි. මහණෙනි, භයජනක රළ යයි බලවත් ක්‍රොධයට මේ නමෙකි. මහණෙනි, දියසුළි යයි පස්කම් බැඳුමට මේ නමෙකි. මහණෙනි, චණ්ඩ මත්ස්‍යය

ජලරාක්ෂසයයි ස්ත්‍රියට මේ නමෙකි. මහණෙනි, ප්‍රතිස්‍රොතය (උඩුගඟ) යයි නෛෂ්ක්‍රම්‍යයට මේ නමෙකි. මහණෙනි, අතින් හා පයින් වෑයම් කිරීම යයි සතර සම්‍යක් ප්‍රධාන වීර්යයට මේ නමෙකි. මහණෙනි, ඉවුරෙහි සිටි ඇස් ඇති පුරුෂයා යයි අර්හත්වූ සියලු දතයුතු ධර්මයන් මනාව දැනගත්තාවූ තථාගතයන් වහන්සේට මේ නමෙකි."

4. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මත්තෙහි කාමයොගයෙන් නිර්භයවූ රහත්බව කැමැති වන්නාවූ මහණතෙම ක්ලේශකාමයන් දුකසේ පහකරන්නේය, විදර්ශනා සහිත මාර්ගප්‍රඥාවෙන් මනාකොට දන්නාවූ ආර්ය මාර්ගාධිගමයට අනතුරුව ඵල විමුක්තියෙන් මනාව මිදුනු සිත් ඇති (මහණතෙම) ඒ ඒ මාර්ගඵලයන්ට පැමිණෙන කාලයෙහි නිවනට ඇතුළත් ඵලසමවතින් වසන්නේය. මාර්ගඥානයෙන් චතුස්සත්‍යයන් දැනගත්තාවූ වැස නිමවනලද මගබඹසර ඇත්තාවූ ස්කන්ධලෝකයාගේ කෙළවරට ගියාවූ ඒ ක්ෂීණාශ්‍රව තෙමේ (සසර සයුරේ) පරතෙරවූ නිවණට ගියේයයි කියනු ලැබේ."

110. **චරතොඋප්පජ්ජති සූත්‍රය:-** 2. "මහණෙනි, ඉදින් හැසිරෙන්නාවූද මහණහට කාමය පිළිබඳ කල්පනාවක් හෝ ද්වෙෂය පිළිබඳ කල්පනාවක් හෝ වෙහෙස කිරීම පිළිබඳ කල්පනාවක් හෝ උපදීද, මහණෙනි, ඉදින් මහණතෙම ඒ විතර්කය ඉවසාද, පහනොකෙරේද, දුරුනොකෙරේද, පහනොවූ කෙළවර ඇත්තක් නොකෙරේද, නැවත නැවත අභාවයට නොපමුණුවාද,

3. "මහණෙනි, කෙළෙස් තවන වීර්යය නැත්තාවූ පාපයට භයනොවූ මෙබඳු මහණතෙම හැසිරෙන්නේද සියලු කල්හි අලසවූ ලාමක වීර්ය ඇත්තේයයි කියනු ලැබේ.

"මහණෙනි, සිටියාවූද මහණහට ඉදින් කාමවිතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ උපදීද,

මහණෙනි, ඉදින් මහණතෙම ඒ විතර්කය ඉවසාද පහ නොකෙරේද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, නොවීමට නොපමුණුවාද, මහණෙනි, එබඳුවූ කෙළෙස් තවන වීර්යය නැත්තාවූ පවට බිය නැත්තාවූ භික්ෂුතෙමේ සිටියේද නිරන්තරයෙන් කුසීතවූ හීන වීර්ය ඇත්තේ යයි කියනු ලැබේ.

4. "මහණෙනි, හුන්නාවූද මහණහට කාම විතර්කයක් වේවායි ව්‍යාපාද විතර්කයක් වේවයි විහිංසා විතර්කයෙක් වේවයි ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඒ කල්පනාව ඉදින් ඉවසාද, පහනොකෙරේද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, නොවීමට නොපමුණුවාද, මහණෙනි, කෙලෙස් තවන වීර්යය නැත්තාවූ පවට බියනොවූ එබඳු මහණතෙමේ හුන්නේද නිතර අලසවූ ලාමක වීර්යය ඇත්තේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, හොවින්නාවූද, නිදි දුරුකරන්නාවූ මහණහට කාමය පිළිබඳ කල්පනාවෙක් වේවයි ක්‍රොධය පිළිබඳ කල්පනාවෙක් වේවයි වෙහෙස කිරීම පිළිබඳ කල්පනාවෙක් වේවයි ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඒ විතර්කය ඉදින් ඉවසාද, පහනොකෙරේද, (සිතින්) දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, අභාවයට නොපමුණුවාද, කෙලෙස් තවන වීර්යය නැත්තාවූ පවට බියනොවූ නිදි දුරුකරන්නාවූ එබඳු මහණතෙම සයනය කරන්නේද, හැමකල්හි අලසවූ හීන වීර්යය ඇත්තේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, හැසිරෙන්නාවූද, මහණහට කාම විතර්කයෙක් හෝ ව්‍යාපාද විතර්කයෙක් හෝ විහිංසා විතර්කයෙක් හෝ ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඒ කල්පනාව ඉදින් නොඉවසාද, පහකෙරේද, දුරුකෙරේද, අවසන් කෙරේද, නොවීමට පමුණුවාද, මහණෙනි, කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ පවට බියවූ එබඳු මහණතෙම හැසිරෙන්නේද, හැමදා පටන්ගන්නාලද වීර්යය ඇත්තාවූ නිවන් පිණිස යවනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, සිටියාවූද මහණහට කාමය පිළිබඳ අදහසෙක් හෝ ක්‍රොධය පිළිබඳ අදහසෙක් හෝ (අනුන්ට)

වෙහෙස කිරීම පිළිබඳ අදහසෙක් හෝ ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඒ කල්පනාව ඉදින් (සිතේ) වාසය නොකරවාද, පහනොකෙරේද, (සිතින්) දුරුකෙරේද, පහවූ කෙළවර ඇත්තෙක් කෙරේද, නොඉපදවීමට පමුණුවාද, මහණෙනි, කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ පවට බියවූ එබඳු මහණතෙම සිටියේද සඳහටම පටන්ගන්නාලද වීර්යය ඇත්තේ නිවන් පිණිස මෙහෙයවනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, හුන්නාවූද මහණහට කාමය හා යෙදුන කල්පනාවෙක් වේවයි. ක්‍රොධය හා යෙදුන විතර්කයෙක් වේවයි, (අනුන්ට) වෙහෙස කිරීම පිළිබඳ කල්පනාවෙක් වේවයි ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඉදින් ඒ කල්පනාව නොඉවසාද, පහකෙරේද, (සිතින්) දුරුකෙරේද, කෙළවර කෙරේද, නොවීමට පමුණුවාද, මහණෙනි, නිතර කෙළෙස් තවන වීර්යය ඇත්තාවූ පවට බියවූ එබඳු මහණ තෙම හුන්නේද පටන්ගන්නාලද වීර්යය ඇත්තේය. නිවන් පිණිස යවනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

8. "මහණෙනි, සැතපෙන්නාවූද, නිදි දුරුකරන්නාවූ මහණහට කාමයෙන් යුත් අදහසෙක් හෝ ක්‍රොධයෙන් යුත් අදහසෙක් හෝ (පරහට) වෙහෙස කිරීම පිළිබඳ අදහසෙක් හෝ ඉදින් උපදීද, මහණෙනි, මහණතෙම ඒ අදහස ඉදින් නොඉවසාද, පහකෙරේද, (සිතින්) දුරුකෙරේද, අවසන්වූවක් කෙරේද, (නැවත) නොඉපදවීමට පමුණුවාද, මහණෙනි, නිතර කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ පවට බියවූ නිදි දුරුකරන්නාවූ එබඳු මහණතෙම සයනය කෙළේද, පටන්ගන්නාලද වීර්යය ඇත්තේය, නිවන් පිණිස මෙහෙයනලද සිතැත්තේයයි කියනු ලැබේ යයි."

9. භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"යමෙක් හැසිරෙන්නේ හෝ ඉදින් සිටින්නේ හෝ හුන්නේ හෝ නැවත හෝනේ හෝ වස්තුකාමය ඇසුරු කළාවූ (නොහොත්) ක්ලේශකාමයන්ට වාසස්ථාන බැවින්ද ගෘහය ඇසුරුකළාවූ ලාමක විතර්කයක් කල්පනා කෙරේද,

එබඳු මිථ්‍යා සංකල්පනාවන් ගොචරකොට ඇත්තාවූ ඒ මහණතෙම උතුම්වූ ආර්ය මාර්ග ඥානයට පැමිණෙන්නට නුසුදුස්සෙකි.

"යමෙක් හැසිරෙන්නේ හෝ නැවත සිටින්නේ හෝ හුන්නේ හෝ නැවත හෝනේ හෝ (යථොක්ත) මිථ්‍යා විතර්කය සන්සිඳුවා (නවමහා විතර්කයන්ගේ අතිශයින් සන්සිඳීම වූ අර්හත් ඵලයෙහි වේවයි, නිර්වාණයෙහි වේවයි ඇලුනේවේද, එබඳු ඒ පුද්ගලතෙමේ උතුම්වූ ආර්ය මාර්ගඥානය බලන්නට සමර්ථ වේයයි."

111. **යතංචර සූත්‍රයඃ-** "මහණෙනි, ශීලයෙන් යුක්තව වසවු, සම්පූර්ණ ප්‍රාතිමොක්ෂසංවරයෙන් වැසුනෝව වසවු, ගොචර සම්පත්තියෙන් යුක්තව ශික්ෂාපදයන්හි මනාවගෙන ස්වල්පත්‍රමාණවූ වරදෙහි පවා භයදක්නා ස්වභාවය ඇත්තෝව හික්මෙවු, මහණෙනි, සම්පූර්ණශීලය ඇතිව වසන්නවුන් විසින් සම්පූර්ණ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් වැසිවසන්නවුන් විසින් ආචාර ගොචර දෙකින් යුක්තව ශික්ෂාපදයන්හි මනාවගෙන ස්වල්පමාත්‍ර දොෂයෙහි පවා භයදක්නා සුලුව හික්මෙන්නවුන් විසින් මත්තෙහි කටයුතු කුමක් වන්නේද?

3. "මහණෙනි, ඉදින් හැසිරෙන්නාවූද (එබඳු) මහණහුගේ විෂම ලොභය පහවගියාවෙයි, ක්‍රොධය පහව ගියේවෙයි, චිත්ත චෛතසිකයන්ගේ ප්‍රබොධ නොවීම පහව ගියේවෙයි, සිතේ නොසන්සුන් බව හා විපිළිසරවීම පහව ගියේවෙයි, සැකය ප්‍රහීනවෙයි. වීර්යය පටන් ගන්නාලද්දේ වෙයි. නොහැකුළුණේවෙයි, සිහිය එළඹ සිටියාවෙයි. මුළා නොවූවාවෙයි, කය සන්සිඳුණේවෙයි, පහවගිය විඩා ඇත්තේ වෙයි, සිතමනාව පිහිටුවන ලද්දේවෙයි, එකඟ වූයේ වෙයි, මහණෙනි, හැසිරෙන්නාවූද එබඳු මහණතෙම කෙළෙස් තවන වීර්යය ඇත්තේය, පවට බිය ඇත්තේය, නිරන්තරයෙන් පටන් ගන්නාලද වීර්යය ඇත්තේය, නිවන් පිණිස යවන ලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, ඉදින් සිටියාවූද (එබඳු) මහණහුගේ විෂම ලොභය පහවූවාවෙයි, ව්‍යපාදය පහවූයේවෙයි. ථීනමිද්ධ නීවරණය පහවූයේවෙයි, උද්ධච්චකුක්කුච්ච නීවරණය පහවූයේවෙයි, විචිකිච්ඡා නීවරණය පහවූවාවෙයි. වීර්යය පටන්ගන්නා ලද්දේවෙයි. නොසැඟවුනේවෙයි. සිහිය එළඹ සිටියාවෙයි. නොමුළාවූවාවෙයි, කය සන්සිඳුණේවෙයි, බර ඇරුණේ වෙයි, සිතමනාව සිටියේවෙයි, එකඟවූයේවෙයි, මහණෙනි, සිටියාවූද එබඳු මහණතෙමේ කෙළෙස් තවන වීර්යය ඇත්තේය, පවට බිය ඇත්තේය නිතරම පටන්ගන්නාලද වීර්යය ඇත්තේයයි නිවන් පිණිස මෙහෙයනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, ඉදින් හුන්නාවූද (එබඳු) මහණහුගේ විෂම ලොභය පහවූයේවෙයි, ව්‍යාපාදය පහවූයේවෙයි, ථීනමිද්ධ දෙක පහවූයේවෙයි, උද්ධච්චකුක්කුච්චය පහවූයේ වෙයි, සැකය පහවූවාවෙයි, වීර්යය පටන්ගන්නා ලද්දේවෙයි, (එහෙයින්ම) නොහැකුළුණේවෙයි, සිහිය එළඹ සිටියාවෙයි, නොමුළාවෙයි, කය සන්සිඳුනේවෙයි, බර ඇරුණේවෙයි, සිතමනාව සිටියේවෙයි. එකඟවූයේ වෙයි, මහණෙනි, හුන්නාවූද එබඳු මහණතෙමේ කෙළෙස් තවන වීර්යය ඇත්තේය, පවට බිය ඇත්තේය, හැමකල්හි පටන් ගන්නා ලද වීර්යය ඇත්තේය, නිවන් පිණිස මෙහෙයනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ඉදින් සයනය කරන්නාවූද නිදි දුරු කරන්නාවූද එබඳු මහණහුගේ විෂම ලොභය පහවූයේ වෙයි. ක්‍රොධය පහවූයේ වෙයි ථීනමිද්ධ දෙක පහවූයේ වෙයි. උදහස හා කුකුසද පහවූයේ වෙයි. සැකය ප්‍රහීනවූවා වෙයි. වීර්යය පටන්ගන්නා ලද්දේ වෙයි. නොසැඟවුණේ වෙයි. සිහිය එළඹ සිටියා වෙයි. නොමුළා වෙයි. කය සන්සිඳුනේ වෙයි. බර ඇරුණේ වෙයි. සිත මනාව පිහිටියේ වෙයි. එකඟවූයේ වෙයි මහණෙනි, හොවින්නාවූද නිදි දුරුකරන්නාවූ එබඳු මහණ තෙම කෙලෙස් තවන වීර්යය ඇත්තේය. පවට බිය ඇත්තේය. සදහටම පටන්ගන්නා ලද වීර්ය ඇත්තේය. නිවන් පිණිස මෙහෙයනලද සිත් ඇත්තේයයි කියනු ලැබේ."

**7.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

"මහණෙතෙම ගටමින් හැසිරෙන්නේය. වීර්යය කරමින් සිටින්නේය. වෑයම් කරමින් හිඳින්නේය. වෑයම් කරමින් හොවින්නේය. වෑයම් කරමින් (අත්පා) හකුළුවන්නේය. වෑයම් කරමින් (අත්පා) දිගුකරන්නේය.

"උඩද සරසද යටද සත්ව ශූන්‍යවූ පඤ්චස්කන්ධයන්ගේ හටගැන්ම හා විනාශයද බලන්නේ වන්නේය.

"මෙසේ වසන සුලුවූ කෙලෙස් තවන වීර්යය ඇත්තාවූ සන්සුන් පැවතුම් ඇත්තාවූ සන්සිඳුණු සිත් ඇත්තාවූ චෙතො සමථයයි කියන ලද ආර්ය මාර්ගයට සුදුසු ප්‍රතිඥාවට හික්මෙන්නාවූ, හැමකල්හි සිහි ඇත්තාවූ එබඳු මහණ නිතර නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇත්තේයයි (ආර්යයෝ) කියතියි."

**112. ලොකාභිඤ්ඤා සූත්‍රයඃ-** 2. "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලොකය මනාකොට අවබොධ කරන ලද්දේය. තථාගතයන් වහන්සේ ලෝකයෙන් වෙන්වූසේක. මහණෙනි, ලොකය (දුක) ඉපදීමට හෙතුවූ තෘෂ්ණාව තථාගතයන් වහන්සේ විසින් මනාව දැනගන්නා ලද්දේය. තථාගතයන් විසින් ලොකය (දුක) හට ගැණීමට හෙතුව පහකරන ලද්දේය. මහණෙනි, ලොකයගේ නොපැවැත්ම (නිවන) තථාගතයන් විසින් මනාකොට දැනගන්නා ලද්දේය. ලොකයගේ නොපැවැත්ම (නිවන) තථාගතයන් විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය. මහණෙනි, ලොකය (දුක) නිරුද්ධ කිරීමට පමුණුවන පිළිපැදීම තථාගතයන් විසින් මනාව දැනගන්නා ලද්දීය. තථාගතයන් විසින් ලොකය නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිඥාතොමෝ වඩන ලද්දීය.

**3.** "මහණෙනි, දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ සත්ව ලොකයා විසින් මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව විසින් යම් දක්නා ලද දෙයක් වේද අසන ලද්දක් වේද ආඝ්‍රාණය කරන ලද රසවිඳින ලද ස්පර්ශ කරනලද දෙයක් වේද, දන්නා ලදද පැමිණෙන ලද්දේද

සොයන ලද්දේද සිතින් නැවත නැවත සලකන ලද්දේද තථාගතයන් විසින් ඒ යම්හෙයකින් මනාව දැනගන්නා ලද්දේ එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, යම් දිනක රෑ තථාගතයන් වහන්සේ නිරුත්තවූ සම්‍යක් සම්බොධිය අවබොධකරන සේක්ද, යම් පඤ්චස්කන්ධයන්ගේ ශෙෂයක් නැති නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පානාසේක්ද, මේ (මැද) යම් ධර්මයක් වදාරණසේක්ද, කියනසේක්ද, දක්වනසේක්ද ඒ හැම එසේම වෙයි. අන් අයුරකින් නොවේ. එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, තථාගතයන් වහන්සේ යම්සේ කියනු සුලුද එසේම කරන සුලුය. තථාගතයන් වහන්සේ යම්සේ කරන සුලුද, එසේම කියන සුලුය. මෙසේ යම් අයුරකින් කියනු සුලුද ඒ අයුරෙන් කරන සුලුය. යම් අයුරකින් කරන සුලුද ඒ අයුරෙන් කියන සුලුය. එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ සත්ව ලොකයෙහි මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාවෙහි තථාගතයන් වහන්සේ මඩින සේක. කිසිවෙකු විසින් නොමඩනා ලද්දේය. ඒකාන්තයෙන් දක්නාසේක. සමවත්ද සිතද තමාගේ වසයෙහි පවත්වන සේක. එහෙයින් තථාගතයයි කියනු ලැබේ යයි."

**7.** මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ.

> "සියලු තුන්ලොව දැන ඒ ත්‍රෛධාතුක සත්ව සන්නිවාසයෙහි යම් කිසිවක් ඇද්ද, ඒ මුලුල්ල නොවෙනස් සේ දැන සියලු ලොකයෙන් මිදුණුසේක. සියලු ලොකයෙහි (බන්ධනයෙන්) තොරවූසේක.
>
> "සියලු මැඩපැවැත්වූ ධෛර්යසම්පන්න වූ ඒ තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් සියලු ක්ලෙශ ග්‍රන්ථයන් මුදා සිටිසේක. උන්වහන්සේ විසින් උතුම්වූ නිවන ස්පර්ශ කරන ලද්දේය. ඒ නිවන කොයිනුත් බිය නැත්තේය.

"නිදුක්වූ සිඳින ලද සැක ඇත්තාවූ ක්ෂය කරනලද ආශ්‍රවයන් ඇත්තාවූ මේ සර්වඥයන් වහන්සේ සියලු කර්මයන්ගේ ක්ෂය කිරීමට පැමිණිසේක. උපධීන්ගේ ක්ෂය කිරීමයයි කියන ලද නිර්වාණයෙහි ඵලවිමුක්තියෙන් මිදුණුසේක.

"ඒ මේ භාග්‍යවතුන් වහන්සේ චතුස්සත්‍යාවබොධය කළසේක. මේ බුදුරජාණන් වහන්සේ කෙලෙස් නැසූ හෙයින්ම නිරුත්තර සිංහවූ සර්වඥයන් වහන්සේ දෙවියන් සහිත සත්ව ලොකයාට ශ්‍රෙෂ්ඨවූ ධර්මචක්‍රය පැවැත්වූසේක.

"මෙසේ යම් කෙනෙක් බුදුන් සරණ ගියාහු වෙද්ද, ඒ දෙවියෝ ද මිනිස්සුද උන්වහන්සේ කරා පැමිණ පහවූ බිය ඇති ගුණයෙන් මහත් බුදුන්වහන්සේට නමස්කාර කෙරෙති.

"බුද්ධ ඍෂීන් වහන්සේ දැමුණුසේක. අන්‍යයන් දමනය කරන හෙයින් දැමුණවුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ සේක. ශාන්ත වූසේක. සන්සුන් වුවන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ සේක. (කෙලෙසුන්ගෙන්) මිදුණුසේක. මිදුනවුන් අතුරෙන් අග්‍ර වූසේක. (සසර සයුරෙන්) එතෙර වූසේක. එතෙරවූවන් අතුරෙන් උතුම් වූසේක.

"මෙසේ දෙවියන් සහිත ලොකයෙහි නුඹවහන්සේ හා සමාන පුද්ගලයෙක් නැත්තේයයි මහත්වූ හෝ පූජ්‍යවූ පහවගිය බිය ඇති මේ බුදුන්වහන්සේට දෙවි මිනිස්සු වඳිත් යයි"

**(11 බ්‍රාහ්මණ වර්ගය නිමි)**

**(ඉතිවුත්තකයේ චතුක්ක නිපාතය නිමි)**

---

# සුත්ත නිපාතය.

## 1 උරග වර්ගය

**1. උරග සූත්‍රය:-** 1. යමෙක් පැතිර සිටි සර්ප විෂය බෙහෙතින් හරනාක් මෙන් උපන්නාවූ ක්‍රොධය දුරුකෙරේද? ඒ මහණතෙම දිරූණාවූ පරණවූ සැවය හරණ සර්පයා මෙන් (සසර) එතෙර මෙතර දුරුකරන්නේය.

2. යමෙක්, විල හටගත් නෙළුම් මල් මෙන් අල්ලාගෙන රාගය ඉතිරි නොකොට සිඳීද, ඒ මහණතෙම දිරූණු පුරාණවූ සැව හරනා සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

3. යමෙක්, පැතිර සිටි වේගයෙන් දිවෙන තෘෂ්ණාව සම්පූර්ණයෙන් ඉතිරි නොකොට සින්දේද, ඒ මහණතෙම සර්පයා දිරූණාවූ පුරාණවූ සැවය මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

4. යමෙක් මහවතුර ඉතා දුර්වලවූ බව දන්ඩෙන් කළ ගෙයක් ගෙනයන්නාක් මෙන් මානය ඉතුරු නොකොට නැසීද ඒ මහණතෙම දිරූණාවූ පුරාණ සැවය (හරනා) සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර දුරු කරන්නේය.

5. යමෙක් දිඹුල් රුක්වල මල් සොයන්නාක් මෙන් භවයන්හි සාරයකට නොපැමිණේද ඒ මහණතෙම සර්පයා දිරූණාවූ පුරාණවූ සැවය මෙන් (සසර) එතෙර මෙතෙර දුරුකරන්නේය.

6. යම් භික්ෂුවක්හුගේ සිත්හි ක්‍රොධයෝ නැත්තේද, මෙසේ වීම හා නොවීමද ඉක්මවීද, ඒ මහණ පුරාණවූ සැවය හැරයන සර්පයාමෙන් (සසර) එතර මෙතර අත්හරී.

7. යම්, භික්ෂුවත්හුගේ නවවිධ විතර්කයෝ සම්පූර්ණයෙන් දවන ලද්දාහුද සිතද සම්පූර්ණයෙන් මනාව සින්දේද ඒ මහණ තෙම සැවය හැරයන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර අත්හරී.

8. යමෙක් ඉතා දිවීම නොකරන්නේ පසු නොබසින්නේ මේ සියලු ප්‍රමාදය, (තෘෂ්ණාව) ඉක්ම ගියේද ඒ මහණතෙම සර්පයා සැවය හැර යන්නා මෙන් එතෙර හා මෙතර අත්හරී.

9. යමෙක්, ලොව මේ සියල්ල බොරුයයි දැන් පහ කළ ලොභ ඇත්තේ වේද, ඉතා දිවීම නොකරේද, පසු නොබසින්නේද, ඒ මහණතෙම සර්පයා සැවය හැර යන්නා මෙන් (සසර) එතෙර මෙතෙර හැරයයි.

10. යමෙක් අතිධාවනය නොකෙරේද, නොපසුබසීද, යම් සියලු දෙය බොරුයයි පහවූ ලොභ ඇත්තේද ඒ මහණ තෙම සැවය හැර යන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර හරණේය.

11. යමෙක් අතිධාවනය නොකෙරේද? නොපසුබසීද මේ සියලු යමෙක් අතිධාවනය නොකෙරේද? නොපසුබසීද මේ සියලු දෙය බොරු යයි පහවූ රාග ඇත්තේද, ඒ මහණ තෙම සැවය හැරයන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

12. යමෙක් අතිධාවනය නොකෙරේද, නොපසුබසීද, මේ සියලු ලෞකික දෙය බොරුයයි පහවූ ද්වේෂ ඇත්තේ වේද, ඒ මහණතෙම සැවය හැර යන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

13. යමෙක් අතිධාවනය නොකෙරේද නොපසුබසීද, මේ සියලු දෙය බොරුයයි පහවූ මොහ ඇත්තේ වේද, ඒ මහණතෙම සැවය හැර යන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

14. යමකුට කිසිම ක්ලෙශයක් නැත්තේද, අකුසල් මූලයෝ මොනවට නසන ලද්දෝ වෙත්ද, ඒ මහණතෙම සැවය හැරයන සර්පයා මෙන් (සසර) එතෙර මෙතෙර අත්හරියි.

15. යමකුට මෙතෙරට ඒමට කරුණුවූ (සිතේ කයේ) වෙහෙසක් නැත්තේද ඒ මහණ සැවය හැරයන සර්පයා මෙන් සසර එතෙර මෙතෙර අත්හරියි.

16. යම් භික්ෂුවක්හුගේ තෘෂ්ණාවෙන් උපන් භවයෙහි උත්පත්තියට කාරණවූ කිසි පවක් නොවේද ඒ භික්ෂුව සැවය හැරයන සර්පයකු මෙන් (සසර) එතෙර මෙතෙර හරනේය.

**17.** යමෙක් නීවරණ පස ප්‍රහීන කොට නිදුක්වූයේ සැකයෙන් එතෙරවූයේ පහව ගිය හුල් ඇත්තේද ඒ මහණතෙම සැවය හැරයන සර්පයා මෙන් (සසර) එතෙර මෙතර අත්හරියි."

**2. ධනීය සූත්‍රය:-** 1. පැසුණු බත් ඇති දොවූ කිරි ඇති මම මහාමහි නදියේ ඉවුර සමීපයෙහි සමානවූ ජනයා හා වසන්නේ වෙමි. මාගේ සැළ සෙවිලි කරණලදී. ගින්න මොළවන ලද්දේය. වළාකුල දැන් ඉදින් කැමැත්තෙහි නම් හොඳට වසින්න යයි ධනිය ගොපල්ලා කීයේය.

**2.** "(ධනියය) මම ක්‍රොධ රහිත වූයෙමි. සිත්හි පහවූ උල් ඇත්තේ වෙමි. මහීනදියගේ තෙර සමීපයෙහි රාත්‍රියේ තනි වාසය ඇත්තෙමි. අරින ලද පැල (ආත්මය) ඇත්තෙමි. (රාගාදී) ගිනි නිවුණේය, දැන් ඉදින් කැමැත්තෙහි නම් මෙසය වසීවයි කීමට මම ම නිසි ය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**3.** "කණ මැස්සන් හා මදුරුවන් නැත්තාහුය. නදිය අසබඩ හටගත් තන ගවයෝ කති. පැමිණි වැස්ස ඉවසන්නාහුය. වලාකුළ දැන් ඉදින් කැමැත්තෙහි නම් වසින්න යයි (ධනිය ගොපල්ලා කීයේය.)

**4.** "(මාර්ග නැමැති) පසුර බඳිනා ලද්දීය. එතෙර වූයේ පරතෙර ගියේ, වතුර පහර හික්මවන්නේය, (මාර්ග නැමැති) පසුරෙන් ප්‍රයෝජනයක් නැත. එසේ හෙයින් දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

**5.** "මාගේ ගොපලු භාර්යාව කීකරුය. ලොල්බව නැත්තීය. බොහෝ කලක් මුළුල්ලෙහි සමග වසන්නීය. මන වඩන්නීය. ඇගේ කිසි පාපයක් නොඅසමි. දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්නයයි" (ධනිය ගොපල්ලා කීයේය.)

**6.** "(ධනියය) මාගේ සිත කීකරුය. මිදුනේය. බොහෝ කලක් වඩන ලදී. මොනොවට දමනය කරණ ලදී. මට පවක් නැත්තේය. දැන් ඉදින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යයි" බුදුහු වදාළහ.)

**7.** "මම මා සතු බත් වැටුපෙන් රැකෙන්නෙමි මාගේ දරුවෝද එක්ව වසත්. නිරෝගය. ඔවුන්ගේද කිසි පාපයක් නොඅසමි.

එසේ හෙයින් දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යයි" (ධනීය ගොපල්ලා) කීයේය.)

8. "මම කාගේවත් බැලයෙක් නොවෙමි. මම සියලු ලොකයෙහි බැලකමින් තොරවැ හැසිරෙමි. බැලයෙන් ප්‍රයොජනයක් නැත්තේය. වැස්ස ඉදින් කැමැත්තෙහි නම් වසින්නයයි' භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

9. "මාගේ ගව මුලෙහි නාඹු වස්සෝද ඇත්තාහ, කිරිබොන ලමා වස්සෝද ඇත්තාහ, ගැබ දරණ දෙන්නුද ඇත්තාහුය, නැවත මෙවුන්දම් පතන දෙන්නුද ඇත්තාහ. තවද ගවයන්ට නායකවූ වෘෂභයාත් මෙහි ඇත. වැස්ස ඉදින් ඔබට වුවමනා නම් වහින්න යයි" (ධනිය ගොපල්ලා) කීයේය.)

10. ("ධනියය) අපගේ සස්නෙහි වසයයි කියනලද වඩින කෙළෙස් නැත. ධෙනුපා නම් නිදන කෙලෙස්ද නැත. ගොචරණී යයි කියන කර්ම අකුශල නැත නැවත පවෙණියයි කියන ලද භව තෘෂ්ණාද නැත. නැවත ගවපති වෘෂභ නම්වූ අභිසංස්කාර විඥාණය නැත. වැස්ස ඉදින් ඔබට වුමනා නම් වහින්නයයි" (බුදුහු වදාළසේක.)

11. "ගවයන් බඳිනා කණු සාරා පිහිටුවන ලද්දාහු නොසෙලවේ. මුදු තණ කොළින් කරණ ලද ලනු අළුත්ය. මනා පිහිටීම් ඇත්තාහ. තරුණ වස්සෝත් කඩන්නට නොම හැක්කෝය. දැන් ඉදිත් කැමැත්තෙහි නම් වසින්නයයි (ධනිය කීයේය.)

12. "මම වෘෂභයා බැඳුම් මෙන් කඩාගෙන ඇතා කීඳි වැල මෙන් කඩාගෙන නැවත මව් ගැබට නොපැමිණෙමි. දැන් ඉදින් කැමැත්තෙහි නම් වළාකුළ වසින්න යයි" (බුදුහු වදාළෝය.)

13. එකෙණෙහි වලද ගොඩද පුරමින් මහත්වූ මෙඝයෙක් වැස්සේය. වස්නාවූ මෙඝයාගේ ශබ්දය අසා ධනිය තෙම මේ අදහස පැවසීය.

14. "පුදුමයෙකි, යම්බඳුවූ අප හැම භාග්‍යවතුන් දකුමෝද ඒ අප හැමදෙනාට මහත් ලාභයෙකි. ඇස් ඇත්තානෙනි, නුඹ වහන්සේ සරණ යමි. මහාමුනිවරය, ඔබ අපගේ ඇදුරා වෙහිය."

15. "ගොපියද මමද යන දෙදෙන කීකරුව සුගතයන් වහන්සේගේ සමීපයෙහි බ්‍රහ්මචර්යාව හැසිරෙමු. ජාතියගේ හා මරණයාගේ පරතෙර ගිය දුක අවසන් කරන්නෝ වෙමු.

16. "දරුවන් ඇති පියා දූ දරුවන් සමග සතුටු වෙයි. ඒ දරුවන් ඇත්තහු සතුටු වන්නේය. එසේ ම බොහෝ ගවයන් ඇත්තේ ගවයන් නිසා සතුටු වන්නේය. මනුෂ්‍යයාට කාමාදියෙන් සතුටුවේ. කාමාදින් අත්හළ තැනැත්තේද සතුටු නොවන්නේමය" (මාරදිව්‍ය පුත්‍රතෙම කීය.)

17. "බොහෝ දරුවන් ඇති පුද්ගලතෙම දූන් හා පුතුන් සමග ශොක කරන්නේය. එසේම බොහෝ ගවයන් ඇත්තේ භවයන් කරණ කොටගෙන සොක කරන්නේය. යම් හෙතුවකින් කාමුපධිහු මනුෂ්‍යයා ශොක කරවත්ද, එනිසා යමෙක් උපධි අත්හැරියේ වේද හෙතෙම නොම ශොක කරත්යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3. **ඛග්ග විශාණ සූත්‍රය:-** 1. සියලු සත්වයන් කෙරෙහි පහරන දඬුමුගුරු බහාතබා ඒ සියලු සතුන්ගෙන් එකෙකුට වත් වෙහෙස නොකරන්නේ තනිවූයේ එක පුත්‍රයෙකුත් නොකැමැති වන්නේය. යහළුවකු කොයින්ද හුදකලාවූයේ

"කගවේනාගේ අඟ හා සමානව හැසිරෙන්නේය. (මේ වාක්‍යය මේ සූත්‍රයේ සෑම ඡේදයක් අගට යෙදිය යුතුයි.)

2. "කයින් සිතින් උපන් එකතුවීම් බව ඇත්තාහට බලවත් රාගය වන්නේය. ස්නෙහය අනුව යන මේ දුක වන්නේය. නොහොත් සංසර්ගය ඇත්තාහට රාගය උපදනේය. ඒ ස්නේහය අනුව ගිය මේ දුක උපදනේය. රාගයෙන් උපන් දොෂය නුවණැසින් දක්නේ

3. මිත්‍රවූ සිතට ප්‍රියවූ හැමදෙනා කෙරෙහි දයා පවත්වන්නේ, පිළිබඳ සිත් ඇත්තේ යහපත නසන්නේය. මේ භය, මිත්‍ර සන්ථවයෙහි දක්නේ,

4. යම්සේ හුණපඳුර විශාලවූයේ අවුල්වූයේ උස්ව සිටියේද එසේම පුතුන් දූන් කෙරෙහිද අඹුවන් කෙරෙහිද යම්

තෘෂ්ණාවෙක් ඇද්ද, ඒ තෘෂ්ණා තොමෝ හුණගොබය මෙන් නොඇලුනේය,

**5.** "නොබඳනාලද පසද මෘගතෙම උයන්හි ගොදුරු පිණිස යම් දිශාභාගයකින් අභිමත දිශාභාගයකට යනු කැමැත්තේද, ඒ දිශාභාගයෙන් යම්සේයේද, එපරිද්දෙන් තනිව හැසිරීම නුවණැසින් දක්නා පණ්ඩිත පුරුෂතෙම,

**6.** "යහළුවන් මැද සිටියහුගේද, දහවල් ශයනය කරන්නහුගේ ද උපස්ථාන කරණ තැන හුන්නහුගේද යමින් සිටියහුගේද චාරිකාවෙහි යන්නහුගේද මෙය අසව යනාදී ඇමතීම් වන්නේය. ආශා රහිත බවද තනිව හැසිරීම්ද නුවණැසින් දක්නේ හුදකලාවූයේ,

**7.** "යහළුවන් මැදදී ක්‍රීඩාවද, පස්කම්හි ඇල්මද වන්නේය. දූ පුතුන් කෙරෙහි බොහෝවූ ප්‍රේමයද වන්නේය. ප්‍රිය විප්‍රයොගයට පිළිකුල් කරන්නේ,

**8.** "හීන ප්‍රණීත චතුර්විධ ප්‍රත්‍යයෙන් සතුටු වන්නේද බ්‍රහ්මවිහාර වඩන සිවුදිග ඇත්තේ, ගැටීමක් නැත්තේවේද, හෙතෙම උපද්‍රවයන් ඉවසන්නේත්වේද, තැතිගැන්මක් නැත්තේද, වේද,

**9.** "සමහර පැවිදිවූවෝද නැවත ගිහිගෙයි නිවසන ගෘහස්ථයෝද, සංග්‍රහකොට හැක්කේය. අනුන්ගේ දරුවන් කෙරෙහි සංග්‍රහකිරීමට නිරුත්සාහව,

**10.** "ගිහි බව ප්‍රකාශ කරණ හිසකේ රවුළු ආදී ගිහිවෙස් පහකොට වැටුනු පත්‍ර ඇති කොබෝලීල ගසක් මෙන් ගිහීන්ට බන්ධනවූ පඤ්චකාම බන්ධනයන් සිඳ වීර්යයෙන් යුක්තවූයේ,

**11.** "වීර්ය ඇති එක්ව වසන සබඳයකු ඉදින් ලබන්නේ නම්, සියලු උපද්‍රවයන් මැඩගෙන ඒ සහාය ලාභයෙන් සතුටුවූයේ සිහියෙන් හැසිරෙන්නේය. වීර්ය ඇති එක්ව වසන සබඳයකු ඉදින් නොලැබෙන්නේ නම් විරුද්ධ රජකු විසින් ජයගන්නාලද රට හැර යන රජෙකු මෙන් අසහායවූයේ

12. "එකාන්තයෙන් යහපත් සහායයන් ලැබීමට ස්තුති කරම්හ. තමහට වඩා ගුණයෙන් උසස්වූද සමවූද සබඳහු සෙවිය යුත්තෝය. මේ විප්‍රකාර සහායයන් නොලැබ දැහැමින් සෙමෙන් උපන් භොජනය වළඳන කුලපුත්‍රතෙමේ අසහායවූයේ,

13. "රන්කරු පුතු විසින් මොනවට කරණලද දෑතෙහි ගැටෙන්නාවූ බබලන සුළුවූ රනින් කළ සම්බන්ධවූ වළලු දැක කීපයක් ඇතිතැන ගැටීමත් එකක් ඇති තැන නොගැටීමත් සිතා පසේබුදු වීමි. මා සේ වනු කැමැත්තෝ,

14. "දෙවැන්නකු සමග බොහෝ කථාකිරීමද ස්නෙහයෙන් ඇල්මද යන මේ භය මත්තෙහි වන්නේයයි නුවණැසින් දක්නෙමි (පසේබුදු වීමි) අසහායව,

15. "රූපාදී වස්තුකාමයෝ වනාහී අනෙක ප්‍රකාරවූවෝ මියුරුවූවෝ සිත අලවන්නෝ නීලාදී විවිධ ස්වරූපයෙන් බාලපුහුදුන්ගේ සිත මඩිති. මා සේ වනු කැමැති කුලපුත්‍රතෙම පස්කම්ගුණ විෂයෙහි අගුණ නුවණැසින් දැක අසහායව,

16. "මාගේ පඤ්චකාම ගුණජාතය දුක් එළවන විපතකැයිද, ගෙඩියකැයිද, උපද්‍රවයයයිද, රොගයයයිද, හුලයයිද යන මේ භය අවබොධ කෙළෙමි. පඤ්චකාම ගුණයේ මේ බිය දැක මා සේ වනු කැමති අර්ථකාමී කුලපුත්‍ර තෙමේ අසහායව,

17. "අභ්‍යන්තර බාහිර ධාතු කිපීමෙන් වන සීතයද උෂ්ණයද සාදුක්ද පිපාසා දුක්ද සුලංද අව්වද, ඩැහැලේ බොන මැස්සන් හා දීර්ඝජාතීන්ද මේ සියලු දුක් අභිභවනයකොට ගෙන විදසුන්වඩා පසේබුදු වීමි. අනිකුත් මා සේ වනු කැමති කුලපුත්‍රතෙමේ,

18. "සුවසේ විසීම නිසා මනා ශරීර ඇති පියුම් පැහැති උදාරවූ ඇතු යම්සේ ඇත් රංචුව හැර කැමති පරිදි වනයෙහි වසන්නේය, හුදකලාවූ,

19. "ජනසමූහයා කෙරෙහි ඇලුනහුගේ ලෞකික සමාපත්තියට පැමිණීමවෙයි, යන යම් කාරණයක් ඇද්ද, එය නොසිදුවේය යන ආදිච්චබන්ධු බුදුන්ගේ මේ වාක්‍යය අසා

සංගණිකායෙහි ඇලුම් හැර පසේ බුදුවීමි. මා සේ වනු කැමති කුලපුත්‍ර තෙමේ

**20.** "විදින අර්ථයෙන් දෘෂ්ටි සංඛ්‍යාත නපුරුකටුව ඉක්මවූයෙමි. සොවාන් මාර්ගයට පැමිණියෙමි. ලබන ලද ඉතිරි මාර්ගතුන ඇත්තෙමි. උපන්ඵල ඥාන ඇත්තෙම් අනුන් විසින් නොපැමිණ වියයුතුවූයේ අනික් දතයුතු ධර්මයක් නැත්තෙම් වෙමි. මා සේ වනු කැමති කුලපුත්‍රතෙමෙ,

**21.** "රස තෘෂ්ණාවට ලොල්නුවූයෙමි. කුහක නොවූයෙමි. පිපාසානැත්තෙමි. මකුගුණය නැත්තෙම් නසනලද කෙලෙස් කසට හා මොහය ඇත්තෙමි. සියලු ලොව භව විභව තෘෂ්ණා නැතිව පසේබුදුවීමි. (අන්‍යයාත්)

**22.** "පාපයෙන් යුක්තවූ අනර්ථය දක්වන කාය දුශ්චරිතාදී විසම දෙයෙහි ගැලුන යහළුවා විශෙෂයෙන් දුරුකරන්නේය. රූපාදියෙහි ඇලුනු පමාවූ ඔහු ආශ්‍රය නොකරන්නේය. එකාන්තයෙන්,

**23.** "පර්යාප්ති ප්‍රතිවෙධ ධර බහුශ්‍රැතවූ, ධර්මය ශ්‍රැත වශයෙන් ප්‍රතිවෙධ වශයෙන් දරණ, උදාරවූ වැටහීම් නුවණ ඇති කල්‍යාණ මිත්‍රයා භජනය කරන්නේය, මෙලොව පරලොව හා පරමාර්ථයන් දැන සැක නසා,

**24.** "ලොකයෙහිවූ ක්‍රීඩාද ඇල්මද රූපාදී කම්සැපයද සාරයයි නොගෙන ආලය නැත්තේ සැරහීමෙන් දුරුවූයේ සත්‍යය කියන සුළුවූයේ,

**25.** "දරුවන්ද භාර්යාවන්ද පියාණන් හා මෑණියන්ද දශවිධ රත්නයන්ද ධාන්‍යයන්ද බන්ධූන්ද සීමා වශයෙන් සිටියාවූ වස්තුකාමයන් හැර හුදකලාවූයේ,

**26.** "මේ උපභොගවූ පඤ්චකාමය එරෙන තැනකැයිද, මේ පස්කම්හි සැපය යන සැනසීම ස්වල්පයයිද පඤ්චකාම අරමුණුකොට ඇති සතුට ස්වල්පයයිද දුක බොහෝයයිද මේ පඤ්චකාමය විලියෙකැයිද නුවණැති පුරුෂතෙමෙ දැන මේ සියල්ලහැර,

27. "ගඟදියෙහිදී නූලෙන් කළ දැළ බිඳගෙන පලාගිය මත්ස්‍යයා මෙන් කාම සංයොජනයන් ඒ ඒ මගින් නිසිලෙස විශෙෂයෙන් පලාහැර දවනලද ස්ථානයට නැවත නොඑන ගිනිමෙන් කාමගුණ ස්ථානයට නැවත නොඑන්නෙමි.

28. "යට බලා හෙලනලද ඇස් ඇත්තේ අනවශ්‍ය ගමන් නැත්තේ සංසුන් ඉඳුරන් ඇත්තේ, රක්නාලද සිත් ඇත්තේ, කෙලෙසුන්ගේ පැවතීම නැත්තේ ක්ලෙස ගින්නෙන් නොදවනු ලබන්නේ,

29. "ගිහිබව ප්‍රකාශ කරණ හිසකේ දැළිරවුළු ආදිය හැර බා තබා පියා ගිහිගෙන් නික්ම මනාවැසුණු පත්‍ර ඇති කොබෝලීල ගසක් මෙන් කාෂාය වස්ත්‍ර ඇත්තේ,

30. "රසයන්හි ගිජු බව නොකරන්නේ ලොල් නුවූයේ පොෂණය කටයුතු අන්‍යයෙකු නැත්තේ නොබැඳුනාවූ සිතින් කුලයක් පාසා පිළිවෙළින් (පිඬු පිණිස) හැසිරෙන්නේ,

31. "සිතට ඇවිරීම කරණ නීවරණයන් පස්දෙනා අත්හැර සියලු කිලුටු දුරුකොට දෘෂ්ටි ඇසුරු නොකළ රාගය සිඳ,

32. "ප්‍රථමධ්‍යාන භූමියෙහිම කායික සැප දුක්ද, දෙවෙනිධ්‍යාන ආසන්නයෙහි චෛතසික දුකද තෘතීය ධ්‍යානයට ආසන්නයෙහිම කායික සැපයද සතරවෙනි ධ්‍යානය ආසන්නයෙහිම චෛතසික සැපයද, පිටත්කොට හැර ඉතා පිරිසිදුවූ සතරවෙනි ධ්‍යාන උපෙක්ෂාව ඇති, සතරවෙනි ධ්‍යානසමාධිය ලැබ පසේබුදුවීමි.

33. "නිර්වාණයට පැමිණීම පිණිස පටන්ගන්නාලද වීර්ය ඇත්තෙමි, හැකුළුන සිත් නැත්තෙමි කම්මැළි සිත් නැත්තෙමි ස්ථිර වීර්ය ඇත්තෙමි ශරීර ශක්තියෙන්ද ඥාණ ශක්තියෙන්ද යුක්තවූයෙමි පසේබුදුවීමි.

34. "පසෙකටවීම හෝ කායවිවෙකයද, චිත්තවිවෙකයද, නොහරින්නේ විදර්ශනාවට යොග්‍ය ධර්මයන් විෂයෙහි නිතර අනුලොම විදර්ශනාවෙහි හැසිරෙන, තුන් භවයෙහි අගුණ දක්නාවූ මම පසේබුදුවීමි.

**35.** "නිර්වාණය පතන නොපමාවූ පණ්ඩිතවූ ව්‍යක්ත වචන ඇති ඇසූපිරූ තැන් ඇති සිහි ඇති සම්‍යක් ප්‍රධාන වීර්ය ඇති, නියතවූ දන්නාලද ධර්මය ඇත්තෙම් පසේ බුදුවීමි.

**36.** "බෙරශබ්දාදියෙහිද භය නොකරණ කෙශරසිංහයා මෙන් දැල නොබැඳෙන වාතය මෙන් දිය හා නොඇලෙන පද්මය මෙන් පසේබුදුවීමි.

**37.** "සිවුපාවුන් පෙලා පන්නා හැර හැසිරෙන වසීකොට ගෙන හැසිරෙන දත්බල ඇති කෙශර සිංහයා මෙන් රජ තෙමේ දුරුවූ හෝනා හිදිනා තැන් ආශ්‍රය කරන්නේ පසේ බුදුවීමි.

**38.** "විමුක්ති නම්වූ මෛත්‍රී ධ්‍යානයද කරුණා ධ්‍යානයද මුදිතා ධ්‍යානයද උපෙක්ෂා ධ්‍යානයද පහසු කාලයෙහි වඩන්නේ සියලු සත්වලොකයා හා විරුද්ධ නොවන්නේ පසේබුදුවීමි.

**39.** "රාගයද, ද්වෙෂයද, මොහයද ප්‍රහාණයකොට සංයොජනයන් ඒ ඒ මගින් පළවා හැර චුති චිත්තයාගේ බිඳීමෙහි භය නොකරන්නෙම් පසේබුදුවීමි.

**40.** "මෙකල තමා දෙස බලන අපිරිසිදු මිත්‍රයෝ ප්‍රයොයක් තකා ඇලෙති. ආශ්‍රයන් කෙරෙහි වැඩක් නොකැමැත්තාවූ ආර්යවූ මිත්‍රයෝ මෙකල ලැබීම දුර්ලභයි.

**4. කසීභාරද්වාජ සූත්‍රයː-** 1. මවිසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මගද දනව්වෙහි ඒකානාලා නම් බමුණු ගම්හි දක්ඛිනගිරි විහාරයෙහි වැඩවසනසේක. ඒ කාලයෙහි කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයා විසින් වප් කල්හි පන්සියයක් නඟුල් යොදන ලද්දාහු වෙත්. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරව පා සිවුරු ගෙණ කසීභාරද්වාජ නම් බමුණාගේ භොජනය යම් තැනෙක්හි වේද එතැනට පැමිණිසේක. එකල කසීභාරද්වාජ බමුණාගේ අනුභවය පවතී.

**2.** බුදුරජතෙම අනුභවය යම්තැනෙක පවතීද එතැනට පැමිණියේය. පැමිණ එකත්පසෙක සිටියේය. කසිභාරද්වාජ බමුණු පිඬු පිණිස හුන් භාග්‍යවතුන් දැක්කේය. දැක

භාග්‍යවතුන්ට මෙය කීයේය. "මහණ මම වනාහි සී සාමි. වපුරමි. සී සා වපුරා අනුභව කරමි. නුඹද මහණ සීසාව, වපුරව, සීසා වපුරා අනුභව කරව."

"මමද බමුණ සාමි, වපුරමි. සා වපුරා වළඳමි"යි වදාළෝ"

"භවත් ගෞතමයන්ගේ වියදඬක් හෝ නගුලක් හෝ සී වැලක් හෝ කැවිටක් හෝ ගොනුන් හෝ නොම දකිමු.

"එතකුදු වුවත් භවත් ගෞතමතෙම මෙසේ කියයි.

"මම ද බමුණ, සාමි, වපුරමි, සා වපුරා වළඳමි"යි ඉක්බිති කසීභාරද්වාජ බමුණු භාග්‍යවතුන්ට ගාථාවකින් කීයේය.

3. "සාන්නෙකැයි ප්‍රතිඥාකෙරෙහිය, ඔබගේ කෘෂි භාණ්ඩ නොදකිමු. අප විසින් විචාරණලදී. යම්පරිද්දකින් ඔබගේ ඒ උපකරණ දැන ගන්නෙමුද කියනු මැනවි."

"ශ්‍රද්ධාතොමෝ බිජුවටය, තපස වර්ෂාවය, මාගේ ප්‍රඥාව විය හා නගුල්ය. ළජ්ජාව නගුලිසය, සිත යොතය ස්මෘතිය මාගේ සීවැල හා කැවිටයි.

4. "රක්ෂාකරණ ලද කාය සුචරිතය ඇත්තෙක්මි. වාක් සුචරිතය ඇත්තෙක්මි. සිවුපසෙහි ආහාරයෙහි සංයතයෙමි. සත්‍යයෙන් තෘෂ්ණා නැති කරමි. අර්හත්ඵල විමුක්තිය මාගේ මිදීමයි.

"මාගේ වියධුර ඉසිලීම් සංඛ්‍යාත (කායික චෛතසික) වීර්යය නිවන දක්වා පවතී. යම්තැනකට ගොස් ශෝක නොකෙරේද ඒ දක්වා නොනැවතී යයි.

"මෙසේ මේ සීය (මා විසින්) සානලදී. ඒ සීය අමෘතඵල ඇතිවේ. මේ සීය සා සියලු දුකින් මිදේ."

5. ඉක්බිති කසීභාරද්වාජ බමුණුතෙම මහත් රන් තලියෙක්හි කිරිබත් බහා යම් හෙයකින් පින්වත් ගෞතම තෙම අමෘතඵල ඇති සීයක් සායිද එහෙයින් පින්වත් ගෞතමයන් වහන්සේ කිරිබත වළඳනසේක්වායි" භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූයේය.

"මා විසින් ගාථා කියා ලබනලද භොජනය වැළඳියයුතු නොවේ. බමුණ, මනා දිවිපැවැත්ම දන්නාවූ බුදුවරුන්ගේ මේ ගී කියා වැළඳීම ධර්මය නොවේ, බුදුවරයෝ ගී කියා ලැබූ භොජනය බැහැර කෙරෙත්. බමුණ ආර්යධර්මය ඇතිකල්හි මේ ජීවිකා වෘත්තියයයි.

**6.** "සියලු ගුණයෙන් සම්පූර්ණවූ මහර්ෂිවූ ආශ්‍රව කුකුස් සන්සිඳවූ ක්ෂීණාශ්‍රවයන් අන්‍යවූ ආහාරපානයෙන් උපස්ථානකරව. රහත් සමූහයා වනාහි පින් කැමැත්තවුන්ට කෙතක් වෙයි."

"එසේ නම් පින්වත් ගෞතමයන් වහන්ස, කවරෙකුට මේ බත දෙව්දැයි?" (විචාළේ)

"බමුණ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ අවකාශ ලෝකයෙහිද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ සත්වලෝකයෙහිද තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හැර ඉන් පිටත් යමකු විසින් ඒ කිරිබත වළඳන ලද්දේ මනා දිරීමට යන්නේද, එබන්දකු මම නොදකිමි. එසේ නම් තෝ ඒ කිරිබත නිල් තණ රහිත තැනෙක්හි දමව. ඉන් මරණයට පැමිණෙන සතුන් නැති ජලයෙහි හෝ උපුල්වා හරුවයි" වදාළෝ.

**7.** ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම ඒ පායාසය ප්‍රාණීන් රහිත ජලයෙක්හි පාකොට හැරියේය. ඒ කිරිබත ජලයෙහි දමනලද්දේ චිච්චිට යන ශබ්ද කෙරේ. හාත්පසින් දුම්නගී වැඩියක් දුම්නගී. (කෙසේද) දවස මුළුල්ලේ රත්වූ නගුල්තලය දියෙහි දමනලද්දේ යම්සේ චිච්චිට යන ශබ්ද කෙරේද, චිච්චිට යන ශබ්ද කෙරේද, හාත්පසින් දුම් දමා, අතිශයින් දුම්නගයිද, එපරිද්දෙන් ඒ පායාසය දියෙහි ලනලද්දේ චිච්චිට ශබ්දකෙරේ. චිච්චිට ශබ්දකෙරේ. හාත්පසින් දුම්නගී. අතිශයින් දුම්නගී ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම සංවේගයට පැමිණියේ ලොමුදැහැගත්තේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී උන්වහන්සේට මෙසේ සැළකෙළේය.

8. "පින්වත් ගෞතමයන් වහන්ස, ධර්මදෙශනය ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, දම්දෙසුම ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනක් විවෘතකරන්නේ යම්සේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ යම්සේද, එපරිද්දෙන් භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. මේ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණයෙමි. භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි මම පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාවද ලබන්නෙමි."

9. ඉක්බිත්තෙන් කසීභාරද්වාජතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබූයේය. උපසම්පදාව ලැබූයේය. උපසම්පන්නයෙන් නොබෝ කල්වූ ආයුෂ්මත් භාරද්වාජතෙම හුදකලාවූයේ වෙන්වූයේ ප්‍රමාද නොවූයේ කෙලෙස් තවන වීර්යය ඇත්තේ පමණට මෙහෙයන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙද්ද, ඒ උතුම්වූ රහත්ඵලය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයකරණ ලදී. බ්‍රහ්මචරියාව වැසනිමවන ලදී. කටයුතුකොට නිමවන ලදී. කෙලෙසුන් නැසීම පිණිස තවත් භාවනාවක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක්වූහ"

5. **චුන්දසූත්‍රයඃ-** 1. "මහත් ප්‍රඥා ඇති සම්‍යක් සම්බුද්ධවූ ධර්මස්වාමිවූ, තෘෂ්ණා පහකළ, දෙපා ඇත්තවුන්ට උතුම්වූ සාරථීන්ටත් ඉතා උතුම්වූ, සර්වඥයන් වහන්සේ විචාරමි. සත්වලෝකයෙහි ශ්‍රමණයෝ කෙතෙක්ද, එසේ නම් වදාළ මැනවයි" චුන්දකර්මාර පුත්‍රතෙමේ කීයේය.

2. "චුන්දය, ශ්‍රමණයෝ සතරදෙනෙකි. පස්වන කෙනෙක් නැත්තේය. ඒ ශ්‍රමණයන් සතරදෙනා තට ඇස් හමුවෙහි විචාරණලද මම ප්‍රකට කෙරෙමි. යමෙක් වනාහි මාර්ගයෙන්

කෙලෙස් නැසූ මාර්ගය දිනුවේනම් වේද? යමෙක් වනාහි අනුන් හට මාර්ගය කියන මාර්ග දෙශකද, යමෙක් වනාහි අවසන් නොකළ මාර්ගවාස ඇති බැවින් මාර්ගයෙහි ජීවත්වේද, යමෙක් වනාහි මාර්ගයට විරුද්ධ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත බැවින් මාර්ග දූෂකද මේ සතර දෙනයයි" වදාළසේක.

3. "බුදුහු, කවරෙකුට මාර්ගජිනයයි කියත්ද? අසමාන මාර්ගදෙශකයා කෙසේවේද, මාර්ගයෙහි ජීවත්වන්නේ කෙසේද මා විසින් විචාරණලද, සර්වඥයන් වහන්සේ වදාරණසේක්වා ඉක්බිති මාර්ගදූෂකයා මට ප්‍රකාශ කරන්නැයි" චුන්දකර්මාර පුත්‍රතෙම කීය.

4. "යමෙක්තෙම පහකළ සැකය ඇත්තේද දුරුවූ රාගාදී උල් ඇත්තේද, නිවන්හි ඇලුනේද, තෘෂ්ණා නොකෙරේද, දෙවියන් සහිතවූ සත්වලෝකයා නිවරණට පැමිණවීද, මාර්ගජිනයා ඔහු යයි කියත්.

5. "මේ ශාසනයෙහි යම් ක්ෂීණාශ්‍රව ශ්‍රමණයෙක් සියලු ධර්මයන්ට නිර්වාණය උතුම්යයි දැන නිර්වාණ ධර්මය හා මාර්ග ධර්මය මේ ශාසනයෙහිම යයි පහළ කෙරේද, කොටස් කෙරේද, කියාද, විස්තර වශයෙන් බෙදයිද, සැක සිඳින්නාවූ මුනිවූ තෘෂ්ණා රහිතවූ ඔහු මාර්ගදෙශකවූ දෙවන ක්ෂීණාශ්‍රව ශ්‍රමණයා යයි කියත්.

6. "යම් ශෛක්ෂ (රහත් ඵලය සඳහා හික්මෙන) ශ්‍රමණයෙක් හෝ සිල්වත් පෘථග්ජන ශ්‍රමණයෙක් ශීල සංවරයෙන් යුක්තවූයේ, සිහි ඇත්තේ, සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් සෙවුනේ නිර්වාණ ධර්මයට කාරණවූම යහපත්කොට දෙශනා ලද මාර්ගයෙහි ජීවත්වේද, ඔහු තුන්වනුවූ මාර්ග ජීවශ්‍රමණ යයි කියත්.

7. "බුදුපසේබුදු සව්වන්ගේ වෙශය ගෙන මමත් සඟ වෙමියි ශාසනයට වැදුනාවූ, කුලයන්ගේ ප්‍රසාදය නසන හික්මීමෙන් තොර කටයුතු ඇත්තේ රැවටිලි ඇත්තේ ශීල සංවරයක් නැත්තේ, බොල් වී ඇටයක් මෙන් ගුණයෙන් හිස්වූයේ බාහිර

අලංකාරයෙන් යුක්තව හැසිරෙන්නාවූ ඒ පුද්ගලයා මාර්ගදූෂක ශ්‍රමණයාවේ.

8. "ශ්‍රැතවත්වූ ආර්යශ්‍රාවකවූ, ඥාණවන්තවූ, ගිහිගෙයි වසන යමෙක් ඒ මේ ශ්‍රමණයන් සතරදෙන දැනගත්තේද, මුලින් කී තුන්දෙනා මාර්ගදූෂීහු හා සමාන නොකොට මෙසේ දැන වසන්නාවූ ඒ ගිහිගෙයි වසන්නාගේ ශ්‍රද්ධාව පවුකරණ පාප භික්ෂූහු දැකත් නොනසී. පිරිසිදු මහණුන් තුන්දෙනා අපිරිසිදු නමින් පමණක් ශ්‍රමණයා හා කෙසේ වනාහි සම කෙරේද?"

**6. පරාභව සූත්‍රයː-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම්වූ අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද විහාරයෙහි වැඩවාසය කරන සේක. ඉක්බිත්තෙන් එක්තරා දෙවතාවෙක් රාත්‍රිය සම්බන්ධ ප්‍රථම යාමය ඉක්මුණු කල්හි අතිශයින් යහපත් ශරීර වර්ණයෙන් ජේතවන විහාරය මුලුල්ල බබුළුවා භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ ඒ දෙවතාවා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ දැනුම් දුන්නේය.

2. "අපි හැමදෙනම පිරිහෙන්නාවූ පුරුෂයා ගෞතමයන් වහන්සේගෙන් අසාදැනගන්නා පිණිස ආවෙමු. පිරිහෙන්නාවූ සත්වයාට ඊට හෙතු කවරේදැයි" විචාළේය.

3. "වැඩෙන්නාවූ පුරුෂතෙම ධර්මකාමී ප්‍රතිපත්තිවල හැසිරෙනු දැකීමෙන් හා ඇසීමෙන් සුවසේ දතහැකි වන්නේය. පිරිහෙන්නාවූ පුරුෂතෙම ධර්මයට වෛරකරණ ප්‍රතිපත්ති දර්ශනයෙන් හා ශ්‍රමණයෙන් සුවසේ දතහැකි වන්නේය. දශ කුශල කර්මපථ ධර්මය අසා පිළිපදනේ වැඩෙයි. ඒ දශකුශල ධර්මයට ද්වෙෂව නොකැමතිව අසා නොපිළිපදනේ පිරිහෙන්නේය.

"මේ පිරිහෙන පළමුවන කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ"

4. "භාග්‍යවතුන් වහන්ස, දෙවනි පිරිහෙන කාරණය වදාළ මැනවි පිරිහීමට කාරණය කවරේද?

සද්ධර්මයට කැමති නොවීමෙන් පිරිහීමට පැමිණෙන පුරුෂයා හට පූරණකාශ්‍යපාදී මිසදිටු ගත් අසත්පුරුෂයෝ ප්‍රියවෙති. ඒ පිරිහීමට පැමිණෙන පුරුෂතෙම බුද්ධාදී සත් පුරුෂයන් ප්‍රිය නොකරන්නේය. යට කියන ලද නිවටුන්ගේ අසත්පුරුෂ ධර්මයන් රුචිකරන්නේය. අසත් පුරුෂයන් කෙරෙහි ප්‍රියවීම, සත්පුරුෂයන් අප්‍රිය වීම අසත්පුරුෂයන්ගේ අසද්ධර්මයට කැමති වීමය යන මේ තුන පිරිහීමට කාරණයයි" වදාළසේක. "මේ දෙවෙනි පරිහානිකාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ."

**5.** "භාග්‍යවතුන් වහන්ස, තුන්වෙනි, පරිහානි කාරණය වදාළමැනව. පිරිහීමට කාරණා කවරේදැයි" විචාළේය.

"යම්කිසි සත්වයෙක් තෙම නිතර නිදන්නේද බොහෝ දෙන රැස්ව කථාකරණ තැනට එළඹ කථාවෙහි ඇලුනේ වේද, වීර්ය තේජස් නැත්තේද අලසද, ක්‍රොධයම ලකුණු කොට ඇත්තේද යන මේ කරුණු පිරිහීමට කාරණයයි වදාළසේක. "මේ තුන්වෙනි පරිහානි කාරණය වදාළ පරිද්ද දැනගතුම්හ."

**6.** භාග්‍යවතුන් වහන්ස, සතරවෙනි පරිහානි කාරණය වදාරණසේක්වා, සත්වයා පිරිහීමට කාරණය කවරේදැයි විචාළේය.

"යම්කිසිවෙක් ජරාවට ගිය තරුණ බව ඉක්මවූ වැදූ මෑණියන් හෝ පියාණන් හෝ (තමා) පොහොසත්වූයේ පොෂණය නොකෙරේද එය පිරිහීමට කාරණයයි" වදාළසේක. "මේ සිවුවෙනි පරිහානිකාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ"

**7.** "භාග්‍යවතුන් වහන්ස, පස්වෙනිවූ පරිහානි කාරණය වදාළ මැනව කවරේදැයි" විචාළේය.

"ක්ෂත්‍රියාදී යම්කිසිවෙක් බැහැර කරන ලද පවු ඇති ක්ෂීණාශ්‍රවවූ බ්‍රාහ්මණයෙකු හෝ සන්සිඳුවන ලද පව ඇති එබඳු ශ්‍රමණයකු හෝ අපි නැවත අන්කිසිවක් ඉල්වන යාචකයෙකු හෝ බොරුකීමෙන් වංචා කෙරේද දෙලොවින්ම පිරිහීමට කාරණයයි" වදාළසේක. "මේ පස්වැනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ"

**8.** "භාග්‍යවතුන් වහන්ස, සවෙනි පරිහානි කාරණය වදාළ මැනව. කවරේදැයි" විචාළේය.

"බොහෝ පොහොසත් රන්රිදී මිණිරුවන් ඇති බොහෝ කහවනු සහිතවූ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බොජුන් ඇති පුරුෂයෙක් තෙම මියුරු රස ඇති භොජන තම අඹුදරුවන්ටත් නොදී තනිවම අනුභව කෙරේද? මේ සවෙනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ."

**9.** "භාග්‍යවතුන් වහන්ස, සත්වෙනි පරිහානි කාරණය කවරේදැයි" විචාළේය.

"යම් සත්වයෙක් ජාතිය කරණකොට ගෙන තදමානය ඇත්තේවේද ධනය හේතුකොට ගෙන තදමානය ඇත්තේ වේද, ගොත්‍රය හෙතුකොට ගෙණ තද මානය ඇත්තේ වේද තමාගේ අවශෙෂ නෑයන් ජාතිධන ගොත්‍ර වශයෙන් පහත් කොට සිතාද, ඒ සිය නෑයන් යටත්කොට දැකීම ඒ සත්වයා හට පිරිහීමට කාරණයයි" වදාළසේක. මේ "සත්වැනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ."

**10.** "භාග්‍යවතුන් වහන්ස, අටවෙනි පරිහානි කාරණය වදාළ මැනව කවරේදැ"යි විචාළේය.

"යම් සත්වයෙක් තෙම පර ස්ත්‍රීන් සේවනය කෙරේද, සුරාබීමෙහි ලොල්වූයේද, දූ කෙළියෙහි ලද ලද යම් වස්තුවක් නසාද, එය පිරිහීමට කාරණයයි" වදාළසේක. "මේ අටවැනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ."

**11.** "භාග්‍යවතුන් වහන්ස, නවවැනි පරිහානි කාරණය කවරේදැ"යි විචාළේය.

"තමතමන්ගේ භාර්යාවන් හෙතුකොටගෙන නොසතුටුවූ යමෙක් වෛශ්‍යාවන් කෙරෙහි දක්නා ලැබෙයිද පරස්ත්‍රීන් කෙරෙහි දක්නා ලැබේද එය පිරිහීමට කාරණයයි" වදාළ සේක. මේ නවවැනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ.

**12.** භාග්‍යවතුන් වහන්ස, දශවෙනි පරිහානි කාරණය වදාළමැනව. කවරේද?"

"ඉක්මගිය යෞවන වයස් ඇති පුරුෂයෙක් තෙම තිඹිරි ඵල වැනි තන ඇති තරුණියක් සරණ පාවාගෙන ඇය තරුණ පුරුෂයකු පතාදෝ යන ඊර්ෂ්‍යාවෙන් රාත්‍රියෙහි නොනිදාද, ඒ කරණය පිරිහීමට කාරණයයි" වදාළසේක "මේ දශවැනි පරිහානි කාරණය වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ."

13. "භාග්‍යවතුන් වහන්ස, එකොලොස්වැනි පරිහානි කාරණය වදාළ මැනව කවරේද?"

"මත්ස්‍ය මාංශ හා සුරාවෙහි ලොල්වූ ඒ මාංශාදිය නිසා සම්පත් විසුරුවන සුලුවූ ස්ත්‍රියක හෝ එබඳුවූ පුරුෂයෙකු හෝ භාණ්ඩාගාරාදිය බාරදී ඒකීදෙයෙහි නියුක්ත කෙරේද, එබන්දහු පිරිහීමට කාරණයයි" වදාළසේක. "මේ එකොළොස්වැනි පරිහානි කාරණය මේ වදාළ පරිද්දෙන්ම දැනගතුම්හ."

14. "භාග්‍යවතුන් වහන්ස, දොළොස්වැනි පරිහානි කාරණය වදාළ මැනව."

"මදවූ වස්තු ඇති තෘෂ්ණා ඇත්තෙක් ක්ෂත්‍රිය කුලයෙහි උපදීද, ඒ ක්ෂත්‍රිය ජාති ඇති අල්පභොග මහා තෘෂ්ණා ඇත්තේ වනාහි තමා සතුවූ හෝ තමාට නොලැබෙන අනුන් සතුවූ හෝ රාජ්‍යය ප්‍රාර්ථනා කෙරේද ඒ පිරිහීමට කාරණයයි" වදාළසේක.

"ප්‍රඥා ඇති පුද්ගලතෙම මේ සත්වලොකයෙහිවූ යථොක්තවූ තෙවිසි පරිහානි කාරණයන් නුවණැසින් පරීක්ෂාකොට දැන එහි ආදීනව දත් ඒ ප්‍රඥාවන්තවූ පුද්ගලතෙම දිව්‍ය ලොකය සේවනය කරන්නේයයි" වදාළසේක.

**7. වසල සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවන නම්වූ විහාරයෙහි වැඩවාසය කරන සේක. එකල්හි වනාහී භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩිසේක. අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙය යම් තැනෙක්හිද එතැනට වැඩිසේක.

2. අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම වැඩමවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේමය. දැක භාග්‍යවතුන්

වහන්සේට මේ වචනය කීයේය. මුණ්ඩකය, එහිම සිටුව, නින්දිත (සැඩොල) මහණ එහිම සිටුවයි" මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාට මෙසේ වදාළසේක. බමුණ, තෝ සැඩොලා හෝ සැඩොල් බවට පමුණුවන කාරණයන් හෝ කිමෙකැයි දන්නෙහිද?"

"වසලයා හෝ වසල බවට පමුණුවන ධර්මය හෝ නොදනිමි. භවත් ගෞතමතෙම වසලයා හෝ වසල බවට පමුණුවන කාරණයන් යම්සේ මම දැනගනිම්ද, මට එසේ දහම් දෙසන සේක්වායි" සැළකෙළේය.

3. "බමුණ, එසේවීනම් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමියි" වදාළසේක. "පින්වත, එසේයයි" කියා අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

4. "යම් මනුෂ්‍යයෙක් කිපෙන ස්වභාව ඇත්තේ වේද, වෛර ඇත්තේ වේද, අනුන් ගුණ නසන පව්ටු ස්වභාව ඇත්තේ වේද, විපර්යාසවූ දෘෂ්ටි ඇත්තේද (හෙවත් සම්‍යක් දෘෂ්ටියෙන් තොරවූයේද) මායාව ප්‍රයෝග ඇත්තේ වේද ඔහු වසලයයි" දැනගත යුතුයි.

5. "මේ ලොකයෙහි යම් පුද්ගලයෙක් පක්ෂීන්ට හා සෙසු සතුන්ට හිංසා කෙරේද, (හෙවත් දිවි තොරකෙරේද) යමෙක්හට සත්වයා කෙරෙහි දයාවක් නැත්තේද, ඔහු වසලයා යයි දතයුතුයි.

6. "යමෙක්තෙම ගම් හා නියම් ගම්ද විනාශ කෙරේද, සේනාව ලවා වටලාද නිග්‍රහ කරන්නෙකැයි ප්‍රසිද්ධවේද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

7. "ගමෙහි හෝ ඉදින් වනයෙහි හෝ අනුන්ගේ මමත්වය ඇති යම් වස්තුවක් සොරසිතින් ගනීද ඔහු වසලයෙකැයි දතයුතුයි.

8. "යමෙක්තෙම ඒකාන්තයෙන් ණය රැගෙන චොදනා කරනු ලබන්නේ 'තට ණයක් නැත්තේයයි' බැහැරයාද ඔහු වසලයෙකැයි දතයුතුයි.

9. "යමෙක් ඒකාන්තයෙන් කිසි වස්තුවක් කැමැත්තේ මාර්ගයෙහි යන්නාවූ ජනයා නසා කිසි වස්තුවක් පැහැර ගනීද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

10. "යම් මනුෂ්‍යයෙක් සාක්ෂි විචාරණ ලද්දේ තමා හේතුකොටගෙන හෝ අනුන් හේතුකොටගෙන හෝ යම් ධනයක් හේතුකොට හෝ බොරු කියාද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

11. "යමෙක් නෑයන්ගේ හෝ යහලුවන්ගේ හෝ භාර්යාවන් කෙරෙහි බලාත්කාරයෙන් එකක්හුගේ ප්‍රෙමයෙන් හෝ උභය ප්‍රෙමයෙන් හෝ දක්නා ලැබේද හෙවත් අනාචාරයෙහි හැසිරේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දත යුතුයි.

12. "යමෙක් තෙම බොහෝ ධනධාන්‍ය ඇත්තේ ජරාපත්වූ පහවගිය යෞවන බව ඇති මව හෝ පියා හෝ පෝෂණය නොකෙරේද ඔහු වසලයෙකැයි දත යුතුයි.

13. "යමෙක්තෙම මවට හෝ පියාට හෝ සහෝදර සහෝදරියන් හා නැදිමයිලන්ට හෝ හිංසා කෙරේද, වචනයෙන් ක්‍රොධකෙරේද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

14. "යමෙක් තෙම විචාරණ ලද්දේම අනර්ථයක්ම ප්‍රකාශ කෙරේද සැඟවීම වශයෙන් යම් යම් දේ කථා කෙරේද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

15. "යමෙක් තෙම පව්කම්කොට මා නොදනීවායි කැමති වේද, යමෙක් තෙම අනුන් නොදන්වා සඟවා කරන ලාමක ක්‍රියා ඇත්තේද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

16. "යමෙක්තෙමේ මේ ඥාතිමිත්‍රාදී අන්ගෙයකට ගොස් යහපත් භොජනයක් අනුභව කොට පසුව තමාගේ ගෙට පැමිණි ඔවුන්ට ආහාර පානයක් නොදේද, ඔහු ඒකාන්තයෙන් වසලයා යයි දත යුතුයි.

17. "යමෙක් තෙම බ්‍රාහ්මණයකු හෝ ශ්‍රමණයකු හෝ අන්කිසි යාචකයකු හෝ තමාගේ ගෙට පැමිණි කල්හි බොරුකියා වඤ්චාකෙරේද ඔහු වසලයෙකැයි දතයුතුයි.

18. "යමෙක්තෙම බ්‍රාහ්මණයකු හෝ ශ්‍රමණයකු හෝ පෙරවරු වේලෙහි පැමිණිකල්හි කිසිවක් නොදේද නුසුදුසු වචන කියමින් රොස් උපදවාද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දත යුතුයි.

19. "මේ ලොකයෙහි යමෙක්තෙම මොහයෙන් වැසෙන ලද්දේද කිසියම් දෙයක් නොදී වළකමින් අසත්පුරුෂ වචන කියාද, ඔහු වසලයයි දතයුතුයි.

20. "යමෙක් තෙම ස්වකීය උඩඟු මානයෙන් පිරිහුනේ තමන් උඩඟු කෙරේද අන්‍යයාට නින්දාකෙරේද හෙවත් හෙලා දකීද, ඔහු වසලයයි දතයුතුයි.

21. "යමෙක් අනුන්ට ක්‍රොධ කෙරේද තද මසුරු සිත් ඇත්තේද නැති ගුණයෙන් පෙනී සිටීද ලජ්ජානැත්තේද පවට බිය නැත්තේද, ඔහු වසලයයි දත යුතුයි.

22. "යමෙක් තෙම බුදුන්ටද උන්වහන්සේගේ ශ්‍රාවකයන්ටද පරිබ්‍රාජකයන්ටද ගෘහස්ථයන්ටද පිරිහෙලා කථා කෙරේද, ඔහු වසලයෙකැයි දතයුතුයි.

23. "යමෙක් තෙම රහත් නුවූයේම රහත්යයි අඟවාද බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි මෙතෙම ඒකාන්තයෙන් පළමුවෙනි මහසොරා වේ. මේ තෙමේ චණ්ඩාලයන්ගෙන් අධමවේ.

24. "ජාතිය හෙතුකොට ගෙන චණ්ඩාලයෙක් නොවේ. ජාතිය හෙතුකොට ගෙන බ්‍රාහ්මණද නොවේ. අධම ක්‍රියාව හෙතුකොට ගෙන චණ්ඩාලවේ. යහපත් ක්‍රියාව හෙතුකොට ගෙන බ්‍රාහ්මණද වේ.

25. "යම්සේ මාගේ මේ උපමා දැන්වීමක් ඇද්ද ජාතිය හෙතුකොට ගෙන සැඩොල් නොවන බව මෙයින්ද දැනගනිව් සැඩොල් පුත්වූ සොපාකයයි කියන ලද මාතංගයයි ප්‍රසිද්ධවූ

26. "ඒ සොපාක තෙරුන්වහන්සේ මේ රාගාදී රජස් රහිතවූ මහතුන්ගේ මහාමාර්ගයවූ ඒ අෂ්ටසමාපත්ති නම් දිව්‍ය යානාවට නැගී කාමරාගය පහකොට උත්පත්ති වශයෙන් බ්‍රහ්මලොකයට පැමිණියේ විය.

27. "ජාතිය ඔහු බඹලොව ඉපදීමෙන් නොවැළැක්විය මන්ත්‍ර අධ්‍යයනයෙන් කල්යවන ප්‍රසිද්ධ බ්‍රාහ්ණ කුලයෙහි උපන්නාවූ වෙදයම නොහොත් මන්ත්‍රයම පිහිටකොට ඇති බ්‍රාහ්මණයෝ පව් කිරීමෙහි නිතර පව් කරන බව දක්නා ලැබෙද්ද, ඒ බ්‍රාහ්මණයෝ මෙලොවදීම නින්දාවට පැමිණෙන්නෝ වෙත්. පරලෙව්හිදී දුගති නම්වූ සතර අපායට පැමිණෙන්නෝ වෙත්. ජාතිය ඒ සත්වයන් පරලොව අපායෙන් හෝ මෙලොව නින්දාවෙන් හෝ නොනවත් වන්නේය.

28. "ජාතිය හෙතුකොට ගෙන වසලයෙක් නොවන්නේය. ජාතිය හෙතුකොට ගෙන බ්‍රාහ්මණයෙක්ද නොවන්නේය. ක්‍රොධ ඊර්ෂ්‍යා මානාදී හීනවූ පාප ක්‍රියාවෙන් වසලයෙක් වන්නේය. ක්‍රොධාදී පාපකර්මයෙන් තොරවූ කරුණාදී යහපත් ක්‍රියාවෙන් උතුම් ජාතියවූ බ්‍රාහ්මණයෙක් වන්නේ යයි" වදාළසේක.

29. "මෙසේ වදාළ කල්හි අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම බුදුරජාණන් වහන්සේට මෙසේ සැළ කෙළේය. (මෙහි සූත්‍ර නිපාතයේ 1 වර්ගයේ 4 සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.)

8. **(කරණීය) මෙත්ත සූත්‍රයː-** (මෙහි ඛුද්දකනිකායේ ඛුද්දක පාඨයන්හි 9 සූත්‍රය යෙදිය යුතුයි.)

9. **හෙමවත සූත්‍රයː-** 1. "අද පසළොස්වක දවසය. දිව්‍යවූ රූප ප්‍රභා ඇති, රාත්‍රිය පැමිණ සිටියාය. ලාමක නොවූ නම් ඇති, ශාස්තෘවූ ගෞතමයන් වහන්සේ ඒකාන්තයෙන් දකුම්හයි" සාතාගිර නම් යක් සෙනෙවි කීයේය.

2. "කිමෙක්ද? ඒ ශාස්තෘහුගේ සිත අචලද ඒ ශාස්තෘ තෙම සියලු සත්වයන් කෙරෙහි මනාවේද, කිමෙක්ද? ඒ ශාස්තෘහුගේ අදහස් ඉෂ්ට අනිෂ්ට අරමුණු විෂයෙහි වසඟ දැයි" හෙමවත යක් සෙනෙවි ඇසීය.

3. "සියලු සත්වයන් කෙරෙහි සමවූ ඒ ශාස්තෘහුගේ සිත අචලය. නැවත ඉෂ්ටවූ සංස්කාරයන් කෙරෙහිද අනිෂ්ටවූ සංස්කාරයන් කෙරෙහිද උන්වහන්සේගේ අදහස් වසඟ කරණ ලදහුයයි" සාතාගිර කීයේය.

4. "කිමෙක්ද? නුදුන් වස්තුව නොගනීද, කිමෙක්ද? සතුන් කෙරෙහි දයාද, කිමෙක්ද? ප්‍රමාදයෙන් හෙවත් අබ්‍රම්සරින් දුරුද, හෙවත් ස්ත්‍රීන් කෙරෙන් දුරුද, කිමෙක්ද? ධ්‍යානය නොහරීදැයි" හෙමවත යක් සෙනෙවි මෙසේ ඇසීය.

5. "ඒ සර්වඥතෙම නුදුන් වස්තුවක් නොගන්නේය. එසේම සතුන් කෙරෙහි දයාව ඇත්තේය. නැවත ප්‍රමාදයෙන් දුරුය. සර්වඥතෙමේ ධ්‍යානය නොහරනේයයි" සාතාගිර මෙසේ කීයේය.

6. "කිමෙක්ද? ඒ ශාස්තෘතෙම මුසාව නොකියාද, අනුන් හිංසා කරණ සිත නැත්තේද, රළු වදන් නැත්තේද, නපුරු වචන නැත්තේද, කිමෙක්ද? කේලාම් නොකියාද, කිමෙක්ද, නිරර්ථක තෙපුල් නොකියාදැයි" හෙමවත යක් සෙනෙවි ඇසීය.

7. "ඒ සර්වඥතෙම නපුරු බස් නොකියන්නේය. නැවත, හිංසා කරණ තෙපුලුත් නොකියන්නේය. නැවත, කේළමුත් නොකියන්නේය. ඒ සර්වඥතෙම නුවණින් පිරිසිඳ අර්ථයෙන් යුත් වචනය කියන්නේයයි" සාතාගිර යක් සෙනෙවි කීයේය.

8. "කිමෙක්ද? ඒ ශාස්තෘතෙම රූපාදි වස්තු කාමයෙහි නොඇලේද, කිමෙක්ද උන්වහන්සේගේ හිත ව්‍යාපාදයෙන් නොකැළඹුනේද, කිමෙක්ද, ඒ ශාස්තෘහුගේ මොහය ඉක්මුනේද කිමෙක්ද, ඒ ශාස්තෘතෙම සියලු සංස්කාර ධර්මයන් විෂයෙහි සමතැස් ඇත්තේදැයි" හෙමවත යක් සෙනෙවිතෙම මෙසේ විචාළේය.

9. "ඒ ශාස්තෘතෙම වස්තු කාම විෂයෙහි නොඇලේ. නැවත සර්වඥයන් වහන්සේගේ සිත ව්‍යාපාදයෙන් නොකැළඹිනි. සියලු මොහය ඉක්මුනේය චතුරාර්ය සත්‍යය දත්තාවූ ඒ සර්වඥතෙම සියලු ධර්මයෙහි නොපැකිල පවත්නා පසැස් ඇත්තේයයි" සාතාගිර යක් සෙනෙවි කීයේය.

10. "කිමෙක්ද? ඒ ශාස්තෘන් වහන්සේ ත්‍රිවිද්‍යා අෂ්ට විද්‍යාවෙන් යුක්තද, කිමෙක්ද, ඒ ශාස්තෘතෙම පිරිසිදු පසළොස් චරණ ධර්ම ඇත්තේද? කිමෙක්ද, ඒ සර්වඥයා විසින් ආශ්‍රවයෝ ක්ෂය කරණ ලදහුද, කිමෙක්ද, ඒ සර්වඥයන් වහන්සේගේ පුනරුත්පත්තියෙක් නැද්දැයි" හෙමවත ප්‍රශ්න කෙළේය.

11. "ඒ සර්වඥතෙම විද්‍යාවෙන්ද යුක්තය. නැවත පිරිසිදු චරණ ධර්මයනුත් ඇත්තේය. ඒ සර්වඥයන් වහන්සේ විසින් සියලු ආශ්‍රවයෝ ක්ෂය කරණ ලද්දහුය. ඒ සර්වඥයන් වහන්සේගේ පුනරුත්පත්තියෙක් නැතැයි" සාතාගිර යක් සෙනෙවි කීයේය.

12. "මුනිහුගේ සිත සම්පූර්ණය. මනඃ කර්මයෙන්ද වාක් කර්මයෙන්ද, සිත සම්පූර්ණය. විද්‍යා හා චරණ ධර්මයෙන් යුක්තවූ ඒ සර්වඥයන් වහන්සේට ඇති ගුණයෙන්ම, සාතා ගිරයෙනි, තොපි ප්‍රශංසා කරන්නෙහිය.

13. "මුනිහුගේ සිත සම්පූර්ණය. මනඃ කර්මයෙන්ද වාක් කර්මයෙන්ද සම්පූර්ණය, විද්‍යාචරණයෙන් යුක්තවූ ඒ සර්වඥයන් වහන්සේට ස්වභාවයෙන්ම (තොපි හෙමවතයෙනි) අනුමෝදන් වෙව."

14. "මුනිහුගේ සිත සම්පූර්ණය. මනඃ කර්මයෙන්ද වාක් කර්මයෙන්ද සම්පූර්ණය. විද්‍යාචරණයෙන් යුක්තවූ ගෞතම ගොත්‍ර ඇති සර්වඥයන් වහන්සේ නිශ්චය කොට දත් බැවින් අපි දෙන්නමෝ දකුම්හයි" සාතාගිර කීයේය.

15. "එණී මෘගයෙකුට බඳුවූ ක්‍රමයෙන් වටවූ පාද ඇති කෘශවූ වීර පුරුෂවූ අල්පාහාරවූ, අහරෙහි ලොල් නොවූ, මොනෙය්‍ය ගුණයෙන් යුක්තවූ වනයෙහි ධ්‍යාන කරණ සර්වඥයන් වහන්සේ සාතාගිරයෙනි, එව. තෙපිත් මමත් දකුම්හ."

16. "කේශර සිංහයා සදෘශවූ අසහායචාරීවූ ශ්‍රෙෂ්ඨවූ වස්තු කාම ක්ලෙශ කාමයෙහි ආලය නොකරණ සර්වඥයන් වහන්සේ සමීපයට පැමිණ මරහුගේ මලින් මිදීම විචාරම්හ."

17. "ආර්ය සත්‍යය කියන්නාවූ සිත් සතන් පරිද්දෙන් ධර්මය පවත්වන්නාවූ සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය බුද්ධවූ ප්‍රාණඝාතාදී වෛරයෙන් හා භයින් ඉක්මුනාවූ ගෞතම සර්වඥයන් වහන්සේ අපි විචාරම්හ."

18. "කවරෙක් උපන් කල්හි සත්ව සංස්කාර ලොකය උපන්නේ වේද? දෘෂ්ටිය හා එක්වීමත් තෘෂ්ණාව හා එක්වීමත්

කවර කලෙක්හි කෙරේද? කුමක් නිසා ලෝක නම්වේද, කුමක් ඇතිකල්හි සත්වලෝකයතෙම පෙළනු ලබන්නේ දැයි" හෙමවත යක්ෂතෙම මෙසේ විචාලේය.

**19.** "හෙමවතය, සයක් උපන් කල්හි සත්ව ලොකයද සංස්කාර ලොකයද උපන්නේ වෙයි. ඒ දෙවැදෑරුම් ආයතන සය කෙරෙහිම තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් බැඳීම සත්ව ලොකයා කරන්නේය. ඒ ද්විප්‍රකාර ෂඩායතනයන්ම නිසා සත්ව සංස්කාර ලොකය අත්පා ව්‍යවහාරයට යන්නේය. ඒ ෂඩායතනයන් ඇතිකල්හිම සත්ව ලොකයා වෙහෙසනු ලබන්නේය. බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ."

**20.** "යම් උපාදානයක් ඇතිකල්හි සත්ව සංස්කාර ලොකය වෙහෙසේද, ඒ ආයතන නම් දුඃඛය කවරේද, නික්ම යන මාර්ගය විචාරණලද මට සර්වඥයන් වහන්සේ වදාළසේක. උපාදානයයි දක්වන ලද දුඃඛයෙන් කෙපරිද්දෙකින් මිදෙන්නේද?

**21.** "සත්ව ලෝකයෙහි මනස සවැනි කොට ඇති, රූපාදී පඤ්චකාම ගුණයෝ ප්‍රකාශ කරණ ලද්දාහුය. මේ ද්වාදශායතනයන්ගේ විෂයෙහි තෘෂ්ණාව සර්වප්‍රකාරයෙන් නසා මෙසේ දුකින් මිදෙයි.

**22.** "ත්‍රිවිධ ලොකයාගේ මාර්ගයෙන් නික්ම යාම තොපට කියන ලදී. මේ මාර්ගයම තොපට මම දහසක් වර විචාළත් කියමි. මේ දුඃඛාදී චතුස්සත්‍යය මම මත්තෙහි විශෙෂාධිගමය පිණිස කියමි. මෙසේම දුකින් මිදෙන්නේය."

**23.** "මේ ලොකයෙහි කවරෙක් කාමාදී සතර සැඩ වතුරෙන් එතරවේද? මේ ලොකයෙහි කවරෙක් සංසාර මුහුදින් එතරවේද, යටින් පිහිටක් නැති මත්තෙහි එල්බෙන තැනක් නැති ගැඹුරු සංසාර සාගරයෙහි කවරෙක් නොගිලේද?"

"හැමකල්හි ශීලයෙන් යුක්තද ඥාණවන්තද, සමාධියට මාර්ගඵලවල මනාව පිහිටියේද, විදර්ශනා වශයෙන් සිතන සුළුද, සිහි ඇත්තේද, තරණය කළ නොහැකි සතර ඕඝය. එතර කරයිද?"

24. "කාම හැඟීමකින් දුරුවීද, කාම සංඥාවෙහි නොඇලුනේද, සියලු සංයොජනයන් ඉක්ම ගියේද, තෘෂ්ණාව හා තුන් භවය ක්ෂය කෙළේද, ඒ ක්ෂීණාශ්‍රව මහණ ගැඹුරුවූ සසර සයුරෙහි නොගැලෙන්නේය.

25. "ගැඹුරුවූ නුවණ ඇති නිපුණවූ අර්ථයන් දක්නා සුළුවූ රාගාදී පලිබොධ නැති දෙවැදෑරුම් කාමයෙහි හා ත්‍රිවිධ භවයෙහි නොගැටුනාවූ, සියලු අරමුණෙහි මිදුනාවූ දිව්‍ය විහාර පථයෙහි හැසිරෙන මහා ඍෂිවරයාවූ ඒ සර්වඥයන් වහන්සේ බලව්.

26. "ලාමක නොවූ නාමයන් ඇති සියුම් අර්ථ අනුන්ට දක්වන නුවණ දෙන කාම තෘෂ්ණාවෙහි නොඇලුනු, සියල්ල දත්තාවූ ශොභන පාරමිතා ප්‍රඥා ඇති ඵල සමාපත්තිය නුවණින් විඳින ඒ මහා ඍෂිවරයා බලව්.

27. "යම් හෙයකින් සතර ඔඝය තරණය කළ ආශ්‍රව රහිත සම්බුද්ධයන් වහන්සේ දැක්කෙමුද, අද අප විසින් යහපත් දැකීමක් දක්නාලදී. අද යහපත් සේ එළිවිය. අද මනා නැගිටීමක් විය.

28. "ඍද්ධියෙන් යුත් අග්‍ර ලාභයෙන් හා අග්‍ර පරිවාරයෙන් යුක්තවූ සියලු මේ දහසක් යක්කු ඔබ සරණකොට යෙති. ඔබවහන්සේ අපගේ එයට වඩා උත්තමයෙක් නැති ශාස්තෘ ය.

29. "සම්‍යක් සම්බුද්ධයන් හටද ධර්මයාගේ යහපත් බවටද නමස්කාර කරන්නාවූ අපි හැමදෙනම ගමින් ගමට දිව්‍ය පර්වතයෙන් දිව්‍ය පර්වතයට ධර්ම ඝොෂා කරන්නෝව ඇවිදින්නෙමු.

**10. ආලවක සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලව් නුවර සමීපයෙහිවූ ආලවක යක්ෂයාගේ භවනයෙහි වසනසේක.

2. (මෙහි සංයුක්ත නිකායේ යක්ඛ සංයුත්තයේ 12 සූත්‍රය යෙදිය යුතුයි.)

3. (මෙහි සූත්‍ර නිපාතයේ 1 උරග වර්ගයේ 4 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

(ii) ඒ මම භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද සංඝයාද සරණ යෙමි. පින්වත් ගෞතමයන් වහන්සේ අද පටන් මා සරණ ගිය උපාසකයකු කොට සලකන සේක්වා යනුයි.”

**11. විජය සූත්‍රයඃ-** 1. යන්නේ හෝ, ඉදින් සිටින්නේ හෝ හිඳිනේ හෝ හෝනේ වේද, හකුළු වන්නේද, දිගු කෙරේද, මෝතොමෝ රූප කායයාගේ සැලීම් වන්නේය.

2. කය ඇටින් හා නහරින් යුක්ත බැවින් සමින් හා මස්පිඬින් තැවරීම ඇති බැවින් සිවියෙන් වසනලද බැවින් එහි ඇති තතු නොපෙනේ.

3. බඩවැලින් පිරින, නොපැසුන අහරින් පිරින, අක්මාවෙන් පිරින, මූත්‍රයෙන් පිරින, හදමසින් පිරින, පපු කැනින් පිරින, වකුගඩුවෙන් පිරින, බඩදිවෙන් පිරින.

4. “සොටුයෙන් පිරින, කෙළින් පිරින, ඩහදියෙන් පිරින, මේදසින් පිරින, ලෙයින්, සදමිඳුලින්, පිතින්, වුරුණු තෙලින්, පිරින.

5. “නැවතද මේ ශරීරයාගේ නව මගින් හැම තන්හිම අපවිත්‍ර වැගිරෙන්නේය. දෙඇස් සිඳුරෙන් කබද, දෙකන් සිඳුරෙන් කනින් පිටවන අපිරිසිදු දේද වැගිරෙන්නේය.

6. දෙනාසා සිදුරෙන් සැරව වැනි කුණුද එක් කලෙක කටින් පිතද එක්කලෙක සෙමද වමනය වන්නේය. කයින් ඩාදියද, හැමකල්හි හැම ඉරියව්වෙහි වෑහෙන්නේය.

7. “නැවත මේ කායයාගේ සිදුරුවූ හිස හිස් මොළින්, පිරෙනලද, ඒ කය බාල ජනතෙම නොදැනීමෙන් මෙහෙයන ලද්දේ ඉෂ්ට හෙයින් සලකන්නේය.

8. “නැවතද ඒ කය මළේ, ඉදිමුනේ, නිල්වූයේ අමු සොහොනෙහි දමන ලද්දේ, යම් කලෙක ගොව්ද සියලු නෑයෝ නිරාලයව හරිත්.

9. මළ කය බල්ලෝද, සිවල්හුද, චණ්ඩ මෘගයෝද පණුවෝද, කපුටුවෝද ගිජුලිහිණියෝද, කති. අනිකුත් යම් සත්ව කෙනෙක් ඇද්ද ඒ සත්හු කන්නාහ.

**10.** මේ ශාසනයෙහි බුදු වදන් අසා විදර්ශනා නුවණ ඇති ඒ මහණ වනාහි ඒ කය පිරිසිඳ දන්නේය. යම් හෙයකින් තත්වූ පරිද්දෙන් දකීද එහෙයිනි.

**11.** මේ සිත් ඇති අශුභය යම්සේ යාම් සිටීම් හිඳීම් හොවීම් කෙරේද, සිත් නැති මේ අශුභය පළමුවෙන් එසේම කරන්නේ විය. මේ මළ ශරීරය යම්සේ යාම් ඊම් ආදිය නොකෙරේද, මේ සිත් ඇති අශුභයත් මතු එසේ නොකරන්නේය. මෙසේ පිළිපන් මහණ පිළිවෙළින් තමා තුළ වූද පිටත්හිවූද කයෙහි ඇල්ම දුරු කරන්නේය.

**12.** මේ ශාසනයෙහි රහත්මග නුවණින් යුක්ත ඒ රහත්මගට හික්මෙන මහණ ඡන්ද රාගයෙන් වෙන්වූයේ අමෘතවූ ශාන්ති නම්වූ නිර්වාණ නම්වූ චුති නැති බැවින් අච්චුතයයි යමක් වදාරණ ලදද, ඒ ශාන්ති පදවියට පැමිණියේය.

**13.** දෙපයත් ඇති මේ මිනිස් සිරුර අපවිත්‍රවූයේ දුගඳ වූයේ පරිහරණය කරයි. කෙස් ඈ නොයෙක් කුණින් පිරුණේ ඒ ඒ දොරින් අශුචි වැගිරෙන්නේමය. මෙබඳුවූ කුණු කයින් යුක්තවූයේ යම් නුවණ නැති පිරිමියෙක් හෝ ගැහැණියක් උසස් බව සිතන්නට සිතාද අන්‍යයන්ට හෝ අවමන් කරන්ට සිතාද අඥානකම විනා මෙහි අන් කවර කාරණයක් ඇද්ද.”

**12. මුනි සූත්‍රයඃ-** 1. “තෘෂ්ණා දෘෂ්ටි ආශ්‍රයෙන් කෙලෙස් බිය උපන්නේය. රූපාදිය අරමුණු කොට ගෙන රාග, ද්වේෂ, මොහ, කෙලෙස් ධූලි උපදනේය. කෙලෙස් වසන රූපාදිය නැති, ආශ්‍රය නැති මේ නිර්වාණය බුද්ධ මුනිහු විසින් දක්නා ලදී. විෂ්මයකි.

**2.** යම් බුද්ධ මුනි කෙනෙක් ක්ලෙශය සිඳ නූපදවාද, ඉපදීමට යොමුව සිටි ක්ලෙශයන් නොහටගන්වාද, ඒ කෙලෙස් උපදින කාරණයද, නූපදවාද, එක්කෙනෙක්වූ ශ්‍රෙෂ්ඨවූ පැවිදි ඉරියවුවෙහි හැසිරෙන උන්වහන්සේ මුනි යයි කියති. ඒ මහර්ෂිතෙම ශාන්ති පදය දැක්කේය.

**3.** කෙලෙස් ඉපදීමට කාරණයන් පිරිසිඳ දැන ලෞකික කුශලාකුශල චිත්තය නසා ඒ ස්නෙහය ඒ බීජයට නොවැද්ද

දේද, ඒ බුද්ධ මුනිතෙම ඉපදීම මරණයන්ගේ කෙළවර නුවණැසින් දක්නේ තර්කය අත්හැර ඒකාන්තයෙන් දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාවට නොපැමිණෙන්නේය.

**4.** "සතුන්ගේ සියලු ස්ථාන අනිත්‍යාදී වශයෙන් දැන් ඒ භව අතුරෙන් එක් වාසස්ථානයකුත් නොපතන ඒ බුද්ධ මුනිතෙම පහකරණ ලද තෘෂ්ණා ඇත්තේ ගිජු නොවූයේ යම් කාරණයෙකින් නිවණට පැමිණියේ වේද, ඒකාන්තයෙන් පින් පවු රැස් නොකරන්නේය.

**5.** සියල්ල මැඩ පැවැත්වූ සියලු ධර්මයන් සර්වාකාරයෙන් දත්, යහපත් නුවණ ඇති සියලු ස්කන්ධාදී ධර්මයෙහි නොඇලුණ සියලු කෙලෙස් සහිත ධර්මයන් අත්හළ තෘෂ්ණා ක්ෂය කිරීමෙහි යෙදුන උන්වහන්සේ බුද්ධ මුනියයි ඥාණවන්තයෝ දනිති.

**6.** ඥාණ බල ඇති සීල ව්‍රත දෙකින් යුත් එකඟවූ ධ්‍යානයෙහි ඇලුණු සිහි ඇති ඇල්මෙන් මිදුණු සිත තද කරණ ධර්ම නැති කෙලෙස් නැති ඔහු වනාහී ඥණවන්තයෝ මුනියයි දනිත්.

**7.** එකම ප්‍රව්‍රජ්‍යාවෙන් සිටගෙන අට වැදෑරුම් චර්යාවෙහි හැසිරෙන මුනිවූ, නොපමාවූ, නින්දා ප්‍රශංසා දෙක්හි නොසැලෙන, බෙර ශබ්ද ආදියෙහි බිය නොවන කෙශර සිංහයා මෙන් බයින් නොම වෙවුලන්නාවූ, දැලෙහි වෘතය මෙන් තෘෂ්ණා දෘෂ්ටි දැල නොබැඳෙන්නාවූ, දිය හා පියුම මෙන් නොඇලෙන්නාවූ, අන් දෙව්මිනිසුන් නිවනට පමුණුවන්නාවූ, අනිකකු විසින් මාර්ගයකියි නිවනට නොපැමිණ විය යුතුවූ, ඔහු වනාහි ඥාණවන්තයෝ මුනි යයි දනිති.

**8.** යම් කෙනෙකු කෙරෙහි අන්‍යයෝ ගුණයක් හෝ කී කල්හි නාන තොට පිහිටි කණුවක් මෙන් එකම ගුණයෙන් යුක්තවේද, ඒ පහවූ ඇලුම් ඇති මනාකොට සන්සිඳුන ඉඳුරන් ඇති ඔහු වනාහි ඥාණවන්තයෝ බුද්ධ මුනියයි දනිත්.

**9.** යම් ක්ෂීණාශ්‍රවයෙක් කාය විෂමාදී දුශ්චරිතයද කාය සමාදි සුචරිතයද විමසන්නේ ඒකාන්තයෙන් අන් ආත්මභාවයක්

නැත්තේද නූල් ඔතන දණ්ඩ මෙන් ඇද නැතිවූයේ පව්කම් පිළිකුල් කරයිද, ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේද මුනියයි දනිත්.

10. ඥාණයෙන් යුත් සීල සංවරයෙන් හික්මුන සිත් ඇති යම් බාලයෙක් හෝ මධ්‍යම වයස සිටියෙක් හෝ අන්තිම වයස සිටියෙක් හෝ පව් නොකරයිද, එබඳු ක්ෂීණාශ්‍රවතෙම අනුන්ට දොස් නොපවරන්නේ වෙයි. කිසිවෙකුට හෙතෙම ක්‍රොධ නොකරන්නේය. ඥාණවන්තයෝ ඒ ක්ෂීණාශ්‍රවයා මුනියයි දනිති.

11. අනුන් විසින් දෙන ලද්දෙන් ජීවත්වන යම් මහණෙක් භාජනයෙහි මුල් කොටසින් ගෙනදෙන හෝ මධ්‍යම කොටසින් ගෙනදෙන හෝ යට කොටසින් ගෙනදෙන හෝ යම් පිණ්ඩයක් ලැබේද, ස්තුති කරන්නට නුසුදුසුය. අප්‍රිය වදන් කීමටත් නුසුදුසුය. නුවණැත්තෝ ඒ ක්ෂීණාශ්‍රවයාටද මුනියයි කියති.

12. යම් රහත් නමක් යෞවන කාලයෙහි යම්කිසි ස්ත්‍රී රූපයෙක්හි පෘථග්ජන කාලයෙහි මෙන් නොබැඳේද, මෛථුනයෙන් දුරුව හැසිරෙන මුනිවූ මදයෙන් හා ප්‍රමාදයෙන් දුරුවූ කෙලෙසුන්ගෙන් මිදුනාවූ ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නුවණැත්තෝ මුනියයි දනිති.

13. ස්කන්ධ ලොකය නිශ්චය කොට පරමාර්ථවූ නිර්වාණය දක්නාවූ කාමාදී චතුර්විධ සැඩවතුරද ආයතන සමුද්‍රයද ඉක්මවා යහපත් අයහපත් දෙයෙහි එක සමානවූ නොහොත් ඔඝය නම් සමුද්‍රය ඉක්ම තාදීවූ එහෙයින් සිඳින ලද ගැට ඇති තෘෂ්ණාදීන් ඇසුරු නොකළ ආශ්‍රව නැති ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ මුනියයි ඥාණවන්තයෝම දනිති.

14. දෙදෙනම ඈත්වූ වාසස්ථාන හා ජීවත්වීම් ඇත්තාහ. ගිහිවූ වැදි කමින් අඹුදරුවන් රකින්නාද යහපත් පැවතුම් ඇති ක්ෂීණාශ්‍රවතෙමේද අසමානයහ. ගිහිවූ වැද්දා කයින් වචනින් මනසින් නොනැවැත්තේද, මුනිතෙම නිරන්තරයෙන් සතුන් මැරීමෙන් වැළකුනේ සතුන් රක්නේද වෙයි.

15. යම්සේ කුඩිම්බිය ඇත්තාවූ නිල් පාට බෙල්ල ඇති, මොණර පක්ෂිතෙම ස්වර්ණ හංසයාගේ වේගවත් ගමනට

කිසිසේත් නොපැමිණේද, මෙසේම ගිහිතෙම හික්මෙන ස්වභාව ඇති, කාය විවේකයෙන් යුත් ධ්‍යාන කරණ භික්ෂුහට සමාන නොකළ හැක්කේය.

(උරග වර්ගය නිමි.)

---

## 2. චූල (සුළු) වර්ගය.

13. **රතන සූත්‍රය:-** (මෙය ඛුද්දක නිකායේ ඛුද්දක පාඨයන්හි 6 සූත්‍රය මෙනි.)

14. **ආමගන්ධ සූත්‍රය:-** 1. "බඩහමු, රත්තණ, හීංමුං කොළ වර්ග, අල මුල්, ගස් වැල්වල ගෙඩි, දැහැමින් ලද දෙය යන මෙතෙක් දේ ශාන්තවූ ආර්යයෝ වළඳන්නාහ. කැමති දේ ප්‍රාර්ථනා කරන්නෝ බොරු නොකියත්.

2. "යහපත්කොට කරණ ලද්දාවූ මනාකොට නිම කරණ ලද්දාවූ, අනුන් විසින් දෙන ලද්දාවූ, ආදරයෙන් එළවන ලද්දාවූ, ප්‍රණීතවූ යම්කිසි මසක් ඇද්ද, එය අනුභව කරන්නාවූ එසේම ඇල් සාලේ බත අනුභව කරන්නාවූ කාශ්‍යප ගොත්‍ර ඇති සර්වඥය. නුඹවහන්සේ මත්ස්‍ය මාංශය යයි සලකන ආමගන්ධය (කුණප ගන්ධ) අනුභව කරණ සේක්ද?"

3. "බ්‍රහ්ම බන්ධු නම් ගෞතමයන් වහන්ස, මොනවට ඉදිකරණ ලද්දාවූ පක්ෂි මාංශයෙන් යුක්තවූ ඇල්සාලේ බත වළඳන්නාවූ නුඹවහන්සේ ආම ගන්ධය මට නොකැපයයි මෙසේ කියන්නාහුය. භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ආම ගන්ධය කෙසේවූ විශෙෂයක් ඇත්තේදැයි" විචාළේය.

4. "ප්‍රාණඝාතයද තැලීම, කැපීම, බැඳීම යන මෙයද, සොරකමද, බොරු කීමද, ආශා කිරීමද, රැවටීමද, අභිවෘද්ධියක් නැති අවැඩට හෙතු පොත් කියවීමද, අනුන් අයත් අඹුවන් කරා යාමද, යන මේ ආම ගන්ධ නම්වේ. ත්‍රිකොටික පරිශුද්ධ මාංශය හා භොජනය ආමගන්ධ නොවේ.

**5.** මේ ලෝකයෙහි යම්කිසි පෘථග්ජන කෙනෙක් කාමයන්හි සංවර නැත්තෝද, රසයන්හි ගිජුවූවාහුද, අපවිත්‍ර භාවයෙන් මිශ්‍රද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුද, විෂමයෝද, කරුණු කියාවත් නොදැක්විය හැක්කාහුද, මේ තෙම ආමගන්ධ නම් වේ. මත්ස්‍ය මාංශ කෑම ආමගන්ධ නම් නොවේ.

**6.** "යම් පෘථග්ජන කෙනෙක් රජවූවෝද, කුලැටියෝද, පිට මස් කන්නවුන් වැන්නෝද, මිත්‍ර ද්‍රොහියෝද, කරුණා නැත්තෝද, අධික මාන ඇත්තෝද, නොදෙන සුල්ලෝද, කිසිවෙක් හට ඉල්වන ලදුවත් නොදේද, මේ ආමගන්ධ නම් වේ. මස් මාංශ කෑම ආමගන්ධ නම් නොවේ.

**7.** "ක්‍රොධයද, ජාතිමදාදි මදයද, දැඩිකමද, පසමිතුරුව සිටීමද, මායාවද, ඊර්ෂ්‍යාවද, තමා උසස් කරණ කථා ඇතිබවද, මානය හා අතිමානයද, අසත් පුරුෂයන් හා මිත්‍රත්වයද, යන මෙය ආමගන්ධ නම්වේ. මත්ස්‍ය මාංශ කෑම ආමගන්ධ නම් නොවන්නේය.

**8.** "මේ ලොකයෙහි යම් පෘථග්ජන කෙනෙක් ලාමක ආචාර ඇත්තෝද, ණය ගෙන නොදෙන්නෝද, කේළාම් කියන්නෝද, අල්ලස් ගෙන නඩු අනඩු කරන්නෝද, අධර්මය කරමින් ධර්මයෙහි හැසිරෙන්නේයයි අඟවන්නෝද, මේ ලොකයෙහි යම් අධම ලාමක සත්ව කෙනෙක් පව් කෙරෙත්ද, මෙතෙම ආමගන්ධය වේ. මත්ස්‍ය මාංශ කෑම ආමගන්ධ නොවන්නේය.

**9.** "මේ ලොකයෙහි යම් ජනකෙනෙක් සතුන් කෙරෙහි අසංයත වූවාහුද, අනුන්ගේ ධනය හෝ ජීවිත ගෙන වෙහෙස කිරීමට උත්සාහ කෙරෙත්ද, අන් සතුන්ගෙන වෙහෙස කිරීමට උත්සාහ කෙරේද, දුරාචාර හා රෞද්‍ර ක්‍රියා ඇත්තාහුද, රළු තෙපුල් ඇත්තාහුද, ආදරයක් නැත්තාහුද මේතෙමේ ආමගන්ධ හෙවත් කුණප ගන්ධ නම්වේ. මාංශ කෑම ආමගන්ධ නම් නොවන්නේය.

**10.** "මේ ප්‍රාණීන් කෙරෙහි තෘෂ්ණාවෙන් ගිජු වෙත්ද, ද්වෙෂයෙන් විරුද්ධයෝ වෙත්ද, නුවණින් සැලකීමක් නැතුව යෙදුනාහුද, ඒ සත්වයෝ මේ ලොවින් පරලොවට ගොස් අඳුරට

පැමිණෙත්. යට හිස් ඇතිව අවීචි ආදී නිරයට වැටීම් වශයෙන් පැමිණෙත්. මේතෙමේ ආමගන්ධ නම්වේ. මත්ස්‍ය මාංශ කෑම ආමගන්ධ නොවන්නේය.

11. "දුරුනොවූ සැකය ඇති සත්වයා මත්ස්‍ය මාංශයන්ගේ නොකෑම හෝ නොකෙරෙයි. වස්ත්‍ර නොහැඳ කරණ තපසද ශුද්ධ නොකරන්නේය. මුඩු කළ පමණින්ම කරණ තපස්ද දළ මඬුළු හා දූවිලි දැලි දරා කරණ තපස්ද, කුර සහිත අඳුම් දිවිසම් දරා කරණ තපස්ද, ශුද්ධ නොකරයි. ගිනි පිදීම් වශයෙන් සෙවනය කිරීමද, ශුද්ධ නොකරයි. නැවත මේ ලොකයෙහි දිව්‍ය භාවය පතා කරන්නාවූ බොහෝවූ ශරීර තාපයෙන් කරණ තපස්ද ත්‍රි වෙදයද, ගින්නෙහි හොම කිරීමද, අශ්වමෙධාදි යාගද, ඍතු සේවනයද යන මෙකී කරුණු ශුද්ධ නොකෙරෙත්. ඉන්ද්‍රිය සය වසන ලද්දේ, ඉන්ද්‍රිය සය දන්නා ලද්දේ වෙත්ද, ධර්මයෙහි පිහිටියේද, ඍජු බැව්හි හා මොළොක් බැව්හි ඇලුනේවේද, රාග ද්වෙෂ සංවෙගයන් ඉක්ම ගියාවූ සියලු ශොක දුක් ප්‍රහාණය කළාවූ නුවණැති පුද්ගලතෙම දැකි ඇසූ ධර්මයන් කෙරෙහි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොඇලේයයි" වදාළසේක.

12. "උක්ත ප්‍රකාරවූ මේ අර්ථය කාශ්‍යප බුදුරජාණන් වහන්සේ නැවත නැවත විස්තර කොට වදාළසේක. ආමගන්ධ නම් කෙලෙස් නැත්තාවූ තෘෂ්ණා දෘෂ්ටීන් නික්මුණාවූ බාහ්‍ය දෘෂ්ටි වශයෙන් මේ ශ්‍රෙෂ්ඨයයි කිසිවකු විසින් නො පැමිණ විය හැකිවූ බුද්ධ මුනිතෙම විසිතුරු ගාථාවෙන් ප්‍රකාශ කොට වදාළසේක. ඒ විසිතුරු දෙශනාව වෙදත්‍රයෙහි පරතෙරට පැමිණි හෙයින් මන්තපාරගු නම් වූ ඒ බ්‍රාහ්මණතෙම අවබොධ කෙළේයි.

13. "ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ආමගන්ධ නම් කෙලෙස් නැත්තාවූ සියලු දුක් නසන්නාවූ සුභාෂිය නම්වූ ධර්ම දෙශනාව අසා, යටත්වූ සිත් ඇති ඒ තිස්ස නම් බමුණුතෙම බුදුන්ගේ පා යුවල පසඟ පිහිටුවා වැන්දේය. එම අස්නෙහිම හුන් කසුප් බුදුන්ගෙන් ප්‍රව්‍රජ්‍යාව කැමතිව ආරාධනා කළේයි."

15. **හිරි සූත්‍රයඃ-** 1. ලජ්ජාව ඉක්මවන, පිළිකුල් කරණ මම යහළුවෙක්මි'යි කියන, කරන්ට හැකි වැඩ බාර නොගන්නා

ඔහු මේතෙම මාගේ යයි නොදන්නේය. යමෙක් මිත්‍රයන් කෙරෙහි අනුව නොයන ප්‍රිය කථාව කරයිද පණ්ඩිතයෝ ඔහු නොකරණ, කියන කෙනෙකැයි දනිත්.

**3.** යමෙක් බිඳීම බලාපොරොත්තුවන්නේ සිදුරුම සොයයිද, හෙතෙම මිත්‍රයෙක් නොවේ. යමෙක් සතුරන් විසින් නොබිඳිය හැක්කේද ළයෙහි පුත්‍රයා මෙන් යමෙක් යම් මිත්‍රයෙකු කෙරෙහි නිදාද ඒකාන්තයෙන් හේ මිත්‍රයාවේ.

**4.** "සතුට ඇතිකිරීමට කරුණුවූ, ප්‍රශංසාව ගෙනදෙන, සැපවූ පුරුෂයාට අයත් වීර්යය උසුළන්නේ ඵල විපාකය ඇත්තේ සිත වඩයි.

**5.** "විවේකයේ (රහත්ඵල) සැපයද සිත සංසිඳීමේ රසයද බී ධර්මයෙන්වූ ප්‍රීතියේ රසය බොන්නේ විඩා නැත්තෙක් වන්නේය. පව් නැත්තෙක් වන්නේය."

**16. මහාමංගල සූත්‍රයඃ-** මෙය මෙහි ඛුද්දකනිකායේ ඛුද්දක පාඨයන්හි 5 සූත්‍රය මෙනි.)

**17. සූචිලොම සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයා තීර්ථයෙහි සූචිලොම යක්ෂයාගේ මාලිගයෙහි ගල් අස්නෙහි වාසය කරණ සේක.

**2.** එකල්හි වනාහි ඛර නම් යක්ෂතෙමේද සූචිලෝම යක්ෂ තෙමේද භාග්‍යවතුන් වහන්සේ ළඟින් යත්. ඉක්බිත්තෙන් ඛර යක්ෂතෙමේ ශුචිලෝම යක්ෂයාට මෙය කීය. 'මේ මහණෙකි, කියා ය" "මේ මහණෙක් නොවේ. හිස් මහණෙකි. ඉදින් මෙතෙම මහණෙක්ද, නැතහොත් හිස් මහණෙක්ද, පළමුවෙන් දනිමි" ඉක්බිත්තෙන් ශුචිලොම යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේ කරා ගියේය. ගොස් භාග්‍යවතුන්ට ශරීරය සමීපකෙළේය. භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය පහකෙළේය. ඉක්බිත්තෙන් ශුචිලොම යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ශ්‍රමණය මට බියවන්නෙහිදැයි" ඇසීය. "ඇවැත්නි මම බිය නොවෙමි. එසේ වුවත් තොපගේ ස්පර්ශය පවිටුයයි" වදාළසේක. "ශ්‍රමණය තොපගෙන් ප්‍රශ්න විචාරන්නෙමි ඉදින් මට ප්‍රකාශ

නොකරන්නේ නම් තොපගේ සිත හෝ උමතු කරවන්නෙමි. පපුව හෝ පලන්නෙමි. දෙපය ගෙන ගඟින් එගොඩ විසිකරන්නෙමියි" කීයේය.

3. "ඇවැත්නි, මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත සත්වයා අතරෙහි යමෙක් මාගේ සිත හෝ උමතු කරවන්නේද, පපුව හෝ පලන්නේද, දෙපය හෝ ගෙන ගඟින් එතර දමා ගසන්නේද, එවැන්නකු මම නොදක්නෙමි. එතකුදු වුවත් ඇවැත්නි, ඔබ යමක් කැමැත්තෙහි නම් එය අසවයි" වදාළසේක. ඉක්බිති සුචිලෝම යක්ෂතෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීයේය.

1. "රාගයද, ද්වෙෂයද කුමක් හේතුකොට ඇත්තේද? නොඇලීම හා ඇල්මද ලොමුදැහැගැන්මද කුමකින් හටගත්තේද, ගම්දරුවෝ කපුටෙක් බැඳ (ඉහළ පහළ දමන්නාක්) මෙන් සිතේ පහළවන විතර්කයෝ කොතැනින් හටගෙන ඉහළ පහළ දමත්ද?

2. "රාගයද ද්වෙෂයද මෙතැනින් හටගැනීම ඇත්තේය. නොඇලීමද ඇලීමද ලොමුදැහැගැන්මද මෙතැනින් ඉපදීමට ඇත්තේය. ගම්දරුවෝ කපුටෙකු (බැඳ ඉහළ පහළ දමන්නාක්) මෙන් සිතිවිලි මෙතැනින් පටන්ගෙන ඉහළ පහළ දමත්.

3. "නුගරුකෙහි කඳින් හටගත් අරළු (මුල්) මෙන් ස්නේහයෙන් වන්නෝ තමාගෙන්ම පහළවන්නෝය. කායයන්හි බෙහෙවින් ඇලුණෝ වනයෙහි මාලුවා නම් වැල පැතුරුණා මෙනි.

4. "යමකින් යම් කෙනෙක් ඒ කෙළෙස් සමූහය උපදීයයි දනිද්ද ඔව්හු ඒ හේතුව දුරුකරත් යයි යක්ෂයා අසව. ඔව්හු පෙර එතරනුවූ දුකසේ එතරවිය යුතු මේ කෙලෙස් සැඩපහර තරණයකොට නිවනට එතෙරවෙත්."

18. **ධර්මචර්යා (කපිල) සූත්‍රය**:- 1. "ධර්මයෙහි හැසිරීමද බ්‍රහ්මචර්යාවද යන මෙය රත්නයන්ට ශ්‍රෙෂ්ඨ යයි කීහු ඉදින් ගිහිගෙන් නික්ම අනගාරිය සස්නෙහි පැවිදිවූයේද,

**2.** "හෙතෙම ඉදින් එරුෂවචන කියන්නේ වෙහෙස දීමෙහි ඇලුණේ, විලිබිය නැත්තේවේද, ඔහුගේ ජීවිතය ලාමකය. තමහට කෙලෙස් වඩයි.

**3.** "මුළා ස්වභාවයෙන් වැසුණු කලහයෙහි ඇලුණු, මහණ තෙම බුදුන් විසින් වදාළ ධර්මය කියන ලද්දේද, නොදනී.

**4.** "අවිද්‍යාවෙන් මුල්වූ ඔහු කෙලෙස් නැතිකළ පුද්ගලයන් වෙහෙසන්නේ අපායට යන මාර්ගයවූ කෙලෙසීම නොදනියි.

**5.** "(සතර) අපායට පැමුණුනේ මව් ගැබින් මව් ගැබට අඳුරින් අඳුරට, යන්නෝව මෙබඳු ඒ භික්ෂුව ඒකාන්තයෙන් පරලොවදී දුකට වැටේ.

**6.** "වර්ෂ ගණන් පරණවූ පිරුණාවූ අශුචිවලක් යම්සේද යම්කෙනෙක් පවින් පිරුණේවේද මෙබඳු කෙළෙස් සහිතව පුද්ගලතෙම පිරිසිඳු කිරීම අපහසුය.

**7.** "මහණෙනි, (පඤ්ච) කාමගුණ ඇසුරුකළ ලාමක අදහස් ඇති, වැරදි කල්පනා ඇති වැරදි හැසිරීම් හා ගොදුරු ඇති මෙබඳු යමකු දනිද්ද,

**8.** "සියල්ලෝ සමගිවී ඔහු දුරුකරව්, කසල පුද්ගලයා ඇද දමව්. කසට පිට කරව්.

**9.** "එබැවින් ශ්‍රමණ නොවූ ශ්‍රමණ, ශ්‍රමණයයි යන හැඟීම් ඇත්තාවූ, බොල් පිඹ හරිව්. පවිටු කැමැත්ත හා හැසිරීමද ගොදුරද ඇති පවිටන් පහකොට විනීතව පිරිසිඳු අපිරිසිදු පුද්ගලයන් සමග විසීම කරව්. ඉන්පසු සමගිවූවාහු දක්ෂ වූවාහු දුක් කෙළවර කරන්නාහුය."

**19. බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනේපිඬුමහ සිටානන් විසින් කරවනලද ජේතවන නම් ආරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති දිරූ, වැඩිමහල්වූ, මහළුවූ කල්ගිය, අන්තිම වයසට පැමිණි, කොසොල් රට වැසි බොහෝ මහාසාර බ්‍රාහ්මණයන් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවියයුතුවූ, සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත් පසෙකසිටි ඒ මහාසාර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, දැන් බමුණෝ පැරණි බමුණන්ගේ බ්‍රාහ්මණ ධර්මයන් දක්වත්දැයි" ඇසූහ.

2. "බමුණෙනි, දැන් බමුණෝ පැරණි බමුණන්ගේ බමුණු ධර්ම නොදක්වත්."

"භවත් ගෞතමයන් වහන්ස ඉදින් භවත්ගෞතමයන් වහන්සේට බරක්නොවේ නම් අපට පුරාණ බමුණන්ගේ බ්‍රාහ්මණ ධර්මය කියතොත් යහපති." - "එසේ නම් බ්‍රාහ්මණයෙනි, අසව් මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි" වදාළසේක. "පින්වතුන් වහන්ස, එසේය"යි ඒ මහාසාර බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ.

3. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

1. "සන්සුන් සිත් ඇති තපස් ඇති පූර්වඍෂීහු වූවාහුද? පස්කම් සැප හැර තමාගේ යහපත කළාහුය.

2. "පැරණි බමුණන්ට සිවුපා සත්තු නොවූහ. රන් නොවූහ. ධාන්‍ය නොවූහ. මන්ත්‍ර පිරවීම නම්වූ ධන ධාන්‍ය වූවාහ. මෛත්‍රී නිධාන නම් බ්‍රහ්ම (ශුද්ධ සිත්) නිධානය පාලනය කළාහුය.

3. "ගෙනෙනලද දොරටුවෙහි තබනලද මේ බමුණන් උදෙසා ශ්‍රද්ධාවෙන් කරණලද යමක්වේද, එය මොවුන්ට දියයුතුකොට සිතූහ.

4. "නොයෙක් වර්ණවත් වස්ත්‍රයන්ගෙන් හා ආසනයන්ගෙන්ද, වාසස්ථානවලින්ද ජනපද රටවල වාසය කරන්නාහු සමෘද්ධ වූවාහුද ඔහු බමුණන් වැන්දාහ.

5. "ධර්මයෙන් රැකුණු ඒ බ්‍රාහ්මණයෝ පැරදවිය නොහැක්කාහුද, දඬුවම් නොකළයුත්තාහුද වූහ. කිසිවෙක් ඔවුන් කුළගෙවල දොරින් නොවැළැක්වූවාහුය.

6. "ඔව්හු සතළිස් අට වර්ෂයක් කුමාර බ්‍රහ්මචර්යාවෙහි හැසුරුණාහුය. පැරණි බමුණෝ විද්‍යාවන් හා චරණයන් සොයමින් හැසුරුණාහ.

7. "බමුණෝ අනෙකක් කරා නොගියහ. ඔව්හු භාර්යාවන් මිලදී නොගත්තාහ. ඔවුනොවුන් හා ප්‍රෙමයෙන් සමග වාසයට පැමිණ සංවාසය රුචිකළහ.

8. "ඒ කාලය අත්හැර ඍතු භාවයෙන් වෙන්වූ තැනැත්තිය ලඟට අතරෙහිදී මෛථුන කර්මයට නොගියාහුය.

9. "මෛථුනයෙන් වෙන්වීමද, ශීලයද, ඍජුබවද මෘදුබවද තපස (ඉන්ද්‍රිය සංවරය) අනුකූලබවද අවිහිංසාවද ඉවසීමද වර්ණනා කළාහුය.

10. "තදවීර්ය ඇති යම් බ්‍රහ්මයෙක් බ්‍රහ්ම වැනි බමුණෙක් ඔවුන්ට ශ්‍රෙෂ්ඨවීද හෙතෙමේද සිහිනෙනුදු මෛථුනයට නොගියේය.

11. "ඔහුගේ සිරිත් අනුගමනයකර හික්මෙන්නාවූ මේ ලොකයෙහි ඇතැම් ඥාණවන්තයෝ බ්‍රහ්මචර්යාවද ඉවසීමද වර්ණනා කළාහුය.

12. "සහල්ද, ආසනද, වස්ත්‍රද, ගිතෙල්ද, තලතෙල්ද ඉල්වාගෙන දැහැමින් එක්කොට ඉන් යාගකළාහුය. යාගය පැමිණ සිටි කල්හි ඔව්හු දෙන්නු නොමැරූහ.

13. "මව්පිය සහෝදරයන් හෝ අන්‍ය නෑයන් හෝ යම්සේද, යමක් කෙරෙහි බෙහෙත් උපදිත්ද, ඒ ගවයෝ අපගේ ශ්‍රෙෂ්ඨ මිත්‍රයෝය.

14. "ආහාර දෙන්නෝය. ශක්තිය දෙන්නෝය. ශරීර වර්ණය දෙන්නෝය. සැප දෙන්නෝය. එසේම මේ කාරණය දැනගෙන ඔව්හු ගවයන් නොමරත්.

15. "සියුමැලි මහත් ශරීර ඇති, පැහැ ඇති, කීර්තිමත් බමුණෝ ස්වකීය ධර්මයන්ගෙන් යුක්තව කුදුමහත් කටයුත්තෙහි උනන්දු වූවාහුය. බ්‍රාහ්මණයෝ යම්තාක් ලෝකයෙහි පැවැත්තාහුද, මේ ප්‍රජාව සැප වින්දාහුය.

16. "රජුන්ගේ සම්පත්තියද අලංකෘත ස්ත්‍රීන්ද අණුවෙන් අණුවට දැක ඔවුන්ගේ විපර්යාසය විය.

17. "ආජානෙය අසුන් යොදනලද, මනාකොට කරණ ලද කොටස් වශයෙන් බෙදනලද, චිත්‍ර මසනලද රථද ගෘහවස්තුද වාසස්ථානද

18. "වගමණ්ඩලවලින් වටකළ, උතුම් ස්ත්‍රීසමූහයා ඇති, මහත් මනුෂ්‍ය සම්පත බමුණෝ කැමතිවූහ.

19. "ඔව්හු එහි සිට මන්ත්‍ර ගොතා ඒ ඔක්කාක රජු වෙතට පැමිණ යාගකරව. තොපට බොහෝ වස්තු වන්නේය. යාගකරව, වස්තුව බොහෝ වන්නේය. ධනය බොහෝ වන්නේය.

20. "බමුණන් විසින් දක්වනලද රථයන්ට වෘෂභයෙකු වැනි රජතෙම අසුන් මරණ යාගද, පුරුෂයන් මරණ යාගද සම්මාපාස නම් යාත්‍රා යාගයද වාජපෙය්‍ය නම් තිරිසනුන් මරණ යාගයද නිරග්ගල නම් යාගයද යන මේ යාගයන් කොට බමුණන්ට ධනය දුන්නේය.

21. "ගවයන්ද, අසුන්ද, වස්ත්‍රද ඉතා අලංකාර කළ ස්ත්‍රීන්ද ආජානෙය අසුන් යුත් මනාකොට මසනලද චිත්‍ර ඇති රථද,

22. "කොටස් වශයෙන් බෙදනලද රම්‍ය වාසස්ථානද නොයෙක් නොයෙක් ධාන්‍යයෙන් පුරවා බමුණන්ට දුන්නේය.

23. "ඔව්හුද එහි ධනය ලැබ නිදන්කොට තබන්ට කැමතිවූවාහුය, ආශාවට බැසගත් ඔවුන්ට බොහෝ සෙයින් තෘෂ්ණාව වැඩිවිය. ඔව්හු එහිදී මන්ත්‍ර ගොතා නැවතද ඔක්කාක රජු ලඟට ගියාහුය.

24. "ජලය පෘථුවිය රන්රුවන් ධන ධාන්‍ය යම්සේද ගවයෝ මිනිසුන්ට එසේය. එයම ප්‍රාණීන්ට උපකරණවේ. ඔබගේ බොහෝ වූ වස්තුව යාගකරන්න. ඔබගේ බොහෝ වූ ධනය යාග කරන්න.

25. "බමුණන් විසින් සංඥාකරණ ලද රථයන්ට වෘෂභයෙකු වැනි රජතෙම නොයෙක් ලක්ෂගණන් ගවයන් යාගයෙහි මැරවූයේය.

26. "පාවලින්වත් අංවලින්වත් හෝ කිසිවකිනුත් හිංසා නොකළ, ඇලුම්වත්, කළ ගණන් දොවින එලුවන් වැනි ගවයන් ඒ රජතෙම අංවලින් අල්ලා ආයුධයෙන් මැරුවේය.

27. "ගවයන් කෙරෙහි යම් ආයුධයක් හෙළනලද්දේද, ඉක්බිති (චාතුර්මහාරාජික) දෙවියෝද බ්‍රහ්මයෝද සක්දෙව් රජුද අසුරයෝද රාක්ෂසයෝද අධමයයි කියමින් හැඬූහ.

28. "පෙර ඕනෑකමද බඩගින්නද මහලුවීමද යන රෝගතුනක් ලෝකයෙහි වූවාහුය. සතුන් මැරීම නිසා අනූඅටක් වූහ.

29. "ත්‍රිවිධ දණ්ඩන අතර පුරාණවූ, මේ බැසගැනීම අධර්මයෙකි. යාගකරන්නෝ අනුන්ට ද්වෙෂ නොකරණ ගවයන් මරත්ද, ධර්මයෙන් පිරිහෙත්.

30. "මෙසේ මෙය හීන ක්‍රියාවකි. පුරාණය දන්නවුන් විසින් ගරහන ලද්දේය. යම් තැනක මෙබන්දක් දකීද, ජනයා යාගකරන්නාට ගර්හා කරයි.

31. "මෙසේ (පුරාණ බ්‍රාහ්මණ) ධර්මයනට කල්හි ශුද්‍රයන් හා වෛශ්‍යයෝ භෙදවූහ. ක්ෂත්‍රියයෝද බෙහෙවින් භෙදවූහ. භාර්යාව ස්වාමියාට අවනම්බු කළාහුය.

32. "ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද ගොත්‍රය රකින යම් අන් කෙනෙක්වේද; ජාතිවාදය නිසා නැසී කාමයන්ගේ වසඟයට ගියාහුය."

මෙසේ වදාළ කල්හි ඒ මහාසාර බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන් වහන්සේට (මෙහි සූත්‍ර නිපාතයේ 1 වර්ගයේ 4 සූත්‍රයේ 8 ඡෙදය යෙදිය යුතුයි.)

20. **නාවා සූත්‍රයඃ-** 1. "යම් හෙයකින් පුරුෂයා ධර්මය දන්නේද දෙවියෝ ශක්‍රයාට මෙන් ඔහු පුදත්. හෙතෙම පුදන ලද්දේ, පැහැදුණු සිත් ඇත්තේ බහුශ්‍රැතවූයේ ධර්ම පහළ කරයි.

2. "නුවණැති යමෙක් එය තේරුම් සහිත කොට අසා ධර්මයට හා අනුධර්මයට අනුව පිළිපදින්නේ නොපමාව එබන්දකු ඇසුරු කරයිද හෙතෙම විශෙෂයෙන් දන්නේ අනුන්ට අවබොධ කරන්නේ දක්ෂද වේ.

3. "කුඩාවූ නුවණ නැති අනාගතය සිතන ඊර්ෂ්‍යාකරන බාලයා ආශ්‍රය කරන්නේ මෙලොවම ධර්මය නොවඩා අත්නොහළ සැක ඇත්තේ මරණයට පැමිණෙයි.

4. "යම්සේ මනුෂ්‍යයෙක් බොහෝ ජලය ඇති ලෙලදී යන පැතුරුණු සැඩ පහර ඇති නදියකට බැස යටිගඟට ගෙන යන්නාවූ ගසාගෙන යන්නාවූ හෙතෙම අන්‍යයන් එතෙර කරවන්ට කිම සමර්ථවන්නේද,

5. "එසේම ධර්මය නොවඩා බහුශ්‍රැතයන්ට ඇහුම්කන් නොදී, තෙමේ නොදන්නේ සැක දුරුනොකළේ වේද ඔහු අනුන්ට මෙනෙහි කරවන්ට සමර්ථද,

6. "යම්සේ සවිය ඇති නැවකට නැග ලෑලි වලින් හා හබලින් යුක්තවූයේද හෙතෙම එහි උපාය දනීද, දක්ෂද එහි අනික් බොහෝදෙනාද එගොඩ කරවයි.

7. "එසේම සිවුමග ඥාණයෙන් යුක්ත වඩන ලද සිත් ඇති, බහුශ්‍රැතවූ කම්පානොවන ස්වභාව ඇති හෙතෙම කන් යොමු කිරීමවූ උපනිශ්‍රය සම්පත්තියෙන් යුත් අනුන් අවබොධ කරවීමට දන්නේය.

8. "එහෙයින් ඒකාන්තයෙන් නුවණැති බහුශ්‍රැත සත්පුරුෂයකු භජනය කරව්. හෙතෙම අර්ථය දැන පිළිපදින්නේ දන්නා ලද ලොකොත්තර ධර්මය ඇත්තේ සැප ලබන්නේය."

21. "**කිංසීල සූත්‍රයඃ**- 1. "කවර සීලයකින් යුත් කවර හැසිරීමකින් යුත් කවර වැඩක් කරන මනුෂ්‍යතෙම මනාව ශාසනයෙහි පිහිටියේ සියලු අර්ථයන්ගෙන් උතුම්වූ අර්හත්වයට පැමිණෙන්නේද?

2. "වෘද්ධයන් පුදන්නේ ඊර්ෂ්‍යා නොකරන්නේ වන්නේය. ගුරුන් දැකීමට කල් දන්නේය. (සමථ විදර්ශනා යුක්ත) කියන ලද ධර්ම කථාවට කාලය දන්නේය. යහපත් වචනයන් සකස්කොට අසන්නේය.

3. "තද බව දුරුකොට යටත් පහත් පැවතුම් ඇතිව ගුරුවරුන් සමීපයට සුදුසු කාලයෙහි යන්නේය. කියනලද කරුණද, පාලි ධර්මයද සීලයද මහණදමද (සෙසු සසුන් පිළිවෙත්ද) සිහිකරන්නේය. හැසිරෙන්නේය.

4. (සමථ විදර්ශනා) ධර්මයෙහි ඇලෙන්නේය, එහි යෙදෙන්නේය. ධර්මයෙහි සිටින්නේය. ධර්මයෙහි තීරණය

දන්නේය. ධර්මය දූෂණය වන කථා නොකරන්නේය. සත්‍යවූ සුභාෂිතයන්ගෙන් කල් යවන්නේය.

5. "මදසිනාව, නිරර්ථක කථාකීම, වැලපීම, කිපීම, වඤ්චාව, නැතිගුණ ඇඟවීම, ගිජුකම, මානය, එකට එක කිරීම, ඵරුෂවචන රාගාදී කසට, අධික තෘෂ්ණාව අත්හැර පහවූ මත්වීම ඇතිව සන්සුන් සිත් ඇතිව හැසිරෙන්නේය.

6. "සුභාෂිතයෝ දන්නා ලද සාරය ඇත්තෝය ශ්‍රැතයද දන්නා ලද සමාධිය සාරයකොට ඇත්තේය. යම් මිනිසෙක් සාහසික වේද ප්‍රමාද වේද ඔහුට නුවණද ශ්‍රැතය (ඉගැනීම) ද නොවැඩේ.

7. "යම් කෙනෙක් ආර්යයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද ධර්මයෙහි ඇලුනේද ඔව්හු කයින් වචනින් මනසින් ශ්‍රෙෂ්ඨය. ඔව්හු නිවන්හි ඇලුණාහු සමාධියෙහි පිහිටියාහු ශ්‍රැතයේද නුවණේද සාරයට පැමිණියාහුය."

22. **උට්ඨාන සූත්‍රය**:- 1. නැගිටිව්, හිඳගනිව්, තොපට නිදීමෙන් කවර ප්‍රයොජනයක්ද හුලින් විදින ලදුව දුකින් පෙලෙන ලෙඩුන්ට කවර නිදීමක්ද

2. "නැගිටිව්, හිඳගනිව්, නිර්වාණය පිණිස දැඩිව හික්මෙව්. මාරයා තොප පමායයි දැන වසඟයට ගියවුන් මුළා කළේය.

3. "යම් තෘෂ්ණාවකින් එය පතන දෙවියෝද මනුෂ්‍යයෝද ඇලී සිටිත්ද, ඒ තෘෂ්ණාව ඉක්මවව්. තොප විසින් මොහොත පැහැර නොහැරිය යුතුය. ක්ෂණය ඉක්මවූවාහු නිරයට ගොස් ශොක කරත්.

4. "සිහිය නැතිකම කිලුටකි. සිහිය නැතිකම නැවත නැවත උපන්නේ කිලුටකි. සිහියෙන් වෙන් නොවීම නම්වූ අප්‍රමාදයෙන්ද (කෙලෙස් නසන දැනීම නම්වූ) විද්‍යාවෙන්ද තමාගේ රාගාදී උල්පස උදුරන්නේය."

23. "**රාහුල සූත්‍රය**:- 1. "රාහුලය, කිමෙක්ද නිතර ආශ්‍රයෙන් පණ්ඩිතයා අවමන් නොකරන්නෙහිද? මිනිසුන්ට පහන දරන්නා (ශාරීපුත්‍රයන්) කිමෙක්ද තා විසින් පුදන ලද්දේද,

2. "මම නිතර ආශ්‍රයෙන් පණ්ඩිතයාට අවමන් නොකරමි. මනුෂ්‍යයන්ට එළිය දරන්නා මා විසින් නිතර පුදන ලදී.

3. "ප්‍රිය ස්වරූප ඇති, සිත් ඇලෙන පස්කම් සැප අත්හැර, ශ්‍රද්ධාවෙන්ගෙන් නික්ම දුක් කෙළවර කරන්නෙක්වෙව.

4. "කල්‍යාණ මිත්‍රයන්ද විවේකවූ ශබ්ද නැති දුර පිහිටි සෙනසුන්ද භජනය කරව. අහරෙහි පමණ දන්නෙක් වෙව.

5. "චීවර පිණ්ඩපාතයෙහිද ප්‍රත්‍යයෙහිද සෙනසුන්හිද යන මොවුන් කෙරෙහි තෘෂ්ණාව නොකරව. මෙලොවට නැවත නොඑව.

6. "ප්‍රාතිමොක්ෂයෙහිද සංවර වෙව. පඤ්චෙන්ද්‍රියයන්හිද සංවර වෙව. කායගතාසතියෙහිද (කය ගැන සිහියෙහි) සිහි ඇතිවෙත්වා. සසර කලකිරීම බහුලවූවෙක් වෙව.

7. "රාගය හා යුක්තවූ ශුභවූ අරමුණ දුරුකරව. එකඟවූ සමාධියට ගිය සිත අශුභයෙන් වඩව.

8. "(රාගාදී) නිමිති නොගැනීමද වඩව. මානය හා අනුශය ධර්ම දුරුකරව. ඊටපසු (ආර්ය මාර්ගයෙන්) මානය නැතිකිරීමෙන් සිත ශාන්තව හැසිරෙන්න. භාග්‍යවතුන් වහන්සේ මෙසේ ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ට මේ ගාථාවන්ගෙන් නිතර අවවාද කරයි."

**24. වංගීස සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලව්රට අග්ගාලාව චෛත්‍යයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි තනිව සිටි විවෙකයෙහි සිටි ආයුෂ්මත් වංගීස ස්ථවිරයන් වහන්සේට මගේ උපාධ්‍යායයන් වහන්සේ පිරිනිවියේද නැත්නම් නුවූයේ දැයි මෙසේ සිතට සිතිවිල්ලක් පහළවිය. ඉක්බිති ආයුෂ්මත් වංගීස ස්ථවිරයන්ගේ සවස් කාලයෙහි ඵලසමවතින් නැගී සිටිසේක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් වංගීස ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි මෙහි තනිව සිටි විවෙකයෙහි සිටි මට

මාගේ උපාධ්‍යාය තෙමේ පිරිනිවියේද නොවූයේදැයි මෙසේ සිතට සිතිවිල්ලක් පහළවූයේයයි මෙය කීයේය. ඉක්බිති ආයුෂ්මත් වංගීස ස්ථවිරයන් වහන්සේ අස්නෙන් නැගිට සිවුර එකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි ඇඳිලිබැඳ භාග්‍යවතුන් වහන්සේට ගාථාවන් කීයේය.

1. "ලාමක නොවූ ප්‍රඥා ඇති, ශාස්තෲන් වහන්සේගෙන් අසමු. මේ ආත්මයෙහිම යමෙක් විචිකිච්ඡාව සිඳින්නේද, ප්‍රසිද්ධවූ යසස ඇති සැඟවුණු, සිත් ඇති භික්ෂු කෙනෙක් අග්ගාලවයෙහි කළුරිය කළහ.

2. "භාග්‍යවතුන් වහන්ස, ඒ බ්‍රාහ්මණයාට නිග්‍රොධ කප්පයන නම ඔබවහන්සේ විසින් තබනලදී. හෙතෙම නිර්වාණය පතන්නේ පටන්ගන්නාලද වීර්ය ඇත්තේ, මිදීම පතන්නේ ඔබවහන්සේ වඳිමින් හැසුරුණේය.

3. "ශාක්‍ය කුල උපන් සර්වඥයන් වහන්ස, ඒ ශ්‍රාවකයා අපි හැමෝම දැනගන්ට කැමැත්තෙමු. ශ්‍රවණය පිණිස අපගේ කන්යොමුකොට සිටියාහ. ඔබවහන්සේ අපගේ ශාස්තෲන් වහන්සේය. ඔබවහන්සේ උතුම්වෙහිය.

4. "අපගේ සැකය සිඳින්න, මට මෙය වදාරන්න, මහා ප්‍රාඥයන් වහන්ස, පිරිනිවියහු වදාරන්න. හාත්පස පෙනෙන ඇස් ඇත්තාණෙනි, දහසක් ඇස් ඇති ශක්‍ර දෙවෙන්ද්‍රයා මෙන් මට මැදෙහි හෝ වදාරන්න.

5. "මෙලොව (අභිධ්‍යාදී) යම්කිසි ගැට කෙනෙක් ඇද්ද, ඔවුහු මොහයට මාර්ගයෝය, නොදැනීම් පක්ෂයෙහිය. සැකයට හෙතුය, ඔව්හු තථාගතයන් වහන්සේ වෙත පැමිණ නොවෙත්. මේ ඇස මනුෂ්‍යයන්ට ශ්‍රෙෂ්ඨය.

6. "පුරිසතෙමේ කිසිකලෙක වාතය වළාකුල් රාශිය නසන සේ කෙලෙසුන් නොනසාද මුළුලෝකය අඳුරින් වෙළන ලද්දේවේද (ප්‍රඥානැමැති) ආලෝකයෙන් යුත් (සැරියුත් ආදී) මනුෂ්‍යයෝ නොබබළත්.

7. "පණ්ඩිත පුරුෂයෝ නුවණ කරන්නෝ වෙත් වීරයන් වහන්ස, මම ඒ ඒ දෙය එසේම සිතමි. විශෙෂයෙන් දක්නාවූ

දන්නා බුදුන් වෙතට (දැනගැනීමට) පැමිණියෙමි. නිග්‍රොධකප්පයන් පිරිස මැද අපට ප්‍රකාශ කරනු මැනවි.

8. "යහපත් ලෙස කථා කරන වචනය වහා කියන්නේ හංසයා මෙන් තදින්ගෙන සෙමෙන් අඬව. ඉතා අලංකාරවූ බින්දු ස්වරයෙන් ඍජුව ගිය ඒ අපි සියල්ලෝ අසමු.

9. "ඉතිරි නොකොට ජාති මරණ ඉක්මවූ නසනලද සියලු පව් ඇති ධර්මය ඉල්ලා කියන්නෙමි. පෘථග්ජනයන්ට කැමති දේ කිරීමක් නොවේ. තථාගතයන් වහන්සේලා විමසා කරන්නෙකි.

10. "ඔබවහන්සේගේ ඍජු නුවණින් ප්‍රකාශ කරණලද කීම වෙනස් නුවූ බව දක්නාලදී. මේ අන්තිම දොහොත් බැඳීමයි. මනාව වඳනා ලද්දේය. දන්නා අලාමක ප්‍රඥා ඇති සර්වඥයන් වහන්ස, මුළා නොකළ මැනවි.

11. "දන්නාවූ අලාමක වීර්ය ඇති භාග්‍යවතුන් වහන්ස, යහපත් අයහපත් උතුම් ධර්මය දැන මුළා නොකරණු මැනව. ග්‍රීෂ්මකාලයෙහි ග්‍රීෂ්මයෙන් රත්වූ ජලය මෙන් වචනය කැමැත්තේමි ශ්‍රැතය වසනු මැනවි.

12. "යමක් බලාපොරොත්තුවෙන් කල්පයක් බ්‍රහ්ම චර්යාවෙහි හැසුරුනේද, කිමෙක්ද ඔහුට එය හිස් නොවූවක් වන්නේද, නැතහොත්, හෙතෙම යම්සේ මිදුණේවේද ශරීරය ශෙෂ වූයේ නිවුණේවේ.

13. "මේ නාමරූපයන්හි බොහෝ කාලයක් නිදා සිටි වාරයාගේ ශ්‍රොතසවූ තණ්හාව සින්දේය. ජාතිජරාමරණ ඉතුරු නොකර තරණය කෙළේය. පස්වග මහණුන්ට ශ්‍රෙෂ්ඨවූ භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

14. "ඍෂීන්ට සත්වෙනි භාග්‍යවතුන් වහන්ස, නුඹ වහන්සේගේ මේ වචන අසා ඒ මම පහදිමි. මා විසින් විචාරණ ලද්ද නොසිස්ය. බ්‍රාහ්මණ තෙමේ මා වංචා නොකෙළෙහිය.

15. "බුදුන්ගේ ශ්‍රාවකතෙමේ කියන්නා වෙන් කරන්නේද වේ. මායා ඇත්තාවූ මරුගේ දැඩිවූ තෘෂ්ණා දැල සින්දේය.

**16.** "සමර්ථවූ භාග්‍යවතුන් වහන්සේ සංසාරයට කාරණය දැක්කේය. ඒකාන්තයෙන් සුදුසු මං ඇති භාග්‍යවතුන් වහන්සේ දුකසේ එතරවිය යුතුවූ මාර භූමිය ඉක්මවා සිටියේය."

**25.** "**සම්මාපරිබ්බාජනීය සූත්‍රයඃ-** 1. "සතර ඕඝය තරණය කළාවූ නිවණට පැමිණි සොපාදිසෙස නිවණින් පිරිනිවී නොසැලෙන සිත් ඇති බොහෝ ප්‍රඥා ඇති මුනීන්ද්‍රයන් වහන්සේ විචාරමි. ගෙන් නික්ම කාමයන් දුරුකොට ඒ මහණතෙම කෙසේ ලොකයෙහි වාසය කරන්නේද?"

**2.** "යමෙකු විසින් දිට්ඨ මංගලාදිය නසන ලද්දාහද? උල්කාපාත ස්වප්න, ලකුණුද මංගල සහිතවූ දොෂද, ප්‍රහීන කළ මහණතෙම ලොකයෙහි මනාකොට පිරිනිවෙන්නේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**3.** "මහණතෙම මනුෂ්‍යයන් අතරෙහිද දෙවියන් අතරෙහිද වූ කාමයන්හි ඇල්ම අත්හරින්නේය. භවය ඉක්මවා ධර්මය දැන ඒ (ක්ෂීණාශ්‍රව) තෙම ලොකයෙහි පිරිනිවෙන්නේය.

**4.** "මහණතෙම කේලාම්ද ද්වෙෂයද අත්හැර මසුරුකම්ද දුරුකරන්නේය. රාග ද්වෙෂයන් ගෙවූ හෙතෙම ලොකයෙහි මනාකොට ලොව පිරිනිවෙන්නේය."

**5.** "ප්‍රිය බව අප්‍රිය බව අත්හැර කොහිවත් නොබැඳී ඇසුරු නොකොට බැඳුම් වලින් මිදී සිටි හෙතෙම ලොව මනාකොට පිරිනිවෙන්නේය.

**6.** "හෙතෙම උපාධීන්හි සාරයට නොපැමිණේ. දැඩි ගැනීම්වල තද ඇල්ම දුරලන්නේය. හෙතෙම කිසිවක් ඇසුරු නොකෙළේ අනෙකකු විසින් නොහික්ම විය යුත්තේ මනාව ලොව පිරිනිවෙන්නේය.

**7.** "වචනයෙන්ද සිතින්ද ක්‍රියාවෙන්ද විරුද්ධ නොවූයේ ධර්මය මනාකොට දැන නිර්වාණ පදය මනාකොට පතන්නාවූ හෙතෙම ලොව මනාකොට පිරිනිවෙන්නේය.

**8.** "යමෙක් මම වඳීයයි මානාධික නොවේද, ආක්‍රොශ කෙළේද, මහණතෙම වෛර නොබඳින්නේය. අන්‍යයාගේ

ආහාර ලැබ මඳයට පත් නොවන්නේය. හෙතෙම ලොව මනාකොට පිරිනිවෙන්නේය.

9. "ලොභයද භවයද හැර සිඳීමෙන් හා බැඳීමෙන් වෙන්වූ මහණතෙම අත්හළ සැක ඇත්තේ, පහවූ උල් ඇති හෙතෙම ලොකයෙහි යහපත්ව පිරිනිවෙන්නේය.

10. "මහණතෙම තමහට කැප දෙය දැන ලොකයෙහි කිසිවෙකුට බිය නොවන්නේය. ධර්මය තත්වූ පරිද්දෙන් දැන හෙතෙම ලොකයෙහි පිරිනිවෙන්නේය.

11. "යමකුට (අර්හත් මාර්ගයෙන් නැසූහෙයින්) කිසි අනුශය ධර්මයක් නැද්ද, අකුශල් මුල් ඉගිළුවාහුද ආශයද නැති බැවින් තෘෂ්ණා නැත්තේද, ඒ ක්ෂීණාශ්‍රවතෙම ලොව යහපත්ව පිරිනිවෙන්නේය.

12. "ආශ්‍රවයන් ක්ෂය කළේ මානය ප්‍රහීන කළේ සියලු රාග මාර්ගය ඉක්මවා ගියේ හික්මුණේ පිරිනිවියේ ස්ථිරවූ ආත්මය ඇත්තේ හෙතෙම ලොකයෙහි යහපත්ව පිරිනිවෙන්නේය.

13. "ශ්‍රද්ධාවත්වූයේ ශ්‍රැතවත්වූයේ මාර්ගය දක්නේද (දෘෂ්ටියෙන්) වර්ගවූවන් කෙරෙහි කැඩී නොයන්නේ ප්‍රඥාවත් වූයේ ලොභය ද්වෙෂය ක්‍රොධය දුරුකොට හෙතෙම ලොකයෙහි මනාව පිරිනිවෙන්නේය.

14. "අරහත් මාර්ග පිරිසුදු දිනන්නාවූ උපුටා දැමූ කෙළෙස් වහල ඇති ධර්මයන්හි වසීවූ පරතෙරට ගිය, පහවූ තෘෂ්ණා ඇති, (ආර්ය මාර්ගය) ප්‍රඥාවෙහි දක්ෂවූ හෙතෙම ලොව මනාකොට පිරිනිවෙන්නේය.

15. "අතීතයෙහිද අනාගතයෙහිද මමය, මගේයයි සිතීම ඉක්මවා ඉතා පිරිසිදුවූ නුවණ ඇත්තේ සියලු ආයතනයන්ගෙන් මිදුණේ හෙතෙම ලොව මනාව පිරිනිවෙන්නේය.

16. "(ආර්යසත්‍ය) පදය දැන, ධර්මය අවබොධ කොට දැක කෙලෙස් නැති කිරීමෙන්වූ නිවන දැක, සියලු උපධීන් සම්පූර්ණයෙන් ගෙවන්නේ හෙතෙම මනාකොට ලොකයෙහි පිරිනිවෙන්නේය.

17. "භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් යමක් වදාරණ ලද්දේද එය එසේමය. මෙබඳු විහරණ ඇති යම් භික්මුණු භික්ෂුවක් වේද සියලු සංයොජනයන්ද ඉක්මවූ ඒ (ක්ෂීණාශ්‍රව මහණ) තෙම ලොකයෙහි මනාකොට පිරිනිවෙන්නේය."

25. **ධම්මික සූත්‍රයː-** 1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති ධම්මික උපාසක තෙම උපාසකයන් පන්සියයක් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ධම්මික උපාසක තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ කීයේය.

2. "මහත් ප්‍රඥා ඇති භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගෙන් විචාරමි. යමෙක් ගිහිගෙන් නික්ම ශාසනයට එයිද ගිහිගෙයි හෝ උපාසකයෝ වෙත්ද, ඒ කෙසේ පිළිපදින ශ්‍රාවක තෙමේ යහපත් වේද?

3. "ඔබ වහන්සේ වනාහි දෙවියන් සහිත ලොකයාගේ උපතද පරලොව උපතද දන්නෙහිය. සියුම් අර්ථ දන්නා ඔබ හා සමාන කෙනෙක් නැත. ඔබ වහන්සේ ශ්‍රේෂ්ඨ බුදුන්යයි කියනු ලැබේ.

4. "ඔබ වහන්සේ දත යුත්තද ධර්මයද ඉතිරි නොකොට දැන සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් ප්‍රකාශ කෙළේය. හාත්පස දක්නා නුවණ ඇති පහකළ කෙළෙස් සෙවෙනි ඇත්තෙත් වෙහිය. සියලු ලොකයෙහි නිර්මලව බබළයි.

5. "ජිනයයි අසා ඓරාවණ නම් ඇත් රජතෙම ඔබ වහන්සේගේ සමීපයට ආයේය. හෙතෙමේද ඔබ සමග කථා කොට යහපතැයි සතුටු සිතින් ගියේය.

6. "කුවෙර නම්වූ වෛශ්‍රවණ රජතෙමේ ධර්මය අසන්ට ඔබ කරා පැමිණෙයි. වීරයන් වහන්ස, ඔහුටද අසන ලද්දේ වදාරන්න, හෙතෙමේද අසා සතුටු සිත් ඇත්තේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "වාද කරුණු කැමති යම් මේ තීර්ථක කෙනෙක් ඇද්ද ඒ ආජීවකයන් හෝ නිඝණ්ඨයන් හෝ යන සියල්ලෝ සිටි තැනැත්තේ ශීඝ්‍රව යන්නකු මෙන් ප්‍රඥාවෙන් ඔබ නො ඉක්මවත්.

8. "වාද කරුණු කැමැති යම් මේ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද කිසියම් මහලු බමුණු කෙනෙක් ඇද්ද, යම් කෙනෙක් වාදීයයි හඟිත්ද ඒ සියල්ලෝ ඔබවහන්සේ කෙරෙහි අර්ථයෙන් බැඳුනාහුවෙත්.

9. "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ විසින් යම් මේ ධර්මයක් මනාකොට ප්‍රකාශ කරණ ලදද මේ (සත්තිස් බොධිපාක්ෂික) ධර්මය සියුම්ය. සුව එලවන්නේය. යහපත් කොට වදාරණ ලදී. එයම සියල්ලෝ අසනු කැමැති වෙති. බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, විචාරණ ලද අපට එය ප්‍රකාශ කරනු මැනවි.

10. "මේ වැඩහුන් සියලු භික්ෂුහුද එසේම අසන්ට පැමිණි උපාසකයෝද නිර්මල බුදුන් විසින් අවබොධ කරණ ලද ධර්මය ශක්‍රයාගේ සුභාෂිතය දෙවියන් මෙන් අසත්වා."

11. "මහණෙනි, අසව්. මා විසින් ධර්මයද කෙලෙස් කම්පා කරණ ක්‍රමයද අස්වමි. සියල්ලෝ දරත්වා, යහපත දක්නා සුළු ප්‍රඥා ඇත්තා ප්‍රව්‍රජිතයන්ට සුදුසු ඉරියව්ව පුරුදු කරව්.

12. "ඒකාන්තයෙන් මහණතෙම නොකල්හි ගමෙහි නොහැසිරෙන්නේය. සුදුසු කල්හි පිඬු පිණිස හැසිරෙන්නේය. නොකල්හි හැසිරෙන්නා කරා ඇලීම් බැඳෙත්. එහෙයින් බුදුවරු නොකල්හි නොහැසිරෙත්.

13. "රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මේවා සත්වයා මදයට පමුණුවත්ද, මේ ස්වභාවයන් කෙරෙහි කැමැත්ත දුරුකර සුදුසු කල්හි උදය ආහාරයට පිවිසෙන්නේය.

14. "මහණතෙම සුදුසු කාලයෙහි ආහාරය ලබන්නේය. හුදකලාව පහව තනිව මැඩ හිඳින්නේය. එකඟ කළ සිත් ඇත්තේ අධ්‍යාත්මය ගැන සිතමින් පිටත රූපාදියෙහි සිත පිටත් නොකරන්නේය.

15. "ඉදින් හෙතෙම ශ්‍රාවකයෙකු හා හෝ අන්කිසි භික්ෂුවක් සමග හෝ කථා කරන්නේ නම් ඔහුට ප්‍රණීත ධර්මය ප්‍රකාශ කරන්නේය. කේලාම් හෝ අනුන්ට දොස් කීම හෝ නොකරන්නේය.

16. "එකෙක් බහින් බහට එක් නුවණ අඩු ඔවුන් හොඳයයි නොකියමි. ඒ ඇලීම් එයින් පහළ වෙත්. ඒ එසේමයි ඒ සිත ඈතට යවත්.

17. "පිණ්ඩපාතයද, ආවාසයද, සෙනාසනද සඟල සිවුරෙහි රජස් පහකරණ ජලයද බුදුන් විසින් වදාළ ධර්මය අසා ශ්‍රේෂ්ඨ නුවණ ඇති ශ්‍රාවකයා ප්‍රත්‍යවෙක්ෂා කොට සෙවනය කරන්නේය.

18. "එහෙයින් භික්ෂුව පිණ්ඩපාතයෙහිද සෙනාසනයෙහිද, සඟල සිවුරෙහි රජස් දුරුකරණ ජලයෙහිද (සිවු පසයෙහි) නෙළුම් පතෙහි දිය බින්දු මෙන් නොඇලුණේවේ.

19. "තොපට ගිහින් ගේ පැවැත්ම කියමි. යම් පරිද්දකින් කරන ශ්‍රාවකයා යහපත් වේද හෙතෙම අයත් ධ්‍යානාදියෙන් යුක්තව යම් මේ තනි භික්ෂු ධර්මය අවබොධ කරන්නට නොලබන්නේය.

20. "ලොව ස්ථාවරවූද, ගමන් කරන්නාවූද සත්වයන් කෙරෙහි දඬු බහා තබා, සතුන් නොමරන්නේය. නොමරවන්නේය. නසන්නවුන්ට අනුනොදන්නේය.

21. "ආර්යශ්‍රාවකතෙමේ දැන දැන ගමෙහි හෝ අරණ්‍යයෙහිවූ ස්වල්පවූ හෝ කොපමණවූ හෝ නුදුන් දෙය කල්පනා කරමින් දුරු කරන්නේය, නොගන්වන්නේය, ගන්නකුට නොඅනු දන්නේය.

22. "ඥාණවන්ත තෙම දැල්වෙන අඟුරුවලක් මෙන් සිතා කාම සෙවනය දුරුකරන්නේය. බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නට නොහැකි නම් අනුන්ගේ භාර්යාවන් නොඉක්මවන්නේය.

23. "සභාවට ගියේ හෝ පිරිස මැදකට ගියේ හෝ එකෙකුට හුදකලාව බොරු නොකියන්නේය. නොකියවන්නේය. කීමට අනුබල නොදෙන්නේය. සියලු නොසිදුවූ දෙය දුරුකරන්නේය.

**24.** "යම් ගිහියෙක් මේ ධර්මය රුචි කරන්නේ නම් සිහි මුළාවීමකැයි දැන මද්‍යපානය නොකරන්නේය. නො පොවන්නේය. බොන්නට අනුනොදන්නේය.

**25.** "බාලයෝ මත්වීම් හෙතුවෙන් පව් කරත්. සෙසු ජනයන්ද ප්‍රමාදවූවන් කරත්. උමතු කරන මුළා කරන බාලයන් ඇදගන්නා අකුසල් උපදින තැන අත්හරින්නේය.

**26.** "සතුන් නොමරන්නේය. නුදුන්දේ නොගන්නේය. බොරු නොකියන්නේය. මත්පැන් නොබොන්නේය. අබ්‍රහ්මචර්යාවවූ මෛථුනයෙන් වෙන් වන්නේය. රාත්‍රියෙහි නොකල්හි නොකන්නේය.

**27.** "මල් නොදරන්නේය, සුවඳ ද්‍රව්‍ය නොගන්නේය, බිම අතුරන ලද ඇඳෙහි නිදන්නේය. සසර දුක් කෙළවර කළ බුදුන් විසින් ප්‍රකාශ කරණ ලද මෙය අංග අටින් යුත් උපොෂථයයි කියනු ලැබේ.

**28.** "ඉක්බිති පක්ෂය සම්බන්ධ දහහතර වැනි දිනයෙහිද, පසළොස්වැනි දිනයෙහිද අටවැනි දිනයෙහිද පොහොය දෙපස දෙදිනද පැහැදුණු සිතින් එක් දවසකුදු අත්නොහැර අංග අටකින් යුත් පෙහෙවස වසන්නේය.

**29.** "අනතුරුව උදෑසන වසනලද පෙහෙවස් ඇති ඥාණවන්තතෙම නිතර සතුටු වන්නේ සතුටු සිතින් ආහාර පානයන්ගෙන් සුදුසු පරිද්දෙන් වළඳවන්නේය.

**30.** "හෙතෙම දැහැමින් මවුපියන් පොෂ්‍ය කරන්නේය, ධාර්මික වෙළඳාම් කරන්නේය. අප්‍රමාදව මේ ගිහි වත් පවත් වන්නේ දෙව්ලොව දෙවියන් අතරට පැමිණෙයි."

**(2 වර්ගය නිමි.)**

---

# 3. මහා වර්ගය

**27. පබ්බජ්ජා සූත්‍රයː-** 1. "ඇස ඇති බුදුරජාණන් වහන්සේ යම්සේ පැවිදිවූසේක්ද උන්වහන්සේ යම්සේ කල්පනා කරමින් පැවිද්ද කැමතිවූසේක්ද ඒ පැවිද්ද කියන්නෙමි.

2. "මේ ගිහිගෙයි වාසය කරදරය, කෙලෙසුන් උපදින තැන යයි ද පැවිද්ද අවකාශය මෙන් විවෘත යයි ද මෙසේ දැක පැවිදිවිය.

3. "පැවිදිව කයින් පව්කම් දුරුකළේය. වචනයේ වරද අත්හැර ජීවිකාව පිරිසිදු කළේය.

34. "ගැවසී සිටි උතුම් ලකුණු ඇති බුදුරජතෙම මගධයන්ගේ පිරිව්‍රජ නම් රජගහනුවර පිඬු පිණිස හැසුරුණේය.

5. "ප්‍රාසාදයෙහි සිටි බිම්බිසාර රජතෙම ලකුනින් යුත් බුදුන් දැක මේ කාරණය කිවේය.

6. "භවත්නි, මනා රූ ඇති උස මහත ඇති පිරිසිදු ගමනින් සුන්දර මුන්වහන්සේ බලව්. වියදඬු පමණක් බලයි.

7. "යටට හෙලූ ඇස් ඇති සිහි ඇති මේ තෙමේ නීචකුලයෙන් පැවිදි වූවෙකු මෙන් නොවේ. මහණතෙම කොහියන්නෙහිදැයි" රාජදූතයෝ දුව බලත්වා

8. යවන ලද ඒ රාජදූතයෝ "මහණතෙම කොහි යන්නේද, කොහි වසන්නේදැයි" පිටුපසින් දිව්වාහුය.

9. වසනලද ඉඳුරන්ගේ දොරටු ඇතිව සංවරව ගෙපිළිවෙළින් හැසිරෙමින් යහපත් නුවණැත්තේ සිහි ඇත්තේ වහා පාත්‍රය පිරුණේය.

10. ඒ මුනිතෙම පිඬු සිඟීමෙහි හැසිර නුවරින් නික්ම මෙහි වාසය වන්නේයයි" පාණ්ඩව පර්වතයට නැංගේය.

11. ඉක්බිති නැවතීමට පැමිණියාහු දැක ඉන් පසු දූතයෝ ළංවූහ. එක් දූතයෙක් පැමිණ රජහුට දැන්වූයේය. "මහරජ, මේ භික්ෂුතෙමේ පර්වත ගුහාවෙහි ව්‍යාඝ්‍රයකු මෙන්ද වෘෂභයකු මෙන්ද සිංහයෙකු මෙන්ද පාණ්ඩව පර්වතය ඉදිරියෙහි පර්වත ගුහාවෙහි හුන්නේය."

12. දූතයන්ගේ වචනය අසා රජතෙම යහපත් යානාවකින් පාණ්ඩව පර්වතය යම් තැනෙක්හිද එහි ඉක්මනින් ගියේය.

13. ඒ ක්ෂත්‍රියය තෙමේ යානාවෙන් යා යුතුතාක් ඉන් ගොස් යානාවෙන් බැස පාබල සෙනඟ සමග පයින්ම පැමිණ සමීපයට ගොස් හිඳගත්තේය.

14. "රජතෙම හිඳ සතුටු විය. ඉක්බිති සිහිකටයුතු කථාවද විය. හෙතෙම කථාව අවසන්කොට මේ කාරණය කීයේය.

15. "ඔබ තරුණයෙකි. බාල මුල් වයසෙහි සිටියේය. උත්පත්තිය ක්ෂත්‍රියයෙකු වැනිය. වර්ණයෙන් හා උස මහතින් යුක්තය.

16. "මම වස්තු දෙමි. අංග රක්ෂක භට සමූහයා හොබවමින් හස්ති සමූහයට පෙරටුව යමින් ඒ භොග අනුභව කරනු මැනවි. විචාරණ ලද්දාවූ මට ජාතිය කියව.

17. "කොසොල් රට පුරාණ සිට පැවත එන ධනයෙන් හා වීර්යයෙන් යුත් හිමාල පර්වත පාර්ශ්වයෙහි ඍජු ජනපද ඇති කොසොල් දනව්වෙහි පුරාණ පාලකවූ රජතෙමේ (මාගේ පියාය.)"

18. "රජ්ජුරුවෙනි, ගොත්‍රයෙන් සූර්යය, ජාතියෙන් ශාක්‍යය, ඒ කුලයෙන් පැවිදිවූයෙමි. කාම වස්තු නොපතන්නෙමි.

19. "කාම වස්තුන්හි දොෂය දැක නිර්භය වශයෙන් නිවන් දක්නට වෑයම්කිරීම පිණිස යන්නෙමි. මගේ සිත මෙහි ඇලේයයි" කීයේය.

28. **පධාන සූත්‍රයඃ-** 1. "නෙරඤ්ජරා නදී තීරයෙහි වීර්ය කරන්නාවූ යොගයන්ගෙන් නිර්භය ස්ථානයට පැමිණීමට ඉතා වීර්යයෙන් ධ්‍යාන කරන ඒ මා කරා

2. "මාරතෙම මෛත්‍රී වචනය කියමින් පැමිණියේය. හෙතෙම' ඔබ කෙට්ටුවූයේ වෙහි, දුර්වර්ණවූයෙහිද මරණය ඔබ සමීපයෙහිය.

3. "ඔබගේ මරණයට කොටස් දහසකි. ජීවිතය එක් කොටසකි. පින්වත ජීවත්වන්න මෙසේ ජීවිතය ශ්‍රෙෂ්ඨය. ජීවත් වෙතොත් පිනුත් කළ හැක.

4. "ඉදින් කලින් කළ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නාවූ ගිනිදෙවියාටද පුදන්නාවූ ඔබට බොහෝ පින් රැස්වේ. වීර්යයෙන් කුමක් කරන්නේද?

5. "වීර්ය සඳහා මඟ දුකසේ යායුතුය. දුෂ්කරය, දුකසේ ලැබිය යුතුය." මාරතෙම මෙසේ ගාථා කියමින් බුදුන් සමීපයෙහි සිටියේය.

6. එසේ කියන්නාවූ ඒ මාරයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "ප්‍රමාදවූවන්ට නෑකම් ඇති පවිටු මාරයා යම් කරුණකින් මෙහි ආවෙහිද?

7. "ස්වල්ප මාත්‍රවූද පිනකින් මට ප්‍රයොජනයක් නැත. යම් කෙනෙකුට පිනින් ප්‍රයොජනයක් ඇත්නම් මාරතෙම ඔවුන්ට කියාවා.

8. "මට ශ්‍රද්ධාවක් ඇත. ඊට වඩා වීර්යයක් ඇත. මට ප්‍රඥාවක් ඇත, මෙසේ ජීවිතයෙහි ආසා නැති මෙබඳු මාගෙන් කිමෙක්ද ජීවත්වීමක් ගැන අසන්නෙහිද?

9. "මේ වාතය ගංගාවන්ගේ සැඩපහර පවා වියලන්නේය. මෙසේ කාය ජීවිත දෙකෙහි නිරපෙක්ෂ මගේ ලෙය කුමක් හෙයින් නොවියලන්නේද?

10. "ලෙය වේලෙන කල්හි පිතද සෙමද වේලෙයි, මස ක්ෂයවන කල්හි බොහෝ සෙයින් සිත පහදී. බොහෝ සෙයින් මගේ සිහියද ප්‍රඥාවද සමාධියද සිටියි.

11. "මෙසේ වාසය කරන්නාවූ මට පැමිණි උතුම් වෙදනාව පිරිසිදුකම බලාපොරොත්තු වන සත්වයා සිත ඒකාන්තයෙන් බලාපොරොත්තු නොවේ.

12. "මාරය, ඔබගේ පළමුවෙනි සෙනාව වස්තුකාමයන්හි ක්ලෙශකාමයයි. දෙවැන්න යහපතෙහි නොඇලීමය, තුන්වැන්න බඩගින්න හා පිපාසයය. සතරවැන්න සෙවීම් සංඛ්‍යාත තණ්හාවය.

13. "පස්වැන්න සිත කය දෙකේ නිදිබර ගතිය සවැන්න බියය, සත් වැන්න සැකය, අටවැන්න ගුණමකුකම හා තදගතියයි.

14. "ලාභය, ගුණකීම, සත්කාරය, බොරුවෙන් ලත් යසයද යම් තමා උසස් කිරීමද, අනුන් ගැරහීමද, මෝතොමෝ මාරය, ශ්‍රමණ බ්‍රාහ්මණයන් නසන්නාවූ තොපගේ සෙනාවය. ඒ සේනාව සූරනොවූ තැනැත්තාම නොදිනයි, දිනා සැප ලබයි.

15. "මේ මෘදු තෘෂ්ණා පරිහරණය කරණ මගේ ජීවිතයට නින්දාවේවා. මට යුද්ධයෙහි මරණය ශ්‍රෙෂ්ඨය, ඉදින් ජීවත් වූයේ නම් පැරදුනාක්මෙනි.

16. "තොපගේ සෙනාවට අසුවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙහි මනුෂ්‍යයන් වශයෙන් පෙනී නොසිටිත්. මනා ව්‍රත ඇත්තේ යමකින් යත් නම් ඒ මාර්ගය නොදනිත්.

17. "හාත්පස වාහනය පිට නැගි මාරයා සහිත සෙනාව දැක යුද්ධයට ඉදිරියෙහි යමි. මා සිටි තැනින් නොසෙලවූයේය.

18. "අමු මැටි බඳුනක් ගලෙන් මෙන් දෙවියන් සහිත ලොකයා මේ සේනාව මැඩ නොපවත්වයිද, ඔවුන් නුවණින් යටපත් කරමි.

19. "මිච්ඡා සංකප්පය වසඟ කොට සිහිය මොනවට පිහිටුවා බොහෝ ශ්‍රාවකයන් හික්මවමින් රටින් රට හැසුරුනෙමි.

20. "අප්‍රමාදවූ කාය ජීවිත දෙකෙහි ආලය නැති මගේ අනුශාසනාව කරන්නාවූ ඔව්හු යම් තැනකට ගොස් ශොක නොකරත්ද නිදුකින් යත්.

21. "සත්වසක් පියෙන් පිය බුදුන් පිටිපස ලුහුබැන්දෙමි" සිහිය ඇති බුදුන්ගේ දොෂයක් නොදැක්කෙමි.

22. "මෙදවර්ණ ගලක කවුඩු තෙම හොටින් කොටා හාත්පසින් ගියේ යම්සේද මෘදුබව දකිම් මුත් ආශ්වාදයක් නැතැයි කලකිරී පහව ගියේද,

23. "සැපයක් නොලැබ, කපුටා ගියේ යම්සේද ශෛලයට පැමිණි කවුඩා මෙන් ගෞතමයන් ගෙන් කලකිරී ගියේය.

24. "ශොකයෙන් මඩනාලද ඔහුගේ කිසිල්ලෙන් වීනාව බිම වැටුනේය. ඉන් සිත නරක්වූ මාරතෙම එහිම අතුරුදහන් විය."

**29.** "**සුභාෂිත සූත්‍රය**:- "මා විසින් මෙසේ අසන ලදී, එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහිවූ අනේ පිඬුමහසිටුහුගේ ආරාමයෙහි වාසය කරණ සේක, එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූ සේක. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

**2.** "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ වචනය යහපත්කොට කියන ලද්දේවේ. නපුරු කොට කියන ලද්දේ නොවේ. නුවණැත්තන් විසින් දොස් නොකියන ලද්දේවේ. දොෂාරොපණ කරණ ලද්දේ නොවේ. කවර සතරකින්ද යත්, මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම යහපත් වචනයම කියයි. නපුරු වචන නොකියයි. ධර්මයම කියයි. අධර්මය නොකියයි. ප්‍රියවූ වචනම කියයි අප්‍රියවූ වචනය නොකියයි. ඇත්තම කියයි, බොරු නොකියයි. මහණෙනි මේ අංග සතරින් යුක්තවූ වචනය යහපත්ව කියන ලද්දේවේ. නපුරු කොට කියන ලද්දේ නොවේ. නුවණැත්තන් විසින් දොස් නොකියන ලද්දේ වේ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාරා නැවත සුගතයන් වහන්සේ මෙසේද වදාළ සේක.

**3.** "සත්පුරුෂයෝ යහපත් වචන කීම උත්තමයයි කියත්. ධර්මය කියන්නේය. අධර්මය නොකියන්නේය. එය දෙවැන්නය ප්‍රිය වචන කියන්නේය. අප්‍රිය වචන නොකියන්නේය, එය තුන්වැන්නය, ඇත්ත කියන්නේය බොරු නොකියන්නේය, මෙය සතර වැන්නය."

**4.** "ඉක්බිති ආයුෂ්මත් වංගීස ස්ථවිරයන් වහන්සේ අස්නෙන් නැගිට සිවුර එකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට "සුගතයන් වහන්ස මට වැටහෙයි" "වංගීසය තොපට වැටහේවායි" වදාළසේක. ඉක්බිති ආයුෂ්මත් වංගීස ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සුදුසු ගාථාවලින් ප්‍රශංසා කෙළේය.

5. "යම් වචනයකින් තමන් නොතවාද අනුන්ට හිංසා පිණිස නොවේද? ඒකාන්තයෙන් ඒ වචනය සුභාෂිතය වේ. ඒ වචනය කියන්නේය.

6. "යම් වචනයක් සතුටුසිතින් විඳිය යුතුනම් එය කියන්නේය. යම් වචනයක් කියන කල අනුන්ට අප්‍රිය නම් එය නොගෙන ප්‍රිය වචනයම කියන්නේය.

7. "ඒකාන්තයෙන් සත්‍යය අමෘත වචනයවේයි. සත්පුරුෂයෝ සත්‍යයෙහිද අර්ථයෙහිද ධර්මයෙහිද පිහිටියාහුය යන මේ ධර්මය පැරණිය.

8. "බුදුරජාණන් වහන්සේ නිර්භයවූ නිවණට පැමිණීම ප්‍රයෝජන කොට යම් වචනයක් දෙශනා කරයිද, ඒකාන්තයෙන් ඒ වචනය වචනයන් අතුරෙන් උතුම්ය."

30. (පුරලාස) සුන්දරික භාරද්වාජසූත්‍රයː- 1. "මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල්රට සුන්දරිකානදී තීරයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි සුන්දරික භාරද්වාජ බමුණුතෙම සුන්දරිකා නදී තීරයෙහි ගිනිදල්වයි. ගිනිදෙවියා පුදයි, ඉක්බිති සුන්දරික භාරද්වාජ බමුණුතෙම ගිනිදල්වා ගිනිදෙවියා පුදා අස්නෙන් නැගිට හාත්පස සතර දිග බලයි. මේ යාගයේ ඉතිරි කොටසින් කවරෙක් වළඳවන්නේද කියායි, සුන්දරික භාරද්වාජ බමුණුතෙම, එක්තරා ගසක් මුල හිස සහිතව පොරවා වැඩසිටි බුදුන් දැක වමතින් යාගශෙෂයත් දකුණතින් කෙණ්ඩියත්ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ පාහඬින් හිස් වැසුම ඉවත් කළසේක. ඉක්බිති සුන්දරික භාරද්වාජ බමුණු තෙම 'මේ පින්වත් තෙමේ හිසමුඩුකළ කෙනෙකි. මේ පින්වත් තෙමේ මුණ්ඩකයෙකැයි" ආපසු යන්නට සිතීය. ඉක්බිති සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයාට මේ අදහසවිය. "මේ ලෝකයේ හිසමුඩුකළත් ඇතැම්හු බමුණෝය. පැමිණ ජාතිය විචාරන්නෙම්නම් යෙහෙකැයි' යනුවෙනි. ඉක්බිති සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද

එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට "පින්වත් තෙමේ කවර ජාතියක් ඇත්තේදැයි" ඇසීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයාට ගාථාවලින් කීයේය.

1. "මම බ්‍රාහ්මණයෙක් නොවෙමි. රාජපුත්‍රයෙකුත් නොවෙමි, වෛශ්‍යයෙකුත් නොවෙමි, ශුද්‍රයෙක් හෝ චණ්ඩාලයෙකුත් නොවෙමි. ගොත්‍ර දැන රාගාදී ප්‍රමාද නැත්තේ මන්ත්‍ර දැන නුවණ අනුව ගිය කායකර්මයෙන් හැසිරෙමි.

2. "තුන්සිවුර අඳින්නේ ආශානැත්තේ ඉවත්කරණ ලද දැළිරැවුල් ඇති ඉතා සංසිඳුනු සිත් ඇත්තේ ඉතා විවේකව වසන්නේවෙමි. බමුණ මාගෙන් ගොත්‍ර විචාරන්නෙහි නම් නුසුදුසුය."

3. "පින්වත් බ්‍රාහ්මණය, ඒකාන්තයෙන් බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයෙක්ද භාරද්වාජයෙක්දැයි, ගොත්‍රය විචාරද්ද, ඉදින් බ්‍රාහ්මණයෝ අනිකක් කියන්නාහුනම් බමුණකු නොවූ ඔබගෙන් පද තුනක් ඇති, අකුරු 24 ක් ඇති වෙදවාක්‍යය අසන්නෙමි.

4. "මේ ලොකයෙහි බොහෝ ඍෂිහු මනුෂ්‍යයෝ ක්ෂත්‍රියෝ බ්‍රාහ්මණයෝ කුමක් ඇසුරුකොට දෙවියන්ට යාගකළාහුද, යාග කාලයෙහි යමෙක් දැනීම් තුනින් කෙළවරට ගියාහුද, මාර්ග ඥානවෙදයෙන් කෙළවරට ගියාහුද යමෙකුට යාග ද්‍රව්‍ය ලැබෙන්නේද, ඔහුට එය සඵලයයි කියමි.

5. "යම්හෙයකින් අපි වේද දත් බුදුන් දකිමුද ඒකාන්තයෙන් ඒ අපගේ යාගය ඉෂ්ටවේ, ඔබවහන්සේ වැනි වේද දතුවන් නොදැකීමෙන් අන්‍ය ජනයෝ යාග බතද කැවුම්ද අනුභව කරත්."

6. "යම්හෙයකින් මා කෙරෙහි පැහැදුනේද එහෙයින් බමුණ මෙහි අභිවෘද්ධියක් කැමතිවන්නෙහි නම් කෙලෙස් ගිනි නිවීමෙන් ශාන්තවූ, ක්‍රොධ දුම්නැති දුක්නැති, ආසානැති ඥාණවන්ත දක්ෂිණාර්හයා මෙහිම හෝ ලබන්නෙහිය, පැමිණ විචාරව."

7. "භවත් ගෞතමයන් වහන්ස, මම දීමෙහි ඇලුනේ දානයක් දෙනු කැමැත්තේවෙමි, යම්තැනක යාගපූජාව

කරණලද්දේ අදහස් ඉටුවේද, එය මට කියනු මැනවි. මම නොදනිමි. මට පින්වතුන් වහන්සේ අනුශාසනා කරණසේක්වා.”

8. “බ්‍රාහ්මණය එසේවී නම් ඔබ කණ යොමු කරව. තොපට බණ කියන්නෙමි.

9. “ඉදින් දානයෙහි මහත් ඵලය කැමැත්තේ නම් ජාතිය නොවිචාරව, ශීලාදිය නොවිචාරව, කෙබඳු දරවලින් හෝ ගිනි උපදී, පහත් කුලයක උපන්නාවූද ක්ෂීණාශ්‍රව මුනි තෙමේ ධෛර්ය ඇති පව්කෙරෙන් ලජ්ජාවෙන් පවින් දුරුව සිටි පුරුෂ ශ්‍රෙෂ්ඨයෙක්වේ.

10. “පරමාර්ථ සත්‍යයෙන් දැමුනාවූ, ඉන්ද්‍රිය දමනයෙන් යුක්තවූ වෙදනම් සතර මාර්ගඥානයෙන් යුක්තවූ වැස නිමවනලද බඹසර ඇත්තාවූ ඒ පුද්ගලයා කෙරෙහි යම් බ්‍රාහ්මණයෙක් පින් කැමැත්තෙන් දෙන්නෙහි නම්, සුදුසු කාලයෙහි යාගද්‍රව්‍ය පුදන්නේය.

11. “යම්කිසි කෙනෙක් යහපත් සංවරයෙන් යුක්ත බැවින් ඇදනැති නූල් බඳින ලීය මෙන් කාමයන් අත්හැර ආශා නැතිව හැසිරෙත්ද, යම් බ්‍රාහ්මණයෙක් පින් කැමැත්තෙන් පුදන්නේ නම් උන්වහන්සේලා කෙරෙහි පූජාද්‍රව්‍ය දෙන්නේය.

12. “යම් කෙනෙක් රාහුගේ ගැනීමෙන් මිදුන චන්ද්‍රයා මෙන් පහවූ රාග ඇත්තාහුද මනාකොට සන්හුන් ඉන්ද්‍රියයන් ඇත්තේද, පින් කැමති යම් බමුණෙක් දන් දෙන්නේ නම් සුදුසු කාලයෙහි ඔවුන් කෙරෙහි යාග ද්‍රව්‍යය දෙන්නේය.

13. “යමෙක් හැමකල්හි සිහිඇතිව තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ගැනීම අත්හැර ලොකයෙහි නොගැටෙමින් හැසිරෙත්ද, පින් කැමති යම් බ්‍රාහ්මණයෙක් පුදන්නේ නම් සුදුසු කාලයෙහි ඔවුන් කෙරෙහි යාග ද්‍රව්‍ය පුදන්නේය.

14. “යම්කෙනෙක් ක්ලෙශකාමයන් අත්හැර වස්තු කාමයන් මැඩපවත්වා හැසිරේද, යමෙක් ඉපදීම මැරීම යන මෙහි අවසනට පැමිණියේද, සිහිල්වූ දියවිලක් මෙන් පිරිනිවියේද, ඒ තථාගතතෙම යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

15. "අප්‍රමාණ නුවණ ඇති තථාගතතෙමේ සමවන අය කෙරෙන් සමවූයේ විෂමයන් කෙරෙන් ඈත්වූයේ මෙලොව හෝ පරලොව හෝ නොඇලුනේ යාගද්‍රව්‍යයට සුදුසු වේ.

16. "යමෙකු කෙරෙහි මායාව නොවසාද මානය නැත්තේද, යමෙක් පහවූ ලොභ ඇත්තේද මමත්වය නැත්තේද ආශානැත්තේද, ක්‍රොධය දුරුකෙළේද මනාව නිවුණු ආත්මය ඇත්තේද, යම් ඒ බ්‍රාහ්මණයෙක් පියුමක් කොට කීයේද ඒ තථාගතතෙම යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

17. "යම් නිවෙසන නම් මනසක් කියේද යමෙකුට තෘෂ්ණාදෘෂ්ටි ගැනීමක් නොවෙත්ද මෙලොව හෝ පරලොව හෝ එය නොගන්නාවූ තථාගත තෙමේ යාග ද්‍රව්‍ය බුදීමට සුදුසුවේ.

18. "යමෙක් එකඟවූ සිත් ඇත්තේද සතර ඕඝය එතර වුනේද ශ්‍රෙෂ්ඨ දෘෂ්ටියෙන් ධර්මය දත්තේද අන්තිම දෙහය දරණ ක්ෂීණාශ්‍රවවූ තථාගතතෙම යාගද්‍රව්‍යයට සුදුසුවේ.

19. "යමක්හුගේ භවතෘෂ්ණාවද, වචනයේ කෘෘර බවද දවන ලද්දේද, ආස්තයට යවන ලද්දේද, නොවෙත්ද, වෙද දත් සියලු ස්කන්ධ ආයතනයන්හි මිදුණු තථාගත තෙම යාගද්‍රව්‍ය ලැබීමට සුදුසුය.

20. "රාගාදී ඇලීම් ඉක්මවූ යමෙක්හට ඇලීම් නැත්තේද, මානයෙහි ඇලුනවුන් අතරෙහි මානයෙහි නොඇලුන සත්වයෙක්වේද ඒ හෙතු සහිත ප්‍රත්‍යය සහිත දුක පිරිසිඳ දත් තථාගත තෙමේ යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුවෙයි.

21. "තෘෂ්ණාවට නොබැඳී නිවණ දක්නාසුලුවූ අනුන් විසින් දැන්වියයුතු දෙසැට මිථ්‍යාදෘෂ්ටිය ඉක්මවූ යමෙක්හට නැවත උත්පත්ති හෙතුවක් නැත්තේද, ඒ තථාගත තෙමේ යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

22. "තමා තුළ ඇත්තාවූද තමාගෙන් පිටත ඇත්තාවූද, ස්කන්ධ ආයතනාදී ධර්මයන් දැන, පිඹ හරිනලද්දාහුද, අස්තයට යවන ලද්දාහුද, නොවෙත්ද, (හෙතෙමේ) ශාන්ත වූයේ නිවන්

අරමුණුකොට කෙලෙසුන්ගෙන් මිදුනේද, ඒ තථාගත තෙමේ යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

23. "සංයොජනද, උත්පත්තියද ක්ෂයවීම දක්නා සුලු යමෙක් තෙමේ රාගය ඉතිරි නොකොට දුරුකෙළේද පිරිසිදුවූ රාගද්වෙෂ මොහ දොෂනැති, නිර්මලවූ පව්නොකරණ තථාගතතෙම යාගද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

24. "යමෙක් තෙමේ ස්කන්ධ මිස ආත්මය කියා දෙයක් නොදකීද? මාර්ග සමාධියෙන් යුක්තද කායවංකාදිය නැද්ද? කම්පා නොවන්නේද ඒජා නම් තෘෂ්ණාවද සිත්හි උල්ද අටතන්හි සැකද නැත්තේද, ඒ තථාගත තෙමේ යාග ද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

25. "යමක්හට මෝහය හේතුකොට ගෙන කිසි අනතුරක් නැද්ද සියලු දෙය ඤාණයෙන් දක්නාසුලු වේද? අන්තිම ශරීරය දරන්නේද පසේබුදුන් ආදීන් හා අසාධාරණ නිර්භය බුදුබවට පැමුණුනේද මෙපමණකින් පුරුෂයාගේ සුද්ධිය වේද ඒ තථාගතතෙම යාග ද්‍රව්‍ය පිළිගැනීමට සුදුසුය.

26. "මා විසින් පෙර බ්‍රහ්මයා අරහයා ගිනිදෙවියා පිදූ යෙම්ද, එය සත්‍ය හෝ බොරු හෝ නොදනිමි. අද ඔබ වැනි යාග ගැන දන්නෙක් ලැබුණු බැවින් සත්‍ය පිදීමක් වේවා. ඔබවහන්සේ ප්‍රත්‍යක්ෂ බ්‍රහ්මයාය. භාග්‍යවතුන් වහන්සේ මාගේ යාග ද්‍රව්‍ය පිළිගන්නාසේක්වා. භාග්‍යවතුන් වහන්සේ මාගේ යාග ද්‍රව්‍ය වළඳනසේක්වා.

27-28. ඡේද දෙක උරග වර්ගයෙහි 4 කසීභාරද්වාජ සූත්‍රයෙහි 6-7 ඡේද මෙනි.)

29. "භාග්‍යවතුන්වහන්ස, යහපත, මම ඔබ වහන්සේගේ අවවාදයෙහි සිට යම්සේ දන්නේ නම් යාග අවස්ථාවෙහි මා විසින් උපස්ථාන කළයුතු එබඳු දක්ෂිණාර්හ කෙනෙක් මට පෙන්වනු මැනවි."

30. "යමෙකුගේ එකට එක කිරීම පහවූයේද, යමෙකුගේ සිත නොකැළඹුනේද, කාමයන්ගෙන් මිදුනේද, යමෙකුගේ කයෙහි ගිලන්කම නැද්ද,

31. "කෙලෙසුන් නැති කරන්නාවූ, ඉපදීම මරණය දෙකෙහි දක්ෂවූ නුවණින් යුක්තවූ එබඳු මුනිතෙම යාගයට පැමිණියේය.

32. "බැම හැකිලවීම නොකොට ඇඳිලි බැඳ නමස්කාර කරව්. ආහාරපානවලින් පුදව්. දක්ෂිණා තොමෝ මෙසේ සම්බන්ධ වේ.

33. "සියලු ලෝකයා විසින් පැමිණ පිදිය යුතුවූ පුණ්‍ය ක්ෂෙත්‍රවූ නිරුත්තරවූ පින්වත් බුදුරජාණන් වහන්සේ යාග ද්‍රව්‍ය පිදීමට සුදුසුය. පින්වතුන් වහන්සේට දෙනලද්ද මහත් ඵල ඇත්තේය.

34. "(මෙහි සූත්‍රනිපාතයේ 1 වර්ගයේ 4 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) ඒ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේ පිහිට කොටයෙමි. ධර්මයේද, භික්ෂුසංඝයාගේද පිහිට සොයමි. භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි. සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණතෙම රහතුන් අතරෙහි කෙනෙක් වූයේය."

31. මාඝ සූත්‍රයඃ- "මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වාසය කරණසේක. ඉක්බිති මාඝ මාණවකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි මාඝ මානවකතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, යාචක ජනයාගේ වචන දන්නා දීමට ඉල්වීමට සුදුසු දායකයෙක්ද, දානපතියෙක්ද වෙමි. ධර්මයෙන් භොගයන් සොයමි.

2. "දැහැමින් වස්තුසොයා දැහැමින් පැමිණි දැහැමින් ලත් වස්තුවෙන් එකෙකුටද දෙමි. දෙදෙනෙකුටද දෙමි. තුන් දෙනෙකුටද දෙමි. සතරදෙනෙකුට දෙමි. පස්දෙනෙකුටද දෙමි. සදෙනෙකුට දෙමි, සත්දෙනෙකුටද දෙමි, අටදෙනෙකුටද දෙමි, නවදෙනෙකුට දෙමි. දසදෙනෙකුටද දෙමි. විසිදෙනෙකුටද දෙමි. තිස්දෙනෙකුටද දෙමි. සතළිස් දෙනෙකුටද දෙමි. පනස්

දෙනෙකුටද දෙමි. සිය දෙනෙකුටද දෙමි. වැඩියද දෙමි. භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද මෙසේ දෙන්නේ මෙසේ පුදන්නේ, බොහෝ පින් රැස්කරම්ද, මාඝය ඔබ මෙසේ මෙසේ දෙන්නේ නම් පුදන්නේ නම් බොහෝ පින් රැස්කරන්නෙහිය. මාණවකය, යම් දායකයෙක් දානපතියෙක් යාචක ජනයාගේ වචන දන්නේද දීමට ඉල්වීමට සුදුසුද දැහැමින් වස්තුව සොයයිද,

3. මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යොදාගන්න.

ඉක්බිති මාඝ මානවකතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීයේය.

(i) "මාඝමාණවකතෙම පින්වත කසට වස්ත්‍ර හඳින ගිජු නොවී වාසය කරණ වචන දන්නාවූ ගෞතමයන් වහන්සේ ගෙන් විචාරමුය, පින් බලාපොරොත්තුවන පින් කැමැත්තා මෙලොව ආහාරපාන අන්‍යයන්ට දෙන්නේ යාගකරන්නාහට කවර තැනෙක යාග කළොත් මහත්ඵල වන්නේද,

(2) (i) "මාඝය මේ ලෝකයෙහි දීමට ඉල්ලීමට සුදුසු දානපතිවූ යම් ගෘහස්ථයෙක් පින් කැමැත්තේ පින බලාපොරොත්තුවෙන් පූජාකරයිද, අන්‍යයන්ට ආහාරපාන දෙමින් කෙළෙස් නැතිකළ දක්ෂිණාර්හයන් සමග සතුටු වන්නේයයිද භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

(3) මෙය (i) මෙහි 2 (i) මෙනි.)

භාග්‍යවතුන් වහන්සේ මට දක්ෂිණාර්හයන් වදාළ මැනව.

4. "යම් කෙනෙක් ඒකාන්තයෙන් ලොකයෙහි රාගාදියෙහි නොගැවී කිසිවක් නැතිව වැඩ අවසන්කර රක්නාලද සිත් ඇත්තෝව වාසය කරත්ද, (ii) පින් බලාපොරොත්තු යම්කිසි බ්‍රාහ්මණයෙක් යාග කරන්නහුනම් සුදුසු කාලයෙහි ඔවුන් කෙරෙහි යාග ද්‍රව්‍යය දෙන්නේය.

5. "යම්කෙනෙක් සියලු සංයෝජන බැම් සුන්කළාහුද දැමුනාහුද, කෙලෙසුන්ගෙන් මිදුනාහුද, දුක් නැද්ද, දැන් කෙළෙස් නැද්ද (මෙහි 4 (ii) ඡේදය මෙනි.)

**6.** (5 වෙනි ඡේදය මෙනි. 'සුන්කළාහු' යන්නට 'මිදුනාහු'යි යොදන්න.)

**7.** "රාගයද, ද්වේෂයද, මොහයද පහකොට කෙලෙසුන් නැසුවෝද, වැසනිමවන ලද බඹසර ඇත්තාහුද (මෙහි 4 (ii) ඡේදය මෙනි.)

**8.** "යම්කෙනෙකුන් කෙරෙහි රැවටිල්ල නැත්තේද මානයක් නොවේද, යම් කෙනෙක් පහවූ ලොභ ඇත්තේද මමත්වය නැත්තේද ආශානැත්තේද (මෙහි 4 (ii) ඡේදය මෙනි.)

**9.** "යම්කෙනෙක් ඒකාන්තයෙන් තෘෂ්ණාවන්හි නොවැටුණාහුද කාම සැඩවතුරු තරණය කොට මමත්වය නැතිව හැසිරෙද්ද, (මෙහි 4 (ii) ඡේදය මෙනි.)

**10.** "යම්කිසි කෙනෙකුන්ට ලොකයෙහි මෙලොව හෝ පරලොව කොයිතැනත් තෘෂ්ණාවක් නැද්ද, (මෙහි 4 (ii) ඡේදය මෙනි.)

(3 වර්ගයේ 30 සූත්‍රයේ 11 ඡේදය මෙනි.)

**11.** "(3 වර්ගයේ 30 සූත්‍රයේ 12 ඡේදය මෙනි.)

**12.** "යම් කෙනෙක් ශමනය කළ කෙළෙස් ඇත්තාහුද, පහවූ රාග ඇත්තාහුද, බාධා නොකළහැකිද වර්තමාන සම්බන්ධ අත්හැර ඇලීමක් නැද්ද,

(මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**13.** "ජාති, ජරා, මරණ අත්හැර සියල්ල ඉක්මෙවූවාහු සැක නැද්ද,

(මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**14.** "යම්කෙනෙක් රාගාදී කිසි ක්ලේශයක් නැතිව සර්වප්‍රකාරයෙන් මිදී ලොකයෙහි තමන් පහනක් මෙන් හැසිරෙත්ද,

(මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**15.** "යම් කෙනෙක් ස්කන්ධ ආයතනාදී ශරීරය අනිත්‍ය යයිදනීද, මේ අවසාන ජාතිය වෙයි. නැවත භවයක් නැතැයි යම් යම් විධියකින් දනිත්ද,

(මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**16.** "වේද දත් යම්කෙනෙක් ධ්‍යානයෙහි ඇලුනේද, සිහි ඇත්තේද, බොහෝදෙනාට පිහිටවූ බුදුබවට පැමිණියේද,

(මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)"

**17.** "ඒකාන්තයෙන් මාගේ ඇසීම හිස් නොවූයේය. භාග්‍යවතුන් වහන්සේ මට දක්ෂිණාර්හයන් වදාළසේක. ඔබවහන්සේ වනාහි ලොකයෙහි දතයුතු සියල්ල යම් ඒ විධියකින් දතයුත්තේද, ඒ ඒ විධියෙන් අවබොධ කරණලදී.

**18.** "දීමට ඉල්ලීමට සුදුසු යම් දානපති ගෘහස්ථයෙක් වූ මාඝ තරුණතෙම පින් බලාපොරොත්තු වන්නේ පින් බලාපොරොත්තුවෙන් මේ ලෝකයෙහි අන්‍යයන්ට ආහාරපාන දෙන්නේද භාග්‍යවතුන් වහන්සේ මට දාන සම්පත්තිය වදාරණු මැනවි."

**19.** "මාඝය, දන්දෙනු ලබන්නේ දෙව, හැමතන්හි සිත පහදව, දන්දෙන්නාට දියයුත්තේයයි කියනලද දානය අරමුණවේ. මෙහි පිහිටා ද්වෙෂය නැතිකරයි.

**20.** "ඒ පහවූ රාග ඇත්තේ ද්වෙෂය නසා අප්‍රමාණ මෛත්‍රී සිත වඩන්නේ රෑදාවල් දෙකෙහි නිතර අප්‍රමාදවූයේ සියලු දිශාවන්හි අප්‍රමාණ මෛත්‍රිය පතුරුවයි."

**21.** "කවරෙක් ශුද්ධවේද, මිදේද, බැදේද, තමන් කවරකින් බඹලොව යද්ද, විචාරණලද මට නොදන්නා හෙයින් වදාළ මැනව. මා විසින් අද්දුටු ප්‍රත්‍යක්ෂ බ්‍රහ්මයා භාග්‍යවත්තෙමේය. නුඹවහන්සේ අපට බ්‍රහ්මයා සමානය යනු සත්‍යය. භාග්‍යවතුන් වහන්ස බ්‍රහ්මලෝකයෙහි කෙසේ උපදින්නේද?"

**22.** "මාඝය, යම්කිසි කෙනෙක් ත්‍රිවිධ දාන සම්පත්තිය පුදාද ගුණවත් දක්ෂිණාර්හයන් සමග සතුටුවේද, මෙසේ දන්දී මනාකොට දීමට ඉල්ලීමට යොග්‍යවූයේ බ්‍රහ්ම ලෝකයෙහි උපදීයයි" කියමි.

**23.** "මෙසේ වදාළකල්හි මාඝ මානවක තෙම (මෙහි 3 මහා වර්ගයෙහි 30 සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.)

**32. සභිය සූත්‍රයඃ-** 1. (මෙහි 1 බොධි වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

**2.** "එකල්හි වනාහි සභිය පරිබ්‍රාජකයාගේ පැරණි සහලේ නෑ දෙවතාවකු විසින් ප්‍රශ්න පමණක් අසන ලද්දාහු වෙත්. සභිය තොප විසින් විචාරණ ලද මේ ප්‍රශ්න යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ප්‍රකාශ කරන්නේද ඔහු වෙත බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙව. ඉක්බිති සභිය පරිබ්‍රාජක තෙම ඒ දෙවතාවාගේ සමීපයෙහි ඒ ප්‍රශ්න උගෙන,

**3.** (i) පිරිස් ඇති ශාස්තෘවරුන් යයි අඟවන ගිහි පැවිද්දන්ගේ ගුරුවරුවූ ප්‍රසිද්ධවූ ලාභ ඇති තීර්ථක නායකවූ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත කරණලද යම් මේ පූරණ කාශ්‍යපය, මක්ඛලිගොසාලය, අජිතකෙසකම්බලය, පකුධ කත්‍යායනය, සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍රය, නිඝණ්ඨනාථපුත්‍රය යන ඔවුන් වෙත පැමිණ ඒ ප්‍රශ්න අසයි. (ii) සභිය පරිබ්‍රාජකයා විසින් ප්‍රශ්න ඇසූකල්හි පිළිතුරු නොදෙත්. උත්තර නොදෙන්නාහු කොපයද, තරහද, නොසතුටද, ප්‍රකාශ කරත්. නැවත සභිය පරිබ්‍රාජකයාගෙන්ම අසත්. ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට (මෙහි මේ සූත්‍රයේ 3 (i) ඡේදය යෙදිය යුතුයි.) යම් ඒ පින්වත් මහණ බමුණු කෙනෙක් ඇද්ද මා විසින් ප්‍රශ්න විචාරණ ලද්දාවූ ඔව්හු පිළිතුරු නොදෙත්. පිළිතුරු නොදෙන්නාහු මගෙන්ම අසත්. මම ගිහිවී කාමයන් අනුභව කරන්නෙම් නම් යහපතැයි" මේ සිත විය.

**4.** ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට මේ සිත විය. 'මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේද පිරිස් ඇත්තෙකි. සමූහ ඇත්තෙකි. ගිහි පැවිද්දන්ගේ ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කෙනෙකි. තීර්ථක නායකයෙකි. බොහෝදෙනා විසින් යහපතැයි ප්‍රසිද්ධය. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙත පැමිණ මේ ප්‍රශ්න අසන්නෙම් නම් යෙහෙකැයි' සිතීය.

**5.** ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට මේ සිත විය. 'දිරූ වැඩි මහලුවූ නාකිවූ බොහෝ කල් ගිය පශ්චිම වයසට පැමිණි ස්ථවිරවූ බොහෝ රාත්‍රි දන්නා පැවිදිව බොහෝ කල් ගිය, (මෙහි මේ

සූත්‍රයේ 3 (i) ඡේදය යෙදිය යුතුයි.) ඔව්හුද මා විසින් ප්‍රශ්න අසන ලද්දාහු නොකියත් නොකියන්නාහු කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කරත්. නැවත අන් කෙනෙකුගෙන් අසත්ද, කිමෙක්ද, මට ශ්‍රමණ ගෞතමතෙම මේ ප්‍රශ්න විචාරන ලද්දේ ප්‍රකාශ කෙරේද, ශ්‍රමණ ගෞතම තෙමේද, උත්පත්තියෙන් බාල වයස් ඇත්තෙකි. පැවිදිවී අලුතය. ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට මේ අදහසවීය. ශ්‍රමණයන් වනාහි බාල වයස්යයි අවමන් නොකළ යුතුය. ඉදින් ශ්‍රමණ තෙමේ බාල වයස් වුවත් හෙතෙමේ මහත් ඍද්ධි ඇත්තේය. මහත් ආනුභාව ඇත්තේය. මම ශ්‍රමණ ගෞතමයන් වෙත පැමිණ මේ ප්‍රශ්න අසන්නෙම් නම් යෙහෙකැයි' යනුවෙනි.

**6.** ඉක්බිති සභිය පරිබ්‍රාජකතෙමේ රජගහ නුවර යම් තැනෙක්හිද එහි ගමන් කෙළේය. පිළිවෙළින් ගමන් කරන්නේ රජගහ නුවර වෙළුවනය යම් තැනෙක්හිද කලන්දක නිවාපය යම් තැනෙක්හිද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි සභිය පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවන් කීයේය.

(i) "ඇසීමට සැක ඇත්තෙමි. ප්‍රශ්න කෙරෙහි සැක ඇත්තෙමි. ප්‍රශ්න ඇසීමට ඉතාම කැමැත්තෙන් පැමිණියෙමි. ප්‍රශ්නයන් මා විසින් විචාරණ ලද්දේ ඔවුන් අවසන් කරන්නෙකු වේවා පිළිවෙළින් ප්‍රශ්නයන්ට පිළිතුරු පාළියට නගා මට ප්‍රකාශ කරන්නැයි" සභිය කියා සිටියේය.

(ii) "සභිය, ප්‍රශ්න විචාරන්නට කැමැත්තෙන් දුර සිට ආයෙහිද? විචාරණ ලද ඒ ප්‍රශ්න නිරාකරණය කරමි. තොපට ප්‍රශ්න අනුව අර්ථයට ගැලපෙන පාළියට නගා එය ප්‍රකාශ කරමි.

(iii) "යම් කිසිවෙක් සිත කැමැත්තෙහි නම් සභිය මාගෙන් ඒ ප්‍රශ්න අසව. ඒ ඒ ප්‍රශ්නය මම අවසන් කරමි."

(iv) ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට මේ සිත විය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්යයි, පින්වත, ඒකාන්තයෙන් අද්භූතයි.

යම්හෙයකින් අනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙන් මම අවකාශ මාත්‍රයකුදු නොලද්දෙමි. මට ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් මේ අවකාශය කරණ ලද්දේ යයි.” සතුටුවූයේ ප්‍රමුදිතවූයේ ප්‍රීතිය හා සොම්නස ඇතිවූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න ඇසූයේය.

**6.** “භික්ෂූන් විසින් කුමක් ලබන ලද්දේද? කුමකින් සන්සිඳුනේද? කෙසේ දැමුනාහුද? බුදුන් යයි කෙසේ කියයිද? විචාළ මට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරණු මැනවයි” සභියතෙමේ ඇසීය.

**7.** “සභිය, යමෙක් තමා විසින් පුරුදු කරණ ලද මාර්ගයෙන් ක්ලෙශ පරිනිර්වාණයට පැමිණියේද, පහකළ සැක ඇත්තේද, ශාස්වත උච්ඡෙද දෘෂ්ටි හැර බඹසර වැස නිමවා ක්ෂය කළ නැවත උත්පත්තිය ඇත්තේ ද ඒ මහණතෙම,

**8.** “හැම අරමුණකම මධ්‍යස්ථවූයේ සිහියෙන් යුක්ත වූයේ ලොකයෙහි කිසිසත්වයෙකුට හිංසා නොකෙරේද යමෙක් හට ක්ලෙශ නැද්ද, හෙතෙම නොයෙක් කෙලෙස් සංසිඳවූ බැවින් සතර ඕඝයෙන් එතරවූයේය. පව් සමනය කළේය. අවුල් අදහස් ප්‍රහීන කෙළේය.

**9.** “යමක්හු විසින් සියලු ස්කන්ධ ලොකයෙහි තමා තුළද පිටත්හිද ඉන්ද්‍රියයන් සයදෙන පුරුදු කරණ ලද්දාහුද, මෙලොවද, පරලොවද දැන කල් බලයි. පුරුදු කරණ ලද ඉඳුරන් ඇති හෙතෙම දැමුනේය.

**10.** “සියලු තෘෂ්ණා දෘෂ්ටීන් අනිත්‍යාදී වශයෙන් බලා සංසාරයද චුති උත්පත්ති දෙකද දැන පහවූ රාගාදී ධූලි ඇති කෙලෙස් නැති පිරිසිදුවූ නිවණට පැමිණි හෙතෙම බුද්ධ යයි කීහු.

**11.** ඉක්බිති සභිය පරිබ්‍රාජකතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ කියමනට සතුටුව අනුමෝදන්ව සතුටුවූයේ ප්‍රමොදවූයේ ඔද වැඩියේ හටගත් ප්‍රීති සොම්නස් ඇත්තේ, භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහි ප්‍රශ්න විචාළේය.

"බමුණන් විසින් කුමක් බලාපොරොත්තුවන කෙසේ ලද්දෝද, කුමකට පැමිණියහුට බ්‍රාහ්මණයයි කියාද, ශ්‍රමණයා සෝදා හරිනලද පව් ඇත්තේවේද, නාගයයි කෙසේ කියන ලද්දේද, මවිසින් විචාරණ ලද භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරණු මැනවියි" සභියතෙමේ ඇසීය.

12. "සභියය පරමාර්ථ බ්‍රාහ්මණතෙම සියලු පාපයන් දුරුකොට නිර්මලවූයේ අර්හත් ඵල සමාධියෙන් යහපත්යයි නිශ්චයවූයේද, ස්ථිරවූයේද, සංසාර හෙතුව ඉක්මවා කටයුතු අවසන් කර තනිවූයේද, හෙතෙම තෘෂ්ණාදිය ඇසුරු නොකළේ ලොක ධර්මයෙන් වෙනසකට නොපැමුණේ යයි කියන ලදී.

13. "පින් පවු අත්හැර රහත් මගින් කෙලෙස් සමනය කොට කෙලෙස් රජස් නැතිව මෙලොවද පරලොවද දැන උත්පත්තිය හා මරණය දුරුකළේ ශ්‍රමණයායයි කියනු ලැබේ.

14. "අධ්‍යාත්මයෙහිද පිටත්හිද සියලු ලොකයෙහි සියලු ලාමක දෙය සෝදා හැර තෘෂ්ණා දෘෂ්ටි සිතීම් වලින් සිතිය යුතු දෙව් මිනිසුන් කෙරෙහි රාගාදී සිතීමකට නොපැමිණියේහුයි. ඔහු නෑවේයයි කියනු ලැබේ.

15. "ලොකයෙහි සියලු දසසංයොජනාදී බැම්ද කාමාදී සංයොගද, මුදාහැර පවක් නොකෙරේද, කිසි ස්කන්ධයක නොඇලේද, කෙලෙසුන්ගෙන් මිදුණු එබඳු තැනැත්තේ නාගයයි කියනු ලැබේ."

16. "ඉක්බිති සභිය පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහි ප්‍රශ්න විචාළේය.

17. "සභියතෙමේ, බුදුවරයෝ දක්ෂවූ කවරෙකුට ක්ෂෙත්‍ර සංඛ්‍යාත ආයතනයන්ගෙන් මිදුනේයයි කියත්ද කවර කරුණකින් කෙසේ පණ්ඩිතයයි කියනු ලැබේද කෙසේ මුනි නම් කියයිද, මවිසින් විචාරණ ලද භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරණු මැනවියි" ඇසීය.

18. "සභියය, සියලු ආයතන නම් ක්ෂෙත්‍රයන් මැඩ සියලු දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්ම ආත්මභාව වලට අයත් ඇතුළත පිටත

වශයෙන් විප්‍රකාරවූ දොළොස් ආයතන වලින් මිදුන ක්ෂෙත්‍රයන් ජයගත් තැනැත්තේ කම්පා නොවන බැවින් තාදීයයි කියනු ලැබේ.

**19.** (මෙහි "ක්ෂෙත්‍රයන්ට" කුශලා කුශලකර්ම නැමැති "කොෂය" යනු යොදා 18 වෙනි ඡේදය යෙදිය යුතුයි.)

**20.** "පිරිසිදු නුවණ ඇත්තේ අධ්‍යාත්මයෙහිද පිටත්හිද දෙවැදෑරුම් ආයතනයන් පරීක්ෂාකොට කුශල අකුශලයන් ඉක්මවූ පණ්ඩිතතෙමේ නොසෙල්වෙන අර්ථයෙන් තාදීයයි කියනු ලැබේ.

**21.** "ඒ මුනිතෙමේ රාගාදී ඇලීම්ද තෘෂ්ණා දෘෂ්ටි ආදී දැල්ද ඉක්මවා සියලු ලොකයෙහි ඇතුළත්හිවූද පිටත්හිවූද අයහපත්වූද යහපත්වූද, ධර්මය දැන ගත් හෙතෙම දෙවි මිනිසුන් විසින් පිදිය යුතු වූයේවේද.

ඉක්බිති සභිය පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහි ප්‍රශ්න විචාළේය.

**22.** "ධර්මය දැන වෙදය දත් වීර්ය ඇත්තේ කුමක් ලබන ලද්දේ ද, කවරෙකු විසින් කෙසේ ප්‍රකාශ කරණ ලද්දේද? ආජානෙයතෙමේ කවරෙක් වේද, මා විසින් අසන ලද්ද, භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශකොට වදාරණ සේක්වායි" සභිය තෙමේ ඇසීය.

**23.** "සභියය, ශ්‍රමණයන් විසින්ද, බ්‍රාහ්මණයන් විසින්ද පනවන ලද සියලු වේදයන් සොයාබලා සියලු වේදනාවන්හි පහවූ ආශා ඇතිව හෙතෙම සියලු වේද ඉක්මවා වෙද දතුවෙක් වූයේය.

**24.** "තෘෂ්ණාදි සසර ප්‍රමාද කරවන කෙලෙස්ද නාමරූප දෙකද අධ්‍යාත්මයෙහිවූද, පිටත්හිවූද රොග මුල්ද දැන සියලු රොග මුල් බැම්මෙන් මිදුනු කම්පානොවන තැනැත්තේ තාදීයයි කියනු ලැබේ.

**25.** "මේ ලොකයෙහි සියලු ලාමක දෙයින් වෙන්වූ වීර්ය ඇති හෙතෙමේ අපාය දුක් ඉක්මවා වීර්ය ඇත්තේ ධ්‍යාන

මාර්ග වැඩීමෙන් යුක්තවූයේ කෙලෙස් සතුරන් නැසීමෙහි සමත් ඥාණවන්ත තෙමේ කම්පානොවන හෙයින් තාදීයයි කියනු ලැබේ.

**26.** "අධ්‍යාත්මයෙහිවූද, පිටත්හිවූද, ඇලීමට මුල්වූ බැමි යමෙකු විසින් සිඳින ලද්දාහු වෙත්ද සියලු ඇල්මට මුල්වූ බැමිවලින් මිදුනු නොසෙල්වෙන ශ්‍රෙෂ්ඨතෙමේ ඉෂ්ට අනිෂ්ට දෙක්හිම එක සමානය."

**27.** "ඉක්බිති සභිය පරිබ්‍රාජකතෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහි ප්‍රශ්න විචාළේය.

**28.** "කුමකට පැමිණෙන ලද්දේ සුවපත්ද? ආර්යතෙමේ කුමක් හෙයින් කෙසේ හැසිරීමෙන් යුක්තද? පරිබ්‍රාජක තෙමේ කෙසේ වේද, භාග්‍යවතුන් වහන්සේ විචාරණ ලද මට ප්‍රකාශ කරණු මැනවියි" සභිය තෙම ඇසීය.

**29.** "භාග්‍යවතුන් වහන්සේ "සභියය, ලොකයෙහි යම් කිසි වරද නිවරදයයි යම් ධර්මයක් වේද, සියලු ධර්මය විශිෂ්ට ඥානයෙන් දැන කාමරූපාදිය ඉක්මවූ සැක නැති මිදුනු කෙලෙස් ඇත්තා හැමතන්හි සුවසේය.

**30.** "ආශ්‍රවයන්ද, ආලයයන්ද, සිඳ ඒ ඥාණවන්ත තෙමේ නැවත ගර්භයක ඉපදීමට නොපැමිණේ. කර්මාදී සංඥාද කාම ගුණාදී පංකද (එරෙන තැන්ද) දුරලා තෘෂ්ණාදී හැඟීමකට නොපැමිණෙයි.

**31.** "මේ ලෝකයෙහි ශීලාදීන්හි පැමිණිය යුත්තට පැමිණි යම් දක්ෂයෙක් හැමකල්හි ධර්මය දනීද, කෙලෙසුන් ගෙන් මිදුන හෙතෙම හැම තැනම නොඇලෙයි. යමෙකුට ක්‍රොධ නැද්ද හෙතෙම ශීලාදී චරණ ධර්ම ඇත්තේවේ.

**32.** "උඩයට සරස මැද නොහොත් තුන්කාලයෙහිම දුක් විපාක ඇති යම් කර්මයක් ඇත්තේද එය දුරුකොට නුවණින් පිරිසිඳ හැසිරෙන්නේ මායාව මානය සහ ලොභය ක්‍රොධයද නුවණින් සිඳ දමා නාමරූපයද කෙළවර කෙළේද, පැමිණිය යුත්තට පැමිණි ඔහු පරිබ්‍රාජකයයි කියන ලදී."

33. "ඉක්බිති සභිය පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වනයට සතුටුව අනුමෝදන්ව ප්‍රීතිවූයේ ප්‍රමොදවූයේ ඔදවැඩියේ ප්‍රීති සොම්නස්වූයේ අස්නෙන් නැගිට උතුරු සළුව එකස් කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි ඇඳිලි බැඳ බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සුදුසු ගාථාවෙන් ස්තුති කෙළේය.

34. "මහත් ප්‍රඥා ඇත්ත, තුනක්වූද, සැටක් වූද, ශ්‍රමණයන්ගේ වාදයෝ ඇත්ද ඒවා ස්ත්‍රී පුරුෂ යන සංඥා අකුරු ඇත්තේය, සංඥාවන් ඇසුරු කළාහුය (මිථ්‍යා තොටවල්) තීර්ථයන් ඉක්මවා ඔඝයන්ගේ අන්තයට ගියෝය.

35. "දුක් අවසන් කළ පරතෙරට ගිය රහත් කෙනෙක, සම්‍යක් සම්බුද්ධය, ඔබ වහන්සේ ක්ෂීණාශ්‍රවයෙකැයි හඟිමි. දුක් කෙළවර කළ බබළන, ඥාණවන්ත මහාප්‍රාඥතෙමේ මා සැකයන්ගෙන් එතර කෙළේය.

36. "මා විසින් සිතනලද යමක් දැන ගත්තේද සැකයෙන් මා තරණය කෙළේද, මුනීන්ගේ මාර්ගයන්හි පැමිණිය යුත්තට පැමිණියාවූ නුඹ වහන්සේට නමස්කාර වේවා. පින්වතුන් වහන්සේ සම්පූර්ණ සූර්ය වංශයේ ඥාතිවරයෙකි. නානාප්‍රකාර කෙළෙස් සංසිඳවූවෙහිය.

37. "මට යම් සැකයක් පෙරවීද, එය පසැස් ඇති ඔබ වහන්සේ මට ප්‍රකාශ කෙළේය. බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් මුනිය. ඔබ වහන්සේට නීවරණ නැත්තේය.

38. "නුඹ වහන්සේ විසින් සියලු දැඩි ආයාසයෝ දමන ලදහ. උදුරා දමන ලද්දාහ, එසේ කොට සිහිල්වූයෙහිය, ක්ලෙශ දමනයට පැමිණියේය. ප්‍රඥා ඇත්තෙහිය. සත්‍යයෙන් නික්මුණේය.

39. "කෙලෙසුන් නොඑන අර්ථයෙන් නාගයන්ගේ ශ්‍රේෂ්ඨ නාගවූ මහාවීරවූ සත්‍යය කියන්නාවූ ඒ ඔබ වහන්සේගේ වචන සියලු පර්වතවාසීවූද ආකාශවාසීවූද දෙවසමූහයෝ අනුමෝදන්වෙත්.

40. "පුරුෂයන්ට ඉතා ශ්‍රේෂ්ඨ තැනැත්ත, ඔබට නමස්කාරවේවා. පුරුෂ ජාතියෙහි උතුම් තැනැත්ත ඔබට නමස්කාරවේවා. දෙවියන් සහිත ලොකයෙහි ඔබවහන්සේට සමාන පුද්ගලයෙක් නැත.

41. "ඔබවහන්සේ බුද්ධය, ඔබවහන්සේ ශාස්තෘය, ඔබවහන්සේ මාරයන් අභිභවනය කළ මුනිය, ඔබවහන්සේ අනුශයයන් සිඳ එතරවූයේ මාද ප්‍රජාවද තරණය කරවනු මැනව.

42. "ඔවුන්ගේ කෙලෙස් ඉක්මවූවාහු ඔබවහන්සේ විසින් ආශ්‍රවයෝ පළනලද්දාහුය. ප්‍රහීනකළ භය හා භයානක අරමුණු නොගන්නා සිංහයෙක් වෙහිය.

43. "ලක්ෂණ පියුමක් යම්සේ ජලය හා නොගැටේද, එසේ පින්ද පව්ද යන දෙක ඔබවහන්සේ නොඅල්ලන්නේය. වීරයන් වහන්ස, පා දිගුකරණු මැනවි. සභියතෙමේ ශාස්තෘන් වහන්සේට වදියි."

44. ඉක්බිති සභිය පරිබ්‍රාජකතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපාමුල මුනින් වැටී භාග්‍යවතුන් වහන්සේට (මෙහි 1 වර්ගයේ 4. සූත්‍රයේ 8. ඡේදය යෙදිය යුතුයි.) ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමියි" කීයේය.

45. "සභියය පෙර අන්‍යතීර්ථකවූ යම්කෙනෙක් මේ ශාසනයෙහි පැවිද්ද කැමැත්තේ නම් උපසම්පදාව කැමැත්තේ නම්, හෙතෙම සාරමාසයක් හික්මෙයි, සතර මාසයකගේ ඇවෑමෙන් සතුටු කළ සිත් ඇති බැවින් භික්ෂූහු මහණකම පිණිස පැවිදි කරවත්, උපසම්පදාකරවත්, එනම් මෙහිදී පුද්ගලයන්ගේ තත්වය දැනගන්නා ලද්දාහ."

46. "ස්වාමීනි ඉදින් පෙර අන්‍යතීර්ථකවූ කෙනෙක් මේ ධර්මවිනයෙහි පැවිද්ද කැමති වන්නාහුද උපසම්පදාව කැමතිවන්නාහුද මහණකම පිණිස සාරමසක් හික්මෙත්ද, සාරමසක් ඇවෑමෙන් භික්ෂූන්ගේ සිත් සතුටු කළ බැවින් පැවිදිකරවත්ද, උපසම්පදා කරවත්ද, මම සතර අවුරුද්දක්

හික්මෙමි, සතර අවුරුද්දකට පසු භික්ෂූන් සතුටුකළ බැවින් මහණකමට පැවිදි කෙරෙත්වා, උපසම්පදා කෙරෙත්වා.”

47. “සභිය පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් පැවිද්ද ලැබූයේය. උපසම්පදාව ලැබූයේය. (මෙහි 1 වර්ගයේ 4. සූත්‍රයේ 9 (ii) ඡේදය යෙදිය යුතුයි) සභිය තෙමේ රහතන් වහන්සේලා අතුරෙන් කෙනෙක් වූයේය.”

33. **සෙලසූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ එක් දහස් දෙසිය පණහක් පමණ භික්ෂු සංඝයා සමග උතුරෙහිවූ අඟු ජනපදයෙහි චාරිකා කරණසේක් ආපණ නම්වූ උතුරෙහිවූ අඟු ජනපද වාසීන්ගේ නියම් ගමක්වීද, එහි වැඩිසේක.

2. කෙණිය ජටිලතෙම ශාක්‍යකුලයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ අඟු ජනපදයෙහි එක්දහස් දෙසියපණසක් පමණ භික්ෂු සංඝයා ඇති මහත් භික්ෂු සමූහයක් සමග ඇවිදින ගමන් ආපණයට පැමිණියේයි ඇසුවේය. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ (ii) ඒ මෙබඳු කීර්ති ශබ්දයක් පැනනැංගේය එනම් ‘මේ කාරණයෙනුදු ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ (iii) අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, විද්‍යාවන්ගෙන් හා චරණයන් ගෙන් යුක්තය, සුගතය, ලොකවිදූය, පුරුෂයන් දමනය කරණ නිරුත්තර සාරථියෙකි. දෙව්මිනිසුන්ගේ ශාස්තෘවරයාය. බුද්ධය, පින් ඇත්තේයයි’ කියායි. (iv) ‘හෙතෙමේ දෙවියන් සහිත මරුන් සහිත, බ්‍රහ්මයා සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත සත්වලොකය තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශකරයි, (v) හෙතෙම මුල යහපත් මැද යහපත් අග යහපත් අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත සම්පූර්ණයෙන් පිරුණු පිරිසිදු බ්‍රහ්මචර්ය ප්‍රකාශ කරයි. (vi) එබඳු රහතන්ගේ දර්ශනය යහපත්යයි’ සිතුයේය.

3. ඉක්බිති කෙණිය ජලටිලතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා

එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි කෙණිය ජලටියාට භාග්‍යවතුන් වහන්සේ (ii) දැහැමිකථාවෙන් කරුණු පෙන්විය. පින් කළයුතු බැව්හි සමාදන් කරවූයේය. වීර්ය වැඩිකළේය, සතුටු කෙළේය, ඉක්බිති කෙණිය ජටිලතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් අනුසස් පෙන්වන ලද්දේ, සමාදන් කරවන ලද්දේ. වීර්ය වැඩිකරණ ලද්දේ සතුටු කරණ ලද්දේ භාග්‍යවතුන් වහන්සේට, "භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග සෙට දින දානය ඉවසනු මැනැවැයි" කියේය.

4. මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ කෙණිය ජටිලයාට (ii) "කෙණිය, භික්ෂු සංඝයා මහත්ය, එක්දහස් දෙසිය පණසක් පමණය, ඔබද බමුණන් කෙරෙහි පැහැදුනෙකි"යි වදාළසේක. (iii) දෙවනුවත් (iv) කෙණිය ජටිලතෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, භික්ෂු සංඝයා එක්දහස්දෙසිය පණසක් වුවත් මම බ්‍රාහ්මණයන් කෙරෙහි පැහැදුන කෙනෙක්වුවත්, භවත් ගෞතමයන් වහන්සේ හෙට භික්ෂු සංඝයා සමග මගේ දානය ඉවසනු මැනවැයි" ආරාධනා කළේය. (v) දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ කෙණිය ජටිලයාට (මෙහි 4 (ii) යෙදිය යුතුයි.) තුන්වනුවත් කෙණිය (මෙහි 4 (iv) යෙදිය යුතුයි.) භාග්‍යවතුන් වහන්සේ කථානොකර ඉවසූසේක.

5. ඉක්බිති කෙණිය ජටිලතෙම භාග්‍යවතුන් වහන්සේ ඉවසා වදාළ බව දැන අස්නෙන් නැගිට තමාගේ ආශ්‍රමය යම් තැනෙක්හිද එහි ගියේය. ගොස් චිත්‍රාමාත්‍යයන්ටද නෑ සහලේ නෑයනටද "මගේ නෑ සහලේ නෑ වූ පින්වත්හු අසත්වා. මා විසින් මාගේ පින්වත් ශ්‍රමණ ගෞතමයන් හෙට දවසට පිණිස භික්ෂු සංඝයා සමග දනට ආරාධනා කෙළෙමි, යම්කාරණයකින් මට කයින් කරණ වැඩපලකට සහභාගිවව් යයි" කීවාහුය.

6. "පින්වත, එසේයයි" (ii) කෙණිය ජටිලයාගේ මිත්‍රයෝද අමාත්‍යයෝද නෑසහලේ නෑයෝද කෙණිය ජටිලයාට පිළිවදන්දී, සමහරෙක් ලිප් බඳිත්, සමහරෙක් දර පලත්, සමහරෙක් භාජන සෝදත් ඇතැම්කෙනෙක් දියසැලි පුරවත්, ඇතැම් කෙනෙක්

අසුන් පනවත්, කෙණිය ජටිල තෙමේ තමාම දන්ශාලාව සරසයි. (iii) ඒ අවස්ථාවෙහි නිඝණ්ඩු සහිත කෙටුභ ශාස්ත්‍රය දත්, නිරුක්ති ශාස්ත්‍ර දත්, ඉතිහාස පස්වෙනිකොට ඇති වෙදයද කියවන්නාවූ විතණ්ඩවාදය, මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රය දත් ත්‍රිවෙද පාරප්‍රාප්ත සෙල බ්‍රාහ්මණතෙම ආපණයෙහි වසයි. ගෝලයන් තුන්සීයකට මන්ත්‍ර කියවයි.

7. ඒ අවස්ථාවෙහි කෙණිය ජටිලතෙමේ සෙල බ්‍රාහ්මණයා කෙරෙහි අතිශයින් සතුටුවූයේවේ. ඉක්බිති සෙල බ්‍රාහ්මණතෙම මානවකයන් තුන්සියයක් පිරිවරකොට ඇත්තේ කෙණ්ඩාවලට සුව සලසන අටියෙන් ඇවිදින්නේ හැසිරෙන්නේ කෙණිය ජටිලයාගේ ආශ්‍රමය යම්තැනෙක්හිද එහි පැමිණියේය. (මෙහි 6 (ii) යෙදිය යුතුයි.) කෙණිය ආශ්‍රමික ජටිලයන් සෙල බ්‍රාහ්මණතෙම දුටුවේය. දැක කෙණිය ජටිලයාට, "කිමෙක්ද, භවත් කෙණියගේ ආවාහයක් හෝ විවාහයක් හෝ වන්නේද, මහායාගයක් වත් ඇත්තේද, හෙට හටසෙනාව ඇති මගධරටට අධිපති සෙනිය බිම්බිසාර රජුට හෝ බතකට ආරාධනා කරණ ලද්දේදැයි" ඇසීය. "භවත් සෙලය, මට (මෙහි මේ සූත්‍රයේ 4 (ii) සිට ඡෙදය යෙදිය යුතුයි.) එතකුදු වුවත් මට මහායාගයක් එළඹ සිටියේවේ. ශාක්‍ය කුලයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ අංගුත්තරාපයෙහි ඇවිදිනසේක් එක්දහස්දෙසිය පණසක් පමණවූ භික්ෂු සංඝයා සමග ආපනගමට වැඩිසේක. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡෙදයේ සිට "යහපත්ය" යන්න දක්වා යෙදිය යුතුයි) මා විසින් හෙට භික්ෂු සංඝයා සහිත උන්වහන්සේට දනට ආරාධනා කරණ ලද්දෙමි.

8. "පින්වත් කෙණිය බුද්ධයයි කීයෙහිද" "පින්වත්සෙල බුද්ධයයි කියමි." "පින්වත් කෙණිය, බුද්ධයයි කීයෙහිද?" "පින්වත්සෙල, බුද්ධයයි කීවෙමි." ඉක්බිති සෙලබ්‍රාහ්මණයාට බුද්ධ යන මේ ශබ්දය පවා ලොකයෙහි දුර්ලභය. අපගේ "මන්ත්‍රවල දෙතිස් මහාපුරුෂ ලක්ෂණ ආවාහුය. එයින් යුත් මහා පුරුෂයාට රහත්නොවී ඉදින් ගිහිගෙයි වෙසේද, ධාර්මිකවූ

දැහැමින් රජය ලැබ කරණ දිනනලද, ජනපද ඇති ස්ථිර භාවයට පැමිණි සත්රුවනින් යුත් සක්විති රජෙක්වේ. ඔහුට චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, පරිනායකරත්නය යන මේ රත්න හතවෙත්, ඔහුට දහසකට වඩා සූරවූ දිව්‍ය ශරීර සමානවූ විරුද්ධ සෙනා මර්ධනය කරණ පුත්‍රයෝ වෙත්. හෙතෙම සාගරය අවසන්කොට ඇති මේ පෘථිවිය දඬුවමින් තොරව, ආයුධයෙන් තොරව ධර්මයෙන් යටත් කොට ගෙන වසයි.

**9.** ඉදින් ගිහිගෙන් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිවූයේද ලොකයෙහි කෙලෙස් සෙවෙනි නැති අර්හත් සම්‍යක් සම්බුද්ධවේ. භවත් කෙණිය, දැන් කොහි වනාහි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භවත් ගෞතමයන් වහන්සේ වාසය කරයිද?" මෙසේ කී කල්හි දකුණත ගෙන සෙල බ්‍රාහ්මණයාට 'පින්වත් සෙලය මේ නිල්වනරොද යම් තැනක බබලයිද එතනයයි" කීයේය.

**10.** ඉක්බිති සෙල බ්‍රාහ්මණතෙම ඒ තරුණයන්ට කථාකෙළේය. පින්වත්නි, පියෙන් පිය නගා නිශ්ශබ්දව එත්වා. එකවර සිංහයන් මෙන් ඒ බුදුවරු විවේකයට කැමති බැවින් ලංවීමට පහසු නොවූ පුද්ගලයෝය. මම යම් වේලාවක ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සමග කථා කරන්නෙම්ද පින්වත්හු අතුරුකථා නොහෙළව්, පින්වත්හු මගේ කථාවේ අවසානය දක්වා නවතිත්වායි" කීයේය.

**12.** ඉක්බිති සෙල බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත් පසෙක සිටියේය. එකත් පසෙකසිටි සෙල බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහ පුරුෂ ලකුණු සලකා බැලූයේය. කොෂය ඇතුලේ සැඟවුනු පුරුෂනිමිත්ත හා පළල් දිවයන ලක්ෂණ දෙකක් හැර ඉතිරි ලක්ෂණ සෙල බ්‍රාහ්මණතෙම දුටුයේය. ඒ දෙකෙහි සැකකරයි, සොයා දුක්වෙයි. නිෂ්ටාවට නොයයි. නොපහදියි, ඉක්බිති

භාග්‍යවතුන් වහන්සේට මේ සිත පහළ විය. ‘මේ සෙල බ්‍රාහ්මණතෙමේ මාගේ මහා පුරුෂ ලක්ෂණ දෙකක් හැර ඉතිරි ලක්ෂණ දුටුයේය. කොෂයෙහි සැඟවී ඇති පුරුෂ නිමිත්තෙහිත් පළල් දිවෙහිත් සැකකරයි. සොයා දුක්වෙයි, නිෂ්ටාවට නොයයි නොපහදියි ‘ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ කොෂය ඇතුළෙහි ඇති පුරුෂ නිමිත්ත යම්සේ දක්නේද එබඳු ඍද්ධියක් ප්‍රභාර්යයක් පෑසේක. සේල බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ කොශයෙන් සැඟවී ඇති පුරුෂ නිමිත්ත දැක්කේය. ඊටපසු භාග්‍යවතුන් වහන්සේ දිව පිටකර දෙකන් සිදුරු ස්පර්ශ කර වූසේක. දෙනාසිකා සිදුරු පිරිමැදිසේක. සම්පූර්ණ නළල දිවෙන් වැසූසේක.

13. ඉක්බිති සෙල බ්‍රාහ්මණයාට ‘ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්පූර්ණ අඩුනැති දෙතිස් මහා පුරුෂ ලකුණින් යුක්තය, උන්වහන්සේ බුදුවීද, නොවීදැයි නොදනිමි. යම් කෙනෙක් බුදුවීනම් උන්වහන්සේලා තමන්ගේ ගුණ කියන කල්හි තමන් ප්‍රකටකෙරෙත් යන මේ කාරණය ආචාර්යවූ ප්‍රාචාර්යවූ වෘද්ධවූ, මහළුවූ, බමුණන්ගේ කීම මා විසින් අසනලදී. ශ්‍රමණගෞතමයන් ඉදිරියෙහි සුදුසු ගාථාවලින් උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙම් නම් යෙහෙකැයි සිතීය. ඉක්බිති සෙල බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි යොග්‍ය ගාථාවන්ගෙන් ස්තුති කළේය.

1. “සම්පූර්ණ සිරුරක් ඇති, යහපත්ව උපන් වීර්යවත්වූ සිත සතුටුකරන දැකුම් ඇති, භාග්‍යවතුන් වහන්සේ රන්වන් සිරුරක් ඇත්තේය. සුදු දත් ඇත්තේය.

2. “යහපත්ව උපන් මනුෂ්‍යයාගේ යම් ලක්ෂණ කෙනෙක් වෙත්ද, ඒ සියලු මහා පුරුෂ ලක්ෂණයෝ ඔබ වහන්සේගේ ශරීරයෙහි ඇත්තාහ.

3. “පැහැදුනු ඇස ඇත්තේය. යහපත් මුව මඬලක් ඇත්තේය. උස මහතය. ඍජුය ආනුභාසම්පන්නය, ශ්‍රමණ පිරිස මැද සූර්යාමෙන් බබළයි.

4. "ශ්‍රමණයන්වහන්ස, යහපත් දැකුම් ඇති රන්කඳකට බඳු සිවියක් ඇති, මෙවැනි උතුම් වර්ණයෙන් යුත් ඔබ වහන්සේට පැවිදිකමින් කවර ප්‍රයෝජනද?

5. "රථයන්ට වෘෂභයකු බඳු ඔබවහන්සේ ජම්බුද්වීපයට අධිපති සතර මහා දිවයින දිනනසුළු සක්විති රජවන්නට සුදුසුය.

6. "ගෞතමයන් වහන්ස, මහත් භොග ඇති රජවරු ඔබට අනුකූල වෙත්. රජුන් විසින් පුදන මනුෂ්‍යයන් විසින් පුදන අධිපතියෙක්ව රජ කරනු මැනව."

7. "භාග්‍යවතුන් වහන්සේ සෙලය ශ්‍රෙෂ්ඨ ධර්මරාජවූ මම රජෙක් වෙමි. යම් චක්‍රයක් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකිද ධර්මයෙන් ඒ ආඥාව පවත්වමි."

8. "සෙලතෙම නිරුත්තරවූ ධර්මරාජතෙමේ සම්බුද්ධ යයි අඳුන්වන්නේය, ධර්මයෙන් ආඥාව පවත්වන්නෙමියි කියන්නේය. මෙය ගෞතමයන් වහන්සේ ප්‍රකාශ කරණ සේක්වායි" කීයේය.

9. "පින්වත්හු විසින් පවත්වනලද ධර්ම චක්‍රයට අනුව ඔබවහන්සේ අනුගමනය කරණ සේනාපතියාවූ ශ්‍රාවකයා කවරේද?"

10. "සෙලය නිරුත්තරවූ යම් ධර්ම චක්‍රයක් ඇත්තේද මා විසින් පවත්වන ලද චක්‍රය තථාගතයන් වහන්සේගේ අනුජාතවූ සැරියුත් තෙරුන් පවත්වයි.

11. "දතයුත්ත දන්නාලදී. වැඩියුත්ත වඩනලදී. දුරුකළ යුත්ත දුරුකරණලදී. බ්‍රාහ්මණය එහෙයින් මම බුද්ධයෙමි.

12. "බමුණ, මා කෙරෙහි සැකය දුරුකරව, ස්ථිරසේ සිත පිහිටුවාගනුව, නිතර බුදුවරුන්ගේ දර්ශනය දුර්ලභවේ.

13. "බ්‍රාහ්මණය, ලෝකයෙහි යම් කෙනෙකුන්ගේ නිතර පහළවීම දුර්ලභද, බ්‍රාහ්මණය, ඒ මම රාගාදී කෙලෙස් කපන්නෙක් වූයෙම් සම්බුද්ධවෙමි.

14. "බ්‍රහ්මයෙකු වැනි කිසිවෙකුට සමාන නොවූ මර සෙනඟ පරදවන (මම) බිය නැත්තේ සියලු අමිත්‍රයන් වසඟ කොට සතුටුවෙමි."

15. "පසැස් ඇති කෙලෙසුන් කපාහරින මහාවීරතෙම සිංහයා මෙන් වනයෙහි නාදකරයි. උන්වහන්සේ යම්සේ දෙශනා කෙරෙද්ද, එයට කන් නමව්.

16. "බ්‍රහ්මයා බඳු උපමා ඇති මරසෙනඟ පරදවන බුදුන් දැක චණ්ඩලාදී නීච ජාති ඇත්තාවූද, කවරෙක් නොපහදින්නේද,

17. "යමෙක් මා කැමැත්තේද නවතීවා යමෙක් නොකැමැත්තේද යේවා මම ශ්‍රෙෂ්ඨ ප්‍රාඥයන් වහන්සේගේ සමීපයෙහි පැවිදිවන්නෙමි.

18. "පින්වත්හට ඉදින් මේ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේගේ ශාසනය කැමතිවේද, අපිද ශ්‍රෙෂ්ඨ ඥාණවන්තයා සමීපයෙහි පැවිදිවන්නෙමු.

13. "මේ තුන්සියයක් බ්‍රාහ්මණයෝ ඇඳිලිබැන්දාහු බඹසර ඉල්ලති. භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ සමීපයෙහි බ්‍රහ්මචර්යයෙහි හැසිරෙමු."

14. භාග්‍යවතුන් වහන්සේ, සේලය. බ්‍රහ්මචර්යය මනාකොට ප්‍රකාශකරන ලද්දේය. ඇස ඉදිරිපිට විපාක ඇත්තේය. කල්නොයවා දෙන විපාක ඇත්තේය. යම්තැනක අප්‍රමාදව හික්මෙන්නහුට ප්‍රව්‍රජ්‍යාව හිස එකක් නොවේ."

15. පිරිස් සහිත සෙල බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබූයේය. උපසම්පදාව ලැබූයේය. ඉක්බිති කෙණිය ජටිලතෙම ඒ රාත්‍රියට පසු ස්වකීය ආශ්‍රමයෙහි ප්‍රණීතවූ කඩා කෑයුතු අනුභවකළයුතු දෙය පිළියෙලකොට "භවත් ගෞතමයන් වහන්ස, කල්වන්නේය. දානය සූදානම් යයි" සැලකළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන කෙණිය ජටිලගේ ආශ්‍රමය යම්තැනෙක්හිද එහි වැඩියහ. ගොස් පනවනලද අස්නෙහි

භික්ෂුසංඝයා සමග වැඩහුන්සේක. ඉක්බිති කෙණිය ජටිලතෙමේ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා ප්‍රණීතවූ කෑයුතු අනුභව කළයුතු දෙයින් සියතින්ම වැළඳවූයේය. පැවරූයේය. ඉක්බිති කෙණිය ජටිලතෙමෙ වැළඳූ පාත්‍රයෙන් අහකට ගත් අත් ඇති බුදුන් ළඟට පැමිණ එක්තරා පහත් අස්නක් ගෙන එක්තපසෙක සිටියේය. එකත්පසෙක සිටි කෙණිය ජටිලයාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවන්ගෙන් අනුමෝදනා කළසේක.

1. "යාගයන්ට ගිනි දෙවියා පිදීම ප්‍රධානය. ඡන්දස්වලට සාවිත්‍රිය ප්‍රධානය. මිනිසුන්ට රජතෙමේ ප්‍රධානය. නදීන්ට සාගරය ප්‍රධානය.

2. "නැකැත් තරුවලට චන්ද්‍රයා ශ්‍රෙෂ්ඨය. තැවෙන දේවලින් සූර්යයා ප්‍රධානය. පින් කැමැත්තෙන් දන් දෙන්නන්ට ඒකාන්තයෙන් සංඝයා ප්‍රධානයි.

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කෙණිය ජටිලයා මේ ගාථාවලින් සතුටුකොට අස්නෙන් නැඟිට වැඩිසේක. ඉක්බිති ආයුෂ්මත් සෙලතෙමේ පිරිස සහිතව හුදකලාවූයේ බැහැරවූයේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වූයේ, නිවන වෙත යැවූ ජීවිත ඇතිව වාසයකරන්නේ නොබෝ කලකින් කුලපුත්‍රයෝ යමක් සඳහා ගිහිගෙන් නික්ම අනගාරියයයි කියනලද ශාසනයෙහි පැවිදිවෙත්ද, උතුම්වූ බ්‍රහ්මචර්යය අවසන්කොට ඇති එය මෙලොවතෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට වාසය කළේය. උත්පත්තිය ක්ෂයවිය. බඹසරවැස නිමවනලදී. කටයුත්ත කරණලදී. මින්මත්තට අනිකක් නැතැයි දනී දැනගත්තේය. පිරිස සහිත සෙල බ්‍රාහ්මණතෙමේ රහතුන් අතරෙහි කෙනෙක්විය. ඉක්බිති පිරිස් සහිත ආයුෂ්මත් සෙල භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ සිවුර ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි ඇඳිලිබැඳ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීයේය.

1. "ඇස් ඇති භාග්‍යවතුන් වහන්ස, මින් අටවෙනි දිනයෙහි ඔබවහන්සේගේ පිහිට ලබා සප්ත රත්නයක් ඇති ශාසනයෙහි හික්මවූයේද,

2. "නුඹවහන්සේ බුද්ධය. නුඹවහන්සේ ශාස්තෲය. නුඹවහන්සේ මාරයන් මැඩපවත්වන මුනිය, නුඹවහන්සේ අනුශය සහිත කෙලෙස් නසා එතරවූයේ වාද පිරිසද එතර කෙළෙහිය.

3. "ඔබවහන්සේ විසින් කෙලෙස් ඉක්මවනලදී. නුඹවහන්සේ විසින් ආශ්‍රවයෝ පලන ලදහ. අත්හළ බිය හා භයානක අරමුණු ඇති තෘෂ්ණාදීන් නොගන්නාවූ සිංහයෙක් බඳු වූයෙහිය.

4. "තුන් සියයක් පමණ මේ භික්ෂූහු ඇඳිලි බැඳ සිටිත් වීරයන් වහන්ස, සිරිපා දික්කළ මැනව කෙලෙස් නොගන්නා නාගයෝ බුදුන් වඳිත්වා."

34. **සල්ල සූත්‍රය**:- 1. මේ ලෝකයෙහි මනුෂ්‍යයන්ගේ ජීවිතය මේ දක්වා ජීවත්වේයයි නිමිති රහිතය. මෙතෙක් කල් ජීවත්වේයයි නොදතහැක්ක, දුකකි, ස්වල්පය, නොයෙක් දුකින් යුක්තය.

2. උපන්නාහු යමකින් නොමැරෙත්ද, එබඳු උපක්‍රමයක් නැත්තේය. ජරාවට පැමිණ හෝ නොපැමිණ මරණයවේ. මෙය සත්වයාගේ ස්වභාව නියමයයි.

3. ඉදුන හෝ පැසුන ගෙඩි උදේ වැටේයයි බිය ඇතිවීම මෙන් උපන් මනුෂ්‍යයන්ට නිතර මරණින් බිය ඇතිවේ.

4. යම්සේ කුඹලා විසින් කරණ ලද මැටි බඳුන් සියල්ල බිඳීම අවසන්කොට ඇත්තාහුද මනුෂ්‍යයන්ගේ ජීවිතය එසේය.

5. ළදරුවෝද, මහල්ලෝද යම් මෝඩයෝ වෙත්ද යම් පණ්ඩිතයෝ වෙද්ද සියල්ලෝ මාරයාගේ වසගයට යති. සියල්ලෝ මරණය පිහිටකොට ඇත්තාහ.

6. පරලොවට යන්නාවූ මරණයෙන් පීඩිතවූ ඔවුන්ගේ පියතෙමේ පුත්‍රයා රකී. නෑයෙක් හෝ නෑයන් රැක නොගනී.

7. නෑයන් බලා සිටියදී බොහෝදෙනාගේ බැගෑහඬ බලන්න. ගවයන් මරන්නෙකු මෙන් මාරයා මනුෂ්‍යයන් අතරින් එකෙකු බැගින් ගෙනයයි.

8. මෙසේ ලෝකයා මරණයෙන්ද, ජරාවෙන්ද පෙළෙන ලදී. එසේ හෙයින් වීර්යවන්තතෙමේ ලොක ස්වභාවය දැන ශොක නොකරත්.

9. ආවාවූ හෝ ගියාවූ යමෙකුගේ මාර්ගය නොදනීද දෙපස නොදන්නේ තේරුමක් නැතිව අඬන්නේය.

10. ඉදින් අඬන්නේ නම් කිසි තේරුමක් ඇතිවිය යුතුය. ඇඬීම මුළාවකි. තමන්ට හිංසාවකි. ඇඬීමෙන් පලක් වන්නේ නම් ඤාණවන්තයාත් මෙය කරන්නේය.

11. හැඬීමෙන්, ශොකයෙන්වත් සිතට සැනසීමක් නැත. බොහෝ සෙයින් දුක් උපදවයි. ශරීරයද නැසෙයි.

12. තමා විසින් තමා හිංසාකරන්නේ කෘශවේ, විවර්ණවේ. ඉන් කළුරිය කළ අය පොෂ්‍යය නොවේ, ඇඬීම ප්‍රයෝජනයක් නැත.

13. ශොකය දුරුනොකරණ සත්වතෙමේ බොහෝ සෙයින් දුකට පැමිණේ. කළුරිය කළහු අනුව ශොක නොකරන්නේ ශොකයාගේ වසඟයට යන්නේය.

14. පරලොවට යන්ට සූදානම් වී සිටින කම් වූ පරිදි යන අනික් සත්වයන්ද බලව. මේ ලෝකයෙහි ප්‍රාණීහු මරහුගේ වසඟයට පැමිණ වෙවුලත්.

15. යම් විධියකින් සිතත්ද ඊට පසු එය අන්පරිද්දකින් වේ. මෙවැනි වෙන්වීම හැඟීමට විරුද්ධය. ලෝකයාගේ විධිය බලව.

16. පුරුෂතෙම වර්ෂ සියයක් ජීවත්වන නමුදු ඊට වඩා හෝ සිටින නමුදු නෑ සමූහයාගෙන් වෙන්වේ. මෙලොව ජීවිතය අත්හරියි.

17. එහෙයින් රහතුන් වහන්සේගෙන් අසා වැළපීම අත්හැර කළුරිය කළ මළහු දැක මා විසින් හෙතෙම නොලද්ද හැක්කැයි දැන.

18. යම්සේ පිහිට ගන්නේද ඇඬීමෙන් ඈත්ව කෙලෙස් නැසීමෙන් පිරිනිවියේය. මෙසේ වීර්යවත් ඤාණවත් පණ්ඩිත

වූ දක්ෂවූ මනුෂ්‍යතෙමේ උපන් ක්‍රොධය වහා වාතය පුළුන් මෙන් නසන්නේය.

**19.** වැළපීමද, තෘෂ්ණාවද තමාගේ දොම්නසද තමහට සැප බලාපොරොත්තු වන්නේ තමාගේ ශොකහුල උගුල්ලන්නේය. උගුල්ලා දමනලද ශොක හුල් ඇත්තේ තෘෂ්ණාදීන් නිශ්‍රය නොවූයේ සිතේ ශාන්තියට පැමිණ සියලු ශොක ඉක්මවූයේ ශෝක නැත්තේවේ.”

**35. වාසෙට්ඨ සූත්‍රයඃ-** 1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල නුවර ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කරණසේක. එකල්හි වනාහි බොහෝ ප්‍රසිද්ධ මහාසාර බ්‍රාහ්මණයෝ ඉච්ඡානංගලයෙහි වාසය කෙරෙත්. ඒ කවරහුද, වංකී, තාරුක්ඛ, පොක්ඛරසාතී, ජානුස්සොනී, තොදෙය්‍ය යන බ්‍රාහ්මණයෝද අනිකුදු ප්‍රසිද්ධ මහාසාර බ්‍රාහ්මණයෝද වෙති. පා සුඛය පිණිස සක්මන් කරණ හැසිරෙන වාසෙට්ඨ භාරද්වාජ යන තරුණයන් අතර මේ කථාව විය.

**2.** පින්වත, කෙසේ බ්‍රාහ්මණයෙක්වේද, භාරද්වාජ මානවක තෙම පින්වත, යම්තැනෙක සිට මවු පිය දෙපසින් යහපත්ව උපන්නේවේද, අමිශ්‍ර කුසක් ඇති බැමිණියකගේ කුසින් උපන්නේද, සත්වෙනි පිය පරම්පරාව දක්වා හීන ජාතියයි කියා බැහැර නොකරණ ලද්දේ ආක්‍රොශ නොකරණ ලද්දේ වේද, මෙපමණකින් බ්‍රාහ්මණයෙක් වේයයි කීයේය.

**3.** වාසෙට්ඨ තරුණතෙම පින්වත යම්තැනක සිට සිල්වත් වේද, සිරිත්වලින් යුක්තවේද, මෙපමණකින් බමුණෙකුවේ යයි කීයේය. භාරද්වාජ තරුණතෙමේ වාසෙට්ඨ තරුණයාට අවබොධ කරවන්ට නොහැකිවිය. වාසෙට්ඨ තරුණතෙම භාරද්වාජ තරුණයාට අවබොධ කරන්නට නොහැකිවිය. ඉක්බිති වාසෙට්ඨ තරුණතෙම භාරද්වාජ තරුණයාට කථා කෙළේය. “පින්වත් භාරද්වාජය, ශාක්‍ය වංශයෙන් පැවිදිවූ ශ්‍රමණ ගෞතමතෙමේ ඉච්ඡානංගල නුවර ඉච්ඡානංගල වනලැහැබෙහි

වාසයකරණසේක. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ මේ කාරණයෙන්ද අර්හත්ය.

(මෙහි 3 වර්ගයේ 33 සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

4. පින් ඇත්තේයයි මෙබඳු යහපත් කීර්ති ශබ්දයක් පැනනැංගේය. පින්වත් භාරද්වාජය යමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණෙමු. පැමිණ ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් මේ කාරණය විචාරමු. අපට ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම්විධියක ප්‍රකාශකෙරේද, එසේ එය දරමු. "පින්වත එසේයයි" භාරද්වාජ තරුණතෙම වාසෙට්ඨ තරුණයාට පිළිතුරු දුන්නේය. ඉක්බිති වාසෙට්ඨ භාරද්වාජ තරුණයෝ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත් පසෙක හිඳගත්තාහ. එකත් පසෙකහුන් වාසෙට්ඨ මානවක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

1. "අපි ත්‍රිවිද්‍යා ඇත්තෝයයි ආචාර්යයන් විසින් කියන ලද්දෙමු. අපිද එසේ කියමු. දෙදෙනාගෙන් මම පොක්ඛරසාතිගේ ගෝලයෙක්මි. මේ තෙමේ තාරුක්ඛගේ ගෝලයෙකි.

2. "ත්‍රිවිද්‍යායයි යමක් කියන ලද ද අපි එහි නිෂ්ටාවට ගියෙමු. පද වශයෙන් ප්‍රකාශ කිරීමෙන් වෙදයෙහි ගුරුවරුන් සමානවෙමු.

3. "ගෞතමයන්වහන්ස, ඒ අපට විවාදයක් ඇත්තේය. එනම් භාරද්වාජතෙම ජාතියෙන් බ්‍රාහ්මණයෙක් වේයයි කියයි. ඇස් ඇත්ත, මම ක්‍රමයෙන් බ්‍රාහ්මණයෙක් වෙමියි කියමි.

4. "ඒ අපි ඔවුනොවුන් පිළිගන්වන්නට නොහැකි වෙමු. බුදුන් යයි ප්‍රකට භාග්‍යවතුන් වහන්සේගෙන් අසන්නට පැමිණියෙමු.

5. "ඇඳිලි බැඳගත් ජනයෝ ලෝකයෙහි සම්පූර්ණවූ චන්ද්‍රයා වැනි ගෞතමයන් වහන්සේ වෙත වඳිමින් නමස්කාර කරත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** "ලොකයට පහළ වූ ඇසක් වැනි ගෞතමයන් වහන්සේගෙන් විචාරමු. උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් වේද, නොහොත් කර්මයෙන් බ්‍රාහ්මණයෙක් වේද නොදන්නා හෙයින් අපි බ්‍රාහ්මණයා යම් පරිද්දෙකින් දනිමුද? එසේ අපට ප්‍රකාශ කරණු මැනවි.

**7.** "භාග්‍යවතුන් වහන්සේ වාසෙට්ඨය මම තොපට ඔවුන් පිළිවෙළින් ඒ වූ පරිද්දෙන් වෘක්ෂලතාවන්ගේද සත්වයන්ගේද ජාති භේදය ප්‍රකාශ කරන්නෙමි. ජාතීහු අනිකක් අනිකක් මය. (නා නා ප්‍රකාරය.)

**8.** "තෘණයන්හිත්, වෘක්ෂයන්හිත්, ජාති භෙදය දනිව්. එතකුදු වුවත් අපි තෘණය, අපි වෘක්ෂයයි නො කියයි. ජාතීහු නා නා ප්‍රකාරය.

**9.** "ඉක්බිති පණුවන් කෙරෙහිද පළගැටියන් කෙරෙහිද කුඹි හින්නන් කෙරෙහිද, ජාතිභේද ඇත. ඔවුන්ට මුල් වූ සතුන්ට සමාන ජාති ඇත්තේය. ජාතීහු නා නා ප්‍රකාරය.

**10.** "කුඩාවූද ලොකුවූද, සිව්පාවුන් කෙරෙහිද ජාති භෙදයවේ. ඔවුන්ට මුල් වූ සතුන්ට සමාන ජාති ඇත්තේය. ජාතිය නා නා ප්‍රකාරය.

**11.** "දික් පිටක් ඇති බඩ පාදයන් කොටා ඇති සර්ප ජාතීන් කෙරෙහිද, ජාතිභෙදය වේ. ඔවුන්ට මුල්වූ සතුන්ට සමාන ජාති ඇත්තේය. ජාතිය නා නා ප්‍රකාරය.

**12.** "උදක නම් වූ ජලයෙහි හැසිරෙන මසුන් කෙරෙහිද, ජාතිභේදය කිව යුතුය. ජාතිය නා නා ප්‍රකාරය ඔවුන්ටද මුල් වූ සතුන්ට සමාන ජාති ඇත්තේය.

**13.** "පියාපත් වාහන කොට ඇති පක්ෂීන් කෙරෙහිද ජාති භෙදය කිවයුතුය. ඔවුන්ට මුල්වූ සතුන්ට සමාන ජාති ඇත්තේය. ජාතිය නානා ප්‍රකාරය.

**14.** "මේ ජාතීන්හි බොහෝ සෙයින් යම්සේ මුල්වූ වස්තුව ජාතියවේද, එසේ මනුෂ්‍යයන් අතරෙහි බොහෝසෙයින් ජාති අඳුනාගත හැකි මූලික වස්තුවක් නැත්තේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

15. "කෙස් වලිනුත් නොවේ, හිසෙනුත් නොවේ. කණිනුත් නොවේ. ඇස්වලිනුත් නොවේ. කටෙනුත් නොවේ. නාසයෙනුත් නොවේ. තොල්වලිනුත් නොවේ. බැමවලිනුත් නොවේ.

16. "බෙල්ලෙනුත් නොවේ, උරහිසෙනුත් නොවේ, බඩිනුත් නොවේ, පිටෙනුත් නොවේ, උකුලෙනුත් නොවේ, පපුවෙනුත් නොවේ, රහසඟිනුත් නොවේ, මෛථුනයෙනුත් නොවේ.

17. "අත්වලිනුත් නොවේ, පාවලිනුත් නොවේ, ඇඟිලි වලිනුත් නොවේ, නියවලිනුත් නොවේ, කෙණ්ඩාවලිනුත් නොවේ, කලවාවලිනුත් නොවේ, පාටිනුත් නොවේ, ශබ්දයෙනුත් නොවේ, අනිත් ජාතීන්හි මෙන් මුල්වූ වස්තුව ජාතිය අඳුනාගැනීම පිණිස නොවේ.

18. "තිරිසනුන්ගේ මේ ලක්ෂණ වෙන වෙනම ඇත. මිනිසුන් අතරෙහි මෙය විද්‍යාමාන නොවේ. මනුෂ්‍යයන් අතරෙහි කොටස වෙන්කිරීම සංඥාවෙන් කරණු ලැබේ.

19. "වාසෙට්ඨය මනුෂ්‍යයන් අතරෙහි යම් කිසිකෙනෙක් කුඹුරු කරමින් ජීවත් වේද්ද හෙතෙම ගොවියෙකි. බමුණෙක් නොවේ.

20. "වාසෙට්ඨය මනුෂ්‍යයන් අතර යම් කිසි කෙනෙක් නොයෙක් ශිල්පයන්ගෙන් ජීවත්වේද, හෙතෙම ශිල්පියෙකි බ්‍රාහ්මණයෙක් නොවේ.

21. "වාසෙට්ඨය මනුෂ්‍යයන් අතුරෙහි යම්කිසි කෙනෙක් වෙළඳාමෙන් ජීවත්වේද හෙතෙම වෙළෙන්දෙකි. බමුණෙක් නොවේ.

22. "වාසෙට්ඨය, මනුෂ්‍යයන් අතර යම්කිසි කෙනෙක් අනුන්ගේ බැලමෙහෙ කරමින් ජීවත්වේද, හෙතෙම පෙස්සිකයෙකි බ්‍රාහ්මණයෙක් නොවේ.

23. "වාසෙට්ඨය, මනුෂ්‍යයන් අතර යම් කිසි කෙනෙක් නුදුන්දේ ගැනීමෙන් ජීවත්වේද, හෙතෙම හොරෙකි බ්‍රාහ්මණයෙක් නොවේ.

**24.** "වාසෙට්ඨය, මනුෂ්‍යයන් අතරෙහි යම්කිසිකෙනෙක් ආයුධ වලින් ජීවිකාව කෙරේද හෙතෙම යුද්ධ භටයෙකි බ්‍රාහ්මණයෙක් නොවේයයි දනුව.

**25.** "වාසෙට්ඨය, මනුෂ්‍යයන් අතර යම් කිසි කෙනෙක් පුරොහිත කර්මයෙන් ජීවත්වේද හෙතෙම යදින්නෙකි. බමුණෙක් නොවේයයි දනුව.

**26.** "වාසෙට්ඨය, මනුෂ්‍යයන් අතරෙහි යම්කිසි කෙනෙක් ගමද රටද අනුභව කරයිද, හෙතෙම රජෙකි, බ්‍රාහ්මණයෙක් නොවේයයි දනුව.

**27.** "මම බ්‍රාහ්මණ ජාතියෙන් උපන්, මවකුගෙන් උපන් බ්‍රාහ්මණයෙකු නොකියමි. හෙතෙම ඉදින් රාගාදී කිසිවක් ඇත්තේවේද, පින්වත පින්වත යන වචන මාත්‍රයෙන් පමණක් උසස්වූයේ වේ.

**28.** "සියළු සංයොජන සිඳ යමෙක් ඒකාන්තයෙන් නොතැවේද, රාගාදී සංගනැති යොගයන් නැති බැවින් සංයොගනුවූ ඔහු බ්‍රාහ්මණයායයි මම කියමි.

**29.** "ක්‍රොධයද රැහැනද සිඳ අනුශයන් නික්මීම සමග දෙසැට දෘෂ්ටීන් සිඳ උගුල්ලා දමන ලද අවිද්‍යා නැමැති පලිඝ ඇති ඒ බුදුරජාණන් වහන්සේ මම බ්‍රාහ්මණයායයි කියමි.

**30.** "යමෙක් ද්වෙෂ සහගත නුවූයේ බැණීමද වධයට පැමිණවීමද බැඳීමද ඉවසයිද ඉවසීම නැමැති බලයද බලඇණියද ඇති ඔහු මම බ්‍රාහ්මණයායයි කියමි.

**31.** "ක්‍රොධ නොකරණ කෙලෙස් නසන සිරිත් ඇති සිල්වත් රාගාදී නැඟීම් නැති හික්මුණු අන්තිම ආත්මයෙහි උපන් ඔහු මම බ්‍රාහ්මණයායයි කියමි.

**32.** "නෙලුම් කොළයෙහි ජලය මෙන්ද හිදිකටු අගෙහි අබ ඇටය මෙන්ද යමෙක් කාමයන් නොතවරාගනීද මම ඔහු බ්‍රාහ්මණයා යයි කියමි.

**33.** "යමෙක් තෙම මෙහිම තමාගේ දුකෙහි විනාශය දනීද බහා තැබූ ස්කන්ධ බර ඇති කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවූ ඔහු මම බ්‍රාහ්මණයායයි කියමි.

34. "ගැඹුරු ප්‍රඥාඇති නුවණැති මග නොමග දත් උතුම් අභිවෘද්ධියට පැමිණි ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

35. "ගෘහස්ථයන් හා අනගාරික ශ්‍රමණයන් කෙරෙහිද යන දෙපක්ෂය හා නොගැටුනාවූ වැඩි බලාපොරොත්තු නැතිව ආලය නැතිව හැසිරෙන ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

36. "බියවන බියනොවන සත්වයන් කෙරෙහි දඬු බහා තබා යමෙක් නොමරද්ද හෙතෙම මම බ්‍රාහ්මණ යයි කියමි.

37. "විරුද්ධවූද ලෞකික ජනයා කෙරෙහි අවිරුද්ධවූ තමන්ට දඬුවම් කරණ ජනයන් කෙරෙහි බහා තැබූ දඬු ඇති මමය මාගේ යයි ගන්නවුන් අතරෙහි නොගන්නාවූ මෙබඳු පුද්ගලයා මම බ්‍රාහ්මණයයි කියමි.

38. "යමෙකු විසින් රාගයද ද්වෙෂයද මානයද ගුණමකුකමද හිඳිකටු අග අබ ඇටක් මෙන් හෙලන ලදද ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

39. "රළු නොවූ අර්ථයන් හඟවන සත්‍ය වචන ප්‍රකාශ කරත්ද, යම් වචනයකින් කිසිවකු කොප නොකරවයිද ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

40. "යමෙක් ලොකයෙහි දික්වූද, කොටවූද, සියුම්වූද, මහත්වූද, යහපත්වූද, අයහපත්වූද, නුදුන් දෙයක් නොගනීද ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

41. "යමෙකුට මෙලොවද පරලොවද ආශාවක් නැද්ද, ආශා නැත්තේ කෙලෙසුන්ගෙන් වෙන්වූ ඔහු මම බ්‍රාහ්මණ යයි කියමි.

42. "යමෙකුගේ බුද්ධාදී අටතන්හි සැකය දුරුවූයේවේද ආශා විද්‍යාමාන නොවෙත්ද, අමෘත මහා නිවනට බැසගත් ඔහු මම බ්‍රාහ්මණ යයි කියමි.

43. "යමෙක් තෙම මේ ලොකයෙහි පිනද පවද යන ඇලීම් දෙක ඉක්මවූයේද ශොක නැත්තේද රජස් නැත්තේද පිරිසිදුවූද ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

44. "පිරිසිදුවූ නොකැළඹුනාවූ නිර්මලවූ චන්ද්‍රයාමෙන් ඇලීමයයි කියන ලද භවයෙන් නික්මුණු ඔහු මම බ්‍රාහ්මණ යයි කියමි.

45. "යමෙක් තෙම මේ රාග නමැති දුර්ග මාර්ගයද සංසාර වෘත්තයද චතුරාර්යසත්‍යය නොපෙණෙන මුළාවද ඉක්මවූයේද තෘෂ්ණා නැත්තේ සැක නැත්තේ එතෙරවූයේ පරතෙරට ගියේ දැඩිකොට නොගෙන කෙලෙස් නිවීමෙන් නිවුන ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

46. "යම් කෙනෙක් තෙම මේ ලොකයෙහි කාමතෘෂ්ණාව අත්හැර ගෙයක් නැතිව පිරිනිවියේද තණ්හාවද භවයද ක්ෂය කළේ ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

47. "මනුෂ්‍ය ආයුෂයද පස්කම් සැපද අත්හැර දිව්‍ය ආයුෂද පස්කම් සැපද ඉක්මවා සියලු යොගයන්ගෙන් මිදුනු ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

48. "ඇල්මද නො ඇල්මද ඇත්හැර සිහිල්වූ කෙලෙස් රහිතවූයේ සියලු ලොකය මැඩ පවත්වන වීරයා මම බ්‍රාහ්මණයයි කියමි.

49. "යමෙක් තෙමේ සත්වයන්ගේ චුතියද උත්පත්තියද සර්වප්‍රකාරයෙන් දැනගත්තේද නොලැගෙන සුගතවූ බුදුරජාණන් වහන්සේ මම බුද්ධයයි කියමි.

50. "දෙවියෝද ගන්ධර්වයෝද මනුෂ්‍යයෝද යමෙකුගේ ගමන නොදනීද, කෙලෙස් ක්ෂය කළ රහත් උන්වහන්සේ මම බ්‍රාහ්මණයයි කියමි.

51. "අතීත වර්තමාන අනාගත ස්කන්ධයන්හි තෘෂ්ණාවෙන් ගැනීම් සංඛ්‍යාත ක්ලෙශයන් නැද්ද රාගාදී කිඤ්චනයක් නැති, ගැනීමක් නැති ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

52. "තැති නොගන්නා වෘෂභයකු වැනිවූ උතුම්වූ වීරවූ මාරයා දිනන ලද තෘෂ්ණා නැති කෙලෙසුන්ගෙන් දුරුවූ පිරිසිදුවූ බුදුරජාණන් වහන්සේ මම බ්‍රාහ්මණයයි කියමි.

53. "යමෙක් තෙම පූර්වෙනිවාසය දැනගත්තේද ස්වර්ග අපා දෙක දකීද නැවත උත්පත්තිය ක්ෂය කළේද ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

54. "තබන ලද නාම ගොත්‍රයක් වේද මෝ තොමෝ ලෝකයෙහි ව්‍යවහාර මාත්‍රයකි. යම් හෙයකින් ඒ සංඥාවෙන් ආවේද එයද උපන්පසු ඤාති සහ ලේ ඤාතින් විසින් තබන ලදී. ඔහු ජාති බ්‍රාහ්මණයයි කියමි.

55. "නොදන්නාවූ සත්වයන්ගේ සන්තානයෙහි මේ දෘෂ්ටි බැස ගන්නා ලදී. සන්තානයෙහි සයනය කරන ඒ නාම ගොත්‍ර නොදන්න හෙයින් ජාතියෙන් බ්‍රාහ්මණයෝ වේ යනු කියත්.

56. "උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් නොවේ. උත්පත්තියෙන් අබ්‍රාහ්මණයෙක් නොවේ. කර්මයෙන් බ්‍රාහ්මණයෙක් වේ. කර්මයෙන් අබ්‍රාහ්මණයෙක් වේ.

57. "කර්මයෙන් ගොවියෙක් වේ. කර්මයෙන් ශිල්පියෙක් වේ. කර්මයෙන් වෙළෙන්දෙක්වේ. කර්මයෙන් වැඩකාරයෙක් වේ.

58. "කර්මයෙන් හොරෙක් වේ. කර්මයෙන් යෝධයෙක් වේ. කර්මයෙන් අනුශාසකයෙක් වේ. කර්මයෙන් රජෙක්වේ.

59. "හේතු ප්‍රත්‍යධර්මය දන්නා කර්ම විපාකයෙහි දක්ෂ පණ්ඩිතයෝ මෙසේ මේ කර්ම තත් වූ පරිද්දෙන් දනී.

60. "ලෝකය කර්ම නිසා පවතී. සත්ව වර්ගයා කර්මය නිසා පවතී. කර්මයෙන් බැඳුණු සත්වයෝ රථයේ ඇණය මෙන් කර්මයෙන්ම යයි.

61. "ඉන්ද්‍රිය සංවරයෙන්ද බ්‍රහ්මචර්යාවෙන්ද, සීලයෙන් ද, ප්‍රඥාවෙන්ද යන මෙයින් බ්‍රාහ්මණයෙක්වේ. මේ උතුම් බ්‍රාහ්මණයායි.

62. "වාසෙට්ඨය, ත්‍රිවිද්‍යාවෙන් යුත් ශාන්තවූ ක්ෂය කළ උත්පත්තිය ඇති බ්‍රාහ්මණයා පමණක් නොව යම් කෙනෙක් මෙබඳු නම් බ්‍රාහ්මයාද ශක්‍රයාද වුවත් පණ්ඩිතයන් විසින් මෙසේ

දත යුතුය. මෙසේ වදාළ කල්හි වාසෙට්ඨ භාරද්වාජ මාණවකයන් දෙදෙන භාග්‍යවතුන් වහන්සේට (මෙහි 2 වර්ගයේ 19 සූත්‍රයේ 32 ඡේදයේ "භවත්" යන තැන් සිට අවසානය දක්වා යෙදිය යුතුයි.)

**36. කොකාලික සූත්‍රයඃ-** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු මහසිටාණන් කරවූ ජේතවන ආරාමයෙහි වාසය කරණසේක. (අංගුත්තර නිකායේ දශක නිපාතයේ ථෙර වර්ගයේ 39 කොකාලික සූත්‍රය යොදා ගත යුතුයි. (පිටු 1694) එහි නොමැති කොටස පමණක් මෙහි දැක්වේ.)

**5.** "බොරුකියන්නා නරකයෙහි උපදී. යම් කිසි කෙනෙක් පව් කොට නොකෙළෙම් කීයේද ලාමක කම ඇති ඒ මනුෂ්‍යයෝ දෙදෙන පර ලොවෙහිද එක සමාන වෙත්.

**6.** "යම් කිසි කෙනෙක් පිරිසිදුවූ පව්නැති පුරුෂයාට ද්වෙෂ කෙරේද, යටි සුළඟට දැමූ දූවිලිමෙන්, ඒ බාලයා කරාම පාපය ආපසු එයි.

**7.** "යම්කිසිවෙක් ලෝභයෙන් යුක්ත වූයේද, ශ්‍රද්ධාව නැත්තේද, තද ලෝභද, යාචකයන්ගේ වචන නොදන්නේද, මසුරුද කේලාම් කීමෙහි යෙදුනේද, හෙතෙම අන්‍යයන්ට වචනයෙන් නින්දා කරයි.

**8.** "විෂම මුඛයක් ඇති පුද්ගලය, බොරු කියන තැනැත්ත, අසත් පුරුෂය, අභිවෘද්ධිය නසන තැනැත්ත, අන්තිම පුරුෂය, ඉලක්කයක් නොමැති පුරුෂය, අවජාත පුත්‍රය, නපුරුකම් කරන තැනැත්ත, මෙහි වැඩිපුර කථා නොකරව. තිරිසනෙක් වෙහිද, පුරුෂයන්ට ගරහන නපුරු පව් කරණ තැනැත්තේ කෙලෙස් වගුරුවන්නේය. බොහෝ දුශ්චරිතයන්හි හැසිර බොහෝ කාලයක් ප්‍රපාතයට යන්නෙහිය.

"කිසිවෙකුගේ කර්මය නසින්නේ නොවේ. ඒ කුශලාකුශල කර්මය ස්වාමියා ලබන්නේමය. නපුරුකම් කරණ බාලයා දුක තමා කෙරෙහි දකියි.

9. "(නිරයෙහි යමපල්ලෝ) යකඩ අකුස්සෙන් ගසන ලද තන්හි තියුණු තළ නැමැති උල් ගසත්. නැවත රත් වූ ලෝ ගුලි වැනි භෝජන එහි ඇත්තේය.

10. "යමපල්ලෝ යහපත් වචන කථා නොකරත්. ආදරයෙන් ඉදිරියට නොපැමිණෙත්. ආරක්ෂාවට නොපැමිණේ. තුනී කළ අඟුරු උඩ නිදවත්. වටේට දැවෙන ගින්නෙහි ප්‍රවේශ කරවත්.

11. "යකඩ දැල් වලින් වෙලා මුව වැද්දෝ මුවෙකුට මෙන් වධ කරත්. අන්ධයෙකු වැනි ඔහු හිම මෙන් පැතුරුණු අන්ධකාරයට ගෙනයත්.

12. "නැවත දැල්වෙන ගිනි සමාන ලෝහයෙන් කළ මහා සැළියකට ඇතුලු කරවත්. ගිනි සමාන එහි උඩයට යමින් එමින් පැසෙත්.

13. "නැවත සැරව ලේ මිශ්‍රවූ, ලොහ සැලියෙහි පව් කළ තැනැත්තේ කුමකැයි පැසෙන්නේද, යම් යම් දිශාවකට යේද, ඒ සැරවින් ලෙයින් තැවරුනේ, කුණුවේ.

14. "පණුවන් වසන ඒ සැළියෙහි වූ ජලයෙහි පව් කළ ඒ තැනැත්තා පැසෙනු පමණක්ද, උඩ පියනත්, වසන ලද බැවින් පහව යන්නට තැනක් නැත.

15. "තියුණුවූ කඩුපත් වනයක් ඇත්තේය. සිඳුණු සිරුර ඇති ඔහු එහි ප්‍රවේශ කරවත්. බිලීකටු වෙන් දිව ඇද හඬවමින් විනාශ කරත්.

16. "නැවත උණුවූ කකියන ජලය සමග තියුණු දැලි පිහිතල ඇති වෙතරණී නම් ගඟක් ඇත. එහි පමුණුවත්, පව් කළ බාලයෝ පව් කොට එහි වැටෙත්.

17. "එහි නිල් පාට ඇති ශක්තිමත්, බල්ලෝද, අඬවමින් කත්. බඩ සා ඇති කපුටු සමූහය හා සිවල්ලුද, උකුස්සෝද කවුඩෝද, කා හප කරත්.

18. "මේ නරකයන්හි විසීම දුකකි. පව් කරණ යම් කෙනෙක් දකීද මේ ඉතිරි ජීවිතයෙහි කුශල ධර්ම කරන්නෙක් වන්නේය. මනුෂ්‍ය තෙමේ ප්‍රමාද නොවන්නේය.

**19.** "ගණිත දන්නන් විසින් පදුම නරකයට දක්වන යම් තල ගැල් ගණනක් වේද කෝටිනහුතයක්ද, දොළොස් කෙළක්ද, නැවත අනික් දොළොස් කෝටියක්ද වෙත්.

**20.** "මෙහි දක්වන ලද යම් පමණ දුක්වූ නරක වේද එහි ද බොහෝ කාලයක් විසිය යුතුය."

**37. නාලක සූත්‍රයː- 1.** "හටගත් ප්‍රීතිය ඇති සතුටුවූ සොම්නස්වූ කිලිටි නොහඳින දෙවියන් ශක්‍රයා පිරිවරා වස්ත්‍ර රැගෙන ඉතා ස්තුති කරමින් සිටිනු දවල් විවේක වාසයට ගිය අසිත ඍෂිතෙම දුටුවේය.

**2.** "සතුටු සිත් ඇති ඔද වැඩි දෙවියන් දැක ආදර කොට එහි දිව්‍ය සමූහයා ඉතා සතුටු සිත් ඇත්තෝව වස්ත්‍ර ගෙන කරකවන්නාහු කුමක් සඳහා දැ"යි ඇසීය.

**3.** "යම් කලෙක්හි අසුරයන් හා යුද්ධය වීද, දෙවියන්ට ජය අත්විය. අසුරයන්ට පරාජය අත්විය. එදාද මෙවැනි ලොමු ඩැහැගැනීමක් විය කවර නම් පුදුමයක් දැක දෙවියෝ සතුටු වූවාහුද?

**4.** "කටින් ප්‍රීති නාදයක් පිටවෙයි. ගායනා කරත්, වැයීම කෙරෙත්, අත් පොළසන් දෙත්, නටත්. මම තොප විචාරමි. මහමෙර මුදුනෙහි වසන තොප විචාරමි. නිදුකානෙනි මාගේ සැකය වහා නසව්."

**5.** "අසමාන ශ්‍රෙෂ්ඨ රත්නයක්වූ ඒ බොධි සත්වතෙම සැපය පිණිස උපන්නේය. ශාක්‍යයන්ගේ ජනපදයෙහිවූ ලුම්බිනි උයනෙහි මනුෂ්‍ය ලොකයට අභිවෘද්ධිය පිණිස උපන්නේය.

**6.** "සියලු සත්වයන්ට උතුම්වූ ශ්‍රෙෂ්ඨ පුද්ගලවූ නර ශ්‍රෙෂ්ඨවූ සියලු ප්‍රජාවන්ට උතුම්වූ උන්වහන්සේ ඍෂි නම් වනයෙහි බලවත් මෘගයන් මැඩපවත්වන සිංහයකු නාද කරන්නාක් මෙන් ධර්ම චක්‍රය පවත්වන්නේය.

**7.** "ඒ ශබ්දය අසා වහා බැස්සාවූ හෙතෙම ඒ වේලාවෙහි ශුද්ධොදන රාජ භවනයට පැමිණියේය. එහි වැඩහිඳ රජතුමනි කුමාරයා කොහිද මමත් දක්නා කැමැත්තෙමි"යි කීයේය.

8. "ඉක්බිති ශාක්‍ය රජතෙම අසිත තවුසාට කෝවෙහි දක්ෂලෙස දමාගන්නා ලද දිලිසෙන රන් රුවක් බඳු උසස් වර්ණයෙන් බබලන කුමාරයා දැක්වීය.

9. දිලිසෙන්නාවූ මොණරෙකු මෙන්ද, අහසින් යන පිරිසිදු තාරකාවක් මෙන්ද, ශරත් කාලයෙහි වළාකුල් වලින් මිදුනු තැවෙන සූර්යයා මෙන්ද, සතුටු සිත් ඇත්තාහු මහත් ප්‍රීතියක් ලැබූහ.

10. "නොයෙක් නන ඇති කැබලි දහසක් ඇති කුඩයක් දෙවියෝ අහසෙහි දැරූහ. රන්දඬු ඇති සෙමෙර සලත්, සෙමෙර කොඩි ගත්තවුන් නොපෙණෙත්.

11. කණ්හසිරි නම් ජටිලතෙම (අසිත) රන්වන් කම්බිලියෙක්හි වූ රන් කැබැල්ලක් මෙන්වූ කුමාරයා දැක මුදුනෙහි සේසත් දරමින් සතුටු සිතින් මුදුනින් පිළිගත්තේය.

12. "ලක්ෂණ ශාස්ත්‍රයෙහි හා මන්ත්‍ර ශාස්ත්‍රයෙහි පරතෙරට ගිය ජටිලතෙම ශාක්‍ය ශ්‍රෙෂ්ඨයා පිළිගෙන පරීක්ෂා කරන්නේ පැහැදුන සිතින් මෙතෙමේ නිරුත්තරය දෙපා ඇත්තන්ට උතුම්යයි වචන ප්‍රකාශ කෙළේය.

13. "නැවත තමාගේ පරලොව ගමන සිහි කරන්නේ නොසතුටු සිතින් කඳුළු වගුරුවයි. අඬන ඍෂිවරයා දැක ශාක්‍යයයෝ ඇයි දැයි ඇසූහ. "කුමාරයා කෙරෙහි අනතුරක් නැතැයි කීයේය."

14. "කණගාටුවූ ඍෂිවරයා දැක ශාක්‍යවරුන්ට "මම කුමාරයාට අයහපතක් නැතැයි කියමි. මොහුට අන්තරායක් නැත. මේතෙම එසේ මෙසේ කෙනෙක් නොවේ. ශ්‍රෙෂ්ඨ සිතින් යුක්තවන්නාහ.

15. "මේ කුමාරතෙම සර්වඥතාඥානය ස්පර්ශ කරන්නේය. ශ්‍රෙෂ්ඨ පිරිසිදුකම දක්නාවූ මෙතෙම බොහෝ ජනයාට හිතවත් අනුකම්පා ඇත්තේ ධර්ම චක්‍රය පවත්වන්නේය. මොහුගේ බ්‍රහ්මචරියාව පැතුරුණු එකක් වන්නේය.

16. "මාගේද ආයුෂ මේ ලොකයෙහි බොහෝ කලක් ඉතිරි නොවේ. මාගේ කළුරිය කිරීම අතරෙහි වන්නේය. ඒ මම

කිසිවෙකුට සමාන නැති වීර්යයක් ඇත්තහුගේ ධර්මය නො අසමි. එහෙයින් අඬමි. සැප නැති වීමි. දුක් වීමි.”

17. “ඒ බ්‍රහ්මචාරීතෙමේ ශාක්‍යයන්ට මහත් ප්‍රීතියක් උපදවා ඇතුළු පුරයෙන් නික්මුනේය. හෙතෙමේ බෑනා කෙරෙහි අනුකම්පාවෙන් ශ්‍රෙෂ්ඨ වීර්යවන්තයාගේ ධර්මයෙහි තෙමේම සමාදන් කරවූයේය.

18. “බුද්ධ යන වචනය යම් කලෙක්හි අනුන්ගෙන් අසන්නෙහිද, උන්වහන්සේ බුදුවී නිවනෙහි හැසිරෙති. එහි ගොස් තෙමේ අසා ඒ භාග්‍යවතුන් කෙරෙහි බ්‍රහ්මචර්යයෙහි හැසිරෙව.”

19. “හිතවත් අදහසින් ඔහු විසින් අවවාද කරණ ලද්දේ, සමාධිගත සිත් ඇති අනාගතයෙහි ශ්‍රෙෂ්ඨ පිරිසිදු කම බලාපොරොත්තු වන රැස් කරණලද පින් ඇති, ඒ නාලක කුමාරතෙම රක්නාලද ඉඳුරන් ඇත්තේ, බුදුන් බලාපොරොත්තු වෙමින් තවුස් වෙශයෙන් විසුවේය.

20. “මුනි ශ්‍රෙෂ්ඨයන් වහන්සේ දම්සක් පැවැත්වීම, දෙවියන්ගෙන් අසා ඉසිපතනයට ගොස් බුදුන් දැක අසා පැහැදුනේ අසිතයන්ගේ අවවාදයෙහි පිහිටා මුනි ශ්‍රෙෂ්ඨයන් වහන්සේගෙන් උතුම්වූ මොනෙය්‍ය ප්‍රතිපදාව ඇසූයේය.

(මොනෙය්‍ය ප්‍රතිපදාව.)

1. “අසිතගෙන් තත්වූ පරිද්දෙන් දැනගන්නා ලද මේ වචනය සියලු ධර්මයන්හි පරතෙරට ගිය ගෞතමයන්වහන්ස, ඔබවහන්සේගෙන් විචාරමි.

2. “පිඬු පිණිස හැසිරෙන අනගාරික භාවයට පැමිණි මා විසින් විචාරණ ලද්දාවූ මුනිතෙමේ මුනීන්ට අයත් (මොනෙය්‍ය) ප්‍රතිපදාව වදාරණු මැනව.”

3. “භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.” කරන්ට දුෂ්කර ඉවසීමට දුෂ්කර මුනීන්ට අයත් ප්‍රතිපදාව විවරණය කරන්නෙමි. තමාට වීර්යයෙන් ආධාර කරව,

4. "ආක්‍රොශ කරන්නන්ටද වඳින්නන්ටද ගමෙහි සමාන වන්න. සන්සුන් සිත් ඇතිව නොසන්සුන් නොවී හැසිරෙන්න. සිතේ දූශ්‍යවීම වලක්වන්න.

5. "ලැව් ගින්නෙහි ගිනි සිළුමෙන් උස් පහත් රූපයෝ ඇස් ආදියට හමුවෙයි. ස්ත්‍රීහු මුනිවරයා ලොභ කරවත්. ඔවුන් කෙරෙහි තොප ලොභ නොවිය යුතුය.

6. "යහපත් අයහපත් කාමයන් අත්හැර මෛථුන ධර්මයෙන් වෙන්වූයේ පිට ප්‍රාණීන් කෙරෙහි විරුද්ධ නොවී තමන්ගේ සතුන් කෙරෙහි නොඇලුනේ ජීවත්වනු කැමැත්තන් නොමැරීමෙන්ද සැප කැමති අයට දුක් වැද්ද නොදීමෙන්ද,

7. "මා යම්සේද මොවුනුත් එසේය. ඔව්හු යම්සේද මාත් එසේයයි" තමා උපමා කොට හිංසා නොකරන්නේය. නොනසන්නේය.

8. "යම් තැනෙක්හි පෘථග්ජන සත්වතෙම යම් චීවරාදී ප්‍රත්‍යයක ඉච්ඡා නම්වූ ලොභය අත්හැර ප්‍රත්‍යය පිණිස ආජීව පාරිශුද්ධි ශීලය නොවලක්වා නුවණැසින් පුරණ ඇස් ඇති මේ මොනෙය්‍ය ප්‍රතිපදාව රකින මහණ එසේ පිළිපැද මේ ප්‍රත්‍ය තණ්හා නම් නරකය දුරලන්නේය.

9. "කුස ඉඩ ඇති, ප්‍රමාණවත් ආහාර ඇති ප්‍රත්‍යය ලොභය නැති අල්ප ආශා ඇත්තෙක් වන්නේය. හෙතෙම ඒකාන්තයෙන් දුරුකළ ආශා ඇත්තේ නිවුනාවූ බලාපොරොත්තු නැත්තෙක් වන්නේය.

10. "හෙතෙම පිඬු පිණිස හැසිර වනයට යන්නේය වෘක්ෂ මූලයට පැමිණ වැඩ සිටින්නේය.

11. "ධ්‍යානයෙහි ඇලුන හෙතෙම වනයෙහි ඇලුනෙක් වන්නේය. තමා සතුටු වෙමින් ගසක් මුල ධ්‍යාන කරන්නේය.

12. "රාත්‍රිය ඉක්මවූ කල්හි ගමට යන්නේය. ආරාධනය නොඉවසන්නේය. ගමින් ගෙන එන ලද්දද නොඉවසන්නේය.

13. "මුනිතෙමේ ගමට පැමිණ කුලයන්හි වහා නොහැසිරෙන්නේය. ආහාර ගැන සුන් කථා ඇත්තේ වචනයෙන් නොඉල්වන්නේය.

14. "යමක් නොලැබුනු කල්හි නොලත් බව හොඳ යයිද ලද නොලද බැව්හි මධ්‍යස්ථවූයේ ගසක් ළඟට ගොස් ගෙඩි ලත් හෝ නොලත් තැනැත්තකුමෙන් කම්පා නොවන්නේය.

15. "අත්ලෙහිවූ පාත්‍රයෙන් යුක්තව හැසිරෙන්නාවූ හෙතෙම නොගොලුව ගොලුයයි සම්මතවූයේ ස්වල්ප දානයට නොගරහන්නේය. දෙන්නාට අවමන් නොකරන්නේය.

16. "ශ්‍රමණයන් වහන්සේ විසින් උස් පහත් ප්‍රතිපදාවන් ප්‍රකාශ කරණ ලද්දාහ. පරතෙරට දෙවරක් නොයත්. මෙය එක මාර්ගයකින් ස්පර්ශ කරණ ලද්දක් නොවේ.

17. "සුන්කරණ ලද කෙලෙස් වතුර ඇති යම් භික්ෂුවකට තෘෂ්ණාවක් නැද්ද, කුසල් අකුසල් නැති කිරීමෙන් දැවීමක් නැත්තේය.

18. "භාග්‍යවතුන් වහන්සේ ප්‍රත්‍යයන්හි කරකැත්තේ මුවාතකට බඳු උපමා ඇති මොනෙය්‍ය ප්‍රතිපදාව කියන්නෙමි. දිවෙන් තල්ල පෙලා රස තෘෂ්ණාව හැර උදරයෙහි සංවර වන්නේය.

19. "කුසීත සිත් ඇත්තේ වන්නේය. බොහෝ දේ ගැන නොසිතන්නේය. කෙලෙස් නැතිව, තණ්හාදීන් ඇසුරු නොකොට ශාසන බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නේය.

20. "සියලු ඉරියව්වෙහි හික්මෙන්නේය. ශ්‍රමණයන් විසින් ඇසුරු කටයුතු අරමුනෙහි හැසිරෙන්නේය. එකත්වය මොනයයි කියන ලදී. ඉදින් හුදකලාව සෙනසුන්හි ඇලෙන්නේය.

21. "දශ දිශාවෙන් එන ස්තුති වචන අසා ධ්‍යාන කරන්නාවූ වීර්යවන්තයන්ගේද, කාමය අත්හළවුන්ගේද ශබ්දයද අසා බොහෝසෙයින් ලජ්ජාවද ශ්‍රද්ධාවද මාගේ ශ්‍රාවක තෙම කරන්නේය.

22. "ඒ නිශ්ශබ්ද භාවය මූදට වදින ගංගා වලින් දතයුත්තාහ. ඇල වලින්ද දොළ වලින්ද කුඩා නදීන්ගෙන්ද, ශබ්දය දත යුත්තාහ.

23. "යමක් අඩුද එය ශබ්ද වෙයි. යමක් පිරුනේද, එය ශාන්තය. බාලයා දිය අඩු කළයක් සමානය. පණ්ඩිත තෙමේ පිරුණු සාගරය මෙනි.

24. "ශ්‍රමණතෙමේ යහපතින් යුත් යමක් බොහෝකොට කියාද, හෙතෙම දන්නේම ධර්ම දෙශනා කරයි. හෙතෙම දන්නේ බොහෝ කියයි.

25. "දන්නා දෙයක් අප්‍රසිද්ධව කීමෙන් සත්වයන්ට හිත පිණිස නොවේද, එය බොහෝ නොකියයි. ඒ මුනිතෙමේ මොනයට සුදුසුය. ඒ මුනිතෙමේ මේ මොනයට පැමිණියේය."

38. **ද්වයතානුපස්සනා සූත්‍රයඃ-** 1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මිගාරමාතා නම්වූ විශාඛාවන් විසින් කරවන ලද පූර්වාරාමයෙහි වාසය කරණසේක. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ සඳ පිරුණු පසළොස්වක් පොහෝ දිනයෙහි රාත්‍රියෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දේ එලිමහනෙහි වැඩ සිටිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භූතව වැඩ සිටි භික්ෂු සංඝයා බලා වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

2. "මහණෙනි, ආර්යවූ නික්මීම ඇතිකරන්නාවූ අර්හත්වයට පමුණුවන්නාවූ යම් ඒ කුශල ධර්ම කෙනෙක් ඇද්ද, මහණෙනි, ආර්යවූ නික්මීම ඇතිකරන්නාවූ අර්හත්වය දෙන්නාවූ ඒ කුශල ධර්මයන් ඇසීමෙන් කවර ප්‍රයෝජනද, මහණෙනි. මෙසේ විචාරන්නාහු ඇත්තාහ. තොප විසින් ඔවුන්ට කොටස් දෙකකින් යුත් කරුණු දැන ගැනීමටයයි, මෙසේ කිවයුත්තාහ. කවර දෙවිධියක්යයි කියන්නහුද? මේ දුකය මේ දුක ඉපදීමට හේතුවය යන මේ එක් අනුපස්සනාවකි. (සිහිකොට බැලීමකි) මේ දුක් නිරුද්ධවන තැනය. මේ දුක් නිරුද්ධ කිරීමට යන ප්‍රතිපදාවය. මේ දෙවෙනි අනුපස්සනාය (ii) මහණෙනි, මෙසේ මනාකොට අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව නිවන වෙත යැවූ සිත් ඇති මහණහට මෙලොවම රහත්බව හෝ ඉපදීම ඇති කල්හි අනාගාමි බව යන ප්‍රයොජන දෙක අතුරෙන් එක්තරා ප්‍රයොජනයක් කැමති විය යුත්තාහ. භාග්‍යවතුන්

වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවතද ශාස්තෲන් වහන්සේ මෙසේ වදාළ සේක.

3. "යම් කෙනෙක් දුක නොදනිද්ද නැවත දුක හටගැනීමද නොදනිද්ද, යම් තැනෙක්හි සර්වප්‍රකාරයෙන් දුක ඉතිරිනොවී සංසිඳේද, එයද දුක් සංසිඳීමට යන මාර්ගයද නොදනිද්ද,

4. "අර්හත් පළ සමාධියෙන් හීනවූ නැවත අර්හත් ඵල ප්‍රඥාවෙන්ද හීනවූ ඔව්හු සංසාර දුක කෙළවර කිරීමට අභව්‍ය ඔව්හු ඒකාන්තයෙන් උත්පත්ති මරණ දෙකට පැමිණියාහුය.

5. "යම් කෙනෙක් ඒකාන්තයෙන් දුක දනිද්ද, නැවත දුක ඉපදීමට හෙතුව දනිත්ද, යම් තැනෙක්හි දුක ඉතිරි නොකොට සිඳේද, දුක් සන්සිඳුවීමට යන ඒ මාර්ගය දනිත්ද,

6. (i) "අර්හත් ඵල සමාධියෙන් යුත් අර්හත්ඵල ප්‍රඥාවෙන් යුත් ඔව්හු සංසාර දුක කෙළවර කිරීමට සුදුසුය. (ii) ඔව්හු උත්පත්තිය ජරා දෙකට නොපැමිණෙත්.

7. "මහණෙනි, ඉදින් අනික් ක්‍රමයකින් මනාකොට ධර්ම දෙකක් නුවණැසින් දැනීම් ඇත්තාහු දැයි විචාරන්නාහු වන්නාහ. ඇත්තාහයි කිව යුත්තාහ. කෙසේ වන්නේද යම්කිසි දුකක් රැස්කරයිද සියල්ල අකුසල් හෙතුකොටගෙන යයි මේ එක් අනුපස්සනාවකි. කෙලෙසුන්ගේම ඉතුරු නොකොට වෙන්වීමෙන් නිරුද්ධ කිරීමෙන් දුකක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනාය (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යොදා යෙදිය යුතුයි.)

8. ලොකයෙහි යම්කිසි නොයෙක් රූපයෝ වෙත්ද ඒ නිසා ඇතිවන අකුසල් නිසා දුක් රැස් වෙත්. යමෙක් නොදැන පවු කරයිද, බාලතෙමේ නැවත නැවත දුකට පැමිණේ. සසර දුක හටගැනීමට හෙතුව උපධි (කෙලෙස්) යයි දැන දන්නා තැනැත්තේ එහෙයින් පව් නොකරන්නේය.

9. "මහණෙනි, අනික් ක්‍රමයකින් මනාකොට දෙකක් අනුව බලන්නේ ඇද්දැයි අසන්නාහු වන්නාහ. ඇතැයි කිව යුත්තාහ. කෙසේ වන්නේද? යම්කිසි දුකක් රැස් කරයිද, සියල්ල අවිද්‍යා

හෙතුකොටයයි මෙය එක් බැලීමකි. අවිද්‍යාව ඉතිරි නොකොට නැතිකිරීමෙන් දුක් රැස්වීමක් නැතැයි යන මෙය දෙවෙනි බැලීමය. (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

10. "යම් කෙනෙක් ස්කන්ධයන්ගේ ඉපදීමවූ ජාතියටද බිඳීමවූ මරණයටද ස්කන්ධ පිළිවෙළවූ සංසාරයටද, යම්කිසි කෙනෙක් යත්ද මේ මනුෂ්‍යාත්මභාවයටද අනික් කොටසකටද යාම අවිද්‍යාවෙන්මය.

11. "යමකින් මේ සත්වයා බොහෝ කලක් ඇවිද්දවන ලද්දේද මේ අවිද්‍යාව වනාහි මහා මොහයකි. යම් සත්වකෙනෙක් විද්‍යාවට ඇතුළුවූවාහුද නැවත උත්පත්තියකට නොපැමිණෙත්.

12. (මෙහි 6 (ii) සූත්‍රයේ ඡේදය යෙදිය යුතුයි.) "යම්කිසි දුකක් රැස්කෙරේද, සියල්ල සංස්කාර ප්‍රත්‍යයෙන් යයි යන මෙය එක් අනුපස්සනාවකි. සංස්කාර නැතිවීමෙන් දුක් පහළවීමක් නැත්තේය යන මෙය දෙවෙනි අනුපස්සනාය. (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

13. "සංස්කාර ප්‍රත්‍යයෙන් දුකයයි යන මේ දොෂය සියලු සංස්කාර සන්සිඳීමෙන් කාම සංඥාදිය මාර්ගයෙන් වැලැක්වීමෙන් මෙය තත්වූ පරිද්දෙන් දැන මෙසේ දුක් ක්ෂය වීමවේ.

14. "වෙදදත් පණ්ඩිතයෝ මනාකොට දැකීමෙන් මනාකොට දැන තුන්බිමට අයත් සසර මැඩපවත්වා නැවත භවයකට නොපැමිණේ (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි.)

15. "කෙසේ වන්නේද යම්කිසි දුකක් රැස්කෙරේද සියල්ල විඤ්ඤාණය හෙතුකොටගෙනයයි. මේ එක් අනුපස්සනාවකි. විඤ්ඤාණයාගේම ඉතිරි නොකොට දුරුකිරීමෙන් දුක් පැමිණීමක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනාවයි. (මේ මෙහි සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

16. "යම්කිසි දුකක් රැස්කෙරේද සියල්ල විඤ්ඤාණ හෙතුවෙන්ය. විඤ්ඤාණය නිරුද්ධවීමෙන් දුක් රැස්වීමක් නැත්තේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. "විඤ්ඤාණ හෙතුවෙන් දුක් ඇතිවෙයි යන මේ දොෂය දැක මහණ තෙම විඤ්ඤාණය නැතිකිරීමෙන් තෘෂ්ණා නැතිව පිරිනිවියේය.

18. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදාගත යුතුයි.) "කෙසේවන්නේද? යම්කිසි දුකක් රැස්කෙරේද සියල්ල ස්පර්ශ හෙතුවෙන්යයි මේ එක් අනුපස්සනාවකි. ස්පර්ශයාගේම ඉතිරි නොකොට වෙන්වීමෙන් නිරුද්ධවීමෙන් දුක් පහළවීමක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනාවයි. (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යෙදිය යුතුයි.)

19. "ස්පර්ශයට වසඟවූ තෘෂ්ණාව අනුව හැසිරෙන අයහපත් මාර්ගයට පිළිපන් ඔවුන්ට කෙලෙසුන් නැතිකිරීම දුරවේ.

20. "යම්කිසි කෙනෙක් ස්පර්ශය දැන කෙලෙස් සන්සිඳුවීමෙහි ඇලුනාවූ ඔව්හු ඒකාන්තයෙන් තෘෂ්ණා නැත්තේ පිරිනිවියේය.

21. (මෙහි මේ සූත්‍රයේ 5 (i) ඡේදය යෙදිය යුතුයි.) "කෙසේ වන්නේද? යම්කිසි දුකක් රැස්කෙරේද සියල්ල වේදනා හෙතුකොට ගෙනය යනු එක් අනුපස්සනාවකි, වෙදනාවම ඉතිරි නොකොට දුරුකිරීමෙන් දුක් පහළවීමක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනාය. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදාගත යුතුයි.)

22. "තමා තුළද පිටතද සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ යම්කිසි වෙදනාවක් ඇද්ද.

23. "මෙසේ දුකයයි දැන නැසෙන පලුදුවන සුළු ධර්මයන් ස්පර්ශ කරමින් මෙසේ එහි පිරිසිදු මේ මහණතෙම වෙදනාවන් ක්ෂයවීමෙන් තෘෂ්ණා රහිතව පිරිනිවීයේය.

24. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි) "කෙසේ වන්නේද යම්කිසි දුකක් රැස්කරයිද සියල්ල තෘෂ්ණා හෙතුවෙනි, යන මෙය එක් අනුපස්සනාවකි. තෘෂ්ණාවගේම ඉතිරි නොකොට ක්ෂය වීමෙන් දුක් රැස්කිරීමක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනායි.

25. "තෘෂ්ණාව දෙවෙනි කොට ඇති පුරුෂතෙම බොහෝ කාලයක් සැරිසරන්නේ ආත්ම භවයෙන් අනික් ආත්ම භාවයකටද යන සංසාරය නොඉක්මවයි.

26. "දුකට හෙතුව තෘෂ්ණාවයයි මේ දොෂය දැක පහවූ තෘෂ්ණා ඇත්තේ තෘෂ්ණා වශයෙන් නොගන්නාවූ මහණ තෙම සිහි ඇතිව පිරිනිවෙන්නේය.

27. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි.) "කෙසේ වන්නේද යම්කිසි දුකක් විඳීද සියල්ල දැඩිකොට ගැනීම හෙතුකොටගෙන යනු එක් අනුපස්සනාවකි. උපාදානයාගේ ඉතිරි නොකොට සන්සිඳුවීනේ දුක් ඇස්වීමක් නැතැයි මේ දෙවෙනි අනුපස්සනායි. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි.)

28. "උපාදාන හෙතුකොටගෙන භවයවේ. උපන්නේ දුකට පැමිණේ, උපන්නාට මරණය වේ. දුක පහළවීමට හේතුව මෙයයි.

29. "එහෙයින් පණ්ඩිතතෙම මනාකොට දැන උපාදාන ක්ෂය කිරීමෙන් උත්පත්තිය ක්ෂය කිරීම දැන උත්පත්තියකට නොඑයි.

30. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදාගත යුතුයි) කෙසේවන්නේද, යම් කිසි දුකක් රැස් කෙරේද, සියල්ල වීර්ය හෙතු කොට ගෙනය. මේ එක් අනුපස්සනාවකි. වීර්යය යන්ගේම ඉතිරි නොකොට සංසිඳුවීමෙන් දුක් රැස්වීමක් නැත්තේය යි. මෙය දෙවෙනි අනුපස්සනාය. (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යොදා ගත යුතුයි.)

31. යම්කිසි දුකක් රැස් කෙරේද සියල්ල වීර්යය හෙතු කොටගෙන වීර්යය නිරුද්ධවීමෙන් දුක් රැස්වීමක් නැත.

32. "වීර්ය හෙතුවෙන් දුකයයි මේ දොෂය දැක වීර්යය නැති නිවනෙහි ඇලුනාවූ

33. "සිඳින ලද භව ආශා ඇති සන්සුන් සිත් ඇති ඒ මහණහට ඉපදීම නැමැති සසර තරණය ඇත්තේ නැවත ඉපදීමක් නැත.

**34.** (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදා ගත යුතුයි.) "කෙසේ වන්නේද කිසි දුකක් රැස් කෙරේද, සියල්ල ආහරය හෙතු කොට ගෙනය යන මේ එක් අනුපස්සනාවකි. ආහාර අත්හැරීමෙන් දුක්රැස්වීමක් නැත්තේය. මේ දෙවෙනි අනුපස්සනාවය. (මෙහි මේ සූත්‍රයේ 2 (i) ඡේදය යොදාගත යුතුයි)

**35.** "යම්කිසි දුකක් රැස් කෙරේද, සියල්ල ආහාරය හෙතු කොටගෙනය. ආහාරය නැතිවීමෙන් දුක් රැස්වීමක් නැත.

**36.** "ආහාරය හෙතුවෙන් දුකයයි මේ දොෂය දැක සියලු ආහාරයන් දැන සියලු ආහාර ඇසුරු නොකොට

**37.** "නිරොගිකම මනා කොට දැන ආශ්‍රවයන් ක්ෂය වීමෙන් සිහිකොට අනුභව කරණ ධර්මයෙහි පිහිටි, වෙද දත් තැනැත්තේ දෙවියාය, මනුෂ්‍යයායයි ගණනට නොවැටේ (මෙහි මේ සූත්‍රයේ 6 (2) ඡේදය යොදාගත යුතුයි.) "කෙසේ වන්නේද, යම් කිසි දුකක් රැස් කෙරේද, සියල්ල තෘෂ්ණාදී හැඟීම් අනුවයයි. මේ එක් අනුපස්සනාවකි. තෘෂ්ණාදී හැඟීම් නැතිවූ කල්හි දුක් රැස්වීමක් නැත.

**39.** "තෘෂ්ණාදී හැඟීම් අනුව දුක් ඇතිවේය යන මේ දොෂය දැන, එනිසා තෘෂ්ණාව අත්හැර සංස්කාරයන් නිරුද්ධ කොට තෘෂ්ණාව නැතිව දැඩිව නොගෙන මහණ තෙම සිහි ඇතිව පිරිනිවෙන්නේය.

**40.** (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි) කෙසේ වන්නේද, තෘෂ්ණා දෘෂ්ටීන් ඇසුරු කළකල්හි බිය ඇති වේයයි යන එක් අනුපස්සනාවකි. තෘෂ්ණාව ඇසුරු කළේ බිය නොවෙයි යන මෙය දෙවන අනුපස්සනාවය. (මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යොදා ගත යුතුයි.)

**41.** "තෘෂ්ණා දෘෂ්ටීන් ඇසුරු නොකළේ බිය නොවේ. ඇසුරු කළේ තදින් අල්වා ගන්නේ මේ ආත්ම බැවින් අනෙක් අත් බවකට යන්නේ සසර නො ඉක්මවයි.

42. "තෘෂ්ණාදීන් ඇසුරු කිරීමෙහි මේ ආදීනවය දැක මහණතෙම ඇසුරු නො කළේ නොගන්නේ සිහි ඇතිව කළුරිය කරන්නේය.

43. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදාගත යුතුයි.) කෙසේ වන්නේද? මහණෙනි රූපයට වඩා අරූපයේ ශාන්තය යන මේ එක් අනුපස්සනාවකි. අරූපයන්ට වඩා නිවන ශාන්තයයි මේ දෙවෙනි අනුපස්සනාය. (මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යොදා ගත යුතුයි)

44. "රූපභවයට ගිය සත්වයෝ යම් කෙනෙක් වෙත්ද අරූපවාසීහු යම් පමණ වෙත්ද, නිවන නොදන්නාවූ ඔවුහු නැවත ඉපදීමට එන්නාහ.

45. "යම් කෙනෙක් රූපයන් විශිෂ්ට ඥානයෙන් දැන අරූපයෙහි සිටියාවූ යම් කෙනෙක් නිවනෙහි මිදුනාහුද ඒ ජනයෝ මාරයා අත් හැර යන්නේය. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යෙදිය යුතුයි.)

46. "කෙසේ වන්නේද? මහණෙනි, මාරයා සහිත බ්‍රහ්මයා සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාවෙහි දෙවියන් සහිත ලොකයෙහි මේ ඇත්ත යයි සිතන ලදද, ආර්යයන් විසින් එය බොරුවකැයි තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දක්නා ලදී. මෙය එක් අනුපස්සනාවකි. මහණෙනි, (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡේදය යොදාගත යුතුයි.) ආර්යයන් විසින් තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දක්නා ලදී. මේ දෙවෙනි අනුපස්සනායි (මෙහි මේ සූත්‍රයේ 2 (ii) ඡේදය යොදාගත යුතුයි.)

47. "ආත්ම නොවූවෙහි ආත්මය යන හැඟීම් ඇති දෙවියන් සහිත ලොකයා බලව. නාම රූප දෙකෙහි මෙයම ඇත්තයයි බැසගත්තේ තෘෂ්ණා දෘෂ්ටීන් හඟියි.

48. "යම් යම් විධියකින් හඟිත්ද, එය ඊට අන් පරිද්දෙකින් වේ. එය ඔහුගේ මුළාවකි. ස්වල්පවූ මුළා කරණ ධර්මයකි.

49. "නොනස්නා සුළු නිවන ආර්යයෝ ඇත්ත වශයෙන් දත යුත්තාහ. ඔව්හු ඒකාන්තයෙන් ඇත්ත අවබොධ වීමෙන් ආශා නැතිව පිරිනිවීයාහුය.

50. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡෙදය යෙදිය යුතුයි. "මහණෙනි තවත් ක්‍රමයකින් මනාකොට ද්වයතානුපස්සී වේදැයි මෙසේ විචාරන්නෝ ඇත්තාහ. ඇත්තාහයි කිව යුතුය. කෙසේ වන්නේද, (මෙහි මේ සූත්‍රයේ 6 (i) යෙදිය යුතුයි.) ලොකයෙහි මෙය සැපයයි සිතයිද, එය ආර්යයන් විසින් මේ දුකයයි තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දක්නාලදී. මේ එක් අනුපස්සනාවකි. (මෙහි මේ සූත්‍රයේ 6 (i) ඡෙදය යෙදිය යුතුයි.) මෙය දුකයයි සිතයිද, ආර්යයන් විසින් එය දුකයයි යහපත් ප්‍රඥාවෙන් දක්නා ලදී. මේ දෙවෙනි අනුපස්සනාවයි. මහණෙනි, මෙසේ මනාකොට දෙකක් බව සිහි කරණ අප්‍රමාදවූ කෙලෙස් තවන වීර්ය ඇති නිත් වෙත යොමුකළ සිත් ඇතිව වාසය කරණ මහණහට ඵල දෙක අතුරින් එක් ඵලයක් කැමති විය යුතුය. මේ ආත්මයෙහි රහත් බව හෝ උත්පත්තිය ඉතිරිව ඇති කල්හි අනාගාමි බව හෝයි" බුදුරජාණන් වහන්සේ මෙය වදාරා මෙසේත් වදාළසේක.

51. "රූපය, ශබ්දය, රසය, ගන්ධය, ස්පර්ශය, ධර්මය යන මේ යහපත්, කාන්ත මන වඩන යම් මේ අරමුණු සයක් ඇත්තේද,

52. "දෙවියන් සහිත ලොකයා විසින් සැපයයි සම්මතය. යම් තැනෙක්හි මොව්හු නැතිවෙත්ද එය දුක්යයි සම්මතය.

53. "ශරීරයාගේ වැළැක්ම සැපයයි ආර්යයන් විසින් දක්නාලදී. සියලු ලෝකයෙහි නොදැක්ම ප්‍රතිගාමී දෙයකි.

54. "අන්‍යයෝ යමක් සැපයයි කීවාහුද, ආර්යයෝ එය දුක්යයි කීහු. අන්‍යයෝ යමක් දුක්යයි කීවාහුද, ආර්යයෝ එය සැපයයි කීවාහුය. දතනොහැකි ධර්මයන් බලව. බාලයෝ මෙහි මුළාවෙති.

55. "අවිද්‍යාවෙන් වැසුනාවූ නිවන නොදක්නාවුන්ට අන්ධබව කරණ අන්ධකාරයවේ. සත්පුරුෂයන්ට ආලොකය

පෙණෙන්නාක් මෙන් නිවණ විවෘතවේ. මාර්ග අමාර්ග දෙකේ දක්ෂයාට තමාගේ ශරීරයෙහිම ඇති නිවන නොදනිත්.

54. "භවාසාවෙන් පීඩිතවූ, භව නැමැති සැඩපාරට අනුව යන කාම රූප අරූප යන සසරට බට තැනැත්තන් විසින් මේ ධර්මය සුවසේ අවබොධ නොකටහැකිය.

57. "යම් නිර්වාණ පදයක් මනාකොට දැන ආශ්‍රව රහිතව පිරිනිවෙයිද, බුදුරජාණන් වහන්සේ හෝ ආර්යයන් හැර නිවන අවබෝධ කරන්නට අන්කවරෙක් සමර්ථද, අසමර්ථමය."

(තුන්වෙනි මහාවර්ගය නිමි.)

---

## 4 අෂ්ටක වර්ගය

39. **කාම සූත්‍රය:-** 1. සත්වතෙමේ යම් කාමවස්තුවක් කැමැත්තේද, ඒ වස්තුකාමය කැමතිවන ඔහුට ඉදින් ලැබේ නම් හෙතෙම ඒ කාමවස්තුව ලැබ ඒකාන්තයෙන් සතුටු සිත් ඇතිවේ.

2. "රූපාදි වස්තුකාමයන් කැමතිවන්නාවූ හටගත් කාමයන්හි කැමැත්ත ඇත්තාවූ ඒ පුද්ගලයන්ගේ ඒ (රූපාදී) වස්තු කාමයෝ ඉදින් පිරිහත්ද, හෙතෙම හුලකින් විදුනාලද කලක් මෙන් තැවීමට පැමිණේ.

3. "යම් සත්වයෙක් (වස්තුකාම ක්ලේශ) කාමයන් පාදයෙන් සර්පයෙකුගේ හිස මෙන් දුරුකෙරේද, හෙතෙම (අපායාදී) ලොකයෙහි මේ තෘෂ්ණාව සිහි ඇතිව ඉක්ම වන්නේය.

4. "මේ මනුෂ්‍යයෙක්තෙම කුඹුරක් හෝ හේනක් හෝ රන් හෝ හරකුන් අශ්වයන් හෝ දාස පුරුෂයන් හෝ ස්ත්‍රීන් හෝ නෑයන් හෝ සෙසු බොහෝ රූපාදී කාමවස්තූන් හෝ ආශාකරන්නේද,

5. "ක්ලේශයෝ ඒ පුද්ගලයා මැඩපවත්වයි. උපද්‍රව ඒ පුද්ගලයා මඩිත්. බිඳුනු නැවක් කරා ජලය උනන්නාක් මෙන් දුක ඔහු අනුව එයි.)

6. "එහෙයින් සත්වතෙම හැමකල්හි සිහි ඇතිව (වස්තු) කාමයන් දුරුකරන්නේය. නිවනට (පරතෙරට) යනු කැමැත්තේ ක්ලේශ කාමයන් ප්‍රහීනකොට නැවෙහි දිය ඉස්සේම (කාමාදී) සතර මහ වතුර එතර කරන්නේය."

**40. ගුහට්ඨක සූත්‍රයඃ-** 1. "යම්බඳු සත්වයෙක්තෙම ශරීරයෙහි ඇලුණේ බෙහෙවින් (රාගාදී ක්ලේශ සමූහයෙන්) වැසුනේ රාගයෙන් යුක්තව සිටින්නේ මුළාවීමෙහි දැඩිව බැසගත්තේවේද, එබඳු ඒ සත්වතෙම (ත්‍රිවිධ) විවේකයෙන් ඈත්වූයේවේ. ලොකයෙහි වස්තුකාමයෝ සුවසේ නැතිකළ හැක්කාහු නොවෙත්මය.

2. "තෘෂ්ණාව මුල්කොට ඇති භව සුඛයෙහි බැඳුණු සත්වයෝ අනාගතයෙහි හෝ වස්තුකාමයන් අතීතයෙහි හෝ කැමතිවන්නාවූ මේ වර්තමාන කාමයන් හෝ පළමුකී (අතීතානාගතවිවිධ) කාම හෝ පතන්නාවූ ඒ සත්වයෝ දුකසේ මිදියහැක්කාහු නොවෙත්. අනුන් විසිනුත් මුදවාලන්නට නො හැක්කෝය. කාමයන්හි ගිජුවූ ඇලුනාවූ මුළාවූවාවූ, මසුරුකම් ඇති, කාය දුශ්චරිතාදී විෂමයෙහි පිහිටියාවූ, ඒ සත්වයෝ මරණ දුකට පැමිණියාහු මේ ආත්මභවයෙන් මැරීගියාවූ අපි කවර නම් ගතියකට පැමිණෙන්නෙමුදැයි වැළපෙත්.

4. "සත්වතෙම ලෝකයෙහි යම්කිසිවක් (කායදුශ්චරිතාදී ධර්මය) විෂමයයි දන්නේනම්, එහෙයින් ඊට (ඒ විෂමවූ කාය කර්මාදියට) හෙතුවූ විෂමය නොකරන්නේය. ඥාණවන්තයෝ මේ ජීවත්වීම අල්පයයි කියත්. එහෙයින් මේ සස්නෙහිම හික්මෙන්නේය.

5. "කාමභවාදියෙහ් පහනොවූ තෘෂ්ණා ඇති පහත්වූ යම් සත්ව කෙනෙක් මාරමුඛයෙහි වැලපෙත්ද, (අපායාදී) ලෝකයෙහි තෘෂ්ණාදී සැලීමෙන් සැලෙන්නාවූ කාමාදී භවයන්හි තෘෂ්ණාවෙන් මඩනාලද මේ සත්ව සමූහයා බලමි.

6. "හීනවූ ජල පහර ඇති ස්වල්ප ජලයෙක්හි ඔබිනොබ හැසිරෙන්නාවූ මසුන් මෙන් මාගේයයි අයත්කොට ගත් වස්තුවෙහි හැපෙන සත්වයන් බලමු. මෙයද දැක මමත්වය

('මගේ කම') නොකරන්නේ (කාමාදී) භවයන්හි ඇල්මක් නොකරමින් හැසිරෙන්නේය.

7. "නුවණැත්තේ (ස්පර්ශය, හා ස්පර්ශය පහළවීම යන) ස්ථාන දෙකහි ඡන්දරාගය දුරුකොට, (චක්ෂුස් ආදී) ස්පර්ශය පිරිසිඳ දැන ගිජු නොවූයේ යම් කර්මයක් තමහට නින්දා ඇතිකරන්නේද ඒ කර්මය නොකරමින් ඇසූ දුටු දෙයෙහි නොඇලෙයි.

8. "ඒ ක්ෂීණාශ්‍රව මුනිතෙම (කාමසංඥාදී හෙතුගත සංඥාව පිරිසිඳ දැන, (කාමාදී) සතරමහ වතුරු තරණය කරන්නේය. අල්වාගැනුම්වල නොඇලුනේ උගුල්ලා දමනලද උල් ඇත්තේ, අප්‍රමාදව හැසිරෙමින් (ස්වකීය ආත්මභාවවූ) මෙලොවද (පරආත්මභාව නම්) පරලොවද නොපතන්නේය."

41. **දුට්ඨක සූත්‍රයඃ-** 1. "ඇතැම් කෙනෙක් ඒකාන්තයෙන් නපුරු සිත් ඇත්තෝව කතාකරත්. නැවත යම් කෙනෙක් (ඔවුන් බස් අදහත්ද, ඔව්හු) සැබව යන හැඟීම් ඇත්තෝව කතාකරත්. (බුද්ධ) මුනිතෙම (අභූතයෙන්) උපන් ආක්‍රොශ වාදයටද නොඑළඹෙන්නේය. ඒ කරුණින් (බුද්ධ) මුනිතෙම කිසිතැනෙක්හි හුලක් නැතිසේ වන්නේය.

2. "කැමැත්තෙන් පමුණුවන ලද, රුචියෙන් බැසගත් තීර්ථකතෙම තමාගේ දැක්ම කෙසේ නම් ඉක්මවන්නේද, තමා විසින්ම සම්පූර්ණ කරනලද ඒ සියල්ල කරන්නේ දන්නේ යම්සේද එසේ කියන්නේය.

3. යම් පුද්ගලයෙක් තමාගේ (ප්‍රාතිමොක්ෂාදී) ශීලයන් හා (අරණ්‍යකාංගාදී) ව්‍රතයන් නොවිචාරණ ලද්දේම අන්‍යයන් හට කියන්නේද, යමෙක් තෙම තමා පිළිබඳව තෙමේම කියන්නේද, ඒ ආත්ම වර්ණනාව අයහපත් ධර්මයකැයි ආර්යයෝ කියත්.

4. "(රාගාදී කෙලෙස් යටපත් කිරීමෙන්) ශාන්තවූ මොනවට නිවුණු සිත් ඇති මහණතෙම මෙසේ සීලයන්හි ආත්ම වර්ණනය නොකියන්නේවේද, යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ රාගාදී ක්ලේශයෝ ලෝකයෙහි කිසිතැනෙකත් නැද්ද, එය (ඔහුගේ ඒ ආත්ම ගුණ අකථනය) ආර්යධර්මයෙකැයි දක්ෂයෝ කියත්."

5. "යමකට සිතනලද, සකස් කළ, (තෘෂ්ණාදෘෂ්ටි දෙකින්) පෙරටුකොට සිටියාවූ අපිරිසිදු (දෙසැට දෘෂ්ටිගත) ධර්මයෝ ඇත්තාහුද හෙතෙම යම්හෙයකින් තමා කෙරෙහි අනුසස් දක්නේද, එහෙයින් කොපයද, හේතුප්‍රත්‍යයෙන් උපන්බවද සම්මත නිවීම නම් ශාන්තියද, ඇසුරුකොට පවත්නේ වෙයි.

6. "මේ ඇත්තයයි බැසගැන්ම පහසුවෙන් අත්හැරිය නොහැක. ධර්මයන්හි (දෙසැට දෘෂ්ටියෙහි) බැසගත් බව නිශ්චයකොට පවත්නා හෙයිනි. එහෙයින් සත්වතෙම ඒ බැසගැනීම් ධර්මය දුරුකරන්නේ වෙයි, ගන්නේද වෙයි.

7. කෙළෙස් කම්පා කළ තැනැත්තාට (රහත් හට) කාමාදී ඒ ඒ භවයන්හි කල්පනා කරණලද ශාස්වතාදී දෘෂ්ටියෙක් ලොව කිසිතැනෙක්හි නැත්තේමය. ඒ කෙළෙස් කම්පා කළ තැනැත්තා මායාවද, මානයද දුරුකොට කිසිදු උත්පත්තියකට නොයන්නේය. හෙතෙම තෘෂ්ණාදී ඇස්කිරීම් වලින් ඇත්ය.

8. "තෘෂ්ණාදෘෂ්ටි ආදිය ඇත්තේ කාරණයන්හි වාදයට පැමිණේ. ඇස්කිරීම නැති රහත්තෙම කුමකින් (රාගාදී ධර්මයකින්) කෙසේ චොදනා ලබන්නේද, ඒ රහත් මහණහට ආත්මයක් හෝ උච්ඡෙද දෘෂ්ටියක් හෝ නැත්තේය. යම් හෙයකින් නිරාත්මයක් හෝ නැත්තේමය. හෙතෙම මේ ආත්මභාවයෙහිම සියලු දෘෂ්ටි නැතිකෙළේද වේ."

42. **සුද්ධට්ඨක සූත්‍රයඃ-** 1. "පිරිසිදුවූ, ශ්‍රෙෂ්ඨවූ, නිරොග භාවයට පැමිණියක්හු දකිම්යයිද, ඒ දැකීමෙන් සත්වයාගේ පිරිසිදුකමවේයයිද මෙසේ විශෙෂයෙන් දන්නේ ඒ දැකීම ශ්‍රෙෂ්ඨයයි දැන පිරිසිදුකම දක්නා සුළුවූයේ මාර්ගඥාණය අදහන්නේය.

2. "ඉදින් දැකීමෙන් සත්වයාගේ කෙලෙස් පිරිසිදුවීමවේද, ඒ සත්වතෙම නුවණින් හෝ (ජාත්‍යාදී) දුක් දුරුකරන්නේය. හෙතෙම රාගාදී කෙලෙස් සහිතවූයේ අනෙකකින් ශුද්ධවේ. දෘෂ්ටි තොමෝම එසේ කියන ඔහුට කියන්නේය.

3. "පිනෙහිද පවෙහිද නොඇලුණු, මමයයි ගැනීම පහකළ, මේ ලොකයෙහි කිසි කිරීමක් නැති, බ්‍රාහ්මණයන් වහන්සේ

අන්පරිද්දෙන් දැකීමකින් හෝ ඇසීමකින් හෝ සිතීමකින් හෝ ශීලයකින් හෝ වත් පිළිවෙතකින් හෝ (ක්ලෙශ) ශුද්ධිය නොකියන්නේය.

4. "යම් කෙනෙක් පළමු ශාස්තෘවරයා හැර අනිකක්හු ඇසුරුකළාහුද, කම්පාකරන්නාවූ තෘෂ්ණාව අනුව ගියාවූ ඔව්හු (රාගාදී) ඇලීම් එතර නොකරත්. ඔව්හු අල්ලා ගැනීම කෙරෙත්, බැහැරලීමද කෙරෙත්, පළමු අත්ත හැර අනික් අත්තක් ගන්නා වඳුරෙකු මෙනි.

5. "(කාමාදී) සංඥාවන්හි ඇලුණු සත්වතෙමේ තෙමේම (ඇත්ව්‍රතාදී) වත් සමාදන්ව උස් පහත් ශාස්තෘවරයන් ගැනුමට යන්නේය. මහාප්‍රාඥවූ ක්ෂීණාශ්‍රවතෙමේ සතර මාර්ග නම් වෙදයන් සමග ධර්මය දැන ලොකු කුඩා ශාස්තෘන් ඇදහුමට නොයයි.

6. "ඒ මහාක්ෂීණාශ්‍රවතෙම යම්කිසි දක්නා ලද්දක් හෝ අසනලද්දක් හෝ සිතින් දැනගත්තක් හෝ වේද, සියලු, ධර්මයන්හි මරසෙන් වනසා සිටියේය. මේ ලොකයෙහි කවරෙක් විවෘතව හැසිරෙන්නාවූ ඒ විශුද්ධිය දක්නාහු කවර ක්‍රමයකින් හිතන්නේද?

7. "ඔවුහු නොසිතත්, පෙරටු නොකෙරෙත්, ඔවුහු සම්පූර්ණ සුද්ධියයි නොකියත්, ගෙතුණාවූ ආශාදී බැම්ම සිඳපියා ලොකයෙහි කොතැන නමුත් තෘෂ්ණාව නොකරන්නේය.

8. "ඒ මහා ප්‍රාඥා ක්ෂීණාශ්‍රව තෙමේ (ක්ලෙශ) සීමාවන් ඉක්ම ගියේය. බමුණුත්වෙයි. ඕහට දැනද දැකද හොඳයයි බැසගත් ධර්මයක් නැත්තේය. හෙතෙමේ රාගයෙන් රත්වී නැත. විරාගයෙන් රත්වූයේද නොවෙයි. ඕහට මේ සත්වලොකයෙහි ශ්‍රෙෂ්ඨයයි දැඩිකොට අල්ලාගත් ක්ලෙශ ධර්මයක් නැත්තේය."

43. **පරමට්ඨක සූත්‍රය**:- 1. "ලොකයෙහි යම් සත්ව කෙනෙක් දෘෂ්ටීන් අතුරෙන් මෙය ශ්‍රෙෂ්ඨයයි ගෙන එහි වසමින් යමක් (ශාස්තෘවර ආදිය) උසස්කරයිද, ඉන්පිටත්හිවූ හැමදෙනාම පහත්යයි කියාද, ඒ කාරණයෙන් හෙතෙමේ විවාදයන් නොඉක්මවූයේවේ.

2. "කලහකරණ හෙතෙම දුටු දෙයෙහි හෝ ඇසූ දෙයෙහි හෝ සිතට දැනුණු දෙයෙහි හෝ ශීලයන්හි හා ව්‍රතයන්හි හෝ යම් ආනිශංසයක් තමා කෙරෙහි දක්නේද එහි (ස්වකීය ලබ්ධියෙහි) (එය ආනිශංසය) ම ඉහළින් පිළිගෙන අන්සියල්ල ලාමක වශයෙන් දන්නේය.

3. "(යම් ශාස්තෘවර ආදියක්) ඇසුරුකළේ අන්‍යයා හීනවශයෙන්ද දකීද, දක්ෂවූවෝ ඒ (දැකීම) ද ගැටයක් ලෙස කියත්. එහෙයින් මහණතෙම දුටුදෙය, ඇසූදෙය, සිතට දැනුණු දෙයද යන ශීලව්‍රත දෙක ඇසුරු නොකරන්නේය.

4. "ලොකයෙහි දෘෂ්ටියද ඥාණයකින් හෝ ශීල ව්‍රතයකින් හෝ නොහඟින්නේය. තවද තමාට සමයයි නොනැගෙන්නේය. නැවත හීනයයි නොහඟින්නේය. විශෙෂ කෙනෙකැයිද නොහඟින්නේය.

5. "හෙතෙම ආත්ම ස්නෙහය අත්හැර (අනිකක්) උපාදාන වශයෙන් නොගන්නේ ඤාණයෙහිද (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ආශ්‍රයක් නොකරයිද, හෙතෙම ඒකාන්තයෙන් භෙදවූ සත්වයන් කෙරෙහි බෙදී නොහැසිරෙන්නේ, තවද හෙතෙම කිසිඑකද දෘෂ්ටියකට නොපැමිණේ.

6. "යමකුට (රහත් නමකට) මේ දෙකෙළවරේහිද නැවත නැවත උත්පත්තියෙහිද, මෙලොවද පරලොවද තෘෂ්ණාවක් නැද්ද, ඒ ක්ෂීණාශ්‍රවයන්ට කිසි තෘෂ්ණා දෘෂ්ටි ඇතුළුවීමක් නැද්ද ධර්මයන්හි තීන්දුකොට දැඩිව ගන්නා ලද්දක් නැත්තේය.

7. "ඔහුට මෙහි හෝ දුටු ඇසූ සිතුදෙයෙහි හෝ (තෘෂ්ණාදී වශයෙන්) කල්පනාකළ ස්වල්පමාත්‍ර හැඟීමක් නැද්ද, මේ සත්වලොකයෙහි (දෙසැට) දෘෂ්ටිය නොගන්නාවූ ඒ බ්‍රාහ්මණයා කුමකින් කවරෙක් කල්පනා කරන්නේද,

8. "ඒ රහතුන් විසින් (දෙසැට මිථ්‍යාදෘෂ්ටි) ධර්මයෝ නොපිළිගන්නා ලද්දාහ, නොසිතවත්, පෙරටු නොකරත්, ක්ෂීණාශ්‍රව තෙමේ සීලව්‍රතයෙන් පමුණුවන්නෙක් නොවේ. අකම්ප්‍යවූ ක්ෂීණාශ්‍රවතෙම නිවනට ගියේ නැවත නොඑන්නේය."

44. ජරාසූත්‍රයඃ- 1. "මේ ජීවිතය ඒකාන්තයෙන් ස්වල්පය, අවුරුදු සියයෙන් මෙපිටද මැරෙන්නේය. ඉදින් යමෙක්තෙම අවුරුදු සියය ඉක්මවා ජීවත්වන්නේ නමුදු එකල්හි වනාහි හෙතෙම ජරාවෙන් හෝ මැරෙන්නේය.

2. "ජනයෝ මගේයයි ගත් දෙයින් ශොකකරත්, සදාකාලිකවූ අයිති දේ නැත. මේ (ජීවිතය) ඇත්තේම වෙන්වීමද වන්නේය. මෙසේ දැක ගිහිගෙයි නොවසන්නේය.

3. "පුරුෂතෙමේ මෙය මාගේයයි යමක් (රූපවෙදනාදියක්) සිතාද, එය මරණයෙන් හරින්නේය. මමත්වය ඇති පණ්ඩිත තෙමේ මේ දැක මමත්වය පිණිස නොනැමෙන්නේය.

4. "පිබිදුණු පුරුෂතෙම සිහිනෙන් දුටුවිරූදෙය නොදකීද එසේම මැරීගියාවූ, කළුරියකළාවූ ප්‍රියකළ ජනයා නොදකී.

5. "යමකුන්ගේ නම මේයයි කියනු ලැබේද, ඒ ජනයෝ දක්නාලදද අසනලදද පරලොව ගිය සත්වයාගේ නාමයම ව්‍යවහාර කරන්නට ඉතිරිවන්නේය.

6. "ගිජුවූවාහු මගේයයි ගත්තෙහි ශොකය, වැලපීම, මසුරුකම අත්නොහරිත්. එහෙයින් නිවන් දක්නාසුලු මුනිවරු අයිතිය හැරපියා හැසුරුණහ.

7. "විවේකයෙන් හැසිරෙන, වෙන්වූ අසුන සෙවුනාවූ, ඒ මහණහට යමෙක් තමා (නිරයාදි) ලෝකවල නොදක් වන්නේද තමාට නිරයාදියට නොයාම සාමග්‍රියයි කියත්.

8. "සියලු තන්හි (තෘෂ්ණාදෘෂ්ටි) ඇසුරු කිරීමක් නැති මුනිතෙම ප්‍රියභාවයද අප්‍රිය භාවයද නොකරන්නේය. ඔහු කෙරෙහි වැලපීම හා මසුරුකම නෙළුම් කොළයේ දිය මෙන් නොඇලෙයි.

9. "යම්සේ නෙළුම් පතක දියබිඳක්වත් නොසිටීද, යම්සේ නෙළුම් මලෙක ජලය නොද ඇලේද එසේ මුනිතෙම යම් මේ ඇසූ, දුටු, සිතූ දෙයෙහි හෝ නොඇලෙන්නේය.

10. "ක්ෂීණාශ්‍රවතෙම යම්මේ ඇසින් දක්නාලද කණින් අසනලද සිතින් සිතනලද දෙයෙහි හෝ නොහඟින්නේය. ඒ

රහත් මහණතෙම අන්පරිද්දකින් ශුද්ධිය නොකැමැතිවේ. හෙතෙම නොම ඇලෙයි. නොඇලෙන්නේද නොවේ.

**45.** "**තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රය**:- 1. "නිදුකානෙනි, මෙවුන්දම්හි යෙදුනහුගේ උවදුර වදාළ මැනව. ඔබගේ වචනය අසා කායාදි ත්‍රිවිධ විවේකයෙහි හික්මෙන්නම්හ" (ආයුෂ්මත්වූ මිත්‍රගේ පරපුරෙහි තිස්ස මෙසේ ඇසීය.)

**2.** "මෛත්‍රෙයය, මෛථුන ධර්මයෙහි යෙදුනහු ශාසනයද සිහිනොවේමය, ඔහු කෙරෙහි පහත් මිථ්‍යා ප්‍රතිපත්තියට පිළිපන්නේ වේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**3.** "යමෙක් පෙර තනිව හැසිර මෙවුන්දම් සෙවුනේද කැරකෙන යානයක් මෙන්වූ ඔහු ලෝකයෙහි හීනවූ පෘථග්ජනයාය කියත්.

**4.** "ඔහුගේ පෙරයම් යසසක් කීර්තියක්වීද, ඕතොමෝ පිරිහේමය. මෙය දැක මෛථුනය නැතිකිරීම පිණිස හික්මෙව්.

**5.** "සිතිවිලි වලින් මැඩගත් යමෙක් වේද, හෙතෙම දිළින්දෙක් මෙන් දැවෙයි. එබඳු තැනැත්තේ අන්‍යයන්ගේ වචන අසා ලජ්ජාවට පත්වේ.

**6.** "නැවත අන්‍යයන්ගේ වචන වලින් චොදනා කරණ ලද්දේ. වචන නමැති ආයුධ පාවිච්චි කරණු ලැබේ. ඔහුගේ මේ මහා තෘෂ්ණාව බොරුකීමට බැසගනී.

**7.** "පණ්ඩිතයයි කියන ලද තනිව හැසිරීමේ පිහිටි පුද්ගලතෙම ඉදින් මෙවුන්දම්හි යෙදේද, හෙතෙම මුළා වූවකු මෙන් හාත්පසින් වෙහෙසට පැමිණෙන්නේය.

**8.** "මේ ශාසනයෙහි මුනිතෙමේ පෙරවූ හා පසුවූ මේ වරද දැක තනිව හැසිරීම දැඩිකොට කරන්නේය. මෛථුනය ඇසුරු නොකරව්.

**9.** "ආර්යයන්ගේ උතුම්වූ මේ විවෙකයෙහිම හික්මෙව්. ඒ කරුණින් ශ්‍රෙෂ්ඨයයි නොහඟින්නේ නම් හෙතෙම ඒකාන්තයෙන්ම නිර්වාණය සමීපයේවේ.

**10.** "කාමයන් බලාපොරොත්තුවක් නැතිව හැසිරෙන්නාවූ (කාය දුශ්චරිතාදිය) හිස් සතර මහ වතුරු තරණය කළ බුදුන්ට කාමයන්හි බැඳුණාවූ මනුෂ්‍යයෝ ප්‍රශංසා කරත්."

**46. පසූර සූත්‍රයඃ- 1.** "යමක් ඇසුරු කළ එහි ශුභය කියන්නාහු මෙන් වෙනත් සත්‍යයන්හි බොහෝ සෙයින් බැස ගත්තාහු මෙහිම ක්ලෙශ ශුද්ධිය වේයයි" කියත්. අනෙක් ධර්මයන්හි විශුද්ධිය නොකීහ.

**2.** "වාද කරණු කැමති ඔහු පිරිසකට වැද ඔවුනොවුන් බාලයන් කොට දකිත්. අන්‍ය (ශාස්තෘවරයන් ඇසුරු කළාවූ ඔවුහු ප්‍රශංසා කැමැත්තෝව පණ්ඩිත වාද ඇත්තම්හයි." උඩඟු වචන කියත්.

**3.** "පිරිස් මැද (වාද) කථාවෙහි උත්සාහවත් වූයේ පැසසුම කැමති වෙමින් සැක කරන්නේ වෙයි. සිදුරු සොයන්නාවූ හෙතෙම බැහැර කළ කල්හි මකුවේ. නින්දාව නිසා කිපෙන්නේය.

**4.** "ඔහුගේ වාදය යම් හෙයකින් බැහැර කෙළේද ප්‍රශ්න විමසන්නෝ ලාමක යයි කියත්. පිරිහුන වාද ඇත්තේ මා ඉක්මවූයේයයි වැලපෙයි." ශොක කරයි, කෙඳිරිගායි.

**5.** "මේ විවාදයෝ (පිටත) ශ්‍රමණයන් කෙරෙහි පහළවූවාහු වෙති. මේ විවාදයන්හි නින්දාවද ප්‍රශංසාවද ඇති වේ. මේ දොෂය දැක කලහය නවත්වන්නේය. පැසසුම ලැබීමට වඩා වෙන වැඩක් නැත්තේය.

**6.** "එහි (ස්වකීය ලබ්ධියෙහි) ප්‍රශංසා කරණ ලද්දාවූ හෙතෙම පිරිස් මැදෙහි ඒ වාදය ප්‍රකාශ කොට එයින් සිනාසෙන්නේද උඩඟුමන් ඇත්තේද වේ, ඔහුගේ සිත යම්සේද වීද ඒ (ජය) කාරණයට පැමිණෙන්නේය.

**7.** "හෙතෙම මානය හා අතිමානය කියාපාන්නේය. මොහුගේ යම් උන්නතියක්වීද ඕතොමෝ විනාශ කාරණයවේ. මේ දොෂය දැක කලහ නොකරන්නේයි, දක්ෂයෝ එයින් (ක්ලෙශ) ශුද්ධිය නොකියත්.

8. "යම්සේ රාජ භොජනයෙන් පොෂ්‍යය කරණ ලද ශූරතෙම ප්‍රති ශූරයා පතමින් කෑගසමින් එන්නේ ඒ ප්‍රතිශූරයා යම් තැනකවීද එතැනින්ම යනු. කලහ පිණිසවූ යම්බඳු කෙළෙස් එය පෙර (බෝමුලේදී) ම නැත.

9. "යම් කෙනෙක් (දෙසැට දෘෂ්ටීන් අතුරෙන් එක්තරා දෘෂ්ටියක්) තදින් ගෙන කලහ කෙරෙත්ද, මෙයම සැබෑයයි කියත්ද, තවද යමෙක්තෙම වාදයක් හටගත් කල්හි විරුද්ධ කරුවෙක් වේද, එබඳුවූ ඔවුහු මේ සස්නෙහි නැතැයි ඔවුන්ට (දෘෂ්ටි ගතිකයනට) තෝ කියව.

10. "යම් කෙනෙක් (කෙළෙස්) මරසෙන් වනසා දෙසැට දෘෂ්ටීන් හා දෘෂ්ටිය වරද්දා නොගනිමින් ජීවිකාව කෙරෙත්ද පසූරය, මෙහි යම් කෙනෙකුන්ට ශ්‍රෙෂ්ඨයයි දැඩිව ගන්නා ලද්දක් නැත්ද ඔවුන් කෙරෙහි ඔබ කුමක් ලබන්නෙහිද?

11. "තවද තෝ සිතින් දෘෂ්ටීන් සිතමින් කල්පනා කරමින් ආයෙහිද කෙලෙස් කම්පා කළ තථාගතයන් වහන්සේ හා වාදයට තෝ පැමිණියෙහිය. එක් වචනයකුදු අසන්නට අසමර්ථයයි" කීයේය.

47. **මාගන්දිය සූත්‍රයඃ-** 1. "තණ්හාවද, අරතියද, රගාද යන මාර දුහිතෘන් දැකත් මෛථුන සෙවනයෙහි කැමැත්තක් නොවීය. දෙතිස් කුණින් පිරුණ මේ ශරීරය දැක මෙවුන්දම් සෙවීම තබා පයින්වත් ස්පර්ශ කරන්නට නොකැමැතිවෙමි."

2. "ඉදින් බොහෝ රජුන් විසින් පතන ලද මෙබඳු ස්ත්‍රීරත්නයක් නොකැමැත්තෙහි නම් ඒ දැකීම ද ශීලයද වත පිළිවෙතද ජීවිතයද උත්පත්තියද කෙබඳුදැයි වදාළ මැනව."

3. "මාගන්දිය, (දෙසැට) දෘෂ්ටීන් නිශ්චය කොට තදින් ගත් මේ දෘෂ්ටි ගැනීම කියමියි" ඒ මට අදහසක් නොවේ. දකිමිනුත් කිසිදෘෂ්ටියක් තදින් නොගෙන නිර්වාණය සොයන්නෙමි. එය මනාකොට දිටිමි'යි භාග්‍යවතුන් වහන්සේ (වදාළ සේක.)

4. යම් විනිශ්චයකින් සිතන ලද්දාහුද ඒවා මුනිවූ ඔබ ඒකාන්තයෙන් නොගෙන ඇතුළත සන්සිඳීමයයි" යම් මේ

පරමාර්ථයක් කීයෙහිද, ඥාණවන්තයන් විසින් දන්නා ලද එය කෙසේද (කියා මාගන්දිය තෙමේ විචාළේය.)

**5.** (භාග්‍යවතුන් වහන්සේ) "මාගන්දිය, මම දැක්මෙන් ඇසීමෙන්, (සමාපත්ති) ඥානයෙන් බාහිර ශීල ව්‍රතයෙන්ද මිදීම නොකියමි. නොදැක්මෙන්, නොඇසීමෙන් නොදැනීමෙන් ශීලයෙන් වෙන්වී ධුතාංග ව්‍රතයෙන් වෙන්වී, නොකියමි. මොවුන්ද හැරදමා, තදින් නොගෙන ශාන්තවූයේ, ඇසුරු කිරීමෙක් නැතිව සසර නොපතන්නට සමත්වේ."

**6.** (මාගන්දිය බමුණා මෙසේ කීයේය.) "ඉදින් වනාහී දැකීමෙන් ශුද්ධිය නොකියන්නේ නම් (මෙහි 5 ඡේදය යෙදිය යුතුයි.) මම ඔබගේ මේ ධර්මය මහා මුළාවකැයි හඟිමි ඇතැමෙක් දෘෂ්ටියෙන් සංසාර මුක්තිය අදහත්මය."

**7.** "මාගන්දිය, නුඹ දෘෂ්ටිය නිසා නැවත නැවතත් අසන්නෙහිය. දැඩිවගත් දෙයෙහි මුළාවට පැමිණියෙහිය. මෙයිනුදු ස්වල්ප මාත්‍රවූද හැඳිනීමක් නොදැක්කෙහිය. ඒ කාරණයෙන් නුඹ මහා මුළාවක් වශයෙන් දැක්කෙහියයි" භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**8.** "යමෙක් තෙම සමානයයි හෝ නොහොත් ශ්‍රෙෂ්ඨ යයි හෝ නැත හොත් හීනයයි හෝ සිතාද හෙතෙම එයින් විවාද කරන්නේය. ත්‍රිවිධ මානයෙන් කම්පා නොවන්නේ සමානයයි කියා හෝ ශ්‍රෙෂ්ඨ යයි කියා හෝ ඔහුට නොවන්නේය.

**9.** "ඒ ක්ෂීණාශ්‍රවතෙම සත්‍යයයි කුමක් නිසා කුමකට කියන්නේද? බොරුයයි හෝ කවුරුන් සමග වාද කරන්නේද, යමකු කෙරෙහි සම බවක් හෝ තවද විෂම බවක් හෝ නැද්ද? හෙතෙම කවරක්හු හා වාදයෙහි යෙදෙන්නේද?

**10.** "ගෙයි (තෘෂ්ණා වශයෙන්) නොහැසිරෙන මුනි තෙමේ විඤ්ඤාණයාගේ අවකාශය හැර ගිහි සබඳකම් නොකරමින් සියලු කාමයන් කෙරෙන් වෙන්වූයේ මතු නූපදින්නේ විරුද්ධ කථාවක් කිසිම කෙනෙකු සමග නොකරන්නේය.

**11.** "නාග (රහත්) තෙමේ යමකින් හිස්වූයේ ලොව හැසිරෙන්නේද, ඒ දෘෂ්ටීන් දැඩිව ගෙන නොකියන්නේය

ජලයෙහි උපන් කටුසහිත පද්මය යම්සේ ජලයෙන්ද මඩින්ද නොතැවරුනේද, එසේ අධ්‍යාත්ම ශාන්තිය ප්‍රකාශ කරන්නාවූ ගිජු නොවූ මුනි තෙම (වස්තු ක්ලෙශ) කාමයෙහිද (අපායාදී) ලොකයෙහිද නොඇලුණේ වන්නේය.

12. "(සතර මාර්ග සංඛ්‍යාත) වෙදයට පැමිණියේ දැක්මෙන් සිතීමෙන් සමාන බවට නො වේය එයින් වූවෙක් නොවේමය. හෙතෙම කර්මයෙන්ද ඇසීමෙන්ද පැමිණ විය හැකි නොවන්නේය. (තෘෂ්ණා දෘෂ්ටි) ගෘහයන්ට ඇතුළු නොවූයේය.

13. "පහවූ කාම සංඥා ඇත්තාහට ගැට නැත්තාහ. විදර්ශනාවෙන් (කෙලෙසුන්ගෙන්) මිදුනහුට මොහය නැත. යම් කෙනෙක් කාමාදී සංඥාද දෙසැට දෘෂ්ටියද දැඩිව ගත්තාහුද ඔව්හු ගැටෙන්නෝ ලෝකයෙහි හැසිරෙත්."

48. පුරා භෙද සූත්‍රයඃ- 1. "කෙසේ දකින කෙබඳු ස්වභාවයකින් යුත් පුද්ගලයා සන්සුන් දැයි කියනු ලැබේද? ගෞතමයන් වහන්ස, අසන ලද්දාවූ මට උතුම් පුද්ගලයා කියනු මැනව."

2. "යමෙක් තෙම ශරීරය බිඳෙන්ට පෙර තෘෂ්ණාව නැති කොට, අතීත ජීවිත ඇසුරු නොකොට වර්තමානයේද චොදනා නොකට හැක්කේද ඔහුට (තෘෂ්ණා දෘෂ්ටි අතුරෙන්) මුල්වන දෙයක් නැත්ද,

3. "නොකිපෙන ස්වභාව ඇත්තේද තැති නොගන්නේද ආත්ම වර්ණනා නොකරන්නේ සැක නැත්තේ පමණට කථා කරන්නේද, උඩඟු නොවූයේ හෙතෙම ඉදින් වචනයෙන් සංවරවූයේ වේද,

4. ඒ මුනිතෙම "අනාගතයෙහි තෘෂ්ණා නැත්තේ ඉක්ම ගිය වස්තුව අනුව ශොක නොකරයිද, ස්පර්ශාදියෙහි විමසා දක්නා සුළුත් වේද, දෙසැට දෘෂ්ටි විෂයෙහිද නොපමුණුවනු ලබන්නේය.

5. "රාගාදීන් කෙරෙන් පහවූ කුහක නොවූ, ආශා නැති මසුරුකම් නැති ආඩම්බර නැති නොපිළිකුල්වූ හෙතෙමේ කේළාම් කීමෙහිද නොයෙදේද,

6. "කාම වස්තූන්හි නො වැගිරෙන, අතිමානයෙහි නොයෙදුණු මොලොක් බැව්හි යුක්තවූ වැටහීමෙහි සමර්ථ නොඅදහන, නොකලකිරෙන,

7. "ලාභ කැමැත්තෙන් නොහික්මෙන්නේත් වේද, නොලැබීමෙහි නොකිපේද, විරුද්ධගති නැත්තේත් වේද, තෘෂ්ණායෙන් රසයන්හි ආශා නොකරන්නේ වේද,

8. "මැදහත් බව ඇති හැමකල්හි සිහි ඇති ලොකයෙහි සමයකු කොට නොහඟින, අතිමානී නොවන අවමානයට නොයන ඔහුට රාගාදී කෙලෙස් නැද්ද,

9. "යමකුට (තෘෂ්ණා දෘෂ්ටි) ආශ්‍රය නැත්ද, ධර්මය දැන නොඇලුණේද යමකු හට ශාස්වත දෘෂ්ටියෙහි හෝ උච්ඡෙද දෘෂ්ටියෙහි හෝ තණ්හාවක් නැද්ද,

10. "ඔහුට ගැට නැත්ද හෙතෙම මහා තෘෂ්ණාව එතර කෙළේද කාමයන්හි බලාපොරොත්තුවක් නැති, ඔහුට ඇතුළත සංසිඳුණේය කියනු ලැබේ.

11. "ඕහට පුත්‍රයෝ ගව මහිෂාදීහුද නැත ක්ෂෙත්‍ර නැත. ඉඩම් නැත, නැවත ඔහු කෙරෙහි හා ශාස්වත හෝ උච්ඡෙද හෝ දෘෂ්ටියක් නැත.

12. "රාගාදී යම් වරදකින් පෘථග්ජනයෝ හෝ මහණ බමුණෝ ඔහුට දොස් කියන්නාහුද, ඒ වරද ඉදිරියට නොඑන්නේය. එහෙත් හෙතෙම නින්දා පූර්වක වචනයෙන් නොසැලෙයි.

13. "පහකරණ ලද ගිජුකම් ඇති මසුරු මල නැති රහත් මහණතෙම විශිෂ්ටයකු කොට කියා නොගනියි. සදෘශයෙකැයිද ලාමකයෙකැයිද නොකියන්නේය. තෘෂ්ණා දෘෂ්ටි ක්ෂයකොට එයට නොඑයි.

14. "ලොකයෙහි යමෙකුට මාගේ යයි ගන්නා ලද්දාක් නැද්ද, නැති නිසාද ශොක නොකරන්නේය. සියලු ධර්මයන් විෂයෙහි (ආශාවෙන්) නොයන්නේය. හෙතෙම ඒකාන්තයෙන් ශාන්තයයි කියනු ලැබේ."

**49. කලහවිවාද සූත්‍රය:-** 1. "කලහයෝද විවාදයෝද කොහින් හටගන්නෝද, වැළපීම, දුක්වීමද මසුරුකමද මාන අතිමානද කේලාම් වචනද කොයින් හටගන්නෝද, සියලු ඉතිරි ක්ලේශධර්ම කොයින්ද, ඒ කරුණු වදාළහොත් මැනවි."

**2.** "කලහයෝද, විවාදයෝද, වැළපීම හා ශොකද මසුරුකම්ද පණ ඇති නැති ප්‍රියවූවස්තු නිසා පහළවූවාහුය. මාන අතිමානයෝද, කේලාම් වචනද ප්‍රිය වස්තූන් නිසා උපන්නාහුය. කලහයෝද, විවාදයෝද, මසුරුකමෙහි යුක්ත වෙති. විවාද කරුණු අතර කේලාම් වචනද ප්‍රියවස්තූන් නිසා පහළවූවාහුය.

**3.** "ලොකයෙහි යම් ලොභ කෙනෙක් පවතිත්ද, ප්‍රිය වස්තූන් අතර කොයින් හටගනිත්ද, යම් කෙනෙක් සත්වයාට පරලොව පිණිස වේද, ඒ ආශාවද සම්පූර්ණවීමද කොයින් හටගැනේද,

**4.** "ලෝකයෙහි යම් ලෝභ කෙනෙක් පවතිත්ද ලෝකයෙහි (ඒ) ප්‍රියවස්තූහු කාමච්ඡන්දාදිය නිදන්කොට ඇත්තාහුය. තවද යම් ධර්ම කෙනෙක් සත්වයාට පරලොව පිණිස වේද, ඒ ආශාවද සම්පූර්ණවීමද මෙය නිදන්කොට ඇත්තාහ."

**5.** "ලොව ඡන්දය කුමක් නිදානකොට ඇත්තේද, තවද (තෘෂ්ණාදෘෂ්ටි සංඛ්‍යාත) විනිශ්චය කොතැනින් උපන්නාහුද, ක්‍රොධය, බොරුකීම, සැකයයයි බුදුන් විසින් වදාරණලද යම් අකුශල ධර්මකෙනෙක් ඇද්ද, ඒ ධර්මයෝ කුමක් ප්‍රභවකොට ඇත්තාහුද?"

**6.** "සත්වලොකයෙහි සැපයයිද දුකයයිද යමක් කියත්ද, ඒ සැප දුක් වේදනා නිසා කැමැත්ත ඇතිවේ. ලොකයෙහි සත්වතෙම රූපයන්හි විනාශයද, උත්පත්තියද දැක (තෘෂ්ණා දෘෂ්ටි) විනිශ්වයද කරන්නේය.

**7.** "ක්‍රොධයද බොරුකීමද, සැකයද තවද මේ ලොභාදී ධර්මයෝද (ඉෂ්ටානිෂ්ට) දෙකම ඇති කල්හි පහළවෙත්. සැකයෙන් යුත් පුද්ගලතෙමේ නුවණ ලැබීම පිණිස හික්මෙන්නේය. බුදුන් විසින් දැන අනිත්‍යාදී ධර්ම ප්‍රකාශ කරණලදී."

8. "සැප වෙදනාවද දුක් වෙදනාවද කුමක් මුල්කොට ගෙන උපදනාහුද? මේ වේදනා කවරක් නැතිකල්හි නොවෙත්ද, තවද විනාශයද, උත්පත්තියද යන යම් මේ අර්ථයක් වේද යමක් නිදන්කොට ඇත්ද? මට මේ කාරණය කියනු මැනවි."

9. "සැප වේදනාවද, දුක් වේදනාවද ස්පර්ශය මුල්කොට ගෙන උපදනේය. මේ ධර්මයෝ වනාහි ස්පර්ශය නැතිකල්හි නොවෙත්. තවද විනාශයද, ඉපදීමද යන යම් මේ කරුණක් වේද, මෙයින් (ස්පර්ශාදිය නිසා) පහළවේ යන මේ කරුණ ඔබට කියමි."

10. "ලොව ස්පර්ශයතෙමේ කවරක් මුල කාරණකොට පහළවේද, තවද අල්ලාගැනීම් කවරකින් පහළවූවහුද, කවරක් නැතිකල්හි (තෘෂ්ණාදෘෂ්ටි) මමත්වය නැත්තේද, කවරක් ඉක්ම ගියකල්හි ස්පර්ශය ස්පර්ශ නොකෙරේද?"

11. "නාමයද, රූපයද නිසා ස්පර්ශය වෙයි. අල්ලාගැනීම් කැමැත්ත මුල්කොට ඇත්තේය. ආශා නම් තෘෂ්ණාව නැතිකල්හි මමත්වය නැත. රූපය ඉක්මගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකෙරෙත්."

12. "කෙසේ පිළිපදින්නහුට රූපාලම්බනය නොවේද, තවද සැප හෝ දුක හෝ කෙසේ නොවේද, යම්සේ රූපාලම්බන සැපය නොවේද එසේ මට කියන්න. එය දනිමි යයි මට සිතෙක් වූයේය."

13. "රූපය නොවන තැනැත්තා ප්‍රකෘති සංඥා ඇත්තෙක්ද නොවෙයි විකෘති සංඥා ඇත්තෙක්ද නොවේ තවද සංඥා ඇත්තෙක්ද නොවෙයි. අරූපධ්‍යාන ලාභියෙක්ද නොවෙයි. මෙසේ (අරූප මාර්ගයට) පිළිපන්නහුට රූපය නොවන්නේය. (යම්හෙයකින් තෘෂ්ණාමාන දෘෂ්ටි) ප්‍රමාදයෝ රූපසංඥාව මුල්කොට ඇත්තාහ."

14. "යමක් ඔබගෙන් ඇසුමූද එය අපට කීයෙහිය. දැන් අන්කරුණක් ඔබගෙන් විචාරමි. එය කියනුමැනවි. මේ ලෝකයෙහි පණ්ඩිතවූ ඇතැම් කෙනෙක් මෙය සත්වයාගේ ශ්‍රෙෂ්ඨ භූමියයයි කියත්."

**15.** "මෙලොව පණ්ඩිතවූ ඇතැම් මහණ බමුණු කෙනෙක් මෙහිදී සත්වයාගේ ශ්‍රෙෂ්ඨ ශුද්ධිය කියත්. ඔවුන් අතරෙහි වනාහි ඇතැම් කෙනෙක් අනුපාදිශෙෂයෙහි දක්ෂවූ වාද ඇතියෝව උච්ඡෙද වාදය (මරණයෙන් ඉවරවීම) කියත්.

**16.** "මොවුහු ආශ්‍රිතයෝයයි දැන ප්‍රාඥවූ ඒ බුද්ධ මුනි තෙම ආශ්‍රයයන්ද දැන මිදුණේ විරුද්ධවාදයට නොපැමිණෙන්නේය. ධීරතෙම නැවත නැවත නොම පැමිණෙන්නේය."

**50. චූලවියූහ සූත්‍රය:-** 1. "තම තමාගේ ඇදහීමෙහි සිටින්නාහු එය දැඩිසේ ගෙන දතුයෙම්හයි වෙන් වෙන්ව කියත්. යමෙක්තෙම මෙසේ දනිත්නම් හෙතෙම ධර්මය දත්තේද, යමෙක් තෙම මෙය ගරහන්නේ හෙතෙම බාලයෙක් වන්නේය.

**2.** "මෙසේත් (ස්වලබ්ධිය) දැඩිකොටගෙන විරුද්ධවාද කෙරෙත්. වාදීවූ අන්‍යයා බාලයෙකැයිද, අදක්ෂයෙකැයිද කියත්. මේ මහණ බමුණන්ගේ වාද අතුරෙන් කවර වාදයක් සත්‍ය වන්නේද, මේ හැම වාදීහුම දක්ෂ වාදකාරයෝ වෙත්.

**3.** "ඉදින් අන්‍යයාගේ ධර්මය නොදන්නා බාලයා නුවණින් අඩු නිහීනයෙක් වන්නේය. සියලුම බාලයෝ ඉතා ලාමක නුවණ ඇත්තෝය. තම තමාගේ ඇදහීමෙහි ගැලී වසන මේ සියල්ලෝම බාලයෝය.

**4.** "ඉදින් ස්වකීය ලබ්ධියෙන් අතිශයින් පිරිසිදුවූවාහු වෙත්ද, පිරිසිදු නුවණ ඇත්තෝ වෙද්ද, දක්ෂයෝ වෙත්ද, බුද්ධිමත්හු වෙද්ද, ඒ මහණ බමුණන් අතුරෙහි කිසිවෙකුත් පිරිහුණු ප්‍රඥා ඇත්තේ නොවේද, ඔවුන්ගේ දෘෂ්ටිතොමෝත් එසේ සමාප්ත වන්නීය.

**5.** "බාලතෙම දෙදෙනෙක්ව ඔවුනොවුන් යමක් කියත්ද, මම මෙය සත්‍යයයි නොකියමි. තම තමා පිළිබඳ දැකීම සත්‍යකළාහුමය. එහෙයින්ම අන්‍යයා බාලයයිද කියත්.

**6.** "ඇතැම් කෙනෙක් යමක් ඇත්තයයි කියත්ද, ඒ අන්හු හිස්වූ බොරුවකැයි කියත්. මෙසේත් දැඩිවගෙන විවාද

කෙරෙත්ද, කවර කරුණකින් ශ්‍රමණවරු එක් සත්‍යයක් නොකියත්ද,

7. "සත්‍යයතෙම එකක්ම වන්නේය. දෙවන සත්‍යයක් නැත. යම් සත්‍යයක් දනිමින් සත්වතෙම විවාද නොකරන්නේය. ඒ මහණ බමුණෝ නොයෙක් සත්‍යයන් තුමූම කියත්. ඒකරුණෙන් මහණ බමුණෝ එක් සත්‍යයක් නොකියත්.

8. "විරුද්ධවාදීවූ දක්ෂවාද ඇතියෝ නොයෙක් සත්‍යයන් කවර හෙයින් කියත්ද, නානාප්‍රකාරවූ බොහෝවූ සත්‍යයෝ අසනලද්දෝද, නොහොත් ඔහු තර්කමාත්‍රය අනුවයෙද්ද.

9. "(සත්ව) ලෝකයෙහි සංඥා මාත්‍රයෙන් නිත්‍යයයි ගන්නාලද ග්‍රහණයන් තබා නානාවිධවූ බොහෝ සත්‍යයෝ නැත්මැයි. තර්කයද දෘෂ්ටීන්හිලා කල්පනාකොට සත්‍යය බොරුයයි ධර්ම දෙකක් කියත්.

10. "දක්නාලද්දද, අසනලද්දද, සිතින් දන්නාලද්දද සිල් හා වත් පැවතුම්ද යන මොවුන්ද ඇසුරුකොට පහත් ලෙස දක්නේ, දෘෂ්ටි විනිශ්චයෙහි සිත හටගත් සතුටු ඇති පාපතෙම අන්‍යයා බාලයෙකැයිද කියන්නේය.

11. "යම් කරුණකින් අනුන් හීනයෙකැයි දක්නේද ඒ කරුණෙන්ම තමා පණ්ඩිතයෙකැයි කියන්නේය. තෙමේම පණ්ඩිතයයි කියන්නාවූ හෙතෙම තමහට ගරහන්නේය. එයම කියන්නේය.

12. "ඒ පුද්ගලතෙම දෙසැට දෘෂ්ටියෙන් පිරුණේ (දෘෂ්ටි) මානයෙන් මත්වූයේ, පිරීමේ මානය ඇත්තේ තෙමේම තම සිතින් රජවූයේවේ. ඒ දෘෂ්ටිය ඔහුට එපරිද්දෙන්ම සම්පූර්ණවූයේ වේ.

13. "ඉදින් යමෙක්තෙම අනුන්ගේ වචනයෙන්ම නිහීනයෙක් වේනම් තමාත් ඒ හා සමගම ලාමක ප්‍රඥා ඇත්තෙක් වන්නේයි. තවද මේතෙමේම වේදයේ (සතර මාර්ගයන්ගේ) පරතෙර පැමිණියේ නුවණැත්තේවේ. ශ්‍රමණයන් කෙරෙහි කිසි බාලයෙක් නැත්තේය.

14. "යම්කෙනෙක් මෙයින් අන්‍ය දෘෂ්ටියක් කියත්ද, අසම්පූර්ණවූ ඔව්හු පිරිසිදුවීමේ මාර්ගය වරදවා ගත්තාහුවෙති. තවද මෙසේ තීර්ථකයෝ බොහෝ දෘෂ්ටීන්ගේ වශයෙන් අශුද්ධිය කියත්ද, යම්හෙයකින් ඔව්හු ස්වකීය දෘෂ්ටි රාගයෙන් ඇලුණාහුද එහෙයිනි,

15. "මෙසේ බෙහෙවින් බැසගත් ස්වකීය මාර්ගයෙහි දැඩිව ප්‍රකාශකරන තීර්ථකයෝ මෙහිම ශුද්ධියවේයයි කියත්. අන්‍ය ධර්මයන්හි වෙසෙත්. ශුද්ධිය නොකියත්.

16. "තවද ස්වකීය (දෘෂ්ටි) මාර්ගයෙහිම දැඩිකොට කියන්නේ මෙහි බාලයායයි අන්‍යවූ කවරක්හු දක්නේද? අනුන් අශුද්ධි ධර්මය ඇති බාලයන්කොට කියන්නාවූ හෙතෙමේම කොලාහල ඇතිකරවන්නේය.

17. "ඒ පුද්ගලතෙම තීන්දු කිරීමෙහි සිට තමාම ප්‍රමාණය කොට මතුමත්තෙහි ලෝකයා කෙරෙහි කලහයට පැමිණෙන්නේය. නුවණැති සත්වතෙම සියලු තීන්දු (දෙසැට දෘෂ්ටීන්) හැරපියා ලෝකයා තුළ කළහ නොකරන්නේය."

51. **මහා ව්‍යුහ සූත්‍රය:-** 1. "තමන් තමන්ගේ ලබ්ධිය දැඩිව ගෙන වසන්නාවූ යම්කිසි මේ තීර්ථක කෙනෙක් මෙයම සත්‍යයයි හිස් විවාද කෙරෙත්ද, ඔහු හැමදෙනම නින්දාව තමන් වෙතට නැවත නැවත එවත්. නොහොත් එහිදී පැසසුමද ලබත්.

2. "මෙය (ප්‍රශංසා සංඛ්‍යාත වාදඵලය) ස්වල්පය. සංසිඳීම පිණිස සමර්ථ නොවන්නේය විවාදයාගේ විපාක දෙකක් කියමි. විවාදය නැති තැනවූ නිවන නිර්භය වශයෙන් දක්නේ මෙසේ දැක විවාද නොකරන්නේය. දැක කලහ නොකරන්නේය.

3. "පුහුදුන්ගෙන් පහළවූ යම්කිසි සම්මත කෙනෙක් ඇත්ද, මේ සියලු දෘෂ්ටීන්ට පණ්ඩිතතෙම නොපැමිණෙන්නේය. උපධි නම්වූ තෘෂ්ණා දෘෂ්ටි රහිතවූ හෙතෙම දෘෂ්ටිශුද්ධියෙහිද ශ්‍රැතශුද්ධියෙහිද, ප්‍රේමය නොකරන්නේ රූපාදී එකද ධර්මයකටවත් කිම පැමිණෙන්නේද,

4. "සීලයම උතුම්කොට ගන්නෝ (හික්මීම්) සංවරය මාත්‍රයෙන් ශුද්ධිය කියත්. වත් සමාදන්ව පැමිණ සිටියාවූ දක්ෂ වාද ඇත්තෝ මේ සත්වයාගේ ශුද්ධිය මෙහිම හික්මෙත් නම්හයි භවයට බැසගත්තාහු වෙත්.

5. "ඉදින් ශීලයෙන් හා ව්‍රතයෙන් වෙන්වූයෙක්වේද, හෙතෙම ඒ ශීල ව්‍රතාදී කර්මය වරදවාගෙන කම්පාවන්නේය. වැලපෙන්නේය. මෙහි ශුද්ධිය පතන්නේත් වෙයි. ගෙන් නික්ම නොරට යන හීනවූ ගැල් වෙළෙන්දෙකු මෙනි.

6. "ආර්යශ්‍රාවකතෙම සියලු ශීලව්‍රතය අත්හැර තවද වරදවූ වරද රහිතවූද කර්මයන් හැර මේ ශුද්ධියද අශුද්ධියද මෙසේ නොපතන්නේ දෘෂ්ටිය නොගෙන නොඇලී හැසිරෙන්නේය.

7. "පිළිකුල් කරණලද්ද හෝ නැතහොත් දක්නාලද්ද අසනලද්ද, සිතනලද්ද හෝ ඇසුරුකොටගෙන මත්තෙහි හැසිරෙන්නෝව නැවත නැවත උත්පත්තියෙහි නොපහකළ ආශා ඇත්තෝව ශුද්ධිය කියන්නට වීර්ය කරත්.

8. "පතන්නාහට වනාහි නැවත නැවත වෙති. තවද අදහස්කළ වස්තූන් නිමිතිකොට ගෙන අතිශයින් සැලෙන බවද වන්නේය. මේ ආත්මයෙහි යම් ක්ෂීණාශ්‍රවයෙක්හට චුතිය හා උත්පත්තිය නැද්ද හෙතෙම කිනම් රාගාදී ධර්මයකින් සැලෙන්නේද, කොතැන්හි හෝ පුරසාරම් දොඩාද?

9. "ඇතැම් මහණ බමුණු කෙනෙක් යම් ධර්මයක් උතුම්යයි කියද්ද, අන්හු ඒ ධර්මයම ලාමකයයි කියත්. මොවුන්ගේ සත්‍යවූ වාදය කවරෙක්ද, මේ සියල්ලෝම දක්ෂයෝය යන වාද ඇත්තෝය.

10. "තම තමන්ගේ ධර්මය සම්පූර්ණ යයි කියත්ද අනුන්ගේ ධර්මය හීනයයි අනෙක් අය කියත්ද මෙසේ විරුද්ධව සිට විවාද කරත්. තම තමන්ගේ සම්මතය සැබවයි කියත්

11. "හීනයා අන්‍යයාට අවමන් කිරීම කරණකොටගෙන කාරණයන්හි කිසිම විශෙෂ ඥානයෙක් නොවන්නේය. බොහෝ අය අනුන්ගේ ධර්මය පහත්කොට කියත්. ස්වකීය ධර්මයෙහි දැඩිවූ වාද ඇත්තෝම වෙත්.

12. "ඒ තීර්ථකයෝම ස්වකීය ධර්මයට යම්සේ ප්‍රශංසා කරත්ද, ස්වකීය ශාස්තෘවරාදීන්ට ගරුබුහුමන් කිරීමත් එසේම පවත්නේය. සියලු වාදයෝ සත්‍යයෝ වන්නාහුය. ඔවුන්ගේ ශුද්ධිය තමන් තමන් තුළ හෙයිනි.

13. "බ්‍රාහ්මණයාට අනුන් හික්මවනු ලැබියයුතු බවක් නැත. දෙසැට මිථ්‍යාදෘෂ්ටියෙහි නිශ්චයකොට දැඩිව ගන්නා ලද්දක් නැත. එකරුණෙන් විවාද කථාවන් ඉක්මවූ හෙතෙම අනුන්ගේ ධර්ය ශ්‍රෙෂ්ඨ වශයෙන් නොදක්නේය.

14. "ඇතැම් කෙනෙක් එපරිද්දෙන්ම මේ කාරණය දනිමි, දකිමියි ස්වකීය ලබ්ධියෙන් සංසාර විමුක්තිය අදහත්. ඉදින් දක්නේද තමාගේ ඒ දර්ශනයෙන් කිමෙක් නම් කරණ ලද්දේද, (ආර්ය මාර්ගය) ඉක්මවා අන්‍යයෝ ශුද්ධිය නොකියත්.

15. "සත්වතෙම පරසිත් දන්නා නුවණින් බලන්නේ නාමය, රූපය දක්නේයි දැක ඒ නාම රූපයන්ම නිත්‍ය සුභ සුඛ වශයෙන් දන්නේත්වේ. ඒකාන්තයෙන් බොහෝකොට හෝ මදකොට හෝ දකීවා. දක්ෂවූ බුද්ධාදී ආර්යයෝ එයින් (නාමරූප දර්ශනයෙන්) සංසාර ශුද්ධිය නොකියත්.

16. "මෙයම ඇත්තයයි කියන්නා සුවසේ හික්ම විය හැක්කේ නොවේමය. අදහස් කළ දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙන්නේද, යම් ශාස්තෘවරයෙක් ඇසුරුකොට සිටින්නේද එහි යහපත්කම කියන්නේදැයි කීය. ලබ්ධියෙහිම ශුද්ධිය කියන්නේද, හෙතෙම එහි එසේම බලන්නේය.

17. "(ක්ෂීණාශ්‍රව) බ්‍රාහ්මණතෙම නුවණින් දැන (තෘෂ්ණා දෘෂ්ටි) සිතීමකට නොපැමිණෙන්නේය. දෙසැට දෘෂ්ටියෙහි හැසිරෙන්නෙක්ද නොවෙයි. තවද (සමා පත්ති) ඤාණාදියෙන් නොකරණ ලද (තෘෂ්ණා දෘෂ්ටි) බැඳුම් ඇති හෙතෙම පෘථග්ජනයන් කෙරෙහි හටගත් යම් මතයන් දැන බැහැර ලන්නේය. අන්‍යයෝ දැඩිකොට ගනිත්.

18. "මේ සත්වලොකයෙහි ක්ෂීණාශ්‍රව මුනිතෙමේ ගැට ලිහා හැර විවාද කරණ අය අතරෙහි භෙදව

නොහැසිරෙන්නේය. නොහික්මුණු පෘථග්ජනයන් අතරෙහි හික්මුණේ අංග සයක් ඇති උපෙක්ෂාවෙන් යුක්තවූයේ වේ. හෙතෙම වැරදිලෙස ගන්නෙක් නොවෙයි. අන්‍යයෝ දැඩිව ගනිත්.

**19.** "හෙතෙම පළමු දෙය හැර දැනුදු එකාන්තයෙන් නොකරන්නේ ඡන්දයෙන් අගතියට නොයන්නේ තවද ස්වකීය ඇදහිල්ලම නොකියන ඒ ක්ෂීණාශ්‍රවතෙම දෙසැට දෘෂ්ටියෙන් විශෙෂයෙන් මිදුණේය. තමහට නොගරහන ධීරතෙම ලොකයෙහි නොඇලෙන්නේය.

**20.** "ඒ රහත් මහණතෙම දක්නා ලද, අසනලද, සිතන ලද, යම්කිසි ඒ සියලු ධර්මයන්හි පහවූ කාමාදී සෙනා ඇත්තේ වේ. බහා තබනලද (ස්බන්ධාදී) බර ඇත්තාවූ වෙහෙසින් මිදුණු ඒ රහත් මහණතෙම තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නොසිතන්නේය. ඇලීමෙහි නොයෙදුනේ පැතීමක් නැත්තේ වේ යයි බුදුහු වදාළහ."

**52. තුවටක සූත්‍රය:-** 1. "සූර්යයාට ඥාතිවූ මහර්ෂීවූ ඔබ විචාරමි. මහණතෙම ත්‍රිවිධ විවේකයද සත්තිස් බොධිපාක්ෂික ධර්මයද, කවර කරුණකින් දැන ස්කන්ධ ලොකයෙහි කිසි රූප වේදනාදියක් නොගන්නේ කෙලෙස් සන්සිඳුවන්නේද,

2. "තෘෂ්ණා දෘෂ්ටීන්ගේ අවිද්‍යාදී මුලද මමය යන මානයද සියල්ල නුවණින් සන්සිඳුවන්නේය. සිය සතන්හි යම්කිසි තෘෂ්ණා කෙනෙක් උපදනාහුද ඒ තෘෂ්ණාවන්ගේ දුරුකිරීම පිණිස හැමකල්හි සිහි ඇතිව හික්මෙන්නේයයි" භාග්‍යවත් තෙම වදාළේය.

3. "තමා කෙරෙහිවූ නොහොත් පිටත ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහිද යම්කිසි උසස් කුලවත් බව මුල්කොට ඇති ගුණයක් මැනවින් දන්නේ නම් ඒ ගුණය කරණ කොට ගෙන මානය නොකරන්නේය. ඒ උඩඟුකම කෙලෙස් ගිනි නිවීමකැයි බුද්ධාදී උත්තමයන් විසින් නොකියන ලදී.

4. "ශ්‍රෙෂ්ඨයෙකැයිද හීනයෙකැයිද නොහොත් සමානයෙකැයිද මානයෙන් නොහඟින්නේ නොයෙක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආකාරයෙන් යුක්තවූ අතිමානය කල්පනා කරමින් නොසිටින්නේය.

5. "මහණතෙම සිය සිතෙහිවූ රාගාදී ක්ලෙශයන් සන්සිඳුවන්නේය. අන් උපායකින් නිර්වාණය නොසොයන්නේය. සියසතන්හිවූ රාගාදී ක්ලෙශ සමූහය සන්සිඳුවන ලද්දාහුට සියල්ල සැමදා පවත්නේයයි දෘෂ්ටියක් නැත. සියල්ල විනාශවන්නේ යයි දෘෂ්ටියක් හෝ කොයින්ද.

6. "මහාසාගරයාගේ මැද රළ යම්සේ නොහට ගනීද නොසැලී සිටියේමවේ. එසේ තෘෂ්ණා නැති රහත් මහණ තෙම අෂ්ටලොක ධර්මයෙන් නොසැලෙමින් සිටියෙක් වන්නේය. එබඳු රහත් මහණතෙම ඇතුළත බැහැර කිසිවක් කෙරෙහි රාගාදී කෙලෙස් ඇති නොකරන්නේය.

7. "විවෘතවූ පසැස් ඇත්ත, උපද්‍රවයන් දුරුකරන්නාවූ තමා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලද ධර්මය ප්‍රකාශ කරණ ලදී. වහන්ස, ඔබගේ යහපත්වූ ප්‍රතිපත්තියද නොහොත් ප්‍රාතිමොක්ෂ ශීලයද සමාධියද වදාළ මැනව."

8. "ඇස් නිසා ලොල්බවක් නොවන්නේය. ග්‍රාම්‍ය කථාවට කන වසන්නේ නම් මැනව. රසයෙහි ගිජු නොවන්නේය. ලොව කිසි රූප වෙදනාදියක් නොගන්නේය.

9. "මහණතෙම යම් කලෙක්හි (ඇස්රෝගාදී) රෝගයකින් යුක්තවූයේද එකල්හි කිසිවක්හි වැලපීමක් නොකරන්නේ නම් මැනව. කාමභවාදියද නොපතන්නේ නම් මැනව. බිය උපදවන අරමුණු නිමිතිකොටගෙනද නොවෙවුලන්නේ නම් මැනව.

10. "මහණතෙම ආහාරයන් පිළිබඳවූද නැවත පානයන් පිළිබඳවූද කඩා කෑ යුතු දේ පිළිබඳවූද තවද වස්ත්‍රයන් පිළිබඳ වූද යම් කිසිවක් ලැබ ආරක්ෂාකොට තැබීම නොකරන්නේ නම් මැනව. ඒ ආහාරපාන වස්ත්‍රාදීන් නොලබන්නේ නොතැතිගන්නේ නම් මැනව.

11. "උසස් සිත එකඟ කරණ මහණතෙම ඇවිදින්නෙක් නොවිය යුතුය. කුකුසින් දුරුවිය යුතුය. නොපමා විය යුතුය.

නැවත මහණතෙම ස්වල්ප ශබ්ද ඇති සේනාසනයන්හිද යහන්හිද ඉරියවු පවත් වන්නේය.

12. "කෙලෙස් තවන වීර්යයෙන් යුත් මහණතෙම නිදාගැනුම බහුල නොකරන්නේය. නිදි දුරුකිරීම සෙවුනේය. අලස කමද මායාවද සිනාසීමද ක්‍රීඩාවද අලංකාරය සහිත මෙවුන්දම්ද වෙසෙසින් දුරු කරන්නේය.

13. "රත්නත්‍රය මාමකවූ මහණතෙම මන්ත්‍ර ගුරුකම්ද ස්වප්න ශාස්ත්‍රයද ලක්ෂණ ශාස්ත්‍රයද නක්ෂත්‍ර ශාස්ත්‍රයද නොකරන්නේය. සතුන්ගේ හඬ කියන ශාස්ත්‍රයද ගැබ්ගැන්වීමද වෙදකම්ද නොකරන්නේය.

14. "මහණතෙම ගටාබිණීම හෙතුකොටගෙන නොසැලෙන්නේය. ප්‍රශංසාකරණ ලද්දේ ආඩම්බරයෙන් ඔසවන ලද හිස් ඇත්තෙක් නොවන්නේය. මසුරුකම සමග ලොභයද ක්‍රොධයද කේළමද දුරු කරන්නේය.

15. "මහණතෙම ගනුදෙනු කිරීමෙහි නොසිටින්නේය. කිසිවෙක් කෙරෙහි දොෂයක් නොකරන්නේය. ගම්හිද නො ඇලෙන්නේය. ලාභ කැමැත්තෙන් යම් යම් දේ ජනයාට නොකියන්නේය.

16. "යොගාවචර මහණතෙම පුරසාරම් කියන්නෙක් නොවන්නේය. සිවුරු ආදිය ලැබීමට යොදන ලද වචනයකුදු නොකියන්නේය. හික්මීමෙන් තොරව නොහැසිරෙන්නේය. විරුද්ධ වාද කථාවන් නොකරන්නේය.

17. "මනා නුවණින් යුත් මහණතෙම මුසාබස් බිණීමෙහි නොයෙදෙන්නේය. කපටිකම නොකරන්නේය. තවද ජීවිතයෙන්ද නුවණින්ද සීලයෙන් හා ව්‍රතයෙන්ද අන්‍යයන් නොයික්මවා සිටින්නේය.

18. "යොගාවචර මහණතෙම මේ සස්නෙන් පිටත් මහණුන්ගේ හෝ නානාප්‍රකාර වචන ඇති ක්ෂත්‍රියාදීන්ගේ හෝ බොහෝ නරක වචන අසා කුපිතව පරොස් බසින් ඔවුන්ට ආපසු නොකියන්නේය. සත්පුන් කෙලෙස් ඇතියෝ ප්‍රතිපක්ෂ බවක් නොකෙරෙති. එහෙයිනි.

**19.** "මහණතෙම හැමකල්හි සිහි ඇතිවූයේ මේ කියන ලද සියලු ධර්මයන්ද දැන ශාන්තිය සොයන්නේ හික්මෙන්නේය. රාගාදීන්ගේ නිවීම ශාන්තියයි දැන ගෞතම බුද්ධ නම්වූ මාගේ ශාසනයෙහි පමානොවන්නේය.

**20.** "ප්‍රසිද්ධවූ සර්වඥතෙම රූප ශබ්දාදීන් තමා මැඩපැවැත්වූයේම කෙලෙසුන් විසින් උන්වහන්සේ යටපත් නොකරණ ලද්දේමය. පරම්පරාවෙන් ආවේයයි නොගෙන තමා විසින්ම ප්‍රත්‍යක්ෂ කරණ ලද ධර්මය දුටුයේය. එහෙයින්ම ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ ශාසනයෙහි අප්‍රමාද වූයේ නමස්කාර කරමින් හැමකල්හි නැවත නැවත හික්මෙන්නේයයි" භාග්‍යවත්තෙම වදාළේය.

**53. අත්තදණ්ඩ සූත්‍රයː- 1.** "බිය තමාගේ දුශ්චරිත හෙතුවෙන් උපන්නේය. පීඩාවට පැමිණියාවූ ජනයාම බලව්. මවිසින් යම්සේ සංවෙගයට පැමිණෙන ලද්දේද එසේ තොපට සංවෙගයද පවසන්නෙමි.

**2.** "දියත්තෙක්හි මසුන් මෙන් සැලෙන සත්ව සමූහයා දැකත් ඔවුනොවුන් හා සමග ප්‍රතිවිරුද්ධවූ නානා සත්වයන් දැකත් මා කරා බිය පැමිණියේය.

**3.** "ලොකයතෙම හාත්පසින් අසාර වන්නේය. සියලු දික්හිවූ සංස්කාරයෝ සැලෙන ලද්දෝවෙත්. තමහට පිහිටක් බලාපොරොත්තු වන්නාවූ මම ජරාදියෙන් නොවැසුන කිසියම් තැනක් නොදැක්කෙමි.

**4.** "ඒකාන්තයෙන් අවසාන ජරා ව්‍යාධි මරණාදියෙහිම වැදුන සිත් ඇති සත්වයන් දැකීමට නොඇල්මක් වූයේය. තවද මේ සත්වයන් කෙරෙහි නොදැක්ක හැකි සිත ඇසුරුකළ රාගාදී හුල දැක්කෙමි.

**5.** "යම්බඳු රාගාදී හුලකින් විදුනු තැනැත්තා සියලු දිගට දුවන්නේද ඒ රාගාදීහුලම උපුටාපියා නොදුවන්නේය. නොකිඳෙන්නේය.

6. "සත්වලොකයෙහි යම් පස්කම් ගුණකෙනෙක් ඇද්ද ඒ නිමිතිකොටගෙන ශිල්පද කියනු ලැබෙත්. ඒ පස්කම් ගුණයන් කෙරෙහි යුක්ත ප්‍රයුක්තවූයේ නොවන්නේය වස්තුකාම ක්ලෙශ කාමයන් නුවණින් විනිවිද දැන තමාගේ රාගාදීන්ගේ නිවීමට හික්මෙන්නේය.

7. "මුනිතෙම සත්‍යයෙන් යුක්තවූයේ වන්නේය. ත්‍රිවිධ නොහික්වීම්වලින් යුක්ත නොවන්නේය. මායාවෙන් යුක්ත නොවන්නේය. කේළාම් නොකියන්නේය. ක්‍රොධ නැති වන්නේය, ලොභ අකුශලයද මාර්ග සත්‍යයද ඉක්මවන්නේය.

8. "නිවන් කෙරෙහි නැමුණු සිත් ඇති සත්වතෙම නිදිබරගතියද, අලසකමද සිතේ මැලිකම මැඩපවත්වන්නේය, සිහිනැතිව නොවසන්නේය, මාන්නය අධික බැව්හි නොයෙදෙන්නේය.

9. "සාහසික හැසිරීමෙන් වෙන්ව හැසිරෙන්නේය. බොරුවෙන් නොයන්නේය. අටවිසිරූපය කෙරෙහි ඇල්මක් නොකරන්නේය, මානය පිරිසිඳ දන්නේය.

10. "ඉක්මගිය රූපවෙදනාදියට සතුටු නොවන්නේය, පවත්නා රූපවෙදනාදිය කෙරෙහි කැමැත්තක් නොකරන්නේය. නැසෙන ඇස් ආදියට ශොක නොකරන්නේය, තෘෂ්ණාව ආශ්‍රය නොකරන්නේය.

11. "මේ තෘෂ්ණාව මගේයයි කියමි. සැඩවතුරයයිද කියමි. ප්‍රතිසන්ධියෙහි පටන් දුවන අර්ථයෙන් ආජවයයිද කියමි. මගේ යයි කියන බැවින් ජල්පනයයි කියමි. ආලම්බනයයි කියමි. කම්පාකිරීමකැයි කියමි. කාම නමැති මඩ දුකසේ ඉක්ම වියයුත්තේයයි කියමි.

12. "සත්‍යයෙන් බැහැර නොයන්නාවූ ඒ ක්ෂීණාශ්‍රව මුනිතෙම නිර්වාණ නමැති ගොඩබිම්හි සිටින්නේය. හෙතෙම ඒකාන්තයෙන් ද්වාදසායතනය බැහැරකොට ශාන්තවූයේ යයි කියනු ලැබේ.

13. "හෙතෙම ඒකාන්තයෙන් සංස්කාර ධර්මය දැන තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රයරහිතවූ පණ්ඩිතයෙකු වූයේ

චතුර්මාර්ගඥානයට පැමිණියෙකි. හෙතෙම ලොකයෙහි මැනවින් ඉරියව් පවත්වන්නෙක. මේ හැම ලෙව්හි කිසිවකුහටත් ඇලුම් නොකරන්නේය.

14. "මේ සත්වලොකයෙහි යමෙක්තෙම වස්තුකාම ක්ලෙශ කාමයන් හා ඉක්මවීමට දුෂ්කර රාගාදී ඇලුම්හත ඉක්මවීද සිඳිනලද තෘෂ්ණා ඇති රාගාදී බැමි රහිත ඒ රහත් මහණතෙම ශොක නොකරන්නේය. පසුතැවිලි නොවන්නේය.

15. "ඉදින් රහත්වීමට කැමැත්තේනම් පෙර කර්ම නිසා උපන් සැඟවී ඇති කෙලෙස්ද ඉක්මගිය කර්මද යන යමක්වේද, එය වියලව, අනාගත සංස්කාර නිසා උපදනා රාගාදී කෙළෙස් තට නොවේවා, ඉදින් වර්තමාන කෙලෙස් සමූහය නොගන්නෙහි නම් මැනව උපශාන්තව හැසිරෙන්නේය.

16. "යමෙකුට නාමරූප දෙකෙහි මාගේ යයි ගන්නා ළද්දක් හෝ සර්වප්‍රකාරයෙන් නැද්ද නැතිවන බැවින්ම ශොක නොකරයි. හෙතෙම ඒකාන්තයෙන් ලොකයෙහි පිරිහීමට නොයන්නේය.

17. "යමෙක්හට මෙය මාගේ යයි හෝ නැවත අනුන්ගේ යයි හෝ කිසිරූපාදී ධර්ම සමූහයක් නැත්තේද, හෙතෙම තෘෂ්ණාදෘෂ්ටි මමත්වයක් නොලබන්නේ මට මෙය නැතැයි ශොක නොකරන්නේය.

18. "ඒ නොසැලෙන පුද්ගලයා අසන ළද්දේ මේ අනුසස් කියමි. ඊර්ෂ්‍යා නැත්තෙක, ගිජු නොවූවෙක, තෘෂ්ණා විරහිතයෙක, සියලු තන්හි සමව පවත්නෙක.

19. "පහකළ තෘෂ්ණා ඇති මනා අවබොධයෙන් දත්තාහට යම්කිසි සංස්කාරයක් නැත. භවයක් ඇතිකරණ රැස්කිරීම්වලින් වෙන්වූ හෙතෙම සෑමතැන්හි නිර්භයව දකී.

20. "රහත් මහණතෙම සමානයන් කෙරෙහි සමානයයි නොකියන්නේය. හීනයන් කෙරෙහි තමා උසස්යයි නොකියන්නේය. ශ්‍රෙෂ්ඨයන් කෙරෙහි ශ්‍රෙෂ්ඨයයි

නොකියන්නේය. සත්හුන් රාගාදී කෙලෙස් ඇති, පහවූ මසුරුකම ඇති හෙතෙම නොගන්නේය. නොබැහැර කරන්නේයයි, බුදුහු වදාළහ."

54. "**ශාරීපුත්‍ර සූත්‍රය**:- 1. මෙබඳු මිහිරි වචන ඇති දර්ශනයක් තුෂිත දිව්‍යලොකයෙන් මවුකුසට පැමිණියාවූ ගණාචාර්යවූ ශාස්තෘ තෙම මා විසින් මේ සකස්පුරයට බැසීමට පෙර නොදක්නා ලද්දේය. ක්ෂත්‍රියාදී කිසිවක්හුගෙන්ද නොඅසන ලද්දේයයි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙමේ කීයේය.

2. "පසැස් ඇති සර්වඥ තෙම දෙවියන් සහිත ලොකයාට යම්සේ පෙනේද, එසේ මිනිසුන්ටද පෙනේ. අසහායවූයේම සියලු රාගාදී කෙලෙස් අඳුර දුරුකොට නෛෂ්ක්‍රම්‍යාදී ඇලීමට පැමිණියේය.

3. "මෙලොව බොහෝ ක්ෂත්‍රියාදී ශිෂ්‍යයන් අතුරෙන් යහපත බලාපොරොත්තුවම තෘෂ්ණාදෘෂ්ටි ආශ්‍රය නොකළ තාදීවූ නැති කළ ත්‍රිවිධ කුහන වස්තු ඇති ගණයට අධිපති බවට පැමිණි ප්‍රසිද්ධ බුදුන් වෙතට ප්‍රශ්න අසනු කැමැත්තෙන් පැමිණියෙමු.

4-5. "ජාති ජරා ව්‍යාධි මරණ කරණකොටගෙන පිළිකුල් කරන්නාවූ ඉඩකඩ ඇති නොගැලපෙන ඇඳ පුටු සෙවුනාවූ මහණහට, රුක්මුල හෝ සොහොන හෝ පර්වත ස්ථාන හෝ ගුහා හෝ ලොකු කුඩා සෙනාසනවල කෙතෙක් බිය උපදවන කරුණු වෙත්ද මහණතෙම නිහඬවූ ඒ සෙනසුන්හි බිය උපදවන යම්කිසි කරුණුවලින් නොසැලෙන්නේද,

6. "මහණතෙම සුදුසු සෙනසුන්හි යම් උපද්‍රවයක් මැඩ පවත්නේද නොගියවිරූ අමාමහ නිවණට යන්නාහට ලෙව්හි උවදුරු කෙතෙක්වෙත්ද,

7. "සකස්කළ වීර්ය ඇති ඒ මහණහට කෙබඳුවචන කෙනෙක් වන්නාහුනම් යහපත්ද ඕහට මෙහි කෙබඳු ගොචර කෙනෙක් වන්නාහු නම් මැනැවිද,

8. "එකඟ සිත් ඇති පණ්ඩිතවූ සිහි ඇති ඒ මහණ තෙම කවර හික්මීමක් සමාදන්ව රන්කරු රත්රන්වල මල පිඹහරින්නාක් මෙන් තමාගේ කෙලෙස් මල හරින්නේය.

9. "ශාරීපුත්‍රය, පිළිකුල් කරන්නාවූ විවේකශය නසන ඒකාන්තයෙන් ආශ්‍රය කරණ සතර මාර්ග ඥානය කැමති මහණහට යම් පහසු විහරණයක්වේද, යම්බඳු අනුධර්මයක් වේද, මේ සැපවිහරණයත් ඒ අනුධර්මයත් අවබෝධවනසේ තට කියන්නෙමියි භාග්‍යවත් තෙම වදාළසේක.

10-11. "වීර්යවත්, සිහියෙන් යුත් ගුණයෙහි අන්තයේ හැසිරෙන ඒ මහණතෙම මැස්සන් පිළිබඳවූද, සර්පයන් පිළිබඳවූද සොරුන්ගේ ස්පර්ශය පිළිබඳවූද සිංහාදී සිවුපාවුන් පිළිබඳවූද සස්නෙන් පිට අය සම්බන්ධවූද යන පස්දෙනා පිළිබඳ සිත් තැතිගැනුම් කෙරෙන් බිය නොවන්නේද, ඔවුන්ගේ බොහෝ බිය උපදවන අරමුණු දැක හෝ අසා හෝ නොතැතිගන්නේයි. තවද කුසල් දහම් සොයන්නේ අන්‍යවූ වැඩියයුතු උවදුරුද මැඩ පවත් වන්නේයි.

12. "රොග ස්පර්ශයෙන්ද සාගින්නෙන්ද යුක්තවූයේ සීතල ගුණයද ඉතා උණුසුම් ගුණයද ඉවසන්නේය. මහණ තෙම ඒ රොග ස්පර්ශයෙන් බොහෝසේ මඩනා ලද්දේ අභිසංස්කාර විඥානාදීන්ට ඉඩ ඇති නොකරන්නේ චෛතසික වීර්යාරම්භය කරන්නේය.

13. "සොරකම් නොකරන්නේයි. බොරු නොකියන්නේයි. පෘථග්ජනයන්ද රහතන්ද යන සකල සත්වයන් මෛත්‍රියෙන් පතුරුවන්නේය. යම් කලෙක්හි චිත්තයාගේ කැළඹුනු බවක් දන්නේ නම් ඒ සියල්ල මාරයාගේ පක්ෂයට අයත්යයි දුරුකරන්නේය.

14. "ක්‍රොධයාගේද අතිමානයාගේද වසඟයට නොයන්නේය. ඒ ක්‍රොධ, අතිමානයන්ගේ අවිද්‍යා මුලද උගුල්ලා දමා සිටින්නේය. ප්‍රිය වස්තුව හෝ අප්‍රිය වස්තුව මැඩපවත්වන්නේ ඒකාන්තයෙන් මැඩපවත්වන්නේය.

**15.** "යහපත් ප්‍රීතියෙන් යුත් මහණතෙම ප්‍රඥා පෙරටු කොට ඒ උවදුරු යටපත් කරන්නේය. විවේක ඇති සෙනාසනවල නොඇල්ම යටපත් කරන්නේය. සතර වැදෑරුම්වූ වැලපෙන ධර්ම ඉවසන්නේය.

**16.** "කුමක්නම් අනුභව කරන්නෙම්ද, නොතැන්හී හෝ බුදින්නෙම්ද, මේ රැයෙහි ඒකාන්තයෙන් දුකසේ සයනය කෙළෙමි. අද රෑ කොතැන්හි සුවසේ නිදන්නෙම්ද, යන වැලපීම් ගෙනදෙන මේ විතර්කයන් බාධා නැතිව හැසිරෙන ශෛක්ෂතෙම හික්මවන්නේය.

**17.** "මේ ශාසනයෙහි ඒ මහණතෙම පිණ්ඩපාත කාලයෙහි ආහාරයද, වස්ත්‍රද ලැබ ලද දෙයින් සතුටුවීම පිණිස පමණ දන්නේය. මහණතෙම ඒ ප්‍රත්‍යයන් ගැනද සංවරවූයේ ගම්හි සංයත විහරණ ඇතියේ වන්නේය. තවද අවමන් කරණ ලදුයේ පරොස් බස් නොකියන්නේය.

**18.** "යටබලා හෙලන ලද ඇස් ඇත්තේ නුවුවමනා ගමනින් දුරුවූයේවේ. ධ්‍යානයෙහි යුක්ත ප්‍රයුක්තවූයේ බොහෝ කොට නිදි දුරු කිරීමෙන් යුක්ත වන්නේය. නීවරණ වලින් සිත පිරිසිදු කරන්නේය. චතුර්ථධ්‍යාන උපෙක්ෂාව අරභයා එකඟසිත් ඇත්තේ කාමවිතර්කාදිය හා කාම සංඥාදිය හා කුකුසද සිඳින්නේය.

**19.** "වචනයෙන් සොයන ලදුයේ සිහි ඇතිව සතුටු වන්නේය. සබ්‍රම්සරුන් කෙරෙහි තද බව නැති කරන්නේය. නුවණින් යුත් සිතින් උපදවනලද තෙපුල් කියන්නේය. කාලවෙලා නොඉක්ම වන්නේය. ක්ෂත්‍රියාදී ජනයාගේ පරිවාද කථාවෙහිලා සිතීමක් නොඋපදවන්නේය.

**20.** "ඉක්බිති මින් අනිකක් කියමි. ලොව රූපරාගාදී පස් රජස්හුවෙති. සිහි ඇතිව යම් රූපරාගාදී කෙනෙකුන්ගේ ප්‍රහානය පිණිස හික්මෙන්නේ නම් රූපාරමුණු කෙරෙහිද ශබ්දාරමුණු කෙරෙහිද නැවත ගන්ධරස ස්පර්ශ අරමුණු කෙරෙහිද ඇල්ම මැඩලන්නේය.

21. "එළඹ සිටි සිහි ඇති මොනවට මිදුන සිත් ඇති ඒ මහණතෙම මේ රූපශබ්දාදී ධර්මයන් කෙරෙහි කැමැත්ත දුරුකරන්නේය හෙතෙම සුදුසු කාලයෙහි මැනවින් ධර්මය විමසන්නේ සමෘද්ධිමත්වූයේ අන්ධකාරය නසන්නේයයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ."

---

## 5. පාරායණ වර්ගය.

**55. අජිත මාණවක පුච්ඡා සූත්‍රයඃ-** 1. "මන්ත්‍ර ශාස්ත්‍රයෙහි පරතෙරට පැමිණි බමුණුතෙම ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය බලාපොරොත්තු වෙමින් රම්‍යවූ කොසොල් නුවරින් දකුණු පැත්තට ගියේය.

2. "හෙතෙම අස්සක, අලක, දෙරට මැද ගොධාවරී ගඟබඩ පිඬු සිඟා කෑමෙන්ද, පලවැල බුදිමින්ද, වාසය කළේය.

3. "ඒ තැන්ම ඇසුරු කොට ගමද මහත් වූහ. ඉන් ලත් ආදායමින් මහා දානයක් දුන්නේය.

4. "මහා දානයක් දී නැවත ආශ්‍රමයට ආවේය. එහි පිවිසි කල්හි අනික් බ්‍රාහ්මණයෙක් ආවේය.

5. "පීඩාවූ පා ඇති බියපත්වූ කිලිටි දත් ඇති හිස කිලිටිවූ හෙතෙම ඔහු කරා පැමිණ පන්සියයක් ඉල්වයි.

6. "ඔහු බාවාරීතෙම දැක අස්න දුන්නේය. සැපසනීප විචාරා මෙසේ කීයේය.

7. "බ්‍රාහ්මණය, මගේ යම් දියයුතු දෙයක් වේද, මා විසින් සියල්ල වියදම් කරණලදී. මා ලඟ පන්සියයක් නැති බව දැන ගන්න.

8. "පින්වත්තෙමේ ඉදින් ඉල්වන්නාවූ මට නොදෙන්නේද, සත්වෙනි දවසෙහි ඔබගේ මුදුන සත්කඩකට පැලෙන්නේය.

9. "හෙතෙම මල් කුසතණ ආදිය රැස්කොට ව්‍යාජ ගති අඟවා භයානක වචන කීයේය. ඔහුගේ ඒ වචනය අසා බාවාරීතෙමේ දුක් වූයේය.

10. "ශොක නැමැති හුලින් පීඩාවූයේ නිරාහාරව වියලෙයි. මෙබඳු සිතක් ඇත්තහුගේ සිත ධ්‍යානයෙන් ප්‍රීතිමත් කරගනියි.

11. "තැති ගත් දුකට පත් ඔහු දැක යහපත කැමති දෙවතාවෙක් බාවාරී වෙත පැමිණ මේ වචන කීයේය.

12. "ව්‍යාජ ගති අඟවන ඒ වස්තු කැමැත්තා මුදුන නොදනී. මුදුනෙහි හෝ මුදුන හෙළීමෙහි හෝ නුවණක් ඔහුට නැත.

13. "ඉදින් පින්වතා දන්නේද, විචාරණ ලද්දාවූ මට කියව, ඔබගේ මුදුනය මුදුනෙහි වැටීමය යන වචනය අසමු.

14. "මෙය මාද නොදනිමි. මෙහි මට නුවණක් නැත. මුදුනය, මුදුනෙහි වැටීමය යන දෙක දන්නේ බුදුවරුය.

15. "මේ පොළොවෙහි දැන් කවරෙක් මුදුන මුදුනෙහි හෙළීම යන දෙක දන්නේද, විචාරණ ලද මට එය කියව"

16. "ඔක්කාක රාජ වංශයෙහිවූ ශාක්‍ය පුත්‍රවූ ආලොකය දෙන්නාවූ ලොකයට නායකතෙමේ කිඹුල්වත් නුවරින් නික්මුණේය.

17. "සියලු ධර්මයන්හි පරතෙරට ගිය බ්‍රාහ්මණ බුද්ධවූ හෙතෙම සියලු විශිෂ්ට ඥාන බලයෙන් යුක්තය. සියලු ධර්මයන්හි දැනීම ඇත්තේය. සියලු ධර්මයන් ක්ෂය කිරීමට ගියේ පව් ක්ෂය කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදුනාවූ,

18. "ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නුවණැස් ඇත්තේ ලොකයාට ධර්ම දෙශනාකරයි. ඔබ උන්වහන්සේ වෙත පැමිණ විචාරව, හෙතෙම එය තොපට ප්‍රකාශ කරන්නේය.

19. "සම්බුද්ධ යන වචනය අසා බාවාරිතෙමේ සතුටුවූයේ. ශොකය තුනී විය. මහත් ප්‍රීතියක්ද ලැබුනේය.

20. "සතුටුවූ ප්‍රීතිමත්වූ ඒ බාවාරිතෙමේ හටගත් ප්‍රීතිය ඇත්තේ ඒ දෙවතාවාගෙන් මෙසේ ඇසූයේය. "යම් තැනකට පැමිණ දෙපා ඇත්තවුන්ට අග්‍රවූ භාග්‍යවතුන් වහන්සේ නමස්කාර කරණ ලදී. ගමෙහි හෝ නියම්ගමෙහි එය කරණ ලදී. නැවත ජනපදයෙහිද එය කරණ ලදී.

**21.** "මහත් ප්‍රඥා ඇති ශ්‍රෙෂ්ඨ ප්‍රඥා ඇති පහවූ වැඩ ඇති මන්ත්‍ර දන්නා, ආශ්‍රව රහිත, මුදුන සිඳීම දන්නා නර ශ්‍රෙෂ්ඨවූ ඒ ශාක්‍ය පුත්‍ර ජිනතෙමේ සැවැත් නුවර කොසොල් රජුගේ මාලිගයෙහි වැඩ සිටී."

**22.** ඉක්බිති මන්ත්‍ර ශාස්ත්‍ර දත් බමුණුතෙම "මාණවකයෙනි, කියන්නෙමි, මාගේ වචන කියව් යයි" මාණවකයන්ට ආමන්ත්‍රණය කළසේක.

**23.** "යමෙක් ලොකයෙහි දුර්ලභද නිතර පහළවීම දුෂ්කරද හෙතෙම අද ලොකයෙහි උපන්නේය. සම්බුද්ධ යයි ප්‍රසිද්ධ විය. සැවැත් නුවරට වහා ගොස් දෙපා ඇත්තන්ගෙන් උත්තමයා දකිව්."

**24.** "බමුණ, බුද්ධ, යනු කෙසේ දනිමුද දකිමුද උන්වහන්සේ ගැන නොදන්නාවූ අපට ප්‍රකාශ කරව."

**25.** "වෙද මන්ත්‍රවල මහා පුරුෂ ලක්ෂණයෝ ආවාහුය. හාත්පසින් දෙතිසක්යයි පිළිවෙළින් ප්‍රකාශ කරණ ලද්දාහ. යම්කිසි කෙනෙකුගේ අවයවයන්හි මේ මහා පුරුෂ ලක්ෂණ ඇත්තාහුද, ඔහුට ගති දෙකක් තුනක් නැත.

**26.** "ඉදින් මේ පොළොව දිනා ගිහිගෙයි වසයි නම් දඬුවම් නොකිරීමෙන් ආයුධ පාවිච්චි නොකිරීමෙන් සක්විති රජව ධර්මයෙන් අනුශාසනා කරයි.

**27.** ඉදින් හෙතෙම ගිහිගෙන් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වේද කෙලෙස් සෙවෙනි නැති නිරුත්තර අර්හත් සම්බුද්ධ වන්නේය.

**28.** "ජාතියද ගොත්‍රයද ලකුණුද මන්ත්‍රද ශිෂ්‍යයන්ද නැවත මුදුනද මුදුනෙහි හෙළීමද සිතින්ම විචාරව.

**29.** "ඉදින් අනාවරණ ඥානයෙන් යුත් බුදු කෙනෙක් වේනම් සිතින් විචාළ පැන වචනයෙන් විසඳන්නේය."

**30.** බාවාරිගේ වචන අසා ගෝලවූ බ්‍රාහ්මණයෝ සොළොස් දෙනෙක් එනම් අජිතය, තිස්ස, මෙත්තෙය්‍යය, පුණ්ණකය, මෙත්තගුය.

**31.** ධොතකය, උපසීවය, නන්දය, හෙමකය යන මොවුහුද තොදෙය්‍යය, කප්පය යන දෙදෙනය නුවණැති ජතුකණ්ණිය.

**32.** භද්‍රාවුධය උදයය, පොසාල බ්‍රාහ්මණය ප්‍රඥාවත් මොඝරාජය, පිංගිය, මහා ඍෂීය යන මොවුහුය.

**33.** වෙන වෙන පිරිස් ඇති සියලු ලොකයෙහි ප්‍රසිද්ධවූ පූර්ව වාසනා ඇති ධ්‍යාන ඇති, ධ්‍යානයෙහි ඇලුනු පණ්ඩිතයෝ,

**34.** බාවාරි වැඳ ඔහු පැදකුණු කොට සියල්ලෝ ජටා දිවිසම් දරාගෙන උතුරු දෙස බලා ගියෝය.

**35.** පෙර බාහිස්සති නම්වූ එකල්හි අලක නම් නුවර පිහිටි තැන, උදෙනි නුවරද ගොධ නුවරද වෙදිස වනයද,

**36.** කොසඹෑ නුවරද උතුම් සැවැත් නුවරද සෙතව්‍ය නුවරද කිඹුල්වත් පුරයද, කුසිනාරා මන්දිරයද,

**37.** පාවා නුවරද, භොග නුවරද, වෙසාලී නුවරද, මගධ පුරයද සිත්කළු යහපත් පාසානක චෛත්‍යයද (ගෙවා)

**38.** වෙළඳතෙම තැවුනේ සිහිල් ජලයක් මහත් ලාභයක් කොට සිතන්නා සේද ග්‍රීෂ්මයෙන් පීඩිතවූයේ සෙවනකට මෙන්ද, වහා පර්වතයට නැංගේය.

**39.** ඒ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පෙරටු කළසේක් වනයෙහි නාද කරණ සිංහයෙකු මෙන් භික්ෂූන්ට දහම් දෙසයි.

**40.** "අජිතතෙමේ සීයක් රැස් ඇති සූර්යයා මෙන් පසළොස්වක දවසෙහි චන්ද්‍රයා මෙන් සම්පූර්ණ බවට පත්වූ බුදුරජාණන් වහන්සේ දැක්කේය.

**41.** ඉක්බිති උන්වහන්සේගේ ශරීරයෙහි සම්පූර්ණ වූ ලක්ෂණ දැක එකත්පසෙක සිටියේ හිතින් ප්‍රශ්න විචාළේය.

**42.** "මුලින්ම උත්පත්තිය කියන්න උදාහරණ සහිත ගොත්‍රය කියන්න. මන්ත්‍රයන්හි කෙළවර කියන්න. කී දෙනෙකුට බමුණුතෙමේ උගන්වයිද?

43. "ආයුෂ එක්සිය විසි වර්ෂයකි. මෙතෙමේ ගොත්‍රයෙන් බාවාරීය. ඔහුගේ ශරීරයෙහි ලක්ෂණ තුනක් ඇති ත්‍රිවෙදයන්ගේ පරතෙරට ගියේය.

44. "ලක්ෂණ ශාස්ත්‍රයෙහිද ඉතිහාසයෙහිද නිඝණ්ඩු ශාස්ත්‍රයෙහිද, විතණ්ඩ ශාස්ත්‍රයෙහිද, පන් සියයක් හික්මවයි. සද්ධර්මයෙහි පරතෙරට ගියේය.

45. "නරෝත්තමයන් වහන්ස, තෘෂ්ණා සිඳී බුදුරජාණන් වහන්ස, බාවාරිගේ ලක්ෂණ විස්තරය ප්‍රකාශ කරණු මැනව, එවිට අපට සැකයන් නොවන්නාහ."

46. "මුහුණ දිවෙන් වසන ලක්ෂණයද බැම අතරෙහි ඌර්ණරෝම ධාතුවද කොෂය ඇතුළෙහිවූ රහස් අවයවයද බමුණ, දනුව,

47. "ප්‍රකාශ කළ ප්‍රශ්න කිසිවක් විචාරණු නොඇසුනු සියලු ජනතෙම ප්‍රීති ඇතිව ඇඳිලි බැඳ සිතයි.

48. "කවරෙක්ද දෙවියෙක්ද බ්‍රහ්මයෙක්ද ඉන්ද්‍රයාද සුජම්පතීද සිතින් සිතූ පැනයන් මේ කවරෙක් ප්‍රකාශ කරයිද.

49. "මුදුනද මුදුනෙහි වැටීමද බාවාරිතෙමේ විචාරයි. භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රකාශ කළ මැනව. ඍෂීන් වහන්ස අපගේ සැක දුරු කරව්."

50. "අවිද්‍යාව මුදුන යයි අනුව, ශ්‍රද්ධා, සති, සමාධි, ඡන්ද විරිය යන මොවුන්ගෙන් යුත් විද්‍යාව මුදුනෙහි වැටීම යයි කියනු ලැබේ."

51. මාණවකතෙමේ ඉක්බිති මහත් සතුටින් ප්‍රීතිමත්ව අඳුන් දිවිසම එකාංශ කොට පා මුල්හි හිසින් වැටුණේය.

52. "නිදුකාණෙනි, බාවාරි බ්‍රාහ්මණතෙම ශිෂ්‍යයන් සමග ඔදවැඩි සිත් ඇත්තේ සතුටු සිත් ඇත්තේ පසැස් ඇති නුඹවහන්සේගේ පා වඳියි."

53. "ශිෂ්‍යයන් සමග බාවාරි බ්‍රාහ්මණතෙම සුවපත් වේවා. මාණවකය ඔබද සුවපත් වෙව, බොහෝ කල් ජීවත් වෙව,

**54.** "බාවාරිගේ හෝ ඔබගේ හෝ සියල්ලන්ගේ සියලු සැකය. අවකාශවූ පරිද්දෙන් විචාරව. යමක් සිත කැමැත්තේද එයද අසව."

**55.** බුදුන් විසින් කරණ ලද අවකාශ ඇති අජිත තෙමේ ඇඳිලි බැන්දේ එහිදී තථාගතයන් වහන්සේගෙන් පළමුවෙනි ප්‍රශ්නය විචාළේය.

**56. අජිත තරුණයාගේ ප්‍රශ්නඃ-** 1. "කවරකු විසින් ලොකය වසන ලද්දේද, කවරකු නිසා නොපෙනේද, කවරකින් තැවරුනේ යයි කීයෙහිද, කුමක් ඇසූ කල්හි බිය ගෙන දේදැයි" ආයුෂ්මත් අජිතතෙමේ ඇසීය.

**2.** "අජිතයෙනි, ලොකය අවිද්‍යාවෙන් වැසෙන ලදී. මසුරුකම කරණකොට ගෙනද ප්‍රමාදය කරණකොට ගෙනද නොපෙනේ. තණ්හාව ආලෙප යයි කියමි. දුක මහත් භය වන්නේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**3.** "හැමතන්හි තණ්හා වතුර ගලා බසිත්. තද ජල පහර වැළැක්වීම කුමක්ද? සැඩ පහරවල නැවතීම කියව. කවරකින් මහ වතුර වසනු ලැබේදැයි" අජිත විචාළේය.

**4.** "අජිතය, ලොකයෙහි කාමාදී යම් ජලපහරක් ඇද්ද සිහිය ඔවුන් වලක්වන බැම්මය. ඒ සිහියම කාමාදී ජල පහරවල වැළැක්මයයි කියමි. මොව්හු නුවණින් සම්පූර්ණයෙන් වසනු ලැබේයයි" බුදුහු වදාළසේක.

**5.** "නිදුකානෙනි, ප්‍රඥාවද, සිහියද, නාමරූප දෙකද කවරතැනෙක්හි නැතිවේද විචාරණ ලද මට මෙය කියනු මැනවයි" අජිත තෙමේ විචාළේය.

**6.** "අජිතය, යම් මේ ප්‍රශ්නයක් විචාළේද එය තොපට කියමි. යම් තැනෙක්හි නාමයද, රූපයද, ඉතිරි නොකොට නිරුද්ධවේද සිතේ නිරුද්ධයෙන් නාමරූප දෙක නිරුද්ධ වේ.

**7.** "යම් අනිත්‍යාදී වශයෙන් කල්පනා කරණ ලද ධර්ම කෙනෙක් ඇද්ද මේ ලොකයෙහි යම් ශෛක්ෂකෙනෙක් වෙද්ද, පණ්ඩිතවූ නුඹ වහන්සේ ඔවුන්ගේ ඉරියව් මට ප්‍රකාශ කළ මැනව."

8. "කාමයන්හි ගිජුනොවන්නේය. සිතින් අවුල් නොවන්නේය. සියලු ධර්මයන්හි දක්ෂවූ සිහි ඇති මහණතෙම පිරිනිවෙන්නේය."

**56. තිස්ස මෙත්තෙය්‍ය මාණවකයාගේ ප්‍රශ්නඃ-** 1. "මේ ලොකයෙහි කවරෙක් සතුටුවූයේද, කවරෙකුට තෘෂ්ණා දෘෂ්ටි ආදී කම්පාවීම් නොවෙද්ද අන්ත දෙක දැන මද නුවණින් නොගෑවේද, මහා පුරුෂයායයි කවරෙකුට කියයිද මේ ලොකයෙහි කවරෙක් වැසීම ඉක්ම වූයේදැයි" ආයුෂ්මත් තිස්ස මෙත්තෙය්‍යතෙම ඇසීය.

2. භාග්‍යවතුන් වහන්සේ, "මෙත්තෙය්‍යය, කාමයන්හි දොස් දැක මාර්ග බ්‍රහ්මචර්යයන් යුක්තවූ පහවූ තෘෂ්ණා ඇති හැම කල්හි සිහියෙන් යුත් අනිත්‍යාදී වශයෙන් සිත නිවුනාවූ මහණෙක් වේද" ඔහුට කම්පාවීම් නැත්තාහ.

3. "හෙතෙම අන්ත දෙක දැන මැද ප්‍රඥාවෙන් නොගෑවෙයි ඒ මහා පුරුෂයා යයි කියනු ලැබේ. හෙතෙම මේ ලොකයෙහි වැසීම ඉක්ම වූයේයයි" වදාළසේක.

**57. පුණ්ණක මාණවකයාගේ ප්‍රශ්නඃ-** 1. "තෘෂ්ණාව නැතිකිරීමේ මුල දැනගන්නා ප්‍රශ්නයක් අසනු කැමැත්තෙන් පැමිණියේ වෙමි. මේ ලොකයේ බොහෝ ජටිලයෝද, මනුෂ්‍යයෝද ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද, දෙවියන්ට යාග කළාහුද, එය විචාරමි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ මැනවයි" ආයුෂ්මත් පුණ්ණතෙමේ විචාළේය.

2. "පුණ්ණකය, මේ ලොකයෙහි යම්කිසි බොහෝ මනුෂ්‍ය වූද ක්ෂත්‍රීයවූද බ්‍රාහ්මණවූ ඍෂිකෙනෙක් දෙවියන්ට යාග කළාහුද, පුණ්ණකය, රූපාදිය පතමින් මනුෂ්‍ය භාවය බලාපොරොත්තුවෙන් ජරාව ඇසුරුකළාහුම යාග කළාහුයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

3. "මේ ලෝකයෙහි යම්කිසි බොහෝ ඍෂි කෙනෙක් ඇද්ද මනුෂ්‍ය කෙනෙක් ඇද්ද, ක්ෂත්‍රියයෙක් බ්‍රාහ්මණයෙක් දෙවියන්ට යාග කළාහුද කිමෙක්ද ඔව්හු යාගයෙහි අප්‍රමාදව යාග

කරමින් ජාති ජරා මරණ නැතිකළාහුද, විචාළ මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ මැනවයි" ආයුෂ්මත් පුණ්ණක තෙමේ කීයේය.

4. "පුණ්ණකය, ඔව්හු යාගයන්හි යෙදුනාහු භවාශාවෙන් යුක්තවූවාහු රූපාදිය පතත්, දන් දුන් අයට ප්‍රශංසා කරත්, වචන කියත්, ලාභ නිසා කාමයන්ම පතත්, එහෙයින් ජාතිය ජරාව එතර නොකළාහුයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

5. "දන්දෙන ඔව්හු ඉදින් නිදුකානන් වහන්ස, ජාති ජරා දෙක නොඉක්මෙව්වාහුද නැවත කවරෙක් දෙව් මිනිස් ලෙව්හි ඉපදීමද ජරාවද මරණයද එතර කෙළේදැයි අසමි. එය භාග්‍යවතුන් වහන්සේ මට වදාළ මැනවයි" ආයුෂ්මත් පුණ්ණකතෙමේ කීයේය.

6. "පුණ්ණකය, ලොකයෙහි තමාට අයත්වූද අනුන්ට අයත්වූද ආත්මභාවයන් දැන ලොකයෙහි කිසි තැනක කම්පාවක් නැද්ද, ශාන්තවූ දුශ්චරිතාදී දුම් නැති, රාගාදී දුක් නැති ඉපදීම ජරාව තරණය කළේයයි" වදාළ සේක."

58. **මෙත්තගූ මාණවක ප්‍රශ්නයඃ-** 1. වෙද දත් පුරුදුකළ ගුණධර්ම ඇති ඔහු දනිමි. ලොකයෙහි යම් කෙනෙක් නානා, ප්‍රකාරද මොව්හු දුකට කුමක් හෙයින් ගියාහු දැයි" ආයුෂ්මත් මෙත්තගූ තෙමේ විචාළේය.

2. "මෙත්තගූ මාණවකයෙනි, මගෙන් ඒකාන්තයෙන් දුකට හෙතුව අසන්නෙහිය. දැනීම පරිදි එය තොපට ප්‍රකාශ කරමි. ලොකයෙහි නානාප්‍රකාරවූ යම් දුකක් වේද, තෘෂ්ණාදී උපධීන් ඊට මුලය.

3. "යම්කිසි කෙනෙක් ඒකාන්තයෙන් තෘෂ්ණාදිය කෙරේද ඒ බාලතෙමේ නැවත නැවත දුකට පැමිණේ. එහෙයින් දන්නාවූ සංසාර දුක ඉපදීමට හෙතුව කෙලෙස් දන්නේ පව් නොකරන්නේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

4. "යමක් විචාළේ නම් අපට ප්‍රකාශ කෙළේය. අනිකක් විචාරමි. එය වදාරණු මැනවි. පණ්ඩිතයෝ ජාති ජරාශොක

පරිදෙවයන්ද මහජල පහරද කෙසේ එගොඩ කරත්ද, මුනි තෙමේ එය මට ප්‍රකාශද කරණු මැනව. එසේමැයි මේ ධර්මය ඔබ වහන්සේ දන්නාසේක."

**5.** "මෙත්තගුවෙනි, මේ ආත්මයෙහි මට ප්‍රත්‍යක්ෂ ඒ ධර්මය තොපට ප්‍රකාශ කරන්නෙමි. යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ ලොකයෙහි තෘෂ්ණාව දුරුකරන්නේ යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**6.** "මහා ඍෂීන් වහන්ස, ඒ උත්තම ධර්මයට මම සතුටු වෙමි. යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ ලොකයෙහි තෘෂ්ණාව දුරුකරන්නේය.

**7.** "මෙත්තගු මාණවකයෙනි, උඩ යට සරස මැද යමක් මනාකොට දන්නෙහිද මොවුන් කෙරෙහි ආශාවද දෘෂ්ටියෙන් ගැනීමද විඤ්ඤාණයද අත්හැර සසර නොසිටින්නේ යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**8.** "මෙබඳු විහරණ ඇති සිහි ඇති අප්‍රමාදවූ මහණතෙම මමත්වය වශයෙන් ගන්නා වස්තු අත්හැර හැසිරෙන්නේ ඒ ඥාණවන්ත තෙමේ මෙලොවම ජාති ජරා ව්‍යාධි පරිදෙව දුක අත්හරින්නේය.

**9.** "මහර්ෂීන් වහන්සේගේ මේ වචනයට සතුටු වෙමි. භවත් ගෞතමයන් වහන්ස, අපට නිර්වාණය මනාකොට වදාරණ ලදී. ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දුක් දුරු කළසේක. එසේම මේ ධර්මය ඔබවහන්සේ විසින් දන්නා ලදී.

**10.** "යම් බඳුවූ මුනිතෙමේ මනාකොට අවවාද කරන්නේද ඒකාන්තයෙන් ඔව්හුද දුක දුරුකරන්නේය. නාගයන් වහන්ස පැමිණ ඔබ වහන්සේ වඳිමි. භාග්‍යවතුන් වහන්සේ මට මනාකොට අවවාද කරන්නේනම් යෙහෙක.

**11.** "අත්හරින ලද පව් ඇති නුවණින් පරතෙරට ගිය. රාගාදී කිසිවක් නැති කාමභාවයෙහි නොඇලුණු යම් බ්‍රාහ්මණයෙක් වේද, හෙතෙම ඒකාන්තයෙන් මේ ඔඝය තරණය කෙළේය. එතෙරවූයේද වෙයි. සැක නැත්තේ හුල් නැත්තේ පරතෙරට ගියේය.

12. "මේ ලොකයෙහි වෙද දත් නුවණැති යම් මනුෂ්‍යයෙක් ලොකු කුඩා භවයන්හි මේ ඇල්ම අත්හැර පහවූ තණ්හා ඇත්තේ දුක් නැත්තේ ආශා නැත්තේ ජාති ජරා තරණය කෙළේ යයි කියමි."

**59. ධොතක මාණවක ප්‍රශ්නඃ-** 1. "මහර්ෂීන් වහන්ස, ඔබ වහන්සේගෙන් විචාරමි. භාග්‍යවතුන් වහන්සේ මට ප්‍රකාශකරණු මැනව, ඔබවහන්සේගේ වචනයට කැමතිවෙමි. ඔබ වහන්සේගේ වචන අසා නිශ්ශබ්දව තමාගේ නිවණෙහි හික්මෙන්නෙමියි" ආයුෂ්මත් ධොතක තෙමේ විචාළේය.

2. "ධොතකය, මේ ශාසනයෙහිම එසේ නම් කෙලෙස් තවන වීර්‍ය ඇතිව සිහි ඇතිව කෙලෙස් තවව. මෙයින් අසා තමා නිශ්ශබ්ද නිවනෙහි හික්මෙවයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

3. "මම දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි රාගාදිය නැති ඉරියව් පවත්වන බමුණෙකු දකිමි. සම්පූර්ණ ඇස් ඇති ඔබ වඳිමි ශ්‍රෙෂ්ඨයාණෙනි, මාගේ සැකය දුරුකරණු මැනවි."

4. "ධොතකය මම ලොකයෙහි සැක ඇති කිසිවෙකු මිදවීමට නොයන්නෙමි. ශ්‍රෙෂ්ඨ ධර්මය දැන මෙසේ ඔබ මේ සැඩපහර තරණය කරව."

5. "ශ්‍රෙෂ්ඨයාණෙනි, කරුණා කරමින් අනුශාසනා කළ මැනව. මම යම් විවේක ධර්මයක් දැනගන්නෙම් අහස මෙන් වෙනසකට නොපැමිනෙන්නෙමි. මෙහිම සිටියේ තෘෂ්ණා දෘෂ්ටීන් ආශ්‍රිත නොවූයේ හැසිරෙන්නෙමි."

6. භාග්‍යවතුන් වහන්සේ "ධොතකය තොපට ශාන්තිය කියමි. මෙලොවම රාගාදී උපද්‍රව රහිතව යමක් දැන සිහි ඇතිව හැසිරෙන්නේ ලොකයෙහි තෘෂ්ණාව දුරුකරව්."

7. "යමක් දැන සිහි ඇතිව හැසිරෙන මම බුදුරජාණන් වහන්සේ කෙරෙහිත් උතුම් ශාන්තිය කෙරෙහිත් සතුටුවෙමි. ලොකයෙහි තෘෂ්ණාව දුරුකරමි."

8. භාග්‍යවතුන් වහන්සේ "ධොතකය, උඩද යටද සරසද මැදද යමක් මනාකොට දන්නෙහිද, ලොකයෙහි මෙය සංඝ යයි දැන භවයෙන් භවයෙහි තෘෂ්ණාව නොකරව."

**60. උපසීම මාණවක සූත්‍රයඃ-** 1. "ශ්‍රෙෂ්ඨයානෙනි. මම පුද්ගලයෙකු හෝ ධර්මයක් හෝ ආශ්‍රය නොකොට මහත් කෙලෙස් සැඩපහර තරණය කරන්ට නොහැක්කෙමි. යමක් ආශ්‍රය කොට සැඩපහර තරණය කරම්ද නුවණැස් ඇත්ත ඊට අරමුණු වදාරන්නැයි" ආයුෂ්මත් උපසීවතෙමේ විචාළේය.

2. භාග්‍යවතුන් වහන්සේ "උපසීවයෙනි, සිහි ඇතිව ආකිඤ්චඤ්ඤායතනය බලමින් නැත යන්න ඇසුරු කොට සැඩපහර තරණය කරව. කාමයන් අත්හැර සැකය පහ කෙළේ රෑ දාවල් දෙක්හි නිවන ප්‍රකටව බලව."

3. "යමෙක් සියලු කාමයන්හි වීතරාගීවූයේද ආකිඤ්චඤ්ඤායතනය ආශ්‍රය කොට ඊට පහළ සමාපත්ති භය හැර ඒ පුද්ගලතෙම ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි චුත නොවමින් සිටීදැයි" ආයුෂ්මත් උපසීවතෙමේ ප්‍රශ්න කරයි.

4. "යමෙක් සියලු කාමයන්හි පහවූ ආශා ඇත්තේද, සෙස්ස අත්හැර ආකිඤ්චඤ්ඤායතනය අත්හළේද, හෙතෙම ශ්‍රෙෂ්ඨ ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටින්නේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

5. "සර්වඥයන් වහන්ස හෙතෙම එහි පහනොවෙමින් ඉදින් සිටීනම් මහත් වර්ෂ රාශියක් ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහිම සිටියේ දුකින් මිදුනේ වන්නේය. ඒ සිටි පරිදිම විඤ්ඤාණය චුතවේද (නැතිවේද)"

6. භාග්‍යවතුන් වහන්සේ "උපසීව වාතවේගයෙන් දමන ලද ගින්න යම්සේ එහිම අස්තයට යාද අසවල් දිගට ගියේයයි නොකිව හැකිය. එසේම ඒ මුනිතෙම නාමකයින් මිදුනේ අස්තයට යේ. අසවල් තැනට ගියේයයි නොවේ."

7. "හෙතෙම අස්තයට ගියේ කිසි තැනක වාසයක් නැද්ද නොහොත් යම් බඳු හෙතෙම ශාස්වතද නොපෙරලෙන

ස්වභාවද මට මුනිතෙමේ මනාකොට ප්‍රකාශ කරන්න. මේ කාරණය එසේ දැනගන්නෙම්ද?"

8. "උපසීවයෙනි, අස්තයට යන ඔහුට රූපාදියක් නැත. යමෙකු විසින් ඔහු මෙසේ මෙසේයයි කියන්නේ නම් නසනලද සියලු ස්කන්ධාදී ධර්මයන්හි සියලු වාද හෙතුද නසනලද්දාහයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**61. නන්ද මානව ප්‍රශ්නඃ-** 1. "ලෝකයෙහි ක්ෂත්‍රියාදීහු මුනීහු ඇත්තාහයි කියත්. කිමෙක්ද සමාපත්තිඥාණාදියෙන් උපන් නිසා අපගේ මුනිහු යයි කියත්ද, රූක්ෂ ජීවිකායෙන් යුක්ත නිසා කියත්දැයි" ආයුෂ්මත් නන්දතෙමේ ඇසීය.

2. "නන්දය, දෘෂ්ටියෙනුත් ඇසීමෙනුත් දැනීමෙනුත් මේ ලොකයෙහි දක්ෂයෝ මුනියයි නොකියති. යම්කෙනෙක් කෙළෙස් සේනා නැතිකොට රාගාදී කෙළෙස් නැතිව, ආශා නැතිව හැසිරෙත්ද ඔව්හු මුනීහු යයි කියමි."

3. "යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් ඇද්ද, ඔව්හු දුටු දෙයින්ද, ඇසූ දෙයින්ද, ශුද්ධිය කියත්. සීලයෙන්ද, ව්‍රතයෙන්ද, ශුද්ධිය කියත්. නොයෙක් කරුණින් ශුද්ධිය කියත්. භාග්‍යවතුන් වහන්ස, කිමෙක්ද, එසේ හැසිරෙන්නාවූ ඔව්හු නිදුකාණන් වහන්ස, උත්පත්තියද, ජරාවද, තරණකළාහුද එය විචාරමි. භාග්‍යවතුන් වහන්සේ එම් වදාළ මැනවයි" ආයුෂ්මත් නන්ද තෙමේ ඇසීය.

4. "යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඔවුහු දුටු දෙයින්ද, ඇසූදෙයින්ද, ශුද්ධිය කියත්. ශීලයෙන්ද, ව්‍රතයෙන්ද, ශුද්ධිය කියත්. (ii) නොයෙක් කරුණින් ශුද්ධියයි කියත්. එහි ඔවුහු යම්සේ හැසිරෙද්ද, එසේ නමුත් නන්දය, උත්පත්තියද, ජරාවද, තරණය නොකළාහුයයි කියමියි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

5. (මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

6. "ඉදින් මුනිතෙමේ සතරඹඝ තරණය නොකළවුන් කීයෙහිය. එසේනම් නිදුකාණන් වහන්ස, කවරෙක් මේ මනුෂ්‍ය

ලෝකයෙහි ජාතියද, ජරාවද තරණය කෙළේය. භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගෙන් විචාරමි. මෙය වදාළ මැනවයි" ආයුෂ්මත් නන්දතෙමේ විචාළේය.

7. භාග්‍යවතුන් වහන්සේ "නන්දයෙනි, මම සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ජාති ජරාවලින් වැළඳගත්තාහුයයි නොකියමි. මේ ලෝකයෙහි යම්කෙනෙකුන් අතරෙහි සියලු දුටුදෙය, ඇසූදෙය, ගන්ධ, රස ස්පර්ශ හෝ සීල ව්‍රත හෝ සියල්ල අත්හැර තෘෂ්ණාව දැන ආශ්‍රව නැත්තේද ඒකාන්තයෙන් ඒ මනුෂ්‍යයෝ කාමාදී සතර දියපහර එතරවූයේයයි" කියනු ලැබේ.

8. "ගෞතමයන් වහන්සේ උපධි රහිත වූවක් වදාරණලදී. මහර්ෂීන් වහන්සේගේ මේ දෙශනාවට සතුටුවෙමි. මේ ලෝකයෙහි යම් කෙනෙකුන් කෙරෙහි දක්නාලද්දද, අසන ලද්දද, ගන්ධ රස ස්පර්ශ හෝ සීලව්‍රත යන සියල්ල අත්හැර නානාප්‍රකාර රූපද හැර තෘෂ්ණාව දැන ආශ්‍රවයන්ගෙන් මිදුනාහුද මම ඒ ඕඝය එතර කෙළෙමියි කියමි."

**62. හෙමක මානවක ප්‍රශ්නः-** 1. "බාවාරි ආදීහු මෙසේ වූයේය. මෙසේ වන්නේයයි ගෞතම ශාසනයට පෙර යම් පූර්ව වාක්‍යයක් කීවාහුද මෙහි මෙසේය මෙහි මෙසේය, යන ඒ සියල්ල තර්කයෙන් පොෂ්‍යවූවකි.

2. "මම එහි සතුටු නොවීමි. යමක් දැන සිහි ඇතිව හැසිර ලෝකයෙහි තෘෂ්ණාව දුරුකළ යුතුද, ඒ තෘෂ්ණාව නසන ධර්මය මුනිතෙමේ වදාරණු මැනවියි" ආයුෂ්මත් හෙමක කීයේය.

3. "හෙමකය, මේ ලෝකයෙහි රූපාදී අරමුණු කෙරෙහි ආශා දුරුකිරීම නම් චුත නොවන්නාවූ නිර්වාණ පදවියට යාම වන්නේය.

4. "සිහි ඇති යම්කෙනෙක් මෙය දැන මෙලොවම පිරිනිවියේ ශාන්තවූවාහු වෙත්ද, ඒ දක්නාසුළුවූවෝ ලෝකයෙහි තෘෂ්ණාව දුරුකළාහුය."

**63. තොදෙය්‍ය මානවක ප්‍රශ්නः-** 1. "යම් කෙනෙකු කෙරෙහි කාමයෝ නොවෙසෙත්ද, යමෙකුට තෘෂ්ණාව නැද්ද යමෙක්

සැකය දුරුකළේද, (ii) ඔහුට කෙබඳු මිදීමක් වේදැයි" ආයුෂ්මත් තොදෙය්‍ය තෙමේ ඇසීය.

2. භාග්‍යවතුන් වහන්සේ "තොදෙය්‍යය, (මෙහි 1 (i) යොදාගත යුතුයි.) ඔහුට අනෙක් මිදීමක් නැත."

3. "පහකළ ආශා ඇති හෙතෙම ආශා ඇති කරගනීද නුවණැති හෙතෙම ඥාණයෙන් සිතයිද, ශ්‍රෙෂ්ඨයන් වහන්ස ඒ මුනිවරයා මම යම්සේ දන්නේද, සර්වඥයන් වහන්ස, ඔහු මට ප්‍රකාශ කළ මැනව."

4. "ආශා නැත්තාවූ හෙතෙම බලාපොරොත්තු නොවෙයි. නුවණැති හෙතෙම ඥාණයෙන් සිතයි. තොදෙය්‍යය, මුනිවරයා මෙසේ දැනගනුව රාගාදී කිඤ්චන නැති කාමභවයෙහි නොඇලුන ඒ මුනීහු මෙසේ දනුව."

**64. කප්ප මාණවක ප්‍රශ්නඃ-** 1. "සසරෙහි වැද සිටින්නා හට භයානක වර්ෂාවක්වූ කල්හි ජරාවෙන්, මරණයෙන් පීඩිත වූවහුට පිහිටක් වදාරන්න නුඹවහන්සේ මට යම් පිහිටක් වදාළසේක්ද ඒ එසේමය. අනෙක් පරිද්දකින් නොවේයයි" ආයුෂ්මත් කප්පතෙමේ කීයේය.

2. "කප්පය, සසර නමැති විල මැද සිටින්නාහට මහත් බිය උපදවන ජලගැල්මක් ඇති කල්හි ජරාවෙන් හා මරණයෙන් යුක්තවූ තොපට කප්පය පිහිටක් කියමියි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

3. "රාගාදී කිසිවක් නැති, ගැනීම් නැති ශ්‍රෙෂ්ඨවූ මේ පිහිට ජරාව හා මරණය ක්ෂය කරණ නිර්වාණයයි කියමි.

4. "සිහි ඇති යම් සත්වකෙනෙක් මෙය දැන මේ ආත්මයෙහිම නිවුනාහු මාරයාගේ වසඟයට නොගියාහුය. ඔව්හු මාරයාගේ ශිෂ්‍යයෝ නොවෙති."

**65. ජතුකණ්ණිමානවක ප්‍රශ්නඃ-** 1. මම බුදුරජාණන් වහන්සේ කාමයන්ට නොකැමැත්තේයයි දැන නොකැමැත්තෙන් භාග්‍යවතුන් වහන්සේ විචාරන්ට ආවෙමි. සියල්ල දක්නා ඇස් ඇත්තානෙනි, ශාන්ති පදය වදාරණු මැනව.

ඇත්තාවූ පරිදි මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ මැනවයි ආයුෂ්මත් ජතුකණ්ණතෙමේ විචාළේය.

2. "භාග්‍යවතුන් වහන්සේ වනාහි තේජස් ඇති සූර්යයා තේජසින් පෘථිවිය මෙන් යටකොට සිටී. මහත් ප්‍රඥා ඇත්ත ස්වල්ප නුවණ ඇති මට යම්බඳුවූ මම ඉපදීම හා ජරාව නැති කරණ ධර්මය මෙහිම දැනගන්නෙම්ද, එසේ වදාළමැනව."

2. ජතුකණ්ණය නිවන් නිවන් යන ප්‍රතිපදාවත් නිර්භයයයි දැන තණ්හා වශයෙන් ගත් දෙයද, නොගත යුතු දේද, තොපට නොවේවා. රාගාදී කිසිවක් ද නො වේවා. කාමයන්හි ආශාව දුරුකරව.

4. පෙර අතීත සංස්කාර කෙරෙහිවූ කෙලෙස් වලින් පිරිසිදුවෙව. තොපට ඉදිරිකාලයෙහි රාගාදී කිසිවක් නොවේවා. වර්තමානයෙහිද නොගන්නෙහිය ශාන්තව හැසිරේවා."

5. "බමුණ, යමකින් මාරයාගේ වසඟයට යත්ද, සර්වප්‍රකාරයෙන් නාමරූප දෙක්හි පහවූ ආශා ඇති ඔහුට ආශ්‍රවයෝ නොවෙත් යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**66. භද්‍රාවුධ මාණවකයාගේ ප්‍රශ්නඃ-** 1. "තෘෂ්ණා ආලය අත්හරින තෘෂ්ණාව අත්හරින, කම්පා නොවන, ඔඝ තරණය කළ, කෙළෙසුන්ගෙන් මිදුන තෘෂ්ණාදෘෂ්ටි සිතිවිලි අත්හරින ඥාණවන්තයා කවරෙක්දැයි විචාරමි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා බොහෝ දෙනා මෙයින් යත්.

2. "වීරයන් වහන්ස, ඔබවහන්සේගේ වචන කැමැත්තෙන් මනුෂ්‍යයෝ නොයෙක් ජනපදයන්ගෙන් රැස්වූවාහුය. නුඹවහන්සේ ඔවුන්ට මනාකොට ප්‍රකාශ කරනු මැනව, මේ ධර්මය ඔව්හු එසේ අවබොධ කරණලදී" යනුවෙන් භද්‍රාවුධ තෙමේ ප්‍රශ්න කෙළේය.

3. භාග්‍යවතුන් වහන්සේ "භද්‍රාවුධය තදින් අල්වා ගන්නාවූ සියලු තණ්හාව හික්මවව්. සත්වතෙම උඩද, යටද, සරසද, මැදද, ලෝකයෙහි යමක් යමක් ගනීද ඔහු සමග මාරයා ලුහුබඳී.

**4.** "එහෙයින් දන්නාවූ මහණතෙම සිහි ඇත්තේ සියලු ලෝකයෙහි කිසිවක් නොගන්නේය. මේ ප්‍රජාව ගනු ලබන සත්වයෝයයි දක්නේ මාරයා පාසයෙහි බැඳගන්නේය."

**67. උදයමාණවකයාගේ ප්‍රශ්නඃ-** 1. "ධ්‍යාන කරණ කෙලෙස් රජස් දුරුකරහුන්, කරණලද කටයුතු ඇති, ආශ්‍රව රහිත, සියලු ධර්මයන්හි පරතෙරට ගිය, බුදුන්ගෙන් ප්‍රශ්න කිරීමේ අදහසින් පැමිණියෙමු. අවිද්‍යා දුරුකරණ රහත්ව කෙලෙසුන්ගෙන් මිදීම කියනුමැනවියි" ආයුෂ්මත් උදය මානවකතෙමේ ප්‍රශ්න කළේය.

**2.** "උදයය, කාමසංඥාවන්ද, දොම්නසද යන දෙක දුරු කරණ, කයේ මැලිකම දුරු කරණ, පසුතැවීම දුරුකරණ

**3.** උපෙක්ෂා, ස්මෘති, දෙකින් පිරිසිදුවූ, අර්හත් විමොක්ෂය පෙරටුව යන අවිද්‍යාව නසන ධර්මය අඤ්ඤාවිමොක්ෂය (රහත්වීම) යයි කියනු ලැබේ."

**4.** "ලොකයෙහි බැඳීම කවරේද, හැසිරීම කවරේද, කුමක් ප්‍රහීන කිරීමෙන් නිර්වාණයයි කියනු ලැබේද?"

**5.** "නන්දි නම් තෘෂ්ණාව ලොකයෙහි බැඳීමය. විතර්කය පරීක්ෂාවයි තෘෂ්ණාව දුරු කිරීමෙන් නිර්වාණයයි කියනු ලැබේ."

**6.** කෙසේ සිහි ඇතිව හැසිරෙන්නාහට විඤ්ඤාණය නැතිවේද, භාග්‍යවතුන් වහන්සේ විචාරන්ට පැමිණියෙමු ඔබවහන්සේගේ කියමන අසමු.

**7.** "ඇතුළත පිටත වේදනාව නොඉවසන්නාවූ සිහි ඇත්තාහට විඤ්ඤාණය නැතිවේ" යනු බුදුරජාණන් වහන්සේ වදාළසේක.

**68. පොසාල මාණවක ප්‍රශ්නඃ-** 1. "යමෙක් තෙමේ තෘෂ්ණා නැත්තේ සිඳින ලද සැක ඇත්තේ යමෙකුගේ අතීතය කියයිද? සියලු ධර්මයන්ගේ පරතෙරට ගියේය. නුඹවහන්සේ ගෙන් ප්‍රශ්න කිරීමට පැමිණියෙමි.

**2.** "ඉක්මවූ රූප සංඥා ඇත්තාවූ සියළු රූප කාය ප්‍රහාණය කළ හට ඇතුළතද, පිටතද, කිසිවක් නැතැයි දක්නාහට

ශ්‍රෙෂ්ඨයන් වහන්ස එබඳු ඥානය විචාරමි. මත්තෙහි නුවණ වෙසේද, කෙබඳුදැයි” ආයුෂ්මත් පොසාල තෙමේ විචාළේය.

3. භාග්‍යවතුන් වහන්සේ “පොසාලය, සියලු විඥ්ඥාණයන් පිහිටන තැන් තථාගතතෙමේ දන්නේ ආකිඤ්චඤ්ඤායතනයයෙහිවූ මේ පුද්ගලයා දනියි.

4. “ආකිඤ්චඤ්ඤායතනය උපදවන කර්මයද, අරූපභව ආශාව, සංයොජනයයි මෙසේ මෙසේ දැන එහි විදර්ශනා කරයි. වැඩ නිමවන ලද්දාවූ ඒ බ්‍රාහ්මණයාට මේ ඥාණය වේ.”

**69. මොඝරාජ සූත්‍රයඃ-** 1. “මම දෙවාරයක් විචාළෙමි. තුන්වෙනි වාරයෙහි විශුද්ධිදෙව්වූ ඍෂිතෙමේ මාගේ ඇසීම ප්‍රකාශ කරන්නෙහියයි” ආයුෂ්මත් මොඝරාජතෙමේ කීයේය.

2. “මෙලොවද, පරලොවද, දෙවියන් සහිත බ්‍රහ්මලොකයද යන මේ තැන්හි කීර්ති ඇති ගෞතමයන් වහන්සේගේ දෘෂ්ටි නොදනිමි.

3. “මෙසේ උතුම් දේ දක්නාවූ බුදුරජාණන් වෙත ප්‍රශ්න ඇසීම ප්‍රයෝජන කොට පැමිණියේවෙමි. කෙසේ නොම බලන්නාහු මාරතෙම නොදකීදැයි” (මොඝරාජ තෙම ප්‍රශ්න කළේය.)

4. “මොඝරාජය, හැම කල්හි සිහි ඇත්තේ ලොකය ශූන්‍ය වශයෙන් බලව ආත්ම දෘෂ්ටිය තරණය කොට සිටියේ මාරයා ඈත්කළේ වන්නේය. මෙසේ ලොව බලන්නහු මාරතෙම නොදක්නේය.”

**70. පිංගිය සූත්‍රයඃ-** 1. “දුර්වලවූ, දුර්වර්ණවූ වයස්ගත කෙනෙක්වීමි. ඇස පෙණීම අඩුය, ඇහීම අපහසුය. අතර සිහිමුලාව මම නොනසිම්වා, ඉපදීම හා ජරාවගේ දුරුකිරීම මෙහිදීම මම දැනගනිම්ද? එබඳු ධර්මයක් දෙශනා කරණු මැනවයි’ පිංගියතෙම කීයේය.

2. “පිංගිය, රූප හේතුවෙන් වෙහෙසෙනු ලබන්නවුන් දැක රූප හේතුවෙන්ම ජනයෝ පෙළෙත්. පිංගිය, එහෙයින් තෝ

ප්‍රමාදනුවූයේ නැවත නොලැබීම පිණිස, රූපය දුරු කරවයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

2. "සතර දිශාවෙහිද සතර අනුදිශාවෙහිද, උඩ, යට යන මේ දශ දිශාවෙහිම ඔබවහන්සේ නොදැකී. නොඇසූ, ස්පර්ශ නොකළ දෙයක් නැත. එසේම, ලොකයෙහි නොදන්නා කිසිවක් නැත. මෙහි ජාති, ජරාවගේ දුරුකිරීමට යම් ධර්මයක් මම දැනගනිම්ද, ඒ ධර්මය දෙශනාකරණු මැනවයි. පිංගියතෙම කීයේය.

4. "පිංගිය, තෘෂ්ණාවේ ගැලුනාවූ මිනිසුන් බලන්නේ ශාන්තවූ ප්‍රජාව ජරාවෙන් දුරුයයි දැන, එහෙයින් පිංගිය තෝ ප්‍රමාදනුවූයේ නැවත නූපදීම පිණිස තෘෂ්ණාව දුරුකරව්."

5. "භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරා මගධ රට වැඩ වාසය කරණසේක් පාෂාණක චෛත්‍යයෙහි සිටි බ්‍රාහ්මණයන් දහසය දෙනෙකුන් විසින් ආරාධනා කරණ ලද්දේ ඇසූ ප්‍රශ්න විසඳූසේක. එක් ප්‍රශ්නයකගේ අර්ථය දැන, ධර්මය දැන ධර්මානුධර්මයෙහි පිළිපදනේ නම් ජාති, ජරා, මරණයාගේ කෙළවරට යන්නේය. මේ ධර්මයෝ (පුද්ගලයා) එතරට යවන බැවින් මේ ධර්ම ක්‍රමයට "පාරායන" යයි තවත් නමෙකි.

6. අජිතය, තිස්ස මෙත්තෙය්‍යය, පුණ්ණකය එසේම මෙත්තගූය, ධොතකය, උපසීවය, නන්දය, එසේම හේමකය, තොදය්‍යය කප්ප යන දෙදෙනාය නුවණැති ජතුකණ්ණිය, භද්‍රාවුධය, උදයය, පොසාල බ්‍රාහ්මණය, ප්‍රඥාවත් මොඝරාජය, පිංගිය මහාඍෂිවරයාය යන මොවුහු මහර්ෂීවූ චරණ ධර්මයන්ගෙන් යුක්තවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත නිපුණවූ ප්‍රශ්නයන් විචාරනු පිණිස පැමිණියාහ.

7. යම්බඳුවූ ඒ ප්‍රශ්නයන් විචාරණලද ඔවුන්ට බුදුරජ තෙම විසඳා වදාළසේක. මුනිතෙම ප්‍රශ්න විසඳීමේදී බ්‍රාහ්මණයන් සන්තොෂ කළසේක.

8. සතුටුවූ ඔවුහු පසැස් ඇති සූර්යබන්ධුවූ උතුම් නුවණැති බුදුරදුන් වෙත බඹසර හැසුරුණාහ.

**9.** යම්සේ බුදුරදුන් විසින් දෙශනාකරණලද එක එකම ප්‍රශ්නයක පවා යමෙක් පිළිපදනේද, ඔහු මෙතරින් එතරට යන්නේය.

**10.** "උතුම් මාර්ගය වඩන්නේ මෙතරින් එතරට යන්නේය ඒ මාර්ගය පරතෙර ගමනට ප්‍රයෝජන බැවින් පාරායනයයි කියයි.

**11.** "නිර්මලවූ උතුම් ප්‍රඥා ඇති ආශා රහිත කෙළෙස් වනයන් නැති ශ්‍රෙෂ්ඨයන් වහන්සේ යම්සේ දැක්කේද, එසේ දෙශනාකළසේක. පාරායන ධර්මය අනුව ගියෙමි. කවර කරුණක් නිසා බොරු කියම්දැයි පිංගියතෙම" කීයේය.

**12.** "මානය හා ගුණමකුකම දුරුකළ ගෙවා දැමූ කෙලෙස් මල හා මොහය ඇති බුදුරදුන්ගේ ගුණ වර්ණනාවෙන් යුක්ත වචනය" දැන් මම කියන්නෙමි.

**13.** "පසැස් ඇති මෝහ අඳුර නසන චතුරාර්ය සත්‍යය අවබොධකළ ලෝකයාගේ කෙළවරට ගිය, සියලු භවයන් ඉක්මවූ කෙළෙස් නැති සියලු දුක් දුරුකළ සත්‍යවූ 'බුද්ධ' යන නම් ඇති උන්වහන්සේ බ්‍රාහ්මණවූ මා විසින් ආශ්‍රය කරණ ලද්දේ වෙමි.

**14.** "යම්සේ පක්ෂිතෙම කුඩා වනය හැර බොහෝ ගෙඩි වර්ග ඇති මහවනයට යේද මෙසේම මමද ස්වල්ප නුවණ ඇතියන් අත්හැර බොහෝ දිය ඇති විලට යන හංසයාමෙන් මෙහි පැමිණියෙමි.

**17.** "මත්තෙහි ගෞතම ශාසනය වන්නේයයි යමෙක් මට ප්‍රකාශ කළෝද සිතීම් ඇතිකරවමින් ඒ සියල්ල එසේම විය.

**16.** "අවිද්‍යාන්ධකාරය දුරුකරන්නාවූ අසහායවූ සූර්යයාවූ උන්වහන්සේ ශ්‍රෙෂ්ඨ ඉපදීම ඇතිසේක. ඥාණධජවූ ගෞතම සේක. බොහෝ ප්‍රඥා ඇති ගෞතමසේක.

**17.** "යම් බුදුකෙනෙක් මෙලොව පලදෙන කල්නොයවා විපාක දෙන ධර්මය දෙශනා කළසේක්ද කෙලෙස් උවදුරු නැති තෘෂ්ණාව දුරුකළ උන්වහන්සේට සමාන කළ යුත්තක් නැත.

18. "පිංගිය, ඥානධජවූ මහා ප්‍රඥා ඇති ඒ බුදුරදුන් කෙරෙන් කිමෙක්ද මොහොතක්වත් වෙන්ව වසන්නෙහිද?

19. "(මෙහි 19 ඡෙදය යොදා ගත යුතුයි.)

20. "බමුණ, ඥානද්වජවූ බොහෝ ප්‍රඥාඇති ඒ බුදුරදුන් කෙරෙන් මොහොතක්වත් වෙන්ව නොවසමි.

21. (මෙහි 19 ඡෙදය යොදාගත යුතුයි.)

22. "රෑ දාවල් දෙක්හි අප්‍රමාද වූයේ ඒ බුදුන් වහන්සේ ඇසින් මෙන් සිතින්ද දකිමි. රාත්‍රියෙහි නමස්කාර කරමින් සිටිමි එයින්ම වෙන් නොවූ බව දනිමි.

23. "මාගේ ශ්‍රද්ධාවද ප්‍රීතියද යහපත් සිතද සිහි ඇති බවද ගෞතම ශාසනයෙන් ඉවත් නොවෙත් මහාප්‍රඥා ඇති බුදුරජ තෙම යම් යම් දිශාවක ගමන් කෙරේද, ඒ ඒ දිශාවට නැමුනේ වෙමි.

24. "දුර්වල ශරීර ඇති වයස්ගතවූ මාගේ ශරීරය ඒ නිසාම ඒ බුදුන් වෙත නොයයි, සිහි ඇති ස්වල්ප ගමනින් නිතර යමි. බ්‍රාහ්මණය, යම්තැනක බුදුරදුන්වේද මාගේ සිත එහිමය.

25. "කාම මඩෙහි නිදන්නේ සැලෙන්නේ, ශාස්තෘවරයෙකුගෙන් ශාස්තෘවරයෙකු වෙත ගියෙමි. ඉක්බිති කාමාදී සැඩවතුරු තරණය කළ කෙලෙස් නැති බුදුන්වහන්සේ දිටිමි.

26. "යම්සේ වක්කලිතෙම ශ්‍රද්ධාව මුදා රහත්වූයේද භද්‍රාවුධ යම්සේද, ආලවී ගෞතමතෙම යම්සේද, එමෙන්ම ඔබද ශ්‍රද්ධාව මුදව, පිංගිය, ඔබ නිර්වාණයට යන්නෙහිය.

27. "මුනීන්ද්‍රයන් වහන්සේගේ මේ වචනය අසා බොහෝ සෙයින් පැහැදුනෙමි. දුරුකළ මෝහාදිය ඇති සම්‍යක් සම්බුද්ධ තෙම කෙලෙස් හුල් නැති ඉක්මන් වැටහීමක් ඇති කෙනෙකි.

28. "ඉතා උසස් ධර්මය දැන හීන ප්‍රණීත සියල්ල දත්සේක ශාස්තෘතෙම ප්‍රශ්නයක් කෙළවර කළසේක. සැක නැතැයි දන්වනසේක.

29. "රාගාදියෙන් නොසෙලවෙන වෙනස් නොවෙන යම් ඒ බුදුන් වහන්සේට සමාන කළ යුත්තක් නැත, ඒකාන්තයෙන් නිර්වාණ ධාතුවට යන්නෙමි. මෙහි සැකයක් නැත. මිදුනු සිත් ඇත්තේයයි මෙසේ මා දරව."

පාරායණ වර්ගය නිමි.

(සූත්‍රනිපාතය නිමි.)

---

# 6. විමානවත්ථු.

## ඉත්ථි විමානවත්ථු

### 1. පීඨ වර්ගය.

1. පඨම පීඨ (පුටු) විමාන කථාවː- 1. "යහපත් වස්ත්‍ර ඇති, අඳිනලද මල්මාලා සහිත සිතු කෙණෙහි කැමැති තැනට ගමන් කරණ රන්වන් මහත් අලංකාර කළ පුටුව වලාකුල විදුලියකින් මෙන් බබලයි.

2. "මෙබඳු වර්ණ සම්පත්තියක් පෙරමිනිස් ලොවදී කෙබඳු කුශලයක් කොට තී ලබන ලද්දේද, කිනම් කාරණයකින් තීට මෙබඳු දිව්‍යානුභාවයක් පහළවේද, සිතට ප්‍රියවූ යම්කිසි භොග කෙනෙක් උපදිත්?"

3. ආනුභාසම්පන්න දෙවතාවෙනි, ඔබ විචාරමි. මනුෂ්‍යව සිටියදී කිනම් පිනක් කෙළෙහිද, තොපගේ ශරීර වර්ණය සියලු දිශා එලිය කරයි. කවර හෙයින් මෙවැනි දිලිසෙන ආනුභාව ඇත්තෙහිද,

4. "මොග්ගල්ලාන තෙරුන් විසින් විචාරණලද සතුටු සිත් ඇත්තාවූ ඒ දෙවතාතොමෝ ප්‍රශ්න වශයෙන් විචාරණ ලද්දී යම් කර්මයකගේ මේ විපාකයද එය ප්‍රකාශ කළාය.

5. "මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යවූ මම මගේ ගෙදොරට පැමිණි භික්ෂුනමකට ආසනයක් දුනිමි. වැන්දෙමි, ඇඳිලි කෙළෙමි, හැකි පරිද්දෙන් දන්ද දුනිමි,

6. "ඒ හෙතුවෙන් මට මෙබඳු වර්ණයක්වේ. ඒ හෙතුවෙන් මට මෙහි සමෘද්ධියවේ. සිතට ප්‍රියවූ යම්කිසි සම්පත් ඇත්ද, ඒවා මට උපදිත්.

7. "මහත් ආනුභාව ඇත්තාණනි, ඔබට ප්‍රකාශ කරමි. මනුෂ්‍යවූවා, යම්පිනක් කළාද එහෙයින් මෙසේ බබලන ආනුභාව ඇත්තී වෙමි. මාගේ වර්ණයද සියලු දිශා බබුළුවයි.

**2. දුතිය පීඨ කථාව**:- (මේ කථාව පළමුවෙනි කථාව මෙනි.)

**3. තතිය පීඨ විමාන කථාව**:- 1-4 (1. කථාවෙහි 1-4 ඡෙද මෙන් වෙත්.)

5. "යම් හෙතුවකින් මම දිලිසෙන ආනුභාව ඇත්තීද මේ මාගේ ස්වල්ප කුශල කර්මයක විපාකයයි. මම පූර්ව ජාතියෙහි මනුෂ්‍යලොකයෙහි මනුෂ්‍යයන් අතර මනුෂ්‍යයෙක් වූයේ වෙමි.

6. "අතිශයින් ප්‍රසන්න, නොකැළඹුණු කෙලෙස් රජස් නැති භික්ෂුවක් දුටිමි. උන්වහන්සේට පැහැදුනාවූ මම ස්වකීය අත්දෙකින් පුටුවක් දුනිමි.

7. "(1. කථාවේ 6 ඡෙදය මෙනි.)

8. "(1. කථාවේ 7 වෙනි ඡෙදය මෙනි.)

**4. චතුත්ථ පීඨ විමාන කථා**:- 1-7 "(මේ ඡෙද 3. කථාවේ 1-7 ඡෙද මෙන් වෙත්.)

**5. කුඤ්ජර විමාන කථාව**:- "එම්බා දෙවතාදුව තිගේ මේ උතුම් වාහනවූ නොයෙක් මැණික්වලින් කළ සැරසීම් ඇති දර්ශනීයවූ, වෙගයෙන් යුත් බලසම්පන්න, ආකාශචාරීවූ හස්ති රාජයෙක්වේද, ඔහු-

2. "පද්මයක්සේය, පියුම් පෙති වැනි ඇස් ඇත්තේය, පියුම් හා මහනෙල්මල් ප්‍රභාව දරයි, පියුම් රෙණුයෙන් වැගුරුණු ශරීර ඇත්තේය, රන්නෙලුම් මල්දම් ඇත්තේය.

3. "තවද ඇත් තෙම යනමග පියුම් පිපෙයි. පියුම් පතින් අලංකාරය, සිටීම රම්‍යය, නොහැපීම් ඇත්තේය. ප්‍රමාණ ගමන් ඇත්තේය.

4. "යන්නාවූ ඔහුගේ රන්මිණිගෙඩි ඇලුම් උපදවන ශබ්ද ඇත්තේය. පඤ්චාංගික තූර්ය ඝොෂාවක් මෙන් කර්ණ රසායනව ඇසෙයි.

5. "ඒ ඇත්රාජයාගේ කඳෙහි ශොභන වස්ත්‍ර ඇති අලංකාරවූ ඔබ මහත් දිව්‍යාංගනා සමූහයා වර්ණයෙන් ඉක්ම බබළන්නෙහිය.

6. "තොප දුන් දානයක මේ ප්‍රයෝජනද, නොහොත් සීලයක ප්‍රතිඵලද, නැතහොත් වැඳීමක ප්‍රතිඵලද, විචාරණ ලද මට ඒ කාරණය කියන්න

7. මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ විසින් විචාරණ ලදුව සතුටුවූ දෙවතාතොමෝ ඒ කර්මයාගේ මේ ප්‍රයොජනය ප්‍රකාශ කළාය.

8. "ධ්‍යාන කරණ ධ්‍යානයෙහි ඇලුන ගුණවත් සත් පුරුෂයකු (සැරියුත් තෙරුන්) දැක වස්ත්‍ර ඇතුරූ මල් විසිරුවූ අස්නක් දුන්නෙමි.

9. "මම අර්ධ නෙළුම්මල් මාලාවන් ඇති ආසනය හාත්පස පියුම් වැසි වස්නාසේ සියතින් මල්පෙති විසුරුවූයෙමි.

10. "ඒ කුශල කර්මයාගේ මෙබඳුවූ මේ ඵලයයි, මම දෙවියන් විසින් කරණ සත්කාරවලින් පුදන ලද්දීමි.

11. "යමෙක් ඒකාන්තයෙන් යහපත් කොට කෙලෙසුන්ගෙන් මිදුන සන්සුන් සිත් ඇති බ්‍රහ්මචාරීන්ට පැහැදුනේ අස්නක් දෙන්නේද, හේ මා මෙන් සතුටු වන්නේය.

12. "එබැවින් අභිවෘද්ධිය කැමති උසස් බව බලාපොරොත්තු වන්නන් විසින් අන්තිම සිරුර දරන්නවුන්ට ආසන දිය යුතුය."

6. **පඨම නාවා විමාන කථාව:-** 1. "දෙවතාවෝ රන් සෙවෙලිකරණලද නැවට නැගසිටින්නෙහිය. පොකුණෙහි ජල ක්‍රීඩාවට බසින්නෙහිය. පියුම් අතින් කඩා ගන්නෙහිය.

2-4. (මේ ඡෙද 1. කථාවේ 2-4. ඡෙදමෙන් වෙත්)

5. "මම පූර්ව ජාතියෙහි මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍ය ධර්මයෙහි පිහිටි විද්‍යාමාන මිනිසුන්ට අයත්ව මිනිස් ලොව

ඉපද (ii) ත්‍රස්ත පිපාසිතවූ ක්ලාන්තවූ භික්ෂූන් දැක නැගිට පානයට පැන්දුන්නෙමි.

**6.** "යමෙක් ක්ලාන්තවූ පිපාසයෙන් යුක්තවූවන්ට නැගිට බීමට පැන් දෙන්නෙද ඔහුට බොහෝ පියුම් ඇති ශීතල ජලය ඇති බොහෝ මල් ඇති නදීහු පහළවෙත්.

**7.** "සිහිල්දිය ඇති වැලි විසුරුණු, පිපී සිටි අඹ සල් තිලක ජම්බු ඇසල පළොල් ආදීන් (ඉවුරෙහි) ඇති නදීහු සැම කල්හි ඔහු පිරිවරා සිටිත්.

**8.** "භූමිභාගයන්ගෙන් යුත් අතිශයින් අලංකාරවූ ඒ ශ්‍රේෂ්ඨ විමානය මේ ඒ කුශල කර්මයාගේ විපාකයයි කළ පින් ඇත්තාහු මෙවැනි දේ ලබත්.

**9-10** (මේ ඡේද 1. කථාවේ 6, 7 ඡේදමෙන් වෙත්.)

**7. දුතිය නාවා විමාන කථාව:-** (මේ කථාව 6 කථාව මෙනි.)

**8. තතිය නාවා විමාන කථාව:-** 1. (මේ ඡේදය 6 කථාවේ 1 ඡේදය මෙනි.)

**2.** "ඔබගේ කුළු ගෙවල්ද වාසස්ථානද කොටස් වශයෙන් ප්‍රමාණ කරණ ලද්දේය. හාත්පසින් සතර දිශාද බබුළුවත්.

**3, 4, 5.** (මේ ඡේද 1 කථාවේ 2, 3, 4, ඡේද මෙන් වෙත්.)

**6, 9.** (මේ ඡේද 6 කථාවේ 5-8 ඡේද මෙන් වෙත්.)

**10.** (මේ ඡේදය මේ කථාවේ 2 ඡේදය මෙනි.)

**11.** (මේ ඡේදය 1 කථාවේ 6 ඡේදය මෙනි.)

**12.** "ඒ කරණ කොටගෙන මෙසේ දිලිසෙන ආනුභාව ඇත්තී වෙමි. මාගේ වර්ණය සියලු දිගුන් බබුළුවයි වැඩ පිණිස ඒ බුදු තෙම ජලය පානය කෙළේ වේද මාගේ ඒ කුශල කර්මයාගේ මේ ප්‍රතිඵලයයි."

**9. දීප විමාන කථාව:-** 1. "එම්බා දෙවතා දුව, ඔසධී තාරකාව දසදිශා එකාලොක කරයිද, එමෙන් රම්‍යවූ වර්ණයෙන්ද ඒ ඔබ සිටින්නෙහිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** (මෙය 1 කථාවේ 2 ඡේදය මෙනි.)

**3.** "දෙවතාව, කිනම් කරුණකින් ඔබ නිර්මල කාන්ති ඇති අනිත් දෙවතාවන් ඉක්මවා බබලයිද, ඔබගේ සියලු ශරීරයෙන් කිනම් කරුණක් නිසා සියලු දිශාවෝ බබළත්ද?"

**4, 5** (මේ ඡේද 1 කථාවේ 3, 4 ඡේද මෙන් වෙත්.)

**6.** (මෙහි 6 කථාවේ 5 ඡේදයේ 1 කොටස යෙදිය යුතුයි.) කළුවර පොහෝ දවසක අන්ධකාරයෙහි පහන් දල්වන කාලයෙහි පහනක් දුනිමි.

**7.** "යමෙක් කළුවර දවසෙහි අන්ධකාරයෙහි පහනක් වුවමනා අවස්ථාවෙහි පහනක් දෙයිද බොහෝ මල්මාලා ඇති බොහෝ පස් පියුම් ඇති බබළන රශ්මි ඇති විමානයක උපදී.

**8.** (මෙහි 1 කථාවේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**9.** "ඒ කරණ කොටගෙන නිර්මල ආලොකයෙන් දෙවතාවන් පරදවා බබළමි. ඒ පිනෙන් මාගේ මුළු ශරීරයෙන් සියලු දිශා බබළයි."

**10.** (මෙය 1 කථාවේ 7 ඡේදය මෙනි.)

**10. තිලදක්ඛිණ විමාන කථාව:-** 1. (මේ ඡේදය 9 කථාවේ 1 ඡේදය මෙනි.)

**2-4.** (මේ ඡේද 1 කථාවේ 2-4 ඡේද මෙන් වෙත්.)

**5.** (මේ ඡේදය 6 කථාවේ 5 (i) ඡේදය මෙනි.)

**6.** "අතිශයින් ප්‍රසන්නවූ නොකැලඹුනාවූ රජස් නැති බුදුන් දුටුවෙමි, දැක සතුටුව අන් දෙයක් නොලැබ තල දානයක් මගේ අතින් දක්ෂිණාර්හවූ බුදුන්ට පූජා කෙළෙමි.

**7-8** (මේ ඡේද 1 කථාවේ 6, 7 ඡේද මෙන් වෙත්.)

**11. පතිව්‍රතා විමාන කථාව:-** 1. "දිව්‍යමය, කොස් ලිහිණියෝද, මොණරුද, හංසයෝද යහපත් නාද ඇති කොවුලෝද නටති. නොයෙක් අලංකාරවත් ස්ත්‍රී පුරුෂයන් විසින් හැසිරෙන ලද රම්‍යවූ මේ විමානය මලින් ගැවසී ගත්තේය.

2. "මහත් ආනුභාව ඇති දිව්‍යාංගනාව එහි වසන්නෙහිය. නානාප්‍රකාර සෘද්ධිහු පහළ කරත්. ඔබගේ මේ දිව්‍යාප්සරාවෝ වටකර නටත්, ගී කියත්, සතුටු කරවත්,

3. "මහත් ආනුභාව ඇති දෙවතාව දිව්‍ය සෘද්ධියට පැමිණියේ වෙහිය මිනිස්ව කිනම් පිනක් කළාද, කුමක් නිසා මෙසේ දිලිසෙන ආනුභව ඇත්තීද, තොපගේ වර්ණයද සියලු දිශා බබුළුවයි."

4. (මෙය 1 කථාවේ 4 ඡේදය මෙනි.)

5. "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක් වූයේ පතිප්‍රතාවූයේ අන් කෙනෙකු වෙත සිත් නැත්තියක් වූවාවෙමි. පුත්‍රයකු රකින මවක මෙන් කිපීමක් නොකරන්නෙම් පරුෂ වචනද නොකීවෙමි.

6. "ඇත්ත කියන සුළුව, මුසාවාදය හැර දන්දීමෙහි ඇලුනා, සංග්‍රහ කළ ජීවිත ඇත්තියක් වීමි. ප්‍රසන්න සිතින් ආහාරපානද සකස් කොට මහත් දානද දුන්නෙමි.

7-8 (මේ ඡේද 1 කථාවේ 7 ඡේදයමෙන් වෙත්.)

12. දෙවෙනි පතිව්‍රතා විමාන කථාවඃ- 1. "වෛදූර්ය මාණික්‍යමය කණු ඇති මනොඥවූ පැහැ විහිදෙන බොහෝ විසිතුරු ඇති විමනකට නැගී (මෙහි 1 කථාවේ 2 ඡේදය යෙදිය යුතුයි.)

2. 3 (මේ ඡේද 1 කථාවේ 3 4 ඡේද මෙන් වෙති.)

4. "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක් වූයේම ඇස් (නුවණ) ඇති උපාසිකාවක් වීමි. සතුන් මැරීමෙන් වෙන් වූයෙමි. නුදුන්දේ ගැනීමෙන් වෙන්වූයෙමි.

5. "රහමෙර නොබොන්නේ, බොරුද නොකීමි. ස්වකීය ස්වාමියා සමගම සතුටුවූයෙමි. පැහැදුන සිතින් මහත් ආහාර පානයෙන් දානයක් සකස් කොට දුනිමි.

6. 7 (මේ ඡේද 1 කථාවේ 6,7 ඡේද නේ වෙත්.)

**13. සූණිසා විමාන වස්තු කථාවඃ**- 1. 2. (මේ ඡේද 9 කථාවේ 1, 2 දෙ මෙන් වෙත්.)

3. 4 (මේ ඡේද 1 කථාවේ 3, 4 දෙ මෙන් වෙත්.)

**5.** "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක් වූයෙමි මා මාගේ ගෙදර ලේලි කෙකේ වීමි.

**6.** "ඒ කාලයෙහි ක්ෂය කරණ ලද කෙලෙස් රජස් ඇති ප්‍රසන්න නොකැළඹුණු භික්ෂුවක් දුටුවෙමි. පැහැදුනේ මගේ අත් වලින් උන්වහන්සේට කැවුමක් දුනිමි. මගේ කොටසින් කොටසක් පුදා නඳුන් වනයෙහි සතුටු වෙමි."

7. 8 (මේ ඡේද 1 කථාවේ 6, 7 ඡේද මෙන් වෙත්.)

**14. දෙවෙනි සුණිසා විමාන කථාවඃ-** 1-5 (මේ ඡේද 13 කථාවේ 1-5 ඡේද මෙන් වෙත්.)

**6.** (මේ ඡේදය 13 කථාවේ 6 ඡේදයේ කැවුමක් වෙනුවට පිට්ටුවක් කියා වෙනස් කර යොදාගත යුතුයි.)

7, 8 (මේ ඡේද 1 කථාවේ 6-7 ඡේද මෙන් වෙත්.)

**15. උත්තරා විමාන කථාවඃ-** 1, 2 (මේ ඡේද 9 කථාවේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3. 4 (මේ ඡේද 1 කථාවේ 3, 4 ඡේද මෙන් වෙත්.)

**5.** "ගෙයි වාසය කරන්නාවූ මා විසින් ඊර්ෂ්‍යාවද මසුරු බවද නැවත ගුණමකු බවද නොකෙළෙමි. ක්‍රොධ නොකරන්නී ස්වාමී පුත්‍රයාට පැවතිය යුතු සියලු ගුණයෙන් යුක්තව වාසය කෙළෙමි.

**6. 7.** "තුදුස්වක් දිනයෙහිද පසළොස්වක් දිනයෙහිද පක්ෂය සම්බන්ධ අටවක් දිනයෙහිද ප්‍රාතිහාර්ය පක්ෂ දිනයෙහිද අෂ්ටාංගයෙන් යුක්තවූ උපොසථය සමාදන් වීමි. සියලු කාලයෙහිම හික්මීමෙන් යුක්තව සීලය වෙන් වෙන්ව සිතීමෙන් යුක්තව, මාගේ ගෙයි වාසය කෙළෙමි.

**8.** "ප්‍රාණඝාතයෙන් වෙන්වූවා බොරු කීමෙන් හික්මුණු සොරකම් කිරීමෙන්ද පරදාර සේවනයෙන්ද සුරාපානය කිරීමෙන්ද දුරුවූවා වෙමි.

**9.** "පඤ්ච ශික්ෂා පදයෙහි ඇලුනෙමි. ආර්යසත්‍යය දැනීමෙහි දක්ෂවීමි. යසස් ඇති පසැස් ඇති ගෞතමයන් වහන්සේගේ උපාසිකාවක් වීමි.

**10.** "එසේවූ මම යහපත්වූ ශීලයෙන්ද යුක්තවීමි. එසේම කීර්තියෙන්ද කීර්තිමත් වීමි. කරදර නැති සැප ඇත්තියක්ව ස්වකීය පින අනුභව කරමි.

11, 12 (මේ ඡෙද 1 කථාවේ 2, 7 ඡෙද මෙන් වෙත්.)

13. "ස්වාමීනි, මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිසින් වඳින්න. 'ස්වාමීනි, උත්තරා නම් උපාසිකාව භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිසින් වඳීයයි" කියන්න. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට යම් මේ ශ්‍රමණ ඵලයක් ප්‍රකාශ කරණ සේක් පුදුමයක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ උත්තරාව සකෘදාගාමීවූ උපාසිකාවක්යයි ප්‍රකාශ කළ සේක."

**16. සිරිමා විමාන කථාවඃ-** 1. "යොදන ලද අතිශයින් අලංකාරවූ යට බැලූ ඇස් ඇති ශීඝ්‍රගමන් ඇත්තාවූ බලවත් වේගයෙන් යුක්තවූ, අසුන් ඇති පන්සියයක් රථයෝ ඔබට මනාව නිර්මිතවූහ. රියැදුරන් විසින් මෙහෙයවනලද අශ්වයෝ ඒ අනුවයත්.

**2.** "දිලියෙන ගින්න ජලය මෙන් බබුළුවමින් ඕතොමෝ අලංකාරවූවා උතුම් රියෙහි සිටී. සිහින් ශරීර ඇත්තීය, අලාමක දැකුම් ඇත්තීය, කවර නම් යොනියක සිට තථාගතයන් කරා එළැඹුණ දැයි මේ කාරණය අසමි."

**3.** "කාමයෙන් අගපත් තැන් අතරින් යමක් අනුත්තරයයි කියත්ද, දෙවතාවෝ මවමින් රමණය කරත්ද? ඒ කයින් විහිදෙන කැමති විය යුතු වර්ණ ඇති අප්සරාවක් (දෙවඟනක්) වූ මම තථාගතයන් වඳින්නට මෙහි ආමි."

**4.** "කිම ඔබ පෙර මේ සස්නෙහි පින් කළෙහිද? කවර හෙයින් ඔබ පමණ නැති යසස් ඇත්තීව සැපයෙන් වැඩුණීව වෙසෙහිද? ඔබට ආකාශ ගාමීවූ ඉතා උසස් සෘද්ධිහු වෙත්. තීගේ පැහැයද දස දිගුන් බබුළුවයි.

**5.** "දෙවතාව, ඔබ දෙවියන් විසින් පිරිවරන ලද්දී සත්කාර කරන ලද්දී, වෙහිය. කොතැනින් චුතව දෙව් ලොවට ගියාද? ඔබ කාගේ වචනය කරන්නීද? කාගේ අනුශාසනය ඇත්තීද? ඉදින් බුද්ධ ශ්‍රාවිකාවක් නම් ඔබ මට කියව."

6. "මා පර්වත අතරවූ මනාව මවනලද උතුම් නගරයවූ රජගහවෙහි ශ්‍රීමත්වූ රාජොත්තමයාගේ පරිචාරිකාවක්වූ නැටීමෙහි හා ගැයීමෙහි ඉතා මනාව හික්මුණු (උගත්) සිරිමා යැයි දත්හ.

7. "ඍෂිවරයන්ට මහොත්තමවූ, හික්මිය යුත්තන් හික්මවන්නාවූ සර්වඥ තෙම සමුදය හෙවත් තෘෂ්ණාව, දුක අනිත්‍යතාව නැවත පහළවීමක් නැති හෙවත් අසංඛතවූ, දුක නැති කිරීමෙන් සුස්ථිරවූ නොවක්වූ, කල්‍යාණ මාර්ගයවූ මේ මග දේශනා කළ සේක.

8. "මම තථාගතයන්ගේ ධර්මයවූ නැවත නැවත පහළ වීම් නැති, නොමැරෙන පදය අසා ශීලයන්හි අතිශයෙන් ඉතා සංවරවූවාවීමි. නරොත්තම බුදුන්ගේ වචනයවූ ධර්මයෙහි පිහිටියක් වීමි.

9. "මම ඉතා උසස් තථාගතයන් දෙසනලද, නැවත නැවත පහළවීම නැති, විරාග පදය දැන එහිම මම කෙලෙස් සමථයෙන්වූ ධ්‍යානය ස්පර්ශ කෙළෙමි. ඒ ම මගේ උත්තම ස්වභාවය විය.

10. "මම උතුම් නිවනවූ විශෙෂනය (ගුණය) ලබා එකාන්තවූවා, ධර්මාභිසමයෙහි (සෝවාන් පෙලෙහි) පිහිටා සැක නැත්තී බොහෝ ජනයා විසින් පුදන ලද්දී ඒ මම බොහෝවූ ක්‍රීඩා රතිය විඳිමි.

11. "මෙසේ මම නිවන් දිශාවෙහි දෙවතාවක් වෙමි. ඉතා උසස් බුදුන්ගේ ශ්‍රාවිකාවක්මි. ධර්මය දක්නී පළමු ඵලයෙහි පිහිටියා සෝවාන්වූවා මට දුගතියක් නැත.

12. "ශ්‍රීමත් ධර්ම රාජයන්ට ගෞරව සහිතවූ, ඒ මම තථාගතයන් වඳින්නට පහදවන්නාවූ, පින් දහම්හි ඇලුණු භික්ෂූන් ද යහපත්වූ භික්ෂු සමාගමයද වඳින්නට පැමිණියෙමි.

13. "තථාගතවූ, උතුම් පුරුෂයන් නමැති හික්මවන්නවුන්ට රියැදුරුවූ මුනිහු දැක සතුටු සිත් ඇත්තී වීමි. මම තෘෂ්ණාව

සිඳි පිනෙහි ඇලුණු, උතුම් නායකවූ අතිශය හිත අනුකම්පා ඇති බුදුන් වඳිමි."

**17. කෙසකාරී විමාන කථාව:-** 1. "කර්ම විපාකයෙන් පහළවුනු මගේ ස්ථානයවූ මේ විමානය සිත් කලුය, ඉතා බබළන සුලුය. වෛදූර්ය කුලුණු ඇත්තේය. ස්ථිරය මනාව නිර්මාණය වී තිබේ. රන්වන් ගස්වලින් හාත්පස වැසී සිටී.

2. "ස්වකීය කර්මයෙන් එහි උපන් මේ පළමු දිව්‍යාප්සරාවෝ සිය දහස් ගණන්ය. මෙහි පැමිණි කීර්තිමත් තී පළමු දෙවඟනන් මැඩ බබළමින් සිටින්නෙහිය.

3. "තාරකාවන්ට රජවූ චන්ද්‍රයා තාරකා සමූහයා බබුළුවන්නේ යම්සේද, එපරිද්දෙන්ම ඔබ කීර්තියෙන් දිලිසෙන්නී මේ දිව්‍යාප්සරා සමූහයා බබුළුවන්නෙහිය.

4. "අලාමක දර්ශන ඇත්තීය, කොහි සිට අවුත්, ඔබ මගේ භවනයෙහි උපන්නීද, ඉන්ද්‍රයා (ශක්‍ර) සහිතවූ සියලු තිදස දෙවියෝ ඒ ඔබ දැකීමෙන් තෘප්තිමත් නොවෙති.

5. "ශක්‍රය, ඔබ කොතැනින් චුතව මගේ මේ භවනයෙහි උපන්නාදැයි මා අතින් විචාරන්නෙහිය. කාශීන්ගේ බාරාණසී නම් පුරවරයක් වෙයි. ඒ නගරයෙහි පෙර කෙසකාරිකා නම් තැනැත්තියක් වීමි."

6. "බුදුන් කෙරෙහිද, ධර්මයෙහිද සංඝයා කෙරෙහිද පැහැදුණු ඇත්තී, ඒකාන්ත බවට ගියා, සැක නැත්තී නොකැඩූ ශික්ෂාපද ඇත්තී, පැමිණි ඵල ඇත්තී, සම්බොධි ධර්මයෙහි නියතවූවා, රොග නැත්තී, (නිදුක්වූවා) වීමි."

7. "ඒ අපි තී ගැන සතුටුවමු. තීට යහපත් පැමිණීමක්ද වේවා, ඔබ ධර්මයෙන්ද කීර්තියෙන්ද බබළන්නෙහිය.

8. (මේ ඡෙදය මෙහි කථාවේ 6 ඡෙදය මෙනි.)

---

## 2. චිත්තලතා වර්ගය.

18. **දාසීවිමාන කථාව**:- 1. "දෙවියන්ට අධිපතිවූ ශක්‍ර දෙවෙන්ද්‍රයා මෙන් රම්‍යවූ චිත්‍රලතා වනයෙහි දිව්‍ය ස්ත්‍රී සමූහයා විසින් පෙරටු කරණ ලද්දී හාත්පස බබලන්නෙහිය. සියලු තාරකාවන්ට වැඩියෙන් බබලන ඔෂධී තාරකාව මෙන් සියලු දිශාවන් බබුළු වන්නෙහිය.

2-4. (මේ ඡෙද 1 කථාවේ. 2, 3, 4 ඡෙද මෙන් වෙත්.)

5. "මම මනුෂ්‍යයන් අතරෙහි අනුන්ගේ ගෙදරක මෙහෙවර යොදනු ලබන දාසියක් වීමි.

6. "නෙත් ඇත්තාවූ කීර්තිමත්වූ ගෞතම සර්වඥ ශාසනයෙහි උපාසිකාවක් වීමි. ඒ කම්පා නොවන උතුමාගේ ශාසනයෙහි සිල් රක්ෂා කරන්නාවූ මට මෙබඳු අදහසක් විය. කුමක්ද?

7. "ඒකාන්තයෙන් මේ ශරීරය බිඳේවා. මෙහි සම්බන්ධයක් නැත. පඤ්ච ශික්ෂාපදයන්ගේ මාර්ගය යහපත සිද්ධ කරයි. නිරුපද්‍රිතයි.

8. "කටු නැති, අකුල් නැති, ඍජුවූ, සත් පුරුෂයන් පැවසූ, එකකි. යම්සේ මෙයට පැමිණෙන්නට බලාපොරොත්තු වන්නීද, නිෂ්කාමයාගේ බලය බලව.

9. "ඉසුරුමත් සක්දෙව් මහරජාණන් කැඳවනු ලබන්නියක්මි. සැට දහසක් පමණ තූර්ය මා අවදි කරයි.

10. "ආලම්බය, ගග්ගරය, භීමය, සාධුවාදීය, සංසය, පුෂ්කරය, සුඵස්සය, වීණා, මොක්ෂ කන්දා, සුනන්දා, සොණ දින්නා අලම්බුසා, මිශ්‍රකෙශී, ඉතා දරුණු පුණ්ඩරිකාය.

11. "එණි, ඵලස්සය, සුඵස්සාය, ප්‍රිය වචන කියන සුභද්‍රාය මේ දිව්‍ය ස්ත්‍රීහුද අන්‍යයෝ දැයි අප්සරාවන් අතර පුබුදු කරවන්නෝ ශ්‍රෙෂ්ඨ වෙත්.

12. "ඒ දෙවතාවෝ මා කරා කලින් කල පැමිණ දැන් නටමු, ගී කියමු. එසේනම් ඔබ සතුටු කරවමුයි කියත්.

13. "මා විසින් ලද මේ දිව ඉසුරු කුසල් කළවුන්ටම විනා කුසල් නොකළවුන්ට නොලැබෙන්නේය. තවුතිසා වැසි දෙවියන්ගේ නන්දා නම් මහා උයන ශොක රහිතය, රම්‍යය.

14. "මේ ලොකයෙහිද පරලොවද පින් නොකරණ ලද්දවුන්ට සැපක් නැත. මේ ලොකයෙහිද පරලොවද කරන ලද පින් ඇත්තන්ට සැප පැමිණේ.

15. "ඔවුන් හා සහ භාවයට යනු කැමැත්තන් විසින් බොහෝ කුසල් කටයුතුයි. කරණ ලද පින් ඇත්තෝ ස්වර්ගයෙහි භොගයන්ගෙන් යුක්තව සතුටු වෙත්."

**19. ලඛුමා විමාන කථාවඃ-** 1. (මේ ජෙදය 9 කථාවේ 1 ජෙදය මෙනි.)

**2-4.** (මේ ජෙද 1 කථාවේ 2, 3, 4 ජෙද මෙන් වෙත්.)

**5.** "මගේ ගෘහය මසුන් මරන ගම දොරටුවෙන් නික්මුණු තැන විය. එහි හැසිරෙන්නාවූ මහර්ෂිවූ ශ්‍රාවකයන්ට

**6.** "මම ප්‍රසන්න සිතින් බතක්ද, පිට්ටුවක්ද, පලාකොළද ලුණු කැඳක්ද පැහැදුණ සිතින් ඍජු අදහස් ඇත්තන් කෙරෙහි දුනිමි.

7-13 (මේ ජෙද 15 කථාවේ 6, 12 ජෙද මෙන් වෙත්.)

**20. අචාමදායිකා විමාන කථාවඃ-** 1. "පිඩු පිණිස හැසිරෙන්නාවූ නිශ්ශබ්දව සිටින්නාවූ ඔබවහන්සේට දිළිඳු වූ දුක්පත්වූ අනුන්ගේ ගෙවල්වල වසන,

**2.** "යම් ස්ත්‍රියක් පැහැදුනී ස්වකීය අත්වලින් දම්කුඩ බත් දුන්නීය. ඕතොමෝ මනුෂ්‍ය ශරීරය අත්හැර කිනම් දිශාවකට ගියේද,

**3.** "පිඬු පිණිස හැසිරෙන්නාවූ නිශ්ශබ්දව සිටින්නාවූ මට අනුන්ගේ ගෙවල්වල සිටින දිළිඳු දුක්පත්,

**4.** "යම් ස්ත්‍රියක්තොමෝ මට පැහැදුනී ස්වකීය අත්වලින් දම්කුඩ බත් දුන්නීද, ඕතොමෝ මින් චුතව කෙලෙසුන්ගෙන් මිදුණේය.

**5.** "මහත් ඍද්ධි ඇත්තාවූ නිර්මානරතී නම් දෙවියෝ ඇත්තාහ. එහි දම්කුඩ බත් දුන් ඒ ස්ත්‍රීතොමෝ සුවපත්වූවා සතුටුවේ.

**6.** "කාශ්‍යපයන් වහන්සේ කෙරෙහි දුගී තැනැත්තියගේ මනාව පිහිටුවන ලද දානය ආශ්චර්යයි. අනුන් විසින් ගෙනෙන ලද දානයෙන් ඒකාන්තයෙන් දක්ෂිණාව සමෘද්ධවේ.

**7.** "යම් ස්ත්‍රියක් සක්විති රජුගේ භාර්යා බව කරන්නේද සියලු අංගයෙන් යහපත් වූවා, ස්වාමියාට ශ්‍රේෂ්ඨ දර්ශන ඇත්තීද, ඒ දම්කුඩ බත් දානයාගේ සොලොස් කලාවෙන් කලාවක්වත් නොඅගනේය.

**8.** "නිෂ්ක (කලං 25 බර) රන් කාසි සියයක්ද, අශ්වයෝ සියයක්ද, අශ්වතරයන් යෙදූ රථ සියයක්ද, මුතු මැණික් කොඩොල් පැළඳ කන්‍යාස්ත්‍රීන් සියයක්ද මේ දම්කුඩ බත් දානයාගේ සොලොස් කලාවෙන් කලාවක් පමණවත් නොඅගනේය.

**9.** "උඩට නැගුණු නගුලිස් පමණ දළ ඇති හිමාල පර්වතයෙහි උපන් ඇත්තුද රන් ඇතිරි ඇති රනින් සැරසූ වස්ත්‍ර ඇති ඇත්තුද මේ දම්කුඩ බත් දානයට සොලොස් කලාවෙන් කලාවක්වත් නොඅගනෝය.

**10.** "යමෙක්තෙම මේ ලොකයෙහි සතර මහ දිවයිනට අයිති කම කරන්නේද ඒ රාජ්‍යයේ එක් දම්කුඩ බත් දානයේ වටිනාකමින් සොළොස් වන කලාවෙන් කලාවක්වත් නොඅගනේය.

**21. චණ්ඩාලී විමාන කථාව:-** 1. "එම්බා සැඩොල් මැහැල්ල, යසස් ඇත්තා වූ ගෞතමයන් වහන්සේගේ පා වඳින්න මුනීන්ට ශ්‍රේෂ්ඨවූ උන්වහන්සේ තොපටම අනුකම්පා පිණිස සිටිසේක.

**2.** "ඉෂ්ට අනිෂ්ට අරමුණු කෙරෙහි තාදී ගුණයෙන් යුත් රහතන් වහන්සේ කෙරෙහි සිත පහදව, ඉක්මනට දොහොත් බැඳ, වඳින්න. ඔබගේ ජීවිතය ස්වල්ප කාලයක් පවත්නේය,

3. "අන්තිම ශරීරය දරන වඩන ලද ආර්ය මාර්ගය ඇති මුගලන් මහ තෙරුන් වහන්සේ විසින් මෙහෙයවන ලද සැඩොලිය යසස් ඇති ගෞතමයන් වහන්සේගේ පා වැන්දාය.

4. "අඳුරෙන් සූර්යයාවූ බුදුන්ට නමස්කාර කරන්නාවූ ඇඳිලි බැඳ සිටියාවූ ඒ චණ්ඩාලිය දෙනක් ඇන මැරුවාය.

5. "අරණ්‍යයක තනිව වසන මුගලන් තෙරුන් වෙත දිව්‍යසම්පත් ලැබූ තැනැත්තී පැමිණ මහානුභාව සම්පන්න වීරයන් වහන්ස, ක්ෂය කළ ආශ්‍රව ඇති පහවූ රජස් ඇති තෘෂ්ණා රහිත හුදකලාව අරණ්‍යයෙහි සිටින ඔබට මහත් ආනුභාව ඇති දිව්‍ය ඍද්ධියට පත්වූ මා වඳිමි.

6. "යහපත් දෙවතාව, රන්වන්වූ දිලිසෙන්නාවූ මහත් යසස් ඇති නොයෙක් ලෙස විසිතුරු විමනකට නැගී දිව්‍යාංගනාවන් පිරිවරා මා වඳින්නාවූ ඔබ කවරෙක්ද?

7. "පින්වතුන් වහන්ස, නුඹවහන්සේ විසින් මෙහෙයවන ලද චණ්ඩාල මැහැල්ලවූ මම අර්හත්වූ ගෞතම බුදුන්ගේ ශ්‍රී පාද යුගල වැන්දෙමි.

8. "ඒ මම සිරිපා වැඳ චණ්ඩාල ජාතියෙන් චුතවූවාය. සර්වප්‍රකාරයෙන් යහපත්වූ නඳුන් උයනෙහි විමනෙක උපන්නෙමි.

9. "දිව්‍යාප්සරාවන් ලක්ෂයක් පෙරටුකොට සිටියි. මම ඔවුන්ට වර්ණයෙන්ද ආනුභාවයෙන්ද ආයුෂයෙන්ද ශ්‍රෙෂ්ඨය. උතුම්ය.

10. "ස්වාමීනි, සම්‍යක් ප්‍රඥාවෙන් යුත් බොහෝ යහපත් දේ කරණ ලද සිහි ඇත්තාවූ මා විසින් ලොකයෙහි කාරුණිකවූ මුනිවූ නුඹවහන්සේ වැඳීමට පැමිණියෙමි.

11. "උපකාර සැලකීමෙන් කෙළෙහිගුණ දන්නාවූ චණ්ඩාලිය මෙය කියා රහතන් වහන්සේගේ පා වැඳ එහිම අතුරුදහන් වූවාය."

**22. භද්‍ර ස්ත්‍රී විමාන කථාව:-** 1. "දිව්‍යාංගනාව, නිල් රන්වන්, ලේවන්, සුදු, ළා රතු, මිශ්‍ර වර්ණය ඇති ලොකු කුඩා පාට ඇති මල් රොනින් ගැවසී ගත්,

2. "මදාරා මල් වලින් මාලාවක් දරන්නෙහිය. බබලන්නෙහිය. මේ දෙව්ලොව සෙසු දෙවතාවන්ට මෙබඳු මල් ගස් නැත්තේය.

3. "කවර කුශල කර්මයක් කරණකොටගෙන මේ තව්තිසා භවනයෙහි උපන්නීද? දෙවතාවිය මා විසින් විචාරණ ලද මේ ප්‍රශ්නයට පිළිතුරු ප්‍රකාශ කරව, කවර කර්මයක් හුගේ මේ ඵලද?"

4. "ශ්‍රද්ධාවත්ව, යහපත් ආචාර සමාචාර ඇතිව හැම කල්හි බෙදා දීමෙහි ඇලුනු කිම්බිලාවෙහි උපාසිකාවූ යහපත් ස්ත්‍රියයි මා දන්නාහුය.

5. "පැහැදුන සිතින් වස්ත්‍රද ආහාරද සෙනසුන්ද පහන්ද ඍජුවූවන් කෙරෙහි දුනිමි.

6. (මේ ඡෙදය 15 කථාවේ 6 දෙය මෙනි.)

7. (මේ ඡෙදය 15 කථාවේ 7 (i) මෙනි.) මම ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව දන් දෙන සුළුව විමනෙහි වසමි.

8. (මේ ඡෙදය 15 කථාවේ 8 ඡෙදය මෙනි.)

9. "ශික්ෂාපද පසෙහි ඇලුනාහ. ආර්ය සත්‍යයෙහි දක්ෂවූ මම බුදුන්ගේ අප්‍රමාදව වාසය කරණ උපාසිකාවක් වීමි.

10. "කරණ ලද බඹසර විසීම් ඇති කරණ ලද කුසල් ඇති ඉන් යුක්තවූ මම සිය ප්‍රභාවෙන් නඳුන් උයනෙහි හැසිරෙමි.

11. මම අතිශයින් හිතානුකම්පීවූ භික්ෂූන්ද මහා මුනිවූ තපස්වීන් දෙනමක්ද වැළඳවූයෙමි.

12. (මේ ඡෙදය මේ කථාවේ 10 වෙනි ඡෙදය මෙනි.)

13. "මම අප්‍රමාණ සැප ගෙනදෙන්නාවූ අංග අටකින් යුත් උපොෂථය නිතර සමාදන් වීමි.

14. (මේ ඡෙදය මේ කථාවේ 10 ඡෙදය මෙනි.)

23. **සොණදින්නා විමාන කථාව**:- 1 - 4 (මේ ඡෙද 9 කථාවේ 1-4 ඡෙද මෙන් වෙත්.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** (මේ ඡේදය 22 සූත්‍රයේ 4 ඡේදය කිම්බිලාවේ භද්‍රස්ත්‍රී, වෙනුවට නාලන්දාවේ සොණදින්නා කියා වෙනස් කර යෙදිය යුතුයි.)

**6.** (2 වර්ගයේ 5 කථාවේ 5 ඡේදය මෙනි.)

**7.** (8 මේ ඡේද 22 කථාවේ 6, 7 ඡේද මෙන් වෙත්.)

**9.** (මේ ඡේදය 22 කථාවේ 8 ඡේදය මෙනි. අප්‍රමාදව වාසය කරණ යන්නට ගෞතම යශස්වීන්වහන්සේගේ කියා වෙනස් කර යොදන්න.)

**10.** 11 (ඡේද 19 කථාවේ 11, 12 ඡේද මෙන් වෙත්.)

**24. උපොසථා විමාන කථාව:-** 1, 2, 3, 4, ඡේද (19 කථාවේ 1, 2, 3, 4, ඡේද මෙනි.)

**5.** (මේ ඡේදය 22 කථාවේ 4 ඡේදය කිම්බිලාවේ භද්‍රස්ත්‍රී, වෙනුවට සාකේතයේ උපොසථාව කියා වෙනස් කර ගත යුතුයි.

**6.** (මේ ඡේදය 22 කථාව් 6 ඡේදය මෙනි.)

**7 8, 9, 10,** (මේ ඡේද 19 කථාවේ 8, 9, 10, 11 මෙන් වෙත්.)

**11.** "නිතර නන්දන වනය ගැන අසා මට කැමැත්තක් පහළ වූයේය. එහි සිත පිහිටුවා නඳුන් උයනෙහි උපන්නෙමි.

**12.** "සූර්යවංශයට ඥාතියෙකුවූ, ශාස්තෲන්වහන්සේගේ වචනය නොකළෙමි. පහත් දෙය කෙරෙහි සිත පිහිටුවා පසුව තැවෙන්නියක් වීමි.

**13.** "උපොසථාව මෙහි විමානයෙහි කොපමණ කාලයක් වසන්නෙහිද? ඉදින් ආයුෂ දන්වන්නෙහි නම් දේවතාව විචාරණ ලද්දේ කියව.'

**14.** "මහා මුනින්වහන්ස, තිස්කෙළක්ද, සැටදහසක්ද මෙහි සිට චිත් චුතවී මනුෂ්‍යයන් සය භාවයට යන්නෙමි.

**15.** "උපොසථාව, නුඹ බිය නොවෙව. බුදුරජාණන් වහන්සේ විසින්ද සොවන්වූ තොපට දුගතිය ප්‍රහීනයයි වෙසෙසා වදාරන ලදී.

**25. ශ්‍රද්ධා විමාන කථාව:-** 1, 2, 3, 4, (මේ ඡේද 19 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි.)

**5.** (මේ ඡේදය 22 කථාවේ 4 ඡේදය 'භද්‍ර ස්ත්‍රී' වෙනුවට 'ශ්‍රද්ධා' කියාද 'කිම්බිලා' වෙනුවට 'රජගහ' කියාද වෙනස් කර යොදාගත යුතුයි.)

**6.** (මේ ඡේදය 22 කථාවේ 5 වෙනි ඡේදය මෙනි.)

**7, 8, 9, 10.** (මේ ඡේද 19 කථාවේ 7, 8, 9, 10, ඡේද මෙනි.)

**11, 12** (මේ ඡේද 19 කථාවේ 11, 12 ඡේද මෙන් වෙත්.)

**26. සුනන්දා විමාන කථාව:-** 1, 2, 3, 4 (මේ ඡේද 19 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි.)

**5.** (මේ ඡේදය 22 කථාවේ 4 ඡේදය 'භද්‍ර ස්ත්‍රී' යන්නට 'සුනන්දා' කියාද 'කිම්බිලා' යන්නට 'රාජගෘහ' කියාද, වෙනස් කර ගත යුතුයි.)

**6.** (මේ ඡේදය 22 කථාවේ 5 ඡේදය මෙනි.)

**7, 8, 9, 10** (මේ ඡේදය 19 කථාවේ 7, 8, 9, 10 ඡේද මෙනි)

**11, 12.** ඡේද 10 කථාවේ 11, 12 ඡේද මෙන් වෙත්.)

**27. පඨම භික්ඛු දායිකා විමාන කථාව:-** (1, 2, 3, 4 මේ ඡේද 19 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි.)

**5.** (මේ ඡේදය 10 කථාවේ 5 ඡේදය පැහැදුනේ ස්වකීය අතින් උන්වහන්සේට ශික්ෂාව දුනිමි, කියා යෙදිය යුතුයි.)

**6, 7** (මේ ඡේදය 19 කථාවේ 11, 12 ඡේද මෙනි.)

**28. දෙවෙනි ශික්ෂාදායිකා විමාන කථාව:-** 1, 2, 3, 4 (මේ ඡේද 26 කථාවේ 1 2 3 4 ඡේද මෙනි.)

**5 6 7** (මේ ඡේද 27 කථාවේ 5, 6, 7 ඡේද මෙනි.)

---

## 3. පාරිච්ඡත්තක වර්ගය.

**29. උළාර විමාන කථාව:-** 1. "දිව්‍යාංගනාවෙනි, තොපගේ ශරීර වර්ණය හා යසස ශ්‍රෙෂ්ඨ සියලු දිශා බබුළුවයි. ස්ත්‍රීහුනටත් අලංකාරවත් දිව්‍යපුත්‍රයෝ ගායනා කරත්.

**2.** "දෙවතාව ඔබට පූජා පිණිස සතුටුවෙත්. පිරිවරත් ඔබේ යහපත් දැකුම් ඇති විමාන ස්වර්ණවර්ණය.

**3.** "සියලු කාමයන්ගෙන් සමෘද්ධවූ, නුඹ ඔවුන්ට අධිපතිය. මනාව උපන්නියක් වෙහිය. මහත්ත්වයට පැමිණියෙහිය. දෙවසමූහයා මැද ප්‍රමොද වන්නෙහිය. විචාරණ ලද දෙවතාව කියනු මැනව. මේ ඵලය කිනම් කර්මයක්හුගේද?"

**4 5 6** (මේ ඡෙද 1 කථාවේ 2 3 4 ඡෙදය මෙනි.)

**7.** "පූර්ව ජාතියෙහි මම මනුෂ්‍ය ලොකයෙහි මිනිසුන් අතර මනුෂ්‍යයෙක් වූයෙමි. දුශ්ශීල කුලයෙක්හි අශ්‍රද්ධාවත් තද මසුරන් කෙරෙහි ලේලියක් වීමි.

**8.** "හැමකල්හි ශ්‍රද්ධාවත්වූවා සීලයෙන් යුක්ත වූවා, බෙදාදීමෙහි යුක්තවූවා පිඬු පිණිස හැසිරෙන්නාවූ නුඹ වහන්සේට කැවුමක් දුනිමි.

**9.** "එකල්හි මම මෙහි ශ්‍රමණයන් වහන්සේ වැඩි සේකයි නැන්දම්මාට කීවෙමි. පැහැදුණු මම ස්වකීය දෙඅතින් උන්වහන්සේට කැවුම් දුන්නෙමි."

**10.** "ස්ත්‍රිය, නුඹ නොහික්මුණු තැනැත්තියක මා විචාරන්නට නොකැමැත්තීවෙහි. එසේ වීනම් ශ්‍රමණයන් වහන්සේට මම දෙමියි මට නැන්දම්මා බැන්නාය.

**11.** "ඉක්බිති මට නැන්දා කිපියේ මොහොලින් ගැසුවාය. මගේ උකුළු ඇටය කැඩුණේය. බොහෝ කලක් ජීවත්වන්ට නොහැකිවීමි.

**12.** "ඒ මම ශරීරයාගේ බිඳීමෙන් ඉන් චුතවූවා මිදුනී. තව්තිසා වැසි දෙවියන් හා සහවාසයට ගොස් උපන්නෙමි.

**13.** (මේ ඡෙදය 9 කථාවේ 8, 10 ඡෙද මෙනි.)

**30. උච්ඡු දායිකා විමාන කථාව:-** 1. "දෙව් ලෝ සහිත පෘථිවිය අලංකාර කොට චන්ද්‍ර සූර්යයන්ගේ පාටින්ද කීර්තියෙන්ද තෙජසින්ද බ්‍රහ්මයාටද තව්තිසා දෙව්ලොව ශක්‍රයා සහිත දෙවියන්ටද වඩා බබලන්නෙහිය.

2. "දෙවතාව, උපුල් මල් දරන්නාවූ මලින් හාත්පසින් වෙලුනාවූ රන්වන් සමක් ඇති අලංකාර උතුම් වස්ත්‍ර දරන යහපත් දෙවතාව මා වඳින්නෙහිය. ඔබ කවුද?"

3. "පෙර ජාතියෙහි මනුෂ්‍යාවූ තමා කිනම් කර්මයක් කරණ ලද්දේද, දානයක් පුරුදු කරණ ලද්දේද, නැවත ශීලයක් රකින ලද්දේද, යසසින් යුක්තවූවා කුමක් කොට සුගතියේ උපන්නීද විචාරන ලද්දී මේ කිනම් කර්මයක ඵලයක්දැයි කියව."

4. "ස්වාමීනි, දැන් ඔබවහන්සේ මේ ගමට පිඬු පිණිස හැසුරුනෙන් අපේ ගෙදරටම පැමිණියේය. ඒ අවස්ථාවෙහි නුඹවහන්සේ කෙරෙහි පැහැදුන සිතින් මහත් ප්‍රීතියෙන් උක් කැබෙල්ලක් දුනිමි.

5. "පසුව නැන්දම්මාද 'ස්ත්‍රිය, මට නොකියා' කොහි උක්ගස් දැමූයෙහිදැයි' ඇසීය. 'මම ඉවත නොදැමීමි, නොකෑවෙමි, ශාන්ත භික්ෂුවකට දුන්නෙමියි' කීවෙමි.

6. "මේ සම්පත් තොපගේද නැත්නම් මාගේ දැයි ඒ නැන්දා මට අපහාස කළාය, පුටුවක් ගෙන මට පහරක් දුන්නීය. ඉන් චුතව කලුරිය කළාවූ මම දෙවතාවියක් වීමි.

7. "මා විසින් ඒ කුශලකර්මයම කළෙමි. මා විසින් කුශලකර්මයද අනුභව කරමි. මේ දෙවියන් සමග පිරිවරමි. පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

8. "මා විසින් ඒ කුශල කර්මයම කරණ ලදී. මා විසින් සැපවූ කර්මක විපාකයක් අනුභව කරමි. මම පස්කම් ගුණයෙන් යුක්තවූවා තවුතිසා වැසි දෙවියන් විසින් රක්නා ලද්දී ශක්‍රයා විසින් රැකවරණය කරණ ලද්දී වෙමි.

9. "මෙබඳු කුශල විපාකය අල්ප නොවේ. මාගේ උක් දානය මහත් විපාක ඇත්තේය. මම දෙවියන් සමග පිරිවරමි. මම පස්කම් සැපයෙන් සතුටු වෙමි.

10. "මෙබඳු පුණ්‍ය ඵලය අල්ප නොවෙයි. මාගේ උක්දානය ආලෝකමත් විපාක ඇත්තීය. නඳුන් වනයෙහි ශක්‍ර භාර්යාව

මෙන් දහසක් නෙත් ඇති ශක්‍රයා විසින් රක්නා ලද්දීය. තව්තිසා වැසි දෙවියන් විසින් රක්නි වෙමි.

**11.** "ස්වාමීනි, අනුකම්පාව ඇති, දක්නා, නුඹවහන්සේ වෙත පැමිණ වැන්දෙමි. සුවදුක්ද විචාළෙමි. නුඹවහන්සේට පැහැදුන සිතින් අසමාන ප්‍රීතියෙන් උක්කැබෙල්ලක් දුන්නෙමිද, එහෙයිනි."

**31. පර්යංක විමාන කථාවඃ-** 1. "මහත් ආනුභාව ඇති දේවිනි, මැණික්, රත්රන්වලින් විසිතුරුවූ මල් විසිරවූ මහත් උතුම් පර්යංකයවූ ඇඳෙන ලොකු කුඩා ඍද්ධීන් කරමින් සිටින්නෙහිය.

**2.** "ඔබගේ මේ දිව්‍යාංගනාවෝ හාත්පසින් නටත්, ගී කියත්. සතුටුවෙත්. මහත් ආනුභාව ඇති දිව්‍ය ඍද්ධියට පැමුණුනෙහිය. මනුෂ්‍යව සිටියදී කිනම් පිනක් කෙළෝද, කිනම් කරුණකින් මෙසේ දිළිසෙන ආනුභාව ඇත්තීද ඔබගේ පැහැය සියලු දිශාවෙහි බබළයි.

**3.** "මනුෂ්‍යයන් අතරෙහි නියම මනුෂ්‍යයෙක් වූ මම පොහොසත් ගෙදරක ලේලියක්වීමි. ක්‍රොධ නොකරන ස්වාමියාගේ අදහස් අනුව පවතින පොහෝදා සිල්රැකීමෙහි අප්‍රමාද තැනැත්තියක්වීමි.

**4.** "මනුෂ්‍යවූ, ළදරුවූ, පවුකාරියක්වූ මම ප්‍රසන්න සිතින් ස්වාමියා සතුටු කෙළෙමි. රෑ දාවල් දෙක්හි හිතට අනුව හැසුරුණු මම පෙර සිල්වත්වීමි.

**5.** "සොරකම් නොකරන්නී සතුන්මැරීමෙන් වෙන්වූවා පිරිසිදු ශරීර ඇත්තී, පිරිසිදු බඹසර ඇත්තී, මත්පැන් නොබොන්නී, බොරුද නොකියමි. ශික්ෂාපදයන් සපුරා රැක්කෙමි.

**6.** "මම තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද පක්ෂය සම්බන්ධ අටවක් දිනයෙහිද පොහොය දෙපස දිනයෙහිද පැහැදුන සිතින් අංග අටකින් යුත් ශීලය අනුව හැසුරුනෙමි. සතුටු සිතින් පොහෝදා සිල්රැකීමි.

7. "මේ ශ්‍රේෂ්ඨ ආර්ය අෂ්ටාංගයෙන් යුත් සැප විපාක ඇති කුශලයක් සමාදන්ව ස්වාමියා කෙරෙහි යහපත්ව පැවැත්තීමි. පෙර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවිකාවක් වූයෙමි.

8. "මනුෂ්‍යලෝකයෙහි මෙබඳු විශෙෂ ආනුභාව ඇති කුශලකර්මයක් කොට ශරීරයාගේ බිඳීමෙන් පරලොව දිව්‍ය ඍද්ධියට පැමිණ සුගතියට පැමිණියෙමි.

8. "යහපත්වූ ශ්‍රෙෂ්ඨ ප්‍රාසාදයවූ විමානයෙහි දිව්‍ය සමූහයා විසින් පිරිවරණලද්දී ස්වකීය ශරීර, ලෝකය ඇති දිව්‍යසමූහයා දිව්‍ය විමානයට පැමිණි මා රමණය කරත්.

**32. ලතාවිමාන කථාවඃ-** 1. "උත්තම දෙවතාවූ ලතාද සජ්ජාද, ශ්‍රීමත් දිව්‍ය රාජවරයාගේ අච්චිමුඛීද, සුතාද, වෛශ්‍රවණ රජුගේ දූ වූ රාජිමතී ද ධර්ම ගුණවලින් බබලන්නේය.

4. "සුන්දරීය, කවර හේතුවකින් ස්වාමියාට වඩා ප්‍රියවෙහිද, රූපයෙන් විශෙෂවූ වඩා උස්වූවක් වෙහිය. පැදකුණු කිරීම් සහිත නැටීම් ගී කීම් වැයීම් ඇත්තීය, ඔබ ස්ත්‍රී පුරුෂයන් විසින් විචාරන ලද්දී අපට කියව."

5. (මේ ඡෙදය 31 කථාවේ 3 ඡෙදය මෙනි.)

6. (මේ ඡෙදය 31 කථාවේ 4 දෙය 1 (ii) පාද මෙනි.) හිමියාගේ සහෝදරයාද, නැන්දාද මාමාද සතුටු කෙළෙමි. ඔවුන් මාගේගුණ සොෂා ඇතිවීමි.

7. "ඒ මම ඒ කුශල කර්මයෙන් කරුණු සතරෙකින් විශෙෂයට පැමිණියෙමි. ආයුෂද, වර්ණයද, සැපයද, බලයද බොහෝවූ ක්‍රීඩා ඇල්මද විඳිමි.

8. "උත්තම දෙවතාවූ මේ ලතාතොමෝ ඒ සුතාවට යමක් කියන්නේ නොවේද? යමක් අපි විචාළෙමුද ස්වාමියාගේද උතුම් කාන්තාවන්වූ ඒ අපගේ ද ස්වභාවයන් අපට කීවානොවේද?

9. "පතිව්‍රතා ඇති ස්ත්‍රීහු යම් තැනෙක වෙත්ද, (අපි) සියල්ලෝ ස්වාමිවරුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණෙමු සියල්ලෝ ස්වාමිවරුන් කෙරෙහි ධර්මයේ හැසිර යම් ඒ සම්පත් ලදිමුයි මේ ලතා කියයි.

**10.** "කඳු මුදුන්වලද හැසිරෙන මස් බුදින සිංහයා මහින්ධර නම් පර්වතය ඇසුරුකොට අනෙක් කුඩා සිවුපාවන් මැඩලයි.

**11.** "එපරිද්දෙන්ම මෙහි සැදැහැවත් ආර්ය ශ්‍රාවිකා තොමෝ ස්වාමියා නිසා ස්වාමියාට අනුකූල පැවතුම් ඇත්තී, ක්‍රොධය නසා මසුරුකම මැඩ ධර්මයෙහි හැසිරෙන්නීවේද, ඕ දෙව්ලොව සතුටුවෙයි."

**33. ගුත්තිල කථාව**:- 1. "මම තත්සතක් ඇත්තාවූ රමනීයවූ අතිශයින් මිහිරිවූ, වීනාවාදනය ඉගැන්වීමි. හෙතෙම මා රඟමඬලට කැඳවයි. දෙවෙන්ද්‍රය මට පිහිටවනු මැනවි."

**2.** "මම ඔබට පිහිටවෙමි. මම ගුරුන් පුදන්නෙකි. ශිෂ්‍ය (මූසිලයා) නොදිනන්නේය. ආචාර්ය තෙමේ ශිෂ්‍යයා පරදවන්නේය.

(3-4-5-6) ඡෙද 2. වර්ගයේ 2. කථාවේ 1-2-3-4-5. ඡෙද මෙනි.

**7.** "පුරුෂයන් අතරද ස්ත්‍රීන් අතරද උතුම් වස්ත්‍රයක් දන්දෙන ස්ත්‍රී තොමෝ ශ්‍රෙෂ්ඨවේ. මෙසේ ප්‍රියදේ දෙන ඒ ස්ත්‍රී තොමෝ දිව්‍යස්ථානයට පැමිණ කැමතිදේ ලබයි.

**8.** "ඒ මාගේ උත්තම වර්ණසම්පත් හා දිව්‍යවිමානය බැලුව මැනව. මම දිව්‍යාංගනාවන් දහසකට ශ්‍රෙෂ්ඨවූ පින්වල විපාකය බලව. කැමැතිවිය යුතු වර්ණ ඇති අප්සරාවක් වෙමි.

**9.** (මේ ඡෙදය 1. වර්ගයේ 1. කථාවේ 2 ඡෙදය තාගේ වෙනුවට මාගේ කියා වෙනස් කොට යොදාගත යුතුයි.)

**10.** (1 වර්ගයේ 1. කථාවේ 7. වෙනි ඡෙදය මෙනි.)

**11.** "ඒ කරණකොට මම මෙසේ දිලිසෙන ආත්මභාව ඇත්තේවෙමි. මාගේ වර්ණයද මා සියලු දිගුන් බබුළුවයි.

**12.** (මෙය මෙහිම 3. 4. 5. 6. 7. 8. 9. 10. 11. ඡෙදයමෙනි.)

**13.** (මෙය මෙහිම 6. ඡෙදය මෙනි.)

**14.** "මෙහිම 7. ඡෙදය වස්ත්‍රයක් වෙනුවට සමන් මල් දමක් හා සුවඳමල් පූජාවක් කියා වෙනස් කර යොදාගත යුතුය.

**15.** (මෙහිම 8. වෙනි ඡේදයමෙනි.)

**16.** (මෙහිම 9. වෙනි ඡේදයමෙනි.)

**17.** "මෙහිම 7 ඡේදය වස්ත්‍රයක් වෙනුවට සුවඳ පූජාවක් කියාවෙනස් කර යොදාගත යුතුයි.

**18.** (මෙහි මේ කථාවේ 8-9 යොදාගත යුතුයි.)

**19.** (මේ ඡේදය වස්ත්‍රයක් වෙනුවට ඵලදානයක් කියා වෙනස් කර 7-8-9 ඡේද යෙදිය යුතුයි.)

**20.** (7 වෙනි ඡේදය වස්ත්‍රයක් වෙනුවට රසයක් කියා වෙනස් කර යොදාගත යුතුය.)

**21.** (මෙහි මේ කථාවේ 8-9 ඡේද යෙදිය යුතුයි.)

**21.** (7 ඡේදයේ වස්ත්‍රයක් වෙනුවට කාශ්‍යප බුදුන්ගේ චෛත්‍යයට සුවඳ කුඩු තවරාගත් ඇඟිලි 5 හේ සටහනක් දුනිමි කියා වෙනස් කර ගතයුතුයි.)

**22.** (මෙය මේ කථාවේ 8-9 ඡේද මෙනි.)

**23.** "භික්ෂූහුද මමද භික්ෂුණීහුද මගට බැස්ස භික්ෂූන් දැක්කෙමු. මම ඔවුන්ගේ බණ අසා එක දවසක් පෙහෙවස් සමාදන්වීමි.

**24.** (මේ කථාවේ 2-9 ඡේද මෙනි.)

**25.** (මේ කථාවේ 3, 4-5, 6 ඡේද මෙනි.)

**26.** ("වස්ත්‍රයක් වෙනුවට පැහැදුන සිතින් භික්ෂුවකට බොන පැන් හා මුවඩොවන පැන් කියා වෙනස්කර. 7. ඡේදය යෙදිය යුතුයි.)

**27.** (මේ කථාවේ (7-8-9) ඡේද මෙනි.)

**28.** (මේ කථාවේ 3-4-5 ඡේද මෙනි)

**29.** "ස්වකීය ශීලයෙන් අප්‍රමාදව චණ්ඩ ස්වභාව ඇති ක්‍රොධකරණ විරුද්ධවූ ස්වාමියාගේ පියාටද මවටද ඊර්ෂ්‍යා නොකර උපස්ථාන කෙළෙමි.

**30.** (මේ කථාවේ 7-9 ඡේද මෙනි.)

31. (මේ කථාවේ 3-4-5-6 ඡේද යෙදිය යුතුය.)

32. "අනුන්ගේ වැඩ කරණ ක්‍රොධ නොකරණ, අතිමාන නැති, යහපතෙහි කම්මැලි නොවූ ස්වකීය කොටස බෙදා අනුභවකරන දාසියක්වීමි.

33. (මේ කථාවේ 8-9 ඡේද මෙනි.)

34. (මේ ඡේදය මේ කථාවේ 3. 4. 5. 6. ඡේද මෙනි.)

35. "පිඬු පිණිස හැසිරෙන භික්ෂුවට මම කිරිබතත් දුනිමි. මෙබඳු කර්මයක් කොට සුගතියෙහි ඉපද සතුටුවෙමි.

36. (මේ ඡේදය මේ කථාවේ 8-9 ඡේද මෙනි.)

37. (මේ ඡේදය මේ කථාවේ 3-4-5-6 ඡේද මෙනි.)

38. "සකුරු පිඩක්, උක්දඬුකඩක්, තිඹිරි ගෙඩියක්, කැකිරි ගෙඩියක්, තියඹරාගෙඩියක්, වැල්එලයක්, උගුරැස්ස ගෙඩියක්, අඟුරු කබලක්, පලාකොල මිටක්, පුළුන් මිටක්, සුළුපලා නම් පලාමිටක්, කොසඹකොළ මිටක්, ඇඹුල් කැදිත්තක්, තෙල්මුරුවටක්, පටියක්, අංස කඩයක්, උර පටියක්, දුම්කබලක්, වටාපතක්, මොණරපිල් හා විජිනිපතක්, කුඩයක්, සෙරෙප්පු දෙකක්, කැවුමක්, අග්ගලාවක්, සක්ඛලික නම් කැවිලි විශෙෂයක්.

(මේ එක එක නමක් පාසා මුලට මේ කථාවේ 3-4-5-6 ඡේදද අගට 8-9 ඡේදද යෙදිය යුතුයි.)

39. "අද මා විසින් මේ දිව්‍යලොකයාට ආ ගමන ඉතායහපත. අද මට මනා උදයක්විය. මනා නැගිටීමක් විය. කැමති වියයුතු වර්ණ ඇති, දෙවතාවූ අප්සරාවන් දුටුවෙමි, එහෙයිනි.

40. "මම මොවුන්ගේ ධර්මය අසා බොහෝ කුශල් කරමි. දීමෙන්ද සමානාත්මතාවෙන්ද, සංවරයෙන්ද, ආත්ම දමනයෙන්ද යම්තැනකට ගොස් ශොකනොකරත්ද ඒ මම එහි යන්නෙමි."

**34. දද්දල්ල විමාන කථාව**:- 1. "වර්ණයෙන් බබලමින් යසසින් යසස් ඇතිව සියලු තව්තිසාවැසි දෙවියන් වර්ණයෙන් ඉක්මවා බබලන්නෙහිය.

2. "පෙරදැකීමක් නොදනිමි. මේ පළමුවෙනි දැකීමයි. කවර ජාතියකින් ආවාදැයි මට නම කියන්නෙහිය."

3. "භද්‍රාව, මම පෙර මනුෂ්‍ය ආත්මයෙහි සුභද්‍රාව විය. මමද මගේ බාලසොහොවුරියද නුඹගේ සමාන භාර්යාවෝ වූමු.

4. "ඒ මම කායයාගේ බිඳීමෙන් මිදුනී ඉන් චුතවූවා නිර්මාණරතී දෙවියන් හා සහභාවයට පැමිණියෙමි.

5. "බොහෝ යහපත කරණලද ඒ සත්වයෝ දෙවියන් අතරට යත් සුභද්‍රාව ඒ ඔවුන් අතර ඔබ තමාගේ ජාතිය කියන්නෙහිය.

6. "නුඹ කෙසේ කිනම් වර්ණයකින්, කවරෙකු විසින් අනුශාසනා කරණලද්දී කිනම් දානයකින් කිනම් යහපත් ව්‍රතයකින් යශස් ඇත්තියක්වීද,

7. "ඒ ඔවුන් අතර මෙබඳු මහත්වූ විශෙෂවූ යශසකට පැමිණියෙහිද, දෙවතාව, අසන ලද්දී කියනු මැනවි. මේ කිනම් කර්මයක ඵලද?"

8. "පෙරදී මට සුදුසු භික්ෂූන් වහන්සේ නමකට පැහැදී ස්වකීය අත්වලින් දක්ෂිණාර්හ සංඝයාට පිණ්ඩපාතයක් දුනිමි.

9. (මේ ඡේදය 1. කථාවේ 6. ඡේදයමෙනි.)

10. "මහත් ආනුභා ඇති දේවීනි, තොපට කියමි. මම මනුෂ්‍යව සිටියදී යමක් කෙළෙම්ද, ඒ කරණකොට ගෙන මෙසේ දිලිසෙන ආනුභාව ඇත්තේවෙමි. මාගේ වර්ණයද සියළු දිශා බබුලුවයි.

11. "මම ඔබට වඩා බොහෝ සංවර බ්‍රහ්මචාරී භික්ෂූන්ට පැහැදුණිමි. ස්වකීය අත්වලින් සතුටු කෙළෙමි. මම ඔබට වඩා බොහෝදේ දී හීන ශරීර තත්ත්වයකට පැමිණියෙමි."

12. "දෙවතාව, කෙසේ නුඹ ස්වල්පයක්දී විශෙෂ මහත්වයකට පැමිණියෙහිද, විචාරණලද දෙවතාව කියනු මැනව. කිනම් කර්මයක මේ ඵලද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "පෙර සිත දියුණුකරණ මහණ කෙනෙක් මා විසින් දක්නාලදහ. ඒ මම තමා අටවැනිකොට රෙවත තෙරුන් පැවරුවෙමි.

14. "යහපතට මුල්වූ ඒ රේවත ස්ථවිර තෙමේ අනුකම්පා පිණිස සංඝයාට දෙවයි මට කීයේය. මම උන්වහන්සේගේ වචනය කෙළෙමි."

15. "ඒ සංඝයා කෙරෙහිවූ දක්ෂිණාව ප්‍රමාණ නොකළ හැකි තන්හි පිහිටියේය. තී විසින් පුද්ගලයන් කෙරෙහි දෙනලද්ද, තීට මහත්ඵල නොවේ."

16. "සංඝයා කෙරෙහි දෙනලද්ද මහත් ඵලයයි, මම දැන් දනිමි. ඒ මම මනුෂ්‍ය ආත්මයට ගොස් දෙන සුලුවූවා, පහවූ මසුරු බල ඇත්තී. නැවතද අප්‍රමාදව සංඝයා කෙරෙහි දන් දෙන්නෙමි.

17. "භද්‍රාව, මේ දෙවතාවා කවරීද? තී සමග කථා කරණු ලබයි. තව්තිසා වැසි සියලු දෙවියන් වර්ණයෙන් ඉක්ම බබලයි."

18. "දෙවෙන්ද්‍රය, පෙර මනුෂ්‍ය ලොකයෙහි මනුෂ්‍යවූවා මගේ බාල සහෝදරියද සමාන භාර්යාවිය. සංඝයා කෙරෙහි දන්දී කළ පින් ඇත්තී බබලයි."

19. "නැගණිය භළාවෙනි, පෙර ඔබ විසින් කරණ ලද ධර්මයෙන් බබලයි. යම්හෙයකින් අප්‍රමාණ ගුණ ඇති සංඝයා කෙරෙහි දානය පිහිටවූයෙහිය.

20. "ගිජ්ඣකූට පර්වතයේදී බෙදා දෙන්නහුගේ යම් තැනෙක දෙනලද විපාකය මහත් ඵලදැයි මා විසින් බුදුරජතෙම අසනලද්දේ විය.

21. "කාමාවචර පින් කරන්නාවූ දනාදී යාග කරන පින් බලාපොරොත්තු සත්වයන් අතරෙහි යම්කෙනෙකුට දෙනලද්ද මහත්ඵලදැයි (අසනලද්දෙමි.)

22. "ස්වකීය කර්මඵලය දන්නා බුදුරජාණන් වහන්සේ යම්තැනකට දෙනලද්ද මහත් ඵලද, බෙදාදීමෙහි ඒ විපාකය බුදුරජතෙම මට ප්‍රකාශ කළසේක.

23. "සතරකට පැමිණි සතර ඵලයක සිටි ප්‍රඥාවෙන් හා ශීලයෙන් යුක්තවූ මේ සංඝතෙමේ ඍජුවූයේය.

24. "දන්දෙන්නාවූ පින්කැමති ප්‍රාණීවූ උපධි විපාක දෙන්නාවූ කුසල් කරන්නාවූ මනුෂ්‍යයනට සංඝයා කෙරෙහි දෙන ලද දෙය මහත්ඵලවේ.

25. "මේ සංඝතෙමේ වනාහි මහත්ය. මහත් භාවයට ගියේය. ජලය දරණ සාගරය මෙන් මේ සංඝයා අප්‍රමාණය. ශ්‍රෙෂ්ඨවූ බුද්ධශ්‍රාවකවූ ආලොක කරන්නාවූ මොවුහු ධර්මය ප්‍රකාශ කෙරෙත්.

26. "යම්කෙනෙක් සංඝයා උදෙසා දන්දෙත්ද, ඔවුන් විසින් මොනවට දෙනලදී. මනාකොට යාග කරණලදී මනාකොට පුදනලදී. සංඝගතවූ, පිහිටි, ඒ දක්ෂිණා තොමෝ මහත් ඵලයයි ලොකය දත් බුදුන් විසින් වර්ණනා කරණ ලදී.

27. "යම්කෙනෙක් මෙබඳු යාගයක් සිහිකරමින් ප්‍රීතියෙන් ලොකයෙහි හැසිරෙත්ද, මසුරු මල මුල් සහිතව හික්මවා නින්දා නොලැබුවාහු ස්වර්ගලොකයට යත්.

35. "**සෙසවති විමාන කථාව**:- 1. "එල්බෙන ගෙඩි ඇති රන්, රිදී දැලින් වැසුණාවූ, නානාප්‍රකාරවූ විසිතුරු තට්ටු ඇති අතිශයින් මනොහරවූ මනාකොට නිමවන ලද්දාවූ තොරණින් යුක්තවූ, විමානය දුටුවෙමි. ශොභනවූ මේ විමාන කැමති දැයින් ගැවසී ගත්තේය.

2. "අහස්හි අන්ධකාරය දුරුකරන්නාවූ දහසක් රැස් ඇත්තාවූ සරත් කාලයේ සූර්යයා මෙන් දසදිසා බබලයි. රාත්‍රියෙහි අහසෙහි දිලියෙන්නාවූ ගින්නක් මෙන් තොපගේ විමානය බබළයි.

3. "අහසෙහි පිහිටි මනොඥවූ මෙය නිතර ඇස් පිනවයි. ශක්‍රපුරය සේ වීණා, මිහිඟුබෙර, කයිතාලම් යන මෙයින් නාද කරවනලද, තොපගේ මේ විමානය සමෘද්ධය.

4. "නෙළුම්, කුමුදු, මානෙල්, සීනිද්ද, වද, කටුකරඬු මල් ඇත්තාහ. මේ විමානය මල් පිපුණ සල් අශොක ආදී නානාප්‍රකාර වෘක්ෂයන්ගේ සුවඳින් යුක්තය.

5. "හල් නම් ගස් හා රට දෙල්, පළොල් යන මේ නම් ඇති ගස්වලින්ද පිපුණාවූ එල්බෙන කුශතණවලින්ද, මැණික් දැල් සමාන අලංකාරවත් යහපත් පොකුණක් තොපට පැමිණ සිටියාය.

6. "ජලයෙහි පිපෙන යම් මල් ජාතියක් ඇද්ද, ගොඩ බිමෙහිවූ යම් වෘක්ෂ ජාතියක් ඇද්ද, මනුෂ්‍යවූ අමනුෂ්‍යවූ, දිව්‍යවූ යම් සම්පත්තියක් ඇද්ද සියල්ල ඔබගේ විමනෙහි පහළවී තිබේ.

7. "කිනම් ක්ලෙශ සමනයක ආත්ම දමනයක මේ විපාකයක්ද? කිනම් කර්ම ඵලයකින් මෙහි උපන්නීද, තී විසින් මේ විමානය යම්සේ ලබනලද්දීද, මහත් ඇසක් (නුවණක්) ඇත්තීය. එය වචනයක් පාසා කියනු මැනවි."

8. "කොස්වාළිහිණි, මොණර, ඇටිකුකුළු, සමූහයා විසින් හැසිරෙනලද දිව්‍යමයවූ ඔබමොබ යන හංස රාජයන්ගෙන් ගැවසීගත් විල්ළිහිණි කොවුලන් ආදී කුරුල්ලන් විසින් නාදකරණ ලදී.

9. "ස්වාමීනි, නොයෙක් දෙව්රුක් හා පුෂ්පයන් සහිත වෘක්ෂයන්ද නන්වැදෑරුම්වූ පළොල්, ජම්බු, අශෝකාදී වෘක්ෂද ඇත්තාවූ මේ විමානය මා විසින් යම් පරිද්දෙකින් ලබන ලද්දේද, එය නුඹවහන්සේට කියන්නෙමි, අසනු මැනව.

10. "ස්වාමීනි, ශ්‍රෙෂ්ඨ මගධ රටට පෙරදිගින් නාලක නම් ගමක් ඇත්තේය. ඒ නුවර ලේලියක්වීමි, එහිදී මා සෙසවතියයි දැනගත්තාහුය.

11. "ඒ මම පුරුදුකරණලද අර්ථ ධර්ම දෙක්හි දක්ෂවූ දෙවි මිනිසුන් විසින් පුදනලද, මහත්වයට පැමිණ, අප්‍රමාණ ගුණ ඇති උපතිස්ස තෙරුන් (සැරියුත්) සතුටු සිතින් මලින් පිදුවෙමි.

12. "ශ්‍රෙෂ්ඨ ගතියට පැමිණ, අන්තිම සිරුර දරන මහත් ඍෂිවරයා පුදා මනුෂ්‍ය දෙහය හැර තව්තිසා දෙව්ලොවට පැමිණ මෙහි වසමි."

**36. මල්ලිකා විමාන කථාව:-** 1. "රන්වන් වස්ත්‍ර ඇති රන්වන් ධවජ ඇති, රන්වන් අලංකාරයෙන් බබලමින්, අන්‍ය රන්වන් අලංකාරලින් නොපැළැන්දාම හොබින්නෙහිය.

2. "සක්මයවූ අඟුපළඳනා ඇති ස්වර්ණමයවූ මල් දම් ඇත්තාවූ රන් මාලාවලින් හෙබි, නොයෙක් රන්දම්වලින් වැසුණු, නොයෙක් මැණික් පෙළින් යුතු

3. "රන්මයවූ රතු මැණික්මයවූ මුතුමයවූ වෙරළු මිණිමයවූ මැසිරි ගල්මයවූ පද්මරාගමයවූ, පරෙවියන්ගේ ඇස් වැනි මැණික්වලින් විසිතුරුවූ

4. "ඇතැම් ඇතැම් අය මෙහි මොණර හඬට බඳු මනා ස්වරයක් ඇත්තෝය. කිසිවෙක් හංසරාජයාගේ මෙනි. කිසිවෙක් කොවුල් හඬ ඇත්තෝය. ඔවුන්ගේ නාදය යහපත් කොට වැයූ පසඟතුරු හඬසේ යහපත්ව ඇසෙයි.

5. "තොපගේ රථයද යහපත්ය. මනොඥය. නොයෙක් රත්නයෙන් අලංකාරය. නොයෙක් පාට ඇති ද්‍රව්‍ය කොටස් වලින් මනාව බෙදුවාක් මෙන් හොබී.

6. "රන් රුවක වර්ණය ඇති යම්බඳුවූ ඒ රථයෙහි තී සිටියා මේ ප්‍රදෙශය අලංකාර කරන්නෙහිය. දෙවතාව, ප්‍රකාශ කරණු මැනව. මේ කිනම් කර්මයක්හුගේ ඵලයද?"

7. "අප්‍රමාණ ගුණ ඇති ගෞතමයන් වහන්සේ පිරිනිවී කල්හි රන් දැල් ඇති මැණික්වලින් හා රනින් අලංකාරවූ මුතු ඇමුණු රන් දැලකින් පැහැදුණ සිතින් මම වැසුයෙමි.

8. "මම බුදුන් විසින් වර්ණනාකරණලද ඒ පින කොට පහවූ ශෝක ඇත්තී සුවපත්වූවා නිරෝගිවූවා ප්‍රීතිවෙමි."

37. **විසාලක්ඛි විමාන කථාව:-** 1. "විසාලක්ඛිය, ඔබ දිව්‍යාංගනා සමූහයා විසින් පෙරටු කරණලද්දී රම්‍යවූ චිත්‍රලතා වනයෙහි හාත්පස ඇවිදින්නෙහිය.

2. "යම් කාලයෙක්හි තවුතිසා වැසි දෙවියෝ මේ වනයට ප්‍රවිෂ්ටවෙත්ද මෙහි පැමිණියාවූ සුදුසුවූ රථ සහිතවූ සියල්ලෝ විසිතුරු වෙති.

3. "මෙහි පැමිණ උයනෙහි හැසිරෙන තොපගේ ශරීරයෙහි කැළලක් නොපෙනේ. තොපගේ රූපය කවරහෙයකින් මෙබඳුවීද? විචාරණලද දේවතාව කියනු මැනව, කිනම් කර්මයක්හුගේ මේ ප්‍රතිඵලයද?"

4. "දෙවෙන්ද්‍රය, යම් කර්මයකින් මගේ රූපයද මගේ ගතියද ඍද්ධියද ආනුභාවයද වේද, ශක්‍රය එය අසනු මැනව.

5. "මම රම්‍යවූ රජගහනුවර හැමකල්හි ශ්‍රද්ධාවත්වූ සීලයෙන් යුක්තවූ බෙදාදීමෙහි ඇලුණු සුනන්දා නම් උපාසිකාවක් වූවාවෙමි.

6. "වස්ත්‍රද, ආහාරද, සෙනසුන්ද, පහන්ද, පැහැදුනාවූ සිහින් ඍජුවූවන් වෙත දුනිමි.

7. (මේ ඡෙදය 15 කථාවේ 6 ඡෙදය මෙනි.)

8. "හැමකල්හි සීල සංවරයෙන් යුක්තව පොහෝදා අටසිල් සමාදන්වීමි. සතුන් මැරීමෙන් වෙන්වුණෙමි. බොරු කීමෙන්ද වැළකුණෙමි. සොරකමින්ද මිථ්‍යාචාරයෙන්ද, මත්පැන් බීමෙන්ද දුරුවුණෙමි.

9. "යසස ඇත්තාවූ, නුවණැස ඇත්තාවූ ගෞතමයන් වහන්සේගේ සිල්පද පසෙහි ඇලුණු ආර්යසත්‍යයෙහි දක්ෂ උපාසිකාවක් වීමි.

10. "ඒ මාගේ නෑ කුලයෙහි දාසියක් හැමකල්හි මල් ගෙන එයි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ථූපයෙහි සියල්ල පිදුවෙමි.

11. "මම පොහෝ දිනයෙහිද ගොස් පැහැදුනි, ස්වකීය හස්තයෙන් මල් ගඳ විලවුන් ථූපයට පූජා කෙළෙමි.

12. "ශක්‍රදේවේන්ද්‍රය, ඒ කර්මයෙන් මගේ රූපයද ගතියද ඍද්ධියද ආනුභාවයද යම් මලක් පිදීද එයින් විය.

13. "යම් ශීලයක් ඇත්තියක්වීද මේතාක් එය විපාක නොදෙයි. දෙවේන්ද්‍රය, මගේ ආශාව සකෘදාගාමීවීමය."

38. **පාරිච්ඡත්තක විමාන කථාව:-** 1. "සිත්කලුවූ, රම්‍යවූ පරසතු මදාරා ගස්වල දිව්‍ය මල්දම් ගොතමින් ගී කියමින් සතුටුවෙත්.

2. "නටන්නාවූ ඒ තොපගේ අවයව වලින් සර්වප්‍රකාරයෙන් ඇසියයුතු මනහර දිව්‍ය ශබ්ද නික්මේ.

3. "නටවන්නාවූ තොපගේ අවයව වලින් සර්වප්‍රකාරයෙන් යහපත් හොඳ සුවඳවත් දිව සුවඳ හමයි.

4. "කොන්ඩෙහි යම් පළඳනාවක්වේද කය සෙලවෙන කල්හි පඤ්චාංගික තූර්යයෙහි මෙන් ඔවුන්ගේ ශබ්දය ඇසෙයි.

5. "වාතයෙන් සොලවනලද, වාතයෙන් විශෙෂයෙන් කම්පාකරනලද මුදුන්මල්කඩක් වේද, පඤ්චාංගික තූර්යයන්හි මෙන් ඔවුන්ගේ ශබ්දය ඇසෙයි.

6. "යහපත් සුවඳ ඇති, යහපත්වූ තොපගේ හිසෙහියම් මල්මාලාවක් වේද, මඤ්ජුසක දිව්‍ය වෘක්ෂය මෙන් සියලු දිශාවෙහි සුවඳ හමයි.

7. "ඔබ යහපත් සුවඳ සිඹින්නෙහිය. මනුෂ්‍යත්වය ඉක්මවා සිටි රූප බලන්නෙහිය. විචාරණලද දේවතාව කියන්න මේ කිනම් කර්මයක්හුගේ ප්‍රතිඵලද?"

8. "මම පැහැ විහිදෙන ගිනි රැසක් සේ රත්වූ, සුවඳ ඇති අසෝක මල්දමක් බුදුන්ට පූජාකෙළෙමි.

**9.** "මම බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනාකරන ලද ඒ කුශලකර්මයකොට පහවූ ශොක ඇත්තී සුවපත්වූවා නිරෝගිවූවා සතුටුවෙමි."

**(තුන්වැනි පාරිච්ඡත්තක වර්ගය නිමි.)**

---

## 4. මඤ්ජෙට්ඨක වර්ගය

**39. මඤ්ජෙට්ඨක විමාන කථාව:-** 1. "රන්වැලි අතුරන ලද, මදටිය පාට ඇති මනා සංගීත ඇති විමානයෙහි අංග පසින් යුත් තූර්යයන්ගෙන් සිත් අලවා වසන්නෙහිය.

**2.** "ඒ රන්මයවූ නිර්මිතවූ විමානයෙන් බැස හැම කාලයකම පිපී තිබෙන සල්වනයට වදින්නෙහිය.

**3.** "දේවතාව, යම් යම් ගසක් මුල සිටින්නෙහිද, උතුම් වෘක්ෂය නැමී මල් මුදන්නේය.

**4.** "පක්ෂීන් විසින් සෙවිනාලද සල්වනය වාතයෙන් සෙලවෙයි. මඤ්ජුස්සක නම් දිව්‍ය වෘක්ෂයසේ සියලු දිශාවෙහි සුවඳ හමයි.

**5.** "ඔබ පිරිසිදු සුවඳ සිඹින්නෙහිය. අමානුසිකවූ රූපය බලන්නෙහිය. විචාරණලද දේවතාව කියන්න. මේ කිනම් කුශලකර්මයක ප්‍රතිඵලයක්ද?"

**6.** "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍ය ස්ත්‍රියක් වූවා ස්වාමිකුලයෙහි දාසියක්වීමි. වැඩහුන් බුදුන් දැක සල්මලින් පිදීමි.

**7.** "මම මනාකොට කරනලද සල් මලින් කළ මුදුන්මල් කඩක්ද මගේම අත් දෙකින් පැහැදී පූජාකෙළෙමි.

**8.** (මේ ඡේදය 38 කථාවේ 9 වෙනි ඡේදය මෙනි.)

**40. පභස්සර විමාන කථාව:-** 1. "පැහැ විහිදෙන වර්ණයෙන් යුත් ඉතා රතුපාට දිවසළුවක් හැඳි එසේම දිව්‍ය සළුවක්

එකාංශකොට පෙරවි, සඳුන් තවරණලද යහපත් ශරීරයක් ඇති මට වදින ශොභමාන තැනැත්තිය ඔබ කවරෙක්ද?"

2. "නන්දන වනයෙහි ශක්‍රදේවෙන්ද්‍රයාසේ යම් ආසනයක හුන්නේද ඒ ආසනය මහාර්ඝවූ නානාවිධ රත්නයෙන් ලක්ෂණය විසිතුරුය."

3. "සොඳුර, කිමෙක්ද නුඹ පෙර කිනම් සුචරිතයක් පුරුදුකරන ලද්දේද, දිව්‍යලෝකයෙහි කිනම් කර්මයක්හුගේ විපාකය විඳින්නෙහිද? විචාරනලද දෙවතාව ප්‍රකාශ කරනු මැනව."

4. "පිඬු පිණිස හැසිරෙන්නාවූ නුඹවහන්සේට, ස්වාමීනි, මල්දමක්ද සකුරු කැටයක්ද පිදීමි. මේ ඒ කර්මයාගේ විපාකය දිව්‍යලෝකයෙහි විඳිමි.

5. "ධර්මරාජයන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරනලද ධර්මය ඒ මම නොඇසුවෙමි. ස්වාමීනි, මා විසින් වරදවනලදී. නපුරක් කරනලදැයි මට පසුතැවිල්ලක්ද විය.

6. "ස්වාමීනි, ඒ කාරණය නුඹවහන්සේට කියමි. යම්බඳුවූ මට අනුකම්පාවක් ඇත්නම් ඒ ධර්මරාජයන් වහන්සේ විසින් දෙශනාකරනලද කිසි ධර්මයෙක්හි ඒ මා සමාදන් කරවන්නෙහිය.

7. "බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සංඝයා කෙරෙහිද ශ්‍රද්ධාවක් යම්කෙනෙකුන්ට ඇත්ද ඔහු ආයුෂින් කීර්තියෙන් ඓශ්චර්යයෙන් මා ඉක්මවා බබළත්.

8. "මට වඩා අන්‍ය දෙවියෝ මහත් ඍද්ධි ඇත්තෝය. ප්‍රතාපයෙන්ද වර්ණයෙන්ද ඉතා උසස්ය."

**41. නාගවිමාන කථාව:-** 1. "අලංකාරවූ මැණික් වලින් හා රුවනින් විසිතුරුවූ රන් දැළින් විචිත්‍රවූ මහත්වූ මනාකොට සරහනලද හස්තිරාජයකු පිට නැඟී අහසින් මෙන් ආවාය.

**2.** "ඇතාගේ දළදෙකෙහි මවනලද මනාව පිපුණු පිරිසිදු ජලය ඇති නෙළුම් විල් වෙත්. පද්මයන්හිද තූර්යවාද කරන්නියෝ පලාගෙන මතුවෙත්. මනහරවූ මොව්හුද නටත්.

**3.** "මහත් ආනුභාව ඇත්තිය, දිව්‍ය ඍද්ධියට පැමිණියා වෙහිය. මනුෂ්‍යවූ කාලයේ කිනම් පිනක් කෙළෙහිද, කිනම් කරුණකින් මෙසේ දිළිසෙන ආනුභාව ඇත්තීද, තොපගේ වර්ණයද සියලු දිශාවන් බබුළුවයි."

**4.** "බරණැසට පැමිණ මම බුදුන්ට වස්ත්‍ර දෙකක් පිදීමි. පාවැඳ බිම ඉඳගත්තෙමි. සිතට ප්‍රීතිය ගෙනදෙන දොහොත් මුදුන්දී වැන්දෙමි.

**5.** "රන්කඳකට බඳු සිවියක් ඇති බුදුරජාණන් වහන්සේද මට තෘෂ්ණාවගේ දුක හා අනිත්‍යභාවය දෙසූ සේක. වෙනස්වීමක් නැති, දුක නැතිකිරීමෙන් ස්ථිරවූ මාර්ගය වැටහෙන පරිදි දෙසූසේක.

**6.** "අල්පායුෂ්කවූ මම ඉන් කළුරිය කළා, චුතවූවා, යසස් ඇත්තීව තවුතිසා දෙව්ලොව උපන්නීවෙමි. ශක්‍රයාගේ දිශාවන්හි ප්‍රසිද්ධවූ සූත්තරා නම් එක්තරා භාර්යාවක්වීමි.

**42. අලොමාවිමාන කථාව**:- 1. (මේ ඡේදය 9 කථාවේ 1, 2, 3, 4, 5 ඡේද මෙනි)

**2.** "මමද බරණැස්නුවර සූර්යවංශයට බන්ධුවූ බුදුරජාණන් වහන්සේට පැහැදුණිමි. ස්වකීය අතින් වියලි පිට්ටුවක් පිදීමි.

**3.** "වියලී ලුණු නැති පිට්ටුවක විපාකය බලනුමැනව. අලෝමව සැපට පැමුණුනා දැක කවරෙක් පින් නොකරන්නේද.

**4.** (මේ ඡේදය 9 වෙනි කථාවේ 8, 9, 10 ඡේද මෙනි.)

**43. කඤ්ජිකදායිකා කථාව**:- 1-4 (මේ ඡේද 9 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි)

**5.** "මම අන්ධකවින්ද රටෙහිදී සූර්යවංශයෙහි උපන් බුදුරජාණන් වහන්සේට ඩෙබර යුෂ කකාරා හැදූ කැඳක් තෙලින් මිශ්‍රකොට දුම්කවා දුනිමි.

**6.** "තිප්පිලි කරාබුනැටි සුදුලූනු මිශ්‍රකොට පැහැදුණ සිතින් ඍජුවූ බුදුන්ට දුනිමි.

**8-9** (මේ ඡේද 20 කථාවේ 8, 9 ඡේද මෙනි)

**10.** "යමෙක්තෙම සතර මහා දිවයිනට රාජ්‍යකරන්නේද එක කැඳ දානයක දහසයෙන් කොටසක්වත් නොඅගනේය.

**44. විහාරදායිකා විමාන කථාවː-** 1. (මේ ඡේදය 9 කථාවේ 1 ඡේදය මෙනි.)

**2.** 3-4-5-6-7 (මේ ඡේද 10 වෙනි කථාවේ 2-3-4-5-6-7 ඡේද මෙනි.)

**8.** "ස්වාමීනි, මගේ යෙහෙළිය සැවැත් නුවර සංඝයා උදෙසා මහත් විහාරයක් කරවූවාය. මම ඊට පැහැදී අනුමෝදන්වීමි. ඒ ගෙයද දැක එය මට ප්‍රියද විය.

**9.** "මාගේ පිරිසිදු ඒ අනුමෝදනාවෙන් දර්ශනීයවූ අද්භූතවූ විමානය ලබන ලදී. මගේ ඍද්ධියෙන් විමානය හාත්පසින් සොළොස් යොදුනක් අහසේ යයි.

**10.** "කොටස් කර බෙදන ලද ප්‍රමාණවත්වූ කුළු ගෙවල් ඇති මේ විමානයෝ හාත්පසින් යොදුන් සියයක් දිලිසෙමින් ආලෝක පතුරුවත්.

**11.** "මත්ස්‍යයන් විසින් ආශ්‍රය කරන ලද මෙහි පිහිටි මාගේ පොකුණුද පිරිසිදු ජලය ඇත්තේ පැහැදුණ රන්වන් වැලි අතුරණ ලද්දේද විය.

**12.** "නොයෙක් පියුමෙන් ගැවසී ගත්තීය, සුදු නෙලුම් මලින් යුක්තය. වාතයෙන් කම්පාවූ ඒවා සුවඳ හමයි.

**13.** "දඹද, කොස්ද, තල්ද, පොල් වනද නොසිටවූ නොයෙක් ගස්ද නිවාසය ඇතුලෙහි පහළවූහ.

**14.** "නොයෙක් තූර්යයන් නාද කරනලද දිව්‍යාංගනා සමූහයන්ගෙන් ශබ්දවත්වූ මා යමෙක් සිහිනෙහුදු දක්නේද ඒ මනුෂ්‍යයාද ධනවතෙක්වේ.

15. "මෙබඳු, පුදුමවූ, දැකුම්කළුවූ, සර්වප්‍රකාරයෙන් දිලියෙන විමානය මාගේ කුශල කර්මයෙන් උපන්නේය. පින් කරන්නට සුදුසුයි."

16. "තොපගේ පිරිසිදු අනුමෝදනාවෙන් ලත් විමානය පුදුමය. දැකුම් කලුය, යම් ස්ත්‍රියක් ඒ දානය දුන්නීද, ඕ තොමෝ කොහි උපන්නීදැයි ඇගේ ගතිය කියනු මැනව."

17. "ස්වාමීනි, මගේ යහළු ස්ත්‍රිය යම් තැනැත්තියක්වීද ඕතොමෝ සංඝයාට මහාවිහාරයක් කරවූවාය. දැනගත් ධර්මය ඇති ඕ දානයක් දී නිර්මාණරතී දෙවියන් අතර උපන්නාය.

18. "ඒ සුනිර්මිත දිව්‍යපුත්‍රයාගේ භාර්යාවය. ඇගේ කුශල කර්ම විපාකය නොසිතිය හැකිය, ඕතොමෝ කොහි උපන්නීදැයි මේ යමක් විචාළෙහි නම් මම ඔබට අන්පරිද්දක් නොකියා ප්‍රකාශ කෙළෙමි.

19. "එසේ හෙයින් වස්තු ඇත්තෝ සංඝයාට දන්දෙව්. අන්‍යයන්ද සමාදන් කරවව්. පැහැදුණ සිතින් ධර්මයද අසව් අතිශයින් දුර්ලභවූ මිනිසත් බව ලබන ලදී.

20. "බ්‍රහ්මයාගේ ස්වරය ඇති රන්වන් සමක් ඇති බුදුහු යම් මාර්ගයක් මාර්ගයනට ප්‍රධානයයි ප්‍රකාශ කළාහුද, යම් තැනෙක්හි දක්ෂිණාව මහත් ඵලයෙන් යුක්තවේද වස්තු ඇත්තේ සංඝයාට දන් දෙව්."

21. "යම් අෂ්ටාර්ය පුද්ගල කෙනෙක් බුද්ධාදී සත්පුරුෂයන් විසින් පසස්නා ලද්දාහුද උන්වහන්සේලා යුග හතරක් වෙත්. බුදුන්ගේ ශ්‍රාවකවූ උන්වහන්සේලා දක්ෂිණාවට සුදුස්සෝය. උන්වහන්සේලා කෙරෙහි දෙනලද්ද මහත්ඵලවේ. (මෙහි 22-23-24-25-26 යන ඡේද 34 කථාවේ 23, 24, 25, 26, 27 මෙනි.)

**45. සතර ස්ත්‍රී විමාන කථාව:-** (බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වාසය කරණ කාලයේ මහමුගලන් තෙරුන් වහන්සේ තව්තිසා දෙව්ලොව විමන්

සතරක දිව්‍යාංගනාවන් සතර දෙනකු දැක) (මෙතැන් සිට 1-2-3-4-5 දක්වා ඡේද 9 කථාවේ 1-2-3-4-5 ඡේද මෙනි.)

**6.** "එසිකා නම් රට පණිකත නම් නුවර ස්වාමි කුලයට ගොස් සමගිව වාසය කෙළෙමු. (ii) පිඬු පිණිස හැසිරෙන්නාවූ භික්ෂුවක් හට ඇසළ මල් මිටියක් පිදීමි.

**7-8-9** (ඡේද 9 වෙනි කථාවේ 8-9-10 ඡේද මෙනි.)

**1-2-3-4-5** (ඡේද 9 කථාවේ 1-2-3-4-5 ඡේද මෙනි.)

**6** (ඡේදය 4-5 කථාවේ 6 ඡේදය මෙනි.) "ඇසළ මල්" වෙනුවට "නිලුපුල් කියා" වෙනස්කර යොදාගත යුතුයි.)

**7-8-9** (ඡේද 9 කථාවේ 8-9-10 ඡේද මෙනි.)

**1-2-3-4-5** (ඡේද 9 කථාවේ 1-2-3-4-5 ඡේද මෙනි.)

**6** ඡේදය 45 කථාවේ 6 ඡේදයේ "ඇසළ මල්" වෙනුවට "සුදු පියුම්" කියා වෙනස්කර යොදාගත යුතුයි.

**7-8-9** (ඡේද 9 කථාවේ 8-9-10 ඡේද මෙනි.)

**1-2-3-4-5** (ඡේද 9 කථාවේ 1-2-3-4-5 ඡේදය මෙනි.)

**6** ඡේදය 45 කථාවේ 6 ඡේදයේ "ඇසළ මල්" වෙනුවට "සමන් මල්" කියා වෙනස්කර යොදාගත යුතුයි.

**7-8-9** මේ ඡේද 9 කථාවේ 8-9-10 ඡේද මෙනි,

**46 අම්බ විමාන කථාව:-** 1. "රම්‍යවූ ඔබගේ දිව්‍යමයවූ අඹවනය රම්‍යය මෙහි ප්‍රාසාදයෝ මහල් ඇත්තාහ. නොයෙක් තූර්යයන්ගෙන් ඝොෂා සහිත වෙත්. දිව්‍යාංගනා සමූහයා විසින් ශබ්දපවත්වන ලදී.

**2.** "මෙහි රන්වන්වූ මහත් පහනක් නිතර දැල්වෙයි. දිවසළු නමැති ඵලයෙන් යුත් වෘක්ෂයන්ගෙන් හාත්පසින් පිරිවරන ලදී.

**3-4-5-6** (මේ ඡේද 9 සූත්‍රයේ 3-4-5-6 ඡේද මෙනි.)

7 (මේ ඡෙද 9 සූත්‍රයේ 7 ඡේදයේ 1 මෙනි) අඹ ගස්වලින් පිරිවරණ ලද විහාරයක් කරවූයෙමි.

8. "විහාරය කොට අවසන්වූ කල්හි උත්සවය නිමි කල්හි වස්ත්‍රමය ගෙඩි අඹගස්වල සදා

9. "එහි පහනක් දල්වා සංඝයා වළඳවා ස්වකීය හස්තයෙන් පැහැදී එය සංඝයා වහන්සේට භාර කෙළෙමි.

10-11-12 ඒ හෙතුවෙන් මාගේ අඹවනය (මේ කථාවේ 1-2-3 ඡෙද යෙදිය යුතුයි.)

**47. පීත විමාන කථාව:-** 1. "රන් වස්ත්‍රද රන් කොඩිද දරන්නිය. රනින් අලංකාරය. රන්වන් සඳුන් තැවරුණ අවයව ඇත්තීය. රන්පාට උපුල් මල්දම් දරන්නීය.

2. "රන්වන් ප්‍රාසාද හා ඇඳන් ඇත්තාහ. රන්වන් ආසනයෝ ඇත්තාහ. රන්වන් භාජන ඇත්තේය. රන්වන් කුඩ ඇත්තාහ. රන්වන් රථ ඇත්තාහ. රන්වන් අශ්වයෝ ඇත්තාහ. රන්වන් විජිනි පත් ඇත්තාහ.

3. "යහපත් ස්ත්‍රිය පෙර මනුෂ්‍යලොකයෙහි කිනම් කුශලකර්මයක් කළේද, දෙවතාව විචාරණ ලද්දී. ප්‍රකාශ කරව. මේ ප්‍රතිඵලය කිනම් කර්මයකගේද?"

4. "දිව්‍යරාජොත්තමය, වැටකොළුයයි ප්‍රසිද්ධ නොවැදගත් වැල් වර්ගයක් ඇත්තේය. ඒ වර්ගයේ මල් සතරක් මම චෛත්‍යයකට පූජාකරන්ට ගෙන ගියෙමි.

5. "ශාස්තෲන් වහන්සේගේ ශ්‍රී ශරීරය ගැන පැහැදුන සිතින් ඒ ගැනම වූ සිහියෙන් පාර නොදුටුවෙමි.

6. "ථූපය වෙත නොපැමිණි සිත් ඇති මා දෙනක් මැරුවාය. ඒ පින මා සිදුකරගත්තේ නම් මීට වඩා සැප ඇති වන්නේය.

7. මඝ නම් දිව්‍යරාජයන් වහන්ස, ඒ කර්මයෙන් මනුෂ්‍ය දෙහය අත්හැර නුඹවහන්සේ හා සහභාවයට ගියෙමි.

8. "තව්තිසා දෙව්ලොවට අධිපති ශක්‍රතෙමේ මෙය අසා තව්තිසා වැසි දෙවියන් පහදවමින් මාතලීට මෙසේ කීයේය.

9. "මාතලිය, ආශ්චර්යවූ විසිතුරුවූ මේ කර්ම ඵලය බලව, ස්වල්ප වශයෙන් දුන් දානය මහත් ඵල පිනක් වේ.

10. "තථාගතවූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි හෝ නොහොත් උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ නමක් කෙරෙහි සිත පැහැදුවූ කල්හි දක්ෂිණාව ස්වල්ප නම් නොවන්නීය.

11. "මාතලිය, එව අප විසින් බොහෝසෙයින් තථාගතයන් වහන්සේගේ ධාතු පුදමු. පින් රැස් කිරීම සැප පිණිස පවතී.

12. "වැඩසිටි කල්හිද පිරිනිවී කල්හිද සමාන සිත ඇතිවූ කල්හි සමඵලවේ. සිත පැහැදීම නිසා සත්වයෝ සුගතියට යති.

13. "යම් තැනෙක්හි සත්කාර කොට දායකයෝ ස්වර්ගයට යත්ද, ඒ බොහෝදෙනාගේ ප්‍රයොජනය පිණිස තථාගතවරයෝ උපදිත්."

48. **උච්ඡුවිමාන කථාව:-** 1. "දෙවියන් සහිත පෘථිවිය ආලොක කොට චන්ද්‍ර සූර්යයන් මෙන් ශ්‍රීයෙන්ද, වර්ණයෙන්ද, යශසින්ද, තෙජසින්ද තව්තිසා දෙව්ලොව ශක්‍රයා සමග බබළන්නෙහිය.

2. "මානෙල් මාලා දරන මල්දම් පැළඳගත්, රන්වන් සමක් ඇති අලංකාරවූ උතුම් වස්ත්‍ර දරන තොප විචාරමි. මා වඳින යහපත් දෙවතාව ඔබ කවුද?

3. "තමා විසින් පූර්ව ජාතියෙහි මනුෂ්‍යාව සිට කිනම් (කුශල) කර්මයක් කෙළෙහිද, දානයක් පුරුදු කරන ලද්දේද නැවත ශීල සංවරයක් පුරුදු කරන ලද්දේද, යසස් ඇත්තීය, කිනම් මේ කුශලයකින් සුගතියෙහි උපන්නීද, විචාරණ ලද දෙවතාව, කියනු මැනවි' මේ ඵලය කිනම් කර්මයකගේද?"

**4.** "ස්වාමීනි දැන් ඔබවහන්සේ මේ ගමට පිඬු පිණිස හැසිරෙන්නේ අපගේ ගෙදරට වැඩිසේක. පැහැදුන සිතින් අප්‍රමාණ ප්‍රීතියෙන් ඉක්බිති නුඹවහන්සේට උක්සකුරු කඩක් දුනිමි.

**5.** "ස්ත්‍රිය, උක් කාට දුන්නීදැයි" පසුව නැන්දම්මා මගෙන් විචාළාය. 'මා විසින් විසි නොකෙළෙමි, නොකෑවෙමි, ශාන්ත භික්ෂුවකට දුනිමි."

**6.** "නැන්දම්මා 'මේ සම්පත් තොපගේද නොහොත් මගේදැයි' මට පරිභව කළාය. කැටක් ගෙන මට පහරක් දුන්නීය. ඉන් චුතව කළුරිය කළා දෙවතාවියක් වීමි.

**7.** " (i) මා විසින් මේ කුශල කර්මයම කරන ලදී. තමා විසින් සැප කර්මයක්ද අනුභව කරමි. මම දෙවියන් විසින් පිරිවරන ලද්දෙමි. පස්කම් සැපයෙන් සතුටුවෙමි.

8. "(මෙහි 7 (i) යෙදිය යුතුයි.) දේවේන්ද්‍රයා විසින් තබාගන්නා ලද්දී තව්තිසා දෙවියන් විසින් කරන ලද්දී, පස්කම් ගුණයෙන් පිළිගැනුණි වෙමි.

**9.** "මේ පින්පලය පමණ නැත. මාගේ උක් දානය මහත් විපාක ඇත්තේය. මම දෙවියන් සමග හැසිරෙමි. පස්කම් ගුණයෙන් සතුටු වෙමි.

**10.** "මේ පින් පලය පමණ නැත. මහත් බැබළීම් ඇත්තීය. දෙව්ලොවට අධිපති දෙවියන් විසින් රකිනලද ශක්‍රදෙවෙන්ද්‍රයා මෙන් නදුන් උයනෙහි සැප විඳිමි.

**11.** "ස්වාමීනි, ඔබද අනුකම්පකයෙක්යැයි දැන ගතිමි. පැමිණ වැන්දෙමි. සැප දුක්ද විචාළේය. ඉක්බිති පැහැදුණ සිතින් අසමාන ප්‍රීතියෙන් නුඹවහන්සේට උක් කඩක් දුනිමි."

**49. බච්ච විමාන කථාව:-** "1-2-3-4-5 (මේ ඡෙද 9 කථාවේ 1-2-3-4-5 ඡෙද මෙනි.)

6. "මම මනුෂ්‍යයන් අතර මනුෂ්‍යයෙක්වූවා සිල්වත් ශ්‍රමණයන් ඇදිලි කෙළෙමි.

7-8-9 '(මේ ඡේද 9 කථාවේ 7-8-9 ඡේද මෙනි.)

**50. රජ්ජු මාලා විමාන කථාව:-** 1. "එම්බා දිව්‍යාංගනාව යම්බඳුවූ තී යහපත් වර්ණයෙන් සිටින්නෙහිද, මනා වාදනය ඇති කල්හි අත්පා වලින් වෙන් වෙන්ව නටන්නීය.

2. "නටන්නාවූ ඔබගේ අංග ප්‍රත්‍යංගයන්ගෙන් ඇසිය යුතුවූ යහපත්වූ දිව්‍යශබ්දයෝ සර්වප්‍රකාරයෙන් නික්මෙත්.

3 4-5-6-7 (මේ ඡේද 44 කථාවේ 3-4-5-6-7 ඡේද මෙනි.)

8. "පෙර මම ගයා රටෙහි බ්‍රාහ්මණයෙකුගේ දාසියක් වීමි. ස්වල්ප පින් ඇත්තාවූ අප්‍රසිද්ධවූ මාර රජ්ජු මාලායයි දනිත්.

9. "ආක්‍රොශයන්ටද, වධයන්ටද, තර්ජනයටද, යටවූවා, කළයක් ගෙන නික්ම දිය ගෙන ඒමට ගියෙමි.

10. "පාර අසළ කළය තබා වන ලැහැබට ගියෙමි. ජීවත්වීමෙන් කිනම් ප්‍රයෝජනද මෙහි මැරෙමියි (කියා)යි.

11. "තද තොණ්ඩුවක් ගසාගෙන ගසක ගැටගසා වනයෙහි කවරෙක් සිටින්නේ දැයි දිශා බැලුවෙමි.

12. "වෘක්ෂ මූලයක උන්නාවූ ධ්‍යාන කරන්නාවූ කිසි බියක් නැති සියලු ලොකයාට හිතවත්වූ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

13. "කවරෙක් වනයෙහි සිටින්නේද, මනුෂ්‍යයෙක්ද නැතහොත් දෙවතාවෙක් දැයි මට සංවෙගයක්ද, පුදුමයක්ද, ලොමු දැහැ ගැන්මක්ද, විය.

14. "වනයන් නිවීමට පැමිණි සතුට ගෙනදෙන ප්‍රසාද එළ වන්නහු දැක මේ එසේ මෙසේ සත්වයෙක් නොවේයයි මගේ සිත පැහැදුණේය.

15. "රකින ලද ඉඳුරන් ඇති ධ්‍යානයෙහි ඇලුණු සිහිබුද්ධිය ඇති සියලු ලොකයාට හිතවත්වූ මේ තෙමේ බුදුරද වන්නේය.

**16.** "ගුහාව ඇසුරු කරන සිංහයෙකු මෙන් බිය හා භයානක අරමුණු ඇති, ළංවිය නොහැකි මේ තෙමේ දිඹුල් මල් සේ දකින්නට දුර්ලභය.

**17.** "ඒ තථාගතයන් වහන්සේ ප්‍රිය වචන වලින් මට 'රජ්ජු මාලාවෙනියි' කථා කොට 'තථාගතවූ මා සරණ යවයි' වදාළසේක.

**18.** "ඒ මම කෙළතොළු නොවූ අර්ථ ඇති පිරිසිදුවූ සියුම්වූ, මෘදුවූ යහපත්වූ සියලු ශොක දුරු කරන්නාවූ වචනය අසා.

**19.** "පැහැදුණු පිරිසිදු සිත් ඇති මා යහපත් සිත් ඇත්තකැයි දැන සියලු ලොකයට හිතවත්වූ තථාගත තෙම මට අනුශාසනා කෙළේය.

**20.** "මේ දුකයයි මට කී සේක. මේ දුක පහළවීමය. මේ නිවණය, මේ නිවණට බැසගත් අඞ්ජස යයි කියන ලද මාර්ගය යයි කීසේක.

**21.** "යහපතට අනුකම්පා කරන්නහුගේ අවවාදයෙහි මම පිහිටියෙමි, චුතනොවන නිර්වාණයවූ අමෘත ශාන්තියට පැමිණියෙමි.

**22.** "ඒ මම සතුටෙහි සිටියා. දැකීමෙහි නොසෙල්වීමි. මූලික ශ්‍රද්ධාවෙන් බුදුන්ගේ ඖරස දුර්වණයක් වූවා වෙමි.

**23.** "ඒ මම ඇලෙමි, ක්‍රීඩා කරමි. සතුටුවෙමි, කොහින්වත් බියක් නැත. මී පැනි හා මෘදු දෙය බොමි.

**24.** "ආලම්බය ගග්ගරය භීමය, සාධු වාදීය, සංසයය යන හැට දහසක් තූර්යයෝ මගේ පිබිදීම කරත්.

**25-26.** "නන්දාය, සුනන්දාය, සොණ දින්නාය, අළම්බුසාය, මිස්සකෙසීය පුණ්ඩරීකය, අතිවාරුණිය, ඒණිඵස්සාය, සුඵස්සාය, සුභද්‍රාය මුදුවාදිනීය යන පොක්ඛරය, සුඵස්සය, නම්වූ වීණාවන් පසෙක තැබූ විස්මයට පැමිණි ස්ත්‍රීහුද

**27.** "ප්‍රබොධය ඇති කරන්නාවූ ඒ දිව්‍යප්සරාවන් අතුරෙන් මොවුහුද අන්‍යයෝද ශ්‍රෙෂ්ඨවෙත්, ඒ දෙවතාවියෝ මා වෙත කලින් කල පැමිණ කථා කරත්.

**28.** "දැන් නටමු. ගී කියමු දැන් ඔහු සතුටු කරමු. තව්තිසා වැස්සන්ගේ මහා වනයවූ රම්‍යවූ නිශ්ශොකවූ මේ නන්දන වනය නොකරන ලද පින් ඇත්වුන්ට නොව කරන ලද පින් ඇත්තවුන්ටමය.

**29.** "නොකරන ලද පින් ඇත්තවුන්ට මෙලොවද පරලොවද සැප නොලැබේ. කරනලද පින් ඇත්තවුන්ට මෙලොවද පරලොවද සැප ලැබේ.

**30.** "ඒ නඳුන් වනයෙහි දෙවියන් හා සහවාසය කැමති වන්නන් විසින් බොහෝ කුසල් කළ යුතුය. කරන ලද පින් ඇත්තෝ ස්වර්ගයෙහි භොගයන්ගෙන් යුක්තවූවාහු සතුටු වෙත්.

**31.** "තථාගතවරයෝ බොහෝ දෙනාට හිත පිණිස උපදිත්. උන්වහන්සේලා මනුෂ්‍යයන්ගේ දානය පිළිගැනීමට සුදුස්සෝය. පින්කෙත් වලට ආකරය දායකයෝ එහි සත්කාර කොට ස්වර්ගයෙහි සතුටු වෙත්."

**(ස්ත්‍රීන් සම්බන්ධ විමාන කථා 50 ක් කියා නිමවන ලදී.)**

---

## 5. මහාරථ වර්ගය.

**51. මණ්ඩූක විමාන කථාව:-** 1. "ඍද්ධියෙන් හා යසසින් දිලියෙමින් යහපත් වර්ණයෙන් සියලු දිශා බබුළුවමින් කවරෙක් මගේ පා වඳියිද?"

**2.** "මම පෙර ජලය ගොචර කොට ඇත්තේ දියෙහි මැඩියෙක් වීමි. ඔබගේ ධර්මය අසද්දී වස්සන් බලන්නෙක් මා මැරීය.

3. "මොහොතක් සිත පහදවා ලැබූ ඍද්ධියද යසසද බලන්න. මාගේ ආනුභාවයද, වර්ණයද, ආලොකයද බලන්න.

4. "ගෞතමන් වහන්ස, යම්කිසි කෙනෙක් බොහෝ කාලයක් ධර්මය ඇසුවාහු නම් යම් තැනකට ගොස් ශොක නොකරද්ද නොසෙල්වෙන ස්ථානයට පැමිණියාහුය."

**52. රේවතී විමාන කථාව:-** 1. "බොහෝ කාලයක් පිට පලාතක සිට සුවසේ පැමිණි පුරුෂයකු නෑයෝද, මිත්‍රයෝද, සහෝදරයෝද සතුටින් පිළිගනිත්ද,

2. "එසේම මෙලොවින් පරලොවට කළ පින් ඇති කෙනෙකු පැමිණි ප්‍රිය නෑයකු මෙන් පින් පිළිගනිත්,

3. (සෙස්ස ප්‍රේත වස්තුවේ රේවතී කථාවට සමානය.)

**53. ඡත්ත මානවක විමාන කථාව:-** 1. "මනුෂ්‍යයන් අතරෙහි යම් කෙනෙක් කියන්නවුන්ට ශ්‍රෙෂ්ඨද කරනලද වැඩ ඇති ශාක්‍ය මුනිවූ භාග්‍යවතුන් වහන්සේ බලයෙන් හා වීර්යයෙන් යුක්ත වූයේ පරතෙරට ගියේ වේද ඒ ඒ සුගතයන් වහන්සේ පිහිට කොට ගනුව.

2. "රාගයෙන් වෙන්වූ තෘෂ්ණා රහිත ශොක නැති, (ප්‍රත්‍යයන්) රැස් නොකරන ලද, ප්‍රිය භාවය කරන, මිහිරිවූ ප්‍රගුණවූ, යහපත් කොට බෙදන ලද යම් ලොකොත්තර ධර්මයක්වේද, මේ ධර්මය පිහිට කොට ගනුව,

3. "යම් තැනෙක්හි දෙනලද්ද මත් ඵලයයි කීවාහුද, පිරිසිදු පුරුෂ යුග සතරෙක්හිවූ ඔව්හු පුද්ගලයන් වශයෙන් අට දෙනෙක්වූ මේ සංඝයා පිහිට වශයෙන් ගනුව,

4. "අහසෙහි සූර්යයා එසේ නොබබළාද, සඳද නොබබළාද, පුසේ නැකත්තරුවද නොබබළාද යම්සේවූ, අසමාන මහත් ආලොකයවූ, තවුතිසා දෙව්ලොවින් පොළොවට පැමිණි නුඹ කවරෙක්ද?

5. "පිරිසිදුවූ නිර්මලවූ යහපත්වූ විමානය සූර්යයාගේ රැස් යටපත් කරයි. විසි යොදුනකට වඩා ආලොකය වේ. රාත්‍රියෙහිද දවාලක් මෙන් කරයි.

6. "බොහෝ පියුම්, විසිතුරු මහනෙල්, ආදී නොයෙක් අලංකාර මලින් ගැවසුණ, රජස් නැති පිරිසිදු රන් දැලින් ගැවසුණ අහසෙහි සූර්යයා සේ බබළයි.

7. "රතු කහ වස්ත්‍රවලින් යුක්තවූ අගිල් පුවඟු සඳුන් රාශිවලින් පිරුණු රන් ශරීරයක් වැනි සිවියෙන් තාරකාවන්ගෙන් පිරුණු අහස මෙනි.

8. "නොයෙක් වර්ණයෙන් යුත් ස්ත්‍රී පුරුෂයෝ මෙහි බොහෝ වෙත්. මෙහි මලින් අලංකාරවූ ආභරණ ඇත්තාහ. මල් වාතයෙන් මුදන ලදුව සුවඳ වහනය කරත්. ආලොක පතුරුවන රන් වස්ත්‍රය.

9. "කිනම් කෙලෙස් සංයමයක ඉන්ද්‍රිය දමනයක මේ විපාකයද, කිනම් කර්ම ඵලයකින් මෙහි උපන්නේද, තා විසින් මේ විමානය යම්සේ ලබන ලදද එහෙයින් දැන් විචාරණ ලද මට වචනයක් පාසා කියනු මැනව"

10. "ශාස්තෲන් වහන්සේ මේ මාර්ගයෙහි මාණවකයකු හමුවී අනුකම්පාවෙන් යමක් අනුශාසනා කළේද, ශ්‍රෙෂ්ඨ රත්නයවූ ඔබවහන්සේගේ ධර්මය අසා ඡත්තතෙම එය පිළිගන්නෙමැයි" කියේය.

11. "ශ්‍රෙෂ්ඨවූ උතුම් ජිනයන් වහන්සේ පිහිට කොට යම් ධර්මයද එසේම භික්ෂු සංඝයාද පිහිට කොට යමි. පළමුව, ස්වාමීනි, මම සරණ නොගිය කෙනෙක්මි. පසුව ඔබගේ වචනය එසේම කෙළෙමි.

12. "අපවිත්‍රවූ නානාප්‍රකාර ප්‍රාණඝාතයෙහි නොහැසිරෙව. ඥාණවන්තයෝ සතුන් කෙරෙහි අසංවරය වර්ණනා නොකළාහුය. ස්වාමීනි මම පළමුව වෙන්වී නොසිටියෙමි. පසුව, නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

13. "අනුන් විසින් රකින ලද නුදුන් දෙය ගතයුතු කොට නොසිතීය. ස්වාමීනි, මම පළමුව ඉන් වෙන් නොව සිටියෙමි. පසුව ඔබවහන්සේගේ වචනය එසේම පිළිපැද්දෙමි.

14. "අනුන් විසින් රක්නා ලද අනුන්ගේ භාර්යාවන් වෙත නොයන්නේය එසේයාම ආර්ය (උතුම්) නොවන්නකි. ස්වාමීනි පළමුව මම ඉන් වෙන් නොවී සිටියෙමි. පසුව නුඹවහන්සේගේ වචන එසේම කෙළෙමි.

15. "අන් පරිද්දෙකින් බොරු නොකියව. නුවණැත්තෝ බොරු කීම වර්ණනා නොකළ හුය. ස්වාමීනි මම පළමුව ඉන් වෙන් නොවී සිටියෙමි. පසුව ඔබවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

16. "යමකින් පුරුෂයාගේ සිහිය පහවේද, ඒ සියලු මත්වන දෙය දුරුකළ යුතුය. ස්වාමීනි, මම පළමුව ඉන් නොවැළැක්කෙමි. පසුව නුඹවහන්සේගේ වචනය එසේම කෙළෙමි.

17. "ඒ මම මෙහි පන්සිල් රැක තථාගතයන් වහන්සේගේ ධර්මයෙහි පිළිපැද සොරු යන මග හන්දියකට පැමිණියෙමි. වස්තුව නිසා ඔව්හු මා මැරූහ.

18. "පින මෙපමණක්ම සිහි කරමි. ඉන්පසු මාගේ අන් පිනක් නොපෙනේ. ඒ සුචරිත කර්මයෙන් මම කැමති දේ කැමැත්තේ තවුතිසා දෙව්ලොව උපන්නෙමි.

19. "ක්ෂණයක් මොහොතක්, සංවර වූවහුගේ ධර්මය අනුව පිළිපැදීමෙහි විපාකය බලව, යසසින් බලනු ලබන්නී දිලිසෙන්නා මෙනි. ලාමක කර්ම ඇති බොහෝදෙනා මට ප්‍රසංසා කරත්.

20. "දෙශනා ස්වල්පයකින් සුගතියට ගියේ වෙමි. සැපයටද පැමිණියේ වෙමි. යම් කෙනෙක් නිතර ධර්මය අසයිද ඔවුහු නිර්භය අමෘතය ස්පර්ශ කෙරේයයි හඟිමි.

21. "තථාගතයන් වහන්සේගේ ධර්මය පරිදි ස්වල්ප යහපතක් කරන ලද්දේද මහා විපාක ඇතිවේ. ඡත්‍ර තෙමේ කළ පින් ඇති බැවින් සූර්යයා මෙන් පෘථිවිය බබුළුවයි බලව.

**22.** "කුසල් නම් කුමක්ද, කුමක හැසිරෙමුද, මෙසේ ඇතැම් අය විසින් රැස්ව මන්ත්‍රණය කරත්. ඒ අපි නැවතද මිනිසත් බව ලැබූයේ පිළිපන්නාහු සිල් ඇත්තෝව වාසය කරමු.

**23.** "ශාස්තෲන් වහන්සේ බොහෝ උපකාරය. මට අනුකම්පා කරන්නෙකු වෙත කලින්ම මෙසේ මාගේ සිහිය පිහිටවීමි. ඒ මම සත්‍ය නම් ඇත්තහු කරා ගියෙමි. නැවතද අනුකම්පා කරනු මැනව. ධර්මය අසමි.

**24.** "යම් කෙනෙක් කාම රාගය දුරු කරත්ද, අනුශය සහිත භව රාගයද මොහයද අත්හැර ඔව්හු නැවත මවුගැබක විසීමට නොපැමිණෙත්. සිහිල්ව පිරිනිවන් පෑවාහුය.

**54. කක්කට විමාන කථාව:-** 1. "මේ විමානය උස්ය, පද්මරාග මැණික් කණු ඇත්තේය. පමණ දොළොස් යොදුන්ය. සියයක් පමණ මහත් කුළු ගෙවල්ය, වෛදූර්යමාණික්‍යමය කුලුණු ඇත. රුචි ඇතිරිලි අතුරණ ලද්දේය.

**2.** එව වසව, කව, බොව හා යහපත්වූ දිව්‍ය වීණා වාදනය කරත්ද, මෙහි දිව්‍ය රසයෝද පස්කම් ගුණයෝද ඇත්තාහ. ස්වර්ණයෙන් වසාගත් ස්ත්‍රීහුද නටත්.

**3-4-5.** (මේ ඡෙද 1 කථාවේ 2 3 4 ඡෙද මෙනි.)

**6.** "රනින් නිමියාවූ පා දහයක් ඇති දොරටුවේ සිටි කකුළුතෙම මා පෙර කළ කුශලය සිහි කරවන්නේය.

7-8 (මේ ඡෙද 1 කථාවේ 6 ඡෙදය හා 7 ඡෙදයේ (ii) මෙනි.)

**55. ද්වාරපාල විමාන කථාව:-** 1-2-3-4-5 (මේ ඡෙද හේ 54 කථාවේ 1, 2, 3, 4, 5 ඡෙද මෙනි.)

**6.** "මාගේ ආයුෂ දිව්‍ය වර්ෂ දහසකි. වචනයෙන් හා සිතින් පවත්වන ලද පුණ්‍ය කර්මය ඇත්තෙම් දිව්‍ය කාමයන්ගෙන් යුක්තව සිටිමි.

7-8 (මේ ඡෙද 1 කථාවේ 6 ඡෙදය හා 7 (ii) ඡෙදය මෙනි.)

**56. කරණීය විමාන කථාව:-** 1-2-3-4-5 (මේ ඡෙද 65 වෙනි කථාවේ 1, 2, 3, 4, 5 මෙනි.)

**6.** "ඒ දිව්‍ය පුත්‍රතෙමේ (මේ ඡේදය 1 කථාවේ 3 ඡේදය මෙනි.)

**7.** "යම් තැනෙක්හි දෙන ලද්ද, මහත් ඵලවේද, දන්නාවූ පණ්ඩිතයා විසින් මනාව පිළිපන් භික්ෂූන් කෙරෙහි පින් කටයුතුය.

**8.** "බුදුරජතෙම ඒකාන්තයෙන් මට අනුකම්පා පිණිස අරණ්‍යයේ සිට ගමට වැඩිසේක. එහි සිත පහදවාගෙන තව්තිසා දෙව්ලොව උපන්නෙමි.

**9, 10** ඡේද (1 කථාවේ 6 ඡේදය හා 7 (ii) මෙනි.)

**57. දෙවෙනි කරණීය විමාන කථාව:-** (7 වැනි සූත්‍රයේ සියලුම ඡේද 'බුදුරජාණන් වහන්සේ කෙරෙහි' වෙනුවට 'භික්ෂූන් කෙරෙහි කියාද, 'බුදුරජාණන් වහන්සේ' වෙනුවට 'මහණ තෙමේ' කියාද වෙනස් කර යොදාගත යුතුයි.)

**58. සූචි විමාන කථාව:-** 1-2-3-4-5 (මේ ඡේද 54 කථාවේ 1, 2, 3, 4, 5 ඡේද මෙනි.)

**6.** "යමක් දේද, එය නොවේ. අවශ්‍ය දෙය දෙන ලද්දේ එයම ශ්‍රේෂ්ඨය, ඉදිකටුවක් දෙන ලද්දේ ඉදිකටුවම ශ්‍රේෂ්ඨය.

7-8 (මේ ඡේද 1 කථාවේ 6, 7 මෙනි.)

**59. දෙවෙනි සූචි විමාන කථාව:- 1, 2, 3, 4, 5.** (මේ ඡේද 54 කථාවේ 1, 2, 3, 4, 5 මෙනි.)

**6.** "මම පූර්ව ජාතියෙහි මනුෂ්‍ය ලොකයෙහි මනුෂ්‍යයෙක්වූයේ අතිශයින් ප්‍රසන්නවූ අවුල් නොවූ, කෙලෙස් රජස් නැති භික්ෂුවක් දුටිමි. උන්වහන්සේට පැහැදුණේ ස්වකීය අත්වලින් හිදිකටුවක් දුනිමි.

**7.** (මේ ඡේදය 54 කථාවේ 7, 8 මෙනි.)

**60. පළමුවෙනි නාග විමාන කථාව:-** 1. "ඉතා සුදු කඳක් ඇති මහත්වූ දික්වූ දළ ඇති, ශක්තිමත් මහත් වේගයක් ඇති,

ඇතෙකු පිට නැඟී යහපත්කොට සරසනලද, ශ්‍රෙෂ්ඨ ඇතෙකු පිට නැඟී අහසින් මෙහි පැමිණියේය.

2. (මේ ඡෙදය 41 කථාවේ 2 3 ඡෙද මෙනි.)

3. (මේ ඡෙදය 1 කථාවේ 4 5 ඡෙද මෙනි.)

4. "වැටුණු මල් අටක් කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ චෛත්‍යයෙහි මගේ අතින් පූජා කෙළෙමි.

5 6 (මේ ඡෙදය 1 කථාවේ 6 7 ඡෙද මෙනි.)

**61. දෙවෙනි නාග විමාන කථාව:-** 1. "සියල්ලෙන් සුදුවූ උතුම් හස්තියෙකුවූ මහත් ඇතෙකු පිට නැඟී ස්ත්‍රී සමූහයා විසින් පෙරටු කරණ ලද්දේ මහා වනයෙහි කැරකෙයි. සියලු දිශාවන් දවහත් තරුව මෙන් බබුළුවයි.

2. (මේ ඡෙදය 1 කථාවේ 2 3 ඡෙද මෙනි.)

(ii) 'සතුටුවූ ඒ දිව්‍යපුත්‍ර තෙම වංගීස තෙරුන් වහන්සේ විචාරන ලද්දේ ප්‍රශ්න කරණ ලද්දේවේ. ප්‍රතිඵලය යම් කර්මයකද එය ප්‍රකාශ කළේය.

3. "මම මනුෂ්‍ය ලොකයෙහි නියම මනුෂ්‍යයෙක් වූයේ ඇස ඇත්තහුගේ උපාසකයෙක්වීමි. සතුන් මැරීමෙන් වෙන්වූයෙමි. ලොකයෙහි නුදුන්දේ දුරු කෙළෙමි.

4. "මද්‍යාපාන නොකළෙමි. බොරුද නොකියමි. ස්වකීය භාර්යාව සමග සතුටුවූවෙක් වීමි. පැහැදුණු සිතින් ආහාරද පානද සහිත සකස් කොට මහත් දානයක් දුනිමි.

5. (මේ ඡෙදය 54 කථාවේ 7 වෙනි ඡෙදය මෙනි.)

**62. තුන්වෙනි නාග විමාන කථාව:-** 1. එම්බා දිව්‍ය පුත්‍රය, සර්වාංග සුදුවූ ඇත් වාහනයක නැඟී (පංචාංගික) තූර්යවාදනයෙන්වූ ඝොෂා පවත්වමින් අහසෙහි බබළයි. තෙපි කවරෙක්ද?

2. "දෙවතාවෙක්ද, ගාන්ධර්වයෙක්ද නොහොත් පෙර දන් දුන් ශක්‍රයාද නොහඳුනන බැවින් විචාරමු. අපි ඔබ කෙසේ දකිමුද?"

3. "මම දෙවියෙක් නොවෙමි. ගාන්ධර්වයෙක් නොවෙමි. පුරින්දද නම් ශක්‍රයාද නොවෙමි. සුධර්මා නම් යම් දෙවිකෙනෙක් ඇද්ද? ඔවුන්ගෙන් එක්තරා කෙනෙක් වෙමි."

4. "ඇඳිලි දැඩිකොට සුධර්ම නම් දිව්‍යපුත්‍රයන් විචාරමි. මනුෂ්‍ය ලොකයෙහි කිනම් කර්මයක් කොට සුධර්මාවෙහි උපදීද?"

5. "උක් පැලක් වේවයි තණ පැලක් වේවයි පිළීකුටියක් වේවයි යමෙක් මේ තුනින් එකක්දී සුධර්මාවෙහි උපදින්නේය."

**63. චුල්ල රථ විමාන කථාව:-** 1. "මනාකොට සදා නගන ලද දුන්නක් ගෙන එක් කෙළවරක් බිම ඔබා අනෙක් කෙළවර එල්ලී සිටිනාවූ තෝ රජකුලයේ කුමාරයෙක්ද නොහොත් මේ වනයෙහි වසන වල් වැද්දෙක්ද?"

2. "ස්වාමීනි මම අස්සක රජුගේ වනයෙහි හැසිරෙන්නාවූ පුත්‍රයාය. ස්වාමීන් වහන්ස, මගේ නම නුඹ වහන්සේට කියමි. සුජාතයයි මා දැනගන්න.

3. "මම මෘගයන් සොයන්නේ මහාවනයට වැදුණෙමි. එම මෘගයා නොදැක්කෙමි. මම නුඹවහන්සේ දැක සිටියෙමි.

4. "මහා භාග්‍ය ඇත්ත, ඔබගේ පැමිණීම යහපත්ය. අයහපත් පැමිණීමක් නොවේ. මෙතැනින් දිය ගෙන ඔබේ පා සෝදාගන්න. සිහිල්වූ මේ ජලය පර්වත ගුහාවෙන් ගෙන එනලදී. රාජපුත්‍රය, "එතැනින් වී ඇතිරියෙහි හිඳිනු මැනව.

5. (ii) "මහාමුනීන් වහන්ස, නුඹගේ වචනය කණට මිහිරිය. යහපත්ය. කෙළතොළු නොවේ. අර්ථවත්ය. මනොඥය. අර්ථය සිතා කියන්නෙහිය.

6. "වනයෙහි වාසය කරන්නාවූ නුඹවහන්සේට කිනම් ඇල්මක්ද, ශ්‍රෙෂ්ඨ ඍෂිවරය, විචාරණලද්ද කියනු මැනව. නුඹවහන්සේගේ වචන මාර්ගය අසා තේරුම් ඇති ධර්ම පදයක හැසිරෙමි."

7. "කුමාරය, සියලු සත්වයන්ට හිංසා නොකිරීමද සොරකමින්ද ස්ත්‍රීසෙවනය කිරීමෙන්ද බොරුකීමෙන්ද රහමෙරින්ද වැලකීම අපට රිසි වන්නේය.

8. "දුශ්චරිතයෙන් වෙන්වීමද බොහෝ අසූ පිරූ තැන් ඇති බව (උගත්කම) ද, කළගුණ දන්නා බවද යන මේ උසස් ධර්මයෝ මෙලොවම ප්‍රශංසා කටයුතු වන්නාහ.

9. "රාජකුමාරය පස්වසකින් මෙපිට ඔබේ මරණය වේයයි දනුව තමා මුදන්න.

10. "ඒ මම කිනම් දෙශයකට ගොස් කිනම් කර්මාන්තයක් කිනම් බලපරාක්‍රමයක් කොට, කිනම් විද්‍යාවකින් අජරාමර (නොදිරන්නෙක් නොමැරෙන්නෙක්) වෙම්දැයි" විචාළේය.

11. "එම්බා රාජකුමාරය, මනුෂ්‍යතෙම යම්තැනකට ගොස් එකාන්තයෙන් අජරාමරවේද එබඳුවූ කර්මයක්, විද්‍යාවක් ධෛර්යක් නොපෙනේ.

12. "මහත් ධන ඇත්තාවූ මහත් වස්තු ඇත්තාවූ රටවල් ඇති රජවරු පවා බොහෝ ධනධාන්‍ය ඇත්තෝවුවද ඔවුහුද අජරාමර නොවූහ.

13. "සූරවූ වීරවූ බලපරාක්‍රමයෙන් මඩින්නාවූ සතුරන් ජයගන්නාවූ සදාකාලිකව මෙන් සිටි ප්‍රසිද්ධ අන්ධක වෙණ්හු පුත්‍රයෝ ඉඳින් තොප විසින් අසන ලද්දාහුද, ඔව්හුද මරණයට පැමිණියාහුය. නැසුනාහ.

14. "ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද චණ්ඩාලයෝද (අශුචි ශොධකයෝ)ද ජාතියෙන් මෙබඳු වූවාහුද අන්‍යයෝද ජරාමරණ දුරුකළාහු නොවෙත්.

15. "යම් කෙනෙක් බ්‍රහ්මයා විසින් සිතන ලද අංග සයකින් යුත්, මන්ත්‍ර පවත්වයිද විද්‍යාවෙන් යුත් මොවුහුද අන්‍යයෝද අජරාමර නොවූහ.

16. "සංවර ආත්මභාව ඇති තපස් කරනා සුලු ශාන්තවූ යම් ඍෂීහුවෙත්ද ඒ තාපසයෝ සුදුසු කාලයෙහි ශරීරය අත්හරිත්.

17. "කළයුතු වැඩකළ, ආශ්‍රවයන් ක්ෂය කළ, දියුණු කළ සිත ඇති රහත්හුවෙත්ද පින්පව් ක්ෂයවීමෙන් මේ ශරීරය බිඳදමත්."

18. "මහර්ෂිවූ ස්වාමීනි, ඔබවහන්සේ ධර්මයවූ පරිද්දෙන් මාගේ සිතට හෙලා වදාරණලද අර්ථවත් ගාථා යහපත් අභිප්‍රායන් අනුව සිතට නගාගතිමි. නුඹවහන්සේද මට සරණවන්න.

19. "ඔබ මා සරණ නොයව. මම යමකු සරණ ගියෙම්ද, මහාවීරවූ ඒ ශාක්‍යපුත්‍රයන්ම ඔබත් සරණ යව.

20. "නිදුකාණන් වහන්ස, නුඹවහන්සේගේ ශාස්තෘන් වහන්සේ කිනම් ජනපදයෙක්හි වෙසෙත්ද මමද අසමාන පුද්ගලයකු නැති, ජිනයන් වහන්සේ දක්නට යන්නෙමි.

21. "ඔක්කාක (ඉක්ෂ්වාකු) කුලයෙහි උපන් පුරුෂ ශ්‍රෙෂ්ඨවූ හෙතෙම පෙරදිග ඒ දනවුවෙහිදී පිරිනිවියේය.

22. "නිදුකාණන් වහන්ස, ඉදින් නුඹවහන්සේගේ ශාස්තෘවූ බුදුන් වහන්සේ වැඩ සිටින්නේ නම් ඇසුරු කරන්නට යොදුන් දහසක් නමුත් යන්නෙමි.

23. "නිදුකාණන් වහන්ස නුඹවහන්සේගේ ශාස්තෘන් වහන්සේ යම් දිනක පිරිනිවියේද, මම නිවණට පැමිණි මහාවීරයන් වහන්සේ සරණයමි.

24. බුදුරජාණන් වහන්සේද නිරුත්තරවූ ධර්මයද, මිනිස් දෙවිවූ බුදුන් වහන්සේගේ සංඝයාද මම සරණයමි.

25. "සතුන් මැරීමෙන් වහා වෙන්වෙමි. ලොකයෙහි නුදුන් දෙය දුරුකරමි. මද්‍යපාන නොකරමි. බොරුද නොකියමි. ස්වකීය භාර්යාව සමග ප්‍රීතිවෙමි.

26. "මහත් ප්‍රභා ඇත්තාවූ, දහසක් රැස් ඇත්තාවූ සූර්යයා මෙන් අහසෙහි අනුක්‍රමයෙන් යම්සේ දිශා බබුළුවයිද නුඹගේ මේ මහා රථය එබඳුය. හාත්පසින් යොදුන් සතක් දිගය.

27. "රන්පටින් හාත්පස වසනලදී. පපුව මුතුමැණික් වලින් අලංකාරය. රන්රිදී රේඛාවෝවෙත්. වෙරළු (නිල්) මිණියෙන් කළාක් මෙන් හොබිත්.

28. "මේ මුදුන වෙරළුමිණියෙන් නිර්මිතය. මේ වියගහ රත්මිණෙන් අලංකාර කරණලදී. සිත මෙන් ඉක්මන් ගමන් ඇති මේ අශ්වයෝද රනින් හා රිදීයෙන් යුක්තවූවාහු හොබිත්.

29. "රන්වන් රියක නැගුනු හෙතෙම දහසක් වාහන ඇති ශක්‍රයා මෙන් සිටි මම යසස් ඇති දක්ෂවූ ඔබ විචාරමි. මේ උදාරභාවය කෙසේ තොප විසින් ලබන ලද්දේද?"

30. "ස්වාමීනි, මම පෙර සුජාත නම් රාජපුත්‍රයෙක් වීමි. ඔබද මට අනුකම්පාවෙන් සංවරයෙහි පිහිටුවීය.

31. "මා මඳ ආයුෂ ඇත්තේයයි දැන ශාස්තෘන් වහන්සේට ශරීරය දෙවූයේය. සුජාතය, මෙය පුදව, එය ඔබට යහපත පිණිසවේ කියායි.

32. "යොදවනලද්දාවූ ඒ මම ගඳින් මලින් පුදා මනුෂ්‍ය දෙහය අත්හැර නඳුන් වනයෙහි උපන්නෙමි.

33. "රම්‍යවූ නොයෙක් පක්ෂි සමූහයා යුත් නඳුන් වනයෙහි දෙවඟනන් පෙරටු කරන ලද්දෙම් නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වසමි."

**63. මහාරථවිමාන කථාව:-** 1. "දහසක් යොදනලද අශ්වවාහනය හොබනේය. නොයෙක් අලංකාර ඇති මේ අශ්ව වාහනයට නැඟී දෙවියන්ට අධිපතිවූ වාසව නම් ශක්‍රයාමෙන් උද්‍යාන භූමිය හාත්පස ඇවිදී.

2. "ඔබගේ රියෙහි රත්රන්මයවූ දෙපස ලී දෙක උඩ පැත්තෙන්ද අංශයෙන්ද මනාව ගැළපුණේය. කණු සමූහය ශ්‍රෙෂ්ඨයන් විසින් නිමවන ලද්දේය. පසළොස්වක දවසෙහි චන්ද්‍රයාමෙන් බබළයි.

3. "රන්දැලින් ගැවසීගත්තාවූ මේ රථය බොහෝ නොයෙක් රත්නයන්ගෙන් වැඩියක් සතුට උපදවන ඝොෂා ඇත්තේය. ශොභනවූ ස්වර ඇත්තේය. චාමර ගත් අත් ඇත්තවුන් කරණකොට බබළයි.

4. "රථයාගේ රොද අතරෙහිවූ සිතින් නිපදවනලද මේ නාභීන්ගෙන්ද, සියක් රේඛාවලින් විසිතුරුවූ මේ නාභීන් ගෙන්ද සියගණින් රේඛාවලින් වෙළුණු විදුලියමෙන් බබළයි.

5. "මේ රථය නොයෙක් සිතුවමින් යුක්තය. බොහෝ නිම්වළලු ඇත්තාහ. දහසක් රැස්ඇත්තේය. ඒවායේ යහපත් ස්වභාවය ඇති නාදය වාදනය කරණ ලද්දේ පඤ්චාංගික තූර්ය මෙන් ඇසෙයි.

6. "හිසෙහි මැණික් සඳක් ඇති චිත්‍රය හැමකල්හි යහපත්ය. පැහැ විහිදෙන්නේය. රන් ඉරිවලින් ඉතා අලංකාරය වෙරළුමිණි ඉරිමෙන් ඉතා හොබනේය.

7. "මැණික් අබරණින් සරසනලද මේ අශ්වයෝ දිග ගෙලවල් ඇත්තාහ. යහපත්වේග ඇත්තාහ. මහත් උපමා ඇත්තාහ. මහත්බල ඇත්තාහ. මහත්වූ වේග ඇත්තාහ. නුඹගේ සිත දැන එසේම හැසිරෙන්නේය.

8. "සතරදෙන බැගින් ඇත්තාවූ එක්වූ අසුන්ට ශ්‍රෙෂ්ඨවූ මෘදුවූ උඩගුනොවූ සමව උසුලන්නාවූ මොව්හු ඔබගේ සිත දැන සමසේ පවතිත්.

9. "යහපත්කොට කරණලද පළඳනා කම්පාකරවමින් අහසෙහි දුවත්, පනිත්, වැටෙත්. ඔවුන්ගේ රම්‍යවූ නාදය පඤ්චාංගික තූර්යයන් මෙන් ඇසේ.

10. "රථවල ශබ්දද, පළඳනාවල ශබ්දද, කුරවල නාදයද, ගැටීමේ නාදයද, විසිතුරුවනයෙහි ගන්ධර්වයන්ගේ තූර්යයන් හා මිශ්‍රව යහපත් හඬක් ඇසෙයි.

11. "රථයෙහි සිටියාවූ මෘගයෙකුගේ මෙන් සිහින් ඇස් ගුළි ඇති, සිනා ඇති, ප්‍රියවචන ඇති, වෙරළුමිණි දැලින් වැසුණු හීන් සිවියක් ඇති, නිතර දෙවියන් සහිත දක්ෂ ගන්ධර්වයන් දෙවශ්‍රෙෂ්ඨයන් විසින් ඔබ පුදනුලබන්නීය.

12. "ඇලුම් කටයුතු රතුවස්ත්‍ර රන්වන් වස්ත්‍ර අඳින්නාවූ මහත්වූ ඇස් ඇති ආශා උපදවන ඇස් ඇති යහපත් කුලයෙහි උපන්නාවූ යහපත් ශරීර ඇති විෂ්මය පත්වූ ඇඳිලිබැඳ එලඹ සිටියාවූ ඔව්හු රථයෙහි සිටියාහුය.

13. "රන්වළලු දරන්නාවූ, හොඳට ඇන්දාවූ, මනා ඉඟටි ඇති ඌරු යුග්මයෙන් හා පයොධරයෙන් යුත් වටවූ ඇඟිලි

ඇති යහපත් මුවක් ඇති දැකීමට ප්‍රිය රථයෙහි සිටියාවූ ඇඳිලිබැඳ එළඹියාහුය.

14. "අනිකුත් යහපත් කොංඩා ඇති මිශ්‍ර කෙශකලාප ඇති සමව බෙදනලද ආලොකයන්ගෙන් යුක්තවූ ඔබගේ අදහස අනුව පවතින වෙන්ව නොයන්නාවූ රථයෙහි සිටි තරුණයෝ ඇඳිලිබැඳ එළඹ සිටියාහුය.

15. "මල්දම් පැළඳගත් පියුම් උපුල්වලින් වැසුණු අලංකාරවූ සඳුන් සුවඳින් සුවඳ ඇති ඔබගේ අදහස් අනුව පවතින වෙන්ව නොයන්නාවූ රථයෙහි සිටියාහු ඇඳිලිබැඳ එළඹ සිටියාහුය.

16. "මල්දම් පැළඳගත් ඔව්හු (15 ඡෙදය යෙදිය යුතුයි.)

17. "ඔබගේ බෙල්ලෙහිද අත්හිද පාදයන්හිද එසේම හිසෙහිද යම් පළඳනා කෙනෙක් ඇද්ද සර්වප්‍රකාරයෙන් දස දිශාවන් බබුළුවමින් සරත්කාලයෙහි සූර්යයා උදාවීමක් මෙන් වන්නේය.

18. "අත්හි මල්මාලාද පළඳනාද වාතවේගයෙන් කම්පාවූවාහු සියලු ඥාණවන්තයන් විසින් ඇසිය යුතුවූ යහපත්වූ පිරිසිදුවූ ශබ්දය පිටකරත්.

19. "උයන් බිමෙහිවූ රියද ඇත්තුද, ශබ්දවත් තූර්යද, පියුම්පත් වැනි මොලොක් අත් ඇති අප්සරාවන්ගේ වීණා නාදයද, දෙවෙන්ද්‍රය ඔබම සතුටු කරවත්.

20. "රම්‍ය ස්වභාව ඇති හෘදය කම්පාවන බොහෝ යහපත්වූ මේ වීණාවන් ගායනාකරන කල්හි ඉතා ආශ්චර්යවූ හික්මුණවූ කන්‍යාවෝ පියුම්වල කැරකෙති.

21. "යම් කලෙක්හි ගීද වැයීම්ද, නැටීම්ද එකට සමවෙත්ද, දෙපස ශ්‍රෙෂ්ඨ ස්ත්‍රීහුවූ අප්සරාවෝ සතුටු කරමින් මෙහි නටත්.

22. "අතිශයින් යහපත්වූ යහපත් ස්වභාවය ඇත්තාවූ මේ වීණාවලින් හෘදය කම්පා කිරීම පිණිස පුදනු ලබන තූර්ය සමූහයෙන් ප්‍රබොධ කරනු ලබන, ඒ වජ්‍රාවුධයා (ශක්‍රයා) මෙන්, හෙතෙම ප්‍රීතිවේ.

23. "ඔබ පෙර ජාතියෙහි මනුෂ්‍යයෙක්වූයේ තමන් කිනම් කර්මයක් කෙළේද ඔබ කිනම් උපොසථයක් විසීද කිනම් ධර්මචර්යාවක් රුචි කෙළෙහිද?"

24. "මෙය කරණ ලද ස්වල්ප කර්මයක විපාකයක් නොවේ. යම් හෙයකින් දිව්‍ය සමූහයා වහා සතුටු කරයිද, ඔබගේ ඍද්ධ්‍යානුභාවය මහත්ය. පෙර පුරුදු කරණ ලද පෙහෙවස් විසීමක ආනුභාවයකි.

25. "මේ ඔබගේ දානයක ඵලයද, නැතහොත් ශීලයක ඵලයද, නොහොත් වැඳීමක ඵලයද, විචාරන ලද මට එය කියනු මැනව.

26. (මේ ඡේදය 54 කථාවේ 5 ඡේදය යෙදිය යුතුයි.)

27-28. "දිනන ලද ඉඳුරන් ඇති ලාමක පුද්ගලයකු නොවන කාම රහිත මනුෂ්‍යයන්ට උතුම්වූ දෙවියන්ට දෙවිවූ, සිය ගණන් පින් ලකුණු ඇති නිවනේ දොර හරින ඝන රන් රුවක් වැනි කෙලෙස් නැමැති සැඩ වතුරු තරණය කළ ඒ බුද්ධ හස්තියා දුටිමි. ඔහු දැක වහා පිරිසිදු සිත් ඇත්තේ විය. යහපත් වචන නැමැති කොඩි ඇති ඔහු දැක,

29. "උන්වහන්සේ කෙරෙහි පිරිසිදුවූ ප්‍රණීතවූ, රසයෙන් යුක්තවූ ආහාර පානද, සිවුරුද, ආශා රහිත සිතින් මල් විසිරවූ ස්වකීය වාසස්ථානයෙහි පිහිටුවා පිදීමි.

30. "ආහාර පානයෙන්ද, සිවුරුවලින්ද, කැවිලි වලින්ද කෑයුතු දෙයින්ද, රස විඳියයුතු දෙයින්ද, ඒ දෙපා ඇත්තවුන්ට ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සතුටු කොට ඒ මේ දිව්‍ය සම්පත් වශයෙන් දිව්‍යපුරයෙහි ප්‍රීතිවෙමි.

31. "මේ උපායෙන් මේ අගුලු රහිත පිරිසිදුවූ ත්‍රිවිධ යාගය කොට මම මනුෂ්‍ය ශරීරය අත්හැර දෙව්ලොව ශක්‍රයාට බඳු උපමා ඇතිව සිත් අලවමි.

32. "මුනිවරය, ප්‍රණීතවූ ආයුෂයද, වර්ණයද, සැපයද, බලයද, කැමැත්තෝ, බොහෝ කොට සකස්කරණ ලද ආහාරද, පානයද, ආශා රහිත සිත් ඇත්තවුන්ට පිහිට වියයුතුය.

33. "මේ ලෝකයෙහි හෝ පරලෙව්හි හෝ බුදුරජාණන් වහන්සේට වඩා ශ්‍රෙෂ්ඨයෙක්වත්, සමානයෙක්වත්, නැත්තේය. මහත් ඵල බලාපොරොත්තුවන පින් කැමැත්තන්ට ආහුණෙයා පුද්ගලයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ පිදීමට සුදුසු වූයේය."

(පස් වැනි මහා රථ වර්ගය නිමි.)

---

## 6 පායාසි වර්ගය.

**65. පළමුවෙනි අගාරිය කථාව:-** 1. "තවුතිසා වැසි දෙවියන්ට උසස්වූ දීප්තිමත්ව බබළන්නවූ ශ්‍රෙෂ්ඨවූ චිත්‍රලතා වනය යම්සේද ඔබේ එබඳු මේ විමානය ආකාශයෙහි බබළමින් සිටින්නේය.

2. "මහත්වූ ආනුභාව සම්පන්නවූයේ දිව්‍ය ඍද්ධියට පැමිණියේ වෙහිය. මනුෂ්‍යව කිනම් කුශලයක් කොට මෙබඳු දිව්‍ය ඍද්ධියක් දිව්‍යානුභාවයක් ලබන ලද්දේද කිනම් කරුණකින් ඔබගේ වර්ණය සියලු දිශාවන්හි බබළයිද,

3. (මේ ඡෙදය 54 කථාවේ 5 දෙය මෙනි.)

4. "මමද භාර්යාවද මනුෂ්‍ය ලොකයෙහි පැන් ඇති ළිඳක් මෙන් ගෙයි විසීමු. පැහැදුණ සිතින් ආහාරද පානද සකස්කොට මහත් දානයක් දුනිමු.

5. (මේ ඡෙදය 54 කථාවේ 5 දෙය මෙනි.)

**66. දෙවෙනි අගාරිය විමාන කථාව:-** 1-5 (මේ ඡෙද 66 කථාවේ සියලුම ඡෙද මෙහි යොදාගත යුතුයි.)

**67. ඵලදායක විමාන කථාව:-** 1. (මේ ඡෙදය 57 කථාවේ 1 ඡෙදය මෙනි.)

2. (මේ ඡෙදය 57 කථාවේ 1 (i) ඡෙදය මෙනි.)

"මෙහි හික්මුණවූ යහපත් ස්වභාවය ඇති අටදෙනෙක් බැගින්වූ කොටස් අටක්වූ තව්තිසාවැසි මහත්වූ දිව්‍ය කන්‍යාවෝ නටත්, ගී කියත්, සතුටුවෙත්

3. 4. (මේ ඡේද 60 කථාවේ 3-4 ඡේද මෙනි.)

5. "පැදකුණු සිතින් යුක්තව ඍජුවූවන් කෙරෙහි දෙන තැනැත්තේ ඵලදෙන්නේද මහත්ඵල ලබයි. හෙතෙමේ තව්තිසා දෙව්ලොව ගියේ සතුටුවෙයි. මහත්වූ පුණ්‍යඵලය අනුභව කෙරේ.

6. "එසේ මම මහාමුනීන්වහන්සේට ගෙඩි සතරෙක් පිදීමි.

7. "එසේ හෙයින් දිව්‍යසැප පතන්නාවූද මනුෂ්‍යවූ සෞභාග්‍යය පතන්නාවූද සැප කැමති මනුෂ්‍යයා විසින් ගෙඩි පිදීමට සුදුසුමය.

8. (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි.)

**උපස්සයදායක විමාන කථාව:-** 1. පහවූ වලාකුල් ඇති අහසෙහි චන්ද්‍රයා යම්සේ බැබළීමටයයිද, එසේම ඔබගේ මේ විමානය අහසෙහි බබළමින් තිබේ.

2. (මේ ඡේදය 60 කථාවේ 3, 4 ඡේද මෙනි)

3-4 (මේ ඡේද 65 කථාවේ 4-5 ඡේද 'පැන් ඇති ළිඳක් මෙන්' යන තැනට 'රහත් නමකට ආවාසයක් දුනිමි.' කියා වෙනස් කර යොදාගත යුතුයි.)

**දෙවෙනි උපස්සයදායක කථාව:-** 1. "පහවූ වලාකුළු ඇති අහසෙහි සූර්යයා (මෙහි 1, 4 ඡේද 68 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි.)

**70. භික්ඛ දායක විමාන කථාව:-** 1-2-3 (මේ ඡේද 69 කථාවේ 1, 2, 3 ඡේද 'සොළොස් යොදුනක්' වෙනුවට 'දොළොස් යොදුනක්' කියා වෙනස්කර යොදාගත යුතුයි.)

4. "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක්වූයේ තැතිගත්තාවූ ක්ලාන්තවූ භික්ෂුවක් දැක එක දවසක භික්ෂාවක් පිළියෙළ කෙළෙමි. අනුභවයට පිළියෙළ කරගත් ආහාර පිළිගැන්වීමි.

5. (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි.)

**71. යවපාලක විමාන කථාව:-** 1-2-3-4 (මේ ඡේද 67 කථාව් 1, 2, 3, 4 ඡේද මෙනි.)

**5.** "මම මනුෂ්‍යයන් අතරෙහි නියම මනුෂ්‍යයෙක් වූයේ යව කෙතක් රකින්නෙක් වීමි. අතිශයින් පැහැදුන ඉඳුරන් ඇති කෙළෙස් රහිත භික්ෂුවක් දුටිමි.

**6.** "උන්වහන්සේට පැහැදුණේ ස්වකීය අත්වලින් මගේ ආහාර කොටසින් භාගයක් පිදීමි. පිට්ටුවක් පුදා නඳුන් වනයෙහි සතුටුවෙමි.

7. (මේ ඡේදය 54 කථාවේ 7-8 ඡේද මෙනි.)

**72. කුණ්ඩලීවිමාන කථාව:-** 1. "අලංකාරවූ මාලා දරන්නාවූ පත්කොට හැඳපැළඳ කුණ්ඩලාභරණ ඇතිව කපනලද දැලි රැවුල් ඇතිව, මුතු සහිත හස්තාභරණ ඇතිව යසසින් යුක්තව දිව්‍යවිමානයෙහි චන්ද්‍රයා මෙන් සිටින්නෙහිය.

2-3-4 (මේ ඡේද 67 කථාවේ 2, 3, 4 ඡේද මෙනි)

5. (මේ ඡේදය 66 කථාවේ 3 ඡේදය මෙනි.)

**6.** "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක්වූයේ විද්‍යාවන්ගෙන් හා චරණයන්ගෙන් යුක්තවූ බොහෝ උගත් තෘෂ්ණාව ක්ෂයකිරීමට පැමිණි පසැස් ඇත්තාවූ සිල්වත් ශ්‍රමණයන් දැක පැහැදුණ සිතින් ආහාරපානද සකස්කොට මහත් දානයක් දුනිමි.

7. (මේ ඡේදය 68 කථාවේ 7 ඡේදය මෙනි)

**72. දෙවෙනි කුණ්ඩලීවිමාන කථාව:-** 1-2-3-4 (මේ ඡේද 72 කථාවේ 1, 2, 3, 4 ඡේද මෙනි)

**5.** "මම මනුෂ්‍යයන් අතරෙහි නියම මනුෂ්‍යයෙක් වූයේ යහපත් ස්වභාව ඇති විද්‍යාවන්ගෙන් හා චරණයන්ගෙන් යුත් යසස් ඇත්තාවූ බොහෝ උගත් සිල්වත්වූ, සන්සුන් ඉඳුරන් ඇති ශ්‍රමණයන් දැක පැහැදුන සිතින් ආහාරද පාන වර්ගද සකස්කොට මහත් දානයක් දුනිමි.

**6.** (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි)

**74. උත්තරවිමාන කථාව:-** 1. "සක්දෙව් රජහුගේ සුධර්මා නම් යම් දිව්‍ය සභාවක් ඇද්ද, දිව්‍ය සමූහයා සමගිව යම් තැනක සිටීද, ඔබගේ එබඳුවූ මේ විමානය අහසෙහි බබළමින් සිටියි.

2-3 (මේ ඡේද 66 කථාවේ 2-3 ඡේද මෙනි) මහමුගලන් වෙනුවට මහා කාශ්‍යප' කියා වෙනස් කර යොදාගත යුතුයි.

4. "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක්වූයේ පායාසි රාජන්‍යයාගේ මෙහෙකරුවෙක් වීමි. ධනය ලැබ බෙදූයෙමි. මාගේ සිල්වත්තු ප්‍රියද වූවාහුය. පැහැදුණු සිතින් ආහාරද පානද සකස් කොට මහත් දානයක් දුනුමි.

**5 (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි)**

**(හයවෙනි පායාසි වර්ගය නිමි.)**

---

## 7 සුනික්ඛිත්ත වර්ගය

**75. චිත්‍රලතා විමාන කථාව:-** 1. "තවුතිසා වැස්සන්ගේ ශ්‍රේෂ්ඨ උයනවූ චිත්‍රලතා වනය යම්සේ බබළයිද, එබඳුවූ නුඹගේ මේ විමානය අහසෙහි බබළමින් තිබේ.

2. (මේ ඡේදය 65 කථාවේ 2 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය 65 කථාවේ 3 ඡේදය මෙනි.)

4. "මම මනුෂ්‍ය ලෝකයෙහි මනුෂ්‍යයෙක් වූයේ දිළිඳුවූ පිළිසරණක් නැත්තාවූ දුප්පත් කම්කරුවෙක්වීමි. වයෝවෘද්ධවූ මවුපියන් පොෂ්‍ය කෙළෙමි. සිල්වත්තු මට ප්‍රිය වූවාහුය, ආහාරද, පානද පැහැදුනු සිතින් සකස්කොට මහත් දානයක් දුනිමි.

5. (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි)

**76. නන්දන විමාන කථාව:-** (මේ කථාවේ සියලු ඡේද 75 කථාවේ සියළු ඡේද මෙනි. නන්දන වනය යන පදය පමණක් වෙනස්කර යොදාගත යුතුයි.)

**77. මණිථූන විමාන කථාව**:- 1. (මේ ඡේදය 67 කථාවේ 1 ඡේදය මෙනි. 'සොළොස්' යන්න වෙනුවට 'දොළොස්' කියා යෙදිය යුතුයි.)

2. "එහි සිටින්නෙහිය. පානය කරන්නෙහිය. කන්නෙහිය යහපත්වූ දිව්‍ය වීණාවාදනය කරත්. මෙහි දිව්‍ය පඤ්චකාම ගුණයෝ ඇත්තාහ. රන්වන් ස්ත්‍රීහුද නටත්.

3-4-5-6. (මේ ඡේද 54 කථාවේ 3-4-5-6 ඡේද මෙනි.)

7. "මම මනුෂ්‍යලෝකයෙහි මනුෂ්‍යයෙක් වූයේ කැළෑ පාරක සක්මනක් තැනුවෙමි. ආරාමය හා වෘක්ෂ රෝපණය කෙළෙමි. මට ශීලවන්තයෝ ප්‍රියවූහ. ආහාරපානද සකස් කොට පැහැදුන සිතින් මහත් දානයක් දුනිමි.

8. (මේ ඡේදය 54 කථාවේ 7 ඡේදය මෙනි.)

**සුවර්ණ විමාණ කථාව**:- 1. "ස්වර්ණ පර්වතයෙක්හි සර්වප්‍රකාරයෙන් පැහැ විහිදෙන රන් දැලින් වැසුණු කිකිණි දැල් ඇති

2. "වෙරළු මිණියෙන් කරවනලද අටැස්කණු ඇත්තාහ. එක් එක් අංශයක සත්රුවනින් නිර්මිතය.

3. "වෙරළුමිණි, රන්වන් පළිගු, රිදී මැසිරිගල් ලොහිතංක සියළු රත්නයෙන් යුක්තය.

4. "භූමිය විසිතුරුය, මනහරය එහි රජස් නොනැගේ. පරාළ දරා සිටි කර්ණිකාව සත්රුවණින් නිමියේය.

5. "සතරදිග සත් රුවනින් නිමියාවූ තරප්පු සතරකින් හා නානාවිධ රත්නයෙන් නිර්මිතවූ නොයෙක් කාමරවලින් යුත් මේ විමානය සූර්යයා මෙන් බබළයි.

6. "එහි සතර වේදිකාවෝ කොටස් වශයෙන් බෙදනලදී. සතර දිශාව හාත්පස බැබළෙමින් ආලෝක කරත්.

7. "උතුම්වූ ඒ දිව්‍ය විමානයෙහි මහත් ප්‍රභා ඇති දිව්‍ය පුත්‍රතෙම සූර්යයා උදාවෙන්නාක් මෙන් බබළයි.

8. "නුඹගේ මේ විපාකය දානයකගේ ඵලයද නොහොත් ශීලයක ඵලයද නැවත වැඳීමක ඵලයක්ද, විචාරණලද්දාවූ මට කියනු මැනව.

9. "මේ අන්ධකවින්ද රට සූර්යවංශයෙහිවූ බුදුරජාණන් වහන්සේට පැහැදී මගේ අත්වලින් විහාරයක් කරවූයෙමි.

10. එහි සුවඳද මල්මාලාද ඉතා වටිනා විලවුන්ද යොදා සරසා පැහැදුන සිතින් ශාස්තෲන් වහන්සේට විහාරය දුනිමි.

11. "ඒ කරණකොටගෙන මේ විමානය මා විසින් ලබන ලදී. නඳුන්වනය වසඟයෙහි පවත්වමි.

12. "නොයෙක් පක්ෂි සමූහයාගෙන් යුක්තවූ යහපත්වූ (ii) නඳුන් වනයෙහි දිව්‍යාංගනාවන්ගෙන් යුක්තව නෘත්‍ය ගීතවලින් ඇලෙමි."

**අම්බවිමාන කථාවෘ**- 1. (මේ ඡේදය 70 කථාවේ 1 ඡේදය මෙනි.)

2. (ඡේදය 77 කථාවේ 2 ඡේදය මෙනි)

3. (ඡේදය 54 කථාවේ 3-4-5 ඡේද මෙනි)

4. "ග්‍රීෂ්මකාලයෙහි අවසාන මාසයෙහි සූර්යයා බබළන කල්හි අනුන්ගේ බැලයෙක්වූ පුරුෂතෙම අඹවනයට පැන් ඉසිමින් සිටියි.

5. "ඉක්බිති සැරියුත්යයි ප්‍රසිද්ධ භික්ෂුතෙම එතැනට ආයේය. උන්වහන්සේ කයින් ක්ලාන්තව සිටියේය. සිතින් ක්ලාන්තව නොසිටියේය.

6. "අඹගස්වලට පැන් වත්කරන්නාවූ මම එන්නාවූ උන්වහන්සේ දැක ස්වාමීනි, යමක් මට බොහෝ කල් හිත සුව පිණිස වන්නේද නුඹවහන්සේ නාවන්නෙමි නම් යෙහෙකැයි" කීයේය."

7. "මට අනුකම්පා පිණිස උන්වහන්සේගේ පාත්‍ර සිවුරු බහා තැබූසේක. එක් සිවුරකින් යුතුව වෘක්ෂයක් මුල සෙවනෙහි වැඩසිටි සේක.

8. "පැහැදුණ සිත් ඇති මනුෂ්‍යතෙම පිරිසිදු ජලයෙන් ගසක් යට සෙවනෙහි එක් සිවුරකින් සිටි උන්වහන්සේ නැවීය.

9. "අඹගස්වලටද පැන් ඉසිනලදී. භික්ෂුවද නහවනලදී. මා විසින්ද බොහෝවූ පින් රැස්කරණලදී. මෙසේ හෙතෙම තමාගේ මුළු සිරුර ප්‍රීතියෙන් පතුරුවයි.

10. "ඒ ජාතියෙහි මෙපමණම පිණක් කෙළෙමි. මනුෂ්‍ය ශරීරය අතහැර නඳුන් වනයෙහි උපන්නෙමි.

11. (මේ ඡෙදය 78 කථාවේ 11 ඡෙදයේ (ii) ඡෙදය මෙනි.)

**ගෝපාල විමාන කථාව:-** 1. "ශ්‍රමණතෙමේ බොහෝ කල් පවත්නා උස්වූ විමානයක මුතු පැළඳී වළලු ඇති යසස් ඇත්තාවූ දිව්‍ය විමානයෙහි චන්ද්‍රයා වැනිවූ දිව්‍ය පුත්‍රයා දැක මෙසේ විචාළේය,

2. "අලංකාරවූ මල්මාලා බර ඇත්තාවූ යහපත්ව හැඳ පැළඳි යහපත් කුණ්ඩලාභරණ ඇති, කපන ලද හිසකෙස් හා රැවුල් ඇති, මුතු පැළඳි වළලු ඇති, යසස් ඇති දිව්‍යවිමානයෙහි චන්ද්‍රයා වැනිය.

3, 4, 5. (මේ ඡෙද 67 කථාවේ 3, 4, 5 ඡෙද මෙනි.)

6. "මම මනුෂ්‍යයන් අතරෙහි මනුෂ්‍යයෙක් වූයේ අනුන්ගේ දෙනුන් එක්කොට රැක්කෙමි. මා සමීපයට ශ්‍රමණනමක් පැමිණියේය. ගවයෝද මෑවැල් කෑමට ගියෝය.

7. "ස්වාමීනි, මම ඒ වේලාවට වැඩ දෙකක් කටයුතුවිය. මෑ කෙත කෑම වැළැක්වීමත් දන්දීමත් යන දෙකයි. ඊටපසු නුවණින් සිහිය ලැබ ස්වාමීනි, 'දන් දෙමියි' රෙදි කැබැල්ල පසෙක තැබීමි.

8. "පෙර මේතෙමේ යමෙකුගේ ධනය අනුභව කරයිද ඒ මම යව කෙතට වහා ගියෙමි. ඉක්බිති මහත් විෂ ඇත්තාවූ කළු නයෙක් ඉක්මනට යන මගේ පා දෂ්ට කෙළේය.

9. "මම වෙදනාවට පත්වූයේ දුකින් පීඩිතවූයේ වෙමි. භික්ෂූන් වහන්සේ ඒ රෙදිකඩ වහා ඉවත්කර මට අනුකම්පාවෙන් පිට්ටුව පිළිගත්තේය. එයින් චුතවූයේ කළුරිය කෙළෙමි.

10. "මා විසින් ඒ කුශල කර්මයම කරණලදී. මා විසින් සැප විපාකවූ කර්මයක් අනුභව කරමි. ස්වාමීනි, නුඹවහන්සේ විසින් වහා අනුකම්පා කරනලදී. කළගුණ දැනීම නිසා ඔබවහන්සේට වඳිමි.

11. "මේ ලෝකයෙහි හෝ පරලෙව්හි හෝ නුඹවහන්සේ සමාන අනුකම්පා කරන්නෙක් නැත. ස්වාමීනි, නුඹවහන්සේ නිතර කෙළෙහිගුණ දන්නා බැවින් වඳිමි."

81. **කන්ථක විමාන කථාව**:- 1. "පූර්ව පක්ෂයෙහි නැකැත් තරු පිරිවරකොට ඇති චන්ද්‍රයා යම්සේද, තාරකාවන්ට අධිපති චන්ද්‍රයා හාත්පස හැසිරෙද්ද?

2. "මේ දිව්‍ය විමානය එබඳුය. අහසෙහිද රැස් ඇති සූර්යයා පහළවන්නාක් මෙනි.

3. (මේ ඡේදය 78 කථාවේ 3 ඡේදය මෙනි.)

4. "වෙරළු මිණි අතුරනලද භූමිය විචිත්‍රය, මනරම්ය, කළුගෙවල් ශුභය, රම්‍යය, තොපට ප්‍රාසාදයක් මැවුණේය.

5. "මත්ස්‍යයන්ගෙන් ගැවසීගත්තාවූ රන්වන් වැලි අතුරනලද පිරිසිදු ජලය ඇති පැහැදුණු පොකුණ රම්‍යය.

6. (මේ ඡේදය 43 කථාවේ 12 ඡේදය මෙනි.)

7. "ඒ පොකුණෙහි දෙපැත්තේ වනලැහැබ් මැවුනේය. ඔවුහු මල්ගස් වලින්ද ඵලදරණ වෘක්ෂයන් විසින්ද යුක්තය.

8. "මෘදුවූ රෙදි අතුරනලද රන්වන් පා ඇති ආසනයෙහි හුන්නාවූ දිව්‍යරාජයා මෙන් අප්සරාවෝ පැමිණ සිටිත්.

9. "සියලු ආභරණයෙන් ගැවසීගත්තාවූ නොයෙක් මල්දම් වලින් යුක්තවූ මහත් ඍද්ධි ඇත්තාවූ ඔහු ඇලුම් කරවත්. වසවර්ති දිව්‍යරාජයාසේ සතුටුවන්නෙහිය.

10. "බෙරයක් මිහිගුබෙර වීණා පණාබෙරවලින් මනාකොට වාදනය කරනලද නෘත්‍යගීතයෙහි සිත් ඇලවීමෙන් යුක්ත තැනැත්තේ ඇලෙයි.

11. "තොපගේ නානාප්‍රකාර දිව්‍යරූපයද, දිව්‍ය ශබ්දද, නොහොත් රසද, ගන්ධද, යහපත් ස්පර්ශයද අදහස් කරනලදී.

12. "යහපත්වූ මේ විමානයෙහි මහත් ආලෝක ඇති දිව්‍යපුත්‍රතෙම උදාවෙන සූර්යයා මෙන් බබළයි.

13, 14 (මේ ඡේද 64 කථාවේ 25-26 ඡේද මෙනි)

15. "මම ශාක්‍යයන්ගේ ශ්‍රෙෂ්ඨපුරය වන කිඹුල්වත්නුවර සුද්ධොදන රජුගේ පුත්‍රයා සමග උපන් කන්ථක නමි.

16. "යම්කලෙක හෙතෙම අර්ධ රාත්‍රියෙහි බුදුවීම පිණිස ගිහිගෙන් නික්මුණේද හෙතෙම මට මෘදු අත්වල තඹපාට ඇති නිය පඳුරින්

17. "කලවයට තට්ටුකොට 'මම උතුම් බුදුබවට පැමිණ ලොකයා එතර කරවන්නෙමි, යහළුව, උසුළවයි' කීයේය.

18. "ඒ වචනය අසන්නාවූ මට මාගේ ප්‍රීතිය මහත්විය. එදා මම සතුටු සිත් ඇත්තේ යහපත් සිත් ඇත්තේ අභිෂෙක ලදිමි.

19. "මහත් යසස් ඇත්තාවූ ශාක්‍යපුත්‍රයා පිට නැගුණේ යයි දැන සතුටු සිත් ඇත්තේ ප්‍රීතිවූයේ පුරුෂොත්තමයා උසුලාගෙන ගියෙමි.

20. "හිරු නැගි කල අන් රටකට ගොස් හෙතෙම මා ද ඡන්නයාද අත්හැර අපෙක්ෂා රහිතව පහවූයේය.

21. "උන්වහන්සේගේ තඹවන් නිය ඇති පා දිවෙන් ලෙවීමි. මහාවීරයන් වහන්සේ යන කල්හි අඬමින් බැලූයෙමි.

22. "ශ්‍රීමත්වූ ශාක්‍යපුත්‍රයන් වහන්සේගේ නොදැකීමෙන් බරලෙඩක් වැළඳුණේය. මාගේ මරණය ඉක්මන්විය.

23. "ඒ ආනුභාවයෙන් මේ විමනෙහි වසමි. දෙව්ලොව දිව්‍යමය සියලු කාමසම්පත් වලින් යුක්තවෙමි.

24. "බුදුවීමේ හඬ අසා මට යම් ප්‍රීතියක් වූයේද, ඒ කුශල මූලයෙන්ම කෙලෙස් දුරුකිරීම ස්පර්ශ කරමි.

25. "ස්වාමීනි, ඉදින් ශාස්තෘවූ බුදුන් සමීපයට යන්නෙහි නම් උන්වහන්සේ මගේ වචනයෙන්ද හිසින් වඳිනු මැනව."

26. "සමාන පුද්ගලයෙකු නැතිවූ ජිනයන් වහන්සේ දැක්මට මමත් යන්නෙමි. කම්පා නොවන්නාවූ ලොක ශ්‍රෙෂ්ඨයන් වහන්සේලාගේ දර්ශනය දුර්ලභවේ.

27. කළගුණ දත්, උපකාර දන්නාවූ, හෙතෙම ශාස්තෲන් වහන්සේ වෙත පැමිණියේය. ඇස් ඇති ශාස්තෲන් වහන්සේගේ වචනය අසා නුවණැස පිරිසිදු කෙළේය.

28. දෘෂ්ටි සමූහයද සැකයද ව්‍රතයද පිරිසිදු කොට ශාස්තෲන් වහන්සේගේ පා වැඳ එහිම අන්තර්ධානවූයේය.

**82. අනෙකවණ්ණවිමාන කථාව:-** 1. "නොයෙක් වර්ණයෙන් යුත් දාහය හා ශොක නසන්නාවූ නොයෙක් විසිතුරු ඇති විමනකට නැඟී දිව්‍යාංගනාවන් පිරිවරන ලද්දේ සුනිර්මිත දිව්‍යපුත්‍රයා මෙන් ප්‍රීතිවෙයි.

2. "කීර්තියෙන්ද, පිනෙන්ද, ඍද්ධියෙන්ද සමවූවෙක් නැත. උසස් කෙනෙක් කොයින්ද,

3. "සියලු දෙවියෝද, තවුතිසා වැසි දිව්‍ය සමූහයාද රැස්වී චන්ද්‍රයාට මෙන් ඔබට වඳිත්, ඔබගේ මේ දිව්‍යාංගනාවෝ හාත්පසින් නටත්, ගී කියත්, ප්‍රමොදකරවත්.

4-5 (මේ ඡෙද 80 කථාවේ 4. 5 ඡෙද මෙනි.)

6. "පින්වතුන් වහන්ස මම පෙර සුමෙධ නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වීමි. අවබොධ නොකළ පෘථග්ජනයෙක් වීමි. ඒ මම සත් අවුරුද්දක් පැවිදිවී සිටියෙමි.

7. "ඒ මම තාදීවූ පිරිනිවියාවූ සතර ඔඝ තරණය කළාවූ ශාස්තෘවූ සුමෙධ බුදුරජාණන් වහන්සේගේ රියනක් උස රන් දැලකින් වැසුණු ථූපය වැඳ සිත පහදවා ගතිමි.

8. "දානයක් නුදුන්නෙමි. දෙන්ට දෙයක් නැතිවිය. අනුන් සමාදන් නොකරවීමි. පිදිය යුතු ධාතුවට පුදවි. මෙසේ වනාහි මෙයින් මතු දිව්‍ය ලොකයට යන්නහුය.

**9.** "මා විසින් ඒ කුශල කර්මය කරන ලදී. මා විසින් දිව්‍ය සැපද අනුභව කරමි. තව්තිසා වැසි දිව්‍ය සමූහයා මධ්‍යයෙහි සතුටු වෙමි. ඒ පිනේ ක්ෂය වීමක් නොපෙනේ.

**83. මට්ට කුණ්ඩලී විමාන කථාව:-** 1. "අබරණින් සැරසුනාවූ මට්ටම් කරණලද කුණ්ඩලාභරණ ඇති මාලාවක් දරන්නාවූ රත් සඳුන්වලින් තැවරුණු අවයව ඇති තෝ මේ වන මැද හිස අත් බැඳගෙන හඬන්නෙහිය. කිම තෝ දුකට පැමිණියේ වෙහිද, කවර හේතුවකින් දුඃඛිත වූයෙහිද?"

**2.** "මට රනින් කළ පැහැ විහිදෙන කරත්තයක් තිබේ. ඊට රෝද දෙකක් නැත. ඒ දුකින් ජීවිතය හරින්නෙමි."

**3.** "මාණවකය, මට කියව. මම නුඹට රණින් හෝ රිදීයෙන් හෝ මැණිකකින් හෝ රතු කැටයෙන් හෝ කරණ ලද රෝද දෙකක් සොයා දෙමි."

**4.** "සඳ හිරු දෙදෙනා මේ අහසෙහි පෙනෙත්. මාගේ රනින් කළ රථය ඒ රෝද දෙක කරණ කොටගෙන හොබනේ වේයයි" හෙතෙම බමුණාට කීයේය.

**5.** "මාණවකය, සඳ හිරු දෙදෙන පතන්නාවූ තෝ බාලයෙකි. නොපැතිය යුතු දෙයක් පතන්නෙහිය. තෝ සඳ හිරු දෙදෙනා නොලද්දාහු නම් මැරෙන්නේයයි, සිතමි."

**6.** "මේ සඳ හිරු දෙදෙනා කෙරෙහි යාම් ඊම් හා පැහැ සටහන්ද වීථි ආදියද පෙනේ. කළුරිය කළ තැනැත්තේ වනාහි නොපෙනෙයි. හඬන්නාවූ අප දෙදෙනා අතුරෙන් කවරෙක් මෝඩද?"

**7.** "මාණවකය, තෝ සැබවක්ම කියන්නෙහිය. මෙහි අඬන්නාවූ අප දෙදෙනා අතුරෙන් ඉතා මෝඩවූයේ මා මය. චන්ද්‍රයා ඉල්වා අඬන බාලයකු මෙන් පරලොව ගිය කෙනෙකු පතමින් අඬන්නේ වෙමි.

**8-9-10.** "මාණවකය, ශොකයෙන් අඬන්නාවූ මාගේ පුත්‍ර ශොකය දුරුකළාවූ නුඹ ගිතෙලින් ඉසින ලද ගින්නක් මෙන්

පුත්‍ර ශොකාග්නියෙන් ඇවිල ගත්තාවූ මා හට දිය වත්කරන්නාක් මෙන් ශොකාග්නියෙන් හටගත් මාගේ සියලු විඩාව නිවූයේය.

11. "මාගේ හෘදයෙහිවූ ශොක නමැති හුල උදුරන ලද්දේය. උදුරා දමනලද ශොක නමැති හුල් ඇත්තාවූ ඒ මම නුඹගේ බස් අසා සිහිල්වූයේ වෙමි. නිවියේ වෙමි, මින්පසු ශොක නොකරමි, නොහඬමි."

12. "එම්බා තෝ කවරෙක්ද? දෙවියෙක් හෝ ගාන්ධර්වයෙක් වෙහිද? පුරින්දද නම් ශක්‍රයා හෝ වෙහිද, කවරෙකුගේ හෝ පුත්‍රයෙක්ද අපි කෙසේ දැනගනිමුදැයි" ඇසීය.

13. "බ්‍රාහ්මණය, ඔබ සිය පුතු සොහොනෙහි දවා යම් පුතෙකු නිසා කඳුළු වගුරුවමින් හඬන්නෙහි නම් ඒ නුඹගේ පුත්‍රවූ මම කුශල කර්මයක් කොට තව්තිසා වැසි දෙවියන් හා වාසයට පැමිණියේ වෙමි."

14. "සිය ගෙයිදී දෙන්නාවූ ස්වල්පවූ හෝ මහත්වූ හෝ දනක්ද පෙහෙවස් කිරීමක් හෝ එබඳු අන්කිසි කුල කර්මයක් මම නුදුටුයෙමි. කවර කර්මයකින් නුඹ දෙව්ලොව ගියේදැයි" ඇසීය.

15. "පින්වත් බමුණ, මම ස්වකීය ගෘහයෙහි හටගත් ආබාධ ඇත්තේ එහෙයින්ම දුකට පැමිණියේ දැඩි ගිලන් බැව් ඇතිව දුඃඛ වේදනාවෙන් පීඩිතවූයේ වීමි. එසේවූ මම චතුස්සත්‍යාවබොධ කළ හෙයින් බුද්ධ නම්වූ පහවූ රාගාදී කෙලෙස් ධූලි ඇති සියලු සැක දුරු කළාවූ පිරුණු නුවණ ඇති සුගතයන් වහන්සේ දුටුයෙමි.

16. "ඒ මම ඉතා සන්තොෂයට හා පැහැදීමට පැමිණි සිත් ඇත්තෙමි, තථාගත බුදුන්ට ඇඳිලි බැඳ වැන්දෙමි. ඒ කුශලකර්මය කළාවූ මම එම පිණින් තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට ගියෙමි."

17. "පින්වත්නි, පුදුමයෙකි. පින්වත්නි නොවූ දෙයකි. අඤ්ජලි කර්මයාගේ මෙබඳු විපාකයක් වෙයි, මමද පහන්වූ සිත් ඇත්තෙම් අදම බුදුන් සරණ යෙමි."

**18-19** "බමුණ, සතුටු සිත් ඇතිව අදම බුදුන් දහම් සඟුන් සරණයව. එසේම ශික්ෂා පද පසද කඩ නොකොට සමාදන් වෙව. ලොකයෙහි හිමියන් විසින් නුදුන් දෙය නොගෙන දුරුකරව. මත්පැන් නොබොව, බොරු නොකියව, පර අඹුවන් කරා නොගොස් සිය අඹු සමග සතුටු වෙවයි" කියේය.

**20.** "දෙවතාව, තෝ මට වැඩ කැමැත්තෙහිය, දෙවතාව, මට හිත කැමැත්තෙහිය. එහෙයින් නුඹගේ වචනය කරමි. තෝ මට ආචාර්යවෙහිය.

**21-22.** "දිව්‍ය පුත්‍රය, මම බුදුන් සරණ යමි. නිරුත්තරවූ ධර්මය හා නරදේවවූ බුදුන්ගේ සංඝයාද සරණ කොට යමි. වහාම ප්‍රාණඝාතයෙන් වෙන් වෙමි. ලොකයෙහි හිමියන් විසින් නුදුන් දෙය නොගෙන දුරුකරමි. මත්පැන් නොබොමි. බොරුද නොකියමි. සිය අඹු සමග සතුටු වෙමියි" කීයේය.

**84. සෙරිස්සක විමාන කථාව:-** 1. "යම්සේ වෙසවුණු රජුගේ පරිවාරකවූ සෙරිස්සක දිව්‍යපුත්‍රයාගේ හා වෙළඳුන්ගේද යම් වාලුකා කාන්තාර භූමියකදී එක්වීමක්වේද, එතන්හිදී ඔවුනොවුන් විසින් මනාව කියනලද යම් කථා ප්‍රවෘත්තියක් ඇතිවීද තොපි සියල්ලෝ ඒ පුවත අසව්.

**2.** "සෙතව්‍ය නුවර පායාසි නම් යම් රාජවංශිකයෙක් වේද, ඒ රාජවංශිකතෙම භූමාටු දෙවියන් හා එක්ව ආනුභව සම්පන්නව උපන්නේය. ඒ සෙරිස්සක දිව්‍යපුත්‍රයා පිරිවර දෙවතාවන් හා සමග සතුටුව දිව්‍යපඤ්චකාම සම්පත් වළඳමින් තමාගේ විමනෙහිම සිට වෙළඳුන් දැක මෙසේ කීය.

**3.** "පින්වත් මනුෂ්‍යයෙනි, මේ කාන්තාරයට පැමිණි මිනිසුන්ට අපගේ ජීවිතය ඇතිවේද නැතිවේද, මරණ පැමිණේද දිවි රකගෙන යාහැකි වේදැයි, කියා සැක උපදියි. නිතර යක්ෂ පිශාචාදී අමනුෂ්‍යයන් හැසිරෙන්නාවූ මිනිසුන්ට ගොචර නොවූ සුවසේ යා නොහැකිවූ කන බොන දේ නැත්තාවූ පැන්ගෙන යායුතුවූ,

**4.** "මේ වාලුකාකාන්තාරය මැද කෑයුතු ගෙඩි හා මුල් ජාතියකුත් නැත්තේය. දරුණුවූ උනුවැලිත් පසුත් හැර අන්

කිසිවක් නැත්තේය. එහෙයින් කෑයුතු ආහාරයක් මෙහිදී කොයින් ලැබේද, නොලැබේමය.

5. "මඳක් පඬුවන් රළුවූ තද පස් ඇත්තාවූ රත්කළ අයොමය කබලක් වැනිවූ සත්වයන්ට භය එලවන්නාවූ අමනුෂ්‍ය සතුරන්නේ ගැවසී ගත්තාවූ කිසි සැපතක් පිහිටක් නැත්තාවූ පරලොවක් හෙවත් නරකයක් වැනිවූ පුරාණ පටන් බොහෝ කලක් මුළුල්ලෙහි යක්ෂයන්ට වාසස්ථානවූ

6. "මේ භූමි ප්‍රදෙශයට තොපි කවර කරුණකින් ආවාහුද? කවර වස්තුවක් පතා ආවාහුද? තොපගේ සතුරෙකු විසින් අනතුරු කරුණු කැමතිව රටින්නගා හරනලද්දාහුද, නොහොත් මංමුළාව ආවාහුදැයි" විචාළේය.

7. "පින්වත් දිව්‍යපුත්‍රය, අපි අඟු මගධ දෙරට වැඩුනාවූ ගැල් පදින්නෝවම්හ. ගැල්වල බොහෝ බඩුපුරවාගෙන වැඩිලාභ උපදවම්හයි සිතා වස්තුලොභයෙන් සින්ධු දෙශයට හා සොවීර දෙශයට වෙළඳාම් පිණිස යම්හ.

8. "නුඹ දක්නට පළමුවෙන් උෂ්ණය බලවත් හෙයින් ග්‍රීෂ්මය ඉවසිය නොහැකිව ගොනුන්ට හා මිනිසුන්ට පහසු පිණිස අනුකම්පාවෙන් දහවල් එක්තැනක ලැගුම්ගෙන සිටි අපි සියල්ලෝම රාත්‍රයෙහි මගට පැමිණියම්හ.

9. "නොකල්හි ගමන යහපත් නොවෙයි. එහෙයින් යක්ෂාධිගෘහිත වාලුකා කාන්තාරය මැද මග දැනගත නොහී මංමුලාව නුවණැස් අන්ධව ඇස් නැත්තන්සේ සින්ධු සොවීර දෙශය අසවල් දිගයයි, කියා දැනගත නොහැකිව විනාශ මුඛයට පැමිණියම්හ.

10. "මෙයින් මතු අපගේ දිවිනැතිවේයයි කියා සිතට සැක උපන. පින්වත් දිව්‍යපුත්‍රය, අප විසින් පෙර නොදක්නා ලද මේ දිව්‍ය ප්‍රාසාදය හා නුඹගේ යම් මේ දැකීමක්වේද ඒ දැකීම හෙතුවෙන් ප්‍රීතියෙන් ඔද වැඩි සිත් ඇත්තෝවම්හ.

11. "පින්වත් දිව්‍යපුත්‍රය, අප විසින් පෙර නොදක්නා ලද මේ දිව්‍යප්‍රාසාදය හා නුඹගේ යම් මේ දැකීමක්වේද, ඒ දැකීම්

හෙතුවෙන් ප්‍රීතියෙන් ඔද වැඩි සිත් ඇත්තෝවම්හ. මෙතැන් පටන් දිවි ලබම්හයි සිතා නුඹ වහන්සේ දැක සතුටු වම්හයි" කීහ.

12. "එසේ ඇවිදින තොප විසින් දක්නා ලද හෝ අසන ලද ආශ්චර්ය අද්භූතවූ යමක් ඇත්නම් ඒ සියල්ලම මට නොවලහා කියවයි" දිව්‍ය පුත්‍රතෙම කීයේය.

13. "පළමු වයසෙහි සිටි පින්වත් දිව්‍ය කුමාරය, මිනිසුන්ට අයත් ඉසුරු සම්පත් ඉක්මගියාවූ යුෂ්මතුන්ගේ මේ ඉසුරු සම්පතට වඩා අප විසින් අසනලද හෝ දක්නාලද හෝ ආශ්චර්ය අද්භූත දෙයක් නැත. නුඹගේ ලාමක නොවූ වර්ණ සම්පත්තිය හා විමාන සම්පත්තිය බලා තෘප්තියකට නොපැමිණෙම්හයි" වෙළෙන්දෝ කීහ.

14. "නොයෙක් සුදු රතු පියුම් ආදී බොහෝ මල් වලින් ගැවසුනාවූ, නිර්මල සිහිල් ජලයෙන් පිරුණාවූ පොකුණු ආකාශයෙහි ගලාබසී. නිතර නොයෙක් ඵල පල්ලවයෙන් සැදුම්ලත් දිව්‍යවෘක්ෂ පංතියෙන් යහපත් සුවඳ හමන්නේය.

15. "වෛදූර්ය, මසාරගල්ල, ලොහිතංක, ශිලාප්‍රවාලාදියෙන් නිර්මිතවූ රැස් විහිදෙන තැන ටැම්මත්තෙහි ශොභාමත් මේ ප්‍රාසාදය පිහිටියේය.

16-17. "සත්රුවනින් නිමියාවූ අසදෘශ දහසක් පමණ බිත්ති කණු තරප්පු ආදියෙන් හෙබියාවූ ස්වර්ණමය වේදිකාවෙන් යුක්තවූ මත්තෙහි රන්පටින් වසනලද්දාවූ බොහෝසේ ජාම්බොනද ස්වර්ණයෙන් යහපත් කොට ඔප නගනලද විමානාවයවයන් ඇත්තාවූ නුඹගේ මේ විමානය දවසක් මුළුල්ලෙහි බලාත් සිත් නොපිරෙන්නේය.

18. "මේ රන්මාලිගාව ඇතුළෙහි කඩා කෑයුතු බුදිය යුතු නොයෙක් දිව්‍ය භොජන සාදා තිබෙයි. දක්ෂවූ ගන්ධර්වයන් විසින් වයනලද මිහිඟුබෙර පනාබෙර ආදී පඤ්චාංගික තූර්ය ඝොෂයෙන් එකනින් නාදවෙයි. නොයෙක් දිව්‍යපුත්‍රයන් විසින් ස්තුති ගී කියා නමස්කාර කරණ ලද්දෙහිය.

19. "යම්සේ වෙසමුනි රජු නොයෙක් මලින් සැදුනාවූ නලිනී නම් පොකුණෙහි නොයෙක් දෙවතාවන් විසින් පිරිවරණලදුව සතුටුව ක්‍රීඩා කෙරේද, එමෙන් ඔබත් නොයෙක් දෙවඟනන් පිරිවරා මේ දෙව්පහයෙහි ක්‍රීඩා වශයෙන් අචින්ත්‍ය අප්‍රමෙයවූ දිව්‍යසම්පත් වළඳන්නෙහිය.

20. "කිමෙක්ද, නුඹදෙවියෙක්ද නොහොත් මේ කාන්තාරයෙහි වසන චණ්ඩවූ යක්ෂයෙක්ද, නොහොත් දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රයාද, මිනිස් ජාති ඇත්තෙක්දැයි" සැක ඇතිව මේ ගැල් වෙළෙන්දෝ විචාරන්නාහු "එම්බා දිව්‍ය පුත්‍රය, නුඹ කවරෙක්දැයි" විචාළහ.

21. "දිව්‍ය පුත්‍රතෙමේ, "පින්වත් වෙළඳුනි, මම මේ වාලුකා කාන්තාර භූමි ප්‍රදෙශයෙහි නියුක්තවූ සෙරිස්සක නම්වූ වෛශ්‍රවණ දිව්‍යරාජයාගේ පරිවාරිකවූ දිව්‍ය පුත්‍රයෙක් වෙමි. වෙසමුනිගේ වචනයෙන් මේ භූමි ප්‍රදෙශය රක්ෂා කරමියි" කීයේය.

22. ගැල් වෙළෙන්දෝ "පින්වත් දිව්‍යපුත්‍රය, යුෂ්මතුන්ගේ මේ දිව්‍ය ඓශ්චර්ය සම්පත් කිසි කරුණක් නැතිව කැමති පරිද්දෙන් ලත් දෙයක්ද, නොහොත් කිසි කෙනෙකු විසින් කාල වශයෙන් පිරිනමන ලද්දක්ද, ඔබගේ දිව්‍ය ඍද්ධි මහිමයෙන් උපදවන ලද්දක්ද, නොහොත් දෙවියෙකු විසින් දෙනලද්දක්ද නුඹ විසින් මේ විමාන සම්පත්තිය කෙසේ ලබන ලදදැයි" ඇසූහ.

23. දිව්‍යපුත්‍රතෙම, "මගේ මේ ඉසුරු සම්පත් නිකරුණේ ලබන ලද්දේ නොවෙයි. යම්කෙනෙකු විසින් පිරිනමන ලද්දේත් නොවෙයි. මා විසින් උපදවන ලද්දේත් නොවෙයි. මහෙශාක්‍ය දෙවියෙකු විසින් දෙනලද්දේත් නොවෙයි. පෙර ජාතියෙහි මා විසින් කරණලද කුශලකර්මයෙන් මේ සම්පත් ලද්දේයයි" කීයේය.

24. "දිව්‍යපුත්‍රය, නුඹ විසින් පුරුදු කරණලද කවර ශ්‍රෙෂ්ඨ චර්යාවක් කවර ව්‍රත සමාදානයක් හෙතුකොටගෙන මේ විමානය ලබන ලද්දේදැයි" ගැල් වෙළෙන්දෝ විචාරත්.

25. "දිව්‍යපුත්‍රතෙම, "මම යටගිය දවස කොසොල් ජනපද වාසීන්ගේ සෙතව්‍ය නම් නුවර විසූ පරලොව නැත, කුසල් නැත. අකුසල් නැතැයි කියා ගන්නා ලද මරණින් මතු අවසානයයි හැඟීම ඇතිව සිටි ලාමක ස්වභාව ඇති පායාසි නම් රාජන්‍යයෙක් විය.

26. "ඒසමයෙහි බුද්ධ ශ්‍රාවකවූ විචිත්‍ර කථිකවූ බහුශ්‍රැතවූ උදාර ප්‍රඥා ඇති ඒ කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ මට බණ වදාරා මාගේ මිථ්‍යාදෘෂ්ටි නමැති හුල් පහ කළ සේක.

27. "මම ඒ බණ අසා උපාසක බැව් දන්වා සතුන් මැරීම, හොරකම, කාමයන්හි වරදවා හැසිරීම, බොරුකීම, සුරාපානය, යන පස් පවින් දුරුවුනෙමි.

28. "එසේ පුරුදු කරණ ලද ව්‍රත සමාදානය හා එම ශ්‍රෙෂ්ඨ හැසිරීමේ මේ විපාකය වෙයි. යහපත්වූ ඒ කුසලකර්ම හෙතුකොට ගෙන මා විසින් මේ විමානය හා විපාක ආනිශංසය ලබන ලදී.

29. "නුවණැති මිනිස්සු (යම්) සැබවක්ම කීවාහු නම් ඒ පඬුවන්ගේ වචනය වෙනසක් නොවන්නේය. කළ පින් ඇත්තේ (උත්පත්ති වශයෙන්) යම් යම් තැනකට යේද ඒ ඒ තන්හි පස්කම් සැපත විඳිමින් සතුටු වෙයි.

30. "කළපව්කම් ඇති සත්ව තෙම යම් යම් තැනකට යේද ඒ ඒ තන්හි (ඔහුට) ශොක කිරීම හා වැලපීමද වදයද බන්ධනයද කියන ලද අයහපත් දේ ඇති වෙයි. කිසි කලෙකත් දුගතියෙන් නොමිදෙයි.

31. "පින්වත් දිව්‍ය කුමාරය (නුඹගේ) පිරිවර ජනයාද, මේ මොහොතෙහි (ශොක වශයෙන්) මුළා ස්වභාව ඇතිවිය. මඩ මුසු ජලය මෙන් කැළඹුණේය. මේ නුඹේ පිරිවර ජනයාගේ හා නුඹගේ ද දොම්නස කවර කරුණකින් වීද?

32. "දරුවෙනි, මහරි උප වනයෙන් මේ දිව්‍ය ගන්ධයෝ හාත්පසින් හාත්පස සුවඳ හමත්. ඒ සුගන්ධයෝ මේ විමන

සුවඳ ගන්වත්. එසේ වුවත් තම ආලොකයෙන් දවල්ද රෑද අඳුර නසත්.

33. "හවුරුදු සියයක් ඇවෑමෙන් එක එක මහරි ඵලයාගේ කොපු පැසී නටුවෙන් ගිලිහී වැටේද, නොහොත් ගොටු බිඳීමට පැමිණ වියලේද (මට) මිනිසුන් පිළිබඳ අවුරුදු සියයක් ඉක්ම ගියේය. යම් දිනක මේ දිව්‍යාත්මයෙහි උපන්නේ වෙම්ද, (එතැන සිට) අවුරුදු සීයක් ආයු වෙයි.

34. "දරුවනි, මම දෙවියන් පිළිබඳ අවුරුදු පන්සියයක් මේ විමනෙහි සිට ආයු ගෙවීමෙන් හා පින් ගෙවීමෙන්ද චුත වන්නෙමි. ඒ සොවින් මුළාවූයේ වෙමි.

35. "යම් සත්ව කෙනෙක් මද පින් ඇතිව අල්පායුෂ්කව උපන්නාහුද ඒ සත්වයෝ මරණයට ඒකාන්තයෙන් ශොක කරන්නාහුය. එබඳු ඒ (නුඹ) අවුරුදු අනූදහසකට බොහෝ කලකට අසමාන දෙව් විමනක් ලැබ කෙසේ නම් ශොක කරන්නෙහිද?

36. "යම් හෙයකින් තෙපි මට අවවාද වශයෙන් කටයුතු වූ ප්‍රිය වචනයක් කීවාහුද? එය තොපට සුදුසුමය. දරුවෙනි, තෙපි මවිසින් රක්ෂාකරන ලද්දාහුය. යම් මගකින් යනු කැමති නම් ඒ මගින් නිර්භයව (සැපසේ) යව්.

37. "ධනය ප්‍රයෝජන කොට ඇති වස්තු ලාභය ප්‍රාර්ථනා කරන්නාවූ අපි සින්ධු සොවීර ප්‍රදෙශයට ගොස් (ඔබ විසින් කරන ලද) ඉල්ලීම පරිදි සම්පූර්ණ ත්‍යාග ඇතිව උදාරවූ සෙරිස්සක නම් උත්සවයක් කරන්නෙමු.

38. "සෙරිස්සක උත්සවය නොකරව්. යමක් තෙපි කීවහුද ඒ සියල්ල තොපට සිදුවන්නේය. ප්‍රාණඝාතාදි පාපකර්මයෙන් දුරු කරව්. දානාදී කුශල ධර්මයන්හි යෙදීමට ඉටා ගනිව් (මෙය සෙරිස්සක උත්සව පූජාවයි.)

39. "මේ සත්ව සමූහයා අතර බහුශ්‍රැතවූ සිල්වත් බවට පැමිණි සැදැහැවත් ත්‍යාගශීලීවූ සුපෙසලවූ කටයුත්තෙහි දක්ෂ

සතුටු සිතැති කර්මය සිහි කරණ ඤාණාදියෙන් මෙලොව පරලොව හිත වැඩ දන්නාවූ උපාසකයෙක් ඇත්තේය.

**40.** "හෙතෙම දැන දැන බොරු නොකියන්නේය. අනුන් නැසීමට නොසිතන්නේය. හිතවතුන් වෙන් කරන (කේලාම්) බස් කීම නොකරන්නේය. මොලොක් සිලිටු වචන කියන්නේය.

**41.** "ගෞරව සහිතවූ සුවච කීකරුවූ හික්මුනු අලාමකවූ අධිශීල ශික්ෂායෙහි පිහිටි පිරිසිදු පැවතුම් ඇති ඒ මනුෂ්‍ය තෙම දැහැමින් මව්පියන් පොෂණය කරයි.

**42.** "ඒ උපාසකතෙම මව්පියන් ඇවෑමෙන් නිවණට නැමුනේ ශාසන බ්‍රහ්මචර්යායෙහි හැසිරෙන්නේද, ඒ මේ උපාසකතෙම තමා නිසා නොව මවුපියන් හෙතුකොට වස්තු සොයා යයි හඟිමි.

**43.** "ඍජුවූ අවංක කපටි නොවූ ශඨ නොවූ මායා රහිතවූ ඒ උපාසකතෙම කැප ලෙසින් ජීවත්වන්නේය. එබඳු පුරුෂතෙම කෙසේ නම් දුක් ලබන්නේද නොලබන්නේය.

**44.** "වෙළඳුනි, ඒ උපාසකයා හෙතුකොටගෙන තොප ඉදිරියෙහි මම පහළවීමි. (යම් හෙයකින් මම ධර්මය ගරු කරමින් රකිමින් තොපත් රකිම්ද) එහෙයින් තොපිත් ධර්මයම බලව් ධර්මයෙහිම හැසිරෙව්) ඒ උපාසකයා නැතුව (තෙපි) මෙහි (පැමිණියාහු නම්) මේ මරුකතර මංමුළාව අනාථව පිළිසරණයක් නැතිව අලුබවට පැමිණෙන්නාහුය. වැනසෙන්නාහුය.

**45.** "(අනුන්ට) අවමන් කරන්නාවූ නොහොත් පීඩා කරන්නාවූ අනිකෙකු විසින් එබඳු දෙය පහසුවෙන් කළ හැක්කේය. සත් පුරුෂයකු සමග එක්වීම ඒකාන්තයෙන් සැපයි.

**46.** "පින්වත් දෙවිය, යම් උපාසක කෙනෙකුට අනුකම්පා පිණිස නුඹ මෙහි පැමිණියෙහිද අපිත් ඔහු දකිනු කැමැත්තම්හ. හෙතෙම කවරෙක්ද කෙබඳු කර්මාන්තයන් කරයිද, නාමය

කුමක්ද ඔහුගේ ගොත්‍රය කුමක්ද, යමෙකුට ඔබ ප්‍රිය වෙයිද ඔහුට ලාභයකම වෙයි.

**47.** "කරනැවැමියෙක් වූ සම්භව නම් ඇති හිසකේ ආදිය පිහිරා අන්දම් තබන පණ්ඩාව හා දැලිපිහි තලයක් නිසා ජීවත්වන්නාහු හෙතෙම උපාසකයෙක් වේද? තොපට වතාවත් කරන්නෙකැයි ඔහු දනිව්. ඒ උපාසකයා සිල් ඇති කෙනෙකි. (එහෙයින්) ඔහුට අවමන් නොකරව්."

**48.** "දෙවතාව, නුඹ යමෙකු ගැන ගුණ කීයෙහිද (අපි) ඔහු දනිමු. හෙතෙම ගුණවතෙකැයි කියා ඔහු ගැන අපි නොදැන සිටියේ දෙවතාව නුඹගේ ගුණකීම අසා අපිද ඔහු පුදන්නෙමු.

**49.** මේ ගැලෙහි ළදරුවූද මහලුවූද නොහොත් මධ්‍යමවූද යම්කිසි මිනිස්සු වෙත්ද, ඒ සියල්ලෝම මේ දෙව් විමනට නගිත්වා. තවද ඔහුගේ කුශල විපාකය බලත්වා."

**50.** එහිදී ඒ සියලුම වෙළෙන්දෝ මම පළමුකොට මම පළමුකොටයයි කියමින් ඒ කරනැවැමියා ඉදිරිපත් කරගෙන ශක්‍රභවනයට මෙන් දෙව් විමනට නැංගාහුය.

**51.** "සියලුම වෙළෙන්දෝ එහිදී මම පළමුකොට මම පළමුකොටයයි උපාසක භාවය දැන්වූහ, ප්‍රාණඝාතයෙන් වැළකුණාහ. ලෙව්හි නුදුන් දෙය පැහැර ගැනීම දුරු කළහ.

**52.** "උපාසක භාවය දන්වා මත්පැන් නොබොන්නාහ. මුසවා නොකීහ. සිය බිරින්ද සමග සතුටුවූහ. එහිදී ඒ හැම වෙළෙන්දෝ මම පළමුකොටය මම පළමුකොටයයි කියා

**53.** (දෙවියා විසින්) අනුදන්නා ලද වෙළඳ සමූහයා දිව්‍යානුභාවයෙන් නැවත නැවත සතුටු වෙමින් (සුවසේ කැමති දෙසකට ගියේය.

**54.** ධන සැපයීම ප්‍රයෝජන කොට ඇති ධන ලාභ ප්‍රාර්ථනාකරන්නාවූ මේ වෙළෙන්දෝ සින්ධු සොවීර දෙශයට ගොස් අදහස් පිරිදි සඵලවූ ලාභ ඇතිව උවදුරු රහිතව පැළලුප් නුවරට ආපසු ආවාහුය.

**55.** ඒ වෙළෙන්දෝ සුවපත්ව, සිය ගෙවලට ගොස් පුතුන් හා බිරින්දන් හා යුක්තව සතුටු සිතැතිව සතුටුව සොම්නස්ව පිනා ගියාහු මහත්වූ සෙරිස්සක නම් උත්සවය කළහ.

**56.** "ඒ වෙළෙන්දෝ සෙරිස්සක නම් පිරිවෙණක් මැවූහ. (කළහ) නොපෙරෙලෙණ ගුණයුත් සත්පුරුෂයන්ගේ ආශ්‍රය මෙබඳු මහත් ප්‍රායෝජන (අනුසස්) ඇත්තාහ. සම්භව නම් එකම උපාසකයා නිසා සියලුම වෙළෙඳ ජනයෝ සුවපත්වූහ.

**85. සුනික්ඛිත්ත විමාන ගාථාවः- 1, 2, 3, 4, 5** (මේ ඡේද 54 කථාවේ 1, 2, 3, 4, 5 ඡේද මෙනි)

**6.** "නපුරුකොට තබනලද මල් මාලාවක් යහපත් කොට බුදුරජාණන් වහන්සේගේ සෑයෙහි තබා මහත් ආනුභාව ඇති මහත් ඍද්ධි ඇත්තෙක් වීමි. දිව්‍ය කාමයන්ගෙන් යුක්ත වූයෙමි.

7 (මේ ඡේද 15 කථාවේ 11, 12 ඡේද මෙනි)

**(විමාන වස්තුව නිමි.**